# ගමන නිමවිය



ආරියරත්න හේවාපතිරණ

# ගමන නිමවිය

ආරියරත්න හේවාපතිරණ

ගමන නිමවිය

© ආරියරත්න හේවාපතිරණ

ISBN 978-955-50918-1-7

ප්‍රථම මුද්‍රණය - 2011 දෙසැම්බර්
දෙවන මුද්‍රණය - 2016 සැප්තැම්බර්

පරිගණක පිටු
සැකසුම - **Design Plus**

ප්‍රකාශක - එන්.ඩී. හේවාපතිරණ
එස්/1/20, ද සොයිසාපුර,
මොරටුව.
දුර : 0773 732028

මුද්‍රණය - නිව්ලක් ප්‍රින්ටර්ස්
නො. 34, ආතර් පෙදෙස
කල්දෙමුල්ල,
මොරටුව.
ශාඛා: කුරුණෑගල

## කතුවරයාගේ වෙනත් පොත් :

දිගු ගමනක අතරමඟදී

| | | |
|---|---|---|
| ගමන නිමවිය | - ප්‍රථම මුද්‍රණය - 2011 දෙසැම්බර් | |
| | දෙවන මුද්‍රණය - 2016 | |
| ආලෝකො උදපාදි | - ප්‍රථම මුද්‍රණය - 2014 මැයි | |
| | දෙවන මුද්‍රණය - 2015 | |

පිළිගැන්වීම
ප්‍රඥාවන්තයින් උදෙසා

# සත්‍යය

"ඕනෑකම" ඇති වූ විට

"නැතිකම" දැනෙන්නේය.

එවිට "දුක" උපදින්නේය.

"බලාපොරොත්තු" ඇති වන්නේය.

"භවය" සැකසෙන්නේය.

"උපන්නේ" වේ.

* * *

"ඕනෑකම" නොමැති විට

නැතිකම" නැත්තේය.

"දුක" නැත්තේය.

"බලාපොරොත්තු" නැත්තේය.

"භවය" නොවන්නේය.

"නූපන්නේය"

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පෙරවදන | i |
| භූමිකා | vii |
| කවරයේ කථාව | xii |
| සටහනක් | xv |
| පසුවදන | xvii |
| කතෲගේ පසු සටහන | xviii |
| බුදු මඟ | 1 |
| දුක්ඛ සමුදය | 23 |
| සක්කාය සමුදය නිරෝධය | 74 |
| සංසාර වට්ටය | 141 |
| දිගු ගමනක් | 180 |
| ආලෝකො උදපාදි | 242 |
| කායානුපස්සනාව | 290 |
| අරි අටැඟි මඟ | 339 |
| ආනාපානසත් භාවනාව | 381 |
| ධ්‍යාන සුවයද නිවනද? | 388 |
| සොටමුඛ සූත්‍රයෙන් | 394 |
| අභිනන්දන සූත්‍රයෙන් | 398 |
| ආදිත්ත පරියාය සූත්‍රයෙන් | 400 |
| බජ්ජනීය සූත්‍රයෙන් | 402 |
| අගලද්දූපම සූත්‍රයෙන් | 412 |
| ඕඝ තරණීය සූත්‍රය | 415 |
| ගමන නිමවිය | 417 |

# පෙරවදන

මෙම කෘතියේ කර්තෘතුමා වසරකට පමණ උඩදී මට හමුවූයේ අප විහාරයේදීය. එතුමා විසින් රචිත "දිගු ගමනක අතරමඟදී" කෘතිය එදින මාහට පරිත්‍යාග කරන ලදී. අඩ සියවසකට වැඩි කාලයක් සමාජය නැමැති විශ්ව විද්‍යාලයෙන් ලද අත්දැකීම් හා දැනුම් සම්භාරයන් එහි ඇතුලත්ය. එහි ප්‍රස්ථාවනාව අවසන්කොට ඇත්තේ මෙසේය. "මා මෙපමණ කාලයක් ගමන්කොට ඇත්තේ කොහේද? මා විසින්ම මවාගත් ලෝකයකය. මා මියගිය සැණින් මාගේ ලෝකය නිමවනු ඇත. එහෙත් ගමන නිමවේදැ'යි කිව නොහැක. මා තුළ පවතින සසර පිළිබඳ වූ තත්ත්වාවබෝධය අනුව එය නිගමනය වනු ඇත"

එම කෘතිය අවසන්කර ඇත්තේ මෙසේය."ජීවිතය යනු ප්‍රශ්න ජාලයකි. ජීවත්වීමයනු එම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට වෙරදැරීමකි. මෙහිදී බලාපොරොත්තුව නම්වූ වරපටමඟින් අපව ප්‍රශ්න සමඟ තදින් බැඳතබයි. "බලාපොරොත්තුව" නම්වූ වරපටින් මිදිය හැකිනම් ප්‍රශ්න වලින් ප්‍රශ්නයක් ඇතිවිය හැකිද?"

මේ ප්‍රකාශන තුළ එතුමා ලබාඇති ජීවිතාවබෝධයේ හරය පසක්කළ හැකිය.

ජීවිතයේ තාවකාලික වූ සන්තර්පණයන් ගෙන් මංමුළා නොව්, පූර්ණකාලීන වූ සැපයක් සොයා ගිය ගමනේ නවාතැන්පොළ වී ඇත්තේ, සම්බුදු දහමය. ධම්මකාමී, ධම්මගවේෂී මනාසකින් ජීවිතය දෙස බැලීමට

උත්සාහ කිරීමේ අගුවූ ඵලය ලෙස "ගමන නිමවිය" නම් වූ කෘතිය සම්පාදනය වී ඇති බව මගේ හැඟීමයි. මේ සඳහා විශේෂ කැපකිරීමක් ඥාණ සම්ප්‍රයුක්ත බවකින් සිදුකර ඇතිබව දැනගන්න ලැබුනි. බාහිර විෂයන්ට අදාළ මෙතෙක් පරිහරණයකළ සියලු පොත පත පුස්තකාලයකට පරිත්‍යාග කරමින්, ත්‍රිපිටක ධර්ම පොත් පමණක් සිය පුස්තකාලයේ තබාගැනීමට කල්පනාකාරී වී ඇත. ඒ අන් කිසිවක් නිසා නොව "හිඃ ගිනිගත්තෙක ඒ ගිනි නිවන ලෙස කුසලට මඳකත් පමානොවී සිත" යන උපදේශය අර්ථවත් කරමිනි. එසේම මජ්ඣිමනිකායේ අලගද්දූපම සූත්‍රයේ දක්වන පරිදි "කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, නිත්තරණත්ථාය නො ගහණත්ථාය" මගේ දහම පහුරකට උපමා කරමි. එය සසර තරණයකිරීම පිණිස පමණි. කරගහගෙන යෑම සඳහා නොවන බවයි" ශ්‍රැතවත් අරිය ශ්‍රාවකයා චිත්ත විසුද්ධිය තුලින් පරම නිෂ්ටාව වූ නිවන ප්‍රත්‍යක්ෂකළවිට ධර්මයද, පැත්තකින් තබනු ඇත. (ධම්මං පහතබ්බං) ධර්මය කෙරෙහිද, ඇලීම් බැඳීම් ඇතිනොකර ගැනීමටත්, එය උපකරණාර්ථයෙන් පමණක් පරිහරණය කිරීමට මග පෙන්වා ඇති බුදුදහම සංසාර බන්ධනයන්ගේ උපතත්, පැවැත්මත්, භය නැතිකිරීමේ මගත්, නැතිකිරීමෙන් ලබන පරම සුවයත් මැනවින් විග්‍රහකොට ඇත. එම දහම් අවබෝධය කතෘතුමාට මැනවින් ඇතිබව පෙනේ.

වත්මන් ආගමික සංස්ථාවතුළ, ආගමේ නාමයෙන් කෙරෙන බොහෝ දෑද. සමාජයේ කෙරෙන පෞද්ගලිකාවූත්, පොදුවූත් කරුණු කාරණාද, මිනිස් සිත සුවපත්කරන දේට වඩා, සිත ඔද්දල් කෙරෙන දෑ

බහුල බව ස්වයං විවේචනයක යෙදෙන කතුවරයා ඉන් නිදහස්වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම පොත සකස්වූ බව ආරම්භයේදීම කියයි.

දීඝනිකායේ, බ්‍රහ්මජාල, සාමඤ්ඤඵල, පොට්ඨපාද වැනි සූත්‍රවල එවකට පැවතුන ආගමික හා දෘෂ්ඨී මතවාද වල තරම ප්‍රකටවේ. හැටදෙකක් දෘෂ්ඨීන්ගෙන් වෙළී පැටලී ගිය සමාජයක් තුළ බුදුන් වහන්සේ පහළවූයේ හැටතුන්වන දෘෂ්ඨීය හඳුන්වාදීමට නොවන බව තේරුම්ගත යුතුව ඇත.

ලෝකය හා සත්ත්වයා පිළිබඳ එවකට පැවති සියලු මතවාද බැහැරකරමින්, විවෘත මනසකින් ලෝක දෙස බැලීමට මඟ පෙන්වා ඇත. වසර හතළිස් පහක් වූ සඳහම් චාරිකාවේ දෙසූ දහමතුල එය අන්තර්ගත වී ඇත.

සිදුහත් කුමර දිවියේ වසර විසිනවයක කාලය උපතින්ලද කාමභෝගී ජීවිතය ඉතා ඉහළින්ම වින්දනය කරමින්, ඉන්ද්‍රිය ප්‍රීණනයේ යෙදුන අතර තාපස දිවියේ වසරහයක කාලය අතිදුෂ්කරවූ කටුක ව්‍රත ප්‍රතිපදාවන්වල යෙදෙමින්, විමුක්තිය ගවේෂණය කළහ. මෙ අන්තද්වයේ නිසරුකම, ග්‍රාම්‍යබව ජීවිත අත්දැකීමෙන්ම පසක්කළ හෙයින්, මැදුම් පිළිවෙතට යොමුවිය. තමා පිළිබඳව සොයා බැලීම උතුම්ම සෙවීමබව පසක් කළහ. දුකමත පිහිටා ඇති මේ ලෝකයේ, එම දුකින් නිදහස්වීමට අරියපරියේෂණයේ යෙදුනාහ. ඉන් විශිෂ්ඨ වූ ප්‍රතිඵල ලබාගත්හ. සසර දිගුගමන වජ්‍රාසනායමත හිඳගෙනම නතරකළහ. සම්බුදු පදවිප්‍රාප්තිය, එහි අවසානයයි. ගමන නිමවිය. (ගතද්ධිනො)

බුදුන් වහන්සේ සද්ධර්මය ලෝකය හමුවේ දේශණා කළේ, තමන් වහන්සේ විසින්ම සකස්කළ දෙයක් ලෙස නොව, ලෝකතත්ත්වය එළිදැක්වීමක් ලෙසය. පෙර බුදුවරු ගියමඟ වල්බිහිවී කාලයේ වැලිතලාවෙන් වැසී තිබුනි. මා පැමිණ නැවතත් ගමන් කල හැකිසේ එළිපෙහෙළි කර දුන්නෙමි", යනුවෙනි.

පුද්ගලයාවටා ලෝකය ගොඩනැගී ඇත. ඉන්ද්‍රියානුබද්ධ අරමුණු ඔස්සේ මනෝමූලිකව ගොඩනගන්නා වූ සංස්කරණාත්මක ක්‍රියාවලියක අප නිරතවී සිටී. එසේ ඇතිකරගන්නා වූ මමායනය තුළ වල්මත්වී, මුල, මැද, අග, දැකියනොහැකි මහත් වූ අවුලකට, සංකීර්ණවූ බන්ධනයකට හසුවිසිටී. දීඝනිකායේ මහානිදාන සූත්‍රයේදී, තන්තාකුළකජාතා, ගුලාගුණ්ඨිකජාතා, මුඤ්ජපබ්බජභූතා, පැටලුන නූල්බෝලයක්සේ, සැවැන්න මුල්ගොඩක් වගේ යන වදන් වලින් ලොව පවත්නා වියවුල් බව, මැනවින් ප්‍රකට කරයි.

ඉහත අවුල විසඳීමට බුදුදහම උපයෝගීකොට ගන්නේ පටිච්චසමුත්පාදය හෙවත් හේතුඵලන්‍යායයි.

"මෙය ඇති කල මෙය වෙයි. මෙය නැති කල මෙය නොවෙයි", හේතුඵලන්‍යායේ මූලිකහරයයි. යමකින් යමක්ඇතිවේ යන්න නොව, යමක් පැවතීමේදී අනිකට යමක් සාපේක්ෂව පවතිනවා යන්න පිළිගැනීමයි.

මේ දහමේ පදනමමත පිහිටා, සත්ත්වයාගෙ භාවගාමී පැවැත්ම සිදුවන ආකාරයත්, පැවැත්ම හා නැවැත්මත් මුල් බුදුදහමේ දේශනාවන් තෝරා බේරා ඉදිරිපත් කිරීමට දහම් ඇස මැනවින් උපයෝගී කොට ගෙන ඇත.

විවිධ කෙටී මාතෘකා ඔස්සේ බුදුදහමේ මූලික ධර්ම කාරණාවන චතුරාර්‍යසත්‍යය, පටිච්චසමුත්පාදය, ත්‍රිලක්ෂණ, ආර්ය අෂ්ටාංගික මාර්ගය, පඤ්චුපාදානස්කන්ධ ධර්ම, සතර සතිපට්ඨානය ආදී ධර්ම විග්‍රහයන් සූත්‍ර ඇසුරෙන් තමා තේරුම්ගත් පරිදී සරළ බසින් තේරුම්කර දීමට කතුවරයා උත්සුකවී ඇත.

කියවීමට රුචිවන අයුරින් දහම් කරුණු එතුමාගේ අධ්‍යාත්මයෙන් නිරායාසයෙන් මතුවී සරළ පදවැල් බවට පත්වී ඇතිබව පෙනේ.

"දුක දරාගැනීමට අසමත්වන ඇතමුන් දුකින් (මාරයා) බේරීම සඳහා මරණය සොයා යයි. මරණය තවත් උපතකට හේතුව පමණි. උපත තවත් දුක්කන්දරාවක් ඇතිකරවන්නකි. එබැවින් මාරයා නම්වූ දුකින් මිදීමට කළයුත්තේ දුකට හේතුවූ ධර්මතාවයන් පිළිබඳව අවබෝධයලබා ඉන් ගැලවීමයි."

ආතුරවූ ලෝකයක, අනාතුරවී සිටීමත්, විවාද සහිත වූ ලෝකයේ විවාද රහිතව සිටීමත්, අවිචාරවත් වූ ලොව විචාරශීලීවීමත්, අධම්මරාගී ලොව ධම්මකාමීවීමත්, සරාගී ලෝකේ - විරාගීව සිටීමත් කළහැකිවන්නේ කෙසේද? යන්න සූත්‍රධර්ම ඇසුරින් දහම්මගට යොමුකිරීමට ගත් බෝසත් ගුණෝපේත උත්සාහයක් ලෙස දකිමි. ශ්‍රැතවත් අරිය ශ්‍රාවකයෙකු ලෙස, උගත් බණ දහම් ප්‍රායෝගිකව භාවනාව තුලින් අත්දැක, ප්‍රත්‍යක්ෂකොට තිබීම සිත හා සිතුවිලි පිළිබඳ විවරණයට ආලෝකයක් ලබා දී ඇත.

මෙය කියවන ඔබ කුමන ජාතියකට, ආගමකට, තරාතිරමකටම අයත් වුවද. මිනිසෙකු ලෙස වඨාත්ම

සතුටින් සිටීමට අවශ්‍ය නම්, මේ ලෝක යථාර්ථය තේරුම්ගත යුතුවඇත.

අසා දැනගැනීමත් (පරතෝඝෝසය) නුවණින් මෙනෙහි කිරීමත් (යෝනිසෝමනසිකාර) නිවැරදි දැක්මක් (සම්මා දිට්ඨි) ගොඩනගා ගැනීමට අත්‍යාවශ්‍ය වූ කාරණා දෙකයි. ඒ සඳහා අවශ්‍ය වූ දහම් කරුණු මෙහි ඇතුළත්වේ.

භික්ඛු - භික්ඛුණී, උපාසක - උපාසිකා යන සිව්වනක් පිරිසටම දේශනාකළේ එකම දහමකි. බුදුබණ පදයක් කණවැකෙත්ම, පැවිදි උතුමන්ට පෙර දහම් රසය විඳ ලොවුතුරු සුවය ලැබූ උපාසිකාවෝ බුදුන් දවස සිටි බවට කතා පුවත් සූත්‍ර ධම්මවල ඇත. මග හොඳට තිබේනම් යන්න දැසත් පෙනේ නම් අදද එය විය නොහැකිද?

දහම් ඇස පහළකොට ගෙන, ජීවිතාලෝකය ලබාගැනීමට, යමෙකු ශ්‍රැතවත් අරිය ශ්‍රාවකයෙක් බවට පත්වේනම් එයම කතෘතුමාට අජරවූ, අමරවූ, නිවන සඳහාම හේතුවේවායි පතමි.

මහලදූවේ නන්දරතන ස්ථවිර

**ආචාර්‍ය මහලදූවේ නන්දරතන ස්ථවිර (Ph D. Deihi)**
විධායක අධ්‍යක්ෂ
ශ්‍රී සුගත ප්‍රජා සංවර්ධන පදනම,
ශ්‍රී තරුණෝදයාරාමය,
මහලදූව, බලපිටිය.

# භූමිකා

වෙසක් කලාපයන් දුටුවෙමි. පොසොන් කලාපයන් දුටුවෙමි. ඒවායෙහි රැස්ව සිටි ජනකායන් දුටුවෙමි. ප්‍රීතිවන්නවුන් දුටුවෙමි. එහෙත් නිවැරදිව ධර්මාවබෝධය ලබන්නවුන් නොදුටුවෙමි. "සිත" හඳුන්නවුන් නුදුටුවෙමි. කලාපයන්හි නොවූයේවුවද ඇතැම්තැනක "නිවන් මඟ" දැක්වෙන ධර්ම දේශනාවන් පවත්වනු දුටුවෙමි. එවන් ධර්මයන් ඇසුවෙමි. එහි "සිත්" පහදින්නවුන් දුටුවෙමි. සිත නිවාගන්නවුන් දුටුවෙමි. නිවැරදිව ධර්මය අවබෝධ කරගන්නාවුන් නොදුටුවේ ද නොවේ.

සසරතරණය උදෙසා ධර්මය ඉගෙනගන්නා අයවද දුටුවෙමි. නම්බුනාම, තනතුරු, තාන්නමාන්න උපාධි ලැබීම පිණිස ධර්මය ඉගෙනගන්නා අයවද දුටුවෙමි. තනතුරු, තාන්නමාන්න උපාධි පිණිස ධර්මය හැදෑරුවේ වුවද - පසුව එය හුදී ජනතාවගේ යහපත උදෙසා කැප කරන්නවුන්ද නොදුටුවේද - නොසිටියේද නොවේ. ශාසනයෙහි උන්නතිය උදෙසා තම දේපල, ධන, ධාන්‍ය, පරිත්‍යාග කරන්නවුන්ද දුටුවෙමි. ශාසන උන්නතිය උදෙසාය කියමින් අන්සතුදෑ තම ග්‍රහණයට නතුකර ගන්නවුන්ද දුටුවෙමි. තමන්ගේ පැවැත්ම උදෙසා ධර්මය විකෘතිකරනදේශකයන්ද දුටුවෙමි. ශාසනයේ උන්නතිය උදෙසා ජීවිතය කැපකළ උත්තමයන් ද දුටුවෙමි. උදරපෝෂණය හා ස්වකීය පැවැත්ම උදෙසා ධර්මයට මුවාවී ගසාකෑමේ නිරතවන්නන්වද දුටුවෙමි. ධර්මයෙහි පහදවා මිනිස් සිත්සතන් පහදවන උත්තමයන්වද

දුටුවෙමි. ධර්මයසේ දක්වා අධර්මයෙහි රඳවා ජනයා මුලාකරන්නවුන්ද දුටුවෙමි. අර්ථවත්දේ කරන අයවද දුටුවෙමි. අනර්ථකාරී දේවල නියැලෙන්නන්වද දුටුවෙමි. මෙවන් දෑ දකින මා සිත නොපහන් විය. සසල විය. එපා විය.

මා කෙරෙන් ඵලප්‍රයෝජන ලැබුවන් දුටුවෙමි. මා කෙරෙන් ඵලප්‍රයෝජන ලබන්නන් දකිමින් සිටින්නෙමි. මා කෙරෙන් අනාගතයෙහි ඵලප්‍රයෝජනයන් ලැබීමේ අපේක්ෂාවෙන් සිටින්නවුන් දකින්නෙමි. මා වෙතින් ඵල ලබාගත් පසුව මා කෙරෙහි නින්දා අපහාසයෙන් යුතුව නිග්‍රහාත්මකව කතා කරන්නවුන්ද දුටුවෙමි.

අනාගතයෙහි ඵලප්‍රයෝජනයන් ලැබීමේ අපේක්ෂාවෙන් යුතුව මා අගය කරන්නවුන්ද, හුවා දක්වන්නවුන්ද, ප්‍රශංසා කරන්නවුන්ද දැක්කෙමි. දකින්නෙමි. තම අපේක්ෂාවන් ඉටුකරගැනීම පිණිස මා රවටන්නට වෙර දරන්නාවුන්ද දකිමින් සිටින්නෙමි. දකින්නෙමි. ඔවුන්ගේ උත්සාහයන්තුල මා රැවටීමේ අපේක්ෂාවක් නොතිබුනේවුවද එහි අවසන් ප්‍රතිඵලය මා රැවටීමට ලක්වීම පමණක්ම බව වටහාගත්තෙමි. වටහාගෙන ඇත්තෙමි.

මම ද අන්අයව රවටා ඇතිබව මෙනෙහි කළෙමි. මෙනෙහි කරන්නෙමි. අන්අයව රවටන බවත් මෙනෙහි කරමි. මට උපකාරකළවුන්ව අතහැර ඇතිබවත් මෙනෙහි කළෙමි. උපකාරකළ ඇතැමුන්ව පවත්වාගෙන යමින් සිටින බවත් මෙනෙහි කළෙමි. අන්අයව හෙළාදැක ඇතිබවත් මෙනෙහිකරමි. අන්අයව විවේචනයකර

ඇතිබවත් මෙනෙහි කරමි. අන්අයව අයසට පත්කළ බවත් මෙනෙහි කළෙමි. අන්අයව ප්‍රසංසාවට ලක් කළබවත් මෙනෙහිකළෙමි. අන්අයව උත්තමාචාරයෙන් ගෞරවයට පත්කළබවත් මෙනෙහි කරමි.

කිසිවෙකු රැවටීමේ අරමුණක් මාතුළ ඇතිවූයේ හෝ නොවූයේ වුවද, සිදුවන්නේ රැවටීමක්ම බව අවබෝධ කළෙමි.

මා දැනහඳුනාගත් සියලු ලෞකිකදේ දුක උපදවනු දුටුවෙමි. මා පීඩාවට පත්කරනු දුටුවෙමි. අයසට පත්කරනු දුටුවෙමි. විපතට පත්කරනු දුටුවෙමි. දකිමි. දකින්නෙමි.

මවිසින් දැන හඳුනානොගත් අපමණවත්දෑ ඇතිබව අවබෝධකළෙමි. ඒ කිසිවකින් මා පීඩාවට පත්නොවන බවත් දුටුවෙමි. මා අයසට පත්නොවන බවත් දුටුවෙමි. මා විපතට පත්නොකරන බවත් ප්‍රත්‍යක්ෂ කළෙමි.

නොදැකිය යුතුදෑ. දැක ඇතිබව සිහිවිය. නොබැලිය යුතු දෑ, බලා ඇතිබව සිහි විය. නොඇසිය යුතු දෑ, අසා ඇතිබව සිහිවිය. නොකිව යුතු දෑ කියා ඇතිබව සිහිවිය. නොසිතිය යුතු දෑ. සිතා ඇතිබව සිහිවිය.

මේ සියල්ල දකින මාතුළ වික්ෂිප්තබවක්, අවිනිශ්චිතබවක ඇතිනොවූයෙද නොවේ. එහෙත් මේ සියලු ධර්මතාවයන්, ධර්මතාවයන්ම මිස මා කෙරෙහි හෝ අන් කවරඅයෙකු කෙරෙහි හෝ සිමාවූවක් නොවන බවත් ප්‍රත්‍යක්ෂ කළෙමි.

නිස්සෙහි පැවතිය හැකිබව අවබෝධවිය. නොනිස්සෙහි පැවතීම, භවය තැනීමබව අවබෝධවිය. දුක ඇතිකරන බව ප්‍රත්‍යක්ෂවිය.

මේ සියල්ලම මමත්ත්වය ප්‍රත්‍යකරමින් පවත්නා බව අවබෝධකළෙමි. මමත්ත්වය ඇතිතාක් රැවටෙනු ඇත. රැවටීමට ලක්වෙනු ඇත. රැවටීමට ලක්කරනු ඇත. රැවටීම සිදුකරනු ඇත. පවත්වාගත නොහැකි මමත්ත්වය. නිරර්ථක මනසිකාරයක් බව ප්‍රත්‍යක්ෂකළෙමි. ඉන් මිදීයාමේ අරමුණින්යුතුව තථාගත සම්බුදු පියාණන් වහන්සේ විසින් පෙන්වාවදාළ ධර්මය සොයන්නට පෙළෙඹුනෙමි. බුදුදහම පිළිබඳ ප්‍රාඥයින් හමුවුනෙමි. ධර්මය පිළිබඳ ආභාසය ලැබුවෙමි.

බුද්ධධර්මය පිළිබඳ ග්‍රන්ථයන් ඇසුරුකළෙමි. පරිශීලනය කළෙමි. අනුමානඥානය අභිබවා, අවබෝධ කළෙමි. අවබෝධය අභිබවා ප්‍රත්‍යක්ෂඥානය ලබන්නට වෙරදැරුවෙමි.

මෙසේ නොයෙක් ආකාරයෙන් ධර්මය සොයායෑමේදී මාතුළ පහල වූ සිතුවිලි, හමු වූ ධර්ම කාරණාවන් පිළිබඳව ලිඛිත සටහන් තැබුවෙමි, එවන් සටහන් තුලින් කවරෙකුහට හෝ ප්‍රයෝජනයක් ගතහැකිවේයැ'යි හැඟුණ බැවින් ඒවා සියල්ල ගොනුකොට පොතක් ලෙසින් සැකසුවෙමි. "ගමන නිමවිය" යනුවෙන් එය නම කළෙමි. මේ එළිදකින්නේ එම පොතයි.

කිසිවෙකු අහස දෙසට ඇඟිල්ල දිගුකොට සඳ පෙන්වන විටකදී, බලන්නා විසින් සඳදෙස නොව පෙන්වන්නාගේ ඇඟිල්ලදෙස බලන්නේනම්, හෙතෙම දකිනුයේ දැකියයුතු සඳ නොව, පෙන්වන්නාගේ ඇඟිල්ලය.

මෙම පොතෙහි දැක්වෙන කරුණු කාරණාවන් පසෙකලා, එහි භාෂා ව්‍යාකරණ, අක්ෂර වින්‍යාසයන්

පිළිබඳව කිසිවෙකු දක්නටයන්නේ නම්, එවන් තැනැත්තාද, සඳ නොබලා - ඇඟිල්ල දෙස බලන්නාහට නොදෙවෙනි වන්නේය.

ආචාර්ය මහලඳූවේ නන්දරතන ස්ථවිරයන් වහන්සේ පොතට පෙරවදනක් සකසාදීමට කාරුණික විය.

පෙර පිනැති, දැනුදු පින් උපයන දානපතියෙකු, පොත මුද්‍රණය කිරීමේ වියදම්දැරීමට ඉදිරිපත්විය. තම නාම එළිදැක්වෙනුවාට ඔහු නොකැමැතිය. එහෙයින් ඔහුගේ නම මෙහිලා දක්වනු නොලැබෙයි.

මෙම කටයුත්ත සාර්ථකකර ගැනීම පිණිස බොහෝ දෙනෙකු මට සහය විය. එසේ සහය දක්වමින් ඔවුන්, ඔවුනගේ අරමුණුකරා ගමන් කළෝය. ඔවුන් වීසින් තව නවත් අරමුණු ඇතිකරගනු ඇත. අරමුණම භවය තනාන්නේය. භවගමන එතැනය. ඔවුන් ගමනේ යෙදෙනු ඇත. ධර්මතාවය පිළිබඳ සත්‍ය අවබෝධවූ දිනක ඔවුන්ද, ගමන නිමකරනු ඇත. නවතිනු ඇත.

මේ පොත කියවන, බුදු දහම පිළිබඳ කරුණු හා සූත්‍ර කටපාඩමින් දැන ලැබූ අනුමානනුවණින් යුතු වූයේ වුවද, ධර්ම කාරණාවන් කෙරෙහි ප්‍රායෝගිකව ලැබූ ප්‍රත්‍යක්ෂඥානයෙන් තොරවූ, සමාජයෙහි බහුශ්‍රැතයින් ලෙස පෙනීසිටින ඇතැමුන්තුළ, මා කෙරෙහි ද්වේෂයක් ඇතිවිය නොහැකිවාම නොවේ. එහෙත් එසේ නොවියයුතුය. මා කෙරෙහි ද්වේෂ ඉපදවීමෙන් පිරිහෙනු ලබනුයේ, එසේ ද්වේෂ උපදවන්නාම මිස, මා නොවේ.

අන් අය කෙරෙහි ද්වේෂයන් උපදවමින් ඒවායින් තමන්ම පිඩාවට පත්වීම අමනෝඥ ක්‍රියාවක් මිස, බුද්ධිමත් ක්‍රියාවක් නොවේ.

එවන් ද්වේෂයක් ඇතිවනුයේ නම් - එම මොහොතේදී කළයුතු නිවැරදි හා බුද්ධිමත් ක්‍රියාවවනුයේ "ධර්මතාව" පිළිබඳ යථාර්ථය අවබෝධකොට සත්‍යයට මුහුණදීමයි.

එවිට ස්වාභිමානය පිළිබඳ ගැටළු ඇතිනොවේ.

තවත් කිවයුතු දෙයකි. එහෙත් එයද රැවටිල්ලකි. රැවටිල්ලක්වුවද මෙහිදී නොකිවහොත් එය අඩුවක් ලෙසින් දැනෙනු ඇත. දකිනු ඇත. සිතනු ඇත. එහෙයින් කියමි. "ඔබ සැමදෙනට ස්තූතිවන්ත වෙමි. කෘතඥ වෙමි."

එපමණකි.
නවතිමි.

ආරියරත්න හේවාපතිරණ

# කවරයේ කථාව

නිසල දියතලයමත දියබිඳුවක් වැටෙන්නේය. දියතලයමත දියබිඳුව ස්පර්ශවත්ම අප්‍රමාණ වූ තරංගයන් දියතලයමත පැතිර යන්නට වන්නේය. එසේ අප්‍රමාණ දිය තරංග පැතිර යමින් පවත්නේවුවද, එවන් තරංග ඇතිකිරීමට ප්‍රත්‍යවූ ස්පර්ශය ඇතිකළ ජල බිඳුව දක්නට නොහැකිය. එය දියමත ස්පර්ශය ඇති කළ ක්ෂණයෙහිම දියතලයට එක්වී නොපෙනී යන්නේය. යළි කවර කලෙක හෝ ඒ දිය බිඳුව දැකිය නොහැකිවන්නේය.

එහෙත් දියබිඳුවේ ස්පර්ශයත් සමඟම ජලතලයේ ඇති වූ තරංගයෝ නම් දැකිය හැකිවන්නේය.

අඛණ්ඩව ජලතලය මත දියබිඳු පතිනවනුයේනම්, නිමාවක් නොමැති අයුරින් ජලතලයමත තරංගයෝ නොනැසී පවතිනකාරයක් දිස්වන්නේය. ප්‍රකටවන්නේ තරංගයන් ඇතිකිරීමට හේතුවූ දියබිඳුව හෝ ස්පර්ශය නොව පැතිරපවත්නාවූ ජල තරංගයෝමය.

බැලියයුත්තේ ජලතරංගයන් දෙස නොව, දිය බිඳුව දෙසය. දියබිඳුව ජලතලයමත ස්පර්ශවත්ම, ජලතලයමතම නොපෙනීයනුයේ යලි කවරඅයුරකින් හෝ එය ජලතලයෙන් වෙන්කොටගත නොහැකිවන්නේය. ස්පර්ශය සමඟම ස්පර්ශය ඇතිකළ හේතුප්‍රත්‍යයද නිමාවිය. ඒවා එතැනම නිරුද්ධවිය. දැකිය යුත්තේ එතැනය. ප්‍රත්‍යක්ෂකළයුත්තේ එතැනය. හේතුවත් හේතුප්‍රත්‍යයත් ස්පර්ශයෙන් ඇතිවිය. එතැනම නැතිවිය.

ජලතරංගයෝ මනසිකාරයන්ය. සිතුවිලිය. මෙනෙහිකිරීම්ය. මඤ්ඤනාවන්ය.

එවන් කිසිවකින් තොරව ජලතලයද, ජලබිඳුවද, ඒවායේ ස්පර්ශයද, දැකිමෙන් හටගත් "සිත" එතැනම නිරුද්ධවිය.

**පිටුපස**

ජලබිඳුව පෙනුමෙන් සරළය. දකිනුයේද සරළ අයුරිනි. එහෙත් එවැනි සරළත්ත්වයක් එහි නැත. ජලබින්දුවවූයේ වූවද, එය අප්‍රමාණවූ ක්‍රියාවන්ගෙන් සමන්විතවූ අනේකාකාර ස්වභාවයන් පවත්වන්නාවූ සංකලනයකි. බිඳුවෙන් බිඳුවවුවද ඒවා ඒකරාශී වීමෙන් යහපත්වන්නාසේම භයංකර වූ විනාශකාරී ප්‍රතිඵල ඇතිකරදීමට සමත් නොවන්නේ ද නොවේ.

* * *

සිත නැමති ජලතලයමත පතිතවන චේතනා (අරමුණු) නැමැති ජල බින්දු ප්‍රත්‍යකොට අපමණවත් වූ තරංග නමැති මනසිකාරයන් පැනනැගෙන්නේය.

එහි වැටෙන ජලබින්දු බින්දු ඒකරාශී වීමෙන් ජලාශය නොසිඳි පවත්නා සේ, මනසිකාරයන් විඥාණගත ත්‍රිවිධ තෘෂ්ණාවනුත් නොසිඳී පවතින්නේය.

# සටහනක්

මෙම පොත එළිදැක්වූයේ ශ්‍රී බුද්ධ වර්ෂ 2555 ක් වූ පුර දොළොස්වක තිථියලත් බුධ දින, ශක වර්ෂ 1933 ධනු රවි සිවු, භාගයක් වූ ක්‍රිස්තු වර්ෂ 2011 දෙසැම්බර් මස 21 වැනි බුධ දිනයේ දිය.

මෙදින පොත එළිදැක්වූයේ වුවද. පොත බිහිවීමේ කටයුතු ඇරඹුනේ, මින් බොහෝ කලකට පෙරදිය. එය ප්‍රකට නොකරමින් පොත එළිදැක්වම සමරයි.

සත්ත්වයාද භවයට වැටුනේ කවදාදැ'යි නොදන්නා නමුදු, බිහි වූ දිනයක සිට බිහිවීම සමරයි. එහෙත් ඒ බිහිවීමට පෙර, බිහිවීමේ හේතුප්‍රත්‍යයන් පහළ වූ බැව් නොදැකීම ම උපත නම් වූ ස්වභාවයෙහි අගයක් ගැනීමට හේතුවෙයි.

පළමුකොට මුලාවන්නේ තමාය. තමන් මුලාවූ බව නොදන්නා බැවින් මුලාවම සැබෑවක් ලෙස පවත්වා ගන්නේය. එම මුලාවට අන්අයවද කැඳවාගනු ලබන්නේය. කැඳවුම් ලබන්නවුන්ද ඒ පිළිගතහොත් මුලාවෙහිම වැටෙන්නෝය. මුලාව, මුලාවම මිස සැබෑවක් නොවන බැවින් මුලාවම පවතින්නෝ ය.

මේ මුලාව පිළිබඳ සැබෑස්වභාවයන් අවබෝධ කරගත් තැනැත්තේ මුලාවෙහි නොවැටෙන්නේය. නොගැලෙන්නේය. ධර්මතාවයන් පිළිබඳ සැබෑ ස්වරූපය අවබෝධකරන්නේය. එයම ප්‍රඥාව වේ.

ප්‍රඥාව පහළවීමය යනු, තමන් රැවටීඇතිබව තේරුම් ගැනීමයි. ධර්මතාවය පිළිබඳ සැබෑ ස්වභාවය ප්‍රත්‍යක්ෂ කරගැනීමයි.

අනිත්‍ය බව - ශූන්‍යත්වය පිළිබඳව වැටහුණු කෙනෙහි මුලාව අත්හැරෙන්නේය. තවත් දුරටත් ඒවායෙහි නොරැවටෙන්නේය. නොරැවටෙන හෙයින් රැවටිල්ලෙහි නොබැඳෙන්නේය. නොබැඳුණු හෙයින් නිදහස් වන්නේය.

ප්‍රඥාවේ ආලෝකය පහළවක්ම - මෝහන්ධකාරයන් බැහැරවූයේ... නොපැවැතියේ වුවද, පවතින ලෙසින් ගත්මඟ තවදුරටත් මඟක් නොවන බව ප්‍රත්‍යක්ෂවූයෙන් මඟක් නොමවූයෙන් නවතින්නේය. නැවතුන තැනම "ගමන නිමවිය."

කතෘ

# "ගමන නිමවිය" පසුවදන

දෙස් විදෙස් බොදුනුවන් බුදු දහම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන වත්මනෙහි ආරියරත්න හේවාපතිරණයන් විසින් සම්පාදනය කරන ලද "ගමන නිමවිය" කෘතිය ශ්‍රී ලාංකේය බොදු දනන්ගේ එකී දහම් පිපාසය සංසඳවීමට ප්‍රමාණික කෘතියකි. මාතෘකා කීපයක් ඔස්සේ කෘතියෙහි කරුණු ගොනු කරන ලේඛකයා එමගින් බුදු දහමේ උගන්වන නිර්වාණගාමී ප්‍රතිපදාව මොනවට විවරණය කර තිබේ. ත්‍රිපිටක පරිශීලනයෙන් හා ප්‍රායෝගිකව දහම් මඟට යොමු වීමෙන් කතුවරයා ලැබූ ඥාන සම්භාරය පාඨක ලෝකයාට දායාද කිරීමට ප්‍රශස්ථ ප්‍රයත්නයක් ලෙස මෙම ධර්ම ග්‍රන්ථය හඳින්විය හැකිය.

නොයෙක් මාතෘකා ඔස්සේ බුදු දහමෙහි කරුණු විවරණය කරමින් පොතපත රචනා කරනු බොහෝ ලේඛකයින් ඒවා පණ්ඩිත ප්‍රිය භාෂා ශෛලියකින් රචනා කළ ද හේවාපතිරණයන් සිය කෘතිය රචනා කරනු ලබන්නේ නොවියත් හුදී ජනයාට ද කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි සරළ සුගම භාෂා රටාවකිනි. එහෙයින් ම මෙම කෘතිය බොහෝ පාඨක පිරිසකට දහම් මඟ එළිපෙහෙළි කර ගැනීමට මහඟු අත්වැලක් වනු ඇති බව අපගේ හැඟීමයි.

නානාවිධ ආගමික මිත්‍යාචාරයන් ගෙන් ගහන නූතන සමාජ වපසරිය තුළ සිය දැක්ම නිවැරදිකර ගැනීමට හේවාපතිරණයන්ගේ මෙම "ගමන නිමවිය" නම් කෘතිය පාඨක ලෝකයාට ආලෝකයක් ම වේවා.

**පරිවේණාධිපති, ශෞංච ශාස්ත්‍රවේදී,**

**පූජ්‍ය මැකිලියතැන්නේ ධම්මවංස හිමි**

**ගා/ශ්‍රී පුෂ්පාරාම මහා පරිවෙන, මීටියාගොඩ**

# කතෘගේ පසු සටහන

'ගමන නිමවිය' කෘතියේ දෙවන මුද්‍රණය ඔබ අත පත් කිරීමට හැකිවීම පිළිබඳව මම සතුටු වෙමි.

දිරිගැන්වීම්, අභියෝග, රැවටිලි, පරිත්‍යාග, මැසිවිලි අතරින් ගිය දිගුගමන හා උත්සාහයක ප්‍රතිඵලයක් ලෙසින් පෙර පිනැති, දැනුදු පින් උපයන දානපතියෙකුගේ පූර්ණ අනුග්‍රහය නොවන්නට "ගමන නිමවිය" මුද්‍රණ කටයුතු අවසන් කරගත නොහැකිව යාමට ඉඩ තිබුණි.

කෙසේ හෝ වේවා "ගමන නිමවිය"

මෙම කටයුත්ත සාර්ථක කර ගැනීමට හැකි හැම ආකාරයකින්ම සහය දැක්වූ සියළු පිංවතුන් හට තව තවත් පිං අනුමෝදන් කරවමි.

ඒ අමාමහ නිවන් සුව බොහෝ දුර නොවේ.

ආරියරත්න හේවාපතිරණ

එස්/1/10, ද සොයිසා පුර,
මොරටුව.
ඇමතුම් අංකः 0777-459 143

# බුදු මඟ

පන්සලේ ධර්මශාලාවෙහි එදිනදා පැවැත්වෙන දහම් කථිකාවකි. නායක හාමුදුරුවන් වහන්සේ, ධර්මා සනයෙහි නොව ධර්මශාලාවෙහි පසක තිබූ අසුනක වැඩ සිටියේය. උන්වහන්සේ වටා පිරිවර කොට බොහෝ දෙනෙකුන් නොසිටියේ වුවද, සිටි කිහිපදෙනා දැඩි උවමනාවකින් යුතුව උන්වහන්සේගේ පැහැදිලි කිරීම් කෙරෙහි දෙසවන් පමණක් නොව, සියළු අවධානයන් යොමු කොට සිටියෝය.

තථාගත සම්මා සම්බුදු පියාණන් විසින් වදාළ චතුරායර්‍ය සත්‍ය අවබෝධකර ගැනීම පිණිස උන්වහන්සේ විසින් පෙන්වා වදාළ ආයර්‍ය අෂ්ඨාංගික මාර්ගයෙහි ගමන් කිරීමට පිවිසි අය උන්වහන්සේගේ ශ්‍රාවකයින් ලෙස හඳුන්වනු ලබති. එසේ ශ්‍රාවක බවට පත්වන කොටස් හතරකි. ඒ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවෝය. මේ බුද්ධ ශ්‍රාවකයෝය. ඔවුහු පරමාර්ථ සත්‍යයෙහි මිස, සම්මුති සත්‍යය කෙරෙහි නොපිහිටති. එහෙයින් කවර ආකාරයේ දෘෂ්ඨිගතවූවන් හෝ වේවා, සංකල්පනාවන් ඇතිකර ගත්තවුන් හෝ වේවා බුද්ධශ්‍රාවක තෙමේ ඒ හැමට වඩා වෙනස් බව අමුතුවෙන් කිවයුතු නොවේ.

අද දවසේ බහුලව දැකිය හැකිවන්නේ බුද්ධ ශ්‍රාවකයින් යැ'යි සිතමින් වෙනත් නොයෙක් ආකාරයෙහි දෘෂ්ඨීන්හි ගැලෙමින් "දුක" නැතිකරගැනීමේ නිරර්ථක උත්සාහයක යෙදෙන පිරිස්ය. ඔවුහු ශීලය වරදවා ගත්තවුන්ය.

එවන් පිරිස් විසින් ඔවුනට රිසි අයුරින් බුද්ධ දේශනාවන්හි අර්ථය වෙනස් කරති. ඔවුන්ගේ අභිමතයට අනුකූලවන අයුරින්ම අර්ථගන්වති. යථා ස්වභාවයන් නොදන්නා අසරණ සත්ත්වයින් නොදන්නාකම නිසා නොවැටහීම නිසා අනේකාකාර වූ මිථ්‍යා සංකල්ප, වැරදි සිතුවිලි තුල ගැලෙමින් - දුකෙන් දුකටම පත්වෙති.

බුදුන් දෙසූ මඟෙහි ගමන්කරන්නෝ ආර්‍ය්‍ය ශ්‍රාවකයින්ය. ඔවුන් ඒ මඟ තරණයකොට "දුක" නිරෝධයෙන් ජය ලබන්නෝය.

**'අඤ්ඤාහි ලාභූ පනිසා අඤ්ඤා නිබ්බාන ගාමිනී**

**ඒව මේ තං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකෝ**

**සක්කාරං නාභි නන්දෙය්‍ය විවේකා මනු බ්‍රෑහියෙ"**

ලාභය ලබනමඟ එකකි. නිවන්මඟ අනෙකකි. එබැවින් මේ පිළිබඳව අවබෝධයෙන් යුතුව, භික්ෂූන්, බුද්ධ ශ්‍රාවකයින් ලාභ සත්කාරයෙන් සතුටු නොවිය යුතුය. ත්‍රිවිධ විවේකය ම වැඩිය යුතුය.

(ධම්ම පදය)

බුදු පියාණන්ගේ උපදේශය එසේය.

"මහා මංගල" සූත්‍රයේදී අපට හමුවෙනවා,

**"අසේවනාච බාලානං - පණ්ඩිතානංච සේවනා"**

කියන ධර්ම පාඨය.

මෙහි පණ්ඩිතයා යනු කවරෙක් ද?

ආර්ය ධර්මඥාණය ලැබූ පුද්ගලයාය.

මේ දුකය.

මේ දුක ඇතිවීමේ හේතුවය.

මේ දුක නැතිකළ හැක්කේය.

මේ දුක නැතිකිරීමේ මාර්ගයයි.

යනුවෙන් චතුරාර්ය සත්‍යය අවබෝධකළ පුද්ගලයාය.

චතුරාර්ය සත්‍ය අවබෝධකළ පුද්ගලයාම, පණ්ඩිත වශයෙන් ආර්ය ධර්මයෙහිදී හඳුන්වන බව පැහැදිලියි.

එහෙම නැතිව භෞතික ලෝකයේ විවිධ සම්මතයන් තුළ පවතින පණ්ඩිතයා මෙන් සහතිකයක් මත රැඳෙන්නෙක්ම නොවන බව වටහාගත යුතුයි. සැබෑ පණ්ඩිතයන් වීමට උත්සාහ කළ යුතුයි. ඒ සඳහා නිවැරදිව ධර්මාවබෝධය ලබාගත යුතුයි.

**න තෙන පණ්ඩිතා හොති - යාවතා බහු භාසති**

**ඛේමි අවෙරි අභයො - පණ්ඩිතොති පවුච්චති**

බොහෝසේ කථාකළ පමණින් යමෙක් පණ්ඩිතයෙක් නොවේ. උවදුරු හා වෛරින් ද නැතිව නිර්භය වූ පුද්ගලයා පමණක් පණ්ඩිතයෙකු යැයි කියනු ලැබේ.

(ධම්ම පදය)

**අපි දිබ්බෙසු කාමෙසු - රතිං සොනාධි ගච්ඡති**

**තණ්හක්ඛයරතො හොති - සම්මා සම්බුද්ධස්ස සාවකො**

සැබෑපණ්ඩිතයා දිව්‍ය, කාම සම්පත්තිවල පවා නොඇලෙයි. සම්බුදු ශ්‍රාවකයා, ආශාවන්ගෙන් බැඳෙනු වෙනුවට තණ්හාව ක්ෂය කිරීම් සංඛ්‍යාත නිවනෙහි වේ.

(ධම්මපදය)

බුදුදහම නිදහස් චින්තනයක්. එය නිදහස්ව සිතීමෙන්, නිදහස්ව අවබෝධ කිරීමෙන් ප්‍රත්‍යක්ෂ කරන්න ඕනෙ.

දැන් ඔය ඇත්තන්ටත් ඒ ගැන නිදහසේ කථා කරන්න, දැනගන්න පුළුවන්..... දැන් අවස්ථාව එළඹිලා'යි පැවසූ නායක හාමුදුරුවන් වහන්සේ නිහඬවිය.

මොහොතකට පැවති නිහඬතාවය බිඳහරිමින්... " සිරිදාස" තම හඬ අවදි කළේය.

අවසරයි, අපේ හාමුදුරුවනේ, ධර්ම දේශනයන්ට සවන් දෙනකොට තේරුම් ගැනීමට අපහසු වචන ඇහෙනවා. සමහර ධර්ම කාරණා පැහැදිලි කිරීමේදී ඒ වචනවල තේරුම් නොදන්නාකම නිසා අහගෙන ඉන්නවා විනා, තේරුම් ගන්නට පුළුවන්කමක් නැහැ... පැහැදිළි කිරීම් මදිවගෙයි මට හිතෙන්නෙ... ඒ නිසා ඒවගේ වචනවල තේරුම් පැහැදිලිකර දෙන්නට හැකිද හාමුදුරුවනේ...

බැරිකමක් නැතිවෙයි. නොතේරෙන දේවල්වල හිරවෙලා ඉන්නවාට වඩා ඒවායෙන් මිදිල - හරිහැටි

තේරුම් ගන්නඑක තමයි වැදගත්ම කාරණය... හොඳයි ඉතින් "සිරිදාස" කියන්නකො... ඒ වචන මොනවාද කියල...

අපේ හාමුදුරුවනේ... තණ්හාව, නාමරූප, විඥානය, භවය, සක්කායදිට්ඨිය, අවිද්‍යාව, පංචස්කන්ධය, පංචඋපාදානස්කන්ධය, නීවරණ, ශීලබ්බතපරාමාශ... මෙන්න මේ වගේ දේවල් යැ'යි සිරිදාස පැවසුවේ ය.

හරියටම හරි සිරිදාස මහත්තයෝ... අද වෙලා තියෙන්නෙ ඔන්න ඔය අවුල තමයි. ධර්මය තේරුම් ගන්න බැරිතරමට වචන ගොනුවෙලා. මිනිසුන් වචන අතර අතරමංවෙලා... බොහොම පහසුවෙන් අවබෝධ කර ගතහැකි ආකාරයෙන් තථාගත සම්මාසම්බුදු පියාණන් දේශනාකළ උතුම් ධර්මය මේ අනවශ්‍ය වචනවලින් ආවරණයකර තිබීම නිසා, අවබෝධකර ගත නොහැකිව අත්හැරී යනවා. ඒ වගේ වැරදි අර්ථකථන, බොරු මවාපෑම් නිසා ඔය ඇත්තො නොතේරෙන මහා බර වචනවල තේරුම් හොයන්නට වෙහෙසෙන්නට ඕන නැහැ. බුදුදහම ප්‍රායෝගිකව අවබෝධකළ හැකි, කළයුතු දහමක්, ඒ නිසා වචනවල ගිලෙන්නේ නැතිව, තමන්ට අවබෝධවන තේරෙන වචන පරිහරණය කරමින්, ඒ ඔස්සේ ධර්මාවබෝධය ලබන්නට උත්සාහ කරන්න ඕනෙ.... පැහැදිළි කරන්නම්... ඔය ඇත්තො හොඳින් තේරුම්ගන්න.

බුදුදහමෙහි උගන්වන්නේ පරමාර්ථ සත්‍යයි. මේ පරමාර්ථ සත්‍යය නොදන්නා උදවිය ගැලෙන්නේ සම්මුති සත්‍යයේයි. ඔය ඇත්තෝ දන්නව "සම්මුති"ය ගැන,

සංසාරය රඳාපවතින්නේ "සම්මුති" ඇතිතාක් පමණයි. එවන් සම්මුතීන් හා ගැලෙන බැඳෙන සත්ත්වයා දුක විඳිනවා. කවර හෝ සම්මුතියක් තුළ රැවටීමක්, මුලාවක් මිස සැබෑවක් නැහැ. සැබෑවක් නොවන සම්මුතියෙන් ලැබියහැකි සතුටක්, සැපතක් නැහැ. සතුටක, සැපතක ඡායාවක් පෙනුනත් එතැන පවතින්නේ දුක ඇති කිරීමේ හේතූන්මයි. මේ බව හොඳින් වටහා ගන්න ඕනෙ.

බුදුදහමෙහි ගැඹුරු අවබෝධය ලැබියහැක්කේ පිරිසිදු ජලයෙන් පිරුණු, ගැඹුරු ස්ථානයක පතුල දකින්නාක් මෙන් බොහොම සරල ස්වභාවයකින් මිස, සංකීර්ණතාවයන් ඇතිකර ගෙන ඒවා තුලින් නොවෙයි. එහෙම දේවලින් ධර්මය දකින්න බැහැ. ධර්මය අවබෝධකළ හැකි අනන්තවත් නිමිති නිරන්තරයෙන්ම අපවටා තිබෙනවා. ඒවා තේරුම්ගන්න ඉගෙනගන්න ඕනෙ. පුරුදුවෙන්න ඕනෙ.

මේ කෙලෙස්සහිත සම්මතලෝකයෙහි ලෝකයාගේ ව්‍යවහාරයට අනුව භාෂාවන් සකස්වී තියෙනවා... මේවා එකක්වත් නිත්‍යදේවල් නොවෙයි. සකස්කර ගත්ත දේවල්. ඒ නිසා "සංඛත" දේවල් කියාත් කියනවා. සකස්කර සම්මතකර ගත්ත දේවල්වලින් පිරුණු නොයෙකුත් සංකල්පයන් ලෝකයේ පවතිනවා. ලෝක ව්‍යවහාරයේ තිබෙන මෙවන් සංකල්ප දැඩිව ග්‍රහණය කරගෙන මතවාදයන්, වාද, විවාද පවත්වමින් ඒවායේම ඇලීසිටින, ඒවාටම හේත්තුවී සිටින ස්වභාවයක් ලෝක සත්ත්වයාතුළ තිබෙනවා. ලෝකයා භාවිතාකරන මේ සංකල්ප පිළිබඳව, ඒවායේ යථා

ස්වභාවයන් තේරුම් නොගැනීම නිසා ඒ ඒ සංකල්පවලම ඇලෙමින්, ගැලෙමින් සිටීමේ ස්වභාවය ලෝකයතුළ තිබෙන අවිද්‍යාවයි.

ලෝකනිරෝධය තත්ත්වාකාරයෙන්, සම්‍යක් ප්‍රඥාවෙන් දකින්නා හට, ලෝකයේ අස්තිරත්ත්වය, ලෝකයක් ඇතය කියන මිථ්‍යාසංකල්පය, ඒකාන්ත දෘෂ්ඨිය නැති වෙනවා. පරමාර්ථසත්‍ය සොයන ආර්‍ය ශ්‍රාවකයා, ලෝකයේ හටගැනීම් ස්වභාවයත්, ලෝකය නිරුද්ධවීමේ ස්වභාවයත් ප්‍රත්‍යක්‍ෂවශයෙන් ම දැනග න්නවා. අන්අයෙකුගේ කියමනක්, ප්‍රකාශයක් විශ්වාස කරනවා නොවෙයි. ප්‍රත්‍යක්‍ෂ ඥානයෙන්ම දැනගන්නවා. මේ ලෝකයේ ඇතිවීමත් නැතිවීමත් ආර්‍ය ශ්‍රාවකයා දැක ගනු ලබන්නේ තමාගේ ම ඉන්ද්‍රියයන් තුලින්මයි. සළායතන තුළින්, ඇස, කන, නාසය, දිව, ශරීරය මනස තුලින්මයි. ඒ ඔස්සේමයි. මේ ප්‍රත්‍යක්ෂ ඥානය ලබන්නේ, එය එසේ ප්‍රත්‍යක්ෂකර ගන්නවා හැරෙන්න මේ දැනීම අවබෝධය ලබන්නට වෙනත් විකල්පක්‍රම නැහැ.

ලෝකය භයෙහිම උපන්නේය. ලෝකය භයෙහිම පවතින්නේය. ලෝකය භයම ඇසුරු කරන්නේය. සත්ත්වයා මේ භයෙහිමගැලී වෙහෙසට පත්වෙනවා. අයසට පත් වෙනවා.

අධ්‍යාත්මික ආයතන භයෙහි ලෝකය හටගන්නවා. බාහිර ආයතනයන් භය හා එක්ව සබඳකම් පවත්වනවා. ඊළඟට අධ්‍යාත්මික භය අල්ලගෙන බාහිර භය ගැන වෙහෙසෙනවා.

තනිව, ඇස්, කන්, නාසාදියෙන් ලෝකය ඇතිවෙන්නේ නැහැ. එකකට එකක් ප්‍රත්‍ය වෙන්න ඕන. පටිච්චසමුප්පන්නවීමට දෙකක් අවශ්‍යයි. බුදුදහමෙහි ගැඹුරු දර්ශනය එතැනමයි.

ඇසත් රූපයනුත් ප්‍රත්‍ය වී, ඒ දෙක මුල්කර ගෙනයි දැකීම පිළිබඳ විඥානය ඇතිවෙන්නෙ. කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා නමැති ත්‍රිවිධ තෘෂ්ණාවන් සපිරිමතකය හඳුන්වනු ලබන තනි වචනය "විඥාණ" යයි. ඇසත්, රූපයත් විඥානයත් යන තුනේ එකතුව ස්පර්ශයයි. මේ ආදී වශයෙනුයි හටගැනීම සිදුවන්නේ, ලෝකය හටගන්නවා දකිනකොට, ලෝකයේ කිසිවක්නැත කියා කියන්න බැරි තත්ත්වයක් එනවා. ඒ වගේම තමාගේ සළායතනතුළින්ම ලෝකයේ නිරෝධය දකිනකොට, ලෝකයේ සියල්ලක්ම ඇත කියන්න පුළුවන් අන්තයක් ලැබෙන්නේ නැහැ.

මේ ධර්මතාවයන් ගැන කථාකරන්න, අනෙකෙකු හට කියාදෙන්න නම් ධර්මය පිළිබඳව ප්‍රත්‍යක්ෂඥානය තියෙන්න ඕනෙ. ධර්මය ප්‍රත්‍යක්ෂකරගෙන තියෙන්න ඕනේ. එහෙම නැතිව පතපොත කියැවීමෙන්, ඇසීමෙන් පමණක් ලබන අවබෝධයමදි. ඒ අනුමානඥානයයි. ඒවා තමන්ගේ ජීවිතයට එක් කරගෙන ඒ අනුව ධර්මයෙහි පවසන දේවල් හා අපට ප්‍රත්‍යක්ෂවන දෙයත් එහි නිරවද්‍යතායවයත් වටහාගන්න ඕනෙ. අනාගතයෙහි පහළවන ඇතැම් භික්ෂූන් ශාසනයේ පරිහාණියේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්වාණය පිළිබඳව කථාකරන ගැඹුරු සුන්‍යතාප්‍රතිසංයුක්ත සූත්‍ර පිළිබඳව අවධානය යොමු නොකරණ බවත්, ඒවා ඇසීමට හෝ ඉගෙනීමට

උත්සුක නොවන බවත් සංයුක්තනිකායෙහි "ආණි" සූත්‍රයෙන් සම්බුදුපියාණන් වදාරා දක්වා තියෙනවා.

දිරායන (කරජකය) මේ කය, රූපයලෙසත් සිත නාමයලෙසත් හඳුන්වන තත්ත්වයක් තියෙනවා. එය වැරදි නොවේ. නිවැරදිමත් නොවේ. කය රූපය ලෙසත් සිත නාමය පමණින් ලෙසත් ගැනීම නිසා තමයි මමය, මගේය, කියන මිථ්‍යා පාඨයෙන් බැහැර වෙන්න මේ තරම්ම අපහසුවෙලා තියෙන්නෙ.

රිදෙනවා, මෙය කවරආකාරයකින් හෝ පෙන්විය හැකිද? නොහැක්කේමය. එහෙත් රිදීම ඇතිලෙසින් දකින්නේය. පිළිගන්නේය. එහි ගැලෙන්නේ විඳින්නේය. විඳවන්නේය. ඇහැට දකින්නබැරි අතින් අල්ලගන්නබැරි මනසිකාරයක් සැබවින් පවතින්නක් සේ වැළඳගෙන විඳවනවා. මේ වැරදිදැක්මයි වටහාගන්න ඕනෙ. තමන් සිටින්නේ මුළාවක බව තේරුම් ගන්න ඕනෙ. ඒ හේතුව තේරුම් ගත්තම හේතුව අත්හරින්න පුළුවන්. ඉන් වළකින්න පුළුවන්. එහෙමයි දුක නැතිකරන්න පුළුවන් වෙන්නේ. භව සන්තතිය නතරකරන්න පුළුවන් වෙන්නේ.

නාමරූප ධර්මතාවයන් පැහැදිලි කිරීමේ දී, ඇතැම් තැන්වල විශාල වශයෙන් නොපැහැදිලි ස්වභාවයන් තියෙනවා.

නාමය සියල්ල යටපත්කොට සිටී. මේ කාලයේ අර්ථ දැක්වීම්වලදී පවා එහි ඇති මූලික අර්ථය යටපත්වී ගිහිං තියෙනවා.

මේ ලෝකයේ සත්ත්වයන් නම්කර ඇති දෑ පිළිබඳව සංඥාව ඇත්තාහුය. එයින් ඔබ්බට යන්නේ නැහැ. ඒ

නම්කර තිබෙන දේ පිළිබඳව පැහැදිලි අවබෝධයක්, ප්‍රත්‍යක්ෂකර ගැනීමක්, නැතිකම හේතුවෙන් මාරයාගේ වසඟයට පත්වෙනවා.

එතකොට හොඳට පෙනෙනවා, වැටහෙනවා යම් තැනෙක නාමයත් රූපයත් - රූපසංඥාවත් මුළුමනින්ම උපරෝධනයවෙයිද? වළකාලනු ලැබෙයිද? - එතැනයි මේ අවුල ලිහෙන තැන.

ලෝකයාට ඇස් තිබුණාට - බුදුන් වහන්සේගේ වචනය හැටියට - ධර්ම චක්ෂුසය පෑදෙනකන් ලෝකයා අන්ධයි.

"(ස්පර්ශය) හැපෙන එක - හැපෙන හැපෙන තැන හැපෙන හැපෙන දෙය. ඒ හැපීමෙන්මයි හඳුනා ගන්නේ. ගැටීමක් ඒ ගැටීම හඳුනාගැනීම වශයෙන් ඇති කර ගන්න රූපසංඥාවක්, මේ ගැටුනේ යම් "තදදෙයක, බුරුල්දෙයක, උණුසුම්දෙයක ආදී වශයෙන් ඒ ඒ ඒවා පිළිබඳව සංඥාවල් ඇතිකර ගන්නවා. මේක ඉතින් ඒ වගේම මෝඩයින් ගණනක් සම්මතකර ගතහොත් ඒක ලෝක සම්මුතියක් වෙනවා. සත්‍යවෙනවා. මේකතමයි වචනය"

යම්කිසි කෙනෙකු, යම්කිසි දෙයක "නම" දන්නවා නම්, ඒ තැනැත්තා ඒ දෙය දැනගත්තා කියා අවබෝධයක් එනවා. පිළිගැනීමකුත් ඇතිවෙනවා.

ඔන්න ඔයවිදියේ පටලැවිල්ලක්නිසා තමයි ලෝකය අවුලක්වෙලා තියෙන්නේ. බුදුපියාණන් වහන්සේ ලෝකය

අවුලක් හැටියට වදාරා ඇත්තේ මේ නිසයි. නාමරූප යම්තාක්කල් විඥාණය සහිතව තිබෙනවාද? ඒතාක්කල් කෙනෙක් උපන්නයි කියන්න පුළුවන්. චුතවෙනවා කියන්නත් පුළුවන්. යළි උපදිනවා කියන්නත් පුළුවනි.

මේ තාක් පවතින්නේ අධිවචන මාර්ගය. සාමාන්‍ය භාෂාවල තියෙන අධිවචන, නිරුක්ති, ප්‍රඥප්ති භාෂාව පිළිබඳ අංගෝපාංග කියලා දැනට හිතාගත්තාම ඇති. දැන් මෙතැනින් පැහැදිලිවම පෙනෙනවා මේ ඔක්කොම නාමරූප විඥාන දෙක අතරට සම්බන්ධ දේවල්ය කියන එක. කෙලෙස් සහිත ලෝකයාගේ ව්‍යවහාරයටයි භාෂාව සකස්වෙලා තියෙන්නේ.

මෙය ඇති කල්හි, මෙය වෙයි. මෙය නැතිකල්හි මෙය නොවෙයි, මෙය හටගැනීමෙන්, මෙය හටගනී. මෙය නිරුද්ධවීමෙන් මෙය නිරුද්ධ වේ.

මෙතැනක් ඇතිවුවොත් අතනක් ඇතිවෙනවා. අතනත්, මෙතැනත් අතර හිඩැසක් පවතිනවා. පෘතග් -ජනයා අතනත් දකිනවා. මෙතැනත් දකිනවා. හිඩැසෙහි පවතිනවා. පවතින තැන දකින්නේ නැහැ. බලන්නේ නැහැ. අවිද්‍යාව සැඟවිලා ඉන්නේ මෙතැනයි. මේ නාමරූපවල ආවරණයෙනුයි. මේවායින් මිදීමේ මාර්ගයයි. මේවා දැකීමේ මාර්ගයයි. විදර්ශනාව, විදර්ශනා මාර්ගය දුවමින් බලන්න බැහැ. බැලුවට හරියට පෙනෙන්නේ නැහැ. නැවතිලා බලන්න ඕනේ. රූපය හා වේදනාව හා සංඥාව හා විඥානය හා යම් සංස්කාර ධර්මයෙක් වේනම් එය හා මේ පස්කඳ (පංච ඉන්ද්‍රියයෝ) මම නොවෙමි. මෙසේ එහි නොඇලේ.

මේ සංසාරවට්ටය - සංසාර නැමැති මේ දියසුළිය මෙතෙක් දුරට කරකැවෙනවා.

කෙසේ මේ දියසුළිය නවතින්නේ ද?

කොතැනක මේ දිය සුළිය අවසන් වන්නේ ද?

යම් තැනෙක පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතරමහාභූතයෝ ප්‍රතිෂ්ඨාවක් නොලබත්ද අන්න එතැනින් තමයි අර දියවැල හැරෙන්නේ. අන්න එතැන තමයි නාමයත් රූපයත් නිරුද්ධවන්නේ. අන්න එතැන තමයි දියසුළිය නොකරකැවෙන්නේ.

වියැලීගිය දියවැල නොගලයි. සිඳිනලද දියසුළිය තවදුරටත් කරකැවෙන්නේ නැත. මෙතැන කියැවෙන්නේ රහතන්වහන්සේලා පිළිබඳවයි.

පංචඋපාදානස්කන්ධයාගේ ස්වභාවයන් වටහා ගැනීමට හැකි හොඳ උපමාවක් මෙසේ කිවහැකියි.

බහ තෝරන්නබැරි කුඩාදරුවෙක් ඉන්නවා. ඒ දරුවට කිසිවෙක් විසින් රබර් බෝලයක් දෙනවා. දරුවා මේක දැක්කෙ පළමු වරටයි. මේක රබර් බෝලයක් කියල කිසිවෙකු කිව්වත්, බහ තෝරන්නබැරි දරුවට ඒක තේරෙන්නේ නැහැ. කොහොමද දරුවා මේක හඳුනාග න්නේ. රබර් බෝලය නහයට කිට්ටුකරල බලනව. දිවගාල බලනවා. කන්න පුළුවන් දෙයක් ද කියල බලනවා. දොඩම් ගෙඩියක් වගේ ඔබල බලනවා. ටිකක් පෙරලලා බලනවා. මේක ඉතින් හොඳට ලස්සනට පෙරළෙන නිසා, මේක සෙල්ලම් කරන්න හොඳඑකක් කියලා තේරුම්ගන්නවා.

"එතකොට අර වේදනා, සංඥා, චේතනා, ඵස්ස මනසිකාර කියන මේ නාමධර්ම මුල්කරගෙන තමයි අර දරුවා රබර්බෝලය හැඳිනගන්නෙ. එහෙම නැතිව ලෝකසම්මුතියෙ තියෙන රබර්බෝලය කියන නමින් නොවෙයි."

යම්කිසි දෙයකට ලෝකයා එතෙක් නමක්දීලා නැත්නම්, ඒක පිළිබඳව ව්‍යවහාර කරණකොට නමක් නැතිඑක කියලවත් ව්‍යවහාරකරන්න වෙනවා. කොහොම හරි නමක්දාන ස්වභාවයක් තියෙනවා.

මේ කියපු මූලික ධර්ම අනුව අපි මෙතැනින් ඇත්ත වශයෙන්ම තේරුම්ගන්න තියෙන්නේ "ලෝකය" පිළිබඳව මොනතරම් අවබෝධ තිබුනත්, හැඳිනගතයුත්තෙ මේ නාමරූප ලෝකයයි.

මේ නාමරූප ලෝකය හඳුනාගන්න ඕනෙ නම් අර කුඩාදරුවගෙ තත්ත්වයටම එන්නඕනෙ. නමුත් ඒ අඥාන උපේක්ෂාව වෙනුවට ඥානසම්ප්‍රයුක්ත උපේක්ෂාවකින් යුක්තවයි. ඒ සඳහා තමයි "සතිසම්පඤ්ඤය" උපකාර කරගෙන නාමරූප ධර්ම තේරුම් ගන්නෙ. ලෝකයේ ප්‍රකට නාමආශ්‍රයෙන් ඒ ඒ ද්‍රව්‍ය තමන් හඳුනා ගෙන තිබුනත්, එතෙන්දි නාමරූප පිරිසිඳ දැනගැනීම සඳහා ධර්මය ප්‍රත්‍යක්ෂ කරගැනීමෙ උත්සාහයේ නිරතවන්නා පාවිච්චි කරන්නේ අර කියාපු ධර්ම. ඵස්ස, වේදනා, සංඥා, චේතනා, මනසිකාර.

මේවා එක් එක් පුද්ගලයාට, දේවල්වලට විවිධාකරයි. විශේෂිතයි. "පච්චත්තං වේදිතබ්බො" කියල කියන්නෙත්

ඒකයි. මේ ධර්ම, තමන්ම ප්‍රත්‍යක්ෂකර ගත යුත්තක්. තමන්ගේ නාමරූප ලෝකය හඳුනාගන්න ඕනෙ තමන්මයි. වෙනකෙනෙකුට හඳුන්වන්න බැහැ. වටහල දෙන්න බැහැ. වෙන ශාස්ත්‍රීය වචන වලින් හෝ වෙනත් ආකාරයන්ගෙන් ඒක පෙන්නුම් කරන්න බැහැ. එතකොට මේ "දුක" තියෙන්නෙ මේ නාමරූප ලෝකයේමයි. බුදුපියාණන් වහන්සේ වදාළ මේ දුක තිබෙන්නෙ අර නොයෙකුත් දෘෂ්ඨිවලට ගැතිවුන අය දක්වන ආකාරයෙන්, ඒ විධියට ඒ සම්මත ලෝකයේ නොවෙයි. මේ නාමරූප ලෝකයේමයි.

"නිවනේ නිවීම" (කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු)

ධර්මයේ පැහැදිලිකිරීම්වලදී පවතින්නේ එකම ආකාරයක් නොවෙයි. එක් එක් අය එක එක ආකාරයෙන් තම තමන්ට අවබෝධවන ආකාරයෙන් විස්තර කරනවා. හරියට "මජ්ජෙ" සූත්‍රයෙහි දී කියනවා වගේ.

අපි ඒ දිහාවට ටිකකට යොමුවෙලා බලමු.

## අන්තයන් කවරේ ද?

ඒ රහත්භික්ෂුතෙම අන්තයන්දෙක නුවණින් දැන මධ්‍යයෙහි නොඇලේනම් ඔහු, මහාපුරුෂයා'යි කියමි. මේ පංචස්කන්දයෙහි අලවන්නා වූ, තෘෂ්ණාව ඉක්ම ගියේයැ'යි තථාගත සම්මාසම්බුදු පියාණන් විසින් "තිස්ස මෙත්තෙය්‍ය" තරුණයාගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් වදාරන ලදී.

ඇවැත්නි, එක් අන්තයක් කුමක් ද? දෙවන අන්තය කුමක් ද? මධ්‍යය කුමක් ද? සිබ්බනී නම් කවරේ ද?

මෙසේ විමසූකල්හි එක් භික්ෂුවක් අනෙකුත් භික්ෂූන්හට මෙසේ පැවසීය.

ස්පර්ශවශයෙන් උපන් හෙයින් අතීතයෙහිලා ගැනෙන ස්පර්ශය එක් අන්තයකි.

අනාගතයෙහිලා ගැනෙන ස්පර්ශ සමුදය (ඉපදීම) දෙවන අන්තයවේ.

නිර්වාණයෙහිලා ගැනෙන වර්තමාන ස්පර්ශය නිරෝධය මධ්‍යය වෙයි.

තෘෂ්ණාව අලවන්නීය (විසන්තිකා) වේ. තෘෂ්ණාවම ස්පර්ශය හා ස්පර්ශ සමුදය අනාගත භවය ඇති කිරීමෙහිලා වන්නේ ය.

ඇවැත්නි, මෙයින් ශ්‍රමණ තෙමේ චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳව දතයුතු දේ මනාකොට දැනගන්නේය. ලෞකික, ලෝකෝත්තර සත්‍යද්මය ප්‍රත්‍යක්ෂකර ජගන්නේය. මනාකොට දැනගනුයේ ප්‍රත්‍යක්ෂකරගනුයේ එතැන්හිම ජාතිදුක්ඛය කෙළවර කරන්නේය.

මෙසේ කී කල්හි අනෙක් භික්ෂුවක්, අන්‍ය භික්ෂුනට මෙසේ කීය.

අතීතාත්මභාවය එක අන්තයකි

අනාගත ආත්මභාවය දෙවන අන්තයයි.

වර්තමාන ආත්මභාවය මධ්‍යයයි.

තෘෂ්ණාව, සිබ්බනියයි. (බැඳතබන්නියයි) බැඳුම්කාරියයි.

අලවන්නියයි. තෘෂ්ණාව ඒ ඒ භවයාගේ ඉපදීම සඳහා අතීතය හා අනාගතය එකිනෙකට යා කරන්නේය.

ඇවැත්නි, මෙපමණකින් වටහාගනී. ප්‍රත්‍යක්ෂ කරගනී.

මෙසේ අවබෝධකරගන්නා, ප්‍රත්‍යක්ෂඥානය ඇති කරගන්නා මැනවින්දන්නා තැනැත්තේ මේ ජාතියෙහිදීම දුක් කෙළවර කරන්නේය.

මෙසේ කීකළ, අනෙක් භික්ෂුවක්, සෙසු භික්ෂූන්හට මෙසේ කියන්නේය.

ඇවැත්නි, සුඛවේදනා එක් අන්තයකි,

දුකවේදනා දෙවන අන්තයයි.

සුඛ, දුක් නොවන වේදනා මධ්‍යයයි.

තෘෂ්ණාවම සිබ්බනිය, විසත්තිකාවය, අලවන්නීය, මැහුම්කාරියවන්නීය.

ඒ ඒ භවයාගේ යළි පැවැතීම සඳහා එකිනෙකා එක්කරන්නේ ය. මෙසේ මැනවින් අවබෝධකර ගන්නා භික්ෂුව මේ ජාතියෙහිදීම දුක කෙළවර කරන්නේය.

මෙසේ කීකළ අන්‍යභික්ෂුවක්, සෙසු භික්ෂූන් අමතා මෙසේ කීය.

ඇවැත්නි, නාමය එක් අන්තයකි.

රූපය දෙවන අන්තයයි.

ප්‍රතිසන්ධි විඥානය මධ්‍යයයි.

තෘෂ්ණාව මහන්නීය, එක්කරන්නීය, මේ ආකාරයෙන් මැනවින් අවබෝධකරන්නාවූ ප්‍රත්‍යක්ෂකරන්නාවූ භික්ෂූතෙම, මේ ජාතියෙහිදීම දුක කෙළවර කරන්නේය.

මෙසේ කීකල්හි තවත් භික්ෂුවක් අනෙකුත් භික්ෂූන් අමතා මෙයාකාරයෙන් කීය.

අධ්‍යාත්මික කායයන් සය එක් අන්තයකි.

බාහිර කායයන් සය දෙවන අන්තයයි.

කර්ම විඥානය මධ්‍යයයි.

තෘෂ්ණාව සිබ්බනියයි. මැහුම්කාරියයි. ඒ ඒ භවයාගේ ඉපදීම පිණිස එකිනෙකා එක්කරයි. පවත්වයි. මේ පිළිබඳව මැනවින් ප්‍රත්‍යවේක්ෂාකරනුයේ මැනවින් අවබෝධකරයි. මෙසේ ප්‍රත්‍යක්ෂකරගන්නා භික්ෂුව මේ ජාතියෙහිදීම සියළුදුක් කෙළවර කරන්නේය.

මෙවිට වෙනත් භික්ෂුවක් අන්‍ය භික්ෂූන් අමතා මෙසේ ප්‍රකාශ කළේය.

සක්කාය එක් අන්තයකි

සක්කාය සමුදය දෙවන අන්තයයි

සක්කාය නිරෝධය මධ්‍යයයි.

තෘෂ්ණාව සිබ්බනියයි. තෘෂ්ණාවම ඒ ඒ භවයාගේ යළි ඉපදීම පිණිස එක් කරන්නේය. ඇවැත්ති, මෙලෙසින් වටහා ගන්නා මැනවින් අවබෝධ කරගන්නා වූ ප්‍රත්‍යක්ෂකරග න්නා වූ භික්ෂුව මේ ජාතියේදීම දුක කෙළවර කරන්නේය.

ඇවැත්නි, අපි හැමදෙන විසින් ම තම තමන්ගේ දැනීම ප්‍රකාශ කරනු ලැබූයෙමු. ඇවැත්නි. අපි, භාග්‍යවතුන් වහන්සේ හමුවට යමු. උන්වහන්සේහට මේ කරුණු සැළකර සිටිමු. උන්වහන්සේ පැහැදිලිකිරීමක් කරනුයේ නම්, අපි ඒ පිළිබඳව මැනවින් දැනුවත් වෙමු.

ඒ හැම භික්ෂුන්ම භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ, තම තමන්ගේ ප්‍රකාශයන් පිළිබඳව සැළකර, කවුරුන් හෝ නිවැරදිදැ'යි විමසා සිටියෝය.

මහණෙනි, මේ කරුණෙහිදී ඔබහැමගේ ප්‍රකාශයන් නිවැරදිය. එසේ වුවත් නිවන්මග ප්‍රඥාව පිණිස යමක් කියමි.

ඒ රහත් මහණ ප්‍රඥාවෙන් උභයාන්තයන් දැන මධ්‍යයෙහි නොඇලේනම්, ඔහු මහාපුරුෂයැ'යිද මෙළොව සිබ්බනී සංඛ්‍යාත ඇලෙන්නා වූ ලෙසින් ගැනෙන තෘෂ්ණාව ඉක්මගියේය'යි වදාරණ ලද්දේනම් එය මැනවින් අසව, මෙනෙහි කරවය'යි කියමි.

ස්වාමිනි, එසේමය.

මහණෙනි, අතීතජාතිය වශයෙන් ගැනෙන ස්පර්ශය එක්අන්තයකි.

අනාගතජාති වශයෙන් ගැනෙන ස්පර්ශ සමුදය දෙවැනි අන්තයයි.

ස්පර්ශනිරෝධය මධ්‍යය වෙයි. තෘෂ්ණාව සිබ්බනියයි. තෘෂ්ණාවම ඒ ඒ භවයාගේ නැවත උත්පත්තිය සඳහා ඒවා එක්කරන්නේය.

මහණෙනි, මෙපමණකින්, මහණ දත යුතු දේ දැන ගනියි. ප්‍රත්‍යක්‍ෂ ඥානයෙන් ප්‍රත්‍යක්‍ෂකරගනී. විශිෂ්ඨ ඥානයෙන් දතයුතුදේ මැනවින් අවබෝධකොට, ප්‍රත්‍යක්ෂකොට මේ ජාතියෙහිදීම දුක නිම කරන්නේය.

(මජ්ඣෙ සූත්‍රයෙනි)

දැන් පැහැදිලිවෙනව ඇති ධර්මයේ පැහැදිලිකිරීම පවතින ස්වභාවය. ඒ නිසා කවර ආකාරයේ දැක්වීමක්, පෙන්වාදීමක් සිදුකෙරුණත් තමතමන්ගේ ප්‍රඥාවට අනුව ඉතාමත්ම පරීක්ෂාකාරීව සියුම් ආකාරයෙන් තේරුම් ගන්න ඕනේ.

අපි මේ පිළිබඳව කරුණු සොයමින්, කථා කරමින් ඉදිරියට යමු. අවසානයේ අපට යථාර්ථය අවබෝධ වේවි.

## ආස්වාදය හා මුලාව

අපි හිතමු නාට්‍යයක් හෝ චිත්‍රපටයක් බලනවා කියලා. එහි රඟන නළුනිළියන් දැකිය හැකියි. ඔවුන් විවිධ චරිත රඟදක්වනවා. ඒවා මවාපෑම් බව අපි හොඳින්ම දන්නවා. ඒ ඒ චරිතවල පෙනීසිටින්නන්ගේ සැබෑ ස්වභාවයන් යම් ප්‍රමාණයකින් දන්නවා. නොදන්නවා වෙන්නත් පුළුවනි. කොහොම වෙතත් මෙතැන සිදුවන්නේ රඟපෑමකි බව හොඳින් ම දන්නවා.

එහෙම රඟපෑම් වගයක් බව දැනදැනම වුනත් ඒවා රඟපෑම්බව මෙනෙහි කරන්නට කවුරුන්හරි කැමති වෙනවාද? නැහැ. රඟපෑම් ඔස්සේ ඉදිරිපත්වන මවාපෑම් වලින් ආස්වාදය ලබනවා. ඒවා සතුට උපදවන ජවනිකා

වෙන්න පුළුවනි. දුක උපදවන ජවනිකා වෙන්න පුළුවනි. ත්‍රාසය උපදවන ජවනිකා වෙන්න පුළුවනි. මේ කවර ආකාරයේ ඒවා වුනත් ආස්වාදය ලැබීමේ නිරතවෙනවා. ඒ ආස්වාදය නැතිවෙනවාට කැමතිනැහැ. විඳිනවා. වින්දනය ලබනවා. පළමු කොටස් අවසන්වුනහම දෙවන කොටස ඉදිරිපත්කරන කල් බොහොම උනන්දුවෙන් බලා සිටිනවා.

මායාවබව දන්නවා. මවාපෑම්බව දන්නවා. ඒත් අත්හරින්න කැමති නැහැ. ආස්වාදය විඳිනවා. සිනහ වෙනවා. අඬනවා. ත්‍රාසයෙන් මුසපත්වෙනවා. සතුටු වෙනවා. දුක්වෙනවා. සැබෑවක් නොවන රඟපෑම්දිහා බලාගෙනම, ඒවාතුළම තමනුත් කොටස්කාරයෙකු වෙනවා. දායකයෙකු වෙනවා. කවදා හෝ මේ මායා ස්වභාවය අවබෝධකර ගෙන ආස්වාදය වෙනුවට සත්‍ය දකිමින් ඒවායින් බැහැරවෙනවා නම් එතැන ගැලවීමයි. ඔන්න තණ්හාව, මුළාව, අවිද්‍යාව, බොහොම පහසුවෙන්ම දැකගන්න පුළුවන්. වටහාගන්න පුළුවන් තෘෂ්ණාභරිත පෘතග්ජනයා මවාපෑම තුළම වෙළෙමින් ආස්වාදය ලබනවා. මවාපෑම් බව දැනදැනම ඉන් බැහැර වෙන්නට නොකැමැති වෙනවා. මායාවෙහිම ගැලෙනවා.

මේ දිරායන කය, දිරායන බව පෙනෙනවා. මනසිකාරයන් - සිතුවිලි වෙනස්වනබව පෙනෙනවා. උපදිනබව දන්නවා. මැරෙනබව දන්නවා. අනිත්‍යබව දන්නවා. දුකබව දන්නවා. ඒ වුනත් ඒවායෙන් ගැලවෙන්නට බයයි. ඇයි, මේ වින්දනයන් ආස්වාදයන් නැතිවෙයි කියන බයට.

මේක බොරු භයක්. තමන් විසින්ම ඇතිකරග න්න භයක්. බලන්නට චිත්‍රපටය නොතිබුනානම්, නාට්‍ය නොතිබුනානම්, ඒවා තුළින් ඇතිවුන ආස්වාදයක් ලැබෙනවාද? නැහැ. ඒවා කෙරෙහි අනුගතවීමෙන් නේද ආස්වාදය පවතින්නේ. ආස්වාදය සොයන්නට යෑමනේද නාට්‍ය බලනවා කියන්නේ. චිත්‍රපට බලනවා කියන්නේ ආස්වාදය ලැබීමට ඇති තෘෂ්ණාව, ආශාව, ඕනෑකම නිසා නේද ඒවා තිබෙනතැන් සොය සොයා යන්නේ. ඒවායින් බැහැර ජීවිතයක් නොපෙනෙන්නේ.

මේ භවනාටකයත් ඔය වගේ තමයි. දුකබව පෙනෙනවා. අත්හැරිය හැකිබව දැනෙනවා. ඒත් ආස්වාදයට ඇති ලෝභකම නිසා අතහරින්නේ නැහැ හඹාගෙන යනවා. ඒවායෙහිම දැවටෙනවා. අල්ලගන්නවා. අතහරිනවා. අහුවෙනවා. අතහැරෙනවා. උපදිනවා. මැරෙනවා. එකක් අතහැරෙනකොට තවඑකක් සොයා ගන්නවා. අල්ලග න්නවා මේකෙ නිමාවක් නැහැ.

ඒ වුනත් ප්‍රඥාවන්තයා, මේ මායාව තේරුම් ගන්නවා. සත්‍ය වටහාගන්නවා. තවදුරටත් මායාවෙහි ගැලෙන්නේ නැහැ. ලාමක ආස්වාදයක් සොයන්නේ නැහැ. ලබන්නේ නැහැ. විඳින්නේ නැහැ. මුලාවෙන් ගැලවුන තැන විඳින්නට ආස්වාදහක් නැහැ. එතැන සතුටක් තියෙනවා. ප්‍රීතියක් තියෙනවා. ඒ කිසිවක් ඉලක්කකොට ගත් ප්‍රීතියක් නොවෙයි. සතුටක් නොවෙයි. එතැන බැඳුනු කිසිවක් නැහැ. බැඳීම් නැහැ. නිදහසයි. කිසිවක බැඳීමක් නැති නිසා නිරාමිසයි. නිරාමිස ප්‍රීතියයි.

**බහුම්පි වෙ සහිතං භාසමානො**

**න තක්කරො හොති නරො පමත්තො**

**ගොපො,ච ගාවො ගණයං පරෙසං**

**න භාගවා සමඤ්ඤස්ස හොති**

ප්‍රමාදි වූ යමෙක් සියළු ධර්මකාරණා ඉගෙන බොහොම බණ කියතත්, තමා එය නොපිළිපදිනම්, නොසළකයිනම්, මහණදම් ඵලයට හිමිකාරයෙක් නොවන ඔහු අනුන්ගේ හරකුන් බලන ගොපල්ලෙක් වැනිය.

**අප්පම්පි වෙ සහිතං භාසමානො**

**ධම්මස්ස හොත් අනුධම්මචාරි**

**රාගං ච දොසං ච පහාය මොහං**

**සම්මප්පජානො සුවිමුත්ත චිත්තො**

**අනුපාදියානො ඉධ වා හුරං වා**

**ස භාගවා සාමඤ්ඤස්ස හොති**

යමෙක් ධර්මය මදවශයෙන් කියතත්, ධර්මය අනුව පිළිපදීනම්, ඔහු රාග, ද්වේශ, මෝහ දුරුකොට හොඳ නුවණින් හා මිඳුන සිතින් යුක්තව මෙලොව පරලොව කිසිම බැඳීමක් - ගැනීමක් - නැතිව මහණදම් ඵලයට හිමිකාරයෙක් වෙයි.

ධම්ම පදය (යමක වග්ග)

මේ බුද්ධ භාෂිතයයි. ඒ අනුව අපි ප්‍රායෝගිකවම ධර්මකාරණාවන් ඉගෙනගෙන ඒවා ප්‍රත්‍යක්ෂ කරගන්නට

වීයඝ් කළ යුතුයි. අන්න ඒ පදනමේ සිට අපි මේ ධර්ම සාකච්ඡාව ඉදිරියට ගෙන යමු.

# දුක්ඛ සමුදය

**කතමඤ්ච භික්ඛවෙ දුක්ඛ සමුදයො අරියසච්චං**

**යායංතණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා**

**තත්‍රතත්‍රාභිනන්දනී සෙය්‍යථීදං කාමතණ්හා භවතණ්හා විභවතණ්හා ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛ සමුදයො අරියසච්චං**

මහණෙනි, දුක්ඛ සමුදය ආයඝ් සත්‍යය කවරේද යත්, නිරතුරුව පුනර්භවය ඇති කරන්නා වූ පැතිර වැඩෙන්නා වූ දැඩි ලෙසින් ඇලෙන්නා වූ බැඳෙන්නා වූ විඳීමෙහි දැඩි කැමැත්තක් ඇත්තා වූ, නන්දිරාගය අනුව යමින් ඒවායේ ආස්වාදයලබන යම් තෘෂ්ණාවක්වේද, ඒවා කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා නම්වෙයි. මහණෙනි, මේ දුක්ඛ සමුදය ආඝ්ය" සත්‍ය'යි (දුක ඇතිවීමේ හේතු යයි) කියනු ලැබේ.

## පංච උපාදානස්කන්ධ

යම් ධර්මයක ඉපදීමට, පැවැත්මට, මූලික වශයෙන් සිටිමින් උපකාරීවීම හේතුප්‍රත්‍යයයැ'යි පැවසෙනවා. මෙහි හේතුවශයෙන් ගෙන ඇත්තේ, අලෝභ, අදෝෂ, අමෝහ - ලෝභ, ද්වේශ, මෝහ යන හයයි.

මේවායින් ලෝභ, ද්වේශ, මෝහ යන හේතු තුන අකුසලයෝමයි.

අලෝභ, අද්වේෂ, අමෝහ යන තුන සැමවිටම කුසල පක්ෂයේයි.

අකුසල පක්ෂයේ එන හේතු තුන කාමාවචර හෝ රූපාවචර හෝ අරූපාවචර හෝ ලෝකුත්තර විය හැකියි.

මෙම හේතු සය නැවත, කුසල, අකුසල, විපාක, ක්‍රියා වශයෙන් සතර ගොඩකට බෙදෙනවා.

කුසල චිත්තයන් හා සම්බන්ධවන විට කුසලහේතු නමින් ද අකුසල චිත්තයන් හා සම්බන්ධවන විට අකුසලහේතු නමින් ද විපාක සිත් සමඟ සම්බන්ධවන විට, විපාකහේතු නමින්ද, ක්‍රියා සමඟ සම්බන්ධ වන විට ක්‍රියාහේතු නමින් ද හඳුන්වනු ලබනවා.

(පට්ඨාන ප්‍රකරණය - හේතු ප්‍රත්‍යයෙන්)

පඤ්චෝපාධානස්කන්ධයට අරමුණුවන සිත් සියල්ල වෙන්වෙන් වශයෙන් සඳහන් කරන්නට නොහැකියි. ලොවෙහි ඇති සියළුම පදාර්ථ ද, ලොවෙහි විද්‍යාමාන නොවුවත්, විද්‍යාමාන වෙතැ'යි පරිකල්පනය කරණු ලබන සෑම දේද, දතහැකි සියල්ල ද ආරම්මණයෝ වෙයි. අරමුණුවෙයි. ආරම්මණ නොවන, අරමුණු නොවන කිසිදු ධර්මයක් නැහැ. එක් එක් සත්ත්වයා තුළ විවිධාකාරයේ අනන්ත වූ, අප්‍රමාණ වූ අරමුණු තියෙනවා. ඇතිවෙනවා. ඒවා එකක් හෝ සදාකාලික නොවේ. නිරන්තරයෙන් වෙනස්වන්නේ වෙයි. එකම නිමිත්තක අරමුණක්වුනත් සෑම සත්ත්වයාතුළම එකම ලෙසකින් දැකීමක්, දැනීමක්, ගැනීමක් සිදුවන්නේ නැත. ඒ නිසා මේ සියල්ලම නම්කිරීම කළ නොහැකි දෙයකි. එබැවින් අරමුණු හා සම්බන්ධකම්

පවත්වන ආයතනයන්ගේ නම්වලට එකතුකොට රූප අරමුණු, ශබ්ද අරමුණු ගන්ධ අරමුණු, රස අරමුණු, ස්පර්ශ අරමුණු, ධර්ම අරමුණු යන කොටස් සයකට බෙදනු ලැබේ. සියලුම ආකාරයේ අරමුණු මේ සයට ඇතුලත් වෙයි.

කවදා හෝ කිසිවෙකුගේ ආයතන සයෙන් එකකට හෝ අරමුණුනොවූවක් ඇත්නම්, එය කිසිවෙකු නොදන්නා දෙයකි. අරමුණු සංඛ්‍යාවන් නිතිපතා වැඩිවීමට ලක්වෙයි. ආදිකල්පිත වනචාරි මිනිසා තුල තුවක්කුව පිළිබඳව සිත් පහළ නොවන්නට ඇත. පැරණි රජදවස මිනිසාතුළ ගුවන්විදුලිය, පරිගණකය පිළිබඳව සිත් පහලනොවූවාට සැකනැත. එමෙන්ම පෙර කාලවලදී නොතිබුණ නමුත් පසුව නිපදවා ගත් පෙරකාලවලදී නොතිබුණ නමුත් පසුවනිපදවා ගත් පෙරනොතිබුණ එහෙත් පසුව බිහිවුණ, නිර්මාණයවුන අරමුණුනිසා උපදින සිත්, අද සිටින අයට ඇතිවෙයි. අද නැතිදේ පසුව ඇතිවිය හැකියි. පෙර පැවති දේ ගිලිහීගියේද විය හැකියි. ඇති සෑමදෙයක්ම, සෑමඅරමුණක්ම ඉහත සඳහන් ගොඩවල් සයතුළටම ඇතුළත් වෙයි.

## අනුලෝම වශයෙන්

රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන, පඤ්චුපාදාන -ස්කන්ධය, මේ අපි ඉගෙන ගෙන ඇති ආකාරයයි. දන්නා ආකාරයයි.

## රූප

අනන්ත වූ ස්කන්ධයන් ඇත්තේය. ඒවා හඳුනානොගත් දේය. එහෙයින් ඒවා පවතින ආකාරයෙන් පවතින්නේය. එතැන අවුලක් නැත.

අහස, පොළොව, ඉර, හඳ, තරු, ගහකොළ, මිනිස්සු, සත්තු, ගැහැණු, පිරිමි, අලි, කොටි, වලස්සු, කෘමීන්, කුහුඹුවන්, පළගැටියන්, මාලුන්, කිඹුලන්, මේසය, පුටුව, කලිසම, කමිසය, සාරිය, ගවුම, සපත්තු, සෙරෙප්පු, පනා, ඇමීබාවන්, පරමානු මෙකී නොකී අනන්තවූ ස්කන්ධයන් හඳුනාගැනීමට යොදාගනු ලැබූ යොදාගන්නා නාමයන් නාමසංඥාව හේතුවෙන්ම අවුල ඇතිවුනේය. ස්කන්ධයක් වශයෙන් නානත්ත්වයෙන්යුතු දෙය ඒකත්ත්වයෙන්, එකක් ලෙසින් ගෙන, ඝණයක් වශයෙන් ගෙන ඒවා රූප ලෙසින් සළකා ඒවාට නම් තැබීමෙන්, සත්‍ය වශයෙන් නොවන්නාවූ, ස්වභාවයන් කෙරෙහි නාමරූප ඇතිකර ගැනීමත් සමඟම සක්කායදෘෂ්ඨිය, වැරදිදැක්ම වැරදිඅවබෝධය ඇතිවී තිබේ. ඒවා සත්‍යලෙසින් ගන්නාවුන්, බැඳුනවුන්, අල්ලාග න්නවුන් මුලාවට පත්වී සිටින්නෝය. මෝහයෙහිම ගැලෙන්නෝය. පැවතිය නොහැක්කාවූ (අනාත්ම) ස්වභාවයන් පවත්වන්නට නිසරු උත්සාහයක යෙදෙමින්, අයසට පත්වන්නෝය. උත්සාහයන් අසාර්ථක වීමෙන් දුකට පත්වන්නෝය. නාමරූප කෙරෙහි බැදෙන්නා, විශ්වාසය තබන්නා දුකින් දුකටම පත්වන්නේය. තථාගත සම්බුදු පියාණන් වහන්සේ ස්වකීය උත්සාහයෙන් අවබෝධකර දේශනාකොට වදාරාඇත්තේ මෙවන් මුලාවන්ගෙන් ගැලවී ගතහැකි ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ගයයි.

## වේදනා

ආස්වාදය, සුඛආස්වාදය, දුකආස්වාදය, අදුක්ඛමසුඛආස්වාදය, වශයෙන් වෙන් වෙන් අයුරින් කොටස් තුනකින් දැක්වූයේ වුවද, සියළු දැනීම්, රිදීම්, වින්දනයන් මෙහි අන්තර්ගත වන්නේය.

## සංඥා

අයෝනිසෝමනසිකාර, නොසන්සුන් මනස ආත්මීය හෝතුකාරකයන්හි එකගවීමේ, පිළිගැනීමේ, පිවිසීමේ ස්වභාවය, පරාමශීණය, උපාදානය (බාහිර අභ්‍යන්තර ආයතනයන්හි පිහිටීම.) හඳුනගන්නාවූ ස්වභාවය.

## සංස්කාර

දිගය, කොටය, උසය, මහතය, ලස්සනය, අවලස්සනය, යනාදී මෙකී නොකී විවිධ ආකාරයෙන් ඇගයීම්ය, හොළාදැකීම්ය, හඳුනාගැනීම් සකස්කිරීම්ය.

## විඥාණ

ආස්වාද - ආදීනව - නිස්සරණ

හැඟීම - දැනීම - රිදීම විඳීමේ ආශාවන් (කාම තණ්හා) පවත්වාගැනීමේ ආශාවන් (භවතණ්හා) නිස්සරණයේ කැමැත්ත, අත්හැරීම, මිදීම, ගැලවීයාමේ කැමැත්ත (විභවතණ්හා) "මම" ලෙසින් පූර්ව මතකය.

මේ අනුව විමසන කල, ලෝකයක් ඇත්තේය. එහි ආස්වාදයන් ඇත්තේය. විඳීමත් ඇත්තේය. විඳීම් පිළිබඳ ආනන්දජනක වේවා. ශෝකජනක වේවා. බෙදීම්ද

ඇත්තේය. මම වෙමි. පවත්වා ගතයුතු වෙමි. රැකගතයුතු වෙමි. රිදුමන්ගෙන් බැහැර වියයුතු වෙයි. සුඛයන් විඳියයුතු වෙයි. පවත්වාගත යුත්තේය. නැතිවන්නට ඉඩනොහළ යුත්තේය. නැතිවුවහොත් මම නැතිවන්නේය. වැනි ලෝභ සිතුවිල්ලෙන් තෘෂ්ණාවෙන් බැහැරයෑමක් දැකිය නොහැකිය. එතැන පවතිනුයේ සංසාර වට්ටයයි.

මේවා මෙලෙස කෙටියෙන් යොදා දක්වනු ලැබුයේ, වටහාගැනීමේ පහසුව සඳහා මිස - අනන්ත වූ - ප්‍රමාණකළ නොහැක්කා වූ ධර්මතාවයන් මෙහිලා දැක්වීමේ අදහසකින් නොවන බව ද වටහාගත යුතුව ඇත.

## ප්‍රතිලෝම වශයෙන් ගත්කල

**විඥාණ** - ත්‍රිවිධ තෘෂ්ණාවන් ඇතිවන්නේය. වේදනා, රිදුම් දැනෙන්නේය. මමය යන්න බිහිවන්නේය. ආස්වාදයෙහි එළැඹෙන්නේය. ආදීනවයෙහි විඳවන්නේය. නිස්සරණයෙහි ගැලීගන්නට වෙහෙසෙන්නේය.

**සංස්කාර** - අගති කරන්නේය. හෙළා දකින්නේය. වර්ග කරන්නේය. සැපතයයි දක්වන්නේය. දුකයයි දක්වන්නේය. දිගය, කොටය, මහතය, අලංකාරය, අශෝභණය, උසස්ය. වටින්නේය, නොවටින්නේය, ආස්වාදය මෙනෙහිකොට හුවා දක්වන්නේය. මඤ්ඤනා කරන්නේය. සිතුවිලි ලොවකට ගෙන යන්නේය. සිතුවිලි ලොවක් පවත්වන්නේය. සිතුවිලි ලොවක අතරමං කරන්නේය. මවන්නේය.

**සංඥා** - චේතනා, යෝනිසෝමනසිකාරය, සිහිය, නිවැරදිදැක්ම, සම්මාසතිය, විඥාණයේ සංස්කාරයේ අනිත්‍යබව දකින්නේය. මෙනෙහි කරන්නේය, අවබෝධ කරන්නේය. දුකට හේතුවනබව දකින්නේය. මෙනෙහි කරන්නේය. අවබෝධ කරන්නේය. ඒවායෙහි නොගැලෙන්නේය, නොඑළැඹෙන්නේය, නොවිඳින්නේය, බැහැරවන්නේය,

නොගැටෙන්නේය, නොගැටි නතරවන්නේය.

**වේදනා** - සංඥාවෙන් සම්බන්ධය නොලැබෙන බැවින්, අනුකූලතාවය නොලැබෙන බැවින්, කවර හෝ ආකාරයක ආස්වාදයක් බිහිවන්නේ නොවේ. ආස්වාදය නොවූයේ ආදීනවය ද නොවන්නේය. ආදිනවය නොවූයේ - නිස්සරණයක්ද නොවන්නේය.

**රූප** - සංඥා, චේතනා, නොවූයේ ආස්වාද නොවන්නේ විය. ආස්වාදය නොවූයේ දැන ගැනීම්, හඳුනාගැනීම් නොවන්නේය. දැනහඳුනා ගැනීම් නොවනකල නාමරූපයන්ගෙන් එලනොවන තැන නාමරූප නොපවතින්නේය. උපරුද්ධ වන්නේය. නොහැඟෙන්නේය. නොදැනෙන්නේය. නොහඳුනන්නේය.

ප්‍රඥාව පහළවන්නේ එතැනය. මූලාව දුරුවන්නේ එතැනය. ගැලවීම එතැනය. මරුවා පරදිනුයේ එතැනය. මරුවා පරදිනුයේ

එතැනය. දුක නැතිවනුයේ එතැනය. ශේෂ වූ කිසිවක් නොමැතිවූයේ නිවුනේය.

## මහාභූත ප්‍රඥප්ති

ආපෝ, තේජෝ, වායෝ, පඨවි සතර මහා භූතයෝය, භූතස්වභාවයෝය, පදාර්ථයෝය.

සම්මතයේ පවතින ජලය, ගින්න, සුළඟ ඝණ බව, මේවා ප්‍රඥප්තීන්ය. ස්කන්ධයන්ය. ඒ කෙරෙහි ඇති කරන්නා වූ නාම රූපයෝ ය.

ජලය ස්කන්ධයකි. එහි සියළුම භූත පදාර්ථයන් අන්තර්ගතවේ. එසේ නොමැතිව ඒ එක් භූතයෙක් නොවේ. ජලයෙහි ප්‍රකටවී ඇත්තේ ජලභූත ස්වභාවයයි. ප්‍රකටතාවය අනුව නාමරූපයෙදී ඇත.

ජලය ස්කන්ධයක් නොවේනම් ජලය වාෂ්පබවට පත්වන්නේ කෙසේද? ජලය වාෂ්පවූ පසුව ජලය පැවති ස්ථානයේ තව දුරටත් ජලය පවතින්නේද? එවැන්නක් දැකියහැක්කේ ද?

වාෂ්පයයනුද ජලභූත පදාර්ථය නොවේ. එය ද ස්වභාවයකි. ඒ හඳුනාගැනීමකි. එතැන නාමරූපය. ජලභූතයාගේ සියුම් වූ භූතපදාර්ථය පියවි ඇසින් දැකියහැක්කේ නොවේ. පංචඉන්ද්‍රියයනට ගෝචර වන්නේ නොවේ.

ගින්නද මෙසේය, සුළඟද මෙසේය, පඨවියද මෙසේය, මේවා ගෝචරවන්නේ දියුණුකළ මනේන්ද්‍රියයටය. මේවායේ යථාභූත ස්වභාවයන් ප්‍රත්‍යක්ෂවනුයේ ඒවා

කෙරෙහි පර්යේෂණයෙහි යෙදෙන්නාහටය. විදර්ශනය කරන්නාහටය.

එසේ නොමැතිව සම්මතයෙහි ගැලීසිටින්නාහට නොවේ.

මහාභූත පදාර්ථයන්ගේ යථාභූතස්වභාවයන් කවරෙකුහට හෝ විස්තරකොට හෝ කියාදීමට නොහැක්කේය. ඒවායේ ස්වභාවයන් ප්‍රත්‍යක්ෂකළ යුත්තේ ඒ ඒ පුද්ගලයා විසින්ම ඇතිකරගත් වඩාගත් සිහියෙනි. ප්‍රඥාවෙනි.

**(තුමෙහි කිච්චං ආතප්පං - අක්ඛාතාරො තථාගතා)**

තථාගතයන් වහන්සේට කළහැක්කේ මඟ කියාදීම පමණි. ඒ වටහාගැනීම තම තමන් විසින්ම කළයුත්තේය.

**මඤ්ඤනාව**

රූපස්කන්ධයේ කිසියම් කොටසක් "අතය" යන රූපයෙන් කිසියම් දවසක දිට්ඨිගතවන්නට ඇත.

"රිදෙනවා" යනුවෙන් නාමධර්මයන් හා සංඥා කිසිවක්, යම් අවස්ථාවක දිට්ඨිගත වන්නට ඇත. පිළිග න්නට ඇත.

මේ මොහෙතේ දී, ස්කන්ධයේ සිදුවන කිසියම් ස්පර්ශයකදී, 'අත රිදෙනවා' යැ'යි ඔබට හැඟෙන්නේනම් කියන්නේනම් එය සිදුවනුයේ මඤ්ඤනාවතුළ හෙවත් මෙනෙහිකිරීමතුළ මිස අළුත් දෙයක් එතැන සිදුවීම නොවේ. සිදුවන්නේ ඔබ නොදැනුවත්වම අතීත

ආවර්ජනයක් මෙනෙහි කිරීමක්තුළට අනුගතවීමක් පමණි. වර්තමාන ස්පර්ශයකට සාපේක්ෂව අතීත නාමසංඥා අනුගතකිරීම පමණි. එය වර්තමානයේ ක්‍රියාවලියක්ලෙස ගැනීම පමණි. විඥාණයේ ස්වභාවය එයයි. "අත" යනුවෙන් රූපයක් ඔබ ඉගෙනගනු ලැබුයේ වර්තමාන ස්පර්ශය සිදුවන අවස්ථාවේ නොවේ. එය අතීතයේලද දිට්ඨියකි. 'රිදීම'ද ඉගෙනගත්තේ වර්තමාන අවස්ථාවෙහිදී නොව, අතීත දිට්ඨියකි.

එසේ නම් වර්තමාන ස්පර්ශයතුළ නාමරූප නැත. ස්පර්ශය සිදුවූ සැනින් නිමවනු ඇත. එහෙත් අතීත ක්‍රියාවක් හා අනුගතවූ නොමරූප ධර්මයන් වර්තමාන ක්‍රියාවට අනුගතකර ගැනීම තුළින් (මෙනෙහි කිරීම තුළින්) වර්තමානය තුළ ස්කන්ධයන්ගේ ස්පර්ශයක් වෙනුවට අතක් හා වේදනාවක් ලෙස ගනිමින් මුලාවටපත්වී විඳින්නටවන්නේ දුකකි. එතැන පංචෝපාදානස්කන්ධයයි.

සැබවින්ම එතැන ඇත්තේ මඤ්ඤණාව හෙවත් මෙනෙහිවීම. ආස්වාද - ආදීනව - නිස්සරණ සිතුවිලි මිස අන්කිසිවක් නොවනබව සිහියෙන් බලනවිට පසක් වන්නේය.

මෙනෙහිකිරීමට අනුගතවීම, සිතීමයි, සිතුවිල්ලයි, සිතුවිල්ලෙන් බැහැරවීම ම සමාධියයි.

## පංච උපාදානස්කන්ධ හා මුලාව

පහන එකකි. තිරය තව එකකි. තෙල් තවත් එකකි. මේ කවරක්වුවද වෙන් වෙන් වශයෙන් නාමරූපයන් ලෙසින් හැඳින්විය හැකිය.

පහනවූයේ නමුදු ආලෝකය නැත.

තිරයවූයේ නමුදු ආලෝකය නැත.

තෙල්වූයේ නමුදු ආලෝකය නැත.

මේ තුනම (පහන, තිරය, තෙල්) එකතු වූයේද ආලෝකය නැත.

ආලෝකය ඇතිවනුයේ තිරය (පහන් වැටිය) දැල්වූවිටය.

පහන් වැටිය දැල්විය හැක්කේ ගින්නෙනි. ගින්න ද නාමරූපවශයෙන් එකක්ලෙස දැකිය හැකිය.

තෙලුත්, වැටියත්, පහනත්, ගින්නත් එකතුවීමෙන් පහන දැල්වෙන්නේය. දැල්වීමට හේතුවූ ප්‍රත්‍යයන් ඇතිතෙක් පහන දැල්වෙන්නේය.

එහෙත් පහනේ ආලෝකය නැත්තේය. (තිරයේ) පහන් වැටියේ ආලෝකය නැත්තේය. තෙලෙහි ආලෝකය නැත්තේය.

ආලෝකය උදාවූයේ ගිණිසිළුවත්, එහි දීප්තියත් කෙරෙනි. ගිණිසිළුවත් දීප්තියත් එකිනෙක වෙන්කර දැකීම අපහසුය. එතරම්ම එකිනෙකා බද්ධවී ඇත්තේය.

රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන ස්වභාවයෝද එසේමය. වෙන් වෙන් වශයෙන් දැකීම අසීරුය. ගිණිසිළුව හා දීප්තිය මෙනි.

මේවා එකිනෙක වෙන්කර දැකිය හැක්කේ සමථ, විදර්ශනා වැඩීම තුලිනි.

නාමරූප වශයෙන් දකිනුයේ කවරේද, ඒ පංච උපාදානස්කන්ධයෝමය. විඳිනුයේ කවරේ ද, පංචඋපාදානස්කන්ධයෝ මය. අඳුරෙහිදී කිසිවක් නොපෙනේ. අඳුරෙහි ඇති දෑ ආලෝකයක් ඇති වූ කල පෙනෙන්නේය.

පෙනෙන්නේ වේවා, දකින්නේ වේවා, විඳින්නේ වේවා, ඒ කවරේ වුවද හඳුනාගැනීමක් වියයුතුය. හඳුනා-ගනුයේ නාමරූපයෙනි. නාමරූපයන් නොවන්නට හඳුනා-ගැනීමක් නොවන්නේය. හඳුනාගැනීමක් නොවන්නට, ඇති නැති බවක් නොවන්නේය. ඇති නැති බවක් නොවන්නට තෘෂ්ණාවක් නොවන්නේය. තෘෂ්ණාවක් නොවන්නට යලි එළැඹීමක් නොවන්නේය. පංචස්කන්ධයෝම, පංචස්කන්ධයන් ප්‍රත්‍යවුනාවූ ස්වභාවයන්, ධර්මතාවයන්, විඥාණලෙසින් තනිව දකින්නේ, හඟින්නේ විඥානය නම් නාමපදාර්ථය තුළම අතරමංවන්නේය. මංමුලාවන්නේය.

තනිව විඥානයක් දැකිය නොහැක්කේය. ප්‍රත්‍යක්ෂ කරනුයේ පංචඋපාදානස්කන්ධයන්ම ප්‍රත්‍යක්ෂකර ගතයුත්තේය.

පහන, එකක්සේ දැක්කේ නමුදු, එයද එකක් නොවේ. ස්කන්ධයකි. හේතුප්‍රත්‍යයන් සමුහයකගේ එකතුවකි. පහන්වැටිය එකක් සේ දැක්කේ නමුදු, එයද එකක් නොවේ. ස්කන්ධයකි. හේතුප්‍රත්‍යයන් සමූහයකගේ එකතුවකි.

තෙල්, එකක්සේ දැක්කේ නමුදු, එයද එකක් නොවේ. ස්කන්ධයකි. හේතුප්‍රත්‍යයන් සමූහයකගේ එකතුවකි.

ගින්න ද එකක්සේ දැක්කේ නමුදු, එයද එකක් නොවේ. ස්කන්ධයකි. හේතුප්‍රත්‍යයන් සමූහයකි.

මේ කවරක්වුවද සණයක් ලෙසින්ගැනීම, එකක් ලෙසින්ගැනීම, සැලකීම වැරදි දැකීමයි. අවිද්‍යාවයි. මිථ්‍යා දෘෂ්ඨියයි.

පංචෝපාදානස්කන්ධයන්හි නිත්‍යස්වභාවයක් නොමැත්තේ, හේතුප්‍රත්‍යයන් අනුවම ඇතිවන නැතිවන ධර්මතාවයන්ය.

සම්මුතිය අනුව ඇතිවනුයේ, උපදින්නේය. නැතිවනුයේ මැරෙන්නේය.

පංචෝපාදානස්කන්ධයන්ගේ ස්වභාවයම, ධර්මතාවයම හේතුප්‍රත්‍යයන් අනුවම මතුවීම හා වියැකී (නැතිවීම) යාමය.

පංචෝපාදානස්කන්ධයන් තුලින් මතුවන ධර්මතාවයන්හි ගැලෙමින්, නාමරූප වශයෙන් සංස්කරණය කරමින්, සංඥා විඳිමින්, සුඛ, දුක්ඛ, උපේක්ෂා, වේදනා ලබමින් සදාකාලිකව පවතින්නාවූ ලෙසින් හඟිමින්, පවත්වාගැනීමට වෙරදැරීම (තෘෂ්ණාව) චිත්තවිකාරයන් මිස අන්කිසිවක් නොවනබව අවබෝධකළ යුත්තේය. චිත්තවිකාරයන්හි නොඑළැඹිය යුත්තේ, නොගැලිය යුත්තේ, එළැඹිසිහියෙන් යුතුවම චිත්තවිකාරයන් කෙරෙන් දුරුවිය යුත්තේය.

## ඵස්සය

ඵස්ස, වේදනා, සංඥා, චේතනා, (සංස්කාර) මනසිකාර.

## විඥාන

කිසියම් තැනැත්තෙකුව විවිධ භාණ්ඩයන්ගෙන් සමන්විත අඳුරුකුටියකට පිවිසවා දොරගුළු දැමුවේයැ'යි සිතමු.

කාමරයතුළ විවිධ භාණ්ඩ නමැති ස්කන්ධයන් (රූප) ඇති නමුදු, ආලෝකය නොමැති බැවින්, ඔහුට දෘෂ්ඨි විඥානය පහල නොවන්නේය. එහෙයින් කාමරයතුළ ඇති කිසිවක් දැකගැනීමේ, හඳුනාගැනීමේ හැකියාවක් ඔහුට නොමැත්තේය.

කාමරයතුළ ඔබ මොබ යන ඔහුගේ පයක් කිසියම් වෙනත් ද්‍රව්‍යයක් (ස්කන්ධයක්) හා ගැටුණි. ඔහුය යනු රූපයකි. (ස්කන්ධයකි) ගැටුනේ තවත් රූපයකි. ගැටීම පිළිබඳ ස්පර්ශය සංඥාව ඇතිවිය. සංඥාව බිහිවිය. කවර හෝ ආකාරයක දැනීමක් (වේදනා) ඇතිවිය. ඒ කුමක්දැ'යි තෝරා බේරා ගැනීමේ ස්වභාවය, ඕනෑකම ඇතිවිය. සංස්කාර (චේතනා) මතුවිය. විඳීය හැකි, විඳිය යුතු, නොවිඳියයුතු, (කාම, භව, විභව) සංඥාවන් ගෙන් සපිරුණ මනසිකාර(විඥාන)ත් ඒ අනුව පූර්ව හඳුනා-ගැනීමේ ස්වභාවයන් අනුව, ගැටුණ ස්කන්ධය පිළිබඳව නාමයන් එළැඹුනෙන් හඳුනාගැනීමක් සිදුවිය.

## රූප

සංඥා, ස්පර්ශ, වේදනා, චේතනා, මනසිකාර, රූප වේදනා, සංඥා සංස්කාර, විඥාන වශයෙන් නාමරූප ඇතිවන්නේය.

අඳුරේදී දැනුණු ස්පර්ශයන්, සංඥාවන් සංස්කාරයන් අනුව කිසියම් නාමයක් යටතේ හඳුනාගන්නේ වුවද, එය මුළුමනින්ම නිවැරදි නොවිය හැකිය.

අඳුරේදී සුවදායක, සුඛදායක දෙයක් ලෙසින් හඳුනාගත්දෙය ආසාවෙන් වැළඳගන්නේ වුවද, ආලෝකයඋදාවූ අවස්ථාවෙහිදී, එය සුඛදායක, සුවදායක දෙයක් නොව විවරකළහොත් දුගඳහමන, අපවිත්‍ර දැයින්, අසූචියෙන්පිරුණු භාජනයක් යැ'යි හඳුනාගත හැකිවුවහොත් හෙතෙම නොපමාව එය අතහැර ඉන් බැහැරවන්නේය. සත්‍යයස්වභාවය එයයි. විඥාණය, චේතනාව, සිතුවිල්ල, මනසිකාර මේ කවර නමකින් හැඳින්වූයේවුවද එය මුලාව ඇතිකරන්නක්ම පමණි.

## සංඥා

රූපස්කන්ධයකි. එයට "මම" නම් වූ සංඥාවකි.

රූපස්කන්ධයේ "කොන්ඩය" නම් වූවක් ද වේ. එය රූපයක් ලෙසින් දැකිය හැක්කේ ද වෙයි.

'හිස' කියා නම්වූවක්දවේ. එය රූපයක් ලෙසින් දැකිය හැක්කේ ද වෙයි.

ඇස, නාසය, දිව, බෙල්ල, අත, පපුව, බඩ, කලවා, පාද යනාදී වශයෙන් හෝ එයට අමතර වශයෙන් හෝ රූපවශයෙන් දැකියහැකි නාමවශයෙන් යොදා දැක්වියහැකි අංග ප්‍රත්‍යාංගයෝ වෙයි.

එහෙත් ඒ කවර ස්ථානයක හෝ "මම" දැකිය නොහැකිය. එය සංඥාමාත්‍රයක් පමණකි. රූපසංඥා, ශබ්දසංඥා, ගන්ධසංඥා, රසසංඥා, ස්පර්ශසංඥා, කායසංඥා, නාමසංඥා, අනිත්‍යසංඥා, දුක්ඛසංඥා, අනාත්මසංඥා වැනි හෝ මෙකී නොකී අපමණවත් සංඥාවල් අභිබවා මම සංඥාව බලවත්ව පෙරටු වන්නේය. එසේ බලවත්වූයේ වුවද, පෙරටු වූයේ වූවද, මම සංඥාව, දුක්ඛසංඥාව හමුවේ අසරණ වන්නේය. දුකට නතුවන්නේය.

දුක්ඛසංඥාවෙන් ගැලවීමේ මඟනොදත් 'මම' දුක් විඳින්නේය. ආර්‍යමාර්ගය නොදත් 'මම' දුකින් ගැලවීමපිණිස 'මම' ම විනාශකරගන්නට පෙළැඹෙන්නේය. එහෙත් 'දුක' නිමනොවන්නේය. 'මම' සංඥාව පවතිනතාක් "දුක" සංඥාවද ලුහුබඳින්නේය. ආර්‍යසත්‍ය අවබෝධකරගත් ප්‍රඥාවන්තයා 'මම' සංඥාව දුරුකරන්නට වීර්‍ය ගන්නේය. 'මම' සංඥාව දුරුකරන්නේය. 'මම' සංඥාවෙන් බැහැර වන්නේය.

ආනාපානසතිය, සතරසතිපට්ඨාන මේ සඳහා බෙහෙවින් උපකාරවන්නේය. කායස්වභාවයේ ඇතිවීම, නිරෝධය, වේදනාවේ ඇතිවීම, නිරෝධය, චිත්ත ස්වභාවයේ ඇතිවීම, නිරෝධ ධර්මස්වභාවය හා එහි අනිත්‍යතාවයන් ප්‍රත්‍යක්ෂවනවිට පංචඋපාදානස්කන්ධයම වැටහෙන්නේය. එහි මුලාව වැටහෙන්නේය. වැටහුණුතැනම අත්හැරෙන්නේය.

## අනිත්‍යය

රාහුලය, කුමක් සිතන්නෙහිද? රූපය නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමිනි, අනිත්‍යය...

චක්ඛුවිඥාණය නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමිනි, අනිත්‍යය...

චක්ඛුසම්පස්සය නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමිනී, අනිත්‍යය...

චක්ඛුසමුපස්සය නිසා යම් වේදනාවක් සංඥාවක් සංස්කාරයක් විඥාණයක් උපදීනම්, ඒ නිත්‍යවේද? අනිත්‍ය වේද?

ස්වාමිනි, අනිත්‍යය ...

යමක් අනිත්‍යනම් එය දුක් වේද? සැප වේද?

ස්වාමිනි, දුක්ය...

යමක් අනිත්‍යනම් දුක්නම් වෙනස්වන සුළුනම්, එය මගේය. මේ මම වෙමි. මේ මගේ අයිතිය(ආත්මය)'යි ලෙසින්ගැනීම සුදුසුද? නොසුදුසුද?

ස්වාමිනී, නුසුදුසු මය...

කන, නහය, දිව නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමිනී අනිත්‍යය....

ශබ්ද ගඳ සුවඳ නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමීනි, අනිත්‍යවේමය.

රස නිත්‍යවේද, අනිත්‍යවේද?

රස විඥාණය නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමීනි, අනිත්‍යවේමය...

රස ස්පර්ශය නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමීනි, අනිත්‍ය වේමය, ....

රසස්පර්ශය නිසා, යම් වේදනාවක් සංඥාවක් සංස්කාරයක් විඥාණයක් උපදීනම් ඒ නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමීනි, අනිත්‍යවේමය...

යමක් අනිත්‍යවේනම් එය දුක්වේද සුවවේද...

ස්වාමීනි, දුක්වේමය...

යමක් අනිත්‍යවේනම් දුක්වේනම් වෙනස්වනසුළු නම් එය මගේය. මම වෙමි. මේ මාගේ අයිතිය (ආත්මය) යි ලෙසින් දැකීම සුදුසුද?

ස්වාමිනී, නුසුදුසුමය...

කය... සිත නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමීනි, අනිත්‍යය

යමක් අනිත්‍යවේනම් එය දුක්වේද? සැපවේද?

ස්වාමීනි, දුකක්වේමය...

යමක් අනිත්‍යනම් වෙනස්වනසුළු නම් මෙය මාගේය. මේ මම වෙමි. මේ මගේ අයිතිය (ආත්ම)' යි ලෙසින් දක්නට සුදුසුවන්නේද, නුසුදුසුවන්නේද?

ස්වාමීනි, නුසුදුසු වන්නේමය.

දහම් නිත්‍යවේද? අනිත්‍ය වේද?

ස්වාමීනි, අනිත්‍යය

මනෝවිඥාණය... මනෝසම්පස්සය (ස්පර්ශය) නිසා යම්වේදනාවක්, සංඥාවක්, සංස්කාරයක්, විඥාණයක් උපදී නම් ඒ නිත්‍යවේද? අනිත්‍යවේද?

ස්වාමීනි, අනිත්‍යවේමය...

යමක් අනිත්‍යනම් ඒ දුක්වේද? සැපවේද?

ස්වාමීනි, ඒ දුක්වේමය...

යමක් අනිත්‍යනම් දුක්නම් වෙනස්වනසුළු නම් මෙය මාගේය. මේ මම වෙමි. මේ මාගේ අයිතිය(ආත්මය)'යි වශයෙන් දක්නට සුදුසු වන්නේ ද?

ස්වාමීනි, එසේ දක්නට සුදුසු නොවන්නේමය ...

රාහුල මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රවකයා ඇසෙහිත් නොඇලෙයි. රූපයෙහිත් නොඇලෙයි. චක්ඛු විඥාණයෙහිත් නොඇලෙයි. ඇසෙහි ස්පර්ශයෙහිත් නොඇලෙයි. ඇසෙහි ස්පර්ශය නිසා යම්වේදනාවක් සංඥාවක්, සංස්කාරයක්, විඥාණයක්, උපදීනම් එහිත් නොඇලෙයි.

කනෙහිත් නොඇලෙයි. නාසයෙහිත් නොඇලෙයි. දිවෙහිත් නොඇලෙයි. රසෙහිත් නොඇලෙයි. රස විඥාණයෙහිත් නොඇලෙයි. රස ස්පර්ශයෙහිත් නොඇලෙයි. රසපහස නිසා යම් වේදනාවක්, සංඥාවක්, සංස්කාරයක්, විඥාණයක් උපදීනම් එහිත් නොඇලෙයි. කයෙහිත් නොඇලෙයි. සිතෙහිත් නොඇලෙයි. දහමෙහිත් නොඇලෙයි. මනෝවිඥාණයෙහිත් නොඇලෙයි.

මනෝස්පර්ශයෙහිත් නොඇලෙයි. මනෝපහස නිසා යම් වේදනාවක්, සංඥාවක්, සංස්කාරයක්. විඥාණයක් උපදීනම් එහිත් නොඇලෙයි. නොඇල්මනිසා මිදෙයි. (ගැලවෙයි) මිදුණුකල්හි රාගයදුරුවීයයි. දැනුම ඇතිවිය. ඉපදීම දුරුවිය. බ්‍රහ්මචර්යාව (පස්කම්හි නොගැලමින් පැවති) දුරුවිය. මේ භවයෙහි කළහැකි, කළයුතු අන්කිසිවක් නැතැ'යි දැනගන්නේය. ප්‍රත්‍යක්ෂවන්නේය. ප්‍රඥාව පහළවන්නේය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

මේ සූත්‍ර දේශනයේදී යම්කිසිවක් හටගන්නා සුළුනම් ඒ සියල්ල නැසෙන සුළුය'යි කෙලෙස් රජස් නැති කෙලෙස්මලයෙන් පහවූ, දහම්ඇස පහළවිය. ආයුෂ්මත් රාහුළ තෙරුන්ගේ සිත උපාදානරහිතව කෙළෙසුන්ගෙන් මිදුණේය.

(රාහුලෝවාද සූත්‍රය)

## වධකයා හැඳින ගැනීම

කාම, භව, විභව තණ්හාවන්ගෙන් පරිනිර්මිත විඥාණය සත්ත්වයාගේ මිතුරෙකු නොවේ. හිතවතෙකු නොවේ. සසරින් ගලවන්නෙකු නොවේ.

රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාණ ග්‍රහණයකොට ලෝභ, ද්වේශ, මෝහයන්හි ගැලෙමින් තණ්හා, දිට්ඨි, මාන ඇතිකර ගනිමින්, නිත්‍ය, සුඛ, ආත්ම, වශයෙන් මුලාවට පත්වී, ඇසෙහි ගැටෙන රූප, කණෙහි පතිතවන ශබ්ද, නැහැයෙහි ස්පර්ශවන ගඳ, සුවඳ දිවෙහි ඇතිවන රස,

නීරස, ගත හා ස්පර්ශයෙන් ඇතිවන සුඛ, දුක්ඛ, මනස ඇසුරින් මතුවන සෝමනස්ස, දෝමනස්සයන්හි ගැලෙමින් මෙනෙහිකිරීම, මඤ්ඤනාකිරීම, ඔස්සේ ආස්වාද ලැබීම, දුකට පත්වීම, අපේක්ෂාවන් බලාපොරොත්තු ඇතිකර ගැනීම මනසතුළ ඇති කරන්නා වූ සිහිනමය මායාකාරී ලෝකතුළට වදිමින්, මනෝලෝකයන් (ථිනමිද්ධය) තුළ සැරිසැරීම විඥාණයාගේ වැඩීමට, පැවැත්මට, බලවත්වීමට, හේතුකාරකයෝ වන්නාහ. අවිද්‍යාඅන්ධකාරයේ ගිලුන, සියලු සත්ත්වයෝ මෙවන් තත්වයන්තුළ ආස්වාදය ලබමින් ත්‍රිවිධතෘෂ්ණාවන්ම වඩති. විඥාණයම බලවත්කරවති. සංසාර වට්ටයෙන් ගැලවීගත නොහැකිවී භවයේම අතරමං වෙති.

විඥාණය යනු ත්‍රිවිධතෘෂ්ණාවෝය. ආස්වාදයෝය. ආදීනවයෝය. නිස්සරණයෝය. මේවායින් බැහැරවීමහැර ලංකරගතයුතු ඒවා නොවන්නේය.

සතුරාද, මිතුරාද වෙන්වෙන්ව, මැනවින් හඳුනාගත යුත්තේය. එසේ නොවූයේ විපතටම පත්වන්නේය. විඥාණය සතුරෙකු, භවකාරකයා ලෙස අවබෝධ නොකරනතාක්, සියළු සත්ත්වයෝ විඥාණයම ඇසුරු කරමින් දුකින් දුකට පත්වන්නෝය.

ඇවැත්නි, යමකයෙනි, තොපට උපමාවක් කියමි.

ඇවැත්නි, යමකයෙනි, යම් හෝ මහත් ධනඉසිරු භවභෝග සම්පත් ඇති ගෙහිමියෙක් ආරක්ෂාසහිතව සිටී.

ඔහුට උවදුරක්, අයහපතක් කරන්නට, ඔහුගේ දිවි තොරකරන්නට කැමැති කිසියම් පුරුෂයෙක් ද වෙයි.

ඔහුතුළ මෙබඳු සිතක් පහළවන්නේය. මේ ගෙහිමියා සමෘද්ධිමත්ය. මහත් ධනයඇත්තේය. අපමණවත් භවභෝග ඇත්තේය. එසේම ආරක්ෂාසම්පන්නය. ඔහුගේ දිවි තොරකිරීම පහසුනොවෙයි. මම ඇතුලට පිවිස දිවි තොරකරන්නෙමි යැ'යි ඉටාගන්නා එම පුරුෂයා එම ගෙහිමියා හමුවන්නේය.

මම ඔබට සේවය කරන්නට කැමැත්තෙමි. ඔබට උවටැන් කරන්නෙමි. කීකරුව යටහත්ව සිටින්නෙමි.

මෙම පුරුෂයාගේ බසඅසා පැහැදුන ගෙහිමියා ඔහුගේ උවටැන් ලබන්නේය.

එම පුරුෂයාද සැමටපෙර අවදිවන්නේ කැපවීමෙන් සේවයකරනුයේ, කලයුතුදෑ විමසමින් ප්‍රියබස් කථාකරමින් සැමටපසුව නින්දට එළැඹෙමින්, ගෘහපති, ගෘහහිමිගේ පුතුගේ සිත් දිනාගනිමින් වෙසෙන්නේය. එම පුරුෂයාද තමන්ගේ මිතුරෙකු ලෙසින් ගෙහිමියා විසින් සිතන්නේය. ඉතාමත් සුහදයෙකු ලෙසින්ද හඳුනාගන්නේය. ඔහුකෙරෙහි විශ්වාසය තබන්නේය.

ඇවැත්නි, ගෙහිමියා තමන්කෙරෙහි දැඩිවිශ්වාසය තබා ඇතිබව වටහාගන්නා ඒ පුරුෂයා, නිසිඅවස්ථාව උදාවූ ක්ෂණයෙහිදීම තියුණු අවියකින් පහරදී ගෙහිමියාව ඝාතනය කරන්නේය.

ඇවැත්නි, යමකයෙනි, ඒ කුමක්යැ'යි සිතන්නාහුද?

යම් අවස්ථාවකදී ගෙහිමියාවෙත පැමිණි පුරුෂයා, මම ඔබගේ සේවකයා වෙමි. ඔබට අවනතව සේවය කරන්නෙමි'යි පැවසුයේ වුවද, ඔහු වධකයාම විය.

වධකයා වූ ඔහුව, ගෙහිමියා ඒ තමන්ට එරෙහිවන වධකයා බව හඳුනානොගත්තේය.

කලින් අවදිවී සියළු මෙහෙයන් නිමකොට, සතුටුබස් කථාකරමින් සැමදෙනාගේ සිත් දිනා, සැමට පසුව නින්දටගියේ වුවද, ඔහු වධකයාම විය.

වධකවූ පුරුෂයා තමන්ගේ වධකයා වනබව, ගෙහිමියා විසින් හඳුනානොගත්තේය. යම් අවස්ථාවක තියුණු අවියකින් පහර දී ගෙහිමියාගේ දිවි තොරකළේද? එකල්හිද, හේ වධකයාමවිය. වධකවූ පුරුෂයා තමන්ගේ වධකයාවන බව නොදන්නේය. ඇවැත්නි, එසේය.

ඇවැත්නි, එලෙසින්ම ආයයීයන් නොදක්නා, ආයයී ධර්මයෙහි අදක්ෂ, ආයයීධර්මයෙහි නොහික්මුණු, සත්පුරුෂයන් නොදක්නා, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු, අශ්‍රැතවත්, පෘතග්ජන රූපය ආත්මය'යි හෝ ආත්මය රූප ඇත්තෙකැ'යි හෝ ආත්මයෙහි රූපය ඇතැ'යි හෝ රූපයෙහි ආත්මය ඇතැ'යි හෝ දකියි.

වේදනාව ආත්මයි හෝ ආත්මය වේදනා ඇත්තෙකැ'යි හෝ ආත්මයෙහි වේදනාව ඇතැ'යි හෝ වේදනාවේ ආත්මය ඇත'යි හෝ දකියි.

සංඥාව ආත්මය'යි හෝ ආත්මය සංඥා ඇත්තෙකු'යි හෝ ආත්මයෙහි සංඥාව ඇතැ'යි හෝ සංඥාවේ ආත්මය ඇතැ'යි හෝ දකියි.

සංස්කාරයෝ ආත්මය'යි හෝ ආත්මය සංස්කාරයන් ඇත්තෙකැ'යි හෝ ආත්මයේ සංස්කාර ඇතැ'යි හෝ සංස්කාරයන්හි ආත්මය ඇතැ'යි හෝ දකියි.

විඥාණය ආත්මය හෝ ආත්මය විඥාණවත් යැ'යි හෝ ආත්මයෙහි විඥාණය ඇතැ'යි හෝ විඥාණයෙහි ආත්මය ඇතැ'යි හෝ දකී.

අනිත්‍යවූ රූපය, අනිත්‍යවූ රූපය යැ'යි තතුසේ නොදනී. අනිත්‍යවූ වේදනාව අනිත්‍ය වූ වේදනාව යැ'යි තතු සේ නොදනියි. අනිත්‍ය වූ සංස්කාර අනිත්‍ය වූ සංස්කාර යැ'යි තතුසේ නොදනියි. අනිත්‍යවූ විඥාණය අනිත්‍යවූ විඥාණයයැයි තතුසේ නොදනියි.

දුකවූ රූපය, දුකවූ රූපයයැ'යි තතුසේ නොදනී. දුකවූ වේදනාව දුකවූ වේදනාව යැ'යි තතුසේ නොදනියි. දුකවූ සංඥාව, දුකවූ සංඥාව යැ'යි තතුසේ නොදනියි. දුකවූ සංස්කාරයෝ, දුකවූ සංස්කාරයයි තතුසේ නොදනියි. දුකවූ විඥාණය, දුකවූ විඥාණ යැ'යි තතුසේ නොදනියි.

අනාත්ම වූ රූප, අනාත්ම රූපයි තතුසේ නොදනියි. අනාත්ම වූ වේදනා, අනාත්ම වේදනා යැ'යි තතුසේ නොදනියි. අනාත්ම වූ සංඥා, අනාත්ම වූ සංඥා යැ'යි තතුසේ නොදනියි. අනාත්ම වූ සංස්කාර අනාත්ම වූ සංස්කාරයැ'යි තතුසේ නොදනියි. අනාත්ම වූ විඥාණය අනාත්ම විඥාණය යැ'යි තතුසේ නොදනියි.

සංඛත රූපය, සංඛතරූපයැ'යි තතුසේ නොදනියි. සංඛත වේදනාව, සංඛත වේදනාවයැ'යි තතුසේ නොදනියි. සංඛත සංඥාව, සංඛත සංඥාවයැ'යි තතුසේ නොදනියි.

සංඛත සංස්කාර, සංඛත සංස්කාරයැ'යි තතුසේ නොදනියි. සංඛත විඥාණ, සංඛත විඥාණ යයි තතුසේ නොදනී.

වධක රූපය, වධක රූපයැ'යි තතුසේ නොදනියි. වධක වේදනාව, වධක වේදනාවයැ'යි තතුසේ නොදනියි. වධක සංඥාව, වධක සංඥාවයැ'යි තතුසේ නොනියි. වධක සංස්කාර, වධක සංස්කාරයැ'යි තතුසේ නොදනියි. වධක විඥාණ, වධක විඥාණය'යි තතුසේ නොදනියි.

හේ රූපය මගේ ආත්මයයි. දෘෂ්ඨිගත වෙයි. දැඩිව ගනියි. පිහිටයි.

හේ වේදනාව මගේ ආත්මයයි. දෘෂ්ඨිගත වෙයි. දැඩිව ගනියි. පිහිටයි.

හේ සංඥාව මගේ ආත්මයයි. දෘෂ්ඨිගත වෙයි. දැඩිව ගනියි. පිහිටයි.

හේ සංස්කාරයෝ මගේ ආත්මයයි. දෘෂ්ඨිගත වෙයි. දැඩිව ගනියි. පිහිටයි.

හේ විඥාණය මගේ ආත්මයයි. දෘෂ්ඨිගත වෙයි. දැඩිව ගනියි පිහිටයි.

ඔහු විසින් මේ පඤ්චෝපාදානස්කන්ධයෝ දිගින් දිගටම පවත්වා ගන්නට උපගතවූවාහු, දැඩිව ගන්නා ලද්දාහු, අහිත පිණිස දුක පිණිසම පවතිත්.

ඇවැත්නි, ආයර්‍යයන් දක්නා, ආයර්‍යධර්මයෙහි දක්ෂ, ආයර්‍ය ධර්මයෙහි හික්මුණු, සත් පුරුෂයන් දක්නා, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුණු

ශ්‍රැතවත් ආයර්‍ය ශ්‍රාවක, රූපය ආත්ම වශයෙන් නොදකියි. ආත්මය රූපවත්යැ'යි හෝ නොදකියි. රූපය ආත්මයෙහි ඇතැ'යි හෝ නොදකියි. රූපයෙහි ආත්මය ඇතැ'යි හෝ නොදකියි.

වේදනාව ආත්ම වශයෙන් නොදකියි. ආත්මය වේදනාවක් යැ'යි හෝ නොදකියි. වේදනාව ආත්මයෙහි ඇතැ'යි හෝ නොදකියි. වේදනාවෙහි ආත්මය ඇතැ'යි හෝ නොදකියි.

සංඥාව ආත්ම වශයෙන් නොදකියි. ආත්මය සංඥාව යැයි හෝ නොදකියි. සංඥාව ආත්මයෙහි ඇතැ'යි හෝ නොදකියි. සංඥාවේ ආත්මය ඇතැ'යි හෝ නොදකියි.

සංස්කාර, ආත්ම වශයෙන් නොදකියි. ආත්මය සංස්කාර යැ'යි හෝ නොදකියි. සංස්කාර ආත්මයෙහි ඇතැ'යි හෝ නොදකියි. සංස්කාරයෙහි ආත්මය ඇතැ'යි හෝ නොදකියි.

විඥාණය, ආත්ම වශයෙන් නොදකියි. ආත්මය විඥාණයයි හෝ නොදකියි. විඥාණය ආත්මය'යි ආත්මයෙහි ඇතැ'යි හෝ නොදකියි, විඥාණයෙහි ආත්මය ඇතැ'යි හෝ නොදකියි.

හේ අනිත්‍ය වූ රූපය, අනිත්‍ය වූ රූපය'යි. තතුසේ දනියි. අනිත්‍ය වූ වේදනාව, අනිත්‍ය වූ වේදනාව යැ'යි තතුසේ දනියි. අනිත්‍ය වූ සංඥාව, අනිත්‍ය වූ සංඥාව යයි තතුසේ දනියි. අනිත්‍ය වූ සංස්කාරය, අනිත්‍යවූ සංස්කාරයයි තතුසේ දනියි. අනිත්‍ය වූ විඥාණය, අනිත්‍ය වූ විඥාණය යැ'යි තතුසේ දනියි.

දුක වූ රූපය, දුක වූ රූපයැ'යි තතුසේ දනී. දුක වූ වේදනාව, දුක වූ වේදනාවයැ'යි තතුසේ දනී. දුක වූ සංඥා, දුක වූ සංඥා යැ'යි තතුසේ දනී. දුක වූ සංස්කාර දුක වූ සංස්කාර යැ'යි තතුසේ දනී. දුකවූ විඥාණය, දුක විඥාණ යැ'යි තතු සේ දනී.

අනාත්ම වූ රූපය, අනාත්ම වූ රූප යැ'යි තතුසේ දනී. අනාත්ම වූ වේදනාව, අනාත්ම වූ වේදනාව යැ'යි තතුසේ දනී. අනාත්ම වූ සංඥාව, අනාත්ම වූ සංඥාව යැ'යි තතුසේ දනී.අනාත්ම වූ විඥාණය, අනාත්ම වූ විඥාණ යැ'යි තතුසේ දනී.

සංඛත වූ රූපය, සංඛත වූ රූප යැ'යි තතුසේ දනී. සංඛත වූ වේදනාව, සංඛත වූ වේදනා යැ'යි තතුසේ දනී. සංඛත වූ සංඥාව, සංඛත වූ සංඥාව යැ'යි තතුසේ දනී. සංඛත වූ සංස්කාරය, සංඛත වූ සංස්කාර යැ'යි තතුසේ දනී. සංඛත වූ විඥාණය, සංඛත වූ විඥාණ යැ'යි තතුසේ දනී.

වධක වූ රූපය, වධක වූ රූප යැ'යි තතුසේ දනී. වධක වූ වේදනාව, වධක වූ වේදනා යැ'යි තතුසේ දනී. වධක වූ සංඥාව, වධක වූ සංඥාව යැ'යි තතුසේ දනී. වධක වූ සංස්කාරය, වධක වූ සංස්කාර යැ'යි තතුසේ දනී. වධක වූ විඥාණය, වධක වූ විඥාණ යැ'යි තතුසේ දනී.

හේ රූපය මගේ ආත්මයැ'යි නොසිතයි. දැඩිව නොගනියි. නොපිහිටයි.

වේදනාව මාගේ ආත්මයැ'යි නොසිතයි. දැඩිව නොගනියි. නොපිහිටයි.

සංඥාව මාගේ ආත්මයැ'යි නොසිතයි. දැඩිව නොගනියි. නොපිහිටයි.

සංස්කාර මාගේ ආත්මයැ'යි නොසිතයි. දැඩිව නොගනියි. නොපිහිටයි.

විඥාණය මාගේ ආත්මයැ'යි නොසිතයි. දැඩිව නොගනියි. නොපිහිටයි.

ඔහු විසින් මේ පඤ්චෝපාදානස්කන්ධයෝ උපගත නොවූවාහු, දැඩිව නොගන්නා ලද්දාහු, දිගුකලක් මුළුල්ලෙහි හිතසුව පිණිස පවතින්යැ'යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදාළහ.

(යමක සූත්‍රය)

## මනසිකාර

සිතක් ඇත්තේ සිතන්නේය. සිතීමේ හැකියාව ඇත්තාහට සැලසුම්කළ හැක්කේය. සැලසුම්කරනුයේ ඕනෑකම නිසාය. ඕනෑකමය යනු කැමැත්තය. කැමැත්තතුළ ඇත්තේ ලෝභයයි. කැමැත්තතුළ ඇත්තේ තණ්හාවයි. තණ්හාව යනු තෘෂ්ණාවයි. තෘෂ්ණාව යනු විඥාණමය හේතුවයි. කාම - භව - විභව තණ්හා කෙරෙන් සපිරි මතකයන්ය යනු විඥාණයයි.

## විඥාණය

විඥාණස්වභාවය කොතැනකද, එතැන සත්ත්වයෙකු ඇත්තේය. සත්ත්වයෙකු වන්නේ කොතැනකද, එතැන විඥාණස්වභාවය ඇත්තේය. සත්ත්වයා විඥාණය

නොවන්නේය. විඥාණයද සත්ත්වයා නොවන්නේය. විඥාණය එකෙකි. සත්ත්වයා අනෙකෙක් වන්නේද නොවේ. විඥාණය එකෙකි. සත්ත්වයා අනෙකෙක් නොවන්නේද නොවේ. හේතු ප්‍රත්‍යයන් පවතිනතාක් මේ ස්වභාවයන්ගේ නැවතීමක් ද නොපෙනෙන්නේය.

එහෙත් රූප, වේදනා, සංඥා, සංඛාර, අභ්‍යන්තර ආයතනයන් විසිනිදු, ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන බාහිර ආයතනයන් විසිනිදු, නිරන්තරයෙන් ස්පර්ශයන් හා කරණකොට අඛණ්ඩ ස්වරූපයක් මත සක්කායදිට්ඨිය පැනනැගී මම, මගේ, වශයෙන් පවතින්නට වන්කළ වෙනස්වීමේ ස්වභාවය නිසාම මුලාවේ පවතී. දුක පවතී.

නාමරූපයන්ම, විඥාණ හේතුප්‍රත්‍යයෝය. විඥාණයම, නාමරූප හේතුප්‍රත්‍යයෝය. එක් ස්වභාවයක් නැති වූ තැන, අනෙක් ස්වභාවය ඇතිවන්නේ නැත.

## ස්පර්ශය, ෂණසංඥාව හා මුලාව

බෙරය එකකි. බෙරයේ ඇසට පහර දෙන අත තවත් එකකි.

ඇස් පියාගෙන සිටින බැවින් බෙරය දකින්නේ නැත. බෙරඇසට පහරදෙන අත දකින්නේ නැත.

බෙර හඬ ඇසුනි.

හඬ අයිති බෙරයටද?

හඬ අයිති බෙරඇසට පහරදුන් අතටද?

බෙරඇසත්, අතත් අතර සිදුවූ ස්පර්ශයේ ස්වභාවය, ප්‍රතිඵලය හඬ විය.

හඬ ඇසුන තැන උපත විය.

හඬෙහි අයිතිය කාගේ ද? නම කුමක්ද?

එවැන්නක් නැත. ස්වභාවයකි.

බෙරය නම් වූ සම්මුතිය ඇසුරුකොට පැනනැගුන බැවින් බෙරහඬ නම් විය.

හඬඋපන් ක්ෂණයෙන් නිරුද්ධ විය.

හඬ නිරුද්ධවන තැනම උපතද නිරුද්ධ විය.

යළි එතැන නිහැඬියාවය.

හඬ පහළවනවිට උපන් සක්කායදෘෂ්ඨිය මම නම් විය. මම අසන්නා විය. විඳින්නා විය. ආස්වාදය ලබන්නා විය.

ආදීනවය ඇතිවිය. නටන්නට විය. හඬ නතරවත්ම නිරෝධය විය.

හඬ ඇසූ මමායනය නිමවිය. මාගේ ඇසීම අවසන්විය. විඳීම අවසන්විය. නිස්සරණයවිය. ස්වභාවයයි. ධර්මතාවයයි.

බෙරඇසට අතින් පහර දෙනතාක් බෙරහඬ පවතින්නේය. ඒ එක් ස්වභාවයකි. බෙරය හා බෙරඇස ස්කන්ධයක් ලෙස ගත්කල, බෙරයට පහරදුන් අත

තවත් ස්කන්ධයකි. ඒ වනාහි තවත් ස්වභාවයකි. බෙරඇසට පහරදීම හා බෙරහඬ එකක්ම නොවේ. අනන්තවූ ස්වභාවයන් රැසකි. බෙරයට අතින් පහරදීමේ ස්වභාවයෝය. බෙරහඬ පැවැත්වීමේ ස්වභාවයෝය. මේ දෙකක්ම පමණක් වන්නේද නොවේ. එකක් වන්නේද නොවේ. අප්‍රමාණයකි. ප්‍රමාණකළ නොහැකි ස්වභාවයෝය. හේතුප්‍රත්‍යයෝය.

බෙරඇස යනුද, බෙරය නොවේ. තවත් අනන්තවූ හේතුප්‍රත්‍යයෝ රැසකි. බෙරගෙඩියද අපමණ වූ හේතුප්‍රත්‍යන්ගෙන් සැකසුන ස්කන්ධයකි. බෙරඇස නම් වූ සම්කඩ සවිවනුයේ බෙරගෙඩියටය. එතැන දී බෙර ගෙඩිය හා බෙරඇස යනු දෙකක් නොවන්නාසේම එකක් ද නොවන්නේය. ස්කන්ධයන් වූ මේවා රූප ස්වභාවයෙන්ම පමණක් නොව නාම ස්වභාවයන් ගෙන්ද යුක්ත වූවෝමය.

නාම ස්වභාවය එහි නොමැති වූයේ නම්, බෙරය හෝ හම්කඩ ලෙසින් හෝ බෙරහඬ ලෙසින් හඳුනාගැනීමේ හැකියාවක් නොවන්නේය. හඳුනාගැනීම යනු සංඥාවයි. විඥාණ ස්වභාවයයි.

බෙරහඬ කෙරෙහි සිත පිහිටුවාගත් කළ ඇසෙන්නේ බෙරහඬ පමණි. බෙරහඬ ඇතිවූ හේතුප්‍රත්‍යයන් දැකීමටනම් ඒ පිළිබඳව සම්මර්ශණය කළ යුත්තේය. එවිට දැකියහැකි දේ අනන්තය. අප්‍රමාණය එවන් ස්වභාවයන් මෙනෙහිවනකළ බෙරහඬ මත පැවතීමේ සිතක් නැතිවන අතර අරමුණු ලෙස ගැනීමට හැකි නිශ්චිත හේතුවක් ද නොවන්නේය. එතැන කිසිවක් හා උපාදානය නොවන

චිත්ත ස්වභාවයකි. එතැන ආස්වාදය නැත. ආදීනවයද නැත. නිස්සරණයද නැත.

බෙරහඬ හා සිත උපාදනය වූයේ නම් එහි හඬ කර්ණරසායනය විය හැකිය. නැතහොත් කර්ණකඨෝර විය හැකිය. එසේ ද නැතහොත් කර්ණකඨෝර හෝ කර්ණරසායනයද නොවියහැක්කේය. මේ කවර ආකාරයෙන් දැක්වූයේ වුවද පහළවූයේ විඥාණය ය. ත්‍රිවිධ තෘෂ්ණාවෝමය. පංචඋපාදානස්කන්ධයෝමය.

බෙරයේ හඬ පැතිරයාමට බෙරඇසෙහි සම මැනවින් පදම්වී තිබිය යුතුය. බෙරකඳ පිපිරීමකින් තොරව මනාලෙස තිබිය යුතුය. බෙරඇසත්, බෙරකඳත්, වරපටින් මනාලෙස සම්බන්ධවී තිබිය යුතුය. බෙරඇසට වදින පහර නිසිලෙසින් බෙරඇස මත පතිතවිය යුතුය. අත හසුරුවන්නා හා ඒ පිළිබඳව ද තවත් හේතුන් අප්‍රමාණ වශයෙන් ක්ෂණයකදීම පවතින්නේය. එවන් අනේකාකාර වූ හේතුන් සමූහයක් පැවතියද, බෙරහඬ මතට පමණක් සිත එළැඹීකළ සෙසු ස්වභාවයන් කිසිවක් නොදකී. එසේනම් බෙරහඬ සක්කායදෘෂ්ඨියකි. සැබැවින්ම බෙරහඬ වූයේ, අප්‍රමාණවූ හේතුප්‍රත්‍යයන් රාශියක සංයෝගයක් මිස, එකම නාමරූප ස්වභාවයක් නොවේ. හේතුප්‍රත්‍යයන් සියල්ල වෙන්වෙන්ව දක්නට ප්‍රත්‍යවේක්ෂ කරන්නේ නම් බෙරය. බෙරහඬ, අත, වරපට හෝ අන් කවරදෙයක් පිළිබඳව මනසිකාරය, විඥාණය නවතින්නේ නැත. පවතින්නේ නැත. කිසිවක් අල්ලා ගන්නට පෙර සියල්ල නිරුද්ධය.

# සිත

මහණෙනි, ඇසූ පිරූතැන් ඇති ආයඝ්‍රාවක තෙමේ සතර මහාභූතයන් ගෙන් හටගත් මේ සිරුරෙහි උකටලී වන්නේත් වෙයි. නොඇලෙන්නේත් වෙයි. මිදෙනු කැමැත්තේත් වෙයි. ඒ කවර හෙයින යත්,

මහණෙනි, සතර මහාභූතයන්ගෙන් හටගත් මේ ශරීරයෙහි වැඩීමත්, පිරිහීමත්, හටගැනීමත්, බිඳීමත් පෙනෙයි. එහෙයින්, ඇසූ පිරූතැන් ඇති ආයඝ්‍රාවක තෙමේ එහිලා උකටලීවන්නේත් වෙයි. නොඇලෙන්නේත් වෙයි. මිදෙනු කැමැත්තේත් වෙයි.

මහණෙනි, මේ යමක් සිත යයිදු, මනස යයිදු විඥාණ යයිදු කියනු ලැබේද? එහිලා නූගත්, පුහුදුන් තෙමේ, කළකිරෙන්නට නොසමත්ය. නොඇලෙන්නට නොසමත්ය. මිදෙන්නට නොසමත්ය. ඒ කවර හෙයින්දයත්, මහණෙනි, නූගත් පුහුදුන්හු විසින් බොහෝ කලක් මුළුල්ලෙහි මෙය මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි (තෘෂ්ණාවෙන්) බැසගන්නා ලදී. එහෙයින් එහිලා නූගත්තෙමේ උකටලීවන්නට නොසමත්ය. නොඇලෙන්නට නොසමත්ය. මිදෙන්නට නොසමත්ය.

මහණෙනි, ඇසූ පිරූ තැන්නැති, පුහුදුන් තෙමේ සතර මහාභූතයන්ගෙන් හටගත් ශරීරය ආත්මයයි ගන්නෙ නම් උතුම්. සිත එලෙස ගැනීම නොම මැනවි. ඒ කවර හෙයින් ද යත්, මහණනි, සතර මහාභූතයන් ගෙන් හටගත් මේ ශරීරය එක්වසක් සිටුනේම, දෙවසක් සිටුනේම, තෙවසක් සිටුනේම, දසවසක් සිටුනේම, විසිවසක් සිටුනේම,

තිස්වසක් සිටුනේම, හතළිස් වසක් සිටුනේම, පනස් වසක් සිටුනේම, සියවසක් සිටුනේම ඉන් වැඩියක් කල් සිටුනේම පෙනෙයි. මහණෙනි, යමක් මේ සිත යැ'යි මනස යයි විඥාණය යැ'යි කියනුලැබේද? ඒ සිත රෑ ද, දහවල් ද අනෙකක්ම උපදි. අනෙකක්ම නිරුද්ධවේ.

මහණෙනි, වඳුරෙක් මහ වනයෙහි හැසිරෙණුයේ යම්සේ අත්තක එල්බගනීද, එය මුදා අනෙකක් එල්බ ගනීද, මහණෙනි, එසෙයින් ම මේ යමක් සිතයැ'යි මනසයැ'යි විඥාණයැ'යි කියනු ලැබේද? ඒ (සිත) රෑ ද දහවල් ද අනෙක්ම උපදී. අනෙකක්ම නිරුද්ධ වේ. (සිත අරමුණක් අරමුණක් පාසා වෙනස්වන බවක් පැවසේ.)

මහණෙනි, එහිලා ඇසූපිරූ තැන්ඇති ආයර්‍යශ්‍රාවක තෙමේ පටිච්චසමුප්පාදයම මනාකොට නුවණින් මෙනෙහි කෙරේද, මෙසේ මේ හේතුව ඇතිකල්හි මේ ඵලය වෙයි. මෙය ඇතිවීමෙන් මෙය උපදී. මෙය නැති කල්හි මෙය නොවෙයි. මේ හේතුව නිරුද්ධවීමෙන් මේ ඵලය නිරුද්ධවෙයි. ඒ නම් අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාණය වේ. මෙසේ මේ දුක් රැසෙහි හටගැනීමවේ.

අවිද්‍යාව නිරවශේෂයෙන් නිරුද්ධ කිරීමෙන් සංස්කාර නිරෝධය වේ. සංස්කාර නිරෝධයෙන් විඥාණය නිරෝධය වෙයි. මෙසේ හුදු දුක්රැසෙහි නිරෝධ වේ.

මහණෙනි, ශ්‍රැතවත් ආයර්‍ය පුරුෂ තෙමේ මෙසේ දන්නේ, රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි. සංඥාවෙහිද කළකිරෙයි. සංස්කාරයෙහිද කළකිරෙයි.

විඥාණයෙහිද කළකිරෙයි. කළකිරෙනුයේ නොඇලෙයි. නොඇලෙනුයේ මිදෙයි. මිදුනුකල්හි මිදුනේයැ'යි දැනගැනීම වෙයි.

ඉපදීම ක්ෂයවිය. මඟබඹසරවැස නිමවනලදී. කටයුත්ත කරනලදී. මේ බැව් පිණිස (මේ සඳහා) අනෙකක් නැතැ'යි දැනගනියි.

මහණෙනි ඇසූ පිරූතැන් ඇති ආයර්‍ය ශ්‍රාවක තෙමේ සතර මහා භූතයන්ගෙන් හටගත් මේ සිරුරෙහි උකටලිවන්නේත්, වෙයි. නොඇලෙන්නේත් වෙයි. මිදෙනු කැමැත්තේත් වෙයි. ඒ කවර හෙයින් යත්,

මහණෙනි, සතර මහාභූතයන් ගෙන් හටගත් මේ ශරීරයෙහි වැඩීමත්, පිරිහීමත්, හටගැනීමත්, බිඳීමත් පෙනෙයි. එහෙයින් ඇසූ පිරූ තැන් ඇති ආයර්‍යශ්‍රාවක තෙමේ එහිලා උකටලීවන්නේත් වෙයි. නොඇලෙන්නේත් වෙයි. මිදෙනු කැමැත්තේත් වෙයි.

මහණෙනි, මේ යමක් සිත යැ'යිදු, මනස යැ'යිදු, විඥාණය යැ'යිදු කියනු ලැබේද? එහිලා නූගත් පුහුදුන් තෙමේ කළකිරෙන්නට නොසමත්ය. ඒ කවර හෙයිනයත්, මහණෙනි, නූගත් පුහුදුන්හු විසින් දිගුකලක් මුළුල්ලේ මේ සිත මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි. (තෘෂ්ණාවෙන්) බැසගන්නා ලදි. මමත්වය ඇතිකරන ලද්දේය. පරාමර්‍ශනය කරනලද්දේය. එහෙයින් එහිලා පුහුදුන් තෙමේ කළකිරෙන්නට නොසමත්ය. නොඇලෙන්නට නොසමත්ය. මිදෙන්නට නොසමත්ය.

මහණෙනි, එහි ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ, මෙසේ මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය හටගැනීමෙන් මෙය උපදී. මෙය නැතිකල්හි, මෙයනොවේ. මෙය නිරුද්ධ වීමෙන්, මෙය නිරුද්ධවේයැ'යි මනාකොට නුවණින් මෙනෙහි කෙරෙයි. මහණෙනි, සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා සුඛවේදනාව උපදී. සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ඒ ස්පර්ශයේම නිරෝධයෙන් ඊට අනුරූප වූ යම් වේදනාවක් වේ නම්, සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා උපන් ඒ සුඛවේදනාව නිරුද්ධ වෙයි. එය සන්සිඳෙයි. මහණෙනි, දුකවේදනාවට ප්‍රත්‍යවූ ස්පර්ශය නිසා දුකවේදනාව උපදී. දුකවේදනාවට ප්‍රත්‍යයවූ ඒ ස්පර්ශයම නිරෝධයෙන් ඊට අනුරූපවූ යම්වේදනාවක් වේනම්, ස්පර්ශයම නිසා උපන් ඒ දුකවේදනාව නිරුද්ධවේ. එය සන්සිඳේ. මහණෙනි, මැදහත් වේදනාවට ප්‍රත්‍යයවූ ස්පර්ශය නිසා මැදහත් වේදනාව උපදී. මැදහත් වේදනාවට ප්‍රත්‍යවූ ඒ ස්පර්ශයේම නිරෝධයෙන් ඊට අනුරූප වූ යම් වේදනාවක්වේ නම්, මැදහත් වේදනාවට ප්‍රත්‍යයවූ ස්පර්ශය නිසා උපන් ඒ මැදහත් වේදනාව නිරුද්ධ වේ. එය සන්සිඳේ.

මහණෙනි, යම්සේ දඬුදෙකක් ගැටුම් හා එක්වීමෙන් උණුසුම උපදීද, උණුසුම හටගනීද, ඒ දඬුදෙක වෙන්වීමෙන්, බැහැරලීමෙන්, එයින් හටගත් යම් උණුසුමක් වේ නම් එය නිරුද්ධවේ. එය සන්සිදේ.

මහණෙනි, එසෙයින්ම සුඛවේදනාවට ප්‍රත්‍යයවූ ස්පර්ශය නිසා සුඛවේදනාව උපදී. සුඛවේදනාවට ප්‍රත්‍යයවූ ඒ ස්පර්ශයේම නිරෝධයෙන් එයට අනුරූප වූ

යම්විදනාවක් වේනම්, සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ස්පර්ශය නිසා උපන් ඒ සුඛවේදනාව නිරුද්ධවේ. එය සන්සිඳේ... මහණෙනි, මැදහත් වේදනාවට ප්‍රත්‍යයවූ ස්පර්ශය නිසා මැදහත් වේදනාව උපදී. මැදහත් වේදනාවට ප්‍රත්‍යයවූ ඒ ස්පර්ශයේම නිරෝධයෙන් ඊට අනුරූපවූ යම් වේදනාවක් වේනම්, මැදහත් වේදනාවට ප්‍රත්‍යයවූ ස්පර්ශය නිසා උපන් ඒ මැදහත් වේදනාව නිරුද්ධවේ. එය සන්සිඳේ.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ ස්පර්ශයෙහිද, කළකිරෙයි. වේදනාවෙහිද, කළකිරෙයි. සංඥාවෙහිද, කළකිරෙයි. සංස්කාරයන්හිද කළකිරෙයි. විඥාණයෙහිද, කළකිරෙයි. කළකිරෙනුයේ නොඇලෙයි. ඇලීමෙන් මිදෙයි. මිඳුන කල්හි මිඳුනේයැ'යි දැනීමවෙයි. ජාතිය ක්‍ෂය වූවාය. බඹසරවැස නිමවනලදී. කටයුතු කරනලදී. භවය පිණිස අන්කිසිවක් ශේෂවී නැතැ'යි දැනගනී.

(අස්සුතවන්ත සූත්‍රයෙනි)

## දුක උපදී

තණ්හාව යනු කැමැත්තය, හැඟීමය, නන්දිරාගය, විඳීමේ දැඩි ඕනෑකමය.

ලෝභය - විඥාණය මෙකී නොකී බොහෝ වචන හේතුවෙන්, සරළව වටහාගත හැකිදේ, වටහාගැනීමට නොහැකි වී, වචන අතර සිරවී සිටින්නට මිනිසා හට සිදුවී ඇත.

කැමැත්ත - ඕනෑකම ඇතිනොවේ නම්, එතැන පවතිනුයේ කුමක්ද?

මේ සරළ වටහාගැනීම ඇතිකර ගැනීමට දුෂ්කරතාවය බිහිවූයේම, වචන වලින් ඇතිවන බෙදනීය තත්ත්වයයි. කෙලෙස්හු අබලයෝයැ. දුබලයෝයැ. ලාමකයෝයැ.

ශ්‍රද්ධාබල, වියර්‍ය්‍යබල, ස්මෘතිබල, සමාධිබල, ප්‍රඥාබල, හිරිබල, ඔත්තප්පබල, යමෙක් හට නැද්ද (එහෙයින්) අබලවූ, දුබලවූ, අල්පබලවූ අල්පශක්තිවූ, හීනවූ, නිහීනවූ ලාමකවූ, ප්‍රතිප්‍රහීනවූ ඒ පුද්ගලයාව, ඒ ඒ ක්ලේශයෝ ග්‍රහනය කෙරෙති. හාත්පසින් මඩිති. අභිභවනය කෙරෙති.

අබල දුබල වූ ක්ලේශයන් විසින් - ප්‍රඥා වීර්‍ය්‍ය හීන පුද්ගලයින්ව ග්‍රහණය කරති. මැඩගනිති.

"මහණෙනි, සංයෝජනීය ධර්මයෙහි, දෝෂය නැවත නැවත දක්නාසුළුව නොවෙසෙන්නහුට විඥාණයාගේ බැසගැනීම වේ. විඥාණප්‍රත්‍යයෙන් නාමරූප වේ. මෙසේ හුදු දුක්රැස් හටගැනීම වේ.

මහණෙනි, යම්සේ මහරුකක්වේද, එහි යටබස්නා යම් මුලුත් වේද? ආහාරයෝ ඇති බැවින් බොහෝ දිගුකලක් සිටුනේය.

මහණෙනි, සංයෝජනීය ධර්‍මයන්හි දෝෂය නැවත නැවත දකිමින් වෙසෙන්නහුට, විඥාණයාගේ බැසගැනීම නොවේ. විඥාණයාගේ නිරෝධයෙන්, නාමරූප නිරෝධ වේ. මෙසේ හුදු දුක්රැස් නිරෝධ වේ.

මහණෙනි, යම්සේ මහරුකක්වේද, පුරුෂයෙන් උදැල්ලක් හා පැසක් ගෙන එහි එන්නේය. හෙතෙම ඒ රුක, මුල් සිඳින්නේය. මහරුක් උසුන්මුල් ඇත්තේ - මතු නොපවතින්නේය.

(විඥාණ සූත්‍රය)

## නාමරූප හේතු ප්‍රත්‍යයෝ

අඹඇටය පසට යටවිය.

පැලයක් ඇතිකිරීමේ වුවමනාවක් අඹඇටයට නැත. තමන් නිසා පැලයක් බිහිවන බවක් අඹඇටය දන්නේද නැත. එහෙත් අඹඇටය ප්‍රත්‍යකරගනිමින් අඹ පැලයක් බිහිවන්නේය. ඒ වනාහි හේතුඵලධර්මතාවයයි.

අඹඇටය ප්‍රත්‍යකරගනිමින් අඹපැලය බිහිවූයේ වුවද, බිහිවූ පැලය කෙරෙහි කිසිදු බලපෑමක් ඇති කිරීමේ හැකියාවකුදු අඹඇටයට නොවන්නේය.

බිහිවීමේ වුවමනාවක් අඹපැලයට ද නැත. එහෙත් අඹපැලය බිහිවී ඇත. තමන් බිහිවූ බවක් අඹපැලය දන්නේද නැත.

අඹගසක් වීමේ වුවමනාවක් අඹපැලයට නැත. එසේ වැඩී, ලියලා, විසල්ගසක් වනබවක් අඹපැලය දන්නේද නැත. එහෙත් කොල අතු දළුලමින්, දිගු මුල් ඇදෙමින්, කඳ මෝරමින් ශක්තිමත් ලෙසින් අඹගස වැඩෙන්නේය.

ගසෙහි, මල් පුබුදුවීමේ ඕනෑකමක් අඹගසට නැත. අඹමල් පූදිනබවක් අඹගස දන්නේද නැත. එහෙත්

අඹගස ප්‍රත්‍යයවෙමින්, අඹමල් හටගන්නේය. අඹමලින් ගෙඩි හටගන්නා බවක් අඹගස දන්නේ නැත. අඹගෙඩි හටගැන්වීමේ වුවමනාවක්, අඹගසට නැත. එහෙත් ගෙඩි හටගන්නේ ය.

තමන් කෙරෙන් අඹගෙඩි හටගන්නා බවක්, අඹමල් දන්නේ නැත. අඹගෙඩි හටගැන්වීමේ වුවමනාවක් අඹ මලට නැත. එහෙත් අඹගෙඩි හටගන්නේය.

අඹගෙඩිය රඳවාගැනීමේ වුවමනාවක් නටුවට නැත. අඹගෙඩිය තමා කෙරෙන් රැඳී සිටින බවක්, නටුව දන්නේද නැත. එහෙත් අඹ ගෙඩිය නටුවෙන් ගසෙහි රැඳී සිටින්නේය.

තමන් වැඩී, ලොකු වී, පැසී ඉදෙන බවක් අඹගෙඩිය දන්නේද නැත. වැඩී, ලොකු වී, පැසී, ඉදීමේ වුවමනාවක් අඹ ගෙඩියට ද නැත. එහෙත් අඹගෙඩිය වැඩී, ලොකුවී පැසී, ඉදෙන්නේ ය.

නටුවෙන් ගිලිහී බිම පතිතවීමේ වුවමනාවක් අඹ ගෙඩියට නැත. එසේ නටුවෙන් ගිලිහී බිම පතිතවන බවක් අඹගෙඩිය දන්නේද නැත. එහෙත් අඹගෙඩිය නටුවෙන් ගිලිහී බිම පතිතවන්නේ ය.

කුණු වී, ජරාවට පත් වී, දුගඳ හමමින් පණුවන් ඇතිකිරීමේ වුවමනාවක් අඹගෙඩියට නැත. කුණුවී ජරාවට පත්වී දුගඳහමමින්, පණුවන් ඇතිවන බවක් අඹගෙඩිය දන්නේද නැත. එහෙත් කුණුවී ජරාවට පත්වී දුගඳ හමමින් පණුවන් ඇතිවන්නේය.

සියළුහරය පසටම එක්වන්නේය.

යලිත් එතැනම තවත් ඇටයක්ද, පසද ශේෂවී ඇති බැවින්, තවත් අඹගසක් බිහිවීමේ ප්‍රවනතාවය එතැන නැත්තේද නොවේ. රූපස්කන්ධයක් එහි නොතිබුණේද නොවේ. අඹගසක් වූයේ නාමරූපප්‍රත්‍යයෙනි. එසේ නොවීනම් පැවතියේ හේතුඵල ධර්මස්වභාවයන් රැසක්ම පමණි.

ගසක් නම් වූ ස්කන්ධ ස්වරූපයකට, වේදනා ධර්ම ස්වභාවයන් නැතුවා නොවේ. එහෙත් එය සත්ත්ව ස්කන්ධයන් කෙරෙහි මෙන් ප්‍රබලතාවයෙන් යුක්ත නොවන්නේය.

සත්ත්ව ස්කන්ධයන් කෙරෙහිද, මනුෂ්‍ය රූප ස්කන්ධයන් කෙරෙහි ද, වේදනා, සංඥා, සංස්කාර, විඥාණ, පස්ස, වේදනා, සංඥා, චේතනා, මනසිකාර, ආදී වශයෙන් අප්‍රමාණ වූ ප්‍රවණතාවයෙන් යුතුවන්නේය.

අඹගස බිහිවූයේ, මහාභූතයින් කෙරෙනි. අඹගස අඹගසක් වූයේ, පඤ්චෝපාදනස්කන්ධයන් වූ නාමරූප ධර්මයන් ප්‍රත්‍යයෙනි. අඹගෙඩි ඇට, ඇස, කන, නාසය, දිව, ශරීරය, මනැස ද පඤ්චෝපාදනස්කන්ධයන් (නාමරූපස්වභාව) ප්‍රත්‍යයෙන් පහළවනු වෙයි. ඒ හැරුණුකොට කිසිදු නිත්‍යවු, සත්‍යවූ, සැබෑවට පවතින්නාවූ කිසිවක් නොවුනේය. අඹගස දැක හඳුනාගන්නේ ත්‍රිවිධ තෘෂ්ණාවෙන් පරිනිර්මිත පූර්ව මතකයන් වන 'විඥානය' කෙරෙනි.

## කරජකය

ආපෝ, තේජෝ, වායෝ, පඨවි, ධාතුහුය. භූත ස්වභාවයෝය. මෙවන් ධාතු ස්වභාවයන්ගේ ප්‍රත්‍යයෝ ශුක්‍රාණුය, අර්තවෝය වශයෙන්ද හටගන්නේය.

අර්තවයක් සමඟ එක්වීමේ ඕනෑකමක් ශුක්‍රාණුවට නැත. ශුක්‍රාණුවක් සමඟ එක්වීමේ ඕනෑකමක් අර්තවයටද නැත. ඒවා එකිනෙකා එක්වන බවක්ද, ඔවුනොවුන් නොදනියි. එහෙත් හේතුප්‍රත්‍ය යෙදුනකළ අර්තවයෝ ද, ශුක්‍රාණුවෝද එකිනෙක ප්‍රතිග්‍රහණය කෙරෙති.

ප්‍රතිග්‍රහණයවන ශුක්‍රාණුවට හෝ අර්තවයට පිණ්ඩයක් බිහිකිරීමේ ඕනෑකමක් නැත. එකිනෙකාගේ ප්‍රතිග්‍රහණය හේතුවෙන් පිණ්ඩයක් බිහිවන බව ඒවා දන්නේද නැත. එහෙත් එකිනෙකාගේ ප්‍රතිග්‍රහණය ප්‍රත්‍යකොට පිණ්ඩයක් බිහිවන්නේය.

කළලයක් බිහිකිරීමේ ඕනෑකමක් පිණ්ඩයට නැත. පිණ්ඩය නිසාම කළලයක් හටගන්නා බවක් පිණ්ඩය දන්නේද නැත. එහෙත් පිණ්ඩය ප්‍රත්‍යය කරමින් කළලය හටගන්නේය.

පඤ්චස්කන්ධයක් ඇතිකිරීමේ ඕනෑකමක් කළලයට නැත. කළලය ප්‍රත්‍යය කරමින් පඤ්චස්කන්ධය හටගන්නා බවක්, කළලය දන්නේද නැත. එහෙත් කළලය ඇසුරු කරමින් පඤ්චස්කන්ධය වැඩෙන්නේය.

බිහිවීමේ ඕනෑකමක් රූපකායට නැත. බිහිවනබවක් රූපකාය දන්නේද නැත. එහෙත් රූපකාය බිහිවන්නේය.

පඤ්චඋපාදානස්කන්ධය ඇසුරු කිරීමේ ඕනෑකමක්, රූපකායට නැත. තමන් ප්‍රත්‍යයකරමින් පංචඋපාදානස්කන්ධය පවතින බවක් රූපකාය දන්නේ නැත. එහෙත් රූපකාය ඇසුරුකරමින් වේදනා, සංඥා, සංස්කාර, විඥානයෝ පහළවන්නාහ.

වැඩීමේ ඕනෑකමක් රූපකායට නැත. වියපත්වීමේ දිරායාමේ, ජරාවට පත්වීමේ, අක්‍රියවීමේ, ඕනෑකමක් රූපකායට නැත. එවන් තත්වයන් ඇතිවන බවක් රූපකාය දන්නේද නොවේ. එහෙත් රූපකාය වැඩෙන්නේය. දිරන්නේය. ජරාවට පත්වන්නේය. අක්‍රිය වන්නේය.

නාමරූප ප්‍රත්‍යයන් පිරිසිඳ දැක්මටත්, හේතු ප්‍රත්‍යයන් ක්ෂයකොට අක්‍රියභාවයට පත්කිරීමෙන් නිරුද්ධ කිරීමටත්, සිහිය දියුණුකළ මිනිසාට අවස්ථාවක් එළැඹෙනුයේද එබැවිනි.

## නාමරූප

ඇවැත්නි, නාමරූප කවරේද? නාමරූප සමුදය කවරේද, නාමරූප නිරෝධය කවරේද? නාමරූප නිරෝධගාමිනී ප්‍රතිපදා කවරේද?

ඇවැත්නි, වේදනා, සංඥා, චේතනා, ස්පර්ශ, මනසිකාර යන මෙය නාමයයි කියනු ලැබේ.

ඇවැත්නි, සතර මහාභූතයන්, සතර මහාභූතයෝ කෙරෙන් පවත්නා රූපයත් යන මෙය රූපයයි කියනු ලැබේ.

ඇවැත්නි, මෙසේ මේ නාමයත්, මේ රූපයත් යනමෙය නාමරූපයයි කියනු ලැබේ. විඥාණ සමුදයෙන් නාමරූප සමුදයවේ. විඥාණ නිරෝධයෙන් නාමරූප නිරෝධයවේ. මේ අරියඅටැඟිමගම නාමරූප නිරෝධ ගාමිනී ප්‍රතිපදාවයි.

ඇවැත්නි, යම් කලෙකපටන් ආයර්‍යශ්‍රාවක තෙමේ මෙසේ නාමරූපයන් දනී ද, මෙසේ නාමරූප සමුදයන් දනීද, මෙසේ නාමරූප නිරෝධයන් දනීද, මෙසේ නාමරූප නිරෝධගාමිනී ප්‍රතිපදාවන් දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන්ම රාගානුශය නැතිකිරීමෙන් කෝපය, බිය නැති කිරීමෙන් මමය යනුවෙන් ඇතිකර ගන්නා වැරදිපිළිගැනීමත්, ඒ සමානවූ සිතුවිලිවලිනුත් මිදී, මෝහය දුරැර, නුවණ උපදවා මේ ජාතියෙහිදීම දුක, කෙළවර කරන්නේය.

ඇවැත්නි, මෙපමණකින් ආයර්‍යශ්‍රාවක තෙමේ මනාවූ නිවැරදි දැක්ම ඇතිකර ගනී. ඍජු අවබෝධයෙන් යුත් ඔහු ධර්මයෙහි අචලවූ පැහැදීමෙන් ද යුක්ත වූයේ නිර්වාණ ධර්මයට පැමිණියේ වෙයි.

(සම්මා දිට්ඨි සූත්‍රයෙනි)

## ආහාර

ඇවැත්නි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසද, අණ්ඩකෝෂ, වස්තිකෝෂයන්හි සිටින එහෙයින්ම උත්පත්තිය සොයන, සතුන්ට අනුග්‍රහ පිණිසද පවත්නා මේ ආහාරයෝ සතරදෙනෙක් වෙත්,

ගොරෝසුවූද, සියුම්වූද, කබලිංකාර ආහාරය (වළඳනු ලබන දෙය)

දෙවැනිවූ, ඵස්සාහාරය,

තුන්වැනිවූ, මනෝසඤ්චෙතනාහාරය

සතරවැනිවූ, විඥානාහාරය යන සතරයි.

තෘෂ්ණාව හටගැනීමෙන් ආහාරයන්ගේ හටගැනීම්වේ. තෘෂ්ණා නිරෝධයෙන් ආහාර නිරෝධයවේ.

මේ ආර්‍යඅෂ්ඨාංගික මාර්ගයම, මේ ආහාරයන් ගෙන් වෙන්වීමේ (ආහාර නිරෝධගාමිනි) ප්‍රතිපදාවයි. එනම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන මේවායි.

ඇවැත්නි, යම් කාලෙක පටන් ආර්‍යශ්‍රාවක තෙමේ මෙසේ ආහාරය දනීද, ආහාරසමුදය දනීද, මෙසේ ආහාරනිරෝධ දනීද, මෙසේ ආහාර නිරෝධයට පමුණුවන පිළිවෙත දනීද, හෙතෙම සර්වප්‍රකාරයෙන්ම රාගානුශයහැර ගැටීම් (කෝපය, බිය) දුරුකොට මම යනුවෙන් ඇතිකරග න්නා වැරදිපිළිගැනීමත්, ඒ හා සමානවූ සිතුවිලිත්, නසා, මෝහයහැර නුවණඋපදවා, මේ ජාතියේදීම දුක කෙළවර කරන්නෙක් වන්නේය. ඇවැත්නි, මෙපමණකින් ආර්‍යශ්‍රාවක තෙමේ (සම්‍යග්දෘෂ්ඨික) මනාවූ නිවැරදි දර්ශණය ඇතිකර ගනී. ඔහුගේ අවබෝධය ඍජුවෙයි. ධර්මයෙහි අචල වූ පැහැදීමෙන් යුක්තවූයේ, මේ නිර්වාණ ධර්මයට පැමිණියේ වෙයි.

(සම්මාදිට්ඨි සූත්‍රයෙනි)

## මනසිකාරය හා විඥාණය

සිත, කරජකය එකතුකරනුයේ, සිතුවිල්ල (මනසිකාරයයි) එතැන වැටෙන ගැටය විඥාණයයි. කාම /භව / විභව තෘෂ්ණාවෙන් සපිරි අතීත මතකයයි.

මනසිකාරයත්, විඥාණයත් යනු එකක් ද?

එසේ පැවසිය හැක්කේ නොවේ.

එසේ නම් මනසිකාරය යනු එකෙකි. විඥාණය යනු අනෙකක්ද?

එසේත් පැවසිය හැක්කේ නොවේ.

එසේනම් මනසිකාරය හා විඥාණය එකක් වන්නේත් නොවන්නේත් වේද?

එසේත් කිවනොහැකිය.

එසේනම් මනසිකාරය හා විඥාණය එකක් වන්නේත් වේද, නොවන්නේත් වේ යැයි කිවහැකිද?

එසේත් කිවනොහැකිය.

එසේනම් ඔබ පවසන්නේ කවරේද? මනසිකාරය හා විඥාණය හටගන්නේ කෙසේද?

සුළඟ හමායනු ඔබට දැනෙන්නේද?

එසේය.

ගහකොළ සෙලවෙනු ඔබට පෙනෙන්නේද?

එසේය.

ඔබට ඒවායින් නැගෙන හඬ ඇසෙන්නේ ද?

එසේය.

එසේනම් සුළඟ දනිමින් පහළ වූයේ සිතයි.

සුළඟ හමන ස්වභාවය පහළ වූයේ මෙනෙහි කිරීම නිසයි.

සුළඟ හා හැමීම හඳුනාගන්නේ විඥාණ ප්‍රත්‍යයයි.

සුළඟ ප්‍රත්‍යවීමෙන් ගහකොළ සෙලවුණි.

ඒවා හේතුකොට ගෙන හඬ ඇසුණි.

මේ කිසිවක් එකක් නොව, අනේකාකාරයෝය. එකක් එකක් වෙන් වෙන් වශයෙන් නොගෙන, නොදකිමින්, එකගොඩටම ගෙන පහළවුන සිත්ය. එකගොඩටම ගෙන නැගූ මනසිකාරයන්ය. (හැඟීම්ය) එක ගොඩටම ගෙන පහළ වූ නාමරූප ප්‍රත්‍යයෝය. විඥාණයෝය. එවන් ස්වභාවයක් තුළ කවරක් හෝ මෙසේ පවතින්නේ යැ'යි කියන්නේනම් එය මුලාවක් නොවේද?

නාමරූප වශයෙන් ඇතිකරගත් විඥාණය නොවන්නට ඔබට සුළඟක් දැකිය හැකිද? දැනිය හැකිද?

නොහැකිය.

නාමරූප වශයෙන් ඇති කරගත් විඥාණය නොවන්නට, ඔබට ගහ කොල සෙලවීම දැකිය හැකිද?, පෙනිය හැකිද?, හඬ ඇතිවීම ඇසිය හැකිද? හඳුනාගත හැකිද?

නොහැක්කේමය.

එසේ නම් නාමරූප, විඥාණය ප්‍රත්‍යකරගෙන කිසිවක් ඇති වූ බවත්, මනසිකාරය (මෙනෙහි කිරීම) ප්‍රත්‍යකරමින් පවත්වාගත් බවත් ඔබට නොවැටහෙන්නේද?

වැටහෙන්නේය. මැනවින් වැටහෙන්නේය. මා පත්වී සිටින මුලාව කවරේදැ'යි වැටහෙන්නේය. නාමරූප (විඥාණය) නොවන්නට ගතහැකි යමක් නොමැති බවත්, එසේවූයේ නම් මෙනෙහි කරන්නට (මනසිකාර) කිසිවක් නොමැති බවත් වැටහෙයි. මේවා එකක්වත් දෙකක්වත් නොවනබව වැටහෙයි. නැසී වැනසී වෙනස්වන ස්වභාවයක් ප්‍රත්‍යකරමින්, ඒ මත නාමරූපයන් හෙලමින් පවතින්නේ මුලාවය. එවන් මුලාවක් සැබෑලෙස ගනිමින් ඒවා මෙනෙහිකරන්නට යෑම, මං මුලාවක්ම බව වැටහෙයි. අවබෝධ වෙයි. ඇත්තෙක් නැත. නැත්තේම ඇතිකර ගැනීම මායාවයි. මායාවේ මැදිවූයේ අසරණ වෙයි. අතරමංවෙයි.

ආස්වාදය, නම් මායාවෙන් ගැලවී, අත්මිදීම, නැවතීම වෙයි. සත්‍යයදැකීම එතැනවෙයි. අවබෝධය එතැනවෙයි. මුලාව දුරුවෙයි. අවිද්‍යාව පහවයයි.

හැඟීම (මනසිකාරයන්) හා නාමරූප (විඥාණය) ප්‍රත්‍යකර ගනිමින් දුකක් ඇතිවිය. ස්වභාවයානුකූලව එය චුතවිය. ඒහාම තවත් හැඟීමක් ඇතිවිය. එයතුළද දුක උපදින්නේය. එයද චුතවන්නේය.

මෙයාකාරයෙන් ක්ෂණයක්, ක්ෂණයක් පාසා සිදුවන උපත හා මරණය නොදකින පෘතග්ජනයෝ, සම්මුති වශයෙන් උපත හා මරණය දෙසම බැල්ම හෙලීම

හේතුවෙන්, සැබෑව අවබෝධකොට ගැනීමට නොහැකිව අතරමංවෙති. තමන් සමීපයෙහිම පවතින හේතුප්‍රත්‍යයෝ නොදකිති.

ඒවා දැකීමට - අවබෝධකර ගැනීමට කිසිවෙකු සමත්වන්නේ නම්, හෙතෙම දුකින් මිදීමේ ආර්‍යමාර්ග යට පිවිසෙන්නේය. ඒ ඔස්සේ ගමන් කරන්නේය. සත්‍ය දකින්නේය. දුක නිමකරන්නේය. දුකින් මිදෙන්නේය. සංසාර චක්‍රයෙන් ගැලවෙන්නේය.

## ඝණ්ඨාරය හා හඬ

සණ්ඨාරය - මතුපිට කූඩුවකින් හා ඇතුළත ගෙඩියකින් සමන්විතය. ඒ ස්කන්ධයකි. එහි ඇණ, මුරිච්චි ලෝහරැඳවුම් වැනි තව තවත් දෑ වලින් සමන්විතය.

සණ්ඨාර තිබූ පමණින් එහි හඬ හටගන්නේ නැත. හඬක් ඇතිවීමට නම් සණ්ඨාරයෙහි ස්පර්ශයක් ඇතිවිය යුතුය. සණ්ඨාරයේ ගෙඩිය හා කූඩුව එකිනෙකා ස්පර්ශ විය යුතුය.

එවිට ඉන් හඬ පැතිරෙන්නේය. සණ්ඨාරය ඇසට පෙනෙනමුත් ඉන් පිටවන හඬ නොපෙනෙන්නේය. හඬ ඇසෙන්නේ කනටය.

සණ්ඨාරය ස්කන්ධරූපය වනවිට ඉන් නිකුත්වන ශබ්දයෝ, නාදරටාවෝ මනෝසංචේතනාවෝය.

සණ්ඨාරයෙන් නිකුත්වූ ශබ්දය තිබූයේ සණ්ඨාරයෙහි කොතැනකද? ශබ්දය අයිතිවන්නේ සණ්ඨාරයෙහි කූඩුවටද, නැතහොත් සණ්ඨාරයෙහි ගෙඩියටද?

මේවා හේතුප්‍රත්‍යයෝය. සණ්ඨාරයේ කූඩුව සමග එහි ඇතුළත ගෙඩිය ස්පර්ශය නොවුනේනම් ශබ්දය ඇතිවන්නේ නැත. එතැන ඇතිවූ හඬ, එතැනම නිරුද්ධවිය. කනෙන් ග්‍රහණයකිරීම කනටඅයත් කටයුත්තක් නොවේය.

සණ්ඨාරය එකකි. ඉන්මතුවූ හඬ තවත් එකකැ'යි කිව හැක්කේද?

එසේ නොකිව යුතුය.

එසේනම් සණ්ඨාරයත් හඬත් එකක්ම වේද?

එසේත් නොකිවයුතුය.

එසේනම් හඬ සණ්ඨාරයේ කූඩුවෙහිත් වන්නේය. ගෙඩියෙහිත් වන්නේද?

එසේත් නොකිවයුතුය.

එසේනම් හඬ සණ්ඨාරයේ කූඩුවෙහිත් ගෙඩියෙහිත් නොවූයේ වූයේද?

එසේත් නොකිව යුතුය.

එසේනම් මෙහි ස්වභාවය කුමක්ද?

හේතුප්‍රත්‍යයමය. ගෙඩියක් නොවන්නට, සණ්ඨාරයෙහි කූඩුවක් නොවන්නට - ඒවායේ මැනවින් හඬක් ඇතිවන අයුරින් නොවන්න, කූඩුවත්, ගෙඩියත් ස්පර්ශ නොවන්නට හඬක් බිහිවෙන්නේ නොවේ. හඬ බිහිවූයේ මින් කවර හෝ එකක් නිසා නොවේ. ඒ සඳහා අවැසි වූ සියළුම

හේතුප්‍රත්‍යාංගයෝ සංකලනයවීම නිසාය. ඒකරාශීවීමේ හේතුව නිසාය. මේ හේතූන් සියල්ල එකක් ලෙස ගෙන බැලීමෙන් ඇතිවන්නේ මුලාවකි. සැබෑව - සත්‍යය ස්වභාවය දැකීමටනම් මේ හේතුප්‍රත්‍යයන් සියල්ලම එකිනෙක වෙන් වෙන්ව දැකිය යුත්තේය. මෙයාකාරයෙන් මෙනෙහි කරනවිට, කය, ශරීරය වශයෙන් පවත්නා ස්කන්ධයන් හා මමය, මගේය වශයෙන් ස්කන්ධයන්ගේ ක්‍රියා ස්වභාවයන් ප්‍රත්‍යයකර ගනිමින් පහළවන්නා වූ, ඇතිවන්නා වූ, මනෝසංචේතනාවන් එකිනෙකට වෙනස් ස්වභාවයන් රැසක් මිස, එකක්ම නොවනබව අවබෝධ වන්නේය. ධාතුන් වශයෙන්, භූත වශයෙන් පවත්නා රූප ස්කන්ධයනුත් - නාම ස්කන්ධයන් වශයෙන් ඇතිවන මනෝසංචේතනා ස්වභාවයනුත් විග්‍රහ වන්නේය. වෙන් වෙන් වශයෙන් අවබෝධ කරගන්නේය.

# සක්කාය සමුදය - නිරෝධය

**විඤ්ඤාන අනිදස්සනං - අනන්තං සබ්බතො පභං**
**එත්ථ අපො ච පඨවි - තේජෝ වායෝ න ගාධති**

විඥාණඅනිදස්සනං - ත්‍රිවිධ තෘෂ්ණාවන් ප්‍රහීනවන කල - අප්‍රමාණ වූ ප්‍රභාෂ්වරය වන්නේය (පැහැදිලි වීම වන්නේය) ඒ හැම සතර මහා භූතයින් පිළිබඳ ප්‍රතිෂ්ඨාවන් (පිහිටීම) ද නොවන්නේ ය.

විඥාණය පැවැත්මේ හේතුව සක්කාය දෘෂ්ඨියයි. සක්කාය දෘෂ්ඨිය (වැරදි දැක්ම) හේතුවෙන් නාම රූප ප්‍රත්‍යයෝ ඇතිවන්නේය.

නාමරූප ප්‍රත්‍යකරමින් ත්‍රිවිධතෘෂ්ණාවෝම (විඥාණය) හටගන්නේය. ත්‍රිවිධතෘෂ්ණාවන්ම හේතුකොට ගෙන යළි යළිත් නාමරූප උපදවන්නේය. ඒවායෙහි ගැලෙන්නේය. භවයන් ඇතිකරන්නේය. සංසාරවට්ටය ඇතිවන්නේය.

**යත්ථ නාමඤ්ච රූපඤ්ච - අසේසං උපරුජ්ඣති**
**පටිඝං රූප සඤ්ඤාච - එත්ථ සා ජිජ්ජතෙ ජටා**

යම්තැනක නාමයත් රූපයත් ඒවගේම රූපසංඥාවත් නොගැටෙන්නේ ද? එතැනදී මේ අවුල ලිහෙනු ලැබෙන්නේය. යනු බුදුපියාණන්ගේ දේශණයයි.

සක්කාය දිට්ඨිය (අවිද්‍යාව), සැඟවිලා තිබෙනුයේ මේ නාමරූපයන් තුළය. මෙසේ සැඟවී ඇති ස්වභාවයන් දැකීමට නම්, දහම්ඇස ඇතිකරගත යුත්තේය. ප්‍රඥාව

පහළකරගත යුත්තේය. එසේ නොවන්නට මුලාවෙහිම ගැලෙන්නට වෙන්නේය.

බුදුපියාණන් වහන්සේ වදාළ පරිදි,

**ධර්ම චක්ෂුසය පෑදෙනකම් ලෝකයා අන්ධයි.**

සක්කාය දිට්ඨිය (අවිද්‍යාව) යනු, සත්‍යවශයෙන් නොමැති ස්වභාවයන් - සත්‍යවශයෙන් පවත්නා වූ ලෙසින් පිළිගැනීමය. ඒවායේ ඇලීමය. ලෝකය නිර්මාණයවී ඇත්තේ මෙවන් වැරදිසහගත මනසිකාරයන් නිසාය. ලෝකය යනු සක්කාය දෘෂ්ඨින්මය. එහි සැබෑ වූ, නිත්‍ය වූ, කිසිවක් නැත්තේමය. පවතිනුයේ සංඛතයෝය. මවාගත්තාවූ දේමය.

කිරිහොද්ද සරල නිදසුනක් ලෙස ගනිමු.

කිරිහොද්ද - නාමරූපයෝය. සංඛත ධර්මයෝය. කිරිහොද්ද, නාමරූපයන් ඇතිවූ සැනින්ම පහළවනුයේ සණසංඥාවයි. ඒකකයක්ය යන හැඟීමයි. අයෝනිසෝමනසිකාරයයි. එතැන දෘෂ්ඨිය වැරදිය.

කිරිහොද්ද - හැදීමට කිරි ඕනෑවිය. කිරි සපයාගනු ලැබුයේ, පොල්වලින් බැවින් පොල් ද ඕනෑ විය.

පොල්කිරි මිරිකාගනු ලැබුයේ, වතුර මුසුකර ගැනීමෙනි. එසේ මුසුකර ගැනීමට වතුර ඕනෑවිය.

කිරි හොද්දෙහි - කහ ද විය. තුනපහ වර්ගයන් ද විය.

කරපිංචාද විය.

කුරුඳුපොතුද විය.

ලූනුද විය, දියළුනුද විය.

මෙයාකාරයෙන් ද්‍රව්‍යයන් ගණනාවකගේ එකතුවක්, ස්කන්ධයක්, නාමරූප ප්‍රත්‍යයෙන් කිරිහොද්ද විය. මේ සියළු ද්‍රව්‍යයන් එකිනෙක, තනි තනිව ගත් කල, එතැන කිරිහොද්දක් නැත්තේය. පවතිනුයේ නාමරූපයෝය. අයෝනිසෝමනසිකාරයන්ය. චිත්තවිකාරයන්ය. විකාරසංඥාවන්ය.

හේතුප්‍රත්‍යයන් ගණනාවකගේ සංයෝගයක් කිරිහොද්ද ලෙසින්, නාමරූපිකව ඇතිකර ගත් සංඛිතය, සැබැවින්ම පවතින්නා වූ, සත්‍ය වූ දෙයක් ලෙසින් ඇතිකරගත් පිළිගැනීම (සක්කාය දෘෂ්ඨිය) ලෝකයාතුල එහි රසවිඳීමේ ආස්වාදය ඇතිකරන්නේය.

කිරිහොද්ද අනුභව කරන තැනැත්තේ මේ පොල්ය, මේ කිරි, මේ වතුරය, මේ තුනපහ වර්ගය, මේ කරපිංචාය යනුවෙන් වෙන් වෙන්ව නොදකිනුයේ, නොදකිමින්ම කිරිහොද්ද අනුභව කරන්නේය. කිරිහොද්දේ සැබෑස්වභාවය නොදකින්නේය. නොදන්නාකම නිසා, එවැනි දැනගැනීමක් ඕනෑ කරන්නේ ද නොවන්නේය. දැනසිටියේ වුවද නොසිතන්නේය. එහෙයින්ම සත්‍ය නොදකින්නේය. නොවැටහෙන්නේය.

කිරිහොද්දේ රසයෙන්, ආස්වාදය ලබන්නේය. ආස්වාදයට යොමුවූයේ, ආදිනවයද විඳින්නට සිදුවන්නේමය. ආදිනවය වේදනාකාරී (දුක) වනවිට එයින් මිදීමේ ඕනෑකම ඇතිවන්නේය.

ඕනෑකම ඇතිවන විට

නැතිකම දැනෙන්නේය.

එවිට දුක උපදින්නේය. සක්කාය දිට්ඨියෙහි පිහිටා දුක නැතිකරන්නට යෑමේදී, යලි යලිත් දුකම උපදින්නේය. බුදුපියාණන් වහන්සේ විසින් මඟපෙන්වා වදාළේ නිවැරදිදැක්ම (සම්මාදෘෂ්ඨිය) ඇතිකොට, ධර්මස්වභාවයන් අවබෝධකර ගනිමින්, ඒවායේ නොඇලෙමින්, නොගැටෙමින් තණ්හා, මාන, දිට්ඨීන් හි නොවෙලෙමින් දුකින් මිදියහැකි මාර්ගයයි.

සම්මාදිට්ඨිය ඇතිකර ගැනීමේදී සීලය (ශ්‍රැතිය) ඇතිවන්නේය.

සම්මාදිට්ඨියෙන් බැහැර වූ ශීලය, ශීලබ්බතපරාමාශයට නැඹුරුවිය හැකියි. එවිට "ශීලය ඔස්සේම දුක නැතිකර ගත හැකිවේ"ය යන සක්කාය දෘෂ්ඨිය ඇතිවන්නේය. එසේ වී කිසියම් සමාධියක් ඇතිවූයේ නම්, ඒ මිච්ඡා සමාධියක්ම වන්නේය.

බුදුන් වහන්සේ දෙස බලාසිටීමෙන් හෝ බුදුන් වහන්සේගේ ගුණසමුදායයන් මෙනෙහි කිරීමෙන් පමණක් සම්මා දිට්ඨිය ලැබියහැකි නොවේ. සම්මාදිට්ඨිය සැළකිල්ලෙන් හා උත්සාහයෙන්ම ලැබිය යුත්තකි. ඒ සඳහා පුහුණුව හා ධර්මඥානයද පැවතිය යුත්තේය.

## සිරිදාස

"සිරිදාස" යනු කවරෙක් ද? ස්කන්දයක් ඇත. එම ස්කන්ධය මත පිහිටා යෙදුන නාමරූපයෝය. සිරිදාස ඉන් එකකි.

ස්කන්ධයෙහි,

හිසක් ඇත. - හිස සිරිදාස නොවේ.

එහි හිසකෙස් ඇත. - හිසකෙස් ද සිරිදාස නොවේ.

නළලක් ඇත. - නළල ද සිරිදාස නොවේ.

දෑසක් ඇත. - දෑස ද සිරිදාස නොවේ.

දෙකනක් ඇත. - දෙකන ද සිරිදාස නොවේ.

නාසයක් ඇත. - නාසය ද සිරිදාස නොවේ.

කම්මුල් දෙකක් ඇත. - කම්මුල් දෙක ද සිරිදාස නොවේ.

දෙතොලක් ඇත. - දෙතොල් සිරිදාස නොවේ.

කටක් ඇත. කට ද සිරිදාස නොවේ.

ගෙලක් ඇත. - ගෙල ද සිරිදාස නොවේ.

මෙයාකාරයෙන් ශරිරය නමින් හඳුන්වනු ලබන නාමරූපී වූ ස්කන්ධයේ සිරිදාස නම් කිසිවක් එහි කොතැනකින් හෝ සොයාගන්නට නොහැකිය.

එතැන සිරිදාසයෙක් නැත. සිරිදාස යනුවෙන් ඇතිකරගත් නාමරූප වැරදිදැක්මක් ඇත. ඒ වැරදි දැක්මම, වරද සහගත බවක් නොදන්නාකම (අවිද්‍යාව) හේතුකොට ගෙන ලෝකයා විසින් සිරිදාස කෙනෙකුම දකින්නේය. පවත්වන්නේය. පටලැවිල්ල එතැනය. එතැන පවතිනුයේ මුලාවය. මේ මුලාවෙහි ගැලී සිටිනතාක් සත්ත්වයා සිටිනුයේ දුකෙහිමය. අඳුරෙහිමය. අන්ධකාරයේමය.

මේ අන්ධකාරයෙන් මිදී, ආලෝකය ලැබිය යුත්තේය. ඒ සඳහා නිවැරදිදැක්ම (සම්මා දිට්ඨිය) ඇතිකරගත

යුත්තේය. ආයර්‍යාෂ්ටාංගික මාර්ගය ඔස්සේම දැකිය යුත්තේය.

එවිට ධර්මචක්ෂුෂය ඇතිවන්නේය. සත්‍යයේ ආලෝකය පහළවන්නේය. සදහම් ආලෝකය පහලවත්ම අවිද්‍යා අන්ධකාරයන් දුරුවන්නේය. ත්‍රිවිධ තෘෂ්ණාවන්ගෙන් සපිරි මතකය (විඥාණය) ප්‍රහීණ වන්නේය. නොපෙනී යන්නේය. නිරුද්ධ වන්නේය.

සක්කායදිට්ඨිය දුරුවත්ම, නාමරූප ප්‍රත්‍යයන්ද නැතිවන්නේය. නාමරූපයන් කෙරෙහි තවදුරටත් ඇලීම ඇතිකර නොගන්නේය. නාමරූප කෙරෙහි නොබැඳෙන්නේය. එය අමුතුවෙන් සඳහන් කළ යුත්තක්ද නොවන්නේය.

නැතිකල අයෙක්ද නොවන්නේය. නැතිකල දෙයක්ද නොවන්නේය. ඇති වූ දෙයක් නොවූයෙන් නැති වූ දෙයක් ද නොවන්නේය. පැවතුනා නම් පැවතියේ ස්වභාවයන් (ධර්මතාවයන්) පමණි. ඒ කෙරෙහි ඇතිකර ගත් වැරදි දැකීම පමණි.

ධර්මස්වභාවය වෙනස්වීමය. වෙනස්වීම ම ධර්මතාවය බැවින් වෙනස් වෙනස් වන ධර්මතාවයන් කෙරෙහි පිහිටා, නාමරූප පැවැත්වීමට යෑමෙන් මිඳුන බැවින් තවදුරටත් හඳුනාගැනීම්වලට ලක්වන්නා වූ, නිත්‍ය ලෙස හඟින්නා වූ ධර්මතාවයන් කිසිවක් ම නොවන්නේය. නොවන්නේද නොවන්නේය. ගැටළුව තිබුණේ එතැනය. ප්‍රත්‍යවේක්ෂය තුළින් විදර්ශණාව ඔස්සේ ගැටළුව විසඳුනේය. තවදුරටත්

එවැනි ගැටළුවක් නොවන්නේය. නොපවතින්නේය. අවුල ලිහුනේය.

ප්‍රඥාව පහළවූයෙන් නිරෝධය ප්‍රත්‍යක්ෂවුයේය. නිවුනේය.

"මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මෙසේ රූපයන්ගේ ආස්වාදය, ආස්වාදය වශයෙන්ද, ආදීනවය, ආදීනවය වශයෙන් ද නිස්සරණය, නිස්සරණය වශයෙන් ද තතුසේ දනිත් ද? ඔහු ස්කන්ධයෙන් තුමූ හෝ රූපයන් පිරිසිඳ දන්නාහුය"

(මහා දුක්ඛන්ධ සූත්‍රයෙනි)

## භාවිතය

මේ කෙලෙස් සහිත ලෝකයාගේ ව්‍යවහාරයටයි භාෂාව සකස්වෙලා තියෙන්නේ. ඒක නිසා මේ භාෂාවෙ ලක්ෂණයක් තමයි ග්‍රාහ්‍ය - ග්‍රාහක භේදය, ග්‍රාහ්‍ය - ග්‍රාහක කියන්නේ අල්ලගන්න දෙයකුත් තියෙනවා. අල්ල ගන්න කෙනෙකුත් ඉන්නවා කියන ව්‍යවහාරය. විෂය - විෂයි කියල තියනවා. කර්තෘ - කර්ම කොයි ආකාරයට බැලුවත් භාෂා ව්‍යවහාරයේ කරන කෙනෙක් ඉන්නවා. කරන දෙයක් තියෙනවා. අල්ලගන්න කෙනෙක් ඉන්නවා. මෙන්න මේ භාෂා ව්‍යවහාරයන්ට මැදිවුන පුද්ගලයාහට සත්‍යය ස්වභාවය විග්‍රහ කරන්නට පුළුවන් ක්‍රමයක් නැහැ. පවතින ව්‍යවහාරයම උපයෝගී කරගන්නට සිදුවෙනවා. ඒ නිසාම සමහර විට පහසුවෙන් අවබෝධකර ගතහැකිව ඇති දේ නිවැරදිව අවබෝධකර ගැනීමට අපහසුතාවයන්

ඇතිවෙනවා. හරියට "මම නිවන් දකින්න කැමතියි. මම නිවන් ලබාගන්න කැමතියි. කියල ඇතිදෙයක් ලබා ගැනීමක් හා ලබාගන්නා අයෙක් සිටින අයුරින් විද්‍යාමාන වෙනවා." ඒක එහෙම වෙන්න බැහැ. නිවන එහෙම ලබාගත හැකි හෝ දැකිය හැකි යමක් නොවේ. නිවන අවබෝධකරගන්නා වූ කිසිවෙකුද නොවන්නේය. එහෙත් කථාකිරීමේ දී ව්‍යවහාරයේදී එවන් අයුරකින් හැර කළහැකි අන්දෙයක්ද නැත්තේය. නිදසුන් වශයෙන් බිය, දුක, සැකය, රිදෙනාව වැනි වචන හැකිනම් නිර්වචනය කරන්න. ඒ කිසිදාක නොහැකි වන්නේය.

"බිය" වචනය ඇසෙත්ම, ඒ ඒ පුද්ගලයින් තුළ ඒ ඒ පුද්ගලයා අනුව ලබාඇති අත්දැකීම්වලට අනුව, සිත්හි පහලවන රූපයෝය. චිත්තරූපයෝය. නාමරූපයෝය.

ක්ලේශයෝය. ඒ ඒ තැනැත්තා ලබා ඇති පූර්ව අත්දැකීම් ස්වභාවයන් පරිදි, ඒ ඒ පුද්ගලයා විඳින, ස්වභාවයන්ගේ උච්ඡාවචයවීමක් දැකිය හැකිවන නමුදු එවන් උච්ඡාවචය නොමැති, පමණ අපමණක් නොමැති හේතුප්‍රත්‍යයන් උපදානය වෙමින් ඇතිවූවා පහළවූවාවූ චිත්තස්වභාවයන්, චිත්තවිකාරයන් පමණක්ම මිස අන් කිසිවක් එහි නැත්තේය. පහළ වු හේතූන්, හේතුප්‍රත්‍ය ස්වභාවයන් බිය නම්වූ නාමරූප ස්වභාවයන් ගෙන් ආවරණය වන්නේය. යථා ස්වභාවය නොපෙනෙන්නේය. සත්‍යය නොපෙනෙන්නේය. බිය මතම රැඳෙන්නේය. එවිට බිය සැබෑලෙස පවතින ලෙසින් වන්නේය. කවර අවස්ථාවක හෝ බියක් ඇතිවූ විට එය බිය ලෙසින් ම ගන්නේ ය. පෙරදීද බිය පැවතිණ. දැන් ද බිය ඇතිවී

තිබේ. අනාගතයේ දී බිය ඇතිවනු ඇත. යනුවෙන් ආත්ම දෘෂ්ඨිය ඇතිවන්නේය. හේතුප්‍රත්‍යයන් බිය වශයෙන්, නාමරූප ලෙසින්, ඇතිකරගත් බවත්, හේතුප්‍රත්‍යයන් දුරුවනවිට බිය පහවයන බවත් නොවැටහෙන්නේය. බිය ආත්ම ස්වභාවයක් ගන්නේය. බිය සදාකාලික වශයෙන් පවතින අතීත, වර්තමාන, අනාගතයන්හි විපාක දෙමින් ඉදිරිපත්වන එකම සංසිද්ධියක් ලෙසින් දකින්නේය. ආත්මදෘෂ්ඨිය එතැනය.

බිය ඇතිවූයේ එයට හේතු කාරක හේතුප්‍රත්‍යයන් නිසාවෙනි. බිය ඇතිවූයේ එවන් හේතුප්‍රත්‍ය ස්වභාවයන් 'බිය' වශයෙන් හඳුනාගැනීමේ නාමරූප ස්වභාවයන්, ප්‍රත්‍යයකරගත් බැවිනි.

ඊයේ ඇති වූ ස්වභාවයන්, ඊයේ පැවති හේතු ප්‍රත්‍යයන් අනුව සිදුවූවකි. එවැනි ස්වභාවයන් හඳුනාගත් නාමරූපයෝ "බිය" නම් විය. ඒ පහළ වූ ස්වභාවයෝ නිමවිය. නාමරූප වශයෙන්ගත් බිය ද නිමවිය. එතැන ආත්ම ස්වරූපයක් ශේෂනොවීය.

අද උද්ගතවූ හේතුප්‍රත්‍යය ස්වභාවයන් කරුණකොට ගෙන බිය ඇති විය. ස්වභාවයම හඳුනාගැනීමට 'බිය' නම් වූ නාමරූප ප්‍රත්‍යයවිය. හේතුප්‍රත්‍යයෝ බැහැරවත්ම අද පැවති බිය ද නිමවිය. නිමාවම නිමවිය. බිය නැතිවිය. බිය පිළිබඳව ආත්ම ස්වරූපයක්ද ශේෂනොවීය. අතීත හෝ වත්මන් බිය හඳුනාගනු ලැබූයේ විඥානයෙනි.

අනාගතයේ දී බිය ඇතිවන බව සිතන්නේය. ඒ බිය ද, බියජනක බවත් සිතෙන බැවින්, අනාගත බිය පිළිබඳව වර්තමානයේදීම බිය ඇතිකරගන්නේය. බියෙන් ගැලවීමට, සැඟවීමට වෙර දරන්නේය. බියට බියවන්නේය. බිය ආත්මයක් ලෙසින් ගන්නේය. සදාකාලිකව පවතින සත්‍යදෙයක් ලෙසින් ගන්නේය. බියෙන් ගැලවී යාමට සිතමින් බිය කරතබා ගෙනම දුවන්නේය. නිරර්ථක වූ වෙහෙසක් දරන්නේය. ඕනෑකම "බියෙන්" මිදීමය. මිදීගත නොහැකි වූ විට උපදින්නේ දුකය. බියෙහි සැබෑස්වභාවය හඳුනානොගත් බැවින්, බියට මුසුකර ගත් "දුක" ද ඇතිකර ගන්නේය. දුකක් ආත්මයක් කරගනිමින් දුකත් බියත්, දෙකම කරතබා ගෙන දුකින් බියෙන් මිදෙන්නට වෙර දරමින්, බියෙහි ගැලෙමින් දුක උපදවන්නේය. භවය ඇතිකර ගන්නේය. භවයම දුකක් වන්නේය. සංසාරයම දුකක් වන්නේය. යථා ස්වභාවයේ ස්වරූපය (ධර්මතාවයන්) පිළිබඳ අනවබෝධය, අවිද්‍යාව හේතුවෙන් මුළාවේ වැටෙන්නේය.

බිය ඇතිවූයේ කුමන ස්වභාවයන් (ධර්මතාවයන්) වීමෙන් ද, බිය ඇතිවීම සඳහා අප්‍රමාණ වූ හේතූන් ඇත්තේය. එවන් හේතූන් ප්‍රත්‍යයවීමෙන් බිය ඇති වූයේනම්, බිය නැතිකරලීම පිණිස කළ යුත්තේ කුමක්ද? හේතුප්‍රත්‍යයන් නැති කිරීමය. හේතුප්‍රත්‍යයන් ගෙන් බැහැරවීමය. බිය උපදවන්නා වූ හේතුප්‍රත්‍යයන් ගෙන් මිදී සිටින්නවුන්හට බිය ඇති වන්නේද?

නොවන්නේය.

බිය ඇතිවීමට හේතුප්‍රත්‍යයන් වූයේ මොනවාද?

ලෝභය, ද්වේශය, මූලාවය, අකුසලයය, කාමතණ්හාවෝය, භවතණ්හාවෝය, විභවතණ්හාවෝය, මතකයෝය. සංක්ෂිප්ත වශයෙන් ගතහොත් විඥාණය මය. බිය වශයෙන් ඇතිකර ගත් නාමරූපයෝ මය. ඉන් බැහැර බිය ඇතිවීමට හේතුකාරක අන්‍ය වූ ස්වභාවයක් නැත්තේය.

විඥාණය යනුවෙන් හඳුන්වන ත්‍රිවිධ තෘෂ්ණා වෙන් සපිරි මතකයෙන් කවරයෙක් හෝ හඳුනාගැනීමෙහිලා සංස්කාර වූ නාමරූප ක්ලේශ ස්වභාවයෝද, සත්ත්වයා, මූලාවෙහි හෙලන්නේය. සංසාරයෙහි අතරමං කරන්නේය. භවයේ බැඳ තබන්නේය. තථාගත සම්මාසම්බුදු පියාණන් වහන්සේ විසින් පෙන්වා වදාළේ, මෙම මූලාවෙන් ගැලවීගත හැකි සත්‍යය මාර්ගයයි. චතුරාර්‍ය සත්‍යය යි.

දුකෙන් මිදීමේ උත්සාහයේ නිරතවන සියළු සත්ත්වයින්, දුකින් මිදීමේ මඟ අවබෝධ කරනුයේ එකම ආකාරයකින් නොවන්නේය. එකිනෙකට වෙනස් වූ නිමිති අරමුණු හේතුප්‍රත්‍යයවීමෙන් ධර්මතාවයන් පිළිබඳව යථාවබෝධය ලබන්නේය. ප්‍රඥාව ඇතිවන්නේය. දුකින් මිදෙන්නේය. නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේය. නිවෙන්නේය.

## ධර්මතාවය

වෙනස්වන ස්වභාවයකි. ධර්මතාවයකි.

එතැන නාමරූප නැත. සංස්කාර නැත. ක්ලේශයන් නැත. සංස්කාර, නාමරූප කොතැනද, එතැනම ක්ලේශයයි.

වැරදිදැකීමයි. සක්කාය දිට්ඨියයි. මේ කවර ආකාරයකින් කවර වචනයකින් දැක්වූයේ වුවද එය මෝහයක් පමණි. මුලාවක් පමණි.

ස්වභාවයක් ඇත.

## ආකාශය

"ආකාශය" නම් විය. සංස්කාරයයි, නාමරූපයයි, ක්ලේශයයි, මෝහයයි.

ආකාශය නම්වූ සංස්කාරය/නාමරූපයන් නොවන්නට, එතැන කිසිවක් නැත. වෙනස්වන ස්වභාවයක් පමණි. ආකාශය නම් වචනය/සංස්කාරය කවුරුන් විසින් කවරදාක යෙදුවේද? එය පහළවූයේ කෙසේද? මේ සම්මතය ඇතිකළේ කවුරුන්ද? මේ කිසිදා නොවිසදෙන ස්වභාවයකි. ඉමක් කොනක් නැති අනන්තය යි.

ස්වභාවයන් පිළිබඳව නොදන්නා, නාමරූපයන්, සංස්කාරයන්, උපාදානය කරගනිමින් සම්මතය තුලටවී ආකාශය සැබෑවක් ලෙස හැඟීම් පහළවේ. නොපෙනෙන්නෙකි. නොදැනෙන්නෙකි. නොපෙනීම. නොදැනීමද නාමරූපයෝ මිස, සැබෑවක් නොවේ. ඒවා ද ස්වභාවයන් පමණි.

ඉහල සිට පහලට ගමන්කරයි. මේවා ද නාමරූපයෝය. ඉහල, පහල, ගමන, නාමරූපයෝය. සංස්කරයෝය. හඳුනාගැනීම් නම් වූ සක්කාය දිට්ඨීන් ය. මුලාවෝ.

## ස්වභාවයකි.

ඉහල සිට පහලට ගමන් කරයි.

(නාම / රූපයෝ - සංස්කාර)

ස්වභාවය විග්‍රහ කරයි.

ජලය / වතුර යැයි කියයි.

මේ වනාහි නාමරූපයි සංස්කාරයි.

ස්වභාවයන් මත බිහිවූ මුලාවයි. ජලය, වතුර නම් වූ සම්මතය (නාමරූප සංඛාර) නොවන්නට එතැන හඳුනාගැනීමක් දැකීමක් නැත. හඳුනාගැනීම, දැකීම යනුද නාමරූපයෝ ය. නාමරූපයෝ, සංඛාරයෝ කොතැනද? එතැන මෝහයකි. මුලාවයි. මෙම මුලාව නොවන්නට මෙනෙහි කිරීම් නොවන්නේය.

"යම් තැනෙක්හි විඥාණය වැඩුනේ වේ නම්, එහි නාමරූප චක්‍රාන්තිය ඇත.

යම් තැනෙක නාම රූප චක්‍රාන්තිය ඇත්නම්, එතැන සංස්කාරයන්ගේ වැඩීම ඇත.

යම්තැනෙක සංස්කාරයන්ගේ වැඩීම ඇත්නම්, එහි පුනර්භවයේ පහළවීම ඇත.

යම් තැනෙක්හි පුනර්භවයාගේ පහළවීම ඇත්නම්, එහි මත්තෙහි ජාති, ජරා, මරණ ඇත.

යම් තැනෙක්හි පැමිණි ජාති, ජරා, මරණ ඇත්නම් මහණෙනි, එතැන දුකය, දුකම උපදින්නේය.

(මහානිද්දේශ පාලි)

කාමතෘෂ්ණාව (විඳීමේ කැමැත්ත) නිදානකොට ඇති භව සුඛයෙහි බැඳුණු, යලි අනාගතයෙහි හෝ අතීතයෙහි හෝ වස්තු කාමයන් කැමතිවන, මේ ප්‍රත්‍යුත්පන්න කාමයන් හෝ ප්‍රාර්ථනා කරන, ඒ සත්ත්වයෝ දුකසේ ඉන් මිදිය යුත්තාහ. අනෙකෙක්හු විසින් නොම මුදනු හැක්කාහු වෙත්.

චුන්දය, යමෙක් තෙමේ ගැඹුරු (මහ) මඩෙහි ගැලුණේද, හෙතෙම ඒකාන්තයෙන් ගැඹුරු මඩෙහි ගැලුණු අනෙකෙක්හු නගාසිටුවන්නේය යන මේ කාරණය නොවෙයි. චුන්දය, යමෙක් තෙමේ නොදැමුණේ නම්, නොහික්මුණේ, කෙලෙස් පිරිනිවනින් නොපරිනිවියේත් වේ නම්, හෙතෙම ඒකාන්තයෙන්ම අනෙකෙක්හු දමන්නේයැ, හික්මවන්නේයැ, පිරිනිවන්නේයැ, යන මේ කරුණ නොවේ. මෙසේත් අනෙකෙක් හු විසින් නොවියහෙන්නාහ. නොහොත් මුදවන අන්කිසිවෙක් නැත. ඉදින් ඔහු මිඳෙන්නාහු නම් ස්වකීය උත්සාහයෙන්, වීයර්‍යයෙන්, සම්‍යක් ප්‍රතිපදාවට, ධර්මානුධර්ම ප්‍රතිපදාවට පිවිස මිඳෙන්නාහුය.

(ඛුද්දක නිකාය)

## නාමරූප - ස්වභාවය

ස්වභාවයකි. එය සංස්කාරවූයේ නාමරූපය "පුළුන්ය". එය වෙනස් වීමට බඳුන් වෙයි.

නූල්ය.

දැන් නූල් පිළිබඳව කථාකරයි. පුළුන් ස්වභාවය අමතකය. බැහැරය.

එය ද වෙනස්වීමට බඳුන් වෙයි. දැන් රෙද්දය.

එතැන පුළුන්ගැන කථා නැත. නූල්ගැන කථා නැත රෙද්ද සම්මුතිය වී ඇත.

වෙනස්වීමට බඳුන්වෙයි. කමිසය විය. කලිසම විය. සාරිය විය. හැට්ටය විය. වෙනත් කවර හෝ තත්ත්වයකට සංස්කරණය විය. සම්මුතිය විය.

දැන් එතැන පුළුන් පිළිබඳ කථා නැත. නූල් පිළිබඳ කථා නැත. රෙද්ද පිළිබඳ කථා නැත. ඇත්තේ වෙනත් සංස්කාර හා සම්මුතීන්ය.

මේ සංස්කාර සම්මුතීන් ද, වෙනස්වීම්වලට බඳුන් වෙත්,

සංස්කාර සම්මුතීන්, සංඛතයෝ වෙනස්වෙති. කිලිටිවෙති. දිරති. ඉරෙති, පරණවෙති.

දැන් පෙර සංස්කාර සම්මුතිතාවයන් හා බැඳුන සතුට නැත. පිළිගැනීම නැත. උපාදානයන් නැත. එබැවින් පෙර ආශාවන් ඇති කරගත් දෑ ඉවත දමයි. බැහැර කරයි. අත්හැර දමයි.

ඒ මතු විපරිනාමයට පත්වෙයි. දිරාපත්වෙයි. පස සමඟ මිශ්‍රවෙයි. මූලික පදාර්ථයන්ට එක්වෙයි. සම්මුති පෙනීමෙන් බැහැරවෙයි. ඒ හා සමඟම ඒවා පිළිබඳව පැවති සංඛතයෝ, සම්මුති, සංස්කාරයෝ ද, සංඥාවෝද, අතුරුදහන් වෙති. මේ අනුලෝමයෝය. සත්ත්වයා බලන්නේම අනුලෝම වශයෙනි. ඒවා ප්‍රතිලෝම වශයෙන්ද බලන්නේනම් මුලාව පැහැදිලිවන්නේය. කිසියම් ස්වභාවයක් නාමරූප

වශයෙන් සංස්කරණය කරමින් සංඛතවත් කරමින්, සම්මුති වශයෙන් ගනිමින්, සිදුවන මුලාව පෙනෙන්නේය. එකෙන් එකට සැබෑ නොවන සම්මුතිමත ඇතිවන තෘෂ්ණාවෝ පෙනෙන්නේය. සැබෑ ස්වභාවය දිස්වන්නේය. එවිට දුරුවන්නේ මෝහයයි. 'මෝහය' යනු, අවිද්‍යාවයි. නොදැනුවත්කමයි. නොදැන්වත්කම බැහැරවනවිට පහළවන්නේ දැනුවත්කමයි. දැනුවත්කම පහළ වනවිට මුලාවෙන් බැහැර වේ. තෘෂ්ණාවෙන් දුරුවේ. ආස්වාදයේ නොගැලෙයි. ආස්වාදයේ නොගැලෙන බැවින් ආදීනවය වන දුකට හසුනොවෙයි. ආදීනව, ආස්වාද නොමැති බැවින් නිස්සරණයද අවැසි නොවේ. නිරෝධයම අවබෝධවේ.

## නාම රූපයෝ - නාම රූපයෝ

ගොයම නාමරූපයෝය.

ගොයමේ හටගත් කරල, වී කරලය. නාමරූපයෝය. එය ගොයම්කරල නොව, වී කරලය.

කරලෙන් වෙන් වූ ඇටය, වීඇටයය. එය ගොයම් ඇටය නොව, වීඇටයය.

වීඇටයෙන් ගැලවුන පොත්ත, සුඹුල්ලය. නැතහොත් දහයියාය. වීපොත්තය

වීඇටය තුලවූ කොටස සහල්ය. සහල් නම් වශයෙන් නාමරූප ගැනෙන කල, ගොයම නම් වූ නාම රූපයෝ මායිමකවත් නැත්තේය.

සහල් තම්බාගත්කළ බත්ය. එතැන දැන් සහල් නැත. බත්ය. නාම රූපයෝය.

සහල් කොටාගත්කළ පිටි ය. එතැන සහල් නැත. පිටිය. නාම රූපයෝය.

පිටියෙන් තැනෙන බොහෝ දෑය. ඒ ඒ දේවලට සංඛත වූ නාම රූපයෝය.

නාමරූපයන් නොවන්නට, නිත්‍ය වශයෙන් කිසිවක් නොතිබි බව නොවැටහෙන්නේද? නාමරූපයන් කෙබඳුදැ'යි ප්‍රත්‍යක්ෂ නොවන්නේ ද?

ආපෝ, තේජෝ, වායෝ පඨවි ධාතු ස්වභාවයන්ය. රූපස්කන්ධයන් මවන්නෝය.

රූපයන් ප්‍රත්‍යකොට වේදනා, සංඥා, සංඛාර, විඥාණ පවතින්නාහ. මේවා නාමධර්මයෝය. පංචඋපාදනස්කන්ධයෝය.

මේවායේ සංකලනයෝය. සංකලන ස්වභාවයෝය. මුලාවෝ ය. මායාවෝ ය.

මායාව සැබෑදේ ලෙස දැකීම මෝහය යි. රැවටීමයි. අවිද්‍යාවයි.

රැවටීමටහසුව සැබෑලෙස ගත්දෙය වෙනස්වනවිට, නැතිවනවිට, රඳවාගත නොහැකි වනවිට, එතැන දුකය.

දුකින් මිදිය හැකිය.

දුකින් මිදීමට, දුක ඇතිවන හේතුවවන මායාකාරී මෝහයෙන්, තෘෂ්ණාවෙන්, අවිද්‍යාවෙන් බැහැරවිය යුතුය.

දුකෙන් බැහැරවිය හැකි එකම මාර්ගය ආර්‍ය්‍ය-අෂ්ඨාංගික මාර්ගයමයි. සම්මාදිට්ඨියයි. නිවැරදි දැකීමයි. නිවැරදි සිතීමයි. නිවැරදි වචන (සැබෑ ස්වභාවය පිළිබඳව පමණක් භාෂණයවනසේ කථාකිරීම. නිවැරදි ක්‍රියා (අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙනි.)

## ආයතනයෝ

රූප - වේදනා - සංඥා - සංස්කාර - විඥාණ

ඇස - කණ - නාසය - දිව - ශරීරය - මනස

අභ්‍යන්තර හා බාහිර ආයතනයන් අතර සිදුවන ස්පර්ශයෝ අපමණය. අනන්තය. ඒවා අතරින් වඩාත්ම ප්‍රකටවන සංඥාව, ඒ මොහොතෙහි පවතින ස්වභාවය වේ.

සක්කායදෘෂ්ඨියෙන්, සණසංඥාවෙන්, ගත්කල, මම, 'මගේ' වේ, 'විඳින්නා' වේ.

ස්පර්ශය හා සංඥාව වෙනස් වූ කළ, ස්වභාවය ද වෙනස් වේ. එවිට එතැන ඇත්තේ පෙර පැවති සණ සංඥාව හෝ සක්කාය ස්වභාවය නොව, පවතින ස්පර්ශ ස්වභාවය හා එයට අනුරූපවන මුලාවය. සණසංඥාවය. සක්කායදිට්ඨියය. විඥාණය, ස්පර්ශය, සංඥාව හා මුසු නොවන්නට ආස්වාදය නැත. වේදනාවත් නැත.

විඥාණමය වූ, නාමරූපයන් ගෙන් ආවරණය වූ සැබෑ ස්වරූපය එතැනය. දැකිය යුත්තේ නාමරූපයන්ගේ ආවරණයෙන් මිදී සැබෑ ස්වරූපය යි. සත්‍ය දැකිය හැක්කේ එවිටය. දකින්නේ එවිටය. අවිද්‍යාන්ධකාරය දුරුවන්නේ

එතැනය. ඒ ඒ මොහොතෙහි සිදුවන ස්පර්ශයන්, සංඥාවන්, ඒ ඒ මොහොතෙහිදීම දුරුවනු අවබෝධවත්ම උපදින තැනම නිමාවවන්නේ ය. නිරෝධවන්නේය.

එවැන්නක් පෙර තිබුනේ ද නැත. පෙර නොතිබූ බැවින් විඥාණයක්ද නැත.

එතැනම නිරුද්ධවූ බැවින් පෙරට යාමක්ද නැත. භවයක්ද නැත.

ඒ මොහොතේ දී ඇතිවී ක්ෂණයෙන්ම නැති වී යන බැවින් විඥාණයට පැවතීමක් ද නැත.

"විඥාණ අනිදස්සණං - අනන්තං සබ්බතෝ පභං"

"විඥාණය නොපෙනී යන විට සියල්ල පැහැදිළිවේ"

ඇතිවන්නේද නොවේ, ඇතිනොවන්නේද නොවේ, ඇතිවන්නේ නොවෙන්නේද නොවේ. ඇති නොවන්නේ නොවන්නේ ද නොවේ.

## දැකීම

අරහත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයෝ ද පෘථිවිය, පෘථිවිය වශයෙන් විශිෂ්ඨ ඥානයෙන් දනිත්. පෘථිවිය පෘථිවිය වශයෙන් විශිෂ්ඨ ඥානයෙන් දැන පෘථිවිය තණ්හාදී වශයෙන් මඤ්ඤණා නොකෙරෙත්, පෘථිවි ධාතුවෙහි, ආත්මය පිහිටියේයැ'යි මඤ්ඤණා නොකරත්, පෘථිවි ධාතුවෙන් බැහැරව ආත්මය පිහිටියේයැ'යි මඤ්ඤණා නොකරත්, පෘථිවිය මාගේයැ'යි අභිනන්දනය නොකරත්, ඒ කවරහෙයින්ද යත්, තථාගතයන් එය පිරිසිඳ දත් හෙයිනැ'යි කියමි.

අපෝ, තෝජෝ, පරම දෘෂ්ඨී ධර්ම, නිර්වාණය, නිර්වාණය වශයෙන් විශිෂ්ඨ ඥාණයෙන් දනිත්. නිර්වාණය නිර්වාණ වශයෙන් විශිෂ්ඨ ඥාණයෙන් දැන, නිර්වාණය තණ්හාදියෙන් මඤ්ඤණා නොකෙරෙත්, නිර්වාණයෙහි ආත්මය පිහිටියේයැ'යි මඤ්ඤණා නොකෙරෙත්, නිර්වාණයෙන් බැහැර ආත්මය පිහිටියේයැ'යි මඤ්ඤණා නොකෙරෙත්, නිර්වාණය මාගේයැ'යි මඤ්ඤණා නොකෙරෙත්, නිර්වාණය අභිනන්දනය නොකෙරෙත්, ඒ කවරහෙයින් ද යත්, තථාගතයන් නිරවශේෂයෙන් (අඩුවකින් තොරව) එය පිරිසිඳ දත්හෙයිනැ'යි කියමි.

(මූලපරියාය සූත්‍රය)

ස්කන්ධාදී ස්වභාවයෝ<br>දකින පෙනෙන ඇසෙනාදී } රූපලෝක

සිතන මෙනෙහි කරන<br>මඤ්ඤණා කරන ස්වභාවයෝ } අරූපලෝක

මේ කවර ලෝකයක් තුළ වුවද, සත්ත්වයා උපාදානය වන්නේ ද නොවේ. නොවන්නේ ද නොවේ. නොවන්නේ ද වන්නේ නොවේ. ඒ පවතිනුයේ ඇතිවන්නාවූ අවබෝධය තුළය.

අසමින්, දකිමින්, ලබමින්, රූපලෝක, රූපභවයන් තනති.

සිතමින් , මවාගනිමින්, මඤ්ඤණා කරමින් අරූප ලෝකයන්, භවයන් තනති.

මේ කවරලොවක් වුව ද, සැබෑනොවන පංචෝපාදාන -ස්කන්ධ ස්වභාවයෝමය. සැබෑනොවනුයේ මුලාවය. මුලාවෙහි ගැලුනේ, ගැලවීමක් නොමැත්තේය.

මුලාවෙන් මිදුනේ, ගැලවීගත්තේ, ගැලවුනේය. නිදහස් වුනේය. විමුක්තිය ලැබුනේය.

## හැඟීම හා සිත

හැඟීම යනු සිහිය නොවේ. සිහිය (සතිය) යනු හැඟීමද නොවේ.

හැඟීමට සිහිය අභිබවා යෑමේ ස්වභාවය ඇත්තේය.

සිහියට (සතිය) හැඟීම නතුකර ගැනීමේ, මැඩ පැවැත්වීමේ මෙහෙයවීමේ හැකි ස්වභාවය තිබේ.

සිහියෙන් යුතු හැඟීම යෝනිසෝමනසිකාරයෝය.

සිහියෙන්තොර වූ හැඟීම් අයෝනිසෝමනිසිකාර යෝය.

සිහිනැතිවූ පුද්ගලයා තුළද, හැඟීම් පහල නොවන්නේ නොවේ.

සිහිය ඇත්තා පාලනයකින් යුතුව ක්‍රමවත්ව කටයුතු කරන්නේය.

සිහිය නැත්තා එසේ නොවේ. සැමවිටම අවිධිමත්ය. තමන් කරන්නේ කුමක් දැ'යි ඔවුන් නොදන්නේය. කළ යුත්තේ කුමක් දැ'යි නොදන්නේය. හරි වැරදි නොදන්නේය. කුසලය, අකුසලය නොදන්නේය. අසන,

දකින, එළැඹෙන හැම දෙයෙහිම යෙදෙන්නේය. මත්පැන් බීගත්කළ සිදුවන්නේ සිහි නැතිවීමය. එවන් තත්ත්වයකට පත් වූ අයෙකුහට, හරිවැරදි වැටහෙන්නේ නැත. පහළවන හැඟීම්වලට නතුවන්නේය. විපතෙහිම වැටෙන්නේය.

නින්දට පත්වූවිට ද සිහිය දුබලවන නමුදු හැඟීම් පවතින්නේය. එහෙයින්ම භාවනාවෙහිදී නින්දෙන් වැළකීමට අඩුකිරීමට උපදෙස් දීම සිදුවන්නේය.

කල්පනාකිරීම යනුද, සිහිය පැවැත්වීම නොවේ. කල්පනා කිරීමේ දී ඇත්තේ ද හැඟීම්වල පෙරටුවීමේ ස්වභාවයකි.

සිහියෙන් සිටින, සිහිය දියුණු කළ තැනැත්තේ, මුලාවෙහි නොවැටෙයි. නොරැවටෙයි. අකුසලයේ නොයෙදෙයි. කුසලයේම යෙදෙයි. සියල්ල ප්‍රත්‍යවේක්ෂා කරයි. පරාමර්ශණයෙහි නොව, සම්මර්ශණයෙහිම යෙදෙයි. ප්‍රත්‍යක්ෂඥාණයම වඩයි. ඒ ඔස්සේ සියළු අභිඥාවන්කරා එළැඹෙයි. දුකින් මිදෙයි.

ලෝකය තැනෙනුයේ සිතෙහිය.

ලෝකය තනනුයේ වචනයෙනි.

ලෝකය තනන්නට ප්‍රතිපාදන සැපයෙනුයේ හැඟීම් වලිනි.

හැඟීම් උපදවනුයේ තණ්හාව ප්‍රත්‍යවීමෙනි.

තණ්හාව ප්‍රත්‍යවීමෙන් ඇතිවූ හැඟීම් හා වචීසංස්කාර ප්‍රත්‍යවෙමින් තැනෙන ලෝකය ප්‍රත්‍ය කරමින් තව තවත් තෘෂ්ණාවන් ඇතිවන්නේය.

මෙසේ ස්වභාවයේ නිමාවක් නොපෙනෙන්නේමය කරකැවෙන්නේය. එකිනෙක පරයමින් කරකැවෙන්නේය. සුළියක ස්වභාවයෙන් කරකැවෙන්නේය. සංසාරවට්ටය එතැනය.

තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපදනා හැඟීම් ක්ලේශයෝය. දුක්ඛ කාරකයෝය. දුකම සමුදය කරන්නේය.

දුක පවතින්නේ අනවබෝධයෙන්. අසිහියෙන් අයෝනිසෝමනසිකාරයෙන් අවිද්‍යාවෙන් එවන් හැඟීම් උදෙසා සිතෙහි ඉඩ සැලසීමෙනි. හැඟීම් හා වචීසංස්කාරයනට උපාදානය වීමට සිතට ඉඩ හැරීමෙනි. හැඟීම් පිළිබඳව සිහියෙන් සතියෙන් නිරවුල් සිතින් දකිනවිට, හැඟීම්වලට ඇතුළුවීමට අවශ්‍ය නොවනවිට, මං අහුරනවිට, හැඟීම්වලට පවතින්නට නොහැකි වීමෙන් ඒවා ඇතිවූ ලෙසින්ම නැතිවී යන්නේය.

හැඟීම, හැඟීමක් නොවිය යුත්තේය. මඤ්ඤනා නොකළ යුත්තේය. කුසල හැඟීම් හැරුණුකල සියළු අකුසල් හැඟීම් බැහැරකළ යුත්තේය. කවර හෝ විටෙකදී කුසල් හැඟීම්වලින්ද බැහැරවන අවස්ථාවක් එළැඹෙන්නේය. ඒ බැව් ප්‍රත්‍යක්ෂවන්නේය. එවිට එවන් කුසල් හැඟීමෙහි හෝ සිත උපාදානය නොවනුයේ, නිරෝධය වන්නේය.

## චිත්ත විකාරයෝ / නාමරූප

බුදුන්වහන්සේය, රහතුන්වහන්සේය යනු මනෝවිකාරයන්, චිත්තවිකාරයන් ගෙන් අත්මිදුනේ වන්නේය.

ස්කන්ධයෝ අනිත්‍යයෝය.

ස්කන්ධයන් කෙරෙහි ආරෝපනය කරනු ලබන නාමරූපයෝ, චිත්ත විකාරයෝය.

ස්කන්ධයේ අනිත්‍යතාවයන්, ඉන් බැහැරව ආරෝපනයවන චිත්තවිකාරයන් ගෙන් වැසීයයි. එවිට සත්ත්ව, පුද්ගලාදී, නාමරූපයන් හා පරිහරණයවනුයේ චිත්තවිකාර, චිත්තවිකාරයෝම වෙයි. මේවාට කෙළෙස් යැයිද කියති.

චිත්තවිකාරයන්හි ගැලෙන සත්ත්වයා භවයේ දුක විඳිති.

චිත්තවිකාරයන් පිළිබඳව සැබෑ තත්ත්වය අවබෝධ කළ සත්ත්වයෝ, එම ස්වභාවයන් ගෙන් මිදීමේ ස්වභාවයට පත්වෙයි.

බුදුන් වහන්සේ, චිත්තවිකාර ස්වභාවයන් අවබෝධ කොට, ඒවායින් බැහැරවූ ස්වභාවයට පත්වූයෙන්, සියළු කෙලෙස් නැසූයේ වූ සේක.

උන්වහන්සේ පිළිබඳව සත්ත්වයා තුළ පවතිනුයේද චිත්තවිකාරයෝම පමණි.

උන්වහන්සේ චිත්තවිකාරයෙහි කෙලෙස් සහිතව, සත්ත්ව, පුද්ගල වූයේ වුවද, චිත්තවිකාරයෙන් මිදුන ස්වභාවයේ සිට "බුද්ධ" නම් විය. එතැන චිත්තවිකාරයන් තව දුරටත් නොවීය.

යමෙක් මා දකීනම්, හේ මාගේ ධර්මය දකීය.

යමෙක් මාගේ ධර්මය දකී නම් හේ මා දකීය.

යනු බුද්ධ වචනයයි.

චිත්තවිකාරයෙහි ගැලෙන්නා භවය සාදාගනී සසර දුක්විඳී. මම ය යනු චිත්තවිකාරයෝය. මා බුදුන් දකින්නේය යනුද, චිත්තවිකාරයෝය. චිත්තවිකාරයන් මැඩලියහැක්කේ සිහියෙනි. චිත්තවිකාරයන් බැහැරවන විට ශේෂවන්නේ සමාධියයි. නිරෝධයයි.

රූපාදී ස්කන්ධයන් පිළිබඳව ඇලීම ඇතිකර ගනිමින්, ඒවායේ යථාස්වභාවයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, වශයෙන් පිරිසිඳ නොදන්නාතාක්, ඔවුන්ට ඒවා සත්‍යයි. සැබෑලෙස පවතිනදේයි. ඔවුන් ඒවා අල්ලාගෙන ඉන්නනිසා ඒවායෙහිම බැඳිලා. ඒනිසා තමයි කර්ම ආදී වශයෙන් පින්, පව්, ආදී වශයෙන් හැම එකක්ම සත්‍ය වෙන්නේ. අල්ලා ගැනීමක් නිසාමයි පැවැත්මක් වෙන්නේ.

මේ කාලයේ බොහෝ දෙනෙකු විශේෂයෙන්ම නිවනේ නාමයෙන් පතන්නේ භවනිරෝධය නොවෙයි. භවයමයි. භවයමයි.

නිදානසංයුත්තයේ, කච්චායනගොත්ත සූත්‍රයේහිදී බුදුරජාණන් වහන්සේ සම්මාදිට්ඨිය විවරණයකරන ආකරය බොහොම වැදගත් වෙනවා. මෙවැනි අවස්ථාවකදී උපදිනුයේ දුකක්ම උපදී. නිරුද්ධ වන්නේ දුකක්ම නිරුද්ධ වෙයි. යනුවෙන් දැනගෙන, සැක නොකරයි. දෙගිඩියාව පහළකර නොගනී. අනුන් කියනවාට පිළිගන්න එකක් නොවෙයි. තමාම ප්‍රත්‍යවශයෙන් අවබෝධකරගන්න, දැනගන්න, ප්‍රත්‍යක්ෂකරගන්නා ඥාණයක්, ඒ ආයර්‍ය පුද්ගලයාහට ඇතිවෙනවා. දුකත්, දුක්ඛ නිරෝධයත් පමණක්මයි මෙතැන තියෙන්නේ කියන ප්‍රත්‍යක්ෂය ඇතිවෙනවා. මෙපමණකිනුයි කෙනෙක් සම්මාදිට්ඨික වන්නේ.

මෙතැන කියැවෙන්නේ ලෝකෝත්තර සම්මා දිට්ඨියයි. මමය, මෙය මගේය, ආදී වශයෙන් කියැවෙන "කම්මස්සකතා" සම්මාදිට්ඨිය නොවෙයි.

"ධර්ම ස්වභාවය" හෙළි කරන සම්මා දිට්ඨියයි.

**"පුබ්බේ චාහං භික්ඛවෙ එතරහි ච**

**දුක්ඛඤ්චෙව පඤ්ඤපෙමි දුක්ඛස්ස ච නිරෝධං"**

එදත්, අදත් කලිනුත් දැනුත් මම කරන්නේ මෙපමණයි. දුකක්, දුකෙහි නිරෝධයත් පනවාලන එක විතරයි. මා කරන්නේ.

(අලගද්දූපම සූත්‍රය)

## ප්‍රත්‍යක්ෂය

පොල්ගසෙහි ගෙඩිය පොල්ගෙඩියයි. ඒවා ස්වභාවයෝය. නාමරූපයෝය. නාමරූප වශයෙන් නොගැනෙන්නට හඳුනාගතහැකි දෙයක් නැත.

අඹගසේ ගෙඩිය අඹගෙඩියය. එය ද නාමරූපයෝය.

අඹ ගෙඩියේ ඇටය, අඹඇටය ය. එය ද නාමරූප ලෙසින්ගෙන ඇති වූ සංඛතයෝ ය. හඳුනාගත්තේය. නාමරූප ම නාමරූපයෝය. මේවා පොල්ය. මේවා අඹය යනුවෙන් කවදා, කවුරුන් විසින් නම් කළේදැ'යි දන්නා අයෙකු නැත. පවතිනුයේ සම්මුතිය පමණි.

ස්වභාවය, ස්වභාවය වශයෙන් හඳුනා ගැනෙනුයේ ස්වභාවය නම් වූ රූපස්වභාවයන්, නාමයන් නිසාවෙනි.

ස්වභාවය නොවන්නට රූපයන් දකින්නේද, නාමයන් යෙදෙන්නේ ද නැත.

ස්වභාවයන්, ස්වභාවයන් ලෙසින්නොව, සැබෑ ලෙසින්, නිත්‍ය වශයෙන් පවත්නා වශයෙන් එවා කෙරෙහි ඇති කරගන්නා විවිධ විඳීම ස්වභාවයෝම විඥාණයෝ වෙති. මේවා වචනයෙන් සකස්වූයේ, වචීසංස්කාර යෝය. චිත්තවිකාරයෝමය.

විඳීමේ කැමැත්ත, පවත්වා ගැනීමේ කැමැත්ත, දුරුකිරීමේ කැමැත්ත එහි පවතින්නේය. ඒ කාමතණ්හා භවතණ්හා, විභවතණ්හා යනුවෙන්ද හඳුන්වනු ලැබෙයි.

ආස්වාදය අනුවද සංස්කරණය වෙයි.

ආදීනවදී අනුවද සංස්කරණය වෙයි.

නිස්සරණ වශයෙන් ද සංස්කරණය වෙයි.

මේ සෑමදෙයම අවිද්‍යාවය. සැබෑ ස්වභාවය නොදන්නාකමය. මෝහයය. මුලාවය. නැත්තේම ඇත්තේ ලෙස සිතන්නේය. ඒවා වැරදි මනසිකාරයෝය. වැරදි සිතුවිලිය. වැරදි මෙනෙහි කිරීම්ය. වැරදි මඤ්ඤනාවෝය. වැරදි චේතනාවෝය.

සිතුවිල්ලම නිවැරදිකර ගතයුතුය. සිතුවිල්ලම නිවැරදිවිය යුතුය. මෙනෙහිකිරීමම නිවැරදිවිය යුතුය. චේතනාවම නිවැරදිවිය යුතුය. මනසිකාරයම නිවැරදිවිය යුතුය. නාමයේ ආවරණයෙන් මිදිය යුතුය. ඝනයක් ලෙස නොව ස්කන්ධයක් වශයෙන් රූප ස්වභාවය වටහාගත යුතුය. මෙනෙහිකළ යුතුය. යෝනිසෝමනසිකාරය

පැවැත්විය යුතුය. සිහිය පැවැත්විය යුතුය. සඤ රූපයෙන් මිදෙනවිට ස්කන්ධ වශයෙන් ගැනෙන අනන්ත අප්‍රමාණ වූ ස්වභාවයෝ පෙනෙන්නාහ. එවන් ස්වභාවයන් කෙරෙහිද, නාමරූප ඇතිවන ආකාරයන් ප්‍රත්‍යක්ෂවන්නේය. නිමාවක් නොමැති ස්වභාවයන් වෙනස් වෙනස් වෙමින් වෙනස් ආකාරයන් ගෙන් ඇතිවන නැතිවන (උදයව්‍ය) ස්වභාවයන් වැටහෙන්නේය. ඇතිවන නැතිවන සෑම ස්වභාවයන් කෙරෙහි, නාමරූප ස්වභාවයන් එළැඹෙන, දුරුවන ආකාරයත් වැටහෙන්නේය. ප්‍රත්‍යක්ෂවන්නේය.

කවරආකාරයේ හෝ එකද ක්ෂණයක හෝ පවතින ස්වභාවයක් නොමැති බව ප්‍රත්‍යක්ෂවන්නේය. කවර ආකාරයේ හෝ එකද ක්ෂණයක හෝ ස්වභාවයන් උපාදානයකොට ඇතිවන නාමරූප ස්වභාවයක් නොමැති බව ප්‍රත්‍යක්ෂවන්නේය.

සැබෑ ස්වභාවයන් ප්‍රත්‍යක්ෂවනවිට මෝහය (අවිද්‍යාව) දුරුවන්නේය. එහි කවර හෝ තෘෂ්ණාවකට පහළවීමේ අවස්ථාව නොවන්නේය.

තෘෂ්ණාවනට අවසර නොමැති තැන විඥාණයාගේ පහළවීමක් කෙසේනම් සිදුවන්නේ ද?

## ධර්මතාව සුළඟ

ස්වභාවයයි

එහි කිසිවක් තිබේද?

නැතැයි කිව නොහැකිය.

එහි කිසිවක් නැත්තේ ද?

එසේත් කිව නොහැකිය.

එසේ නම් එහි කිසිවක් ඇත්තේත් නැති, නැත්තේත් නැතිවන්නේ ද?

එසේත් කිව නොහැකිය.

එසේනම් එහි කිසිවක් නැතිවන්නේත් නැති. ඇතිවන්නේත් නැත්තේ ද?

එසේත් කිව නොහැකියි.

එසේ නම් කිවහැක්කේ කුමක් ද?

අනිත්‍යතාවයයි, වෙනස්වනසුළු බවයි. ධර්මතාවයයි.

මේ පිළිබඳව නිදසුනක් කිවහැකිද?

ස්වභාවයයි. එය සංස්කාරයට ලක්වෙයි. සුළඟයැ'යි කියයි.

ස්වභාවය පවතිනවිට සුළඟයැ'යි කියයි. එය නාම රූපයයි.

ස්වභාවය වෙනස්වනවිට සුළඟ නැතිවූයේයැ'යි කියයි.

නැතිවීමයනු සංස්කාරයයි. සංඥාවයි.

දැන් ඇතිවීමක් පිළිබඳ ස්වභාවයක් ද, නැතිවීමක්

පිළිබඳ ස්වභාවයක් ද පහළවී ඇත. මේ දෙක අතර ස්වභාවය විඥාණ ස්පර්ශයයි.

දැන් ස්වභාවය නොපෙනී, ස්වභාවය සුළඟවී ඇත. සංස්කාරවී ඇත. නාමරූපයන්වී ඇත. විඥාණයවී ඇත.

ස්වභාවය සුළඟවිය. ස්වභාවය ඇතිවූ මොහොතේ සුළඟ විය. සුළඟ හමනවා වශයෙන් සංස්කරණයවිය. හැමීමද සංස්කාරයකි. නාමරූපයකි. මේවා ස්වභාවය ප්‍රත්‍යකොට ඇතිවූ නාමරූපයන්, සංස්කාරයන් මිස සැබෑවක් නොවේ.

ස්වභාවයේ ධර්මතාවයක් ලෙසින් සුළඟ ගැනේ. ස්වභාවයත්, සුළඟත් ඇතිවීමත්, නැතිවීමත්, හැමීමත් වශයෙන් සිදුවන වචීසංස්කාරයත් හා විඥාණත් ස්පර්ශයත් පවතියි.

සුළඟ හා හැමීම වශයෙන් නාමරූපයන් පෙරමුණේය.

යථා ස්වරූපීය ස්වභාවය, සුළඟහැමීම වැනි නාමරූපයන්ගෙන් වැසී ගොසිනි. සුළඟ හා හැමීම සැබෑ වූ නිත්‍ය වූ දේවල් ලෙස ගැනෙන්නේය.

සුළඟහැමීම හොඳය. සුළඟහැමීම නරකය, සුළඟහැමීම හොඳවන්නේ නැත. සුළඟනොහැමීම හොඳවන්නේත් නැත.

සුළඟ ඇත.

සුළඟ නැත.

සුළඟ ඇත්තේ නැත.

සුළඟ නැත්තේ නැත.

සුළඟ නැත්තේත් නැත. සුළඟ ඇත්තේත් නැත.

මේ සියල්ල නාමරූපයෝය. සංස්කාරයෝය. විඥාණය හේතුකාරකයෝය. මේවායේ කිසිවක් නැත. මේ සංස්කාරයන් පහළවූයේ ස්වභාවයන් ප්‍රත්‍යකරගෙනය. ස්වභාවය ඇතිවිය ස්වභාවය නැතිවිය.

ඇතිවීම, නැතිවීම, සංස්කාරයෝය. ස්වභාවය, ස්වභාවයේ ස්වභාවයම විය. ස්වභාවධර්මතාවයම එයයි. වෙනස්වීමයි.

මේවා සංස්කරණයකර ගනිමින්, නාමරූප සංඥාවන් ඇතිකර ගනිමින්, තෘෂ්ණා මූලිකව මතක තබා ගනිමින් විඥාණගත කරමින් සිදුවන, සිදුවීම් ද මූලාවය, මිථ්‍යාවය, අවිද්‍යාවය, මංමුලාවීමය.

සත්‍ය අවබෝධ වූ ක්ෂණයෙහි මුලාව දුරුවන්නේය. විද්‍යාව පහළවූ ක්ෂණයෙහි, අවිද්‍යාව දුරුවන්නේය. එතැන නිරෝධයයි. සංස්කාරයන් නොවන්නට නාමරූප විඥාණයන් නොවන්නේය.

ස්පර්ශයන් හේතුකොටගෙනම සංස්කාරයන් ඇතිවේ. ස්පර්ශයන් හේතුකොටගෙනම භවය ඇතිවේ. සංස්කාරයන් නොවන්නට භවය ඇති නොවේ.

විඥාණය (ස්පර්ශයෙන් තෘෂ්ණා මූලික) වේදනා ඇති නොවේ. වේදනා නොවන්නට ජාති, ඉපදීම, හැඟීම් (චේතනා) පහළ නොවන්නේය. හැඟීම් පහළ නොවන්නට වචන (වචීසංස්කාර) පහළවීම් නොවන්නේය.

නාමරූපයන් නොවන්නට, තණ්හාවන් ඇති නොවන්නට, තණ්හාව (කාම, භව, විභව) ඇති නොවේ. තණ්හාව ඇතිනොවන්නට ජරා, මරණ ශෝක පරිදේව ව්‍යාපාදී ඇතිනොවේ. ආස්වාද - ආදීනව - නිස්සරණ ඇති නොවෙයි.

අවිද්‍යාව නොවන්න, සළායතනයෝ (පංචේන්ද්‍රියයෝ, බාහිර ආයතනයෝ ) නොපවතී, සළායතනයන් නොවන්නට උපාදානයන් (අල්ලා ගැනීම්, ගැලීම්, ඇලීම්) ඇති නොවේ. එය ඇතිවනවිට මෙය ද ඇත්තේ වේ. එය නැතිවනවිට මෙය ද නැතිවන්නේ වෙයි. මේ සියල්ල වචනයෙන්ම සකස් වූ (වචීසංස්කාර) චිත්තවිකාරයෝමය.

## සිත සහ කෙලෙස්

කැඩපත හෙවත් කණ්ණාඩිය ඉදිරිපස හෝ පසෙකින් එයට නාභිගතවන දෙය කණ්ණාඩිය මත ප්‍රතිබිම්භනය වෙයි. එවිට හැඟෙනුයේ බැහැරින් පවතින්නාවූ, කණ්ණාඩියට නාභිගතවූ සියළුදෙය කණ්ණාඩියතුල ද ඇත්තාසේය. එහෙත් එවැන්නක් නැත. සිදුවන්නේ දර්පණතලයමත පතිතවූදේ දෘෂ්‍යවීම පමණකි. නාභිගතවූ දෙය කණ්ණාඩිය කෙරෙන් ඉවත්කළ කල්හි නැවතත් පෙර පැවතිදේ කණ්ණාඩියෙන් දැකගත නොහැකිවන්නේය. එහෙත් එම අවස්ථාව වනවිට කණ්ණාඩියට නාභිගතවන දෙය දෘෂ්‍යවන්නේය කණ්ණාඩියේ ඔපයමතට කුමක් හෝ නිරන්තරයෙන්ම නාභිගතවෙමින් ඒවා දෘෂ්‍යමානවන්නේය. ස්වභාවය එයයි. ධර්මතාවය එයයි.

කණ්ණාඩියේ මූණ ඔපවත්ය. එවන් තත්ත්වයක් පවතින ඕනෑම දෙයක් මතට නාභිගතවී ස්පර්ශවන රූපය, එම දර්පණතලයමත පිහිටනු දැකිය හැකිවන්නේය.

දුහුවිල්ල කොතැනක හෝ පතිතවූයේ, ඇලෙන ස්වභාවයක් ඇත. මෙසේ කාලාන්තරයක් කණ්ණාඩිය මත ක්‍රමක්‍රමයෙන් දූවිලි පතිතවී ඇලීගියකළ කණ්ණාඩියේ ඔපය දුර්වලවන්නේය. දර්පණතලය, මත රැඳීඇති දූවිලිතට්ටුවෙහි ස්වභාවයම කණ්ණාඩියෙන් දිස්වන්නේය. බැහැරින් පැමිණ තැන්පත්වූ දූවිලිතට්ටු තිබෙනතාක් පැහැදිලිදසුන් ඇතිවිය නොහැකිය. නිරන්තරයෙන්ම පෙනෙනුයේ ඒමත පතිතවීඇති දූවිලිතට්ටුවමය. දර්පණතලයමත රැඳීඇති දූවිලිතට්ටුව කවරක්‍රමයකින් හෝ ඉවත්කරගත හැකිවූයේනම්, නැවතත් එහි ඔපය ඇතිවීමෙන් එයට නාභිගතවන සියළුදේ එයතුල පවතින ලෙසින් දැකිය හැකිය. එසේ දැකියහැකි කිසිවක් එයතුල නොමැතිබව නොසිතන්නාහට අවබෝධනොවේ. එහි පෙනෙනදෙය බලමින් ආස්වාදය ලබන්නේය. මුළාවට පත්වන්නේය.

එහෙත් සිතන්නාහට කණ්ණාඩියතුල හෝ ඒමත ඔපය හැරුණකොට අන්‍යමක් නොමැති බවත්, ඒ ඔපයමතට නාභිගතවී වැටෙන සියළුම රූපයන්, නාභිගත තැනින් ඉවත්කිරීමත්, සමඟ නැතිවන බවත්, ඉන් කිසිවක් කණ්ණාඩියමත හෝ තුල හෝ ශේෂනොවන බවත් වැටහෙන්නේය. මෙම තත්ත්වය අවබෝධකරගත හැකිනම් සිත හා ක්ලේශයන් පිළිබඳව අවබෝධකර ගැනීමට වඩාත් උපකාරවන අත්වැලක්වෙනු ඇත.

සිත හා ක්ලේශයන් පිළිබඳව බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරා ඇත්තේය.

**පභස්සර මිදං භික්ඛවේ චිත්තං**

**තංචකො ආගන්තුකේහි**

**උපක්කිලෙසං - උපක්ලිට්ඨං**

**සංකිලිට්ඨති**

මහණෙනි, මෙම සිත ඉතාමත් දීප්තිමත්ය. එය පිටතින් පැමිණෙන ක්ලේෂයන්ගෙන් කිළුටට පත්වෙයි.

සිත හා ගැටෙන අරමුණු (සංකල්පනාවන්) කෙලෙස් හේතුවෙන්, විවිධ චිත්‍රයන් පැනනගින්නේය. වෙනත්, වෙනත් චිත්‍රයන් ඇතිවන්නේය. එවිට පෙරපැවති චිත්‍රය නැතිවී ගොසිනි. එහෙත් ආස්වාදය පිණිස ඇතිවන්නාවූ තණ්හාව හේතුකොට ගෙන ඒවා කණ්ණාඩිය මත දූවිලි රැදෙන්නාක් මෙන්, අලවාතබා ගන්නේය. ඇලීම සිදුවීම තණ්හාවෙහි ස්වභාවයයි. කවර කවර හෝ අරමුණු, නිමිතිවලින් සිත නම්වූ කැඩපත ආවරණයකර ගත්කළ, එසේකර ගන්නාවූ තැනැත්තාහට හෝ තැනැත්තියට හැගෙනුයේ එම අරමුණු සජීවී ලෙසින් නිරන්තරයෙන්ම සිත හා බැඳීතිබෙන ලෙසින්ය. කෙලෙස් හේතුවෙන් අපවිත්‍රවී ඇති සිතට ඉන් බැහැරව නාභිගතවන කිසිදු අරමුණක් හෝ අරමුණු නිවැරදිව අවබෝධකරගත නොහැක්කේය. එබැවින් සිතමත පිහිටාඇති තණ්හාමය ස්වභාවයම මෙනෙහි කරමින් විඳවන්නේය.

මව ඉදිරියේ දරුවා සිටී. ඒ බව ඇය දකින්නේය. දරුවා ඇය ඉදිරියෙන් ඉවත්වී ගියසැනින් දරුවා එතැන නැත. එහෙත් ඒ දරුවා පිළිබඳව චිත්‍රධාරාවක් නොනවත්වාම පවත්වා ගන්නේය. එතැන නොමැති දරුවා පිළිබඳව, නොනිමි සිතුවිලි දහරාවන් පවත්වන්නේය. ඒවා මනෝවිකාරයන් මිස, සැබෑතත්ත්වයන් නොවන්නේය. ඒ වනාහි, පුනර්භවය ඇතිවීමේ හේතුවයි. දරුවා පිළිබඳ සිතුවිල්ල ආස්වාදජනකනම්, එය විඳීමේ ආශාව කාමතණ්හාවය. එම ආස්වාදය ඉදිරියටත් ලැබීමේ ඕනෑකමවන්නේ නම්, එතැන භවතණ්හාවය.

දරුවා පිළිබඳ සිතුවිල්ල දුක්බරනම්, එතැන ඇතිවන්නේ, එම දුකින් මිදීමේ ඕනෑකමයි. දුක අත්හැර දැමීමේ ඕනෑකමයි. දුක පළවාහැරීමේ ඕනෑකමයි. එය වනාහි විභවතණ්හාවයි.

මව ඉදිරියේ දරුවා සිටියදී, දරුවා සිටිනබව පමණක් තේරුම්ගත හැකිවූයේනම්, දරුවා මව ඉදිරියෙන් බැහැරවූ සැනින්ම දරුවා පිළිබඳ සිතිවිල්ලද බැහැරවිය යුතුය.

එසේ එම මොහොතෙහිදීම දරුවා පිළිබඳව සිතුවිල්ල බැහැරවූයේනම්, ශේෂය වූයේ, හිස්තැනකි. විඳිනට යමක් නැතිවීමකි. නිරෝධයකි.

පහළවන, පහළවන සිතක් පාසාම තත්වය මෙසේමය. ඒ ඒ ක්ෂණයත් පාසා, ඇතිවී, නැතිවන ස්වභාවයත්, නැතිවන අරමුණ සමඟ වෙනත් අරමුණක් පහළවන ආකාරයත්, එයද නැතිවනවිට එහි ස්වභාවයද නැතිවන බවත් සිහියෙන් යුතුව විමසන්නේ නම්, සිටි තැනම

නැතිවෙනවා මිස, ඉදිරියට යෑමක් පැවැත්මක් නැතිබව අවබෝධවන්නේය. අත්හැරුනේ එතැනය. අල්ලාගැනීමට යමක් නොවූයෙන්, එතැන දිස්වූයේ සමාධියයි. උපාදානයේ නිමාව එතැනය. ඒ වනාහි සැබෑසතුටය. එය තමා විසින් තමාතුලින්ම අවබෝධකර ගතයුතු, දැකගතයුතු, තත්ත්වයක් මිස වචනයෙන් විග්‍රහකර දැක්විය හැක්කක් නොවේ.

## අකුණුසරය හා ගස

අකුණුසරයක් වැදින. මහා ගසකට ගිනි ඇවිලුනේය. දර, කොළ, අතු, ඉති ආදී වශයෙන් ගින්න පැවතීමට ප්‍රමාණවත්වූ හේතුප්‍රත්‍යයන් පවතිනතාක් ගින්න දැල්වෙනු ඇත. ගින්න හටගත් ගස දැවී නිමවනවාත් සමගම ගින්න නිවීයන්නටද හැකිය. ගින්නට පවතින්නට තරම් වියළිගතියක් නොමැතිකම හේතුවෙන් ගස ඉතිරිව තිබියදී ගින්න නිවීයන්නටද හැකිය.

ගසදැවෙනු සමගම වෙනත් ගසකවෙලී ගින්න පැතිරෙන්නටද හැකිය. වෙනත් වෙනත් ගස්වලට ඇවිලෙමින් ගින්න පැතිරයන්නටද හැකිය. කෙසේ හෝ වේවා, හේතුප්‍රත්‍යයන් පවතිනතාක් ගින්න දැල්වෙනු ඇත.

ගින්නක් තිබුනේ නැත. ගසෙහිද, ගින්නේද, සම්බන්ධයක් තිබුනේද නැත. ගින්න හටගැනුනේ, වෙනත් හේතුප්‍රත්‍යයන් හේතුවෙන් ඇතිවූ අකුණුසරයෙනි. අකුණුසරය හා ගසඅතරද සම්බන්ධයක් තිබුනේ නැතිය.

එහෙත් අකුණුසරය ප්‍රත්‍යවෙමින් ගසෙහි ගින්න හටගත්තේය. ගින්නත්, ගසත් අතර පෙර සම්බන්ධයක්

නොතිබූ නමුදු මේවනවිට ගසත්, ගින්නත්, අතර සම්බන්ධයක් ඇතිවී අවසන්ය.

ගස දවන්නට, ගින්නට වුවමනාවක් නැත්තේය. ගින්නෙහි දැවෙන්නට, ගසට වුවමනාවක් ද නැත්තේය. එහෙත් හේතුප්‍රත්‍යයන්ගෙන් ගින්න ඇතිවිය. එහි පැවැත්මට ගස හේතුප්‍රත්‍යවිය. ගින්න පවතින්නට ගසෙන් අවසර ගැනීමක් හෝ ගින්න ඇතිවීමට පෙර ඒ පිළිබඳව ගසෙන් විමසීමක් නැත්තේය. හේතු පහලවූ ක්ෂණයෙහි හේතුප්‍රත්‍යකරමින්, හේතුවේ ඵලය ලෙසින්වන ධර්මතාවය ඇතිවන්නේය. හේතුව නිමවනවිට ඵලය ලෙසින්වන ධර්මතාවයද නිමවන්නේය. ඒවායේ දැනීමක්, හැඳිනීමක් නැත. දැනීම, හැඳිනීම, ඇතිවූයේ හේතුඵල ධර්මතාවයන් කෙරෙහි ඇතිකළාවූ නාමරූපයන් තුලිනි. නාමරූප නොවන්නට ධර්මතාවයන් ධර්මතාවයන් අනුවම පවතිනු ඇති. නැතිවනු ඇති.

හේතුප්‍රත්‍යයක් අඩුව ඇතිවූ ස්වභාවයකි. ධර්මතාවයකි. ගින්න නම්විය. නාමරූප ඇතිවිය. පංචෝපාදානස්කන්ධයෝම එතැනය. නාමරූප ප්‍රත්‍යවීමෙන් ධර්මතාවය, ස්වභාවය ආවරණය විය. දැන් දකින්නා දකිනුයේ නාමරූපය, විඳින්නා විඳිනුයේ නාමරූප කෙරෙනි. නාමරූප කෙරෙන් චිත්තවිකාරයෝ වෙති. චිත්තවිකාරයෝම සිතති. මෙනෙහි කරති. අයෝනිසෝමනසිකාරයෝ වෙති. මඤ්ඤනා කෙරෙති.

අකුණුසරයක් හේතුප්‍රත්‍යවෙමින් ගස හා උපාදානයවීමෙන් ගින්න හටගන්නාසේම, පෙර නොපැවැති නිමිති (සංඥා) ප්‍රත්‍යවීමෙන් ඒ හා උපාදානයවන්නාවූ සිතුවිලි

චිත්තවිකාරයන්හි ගැලෙමින් හේතුප්‍රත්‍යවූ සංඥා කෙරෙන් චිත්තවිකාරයන් පවත්වනුයේ නොදන්නාකම නිසාය. අවිද්‍යාව නිසාය.

නි මි ති (සං ඥා) ප හ ළ වූ ක් ෂ ණ යෙ හි යෝනිසෝමනසිකාරයෙන්, නිවැරදිසිහියෙන්, සතියෙන්, ඒ පංචඋපාදානස්කන්ධ ස්වභාවයන්ලෙස වටහාගනුයේ, එවන් ධර්මතාවයන් කෙරෙහි නාමරූප පවත්වන්නේ නැතිය. ධර්මතාවයන්ම ඇතිවෙයි. ධර්මතාවයන්ම නැතිවෙයි. ප්‍රත්‍යක්ෂඥාණයෙන් යුතුව සිහියපවත්වන හෙතෙම ධර්මතාවයන්ම දකියි. ඉන්බැහැර කිසිවක් නොදකියි. දැක්කේවුවද, නොගනියි. නොඇලෙයි. නොවිඳියි. නොඑළැඹෙයි. නොපිහිටයි. අල්ලාගන්නේද නොවෙයි. අත්හරින්නේද නොවෙයි. අත්හැරුනේමවෙයි.

කනින්, සියල්ල අසයි. ඇසින් සියල්ල දකියි. ප්‍රාඥතෙමේ දුටු, ඇසූ සියල්ල හරනට හෝ ගන්නට නොනිසි වෙයි.

'ඇස් ඇත්තේ නමුදු, නොබැලිය යුත්තේහි අන්ධයෙකු මෙන්වන්නේය. කන්ඇත්තේ නමුදු, නොඇසිය යුත්තෙහි, බිහිරෙකුමෙන් වන්නේය. නුවණ ඇත්තේනමුදු නොදතයුත්තේ මෝඩයකුමෙන් වන්නේය. බලඇත්තේ නමුදු නොකටයුත්තෙහි දුබලයෙකුමෙන් වන්නේ ය. යළි නොකටයුතු දෙයක් එළැඹසිටිකල්හි මර ඇඳෙහි වැතිර සිටින්නෙකු මෙන්, නිසලව වැතිර සිටින්නේ ය"

(මහාකච්චායන ථෙර ගාථා)

## නිවුණේ ය.

පහනෙහි තෙල්දවිය. පහන්තිරයද විය. හේතුප්‍රත්‍යයන් ඇති බැවින් පහනෙහි ගිනිසිළුව දීප්තිමත්ව දැල්වෙමින් තිබුණි.

කාලය ගෙවීයත්ම පහනේ තෙල්සිඳීගියේය. පහන්තිරයද දැවීගියේය. හේතුප්‍රත්‍යයන් නොමැතිවීමත් සමඟම එතෙක් දීප්තිමත්ව දැල්වෙමින් තිබූ ගිනිසිළුව ද

නිවුණේය.

ගිනිසිළුවක් පැවති බවක් හෝ පැවතියේ නම්, එය දැන් කොහේ ගියේදැ'යි පැවසිය හැකි අයෙකු නොවීය. එහෙත් හේතුප්‍රත්‍යයෙන් ගිනිසිළුව පැවතිබවත් හේතුප්‍රත්‍යයන්ගේ දුරවීමෙන් ගිනි සිළුව නිවුන බවත් ප්‍රඥාවඇති තැනැත්තෝ අවබෝධකර ගන්නෝය. ප්‍රත්‍යක්ෂකර ගන්නෝය.

තවදුරටත් හේතුප්‍රත්‍යයන් හා නොඇලෙන බැවින්, ඔවුහුද නිවුනේ විය.

## සිත හා වළාකුළු

අහසෙහි වළාකුලක් පා වෙන්නේය.

අහස පිළිබඳව දැන නොසිටියේනම් අහසපිළිබඳව සිතුවිල්ල ඇතිවිය නොහැක්කේය.

වළාකුල පිළිබඳව දැනනොසිටියේනම් වළාකුල පිළිබඳව සිතුවිල්ල පහළවිය නොහැක්කේය.

එහෙත්, දැන් අහසෙහි වළාකුලක් පාවෙන්නේය.

අහස ඇතිවූයේ සිතෙහිය. වළාකුලද ඇතිවූයේ සිතෙහිය. අහස ඇතිවූයේත්, වළාකුල පාවූයේත් සිතෙහිය.

අහස, වළාකුල, පාවීම සියල්ලම වාචිකයෝය. වචීසංස්කාරයෝය. නාමරූපයෝය. විඥාණයෝය. යළිඳු දිස්වනුයේ සංඥාවෝය.

සිතුවිලි (මනසිකාරයන්) වළාකුල, අහස, පාවීම වශයෙන් නාමරූපයන් ගෙන් විඥාණයෙන් මිඳුනකළ තවදුරටත් අහසක් නැත. වළාකුලක්ද නැත. පාවීම නැත.

වළාකුලවූයේ සිතය. පාවීමවූයේ සිතය. අහසවූයේ සිතය.

කොතෙකුත් වළාකුළු අහසේ පාවූයේවුවද සිත එම සිතුවිලිවලින් මිඳුනකළ අහස හෝ වළාකුල හෝ පාවීම තවදුරටත් නොවන්නේය.

අහසෙහි වළාකුලක් පාවෙන්නේ යැ'යි සිතුනවිට ඒ දෙස බලාසිටීමේ සිත්පහළවූයේනම්, ඒ දෙස බලා සිටින්නේය.

අහස, වළාකුල, පාවීමදෙස බලා සිටීමේ සිතුවිල්ලෙන් බැහැරවීමට සිතුනවිට ඉන්බැහැර වන්නේය.

අනතුරුව, අහස, වළාකුළ, පාවීම පිළිබඳව තවදුරටත් සිතුවිලි නොවන බැවින්, එතැන, අහසක් හෝ වළාකුලක් හෝ පාවීමක් නැත්තේය.

'අහස' වූයේ සිතයි.

'වළාකුල' වූයේ, සිතයි.

පාවූයේ සිතයි.

සිතම මිස (චිත්තස්වරූපයම මිස) අන්කිසිවක් නොවේ.

## සංයෝජනයෝ

"යම් ආකාරයකින් දියෙහි උපන් අලංකාර නෙළුම් මලක් දියෙන් මතුවී පිපෙන්නේද? දියෙහි නොගැටී සිටින්නේද?''

''එසේම, ලෝකයෙහි උපන් සර්වඥතෙමේ ලෝකයෙහි වෙසෙයි. දියෙහි පිපුන නෙළුම කෙසේනම්, දිය නොතැවරී පවතින්නේද? එසේම සර්වඥයින් වහන්සේද ලෝකය අතරින් බිහිවී ලෝකයෙහි නොගැටී පවතින්නේය"

ඇවිලෙන ගින්නෙහි තවදුරටත් ඇවිලීමට දර නැතිවූයේ ගින්න සන්සිඳේ. අඟුරු ඇත්තේ වුවද, ගින්න නිවුනේ යැ'යි කියනු ලැබේ.

මේ වනාහි නුවණැත්තන් විසින් දෙසන ලද අර්ථ ප්‍රකාශක උපමාවකි. මහානාගයෝ (ක්ෂීණාශ්‍රවයෝ) දතයුතු ආකාරයෙන්ම නාගයා නාගයාලෙස හඳුනත්,

(උදායි ස්ථවිර ගාථා)

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේහට ඇස, ඇත්තේමය. උන්වහන්සේ ඇසින් රූ දකිති. භාග්‍යවතුන් වහන්සේහට ඡන්දරාගයක් නැත. උන්වහන්සේ මැනවින් මිඳුනසිත් ඇතිසේක.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේහට දිව ඇත්තේමය. භාග්‍යවතුන් වහන්සේ දිවෙන් රස විඳිති. උන්වහන්සේහට ඡන්දරාගයක් නැත. උන්වහන්සේ මැනවින් මිඳුනසිත් ඇතිසේක.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේහට සිත ඇත්තේමය. භාග්‍යවතුන් වහන්සේ සිතින් ධර්මතාවයන් දකිති. දනිති. උන්වහන්සේහට ඡන්දරාගයක් නැත. භාග්‍යවතුන් වහන්සේ මැනවින් මිඳුනසිත් ඇතිසේක.

ඇවැත්නි, යම්සේ ඇස, රූපයනට සංයෝජනය නොවේද, රූපය, ඇසට සංයෝජනය නොවේ. එහි ඇසත්, රූපයත්නිසා යම් ඡන්දරාගයක් උපදීනම් එය එහි සංයෝජනයවේ.

දිව රසයනට සංයෝජනය නොවේද, රස දිවට සංයෝජනය නොවේ. එහි දිවත් රසයත් නිසා යම් ඡන්දරාගයක් උපදීනම්, එය එහි සංයෝජනයවේ.

සිත ධර්මතාවයනට සංයෝජනය නොවේද? ධර්මතාවය සිතට සංයෝජනය නොවේ. එහි ධර්මතාවය හා සිතනිසා කිසියම් ඡන්දරාගයක් උපදීනම් එය සංයෝජනය වේ.

එහෙයින් මේ හැම මෙයාකාරයෙන් දතයුතුය. අවබෝධකළ යුතුය. ප්‍රත්‍යක්ෂකළ යුතුය.

(කොට්ඨීන සූත්‍රය)

## නිරුද්ධ කළ යුත්තේ

ස්වභාවයෝය. ආපෝ, තේජෝ, වායෝ, පඨවි යනාදී වශයෙන් හැඳින්වෙන්නේය. නාම දරන්නේය. මෙවන් නාම නොවන්නට ස්වභාවයන් පිළිබඳව හඳුනාගැනීමක් පැවතීමක් පිළිබඳව පහළවීමක් නොවන්නේය.

මෙවන් ස්වභාවයන් එකසේ, එක් අයුරකින්ම නොපවතින්නේමය. නිරන්තරයෙන් සසලවන්නේමය. වෙනස්වන්නේය. එකිනෙකා වෙනස්, වෙනස් ස්වභාවයනට පත්වන, සෑම ක්ෂණයක්, ක්ෂණයක් පාසා, එකිනෙකතුලින්, එකිනෙකා ස්පර්ශවීමෙන් වෙනත් ස්වභාවයන් ඇතිවන්නේය. ශක්තීන් ඇතිවන්නේය. ඒවාද ඒ ඒ ක්ෂණයෙහිම නැතිවන්නේය. මෙම ස්වභාවයන් ධර්මතාවයන්ය. නාමයැ'යි ද, සිත්යැ'යිද වශයෙන් යෙදෙති. එකක්, එකක් වශයෙන් වෙන්වෙන්ව නොව, එකිනෙකා පරයමින් සිදුවන මෙම ක්‍රියාදාමයන්තුළ ඇතිවන, නැතිවන නාමධර්මයෝ (සිත්)ද අපමණය. එම ස්වභාවයන් තුළ ඇතිවී නැතිවීමක් නොව නිරන්තරයෙන්ම පවතින ස්වභාවයක් උද්ගතවන්නේය. වැරදුනේ එතැනය. ඇතිවී නැතිවී යනස්වභාවයන්ගේ වේගවත් ක්‍රියාකාරීත්වය හේතුයෙන් එකිනෙකා වෙන්වෙන් වශයෙන් ගැනීම වෙනුවට, ඒ සියල්ල එකක් ලෙස, ඝණයක් ලෙසින් ඇතිවන සක්කායදිට්ඨි ස්වභාවයන්ම ත්‍රිවිධ තෘෂ්ණාවන්ගෙන්, අතීත මතකයන්ගෙන්, සමන්විත විඥාණයන්, මමත්ත්වයන්, ආත්මදෘෂ්ඨි බිහිවීමට හේතුකාරක වන්නේය.

ස්වභාවයන්ගේ වෙනස්වීම්, ස්පර්ශයන්, වේදනාවන්, සංඥාවන්, ස්කන්ධයක් වශයෙන්නොව ඇතිවන

ක්ෂණයෙහිම නැතිවන ස්වභාවයන් අවබෝධ කරන්නේ නම් එම ස්වභාවයන් පිළිබඳව හැඟීම් චේතනාවන්, සංස්කාරයන්, මනසිකාරයන්, හටගන්නේ නැත. පවතින්නේ නැත.

ඇතිවූ ස්වභාවයෝ, ඇතිවූ ස්ථානයෙහිම නැතිවිය. අල්ලාගැනීමට, රඳවාගැනීමට, තෘෂ්ණාඉපදවීමට ශේෂයක් නොමැතිබව ප්‍රත්‍යක්ෂවන්නේය.

සක්කායදිට්ඨි ස්වභාවයෝය. අනාත්මයෝය. කාමතණ්හාවෝය. භවතණ්හාවෝය. විභවතණ්හාවෝය. ක්ලේශයෝය. මාරධර්මයෝය. දුක ඇතිවීමට හේතු කාරකයෝය. විඥාණයම දුක් ගොඩකි. මායාජාලයකි. නොපමාව ඉවත්විය යුත්තකි. බැහැරකළ යුත්තකි. නොපැවැත්විය යුත්තකි. වශයෙන් අවබෝධවන්නේය.

## චිත්තවිකාර

ගසෙහි මල්පොහොට්ටුව - මතුවෙලා තිබෙනු දැක
මගේසිත සතුටකින් - පිරීයයි පිරීයයි.
දිගුකලෙක සිටපැවති - නෙකහැඟුම් සපුරමින්
තව නොබෝ දිනකින්ම - මලපිපෙනු දැකියහැක.

සුවඳවිදහාලමින් - පෙරදිනයෙ පිපුනමල
එකදිනකි පැවතුනේ - පෙතිගිලිහි මැලවිලා
අද දවසෙ පරවෙලා - නටුවෙනුත් ගිලිහිලා
මලක් පිපි බවක් හෝ - එහි නොමැත දැකගන්න.

පොහොට්ටුව දුටුදවසෙ - පහළවුණු සතුටුසිත
මා වෙතින් ගිලිහිලා - මැලවිලා යායුතුද
කුහුල මතුවෙයි සිතෙහි - පෙනෙනවිට මේ ලෙසින්
පරවුනේ මලම්සක - පොහොට්ටුව හෙම නොවේ

පොහොට්ටුව නොමවන්න - මලක් බිහිවනු නොවේ.
මලපිපෙනු දකිනවිට - පොහොට්ටුව එහි නොවේ.
සැබෑලෙස දිස්වුවත් - එය මුලාවක් පමණී
පහළවුණ සිත් පෙළක් - හැරනොමැත අන්කිසිත්
සිදුවීම තුළ තිබෙන - සැබෑතතු පසෙකලා
සම්මුතිය තුලටවී - මුලාවට පත්වෙලා
"මුලාවම" කරටගෙන - "විමුක්තිය" සොයනමුත්
"විමුක්තිය" පෙනි පෙනී - නොමදකිති බාලයෝ

## ලෝකධර්ම - ධර්මස්කන්ධ

| | |
|---|---|
| මේවා තුළ | මේවා තුළ |
| විවිධ ක්‍රියාකාරීත්වයන් | විවිධ ක්‍රියාකාරීත්වයන් |
| පවතින ස්වභාවයෝය. | පවතින ස්වභාවයෝය. |
| පුරුෂනම්වූ | ස්ත්‍රීනම්වූ |
| නාමරූප සංස්කාරයකි. | නාමරූප සංස්කාරයකි |
| ස්කන්ධයකි. | ස්කන්ධයකි. |

දරුවන් ඉපදවීමේ ඕනෑකමක් මෙම කවර කයකට (ස්කන්ධයකට) හෝ නැත. "කය" දරුවන් බිහිකරන්නේද නැත. තමන් දරුවන් උපදවන බවක් "කය" දන්නේද නැත. කායික සම්බන්ධයන්ගෙන් තොරව දරුවන් බිහිවන අන්ආකාරයක්ද නැත. බිහිවූ සැනින් වෙනත් කයක් බැවින් මුල්කායයන්ගේ අයිතියක්ද නැත්තේය. ස්වභාවය එයමය.

එහෙත්, මව,පියා, ලෙසින් එළැඹෙන විඥාණ ස්වභාවයන් විසින් අයිතියක් දක්වන්නේය.

මල එකකි. තවත් මලක පරාගපෝෂණය වීමෙන් ගෙඩිය හටගනී.

ගස කෙරෙන් මල හටගත්බවක් ගස නොදනී. මල කෙරෙන් ගෙඩිය හටගත්බවක් මල නොදනී. තමන් කවුරුන් කෙරෙන් හටගත්තේද යන්න ගෙඩිය නොදනී. විඥාණ ස්වභාවයන් හැරෙන්නට ඒවායේ හිමිකම් කියන්නට, අයිතිය කියන්නට, අන්කවර ස්වභාවයක්වත් නැත. විඥාණ ස්වභාවයම මුළාවය. මෝහයය. මායාවය. මේ ස්වභාවයන්, ත්‍රිවිධතෘෂ්ණා ස්වභාවයන් ඇතිකරයි. මෙම ස්වභාවයන්ගේ පැවැත්ම භවකාරකයෝය. මෙම ස්වභාවයන් එකක් නොවේ. අනන්තය. අපරිමිතය. කවරනම් හෝ අවස්ථාවක ඇතිවූ මෙම ස්වභාවයන් එකිනෙක ගැටෙමින්, නාමරූපසංඥා උපදවමින්, ඇතිවෙමින් නැතිවෙමින් භවසංස්කාරයන් ලෙසින් පවත්නේය.

මෙම ස්වභාවයන් මූලික ස්කන්ධයනට අයත්වන්නේද නොවේ. එම ස්කන්ධයන් නොවූයේනම් මෙම ස්වභාවයන්

බිහිවන්නේද නොවන බැවින් මූලික ස්කන්ධයන්ගෙන් බැහැරවූයේද නොවේ. හේතූන් සමුදායක් විසින්, ඵලප්‍රත්‍යය සමුදායක් ගොඩනැගී ඇත. ඇතිවූ ස්වභාවයන්, ඇතිවූ මූලික ප්‍රත්‍යයන්තුලින්ම නිරෝධ නොවූයේනම්, හේතුඵල ප්‍රත්‍යකරගනිමින් අනන්ත, අපමණ අයුරින් ඇදීගෙන යනු ඇත.

ස්වභාවය, ස්වභාවයන් හා පවතින්නේය.

ස්වභාවය, ස්වභාවයන් හේතුවෙන්ම නිරෝධ වන්නේ ය. විඥාණය යනුද අනෙකුත් ධර්මතාවයන් මෙන් ශක්ති ස්වභාවයකි. සතිය හෙවත් සිහිය යනු ද එවැනිම ධර්මතාවයකි. සංස්කාර නම්වූ තත්ත්ව තුළින්, මෙහි සැබෑස්වරූපය හඳුනාගත නොහැකිය.

විඥාණය, ප්‍රොජෙක්ටරයනම් නාමරූප, මමය, මාගේ ය. යනු තිරයමත වැටෙන දර්ශණයෝය. එම තිරයමත වැටෙන දර්ශණතුලින් විඥාණය දැකීමට හෝ එය පහකිරීමට නොහැකිය.

එහි සැබෑස්වරූපය දැකීමට නම් ප්‍රොජෙක්ටරය වෙත යායුතුය. එය දැකියයුතුය. එය ක්‍රියාවිරහිත කළයුතුය. එවිට තිරයමත වැටෙන විඥාණරූප, මම, මගේ ස්වභාවයන් නිරෝධවනු ඇත්තේය.

විඥාණය අතීත ස්වභාවයෝය. තත්කාලීන ස්වභාවයන් හා වෙළෙමින් වර්තමාන ස්වභාවයන් උපදවන්නෝ ය. එම ස්වභාවයන් අනාගත ස්වභාවයන් උදෙසා හේතු කාරක වන්නේය. මෙම ස්වභාවයන් පිළිබඳ යථාතත්ත්වය

දැන, අනිත්‍ය වූ විඥාණ කාරකයන් අනිත්‍ය ලෙසින්ම නිරෝධයවන්නට හැරීම මිස, නොපැවැත්විය යුතුය.

## ධර්මතාවය

ස්වභාවයයි.

වෙනස්, වෙනස්වීමම එහි ස්වභාවයයි.

ස්වභාවයෙහි කිසිම නිශ්චිත හැඩයක් නැත. නිශ්චිත ස්වභාවයක් නැත.

කිසිදා වෙනස්නොවන එකමස්වභාවය නම් වෙනස්වීමය. එය පරමසත්‍යයයි.

ස්වභාවයම, ධර්මය විය.

ස්වභාවයම, ආර්‍ය සත්‍යය විය.

ස්වභාවයම, ඇතිවීමනම් සංස්කාරයවිය. එය සක්කාය දෘෂ්ඨියයි.

ඇතිවීමනම්වූ සංස්කාරය වන්නාහාම නැතිවීමනම්වූ සංස්කාරයද ප්‍රාප්තවිය. එයද සක්කාය දිට්ඨියයි.

ඇතිවීම, නැතිවීම නාමරූපවිය. ස්වභාවය ඒවායින් ආවරණයවිය. සත්‍යය නොපෙනීගියේය. ඇතිවීම නැතිවීම පෙරටු, ඇතිවීම් නැතිවීම් සත්‍යවශයෙන් පවතින ලෙසින් සම්මතවිය. මුලාව ඇතිවිය.

ඇතිවීමක් නැත. එතැන නැතිවීමක් ද නැත.

ස්වභාවය පමණි. යථා නාමරූපයන් වූ වෙනස්වීම පමණි.

ස්වභාවයක් ඇතැ'යි කිවනොහේ.

ස්වභාවයක් නැතැ'යි කිවනොහේ.

ස්වභාවයක් ඇත්තේත් නැති, නැත්තේත් නැත්තක් යැයි ද කිවනොහේ.

ස්වභාවයක් නැත්තේත් නැති, ඇත්තේත් නැත්තේ යැයි ද කිවනොහේ.

ස්වභාවයම එයයි.

ඇත්තේත් නැත. නැත්තේත් නැත.

උපේක්ෂාවය.

ඇත්තේත් නැත. නැත්තේත් නැත.

නේවසංඥානාසංඥාය

## සත්‍යාවබෝධය

නාමරූපයෙන් තොරව විඥාණයක් නැත. විඥාණයෙන්තොර නාමරූපද නැත.

සිහිය හා එක්වීමෙකින් තොරව විඥාණයට පැවැත්මක් ද නැත.

සිහිය යනු යෝනිසෝමනසිකාරී ස්වභාවයයි.

සිහිය, විඥාණය හා ස්පර්ශවූකළ බිහිවෙනුයේ අයෝනිසෝමනසිකාර ස්වභාවයයි. එවිට පවතින්නේ මුලාවයි.

සීතලක් දැනෙයි, සීතලයනු නාමස්වභාවයකි. සීතලදැනෙනුයේ විඥාණ සම්මුඛයේදීය.

සීතල අත්විඳිනුයේ - සිහිය යටපත්කොට නැගුන අයෝනිසෝමනසිකාරයෙනි. පංචඋපාදනස්කන්ධයෙනි.

සිහිය ඇත්තේ - සීතලට අනුකූල නොවන්නේ දියට බසින්නේය. නාන්නේ ය. සීතලය දුරුවන්නේය.

සීතලනම්වූ නාමරූප ස්වාභාවයත් විඥාණයත් බැහැරවන්නේය.

විඥාණය, සිහියට පරාජයවී පලාගියේය.

සීතලට හසුකොට, පීඩාවක් ඇතිකිරීමට පැමිණි විඥාණ මාරයා, සිහිය හමුවේ. පරාජයටපත්වී පළාගියේය.

අවබෝධවිය යුත්තේ මෙම ස්වභාවයන්ය. ධර්මතාවයන්ය.

## ආස්වාදය

ස්වභාවය, ධර්මතාව, වෙනස්වීම දැකීමම - ධර්මය - දැකීම - වෙයි. සත්‍යාවබෝධය වෙයි.

ජයග්‍රහණය පිළිබඳ දෘෂ්ටිගතවන්නෝ, සිහින දකින්නෝ, පරාජයේ මඟ තනාගන්නාවුන්මය. ජයග්‍රහණය

හෝ පරාජය පිළිබඳ දෘෂ්ටිගත නොවන්නාහට ලැබෙන ජයක් හෝ පරාජයක් නැත.

ආස්වාදයක් නැත.

ආස්වාදයක් නැති හෙයින් ආදීනවයක් ද නැත.

ආදීනවයක් නැති තැන නිස්සරණයක් ද නැත.

උපේක්ෂාවම පවතිනු ඇත.

## සිහිය

සිහිය පිහිටන්නේ ඇතිවී නැතිවීයන තැනය. විඤාණය ඉන් බැහැරවය.

අවිද්‍යා අන්ධකාරයෙන් වැඩුන, පුහුදුන් සත්ත්වයින්හට හමුවන්නේ, පෙනෙන්නේ තෘෂ්ණාහරිත විඤාණයයි.

විද්‍යාව පහළවන අවස්ථාවේ ප්‍රත්‍යක්ෂවනුයේ අනිත්‍ය - ස්වභාවයයි. ඇතිවන, නැතිවන - උදයව්‍ය ස්වභාවයයි. නාමරූපයන්ගේ යථාස්වභාවයයි. නාමස්වභාවයන්, නාමකයන් (සංඛතයන්, සම්මුතීන්) ක්ලේශයන් හා උපාදානයන් නොවනකල - තෘෂ්ණාවන් පැතිරෙන්නේ නැත. තෘෂ්ණාවයාගේ නොපැතිරීම යනු විඤාණ ස්වභාවයේ දුබලවීමයි. ක්ෂයවීමයි. මාරයාගේ ඇදවැටීමයි.

## වෙනස්වීම

ඩිම්බයකි, ශුක්‍රාණුවකි. මේ ස්වභාවය සංස්කාරයෝය. නාමරූපයෝය.

වෙනස්, වෙනස් වෙයි.

කළලයකි - සංස්කාරයෝය - නාමරූපයෝය

වෙනස්, වෙනස් වෙයි.

බිළිඳෙකි - සංස්කාරයෝය - නාමරූපයෝය.

වෙනස්, වෙනස් වෙයි.

ළදරුවෙකි - සංස්කාරයෝය - නාමරූපයෝය.

දරුවෙකි (ළමයෙකි) - සංස්කාරයෝය
නාමරූපයෝය.

වෙනස්, වෙනස් වෙයි.

යෞවනයෙකි - සංස්කාරයෝය - නාමරූපයෝය.

වෙනස්, වෙනස් වෙයි.

වැඩිහිටියෙකි - සංස්කාරයෝය - නාමරූපයෝය.

වෙනස්, වෙනස් වෙයි.

මහල්ලෙකි - සංස්කාරයෝය - නාමරූපයෝය.

වෙනස්, වෙනස් වෙයි.

මළකඳකි - සංස්කාරයෝය - නාමරූපයෝය.

වෙනස්, වෙනස් වෙයි.

පිළිකුල්කළ යුත්තකි. දුගඳ හමන්නකි. බැහැරකළ යුත්තකි. සංස්කාරයෝය නාමරූපයෝය.

ඔජස්ගලා දිරාපත්වී ස්කන්ධය නොපෙනීයයි. ස්වභාවය, ස්වභාවයේ යථාස්වභාවයම දක්වා ඇත.

මේ ස්වභාවයන් පිළිබඳ යථාස්වභාවය නොදන්නාකම (අවිද්‍යාව) හේතුවෙන් ඒ ඒ ස්වභාවයන් සංස්කාරයන් නාමරූපයන් (උපාදානයකර) ගනිමින් ආස්වාදය විඳීමේ තෘෂ්ණාවෙන් කැමැත්ත ඇතිවූයේ නම්, වෙනස් වෙනස්වන ස්වභාවයතුල එම ආශාවන් සුළු මොහොතකට හෝ පවත්වාගත නොහැකිව - වෙනස්වන වෙනස්වන ස්වභාවයන් හා උපාදනයවෙමින් හඹායමින් සංස්කාරයන්හි ගැලෙමින්, නාමරූප ඇතිකරමින් පවත්වමින්, ඇදීයන්නේ ආශාකරනදේ රඳවාගත නොහැකිකමින් පහළවන දුක උරුමකර ගනිමිනි. දුකඋපදින්නේ එතැනමය.

දුක නැතිකළ හැක්කේ වෙනස් වෙනස්වන ස්වභාවයන් පිළිබඳව යථාස්වභාවය, හැඳින ඒවා සංස්කරණය නොකරමින්, නාමරූප නොපවත්වමින් උපාදානය නොවෙමින් එළැඹිසිහියෙන් යුතුව පැවතීම තුළින්ය.

ඒ පිළිබඳ යථාවබෝධයෙන් යුතුව සිහියපැවැත්වීම ඔස්සේ දුක ඇතිවීමේ මං අසුරාදැමීම-දුක්ඛනිරෝධගාමිනි පටිපදාව වෙයි.

## සංස්කාර

ආශ්වාසය ඇති තැන - ප්‍රශ්වාසය නැත.

ප්‍රශ්වාසය ඇති තැන - ආශ්වාසය නැත.

සතුට පවතින තැන - දුක නැත.

| | | |
|---|---|---|
| දුක පවතින තැන | - | සතුට නැත. |
| කෝපය පවතින තැන | - | ඉවසීම නැත. |
| ඉවසීම ඇති තැන | - | කෝපය නැත. |
| හඬ ඇති තැන | - | නිහඬතාවය නැත. |
| නිහඬතාවය ඇති තැන | - | හඬ නැත. |
| ඇත්තේ කොතැනද | - | නැතිකම නැත්තේය. |
| නැත්තේ කොතැනද | - | ඇතිබව නැත්තේය. |
| මෙතැන ඇතිවන විට | - | අතනකුත් ඇතිවෙයි. |
| අතනක් ඇතිවන විට | - | මෙතැනකුත් ඇතිවෙයි. |

මෙසේ බලනකළ මේ සියල්ලෙහි සංස්කාරික බව වැටෙහෙයි. සංඛතබව වැටහෙයි. මුළාවේ ස්වභාවය වැටහෙයි. එය ඇතොත්, මෙයද ඇතිවීම ස්වභාවයයි. එය ඇතිනොවූයේ නම් හෝ නොවන්නේ නම් මෙයද ඇතිනොවූයේවේ. නොවන්නේවේ. ඇතිකිරීම නැතිකිරීම තමා තුලින්ම සිදුවන්නක් මිස බාහිර කිසිවක් නොවේය.

තරඟවදින්නන් ජයග්‍රහණයට පත්වෙයි. පරාජයටද පත්වෙයි. ජයග්‍රහණයතුළ මාත්සය්‍යීය, උද්දාමය, ඇත. පරාජයතුළ ද්වේෂය, වෛරය ඇත.

මෙහි රූපය කවුරුන්වුවද පෙළෙන්නෝ වෙති. ආස්වාදයට පත්වූවෝවෙති. ආදිනවයලද්දෝ වෙති. නිස්සරණය සොයන්නෝ වෙති.

මේ සියල්ලෝම සංස්කාරයෝය. නාමරූපයෝය. සංඛතයෝය. අනිත්‍යයෝය. දුක්ඛයෝය. අනාත්මයෝය.

තරඟය නම්වූ සංස්කාරයෙහි නොගැලුන තැනැත්තේ, පරාජය නොදරන්නේය. ජයග්‍රහණය නොදරන්නේය. ආස්වාදයෙහි නොගැලෙන්නේය. ආදීනවයන් නොලබන්නේය. නිස්සරණය නොසොයන්නේය. ඇත්තේද නැත්තේය. නැත්තේද නැත්තේය.

## සිතුවිල්ල (හැඟීම)

සිතුවිල්ලක්ම මිස, සැබෑවක් නොවේ.

මුලාවක් පමණි. සිතුවිල්ල නිමවූයේ තවදුරටත් එය නොවන්නේය. සිතුවිල්ල ඇතිතාක් සිතුවිල්ලම පවත්තේය. සිතුවිල්ල නොමැතිකල එවැන්නක් පැවතිබවක් ද නොවන්නේය.

නැත්තේය... කිසිවක්ම නැත්තේය. සූන්‍යය.

චිත්තවිකාර

ධර්මතාවයන් (ස්වභාවයන්)

ධර්මතාවයන් (ස්වභාවයන්) - අනුවම පවතී

එවන් ස්වභාවයන් කෙරෙහි නාමරූපයන් ආරෝපණය කරමින්, ඇතිවන්නා වූ සිතිවිල්ලද සිතුවිල්ලකම මිස සැබෑවක් නොවේ.

එහෙයින්ම - වෙනස්වන්නා, වූ ස්වභාවයන් කෙරෙහි බැඳීම්ඇතිකර නොගතයුතුය. මායාවෙහි බැඳුනේ, මුලාවටම පවත්වන්නේය. දුකම විඳින්නේය.

ස්වභාවයේ, ස්වභාවයම වෙනස්වීමයි. ධර්මතාවයද එයමය. ස්වභාවය, ස්වභාවයලෙසින් ධර්මතාවයන්

පවතින්නට හරිනුම්ස ඒවා කෙරෙහි අනුගතවන්නට යෑමෙන් මතුවන සිතුවිල්ලම භවය ඇති කරන්නේය.

ඇතිවන්නාවූ එවන් සිතුවිලි භවයන් සමූහ ස්වභාවය සංසාරය වන්නේය. එකතැන කරකැවෙන ස්වභාවය සංසාරවට්ටය ලෙසින් වන්නේය.

ඉන් ගැලවීගත නොහැකිවනුයේ ජාති - ජරා මරණ දුක්ඛ, දෝමනස්ස, ශෝක, පරිදේව ධර්ම ස්වභාවයන්හි ගැලෙන්නේය.

ධර්මතාවයන් පවතිනුඇත. ඒවා නවතාලිය නොහැකිය. නොනවතින්නාවූ වෙනස්, වන්නාවූ ධර්මතාවයන් කෙරෙහි නාමරූපසංඥා උපදවමින් සිතුවිලි ඇතිකරමින් - අග, මුල සොයා ගැනීමට නොහැකිව වල්මත්වීමෙන් බැහැර වී ස්වභාවයේ ස්වභාවයන් හඳුනා ඒ කෙරෙහි සිතුවිලි නූපදවන්නේ මුලාවට හසුනොවන්නේය.

## චිත්තවිකාර

පිං කැමැත්තෝ - පන්සල් යන්නේය.

මිළදී ගැනීමට / විකිණීමට කැමැත්තෝ වෙළඳ පොලට යන්නේය.

මරණු කැමැත්තේ අවිය ගන්නේය.

නොමරණු කැමැත්තේ අවිය නොගන්නේය.

මේ කවරේවුවද චිත්තවිකාරයෝය. මරණ අවස්ථාවේ පහළවූ චිත්තවිකාරයට අනුව, ප්‍රතිසන්ධි (යළි ඉපදීමේ)

චිත්තවිකාරයෝම පවත්නේ ඒවායෙහිම ගැලෙන්නේය. එවැන්නෝ ධර්මතාවය නොදන්නෝය.

ධර්මතාවය - ධර්මය දන්නේ, චිත්තවිකාරයන් හා නොඇළැඹෙති. නොගැලෙති. නොසැලෙති. චිත්තවිකාරයෙන් වෙන්වූයේමවේ.

ක්ලේශයෝ යනු - චිත්තවිකාරයෝ ය.

කාමඅභිලාශයෝය.

විකාරයෝ - යනු - සැබෑ නොවූ එහෙත් සැබෑ ලෙසින් පවත්වා ගන්නා වූ - පිළිගන්නා වූ සංඛතයන්ය. මවාගැනීම්ය. මඤ්ඤනාවන්ය. සක්කායදිට්ඨීන්ය. වැරදිදැනීම්ය.

කෙලෙස් දුරුවනුයේ - දුරුවන්නේ චිත්තවිකාර යන්මය.

චිත්තවිකාරයන් ප්‍රහීණවනවිට - ප්‍රහීණවනුයේ සක්කායදිට්ඨීන්මය.

හුදකලාවම - සිත සුවපත්කරන්නේවේ. (සම්මාසතිය) නිවැරදිව සිහියපැවැත්වීම, හැර, අන්කවර ආකාරයකින් පැවතියේවුවද - පවතිනුයේ චිත්තවිකාරයන්මය.

## රහතන් වහන්සේලාගේ ස්වභාවය කුමක්ද?

දෘෂ්ඨි ප්‍රකල්පනය කරන්නේ නැහැ.

දෘෂ්ඨි ගෙනෙන්නේ නැහැ.

තනන්නේ නැහැ.

ඉදිරිපත් කරන්නේ නැහැ.

ලෝකයා පිළිගත් යම්යම් දෘෂ්ඨි ආදියෙහි ගැලෙන්නෙත් නැහැ. ඒවා පිලිගන්නෙත් නැහැ ශීලව්‍රත ආදියට ඇදිල යන්නේත් නැහැ.

ඒ ලෝකෝත්තර විමුක්තිසුවය ලැබුවාට පස්සේ ආපහු මනෝලෝකවල රජකරන්නේ නැහැ. සිතන්නට කිසිවක්ම නැහැ. හැමදෙයම නැවතිලා. නිරුද්ධයි.

"මහණෙනි, යම් කිසිවෙකු මේ සතර සතිපට්ඨානයන්හි යෙදෙමින් සතර සතිපට්ඨානය වඩන්නේනම්, ඔහුවිසින් අප්‍රකටව පවත්නාවූ ස්වභාවයන් හඳුනාගනිමින් වාසය කරනුයේ, අපේක්ෂිතාකාරයෙන්ම ධර්‍මය ප්‍රත්‍යක්ෂකොට මේ අත්භවයෙහිම රහත්බව හෝ කෙලෙසුන්ශේෂව තිබේනම් අනාගාමී බව හෝ මෙසේ මේ ඵලයන් අතුරෙන් කවරකු හෝ ලබන්නේය"

(මහා සතිපට්ඨාන සූත්‍රයෙන්)

මහණෙනි, මෙසේ මැනවින් පැහැදුන සිත් ඇති මහණුහට බොහෝකොට ඇස ප්‍රියකරන රූප, ඇස හමුවට එනනමුදු - ඔහුගේ සිත ඒවායින් යටහත් නොවන්නේය. ඔහුගේ සිත ස්ථිරවූයේ වෙයි. මැනවින් පිහිටියේ වෙයි. අරමුණු හා මුසුනොවන බැවින් නොසැලෙන්නේම වෙයි. ඒවායේ ක්ෂයවීම් ස්වභාවයද හෙතෙම දන්නේය. එහෙයින් ඒවායේ නිස්සරණත්වයම දකින්නේය. බලන්නේය.

කණ පිනවන බොහෝ ශබ්ද, නාසය පිනවන ගන්ධ, දිව පිනවන රස, කය පිනවන ස්පර්ශ, සිත පිනවන ධර්මතාව ඔහුගේ සිත (මනස) හමුවට එනමුත් ඒ කිසිවකට හෝ ඔහුගේ සිත යටත් නොවන්නේ ය. ඔහුගේ

සිත මැනවින් ස්ථිර වූයේ - අරමුණු හා නොමුහු වූයේ නොසැලෙන බවට පත් වූයේ වෙයි. ඇතිවන්නාවූ සියළු ස්වභාවයන්ගේ ක්ෂයවීම ඔහු දන්නේය. එහෙයින් ඒවායේ නිස්සරණත්ත්වයම දකින්නේය. බලන්නේය.

(සීලාශ්‍රපොම සූත්‍රය)

සම්මා සතිය ඇති වූයේ, තවත් කළ යුතු, කිව යුතු කිසිවක් නොමැති බව ප්‍රත්‍යක්ෂවන්නේය.

යළි ඉපදීමේ හේතුප්‍රත්‍යයන් සකස්වීමක් නැත්තේය. භව නිරෝධය වූයේ විය.

මරුවා පරාජයට පත්වූයේ විය.

තෝරාගනු ලබනුයේ - ඒ කෙරෙහිම බැඳෙන්නේය.

අල්ලාගනු ලබනුයේ - ඒ කෙරෙහිම යටත් වන්නේය.

## සිතුවිල්ල

සිතුවිල්ල, සිතුවිල්ලක්ම පමණි.

එය ඇති වූ ක්ෂණයෙහිම නැතිවී යයි.

පහළ වූ සිතුවිල්ල මෙනෙහි කිරීම හේතුවෙන් සිතුවිලි දහරාවක් ලෙසින් ඇදී යයි. භවය එතැනයි.

## රාගයෙන් මිදීම

මිනිසුන් කෙරෙහි නිත්‍යවූ කාමයෝ නැත. යම් කාමවස්තූන් කෙරෙහි බැඳුනු යම් කාමවස්තූන් කෙරෙහි ප්‍රමෝදය ඇතිකළ පුරුෂ තෙමේ මාරයාගෙන් ගැලවුන,

නැවත නොඑන්නා වූ නිවනට නොපැමිනෙන්නේ වේද, එබඳුවූ ඉෂ්ටාලම්බනයෝ මේ ලෝකයේ ඇත. පඤ්චස්කන්ධ (දුඃඛය) තෘෂ්ණාවෙහි ගැලීම කරණකොට හටගත්තේය. පඤ්චඋපාදානස්කන්ධ (දුඃඛය) තෘෂ්ණාවෙහි කරණකොට හටගත්තේය.

තෘෂ්ණාව දුරුකිරීමෙන් සියළු ස්කන්ධයෝ (දුඃඛය) දුරුකිරීමවේ. සියළු ස්කන්ධයන් දුරුකිරීමෙන් (දුඃඛය) සියළු සංසාර දුඃඛය දුරුකිරීමවේ.

ලෝකයෙහි විචිත්‍රවූ අපමණවත් රූපාදී අරමුණු ඇත්තේ ද? ඒවා කාමයෝ නොවෙති. සත්ත්වයා ශුභාශුභ - ආදී වශයෙන් සංකල්පනාවන් ලෙසින් ඇති කර ගන්නා රාගයම කාමයයි. එසේ වුවද, ප්‍රඥාවන්තයින් මේ ආරම්මණයන්හි ඡන්දරාගය නොපවත්වති. දුරුකෙරෙති.

එහෙයින්ම ඔව්හු දුඃඛයෙන් මිදුනේ, ගැලවුනේ වෙති. නිවෙති.

(න සන්තිකාම සූත්‍රය - සංයුක්ත නිකාය)

## නීවරණ ධර්මයෝ

සිත හාත්පසින්ම බැඳ තබන දුකින් මිදීමේ මඟ අහුරන ධර්මතාවයන්

කාමච්ඡන්ද : ගිජු කැමැත්ත - ඕනෑකම - තණ්හාව යනාදී වශයෙන් හඳුන්වනු ලැබේ. කවර හෝ ආකාරයේ විඳීමේ ආස්වාදය ලැබීමේ ඕනෑකමක් පහල වූ විට දැන් මා තුල කැමැත්තක් පහළ වී ඇත්තේ යැයි සිහියෙන්

දැක ගැනීමට ඔබ, සමත් විය යුතුය. මේ ඕනෑකම අනිත්‍ය බව මෙනෙහි කළ යුතුය. ඕනෑකම දුක ඇතිකර ලීමට හේතුවන බව මෙනෙහි කළ යුතුය. මේ ඕනෑකම සත්‍ය දෙයක් - සැබෑ දෙයක් නොවන, ක්ෂණයකින්ම වෙනස් වී නැති වී යන්නක් බව මෙනෙහි කළ යුතුය.

එසේම මෙනෙහි කිරීමෙන් හා අවබෝධයෙන් යුතුව තමන් තුල ඇති වූ කැමැත්තෙන් කාමච්ඡන්දයෙන් බැහැරවීමට ඔබ දක්ෂ විය යුතුය.

එසේම මෙනෙහි කිරීමෙන් හා අවබෝධයෙන් යුතුව තමන් තුල ඇති වූ කැමැත්තෙන් කාමච්ඡන්දයෙන් බැහැරවීමට ඔබ දක්ෂ විය යුතුය.

ව්‍යාපාද : බිය - කෝපය යනාදී වශයෙන් හඳුන්වනු ලැබේ.

කවර ආකාරයේ හෝ බියක් හෝ කෝපයක් ඇතිවන විට, දැන් මා තුල කෝපයක් ඇති වී තිබේ, බියක් ඇති වී යැ'යි සිහියෙන් දැකීමට ඔබ සමත් විය යුතුය.

මා තුළ ඇත්තා වූ තණ්හාව හේතුවෙන් එම තණ්හාවට හේතු ප්‍රත්‍ය වූ දෙය මා කෙරෙන් නැති වී යනු ඇතැ'යි යන හැඟීම

තුලින් බිය ඇතිවන බවත්, ආශා කරන දෙය නැතිවීමට නොදී රැක ගැනීමට යෑමේදී කෝපය ඇති වූ බවත් සිහියෙන් දැකිය යුතුය.

මේ ව්‍යාපාදය අනිත්‍ය බව මෙනෙහි කළ යුතුය. මේ ව්‍යාපාදය "දුක" ඇති කරවන්නක් බව මෙනෙහි කළ යුතුය. මේ ව්‍යාපාදය සැබෑ ස්වභාවයක් නොවන බව මෙනෙහි කළ යුතුය.

එසේ මෙනෙහි කිරීමෙන් හා අවබෝධයෙන් යුතුව තමන් තුළ පහල වූ ව්‍යාපාදයෙන් බැහැර වීමට ඔබ දක්ෂ විය යුතු ය.

ථීනමිද්ධය : අලසකම - පසුබෑම, නිරර්ථක, නිශ්ඵල සිතුවිලිවල ගැලීම - මනෝලෝකයන්හි නිමග්නවීම.

කුශලමය ක්‍රියාවන්හි නිරත වෙමින් සිටියදී දැන් මට වෙහෙසයි. අදට මේ ඇති පස්සෙ වෙලාවක මේක කරනවා වැනි හෝ එවන් ආකාරයේ හැගීම් පහළ වන විට දැන් මා තුල ථීනමිද්ධයක් පහළ වී ඇති බව සිහියෙන් දැකීමට ඔබ සමත් විය යුතුය. සම්පප්ප්‍රලාපයන්හි නොගැලිය යුතුය. අහස්මාලිගා නොතැනිය යුතුය.

මා තුළ ඇතිවන්නා වූ මේ අලසකම ම

පරිහානියට පත් කරවන්නක් බැව් සිහියෙන් දැකිය යුතුය.

මේ ථිනමිද්ධය අනිත්‍ය බව මෙනෙහි කළ යුතුය. මේ ව්‍යාපාදය "දුක" ඇති කරවන්නක් බව මෙනෙහි කළ යුතුය. මේ ථිනමිද්ධය සැබෑවක් නොවන බව මෙනෙහි කළ යුතුය.

එසේ මෙනෙහි කිරීමෙන් හා අවබෝධයෙන් යුතුව තමන් තුල පහළ වූ "ථිනමිද්ධ" යෙන් බැහැර වීමට ඔබ දක්ෂ විය යුතුය.

උද්දච්චකුක්කුච්ච : නොසන්සුන්කම - පසුතැවිල්ල වශයෙන් හඳුන්වනු ලැබේ.

කවර අවස්ථාවකදී හෝ ඔබ කලබලයට පත් වන්නේ නම් හෝ පසුතැවිල්ලට පත්වන්නේ නම්, දැන් මා තුල නොසන්සුන් කමක් ඇති වී තිබේයැ'යි සිහියෙන් දැකීමට ඔබ සමත් විය යුතුය. මේ නොසන්සුන්කම පසුතැවිලි ඇති කිරීමට හේතු ප්‍රත්‍යවන බව සිහියෙන් දැකීමට ඔබ සමත් විය. යුතුය.

මා තුළ ඇති වන්නා වූ මේ නොසන්සුන්කම පසුතැවිල්ලට හේතුවන බවත් මෙනෙහි කළ යුතුය. මේ උද්දච්ඡ කුක්කුච්ඡය අනිත්‍ය බව මෙනෙහි කළ යුතුය. "දුක" ඇති කරවන්නක් බව මෙනෙහි

කළ යුතුය. සැබෑ වූ දෙයක් නොවන බව මෙනෙහි කළ යුතුය.

එසේ මෙනෙහි කිරීමෙන් හා අවබෝධයෙන් යුතුව තමන් තුල පහළ වූ උද්ධච්ච කුක්කුච්ඡයෙන් බැහැර වීමට ඔබ දක්ෂ විය යුතුය.

විචිකිච්ඡා : කුතුහලය - සැකය වශයෙන් හඳුන්වනු ලැබේ.

කවර අවස්ථාවකදී හෝ ඔබ තුල කුතුහලයක් ඇති වූයේ නම්, දැන් මා තුල "කුතුහලයක්" ඇති වී තිබේ යැ'යි සිහියෙන් දැකීමට ඔබ සමත් විය යුතුය. ඔබ තුල " සැකයක්" ඇති වී තිබේ නම් දැන් මා තුළ සැකයක් ඇති වී තිබේ යැ'යි සිහියෙන් දැකීමට ඔබ සමත් විය යුතුය.


මා තුළ ඇති වූ මේ කුතුහලය සැකය අනර්ථකාරී එකක් බැව් මෙනෙහි කළ යුතුය. එය අනිත්‍ය බැව් මෙනෙහි කළ යුතුය. එය "දුක" ඇතිකරවන්නක් බැව් මෙනෙහි කළ යුතුය. එය සැබෑ වූ දෙයක් නොවන බව මෙනෙහි කළ යුතුය.


මෙසේ සිහියෙන් යුතුව සිටින ඔබ තුළ ඒ ඒ අවස්ථාවන්හි පහළ වන නීවරණ ධර්මයෙන් සිහියෙන් දකිමින් ඒවායේ නොගැලී ඉන් බැහැර වන විට ඇතිවන සුවය ඔබට එම මොහොතේදීම අත්විඳින්නට හැකි වන්නේය.


සත්ත්වයාගේ සිත පෙළනු ලබන්නේ මෙම ධර්මතාවයන් ගෙනි. එම ධර්මතාවයනට ගොදුරු නොවනුයේ නිදුක් වෙති. සුවපත් වෙති.


මේ වටහා නොගැනීම නිසා සත්ත්වයා දුකින් දුකට පත්වෙමින් කම්පා වෙති. මෙම ධර්මතාවයනට ගොදුරු වෙති. ඒවායේ ගැලී "දුක" විඳිති


# පටිච්ච සමුප්පාදය




අවිජ්ජා - අනිත්‍ය - දුක්ඛ - අනාත්ම - බව නොදැනීම.

සංඛාර - සැබෑ ස්වභාවය නොදන්නා නිසා - නිත්‍ය - සුඛ - අත්ම වශයෙන් සකස්කර ග්‍රහණයකර ගැනීම.

විඥාණ - ආස්වාදය විඳිමින්, ආදීනවයෙහි ගැලෙමින්, නිස්සරණය සෙවීම, කාම, භව, විභව තණ්හාවයන්හි ගැලීම. පූර්ව මතකයන්.

නාම-රූප- ධර්මතාවයන්ගේ ස්වභාවය නොදන්නාකමින්, ධර්මතාවයන් කෙරෙහි නාමයන් යොදමින්, රූපයන් ලෙස ගනිමින් ඇතිකර ගන්නා මුලාව.

සළායතන - අභ්‍යන්තර / බාහිර ආයතන

ඵස්ස - සුඛවේදනා - දුක්ඛවේදනා - අදුක්ඛමසුඛවේදනා

තණ්හා - කාමතණ්හා - භවතණ්හා - විභවතණ්හා


උපාදාන - ඇලීම - ගැලීම - නිරතවීම

භව - සකස්කිරීම - සැළසුම් කිරීම - එළඹීම

ජාති - ඉපදීම - ආරම්භ වීම - ක්‍රියාත්මක වීම

ජරාමරණ දුක්ඛ දෝමනස්සෝපායාස
විනාශය - හානිය - දුබල වීම - නැතිවීම - සියළු දුකෙහි ප්‍රමුඛවීමේ හේතුන් වීම.

# සංසාර වට්ටය




විඥාණය පහළවූයේ මනසිකාර (මෙනෙහි කිරීම්) හේතුවෙනි. මෙනෙහිකිරීම් ඇතිවූයේ චේතනා (සිත) පහළවූයේ සංඥා, වේදනා, ඵස්සයන් අනුවය, මුල වැරදුනේ චේතනාවයි. සිතයි. සිතුවිල්ලයි. මනසිකාරයයි. ඒවා අවසන්ය. ඇත්තේ ඒවා තවදුරටත් ඇති ලෙසකින් එක තැන කරකැවීමයි. (භ්‍රමණය, සුළිය) ආරම්භයවූ මනසිකාර වෙත විඥාණය එළැඹ ඇත.

චේතනාව වෙත එළැඹ එතැන සිට නිවැරදිකිරීම මිස විඥාණය දෙස බලා කළහැකි කිසිවක් නැත. එසේ විඥාණය දෙස බලමින් සිටින්නේ නම් සිදුවනුයේ තව තවත් දිය සුළියට හසුවීමක් පමණි.

අල්ලා සිටින්නේ මැදිනි, චේතනාවෙනි, (සිතෙහි) අත්හල යුත්තේ ද එතැනිනි, එවිට ගැටය ලිහී යන්නේය. සුළිය නවතින්නේය.

අල්ලා සිටින්නේ මැදිනි, චේතනාවෙනි, (සිතෙහි) අත්හල යුත්තේ ද එතැනිනි, එවිට ගැටය ලිහී යන්නේය. සුළිය නවතින්නේය.

වේදනා, සංඥා, සංස්කාර, විඥාණ

ඵස්ස, වේදනා, සංඥා, චේතනා, මනසිකාර. මේවා නම් වශයෙන් ගෙන හඳුන්වාදීමේදී එකිනෙකට අනුපිළිවෙලින් දක්වා ඇතිවූයේ වුවද, ස්වභාවයේ දී ඒවා ක්‍රියාත්මකවනුයේ එකක් පසු පස අනෙකා වශයෙන් අනුපිළිවෙලින් නොව, උද්ගතවන්නා වූ හේතූන් ප්‍රත්‍ය කරමින් පහළවන්නාහුම වෙති. මෙසේ පහළවන්නාවුන් වෙතින් වඩාත් ප්‍රකටවන ස්වභාවයම වඩා ක්ෂණිකව පෙරටුවන්නේ වේ. දකින්නේ වේ. දැනෙන්නේ වේ.

මනසිකාරය, රූප, වේදනා, සංඥා, සංස්කාර ඔස්සේ විඥානයේ දී යලි දකින්නේ මනසිකාර බැවින් යලි යලිත් රූප, වේදනා, සංඥා, සංස්කාර වශයෙන් එකම තැන වෘත්තයක් ලෙසින්, සුළියක් ලෙසින් භ්‍රමනය වන්නට වන්නේය. සංසාරවට්ටය වූයේ එතැනදීය. කවර සංඥාවක් වුවද සිතෙහිදී චේතනාව බවට පත්නොවී සංඥා ක්ෂණයෙහිදීම නතරවන්නේ නම් සුළියට මැදිවීම නතරවන්නේ වෙයි.

## සත්‍යාවබෝධය

සත්‍ය අවබෝධය ලැබීමේදී කාමඋපභොගයන් පමණක් නොව කාමඅභිලාශයන් ගෙන්ද වෙන්විය යුතුවන අතර ඉන් නොගැලවී සත්‍යාවබෝධය ලැබිය නොහැකි බව වටහාගත හැකි හොඳ උපමාවන් තුනක් මහසච්චක සූත්‍රයෙහි දී මෙසේ දැකිය හැකිය.

අග්ගිවෙසනය, කිසියම් මිනිසෙකු දියෙහි වැටී පෙඟුණ දණ්ඩක් ගෙන තවත් එවැනි දණ්ඩක ගටා ගිනි නිපදවීමට උත්සාහකරයි නම් එවන් උත්සාහයක් සාර්ථකවිය හැකිද?

භවත් ගෞතමයිනි, එවන් දඬු ගැටීමකින් ගිනි නිපදවිය නොහැක්කේමය. ඒ ඒවා පෙඟී ඇති බැවිනි. එවන් දඬු ගැටීමකින් ගිනි නිපදවීමට කිසිවෙකු උත්සාහ දරන්නේ නම්, එම උත්සාහය නිරර්ථකවනු ඇත. ඉතිරි වනුයේ වෙහෙස පමණි.

අග්ගිවෙසනය, එලෙසින් කිසියම් ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ සිත හා කය කාමෝපභෝගයන් කෙරෙහි ඇලී පවතීද? ඔහුගේ කාමඅභිලාෂයන් ශාන්ත නොවූයේද? එබඳු පුද්ගලයා කෙතරම් වෙහෙස ගත්තත් ඔහුට ඥානදෘෂ්ඨිය හා ලෝකෝත්තර සම්බෝධිය ලබාගත නොහැකිවනු ඇත.

අග්ගිවෙසනය, මට වෙනත් උපමාවක් සිහියට නැගෙයි. ජලයේ නොගැවුනු එහෙත් තෙමුන දණ්ඩක් ගෙන, එය අනෙක් දණ්ඩක ගටා ගිනි නිපදවීමට කිසියම්

මිනිසෙකු ප්‍රයත්න දරයි නම් ඔහුට ගිනි නිපදවිය හැකිවේද?

භවත් ගෞතමයිනි, නැත, ඔහුගේ ඒ ප්‍රයත්නය ව්‍යර්ථව වෙහෙස පමණක්ම ඉතිරිවනු ඇත. මක්නිසාදයත් ඒ දණ්ඩ තෙමුණ එකක් හෙයිනි.

අග්ගිවෙසනය එලෙසින් කාමෝපභෝගයන් දුරුකොට, සිත, කය එහි නොඇලවා වසන ශ්‍රමණයාගේ හෝ බ්‍රාහ්මණයාගේ කාමාභිලාෂයන් සංසිඳී නැත්නම්, ඔහු කොතෙක් වෙහෙස වින්දත් ඔහුට ඥානදෘෂ්ඨිය මෙන්ම ලෝකෝත්ත්තර සම්බෝධිය නොලැබෙනු ඇත.

අග්ගිවෙසනය, මට තෙවන උපමාවක් ද සිහිවෙයි. කිසිවෙක් ජලයෙහි නොතැවුරුණු නොපෙගුණ දණ්ඩක් ගෙන එය තවත් දණ්ඩක ගටා ගිනි ඉපිදවීමට උත්සාහ කරන්නේ නම් ඔහුගේ එම උත්සාහය සාර්ථක වියහැක්කේද? නොවේද?

භවත් ගෞතමයිනි, එසේය. ඔහුට ගිනි නිපදවීමට හැකිවන්නේමය. ඒ එම දඬු දියෙහි නොගැටුන, මුළුමනින්ම වියළි ඒවා බැවිනි.

අග්ගිවෙසනය, එලෙසින් කිසියම් ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ, සිත හා කය කාමෝපභෝග යන් ගෙන් දුරුව පවතීද, එසේම ඔහුගේ කාමාභිලාෂයන් සහමුලින්ම විනාශවී ගියේවේද, ඔහු සිරුරට මහත් දුක් නොදුන්නේ වුවද, ඔහුට ඥානදෘෂ්ඨිය හා ලෝකෝත්තර සම්බෝධිය ලබාගත හැකිවේමය.

(මහා සච්චක සූත්‍රය)

කාමඋපභෝගයන් පමණක්නොව කාමඅභිලාෂයයන්ද සිතින් දුරුවනතෙක් සත්‍යාවබෝධය ඥානදර්ශනය නොලැබෙන බැව් මෙම උපමා තුනින් මොනවට පැහැදිලිවන්නේය.

## අත්තකිලමතානුයෝගයේ නිරර්ථක බව

අග්ගිවෙසෙනය, මට මෙසේ සිතුණි, යටගිය දවස මහණකෙනෙක් වේවයි, බමුණුකෙනෙක් වේවයි, උපක්‍රමිකවූ තියුණු, කටුක දුක් වේදනාවන් වින්දාහුද, ඒ වේදනාවෝද, මා වින්ද දුක්ඛයෝමය. පරම දුක්ඛයෝමය. මෙයින් වැඩිවූයේ නොවේ.

මතු අනාගතයේදී මහණකෙනෙක් හෝ බමුණුකෙනෙක් වේව'යි. කවරෙකු හෝ සසර නැසීමේදී උපක්‍රම වශයෙන් තියුණුවූ කටුකවූ දුක්වේදනා විඳිත්ද? ඒ වේදනාවට හේතුකාරකයෝ එයම වෙයි. පරම දුකම වෙයි. මෙයින් වැඩිවන්නේද නොවේ.

අද දවසේවුවද මහණකෙනෙක් හෝ බමුණුකෙනෙක් දුකින් ගැලවීමේ උපක්‍රමයන් වශයෙන් තියුණු වූ, කටුක දුක්වේදනාවන් අනුභව කරත්ද? විඳිත්ද? ඒ වේදනාවනටද හේතුකාරකයෝ ඒවාමය. එයම පරම දුක වෙයි. මෙයින් වැඩියෙන් නොවෙයි.

මෙවන් දුෂ්කර ක්‍රියාවෙන් මිනිස් දහමෙහි උතුම් ආර්‍ය්‍ය බව අවබෝධ කරන්නට, ලොව්තුරු මාර්ග අවබෝධ කරන්නට නොහැකි බවත්, සම්බෝධිය අවබෝධ කිරීම පිණිස වෙනත්මගක් තිබියහැකි බවත් සිතුවෙමි.

(මහා සච්චක සූත්‍රයෙනි)

## ලෝකායත

භවත් ගෞතමයෙනි, කිම, සියල්ල ඇත්තේද?

බමුණ, සියල්ල ඇත්තේය. යන මෙය පළමුවන ලෝකායතයයි.

භවත් ගෞතමයෙනි, සියල්ල නැත්තේ ද?

බමුණ, සියල්ල නැත්තේය. යන මෙය දෙවැනි ලෝකායතයයි.

භවත් ගෞතමයෙනි, කිම සියල්ල එක් ස්වභාව නැත්තේ ද?

බමුණ, සියල්ල එක් ස්වභාව නැත්තේය යන මෙය තෙවැනි ලෝකායතයයි.

භවත් ගෞතමයෙනි, කිම, සියල්ල නානාස්වභාව ඇත්තේ ද?

බමුණ, සියල්ල නානාස්වභාව ඇත්තේය. යන මෙය සිවුවැනි ලෝකායත යයි.

බමුණ, ඒ මේ අන්තදෙකට නොපැමිණ, තථාගත තෙමේ අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති, සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥාණයවේ. මෙසේ මේ හුදු දුක් රැසේ හටගැනීමවේ. අවිද්‍යාවේම නිරවශේෂ විරාග නිරෝධයෙන්, සංස්කාර නිරෝධයවේ. සංස්කාර නිරෝධයෙන්, විඥාණය නිරෝධයවේ. මෙසේ මේහුදු දුක්රැසේ නිරෝධයවේ යයි. මැදුම් පිළිවෙතින් දහම් දෙසයි.

මෙසේ වදාලකල්හි ලෝකායතික බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට, භවත් ගෞතමයෙනි, ඉතා මැනව,

මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයෙකුකොට දරන සේක්වා'යි මෙය සැළකෙළේය.

(ලෝකායත සූත්‍රයෙන්)

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාහට කිම, කුමක් ඇතිකල්හි කිමෙක්වේද, කුමක් ඉපදීමෙන් කිමෙක් උපදීද, කුමක් ඇතිකල්හි සංස්කාරයෝ වෙත් ද, කුමක් ඇතිකල්හි විඥාණයවේද, කුමක් ඇතිකල්හි නාමරූපවේද, කුමක් ඇතිකල්හි ෂඩායතනවේද, කුමක් ඇතිකල්හි ස්පර්ශයවේද, කුමක් ඇතිකල්හි වේදනාවවේද, කුමක් ඇතිකල්හි තෘෂ්ණාවවේද, කුමක් ඇතිකල්හි උපාදානවේද, කුමක් ඇතිකල්හි භවයවේද, කුමක් ඇතිකල්හි ජාතියවේද, කුමක් ඇතිකල්හි ජරාමරණවේදැ'යි මෙබඳු සිතෙක් නොවේ.

එසේ වුවද මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකහට මෙය ඇතිකල්හි මේ වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදී. අවිද්‍යාව ඇතිකල්හි සංස්කාරයෝ වෙති. සංස්කාර ඇතිකල්හි විඥාණයවේ. විඥාණය ඇතිකල්හි නාමරූපවේ. ජාතිය ඇතිකල්හි ජරාමරණ වෙයි. යන මෙහිලා පරප්‍රත්‍යයරහිත (අනුන්ගේ පිහිටක් නැතිව) දැනීම වෙයි. හෙතෙම මේ ලෝකය මෙලෙසින් උපදීයයි මෙසේ දැනගනී.

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාහට කිම, කුමක් නැතිකල්හි කිමෙක් නොවේ ද, කුමක් නිරුද්ධවීමෙන් කිමෙක් නිරුද්ධවේද, කුමක් නැතිකල්හි සංස්කාරයෝ නොවෙද්ද, කුමක් නැතිකල්හි විඥාණය නොවේද, කුමක් නැතිකල්හි නාමරූප නොවේද, කුමක් නැතිකල්හි

ෂඩායතන නොවේද, කුමක් නැතිකල්හි ස්පර්ශය නොවේද, කුමක් නැතිකල්හි වේදනාව නොවේද, කුමක් නැතිකල්හි තෘෂ්ණාව නොවේද, කුමක් නැතිකල්හි උපාදාන නොවේද, කුමක් නැතිකල්හි භවය නොවේද, කුමක් නැතිකල්හි ජාතිය නොවේද, කුමක් නැතිකල්හි ජරාමරණ නොවේදැ'යි මෙබඳු සිතෙක් නොවෙයි.

එසේ වුවද මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාහට මෙය නැතිකල්හි මෙය නොවෙයි. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධවේ. අවිද්‍යාව නැතිකල්හි සංස්කාරයෝ නොවෙති. සංස්කාර නැතිකල්හි විඥාණය නොවේ. විඥාණය නැතිකල්හි නාමරූප නොවේ. නාමරූප නැතිකල්හි ෂඩායතන නොවේ. ස්පර්ශය නොවේ. වේදනාව නොවේ. තෘෂ්ණාව නොවේ. උපාදාන නොවේ. භවය නොවේ. ජාතිය නොවේ. ජාතිය නැතිකල්හි ජරාමරණ නොවේ'යි යන මෙහිලා පරප්‍රත්‍යය රහිතවම දැනීම වෙයි. හෙතෙමේ මේ ලෝකය මෙසේ නිරුද්ධ වේ යැ'යි මෙසේ දැනගනී.

මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෙසේ ලෝකයේ හටගැනීමත්, නැතිවීමත්, තතුසේ දැනගනී ද, මහණෙනි, මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ දිට්ඨිසම්පන්න ය'යි ද, අමාදොරට හැපි සිටීය'යිද කියනු ලැබේ.

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාහට කිම, කුමක් ඇතිකල්හි කිමෙක්වේද, කුමක් ඉපදීමෙන් කිමෙක් උපදීද, කුමක්ඇති කල්හි සංස්කාරයෝ වෙත් ද, කුමක් ඇතිකල්හි විඥාණයවේද, කුමක් ඇතිකල්හි නාමරූපවේද, කුමක්

ඇතිකල්හි ෂඩායතනවේද, කුමක් ඇතිකල්හි ස්පර්ශයවේද, කුමක් ඇතිකල්හි වේදනාවවේද, කුමක් ඇතිකල්හි තෘෂ්ණාවවේද, කුමක් ඇතිකල්හි උපාදානවේද, කුමක් ඇතිකල්හි භවයවේද, කුමක් ඇතිකල්හි ජාතියවේද, කුමක් ඇතිකල්හි ජරාමරණවේදැ'යි මෙබඳු සිතෙක් නොවේ.

එසේවුවද මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාට මෙය ඇතිකල්හි මෙයවේ. මෙය ඉපදීමෙන් මෙය උපදී. අවිද්‍යාව ඇතිකල්හි සංස්කාරයෝ වෙති. සංස්කාර ඇතිකල්හි විඥාණයවේ. විඥාණය ඇතිකල්හි නාමරූපවේ. නාමරූප ඇතිකල්හි ෂඩායතනවේ. ෂඩායතන ඇතිකල්හි ස්පර්ශයවේ. ස්පර්ශය ඇතිකල්හි වේදනාවවේ. වේදනාව ඇතිකල්හි තෘෂ්ණාවවේ. තෘෂ්ණාව ඇතිකල්හි උපාදානයවේ. උපාදානය ඇතිකල්හි භවයවේ. භවය ඇතිකල්හි ජාතියවේ. ජාතිය ඇතිකල්හි ජරාමරණ වෙයි. යන මෙහිලා පරප්‍රත්‍යය රහිතවම දැනීම වෙයි. හෙතෙමේ මේ ලෝකය මෙලෙසින් හටගනී. ය'යි මෙසේ දැනගනී.

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාහට කිමෙක්ද, කුමක් නැතිකල්හි කිමෙක් නොවේ ද, කුමක් නිරුද්ධවීමෙන්, කිමෙක් නිරුද්ධවේද, කුමක් නැතිකල්හි සංස්කාරයෝ නොවෙත්ද, කුමක් නැතිකල්හි විඥාණය නොවේද, කුමක් නැතිකල්හි ජරාමරණනොවේදැ'යි මෙබඳු සිතෙක් නොවේ.

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාහට මෙය නැති කල්හි මෙය නොවේ. මෙය නිරුද්ධවීමෙන්, මෙය නිරුද්ධ වේ. අවිද්‍යාව නැතිකල්හි සංස්කාරයෝ නොවෙත්, සංස්කාර නැතිකල්හි විඥාණය නොවේ. විඥාණය

නැතිකල්හි නාමරූප නොවේ. ජාතිය නැතිකල්හි ජරාමරණ නොවේයැ'යි යන මෙහිලා පරප්‍රත්‍යය රහිතවම දැනීමවෙයි. හෙතෙමේ මේ ලෝකය මෙලෙසින් නිරුද්ධවේයැ'යි මෙසේ දැනගනී.

මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෙසේ ලෝකයේ හටගැනීමත්, නැතිවීමත් තතුසේ දැනගනීද, මහණෙනි, මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ දෘෂ්ටිසම්පන්නය'යි ද, දර්ශන සම්පන්න ය'යි ද, මේ සද්ධර්මයට පැමිණියේ ය'යි ද, මේ සද්ධර්මය දකී ය'යි ද, ශෛක්ෂඥානයෙන් සමන්නාගත ය'යි ද, ශෛක්ෂවිද්‍යාවෙන් සමන්වාගත ය'යි ද, ධර්මස්‍රොතසට පැමිණියේ ය'යි ආර්‍ය්‍ය වූ නිර්වෙධික ප්‍රඥාඇත්තේය'යිද, අමාදොරට හැපී සිටිය'යිද කියනු ලැබේ.

(අරියශ්‍රාවක සූත්‍රයෙනි)

## දුක්ඛය

මහණෙනි, මෙහි මහණ තෙමේ පිරික්සන්නේ නන් වැදෑරුම්, නන්අයුරු දුක් වූ යම් මේ ජරාමරණ ලෝකයෙහි උපදීද, මේ දුක කිමෙක් නිදානකොට ඇත්තේද, කුමක් සමුදයකොට ඇත්තේද, කිමෙක් ජාතිකොට ඇත්තේද, කුමක් භවකොට ඇත්තේද, කුමක් ඇතිකල්හි ජරාමරණ වේද, කුමක් නැතිකල්හි ජරාමරණ නොවේ දැ'යි පිරික්සයි.

හෙතෙමේ පිරික්සන්නේ, නන්වැදෑරුම්, නන්අයුරු දුක් වූ යම් මේ ජරාමරණ ලෙව්හි උපදී ද, මේ දුක ජාතිය නිදානකොට ඇත්තේය. ජාතිය, ජාතිකොට ඇත්තේය. ජාතිය ප්‍රභවකොට ඇත්තේය. ජාතිය ඇතිකල්හි ජරාමරණ

වෙයි. ජාතිය නැතිකල්හි ජරාමරණ නොවේය'යි මෙසේ දැනගනී.

හෙතෙමේ ජරාමරණයත් දැනගනී. ජරාමරණ සමුදයයත් දැනගනී. ජරාමරණ නිරෝධයත් දැනගනී. ජරාමරණ නිරෝධයට සරුප්ව යනසුලු යම් ප්‍රතිපදාවක් වේ නම් එයද දැනගනී. එසේ පිළිපන්නේ නිවනට අනුකූල වූ පිළිවෙතෙහි හැසිරෙන්නේ ද වෙයි.

මහණෙනි, මේ මහණ තෙමේ හැමඅයුරින්, මැනවින් දුක ක්ෂයකිරීම පිණිස, ජරාමරණ නිරෝධය පිණිස, පිළිපන්නේ වේය'යි කියනු ලැබේ.

යලි මතුද පිරික්සන්නේ මේ ජාතිය කුමක් නිදානකොට ඇත්තේද, කිමෙක් සමුදයකොට ඇත්තේද, කුමක් ජාතිකොට ඇත්තේද, කුමක් ප්‍රභවකොට ඇත්තේද, කුමක් ඇතිකල්හි ජාතිය වේද, කුමක් නැතිකල්හි ජාතිය නොවේ දැ'යි පිරික්සයි.

හෙතෙමේ පිරික්සන්නේ, ජාතිය භවය නිදානකොට ඇත්තේය. භවය සමුදයකොට ඇත්තේය. භවය ජාතිකොට ඇත්තේ ය. භවය ප්‍රභවකොට ඇත්තේය. භවය ඇතිකල්හි ජාතිය වේ. භවය නැතිකල්හි ජාතිය නොවේය'යි මෙසේ දැනගනී.

හෙතෙමේ ජාතියත් දැනගනී. ජාතිසමුදයත් දැනගනී. ජාති නිරෝධයත් දැනගනී. ජාති නිරෝධයට සරුප්ව යන සුලු යම් ප්‍රතිපදාවක් වේනම් එයත් දැනගනී. එසේ පිළිපන්නේ නිවනට අනුකූල පිළිවෙතෙහි හැසිරෙන්නේදවේ.

මහණෙනි, මේ මහණ තෙමේ හැම අයුරින් මැනවින් දුක් ගෙවීම පිණිස, ජාති නිරෝධය පිණිස, පිළිපන්නේ වේය'යි කියනු ලැබේ.

යළි මතු ද පිරික්සන්නේ, මේ භවය වනාහි කිමෙක් නිදානකොට ඇත්තේ ද, කුමක් සමුදයකොට ඇත්තේද, කිමෙක් ජාතිකොට ඇත්තේද කුමක් ප්‍රභවකොට ඇත්තේද කුමක් ඇතිකල්හි භවය වේද කුමක් නැතිකල්හි භවය නොවේදැ'යි පිරික්සයි.

හෙතෙමේ පිරික්සන්නේ, භවය උපාදාන නිදානකොට ඇත්තේය. උපාදාන සමුදයකොට ඇත්තේය. උපාදාන ජාතිකොට ඇත්තේය. උපාදාන ප්‍රභවකොට ඇත්තේය. උපාදාන ඇතිකල්හි භවය වේ. උපාදාන නැතිකල්හි භවය නොවේ ය'යි මෙසේ දැනගනී,

හෙතෙමේ භවයත් දැනගනී. භව සමුදයත් දැනගනී. භව නිරෝධයත් දැනගනී. භව නිරෝධයට හරස්ව යන සුළු යම් ප්‍රතිපදාවක් වේනම්, එයත් දැනගනී. එසේ පිළිපන්නේ නිවනට අනුකූල පිළිවෙතෙහි පිළිපන්නේදවේ.

මහණෙනි, මේ මහණ තෙමේ හැම අයුරින් මැනවින් දුක ක්ෂයකිරීම පිණිස භවනිරෝධය පිණිස පිළිපන්නේ වේය'යි කියනු ලැබේ.

යළි මතු ද පිරික්සන්නේ මේ උපාදාන කුමක් නිදානකොට ඇත්තේද, මේ තෘෂ්ණාව කුමක් නිදානකොට ඇත්තේ ද මේ ස්පර්ශය කුමක් නිදානකොට ඇත්තේද, මේ වේදනාව කුමක් නිදානකොට ඇත්තේද, මේ ස්පර්ශය කුමක් නිදානකොට ඇත්තේද, මේ ෂඩායතන

කුමක් නිදානකොට ඇත්තේද, මේ නාමරූප කුමක් නිදානකොට ඇත්තේද, මේ විඥාණය කුමක් නිදානකොට ඇත්තේද, මේ සංස්කාරයෝ කිමෙක් නිදානකොට ඇත්තාහුද, කුමක් සමුදයකොට ඇත්තාහුද, කිමෙක් ජාතිකොට ඇත්තාහුද, කුමක් ප්‍රභවකොට ඇත්තාහුද, කුමක් ඇතිකල්හි සංස්කාරයෝ වෙත්ද, කුමක් නැතිකල්හි සංස්කාරයෝ නොවෙත්දැ'යි පිරික්සයි. හෙතෙම පිරික්සන්නේ සංස්කාරයෝ අවිද්‍යාව නිධානකොට ඇතියහ. අවිද්‍යාව සමුදයකොට ඇතියන අවිද්‍යාව ජාතිකොට ඇතියහ. අවිද්‍යාව ප්‍රභවකොට ඇතියහ. අවිද්‍යාව ඇතිකල්හි සංස්කාරයෝ වෙත්. අවිද්‍යාව නැතිකල්හි සංස්කාරයෝ නොවෙත්ය'යි මෙසේ දැනගනී. හෙතෙමේ සංස්කාරයනුත් දැනගනී. සංස්කාර සමුදයයත් දැනගනී. සංස්කාර නිරෝධයත් දැනගනී. සංස්කාර නිරෝධයට හරස්ව යනසුලු යම් ප්‍රතිපදාවක් වේනම් එයත් දැනගනී. එසේ පිළිපන්නේ නිවනට අනුකූල පිළිවෙතෙහි හැසිරෙන්නේ ද වේ.

මහණෙනි, මේ මහණ තෙමේ හැමලෙසින් මැනවින් දුක්ගෙවීම පිණිස, සංස්කාර නිරෝධය පිණිස පිළිපන්නේවේය'යි කියනු ලැබේ.

මහණෙනි, අවිද්‍යාවෙන් යුක්ත මේ පුද්ගල තෙමේ ඉඳින් කුශල සංස්කාර රැස්කෙරේ නම්, සිත කුශල සහගතවේ. ඉඳින් අකුශල සංස්කාර රැස්කෙරේ නම් සිත අකුශල සහගතවේ. ඉඳින් අකුශල අරූපාවචර කුශල සංස්කාර රැස්කරන්නේ නම් සිත රූපාවචර කුශල සහගත වේ.

මහණෙනි, යම් කලෙක පටන් මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණවූවා වේද, (එකල අහින් මාර්ග) විද්‍යාව උපන්නී වෙයි. හෙතෙමේ අවිද්‍යාව තොරවීමෙන් මාර්ග ඥානසංඛයාත විද්‍යාව ඉපදීමෙන්, කුශල සංස්කාර නොම රැස්කෙරෙයි. අකුශල සංස්කාර නොම රැස්කෙරෙයි. අරූපාවචර කුශල සංස්කාර නොම රැස්කෙරෙයි. කර්ම රැස්නොකරන්නේ සිත නොමෙහෙයවන්නේ ලෝකයෙහි කිසිවක් (තෘෂ්ණාදියෙන්) උපාදානය නොකරයි. උපාදානය නොකරන්නේ (තණ්හා පරිතස්සනා භය පරිතස්සනා වශයෙන්) තැති නොගනී. තැති නොගන්නේ තෙමේම පිරිනිවේ. ජාතිය ක්ෂයවූවාය. බඹසරවැස නිමවනලදී. කටයුතු කරණලදී. මේ රහත්බැව් පිණිස අනෙකක් නැතැ'යි දැනගනී.

හෙතෙමේ ඉදින් සුඛ වේදනාවක් විඳිනම් එය අනිත්‍යය'යි දැනගනී. තෘෂ්ණාවෙන් නොබැසගන්නා ලදැ'යි දැනගනී. අභිනන්දන විසින් නොපිළිගන්නා ලදැ'යි දැනගනී. ඉදින් දුක් වේදනාවක් විඳිනම් එය අනිත්‍ය යැ'යි දැනගනී. තෘෂ්ණාවෙන් නොබැසගන්නා ලදැයි දැනගනී. නොපිළිගන්නාලදැ'යි දැනගනී. ඉදින් නොදුක් නොසුව වේදනාවක් විඳීනම් එය අනිත්‍යය'යි දැනගනී. නොබැසගන්නාලදැ'යි දැනගනී. නොපිළිග-න්නා ලදැ'යි දැන ගනී.

හෙතෙමේ ඉදින් සුඛ වේදනාවක් විඳිනම් නොබැඳුනේ ඒ වේදනාව විඳී. ඉදින් දුක් වේදනාවක් විඳීනම් නොබැඳුනේ ඒ වේදනාව විඳී. ඉදින් මැදහත් වේදනාවක් විඳිනම් නොබැඳුනේ ඒ වේදනාව විඳී.

හෙතෙමේ කය හිමිකොට ඇති (පඤ්චද්වාරික) වේදනාව විඳින්නේ කය හිමිකොට ඇති වේදනාව විඳිමි'යි දැනගනී. දිවි හිමිකොට ඇති (මනෝද්වාරික) වේදනාව විඳින්නේ දිවි හිමිකොට ඇති වේදනාව විඳිමි'යි දැනගනී. කය බිඳීමෙන් දිවි කෙළවර වන්නට පෙරාතුව මෙලෙවීහිදීම සියලු වේදනාවෝ නොපිළිගන්නා ලද්දාහු, සිහිල්වන්නාහු නොපවත්නා ස්වභාව ඇත්තාහුය. ධාතු ශරීරයෝ ශේෂවන්නාහ'යි දැනගනී.

මහණෙනි, යම්සේ පුරුෂයෙක් උණුසුම් කළයක් කුඹල් උඳුනෙන් ගෙන සමබිමෙක තබාද, එහි යම් ඒ උණුසුමක්වේද, එය එහිම සංසිඳෙන්නේය. කළය ශේෂ වන්නේය. මහණෙනි, එපරිද්දෙන්ම මහණ තෙමේ කය හිමිකොට ඇති වේදනාව විඳින්නේ කය හිමිකොට ඇති වේදනාව විඳිමි'යි. දිවි හිමිකොට ඇති වේදනාව විඳින්නේ දිවි හිමිකොට ඇති වේදනාව විඳිමි'යි දැනගනී. කය බිඳීමෙන් දිවි කෙළවරවීමට පෙරාතුව මෙලෙව්හිදීම සියලුම වේදනාවෝ නොපිළිගන්නා ලද්දාහු සිහිල් වන්නාහ. ධාතු ශරීරයෝ ශේෂවන්නාහ'යි දැනගනී.

මහණෙනි, ඒ කුමක්දැ'යි සිතන්නේද? රහත් මහණ තෙමේ කුශල සංස්කාර හෝ රැස්කරන්නේද? අකුශල සංස්කාර හෝ රැස්කරන්නේද? අරූපාවචර සංස්කාර හෝ රැස්කරන්නේද?

වහන්ස, මෙය නොවේමය.

හැමඅයුරින් සංස්කාර නැතිකල්හි සංස්කාර නිරෝධයෙන් විඥාණයෙක් පැනනගින්නේද?

වහන්ස, මෙය නොවේමය.

සර්වප්‍රකාරයෙන් විඥාණය නැතිකල්හි විඥාණ නිරෝධයෙන් නාමරූප පැනනගින්නේද?

වහන්ස, මෙය නොවේමය.

සර්වප්‍රකාරයෙන් නාමරූප නැතිකල්හි නාමරූප නිරෝධයෙන් ෂඩායතන පැනනගින්නේද?

වහන්ස, මෙය නොවේමය.

නිරවශේෂයෙන්ම ස්පර්ශය නැතිකල්හි ස්පර්ශ නිරෝධයෙන් වේදනාව පැනනගින්නේද?

වහන්ස, මෙය නොවේමය.

නිරවශේෂයෙන්ම වේදනාව නැතිකල්හි වේදනා නිරෝධයෙන් තෘෂ්ණාව පැනනගින්නේ ද?

වහන්ස, මෙය නොවේමය.

නිරවශේෂයෙන්ම තෘෂ්ණාව නැතිකල්හි තෘෂ්ණා නිරෝධයෙන් තණ්හාව පැනනගින්නේද?

වහන්ස, මෙය නොවේමය.

නිරවශේෂයෙන්ම උපාදාන නැතිකල්හි උපාදාන නිරෝධයෙන් භවය පැනනගින්නේද?

වහන්ස, මෙය නොවේමය.

නිරවශේෂයෙන්ම භවය නැතිකල්හි භව නිරෝධයෙන් ජාතිය පැනනගින්නේද?

වහන්ස, මෙය නොවේමය.

නිරවශේෂයෙන්ම ජාතිය නැතිකල්හි ජාති නිරෝධයෙන් ජරාමරණ පැනනගින්නේද?

වහන්ස, මෙය නොවේමය.

මහණෙනි, මැනවි, මැනවි, මහණෙනි, මෙසේමය. මෙය අන් අයුරකින් නොවේ. මහණෙනි, මෙය මෙසේ ම යයි අදහවු, නිශ්චයට පැමිණෙවු,මෙහි සැක නැත්තෝ, පහවූ විචිකිච්ඡා ඇත්තෝ වවු. මෙයට දුක් කෙළවර නිවන වේ.

(පරිවීමංශ සූත්‍රයෙනි)

මහණෙනි, උපාදානයන්ට ප්‍රත්‍යයවූ ධර්මයන් විෂයෙහි ආස්වාදය අනුව බලමින්, වෙසෙන්නහුගේ තෘෂ්ණාව වෙසෙසින් වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වේ. උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ. භවප්‍රත්‍යයෙන් ජාතිය වේ. ජාති ප්‍රත්‍යයෙන්, ජරාමරණ, සෝකපරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ හටගනිත්. මෙසේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

මහණෙනි, යම්සේ දරගැල් දසයක හෝ දරගැල් විස්සෙක හෝ දරගැල් තිසෙක හෝ දරගැල් සාළිසෙක හෝ මහා ගිනිකඳක් යම්සේ දිලෙන්නේ ද, පුරුෂයෙක් කලින්කල වියලිතණත් එහි නොලන්නේ ද, වියලිගෙ ාමත් එහි නොලන්නේද, වියලිදරත් එහි නොලන්නේ ද, මහණෙනි, මෙසේ ඒ මහ ගිනිකඳ පළමු දර දැවීමෙනුත් අනෙක් දර නොලැබීමෙනුත් ප්‍රත්‍යය රහිතවූයේ නිවෙන්නේය.

මහණෙනි, එසෙයින්ම උපාදානීය ධර්මයන්හි දෝෂය නැවත නැවත දක්නාසුලුව වෙසෙන්නාහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධයවේ. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධයවේ.

(උපදාන සූත්‍රයෙනි)

## සංයෝජන

මහණෙනි, සංයෝජනයන්ට ප්‍රත්‍යයවූ ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නා සුලුව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානවේ. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීමවේ.

මහණෙනි, යම්සේ තෙලත් නිසා, වැටියත් නිසා, තෙල්පහනෙක් දැල්වෙන්නේද, පුරුෂයෙක් කලින් කල එහි තෙල් බහන්නේ ද, වැටිය සකස්කරන්නේද, මහණෙනි, මෙසේ ඒ තෙල් පහන, ඒ ආහාර ඇත්තේ ඒ උපාදාන ඇත්තේ, බොහෝ දිගුකලක් දිලෙන්නේ ය.

මහණෙනි, එසෙයින්ම සංයෝජනීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලුව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානවේ. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

මහණෙනි, සංයෝජනීය ධර්මයන්හි දෝෂය නැවත නැවත දක්නාසුලුව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධයවේ. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, යම් සේ තෙලත් නිසා, වැටියත් නිසා, තෙල් පහනෙක් දැල්වෙන්නේ ද, පුරුෂ තෙමේ කලින් කල එහි තෙල් නොබහන්නේ ද, වැටියත් සකස් නොකරන්නේ ද, මහණෙනි, මෙසේ ඒ තෙල් පහන පළමු තෙල් දැවීමෙනුත්, අනෙක් තෙලක් නොගැනීමෙනුත් ප්‍රත්‍යරහිතවූයේ නිවෙන්නේය.

මහණෙනි, එසෙයින්ම සංයෝජනීය ධර්මයන්හි දෝෂය නැවත නැවත දක්නාසුලුව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වෙයි. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වෙයි. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

(සංයෝජන සූත්‍රයෙනි)

## මහා රුක්ඛ

මහණෙනි, උපාදානීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලුව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වෙයි. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

මහණෙනි, යම්සේ මහ රුකෙක් වේද එහි යටට බස්නා යම් මුලුත් වේද, සරසට යම් මුලුත් වේද, ඒ සියල්ල ඕජස උඩට ගෙනයයි. මහණෙනි මෙසේ ඒ මහරුක ඒ ආහාර ඇත්තේ ඒ උපාදාන ඇත්තේ බොහෝ දිගුකලක් පවත්තේය.

මහණෙනි, එපරිද්දෙන්ම උපාදානීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දක්නාසුලුව වෙසෙන්නහුගේ තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වේ. මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

මහණෙනි, උපාදානීය ධර්මයන්හි දෝෂය, නැවත නැවත දක්නාසුලු ව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ. උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වේ. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, යම්සේ මහරුකෙක්වේද, එකල්හි පුරුෂයෙක් උදැල්ලක් හා පැසක් ගෙන එන්නේය. හෙතෙමේ ඒ රුක මුල සිඳින්නේය. මුලසිඳ හාත්පස සාරන්නේය. හාත්පස සාරා යටත් පිරිසෙයින් සුවඳහොට මුල් පමණවුත් මුල් උදුරන්නේය. හෙතෙමේ ඒ රුක, කඩ කඩකොට සිඳින්නේය. කඩ කඩකොට සිඳ පලන්නේය. පලා කැබැලි කැබැලි කරන්නේ ය. කැබැලි කැබැලි කොට අවු සුළඟෙහි වියලන්නේය. අවු සුළඟෙහි වියලා ගින්නෙන් දවන්නේය. ගින්නෙන් දවා හළුකරන්නේය. හළුකොට මහ සුළඟෙහි හෝ පොලා හරින්නේය. සැඩ පහර ඇති ගඟෙහි හෝ පාකොට හරින්නේය. මහණෙනි, මෙසේ ඒ මහරුක උසුන් මුල්ඇත්තේ හිස්සුන් තල්ගසක් මෙන් කරණලද්දේ, නොවැඩෙන බවට පමුණුවන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේය.

මහණෙනි, එසෙයින් ම උපාදානීය ධර්මයන්හි දෝෂ නැවත නැවත දක්නාසුලුව වෙසෙන්නහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වෙයි.

(මහාරුක්ඛ සූත්‍රයෙනි)

## ප්‍රත්‍යක්ෂය

කාමාදි භවයෙහි හෝ අභිවෘද්ධියෙහි ඇලුණු ලෝවැසි තෙමේ, තමා සිතන සැටියෙන් අන් පරිද්දකින්ම වනසන සුළුවෙයි. (නොසිතූ ආකාරයෙන් වැනසීම සිදුවෙයි.) එසේ වුවද, භවයෙහි ඇලුනේ, භවයම කැමතිවෙයි. යම් භවයක් හෝ අභිවෘද්ධියක් කැමතිවේද, එය බියකි. ජරා මරණ ආදියෙන් බියවේද, එය දුකකි.

**(බුදුහු තමන් වහන්සේගේ සිත අමතන සේක)**

"වෙන වෙන පඤ්චස්කන්ධවූ අවිද්‍යායෙන් මැඬනාලද ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන් කෙරෙහි ඇලුණ හෙයින්ම, භවයෙන් නොමිඳුණ මේ සත්ත්ව ලෝකය බලව".

යම්කිසි කාමාදි භවයෙන් මෙන්ද, උඩ යට ආදි සියළුතැන්හි සර්වභාවයෙන් (මුළුමනින්ම) ඒ හැම භවයෙන් අනිත්‍යයහ. දුඃඛ්‍යහ, විපරිනාම ස්වභාවවූහයි.

මෙසේ ත්‍රිලක්ෂණ ප්‍රතිවේධාකාරයෙන් භවයෙහිලා ගැනෙන පංචස්කන්ධය, තත්වූ පරිදි විදර්ශණා සහිත මාර්ගඥාණයෙන් දක්නාහට භවතෘෂ්ණාව ප්‍රහීණ වෙයි. පැවත්වීමට නොකැමැති වෙයි.

සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාවන්ගේ ක්ෂයවීමෙන් ශේෂයක් නොවූ, ආයර්‍ය මාර්‍ගයෙන්වූ අනුත්පාද නිරෝධය නිර්වාණයයි. ඒ කෙලෙස් පිරිනිවනින් නිවුන මහණ (ශ්‍රාවකයා) හට උපාදාන රහිත හෙයින් පුනර්භවය නොවේ. ක්ලේශාදී පඤ්චමාර මඬිනලදී. ක්ලේශ

සංග්‍රාමය දිනන ලදී. සුඛදුක්ඛාදියෙහි නොඇලුනේ සියළු භවයෙන් ඉක්මවූයේයි.

(පෙටකෝපදේශය)

## මෙනෙහිකිරීම

භව නාටකය නැවත විකාශය කිරීම (මෙනෙහි කිරීම මඤ්ඤනාකිරීම) නොකරන්න. යෝනිසෝමනසිකාරයෙන් (සන්සුන් මනසින්) යුතුව එළැඹි සිහියෙන් සිටින්න. අතීත භව නාටකය නැවත සිහියට එනකල ඉන් වළකින්න. එය හා නොබැඳෙන්න. ඉන් ගැලවීගන්න. නැවතුම එතැනය. වරක් දුටුදෙය යලි බලන්නට සිත්වීම අතීත භව නාටකය යලි විකාශය කිරීමක් ලෙසින් උදාහරණයට ගන්න.

සිදුවූ දෙය, සිදුවී හමාරය - මූණ ගැසුණ දේ ඒ මොහොතේදී මුණගැසී හමාරය - පසු අවස්ථාවකදී එය යළි කරළියට ඒම "භවයට" ඇද වැටීමකි. එසේ වූයේ අනන්තයට බිලිවීමකි. නිමාවක් නොපෙනෙන සංසාර වට්ටයෙහි හසුවීමකි.

## ගුණදොස් කෙරෙහි

සුප්පිය පරිභ්‍රාජිකයා බුදුන් වහන්සේට නොයෙක් ආකාරයෙන් දොස් කියයි. ධර්මයට දොස් කියයි. සංඝයාට දොස් කියයි. එහෙත් මොහුගේ තරුණ අතවැසි බ්‍රහ්මදත් තෙමේ නොයෙකුත් ආකාරයෙන් බුදුන්ගේ ගුණ කියයි. ධර්මයේ ගුණ කියයි. සංඝයාගේ ගුණ කියයි. මෙසේ මේ ගුරු ගෝල දෙදෙනා එකිනෙකට විරුද්ධ කථා කියමින් භාග්‍යවතුන් වහන්සේත් සංඝයාත් පසුපසින්ම එන්නේය.

භික්ෂු සංඝයා විසින් මේ කරුණ බුදුන් වහන්සේ වෙත සැලකරනු ලදුව, උන්වහන්සේ විසින් මෙසේ වදාරන සේක.

මහණෙනි, අනුන් මට දොස් කියන්නේ නම්, ධර්මයට දොස් කියන්නේ නම්, සංඝයාට දොස් කියන්නේ නම් හෝ එවැනි අවස්ථාවලදී ඔබ කිසිවෙකුත් කෝප නොවිය යුතුය. නොසතුටු නොවිය යුතුය. සිතෙහි අමනාපයන් අතිකර නොගත යුතුය.

මහණෙනි, අනුන් මට දොස් කියතහොත්, ධර්මයට හෝ සංඝයාට දොස් කියතහොත් ඔබලා ඒ පිළිබඳව කෝප වන්නේනම්, නොසතුටු වන්නේකම්, එයින්ම ඔබ හැමගේ ධ්‍යානලාභාදියට බාධා වන්නේය.

මහණෙනි, අනුන් මට හෝ ධර්මයට හෝ සංඝයාට දොස්පවරණ අවස්ථාවන්හිදී, ඔබලා කලබලයට පත්වන්නේ නම්, අනුන් කීදෙය සත්‍යයක්ද, නැතහොත් අසත්‍ය කථාවක් දැ'යි දැන ගැනීමට හැකිවන්නේද?

ස්වාමීනි, කලබලයට පත්වුවහොත් කථාවෙහි ඇත්ත නැත්ත දැනගැනීමට නොහැකි වන්නේමයැ'යි ඒ භික්ෂූහු පිළිතුරු දුන්හ.

මහණෙනි, අනුන් මට හෝ ධර්මයට හෝ සංඝයාට හෝ දොස් කියතහොත්, එවන් අවස්ථාවන්හිදී මෙය අභූත කාරණයකි. මෙය අසත්‍යයකි. මේ කියන දෝෂයන් අප කෙරෙහි නැත. මේවා අප අතරින් දැකගැනීමට නොවන්නේමය ලෙසින් සිතා ඉවත දැමිය යුතුය.

මහණෙනි, අනුන් මාගේ හෝ ධර්මයේ හෝ සංඝයාගේ හෝ ගුණ කියතහොත්, ඒ පිළිබඳව ඔබ කිසිවෙකුත් ප්‍රීතිනොවිය යුතුය. සතුට පළනොකළ යුතුය. සතුටෙහි නොපිහිටිය යුතුය.

මහණෙනි, අනුන් මාගේ හෝ ධර්මයේ හෝ සංඝයායේ හෝ ගුණ කියතහොත්, ඔබ හැම ඒ කෙරෙහි ප්‍රීතිවන්නේ නම් හෝ සතුටුවන්නේ නම් ඒ ඔබලාගේ ධ්‍යානාධි ගුණ ලැබීමට බාධක වන්නේය.

මහණෙනි, අනුන් මාගේ හෝ ධර්මයේ හෝ සංඝයාගේ හෝ ගුණ කියනු ලබන අවස්ථාවන්හිදී මේ කරුණින් මෙය සත්‍යය, මෙය ඇති එකකි. අප තුලද මෙසේ ඇත්තේය යනුවෙන් ඇති ගුණ, ඇති ගුණයන් වශයෙන්ම සිහි කළ යුත්තේය.

(බ්‍රහ්ම ජාල සූත්‍රයෙනි)

මහණෙනි, යම් කලෙක මහණ තෙම ස්පර්ශායතනම සයදෙනෙකුගේ හේතුවද, නිරෝධයද, ආස්වාදයද, ආදීනවයද, ප්‍රහාණයද, යථා පරිද්දෙන් අවබෝධකර ගනීද, හෙතෙම හැම දෘෂ්ඨියක්ම ප්‍රහීණකොට (ශීල සමාධි ප්‍රඥා) භව නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගනී.

(බ්‍රහ්මජාල සූත්‍රයෙනි)

## අරුත් දැනීම

ඇවැත්නි, ප්‍රඥාවනැත්තා, ප්‍රඥාවනැත්තායැ'යි කියනු ලැබේ. කුමක් අරහයා ප්‍රඥාවනැත්තායැ'යි කියනු ලැබේද?

නොදනියි, නොදනියි යනු යම් හේතුවක්වේද, එහෙයින් ප්‍රඥාවනැත්තායැ'යි කියනු ලැබෙයි. කුමක් නොදන්නේද යත්, මේ දුක යැ'යි නොදන්නේය. මේ දුක ඇතිවීමේ හේතුවයැ'යි නොදන්නේය. මේ දුක නිරෝධයකළ හැකියැ'යි නොදන්නේය. දුක නැතිකළ හැකි ප්‍රතිපත්ති මේ යැ'යි, දුක නැතිකිරීමේ මාර්ගය නොදන්නේය. ඇවැත්නි, මෙසේ නොදනියි - නොදනියි යන යම් හේතුවක්වේද, එහෙයින් ප්‍රඥාවනැත්තායැ'යි කියනු ලැබේ. (මෝඩයාය, බාලයාය).

ඇවැත්නි, ප්‍රඥාවන්තයා, ප්‍රඥාවන්තයැ'යි කියනු ලැබෙයි. කුමක් හේතුකොට ගෙන ප්‍රඥාවන්තයැ'යි කියනු ලැබේද?

ඇවැත්ති, දනී, දනී, යන යම් හේතුවක්වේද, එහෙයින් ප්‍රඥාවන්තයා කියා කියනු ලැබෙයි. කුමක් දන්නේද යත්, මේ දුක යැ'යි දන්නේය. දුක්ඛසමුදය මේ යැ'යි දන්නේය. දුක නැතිකිරීම මෙය යැ'යි දන්නේය. දුක නැතිකිරීමේ ප්‍රතිපත්තිමය මාර්ගය මෙය යැ'යි දන්නේය.

ඇවැත්නි, මෙසේ දනී - දනී යන යම් යම් හේතුවක් වේද, එහෙයින් ප්‍රඥාවන්ත යැ'යි කියනු ලැබෙයි.

ඇවැත්නි, විඥාණය - විඥාණය'යි කියනු ලැබේ. ඇවැත්නි, කවරෙක් නම් විඥාණයැ'යි කියනු ලැබේද?

ඇවැත්නි, දන්නේය - දන්නේය යන යම් හේතුවක් වේද, එහෙයින් විඥාණය යැ'යි කියනු ලැබේ. කුමක් දන්නේ ද යත්, සුඛවේදනායැ'යි ද දන්නේය. දුකවේදනායැ'යි ද දන්නේය. අදුක්ඛමසුඛවේදනාවයැ'යිද දන්නේය.

ඇවැත්නි, මෙසේ දන්නේය - දන්නේය යන යම් හේතුයෙක් වේද, එහෙයින් විඥාන යැ'යි කියනු ලැබේ.

ඇවැත්නි, යම් ප්‍රඥාවක් ඇද්ද, යම් විඥාණයක් ඇද්ද, මේ දහම්හු එක් එක් වශයෙන් මිශ්‍රවන්නේද? නැතහොත් අමිශ්‍රව පවතින්නේ ද? මේ ධර්මයන් වෙන් වෙන්කොට වෙනස පනවන්නට හැකිවේද?

ඇවැත්නි, යම් නුවණක්ඇද්ද, යම් දැනීමක්ඇද්ද, මේ දහම්හු එක්වම ඇත්තේ ය. මේ ධර්මතාවයන් අරමුණු ආදි වශයෙන් හෝ වෙන් වෙන්කොට වෙනස් අයුරකින් දක්වන්නටද නොහැකිය.

ඇවැත්නි, යම් චතුස්සත්‍යය ධර්මයක් අවබෝධකොට දනීද, මාර්ගය පිළිබඳ දැනීම ඒ ධර්මකෘත්‍ය විසින් දන්නේය. මාර්ගවිඥාණය යම් චතුස්සත්‍යය පිළිබඳ අවබෝධයක් දැනීමක් වේද, එය අවබෝධ ඥානය විසින් ද දනී. එහෙයින් මේ දහම්හු මිශ්‍රය. අමිශ්‍ර නොවෙති. මේ ධර්මයන් වෙන් වෙන්කොට වෙනස් ලෙසින් දක්වන්නට ද නොහැකිය.

ඇවැත්නි, යම් දැනීමක්ඇත්ද, යම් අවබෝධයක්ඇත්ද, එකිනෙක මිශ්‍රවසිටී. වෙන් නොවී සිටින්නාවූ මේ ධර්මයන්ගේ වෙනස කිම?

ඇවැත්නි, යම් අවබෝධයක් (නුවණක්) ඇත්ද, දැනගැනීමක් (විඥාණයක්) ඇත්ද සංයෝගව සිටී. වෙන්ව නොපවතින මේ ධර්මයන් අතුරින් (මාර්ග) නුවණ වඩහාගත යුතුය. විදර්ශණා (විඥාණය) අවබෝධකොට වටහාගත යුතුය. මේ උන්දෙදෙනාගේ වෙනසයි.

ඇවැත්නි, වේදනා - වේදනායැ'යි කියනු ලැබේ. ඇවැත්නි, කුමක් උදෙසා වේදනා'යි කියනු ලැබේද?

ඇවැත්නි, විඳින්නේය - විඳින්නේයැ'යි යන මේ හේතුවක් වෙත්, එහෙයින් වේදනා'යි කියනු ලැබෙයි. කුමක් විඳුනේද යත්, සුවඅරමුණුද විඳින්නේය. දුක්අරමුණුද විඳින්නේය. නොදුක්නොසුව අරමුණු ද විඳින්නේය.

ඇවැත්නි, මෙසේ විඳින්නේය - විඳින්නේ යැ'යි යම් හේතුවක් වේද, එහෙයින් වේදනා යයි කියනු ලැබේ.

ඇවැත්නි, සංඥා - සංඥා යැ'යි කියනු ලැබෙයි. ඇවැත්නි, කවරෙක් සංඥාවන්නේද?

ඇවැත්නි, හඳුනාගනී - හඳුනාගනී, යන යම් හේතුවක් වේද, එහෙයින් සංඥා යයි කියනු ලැබෙයි. කුමක් හඳුනාගන්නේද යත්, වර්ණයන්ද හඳුනාගනී. රූපයන්ද හඳුනාගනී. ශබ්දයන්ද හඳුනාගනී. ගන්ධයන්ද හඳුනාගනී. ස්පර්ශයන්ද හඳුනාගනී.

ඇවැත්නි, මෙසේ හඳුනාගනී - හඳුනාගනී යන යම් හේතුවක් වේද, එහෙයින් සංඥා යැයි කියනු ලැබෙයි.

ඇවැත්නි, යම් වේදනාවක් ඇද්ද, යම් සංඥාවක් ඇද්ද, යම් විඥාණයක් ඇද්ද, මේ ධර්මයන් සංයෝග වන්නේ ද? නැතහොත් විසංයෝගී වන්නේ ද? මේ ධර්මයන් වෙන් වෙන්කොට දැක්වීමට හැකි වන්නේද?

ඇවැත්නි, යම් වේදනාවක් ඇද්ද, යම් සංඥාවක් ඇද්ද, යම් විඥානයක් ඇද්ද, මේ ධර්මයන් සංයෝගව පවතී. වෙන් වෙන්ව නොපවතී. වෙන් වෙන්කොට වෙනස දක්වන්නට ද නොහැකිය.

ඇවැත්නි, (වේදනාව) යම් අරමුණක් විඳිද, (සංඥාව) ඒ අරමුණ හඳුනයි. (සංඥාව) යම් අරමුණක් හඳුනාගනීද? (විඥානය) ඒ අරමුණ තම කාර්යය ලෙසින් දැනගනී. එහෙයින් මේ ධර්මයන් සංයෝගය වෙන් වෙන්ව නොඑති. මේ ධර්මතාවයන් වෙන් වෙන්කොට දැක්වීමට ද නොහැකිය.

ඇවැත්නි, අවබෝධ කළයුතු ධර්මය කෙසේ නම් දැකිය හැක්කේද?

ඇවැත්නි, අවබෝධ කළයුතු ධර්මය ප්‍රඥාව චක්ෂුසින් (නුවණැසින්) දක්නේය.

ඇවැත්නි, භවයෝ කොතෙක් වන්නේද?

ඇවැත්නි, භවයෝ තුන් දෙනෙකි. කාමභවය, රූප භවය, අරූප භවය.

ඇවැත්නි, මතු අනාගතයෙහි පුනර්භවයෙහි ඉපදීම කෙසේ වන්නේ ද?

ඇවැත්නි, අවිද්‍යානීවරණ ඇති, තෘෂ්ණා සංයෝජන ඇති සත්ත්වයන්ගේ ඒ ඒ තැන්හි, රූප ආදී අභිනන්දනයෙන් ද, ආස්වාදයන් ගෙන් පුනර්භවයෙහි ඉපදීම සිදුවෙයි.

ඇවැත්නි, අනාගතයෙහි පුනර්භවයේ ඉපදීම සිදු නොවන්නේ කෙසේද?

ඇවැත්නි, අවිද්‍යා ක්ෂයකොට විරාගී බව හේතුයෙන් වන අරහත් මාර්ග චිත්තයන් වැඩීමෙන් - තෘෂ්ණාක්ෂය නිරෝධයෙන්, මෙසේ මතුයෙහි පුනර්භවයේ ඉපදීම නොවන්නේය.

ඇවැත්නි, ඉන්ද්‍රියයෝ පස්දෙනෙකි. ඒ කවරේදයත්, චක්ෂුසින්ද්‍රිය, ශෝතේන්ද්‍රිය, ඝ්‍රාණේන්ද්‍රිය, ජිව්හේන්ද්‍රිය, කායේන්ද්‍රිය'යි.

ඇවැත්නි, මේ පස්දෙනා නිසා "ආයු සිටිත්,

ඇවැත්නි, "ආයු" කුමක් නිසා පවතින්නේද?

ඇවැත්නි, "හුස්ම" නිසා සිදුවෙයි.

ඇවැත්නි, "හුස්ම" කුමක් නිසා පවතින්නේද?

"හුස්ම" - "ආයු" නිසා සිටුනේය.

ඇවැත්නි, අප දැන් ආයුෂ්මත් සැරියුත් තෙරුණුවන්ගේ බස මෙසේ වටහා ගනිමු. ආයු, හුස්ම නිසා පවතින්නේය. හුස්ම, ආයු නිසා පවතින්නේය.

ඇවැත්නි, කවර ආකාරයක හෝ උපමාවකින් මෙය වටහාගත හැකිවන්නේද?

ඇවැත්නි, එක් කරුණකින් තොපට උපමාවක් ගෙනහැර දක්වමි. උපමාවන්ගෙන්ද ප්‍රඥාවත්හු කියන ලද්දෙහි අර්ථය මැනවින් වටහාගනිති.

ඇවැත්නි, යම් ආකාරයකින් දල්වනලද තෙල් පහනෙහි, ගිනිසිළුව නිසා ආලෝකය (දීප්තිය) පවතින්නේද? දීප්තියනිසා සිළුව පවතින්නේද?

ඒ ආකාරයෙන්ම හුස්ම නිසා ආයු පවතී. ආයු නිසා හුස්ම පවතින්නේය.

ඇවැත්නි, එයම ආයුසංස්කාර වන්නේද? එයම වේදනාධර්ම වන්නේද? නැතහොත් අනෙකක් ආයු සංස්කාර වන්නේද? අනෙකක්ම වේදනා ධර්මවන්නේද?

ඇවැත්නි, ඔහුම ආයු සංස්කාරයෝත්, ඔහුම වේදනා ධර්මයෝත් නොවෙති.

ඇවැත්නි, ඔහුම ආයු සංස්කාරයෝත්, ඔහුම වේදනා ධර්මයෝත් වන්නේනම් සඤ්ඤාවේදයිත නිරෝධ සමවත්හි සමවැදුන මහණහුගේ (සමවතින්) සමාධියෙන් නැගී සිටීම නොවන්නේය.

ඇවැත්නි, යම් හෙයකින් අනෙකක් ආයු සංස්කාරයෝ වෙත්ද, අනෙකක් වේදනාධර්මයෝ වෙත්ද, එහෙයින්, සඤ්ඤාවේදයිත නිරෝධ සමවතට සමවැදුන මහණනුගේ (සමවතින්) නැඟීසිටීම වන්නේය.

ඇවැත්නි, යම් දිනෙක කොපමණ ධර්මතාවයන් මේ කය හැරයන්නේද? එකල මේ කය සෙලවිය නොහැකි අයුරින් වැතිරගන්නේ නොවේද?

ඇවැත්නි, යම් කලෙක ආයුෂය, හුස්ම ය. විඥාණය යන ධර්මයන් තිදෙනා විසින් මේ කය අත්හරින්නේ ද, එසේ අත්හැරීම කරණකොට අචේතනික වූ ස්කන්ධයක් ලෙසින් බිම වැතිරගන්නේය.

ඇවැත්නි, යම් පුද්ගලයෙක් මළේ - කලුරිය කළේ වේද, යම් මේ මහණෙක් සංඥාවේදයිත නිරෝධයට සමවන්නේ වේද, මොවුන්ගේ වෙනස කෙබඳුවේද?

ඇවැත්නි, යම් පුද්ගලයෙක් මළේ ය. කලුරිය කළේවේද ඔහුගේ ආශ්වාස ප්‍රශ්වාස නැවතිණ. විතර්ක විචාරයෙන් නැවතුණහ. සංඥාවෝ නැවතුණහ. ආයු නිමවිය. උණුසුම සංසිඳින. ඉන්ද්‍රියයන් අක්‍රිය විය.

යම් මේ මහණෙක් සංඥාවේදයිත නිරෝධයට සමවැදුනේ වේද, ඔහුගෙත් කාය සංස්කාරයෝ නිරුද්ධය. සංසිඳුනාහ. වාක් සංස්කාරයෝත් නිරුද්ධය. සංසිඳුනාහුය. ආයුසිඳුනේ නොවේ. හුස්ම නොසෙල්වෙයි. ඉන්ද්‍රියයෝ වඩාත් ප්‍රසන්න වෙති."

ඇවැත්නි, යම් පුද්ගලයෙක් මළේ, කලුරිය කළේවේද යම් මේ මහණෙක් සංඥාවේදියිත නිරෝධයට සමවන්නේ වේද? මේ උන්ගේ වෙනසයි.

(මහාවේදල්ල සූත්‍රයෙනි)

## සත්ත්වයා

රාධ, රූපයෙහි යම් ඡන්දයක්, රාගයක් යම් නන්දියක්, යම් තෘෂ්ණායෙක්, කැමැත්තක්, දැඩිලෙසින් ගන්නා අකුසල චිත්තයන්හි ගැලුන කෙනෙක් වෙද්ද, එහි ඇළුන කෙනෙක් වෙත්ද, විශේෂයෙන් එහි ඇළුනේ වේද සත්ත්වයැ'යි කියනු ලැබේ.

වේදනාවෙහි, සංඥාවෙහි, සංස්කාරයෙහි, විඥාණයෙහි ඇළුනකෙනෙක් වෙත්ද, විශේෂයෙන්ම එහි ඇළුනේවේද සත්ත්වය'යි කියනු ලැබේ.

සත්ත්වයා යනු විශේෂයෙන් ම ඇලීම ප්‍රකාශ කිරීමයි.

(නර) සත්ත්ව තෙම සිටුනේ, රාගයෙන් රත්වූයේ සිටී, ද්වේශයෙන් දෘෂ්ඨිවූයේ සිටී. මෝහ වශයෙන් මුඨ වූයේ සිටී. මාන වශයෙන් නානාලම්බන වික්ෂේපයට පැමිණ නොසිටි, විචිකිත්සා වශයෙන් නිෂ්ඨාවට පැමිණ නොසිටි. අනුශය වශයෙන් ස්ථිරබවට පැමිණසිටී. මෙයිනුදු නර යැයි වේ.

(ශුභට්ඨක සූත්‍රයෙනි)

## ගමනක් තිබුනේ ද?

අයෙකු සැතපුම් සියයක ගමනක් වාහනයකින් ගමන් කළේය.

වාහනය, ගමන, දුර ප්‍රමාණය, පුද්ගලයා මේ කවරේද? ගමන ගොස් ඇත. ගමන ගියේ වාහනයෙනි, වාහනය ක්‍රියාත්මකවූයේ එහි එන්ජිමෙනි. එන්ජිම සවිකොට තිබුනේ එහි චැසිය මතය.

සැතපුම් සියයක් ගමන්කළ බවක් පළවන මොහොතේ මේ සැතපුම් සියය ගමන්කිරීමට පාදක වූ වාහනයෙහි එන්ජිම කොපමණ දුරක් ගොස් තිබුණේ ද?

එන්ජිම පැවතියේ සවිකොට තිබූ චැසිය මතමය. එය එතැනින් බැහැර කොහේවත් ගොස් නැත. පුද්ගලයා සැතපුම් සීයයක් ගිය බව පවසතත්, ගමන ගිය වාහනයේ එයට බලය සැපයූ එන්ජිම තිබූ තැනමය. එන්ජිම බලය දෙමින් එතැනම සිටියදී පුද්ගලයෙකු සැතපුම් සියයක් ගොස් ඇත.

පුද්ගලයා සැතපුම් සියයක් ගිය බවකි. ගමන සිදුවූයේ වාහනයේ රෝද කරකැවීම නිසාය. වාහනයේ රෝද නොකරකැවෙන්නට සැතපුම් සියයක ගමනක් නොවනු ඇත.

කෙසේ හෝ වේවා රෝද කරකැවුනේය. වාහනය ගමන්කළේය. සැතපුම් සියයක ගමනක් පුද්ගලයා ගියේය.

වාහනයේ රෝද හතරක්ම කරකැවෙමින් ගමන ගියේය. රෝද හතර ගිය දුර ප්‍රමාණය සැතපුම් කොපමණද? යැ'යි කිව හැක්කේද?

නොහැක්කේය.

රෝද කොහේවත් ගොස් නැත. රෝද කරකැවුනේ ඒවා සවි වී තිබූ ඇක්සලය වටා පමණි. ඉන් බැහැර කොහේවත් ගොස් නැත. යෑමේ හැකියාවක් තිබුනේද නැත. රෝද ගමනක් ගියේද නැත. රෝද ක්‍රියාත්මක වූයේ එන්ජිමෙන් ඇතිකළ බලය අනුව තමන් සවිවී ඇති ඇක්සලයවටා භ්‍රමණයවීම පමණි.

පුද්ගලයා හැරණුවිට, එන්ජිම හෝ වාහනයට හෝ ඇක්සලයට හෝ රෝදවලට හෝ අන්කිසිවකට හෝ ගමනක් යෑමෙක් තිබී නැත. ගමන ඇතිවූයේ ගමන ගියේත් පුද්ගලයාය. ගමන ඇතිවූයේ පුද්ගලයා තුලය.

වෙනත් විවිධ බලයන්, ශක්තීන්මත පුද්ගලයා තුල පහල වූ ගමන නිර්මාණය විය. එහි නිමාව ද විය.

සත්ත්වයාගේ භවගමනද මෙවන් අයුරින්ම එක තැනම කරකැවීමක් පමණි.

සැබැවින්ම පුද්ගලයාතුල පහලවූ අරමුණ (සිතුවිල්ල) නොවන්නට ගමනක් තිබුණේද? සැතපුම් සියයක් යන්න නිර්මාණයවූයේ කෙසේද? මේවා සියල්ල සිත ප්‍රත්‍යකොට ඇතිකරගත් සංඛතයෝම පමණක් බව ප්‍රත්‍යක්ෂ කරගන්නට කිසිවෙකු සමත්වන්නේ නම් හේ සැබැවින්ම නුවණැත්තෙකි.

## දෙකෙළවර හා මධ්‍යය

ග්‍රීෂ්ම කාලයේ තැනිතලාවක ඈත පෙනෙන මිරිඟුවක් දකින මුවෙක්, ඒ මිරිඟුවේ ජලය පිළිබඳව සංඥාවක්

ඇති කරගන්නව. ජලය කියා සිතා ගන්නවා. ඒ සංඥාව අනුව, අරමුණ අනුව මඤ්ඤනාවක්, මෙනෙහි කිරීමක් ඇති කරගන්නවා. එහෙම හිතාගෙන ඒ මිරිඟුව දිහාවට දුවන්න පටන් ගන්නවා. ඒ මිරිඟුව දිහාවට දුවන්නෙ කුමක් නිසාද? මේ දිවීමෙන් තමන් හා ජලය අතර ඇති පරතරය ගෙවා දමලා. ඒ ජලයට ලංවෙන්න පුළුවන් කියන හැඟීම මුවා තුල ඇති වුන නිසයි. ඒ හැඟීම තවදුරටත් මුවා තුල තිබෙන නිසයි. නමුත් මුවා වටහානොගත්තු කාරණයක් තියෙනවා. මේ පරතරය දුවලා නිමකරන්න බැරි බව. මේ පරතරය කිසිදාක දුවලා ගෙවන්න බැහැ. මේ පරතරය ගෙවාදැමිය නොහැක්කක්.

දෙකොනක් ඇතිතාක්, මැදක් ද තියෙනවා. මෙක හොඳින් අවබෝධකර ගතයුත්තක්. දෙකොනෙහිම මුලාවයි. ගැලවීම ඇත්තේ මැදයි. මැද හරියටම දැක ගත්තොත් නිවැරදිම දුකින් ගැලවෙනවා.

දකින ඇස එක කොනක්. ඈත තිබෙන ජලය දෙවන කොනයි. මෙක කොන් දෙක වෙන්කර දැකගත්තා නම් ඒ අතර තියෙනවා පරතරයක්, හිඩැසක්.

මේ කාරණ තුනම අවශ්‍යයි මේ කියපු අරමුණකට, සංඥාමය අවස්ථාවට, අන්න ඒ නිසයි අර පරතරය ගෙවා දැමීමට නොහැකිවන්නේ.

මේ පරතරය ගෙවාදැමිය නොහැක්කක් බව තේරුම් ගත්තු විමුක්ත පුද්ගලයා අර මිරිඟුවට රැවටෙන්නේ නැහැ. ඒ මිරිඟුව ඔස්සේ දුවන්නේ නැහැ.

මේ පිළිබඳව අවබෝධයලත් ප්‍රඥාවන්තයා, ඒ රහතන් වහන්සේ, දිට්ඨ මන්තං ආදී වශයෙන් දැක්වූ ආකාරයෙන් දුටුදෙයෙහි, දුටුමතින් නවතිනවා. ඇසුනේ, ඇසුනමතින් (එතැනම) නවතිනවා. දැනුනේ. දැනුනමතින් නවතිනවා. දත්දෙයෙහි, දත්මතින්ම නවතිනවා. ඉන් ඔබ්බට යෑමක් හෝ ආපසු ගැනීමක් හෝ එතැනම පවත්වා ගැනීමක් හෝ නැහැ. එය මෙනෙහිකිරීමක් නැහැ. මඤ්ඤණාකිරීමක් නැහැ. දැනුනා, ඇසුනා, බැලුවා පමණයි. එතැනම නිරුද්ධවෙන්නට හරිනවා. මෙන්න මේ විමුක්ත තත්ත්වය රහතන්වහන්සේ තුල තිබෙනවා. රහතන්වහන්සේ නමක් දිට්ඨි, සුත, මුත, විඤ්ඤාත, කියන කාරණා පිළිබඳ නිවැරදි ලෙසින් ප්‍රකාශ කරන්නේ මෙයාකාරයෙනි.

"ඇවැත්නි, මම දිට්ඨිය පිළිබඳව ළංවෙන්නේත් නැතිව, දුරස්වෙන්නේත් නැතිව, එය ඇසුරු කරන්නේත් නැතිව, එහි බැඳෙන්නේත් නැතිව එයින් මිදී, එයින් ගැලවී මායිම්කර නොගත් සිතකින් යුත්තව වාසය කරනව",

දැන් මිරිඟුව පිළිබඳ කාරණය වෙත එළැඹෙමු. එය තේරුම් ගන්නට බලමු.

මිරිඟුවකට ළංවෙන්නත් බැහැ. ඈත්වෙන්නත් බැහැ. දැඩි හිරුඑළිය පවතින කාලයේ ඇතිවන මිරිඟුවක් දැක්කම, තමන්තුළ පවතින පිපාසය නිසා ජලය පානයකර පිපාසය නිවාගැනීමේ ඕනෑකමින් මිරිඟුව කෙරෙහි ජලය පිළිබඳ සංඥාව ඇතිකරගෙන, ජලය ඇතිසේ පෙනෙන, එදෙසට දිවයෑමයි කරන්නේ, ඒ පැත්තට කොපමණ වේගයෙන් දිවගියත් මිරිඟුව ළඟට ළංවෙන්න බැහැ. කොපමණ දිවගියත් මිරිඟුව තියෙන බව පෙනෙන්නේ ඈතින්මයි.

රහතන්වහන්සේ, දකින, ඇසෙන, දැනෙන, පෙනෙන, සිතෙන කිසිවකට රැවටෙන්නේ නැහැ ඒවාට ලංවෙන්න සිතන්නේ නැහැ. ඒ නිසාම ඒවාට ලංවෙන්න යන්නෙත් නැහැ. ඒවායින් ඈත්වෙන්නෙත් නැහැ. ලංවීමට හෝ ඈත්වීමට සිත ඇතිකරන්නේ නැහැ. සිත පවත්වන්නේ නැහැ. එවැනි අරමුණුවල පවතින්නේ නැහැ. සැබෑ ස්වභාවය එසේවුනත් දිට්ඨි, සුත, මුත, විඤ්ඤාතවල යෙදිලඉන්නවා වාගේ බාහිර ලෝකයාහට පෙනෙනවා. එහෙම හිතනවා. ඒ වුනත් මෙතැන එහෙම කිසිම ස්වභාවයක් නැහැ.

රහතන්වහන්සේලා, ප්‍රඥාව ඇතිකරගත් අය සංඥාවන් ගෙන් මිදිලා, ඒවායින් බැහැරවෙලා, කිසිවකින් මායිම්කර නොගත් සංයමයෙන්යුතු, සිතකින් යුතුව සිහියෙන් පසුවෙනවා.

මොකක්ද මේ මායිම් කිරීම, දෙකොන හා මැද,

කලින් පැහැදිලි කලා වගේ ඇස වෙනමයි රූපය වෙනමයි. ඒ අතරින් මැද පරතරයයි කියල මායිම්කර ගැනීමක් නැහැ. විමුක්ති සුවය ප්‍රත්‍යක්ෂකළ අයතුළ.

(කටුකුරුන්දේ ඥාණානන්ද භික්ෂු)

සිතිවිලි, අරමුණු මඤ්ඤණා, කෙරෙන් සිදුවන්නේ දකින, පෙනෙන, ඇසෙන, සිතන දේ (දිට්ඨි, සුත, මුත, විඥාණ) ආදිය කෙරෙහි වටිනාකමක් ඇතිකර ගැනීමයි. කිසියම් ආකාරයක පවතින දෙයක්ලෙස සිතා ගැනීමයි. වැරදි සංඥාවන් අනුව ඇතිකරගත් සාවද්‍ය සිතුවිලි ග්‍රහණය කරගැනීමයි. ඒවායේ ගැලීමයි. වෙලී යාමයි.

දකින දෙයක් තියෙනවා. අසන දෙයක් තියෙනවා. දැනෙන දෙයක් තියෙනවා. සිතන දෙයක් තියෙනවා. ආදි වශයෙන් සිතන්නට වීමෙන් නිරන්තරයෙන්ම සිතීමෙන් (මඤ්ඤණා කිරීමෙන්) කිසි අයුරකින් නොමැතිවුවත්, ඒවා ඇතිලෙසින් ඒවා සත්‍ය වශයෙන්ම ඇතිදේ ලෙසින් මුලාව ඇතිවෙනවා.

එවැනි මුලාවතුළින් යම්දෙයක් ඇතිවූයේනම්, එයම අනෙකක් බවට පත්වෙනවා. දෙයක් වෙලයි. අන්දෙයක් ලෙසට පත්වෙන්නේ කියා ප්‍රකාශවන්නේ ඒකයි.

දෙයක් හැටියට ගන්න නිසාම ඒකට ළංවෙන්න දරන උත්සාහයම ඇත්වෙනවා වගේ පෙනෙනවා, දැනෙනවා.

එකකට ලංවෙනකොට අනික ඇත්වෙනවා. ඒකයි ස්වභාවය. ඒකයි ධර්මතාවය. මැනවින් අවබෝධය ලැබිය යුත්තේ එයයි. මෙය මැනවින් ප්‍රත්‍යක්ෂකරගත් තැනැත්තේ සසරෙහි නොවැටෙයි. භවයෙහි නොඇලෙයි. නවතියි. නිවෙයි.

## මතකයක තරම

පූර්වනිගමනය, අතීත අත්දැකීම්මත පහලවන්නකි. වර්තමාන සිදුවීම්යනු අතීත අත්දැකීමකට හේතුවූ ක්‍රියාවලියනොව, අනෙකකි. වර්තමාන ක්‍රියාවලිය වර්තමාන ක්‍රියාවලිය ලෙසින්ම දැකිය හැකිය. එයට මුහුණදිය හැකිය.

එහෙත් අප විසින් සිදුකරනු ලබනුයේ අතීත ක්‍රියාවලියක අත්දැකීම්, වර්තමාන ක්‍රියාවලියන් සමග

අනුගතකරන්නට යෑමය. එවිට අතීත ක්‍රියාවන්ගේ නිගමනයන්, වර්තමාන ක්‍රියාවන් හා නොගැලපෙන විට, කෝපය ඇතිවෙයි. බිය ඇතිවෙයි. සියළු දුකට හේතු වෙයි.

වර්තමාන ක්‍රියාවලිය වර්තමානයට අනුරූපවම පවත්වා හරින්නේනම් පෙරකී දුකට හේතූන් එතැන පහලවන්නේ නැත. එම වර්තමානයද එතැනම බැහැරවීමට ඉඩහළ යුතුය.

එම අත්දැකීම් අනාගතයට පවත්වන්නට වෙර දරන්නේ නම් වර්තමානය, අනාගතයේදී අතීතය බවට පත්වී ඇති බැවින් යලිත් අතීත නිගමනයන් වර්තමානයට අනුගතකිරීමට ගන්නා දුකට මුල් වූ හේතූන් අතර ගැලීමක් වන්නේය.

අතීතය බැහැර වී ගොසිනි.

වර්තමානය අතීතයට එක්වනු ඇත.

අනාගතය ඇතිවියහැකිද? එසේ ඇතිවුවද, එය තවත් වර්තමානයක් හා අතීතයක්මවනු ඇත. අතීතයේ වර්ෂාව පැවතුනි. එම වර්ෂාව හේතුවෙන් ගංවතුර ඇති වී විශාල හානියක් සිදුවිය. එබැවින් වර්ෂාව පිළිබඳව ඇතිවූයේ නොමනාපයකි. වර්ෂාව නැතිවීම හොඳයැ'යි හැඟීමකි. ඒ එදාය.

වර්තමානයේ නියඟයක් පවතී. බොන්නට හෝ දිය පොදක් නොමැතිව සතුන් මියයති. මහ පොළොව ඉරිතැලී ගහකොළ වියළී යමින් පවතී.

මෙවන් තත්ත්වයකදී අතීත නිගමනයන් කොපමණ දුරට වලංගුවන්නේද? ... වලංගු නොවන්නේමය. පවතින නියඟය දුරුවීම පිණිස වර්ෂාව ඇතිවියයුතු බවට අළුත් නිගමනයක් ඇතිවන්නේ ය. එය වනාහි එදිනට නිවැරදි නිගමනයකි. වර්තමානයේ තත්ත්වයට අනුව ක්‍රියාවලිය පැවතිය යුතුවා මිස, අතීතයට අනුකූලව ක්‍රියාවන් නොපවතින්නේ එසේ පැවත්විය නොහැකි බැවිනි.

අනාගතයේදී වැසි ඇතිවිය යුතුද, නියඟය ඇතිවිය හැකිද? එය අනාගත ක්‍රියාවලියට අයත්දේ මිස වර්තමානය විසින් සැලකියහැකි ක්‍රියාත්මකකළ හැක්කක් නොවන්නේය.

වර්තමානය අතීතයට පත්වනවිට අනාගතය වශයෙන් පැවතිදේ වර්තමානය වන්නේය. එවිට එතැන පවතින ක්‍රියාවලියට අනුකූලව නිගමනයක් ඇතිවිය යුතුය. දුටු දේ දුටු මතින් නිමවිය යුතුය. බුද්ධදේශණයද එයමය.

# දිගු ගමනක්

ගමන දිගුවූයේ වුවද, කෙටිවූයේ වුවද, පෙර නොපැවති එකකි. ගමනයනු සංඛත ධර්මතාවයකි. උවමනාවෙන්ම සකස්කරගනු ලැබූවකි. ගමනේ ස්වභාවය දිස්වනුයේ, එවන් ගමනක් ඇරඹීමට හේතු පාදක වූ ඕනෑකම, දැකීමට අපේක්ෂිත ඵලය හා තෘෂ්ණාසහගතව බැඳුනු අපේක්ෂාවන් ජාලය තුලිනි. මෙහි අතරමඟ කොහේද? අවසානය කොහේදැ'යි කිව නොහැකිය. අරමුණු ජාලය පවතිනතාක්, ගමනද පවතිනු ඇත. යථාවබෝධයෙන් තොරව ගමනේ නිමාව දැකිය නොහැකිවනු ඇත.

යථාවබෝධය ඇතිවූ සැනින් තමන්තුල ඇතිවූ කෙලෙස් හෙවත් අපේක්ෂාවන් හෙවත් බලාපොරොත්තු මතින් ගමනක් සකස් වූ බවත්, ගමනක් යෑමට වුවමනා වූ බවත්, ලෝභය මුසු වූ විඥාණ සහගත එම අපේක්ෂාවන් ඇති නොවූයේනම් සංඛත ධර්මතාවයක් වූ ගමනක් ඇතිකර නොගන්නා බවත් වැටහෙන්නේය. ඒ ක්ෂණයකින් තමා නවතින්නේය. නැවතුන තැනම ගමන නිමා වන්නේය.

නැති දෙයක් ඇත්තේ සේ දෘෂ්ඨිගතවන තැනැත්තේ, තවත් නැති දෙයක් කෙරෙහි ඉලක්කගත වීමෙන්, මෙතන සහ අතන වශයෙන් දෙකොනක් ඇතිකර ගනියි. ඒ දෙක අතර පරතරයකි. තමාතුලම මෙතැන හා අතන යනුවෙන් ඇතිකරගත් කොන්දෙක යාකිරීම සඳහා හෙතෙම ගමන අරඹන්නේය.

එතැනක් ඇත්තේනම් එය සංඛතයක්, මවාපාන්නක් වන්නේනම් මෙතැනක් ද ඇත්තේනම් එය ද සංඛතයක් හෙවත් මවාගත්තක්ම වන්නේනම් ගමනේ අවසානයක් දැකිය හැක්කේද? කොන්දෙක යාකළ හැක්කේ කෙසේද?

නොහැක්කේමය.

එතැනත් මෙතැනත් අතර හිඩැස එක්කිරීමේ ගමන මෙහෙයවනු ලබන්නේ අවිද්‍යාව නිසා හටගත් විඥාණය විසිනි. තෘෂ්ණාව හෙවත් ලෝභය එතැනයි. එය නොවන්නට ගමනක් ඇතිනොවන්නේය. දැකිය යුත්තේ එතැන, මෙතැන, වශයෙන් කොන්නොවූ මධ්‍යයි. දුක එතැනයි. මැද පවතින විඥාණමය තෘෂ්ණා සහගත ක්‍රියාකාරීත්ත්වයයි. යථාවබෝධයෙන් තොරවීම හේතුවෙන් ලෝභමූලිකව ඇති වූ අතනවල්, මෙතැනවල් හරහා අප කොතරම් දුරක් ගමන්කරන්නට ඇද්ද? අද දවසේ වුවද, ජීවිත ගමන එය තුලය. සංසාරය ද එතැනය. සත්‍යතත්ත්වය අවබෝධකර නොගත්තෙහි නම් ගමනෙහිද කොළවරක් දැකියහැකි නොවන්නේය. එසේ අවසනක් දැකියහැකි නොවන්නේ, ගමන සංඛත ධර්මතාවයක් බැවිනි. සැබෑවක් නොවන, එහෙත් නිර්මාණයකර සැබෑවක් ලෙස පවත්වාගනු ලබන්නක් බැවිනි. හේතුව වැරදිඅවබෝධයයි. අවිද්‍යාවයි.

නිවැරදි අවබෝධය, යථාවබෝධය ඇතිකර ගත් කල අවිද්‍යාව දුරුවී විද්‍යාව පහලවෙයි. සත්‍යයේ ආලෝකය දුටු තැනැත්තේ, අවිද්‍යා ගමන අත්හරින්නේය. නතරවන්නේය. නිමාවක් නොපෙනෙන ගමන පිළිබඳ අවබෝධය ඇතිවීම නිසා, අතරමඟදී නිමාවන්නේය. සසරදුකින් මිදීම එතැනවන්නේය.

## නිස්සරණය

මහණෙනි, නිස්සරණ (නික්මීම) ප්‍රතිසංයුක්ත වූ ධර්මයෝ තිදෙනෙක් වෙති. කවර තිදෙනෙක් ද යත්, යම් මේ ප්‍රථම ධ්‍යානයෙක් වේද, මෙය කාමයන්ගේ නිස්සරණයයි. හෙවත් නික්මීමයි. යම් මේ අරූපාවචර ධ්‍යානයෙක් වේද, මෙය රූපයන්ගේ නිස්සරණයයි. හේතුප්‍රත්‍යයෙන් හටගත්, එයින්ම රැස්කරනලද හේතුප්‍රත්‍යයෙන් උපන් යම් කිසිවක්වේද, ඒ ධර්මයගේ නිස්සරණය, පහවීම නිරෝධයයි. නිවරණය මේ නිස්සරණීය ස්වභාවයෝ තිදෙන වෙත්.

හැමකල්හි කෙලෙස්තවන වියයීඇති, කාම නිස්සරණයද, රූපයන්ගේ අතික්‍රමයද (අතික්‍රමෝපාද) දැන සියළු සංස්කාරයන්ගේ සංසිඳීම යැ'යි කියන්නා වූ නිර්වාණය ස්පර්ශකරන්නාවූ ඒ මහණතෙම ඒකාන්තයෙන්ම සම්‍යග්දර්ශී නම් වෙයි. යම් හෙයකින් ඒ කාමයන්ගේ නිස්සරණයන්, විශිෂ්ඨ ඥානයෙන් දැන නිමවනලද කෘත්‍යඇති ඒ රහත්මහණතෙමේ කාමාදී චතුර්යෝගයන් ඉක්මවූයේ නම්වෙයි.

(නිස්සරණීය සූත්‍රයෙනි)

## විමුක්තිය

වර්ණයෙන් තොර, විනිවිද පෙනෙන කිසිවක්, වර්ණවත් වූ කිසිවක්මත පතිනවන්නේද, වර්ණවත් වූ පසුබිමමත පතිතවන්නේද, ගැටෙන්නේද, යෙදෙන්නේද, එම පසුබිමෙහි වූ වර්ණයෙන්ම, වර්ණයෙන් තොර විනිවිද

පෙනෙන දෙයතුලින් දිස්වන්නේය. පෙනෙන්නේය. විනිවිදයන්නාවූ දෙය පිළිබඳව නොදන්නේ, දිස්වන්නාවූ වර්ණය විනිවිද දැකියහැක්කාවූ දෙයෙහි වර්ණයම ලෙස දකින්නේය. පිළිගනු ලබන්නේය.

දැකිය නොහැක්කාවූ ප්‍රභාෂ්වරවූ සිතද, පතිතවන්නාවූ පසුතලයන්, පසුබිම් අනුවම ඒවායේ වර්ණයන්, ඒවායේ ස්වරූපයන් අනුවම දිස්වන්නේය. සිතෙහි ප්‍රභාෂ්වර (විනිවිද යන) ස්වභාවය නොදන්නා තැනැත්තේ, සිත පතිතවී ඇති ගැටී ඇති, පහළවී ඇති, පසුබිමෙහි, වර්ණයෙහි, ධාතුවෙහි, ස්කන්ධයෙහි, දිරාපත් වන්නා වූ කයෙහි (ගතෙහි) ස්වරූපයම දකින්නේය. එයම සිත ලෙස සිතන්නේය. මෙනෙහි කරන්නේය. මඤ්ඤනා කරන්නේය.

එහෙත් ප්‍රඥාවවැඩූ තැනැත්තේ සිතෙහි විනිවිද පෙනෙන ප්‍රභාෂ්වර බව ප්‍රත්‍යක්ෂකර ඇත්තේ, සිත ගැටුන, පතිතවුන, ගැලුන, ඇලුන, කයෙහි හෝ ස්කන්ධයෙහි හෝ පසුබිමෙහි හෝ වර්ණයෙහි නොරැවටෙන්නේය.

හේ සිත, සිත ලෙසත්, පසුබිම හෝ ස්කන්ධය හෝ වර්ණය වෙන් වෙන් ලෙසින් නිවැරදිව දකින්නේය. ගත (ස්කන්ධය) හා සිත එකිනෙක පටලවා නොගන්නේය. එහෙයින්ම එහි නොරැවටෙන්නේය. නොඇලෙන්නේය. නොරැඳෙන්නේය. අවබෝධයෙන්ම ඉන් විමුක්ත වන්නේය. නිදහස් වන්නේය. තවදුරටත් වැරදි දැක්මක් නොවන්නේය. මිථ්‍යාව දුරුවූයේ, සිත, ගතින් වෙන්වුනේය. ස්කන්ධයෙන් බැහැරවුනේය. වර්ණයෙන් වෙන්වුනේය. පසුබිමෙන් වෙන්වුනේය. සිත ප්‍රභාෂ්වර වූයේ විය.

නාමරූප මුලාව මිස, පවතින කිසිවක් තවදුරටත් නොවුයේය.

ප්‍රභාෂ්වර සිතෙහි මෝහාන්දකාරයන් දුරුවී, ප්‍රඥාවේ ආලෝකය පැතිරගියේ විය. මායාරූපී වූ චිත්තවිකාරයන් ප්‍රඥාවේ ආලෝකය හමුවෙහි රැඳීගත නොහැකිවූයේ, පැවතිය නොහැකිවූයේ ශේෂයකින් තොරවම දැවීගියේ විය. නෂ්ඨවූයේ විය. විනාශවූයේ විය.

සියල්ල සන්සුන් විය. නිවුනේය.

## උපාදානස්කන්ධ

ස්පර්ශය ඇති වූයේ - සංඥාව බිහිවන්නේය.
සංඥාව බිහිවනුයේ සිතුවිල්ල බිහිවන්නේය.

බිහිවූ ස්පර්ශයද සංඥාවද සිතුවිල්ලද නොරැඳී නිරුද්ධවන්නේය.

නිරුද්ධවීමට අවස්ථාව නොතබන්නේ, සිතුවිලි දාමයක් ඇතිකර ගන්නේය. ඒවායෙහි ගැලෙන්නේය. වෙලෙන්නේය. සිතුවිලි පවත්වමින් ඒ තුලම අතරමංවන්නේය. වල්මත් වන්නේය. භවය එතැනය. එතැනම සංසාරයයි. සංසාර වට්ටයයි. සංසාර දියසුළියයි.

ඇවිදින්නට සිතන්නේ ඇවිදියි. භවය පවත්වයි. නවතින්නට සිතන්නේ නවතියි. භවය පවත්වයි. සිනහසෙන්නට සිතන්නේ සිනහසෙයි. භවය පවත්වයි.

කවර ආකාරයෙන් සිතුවිල්ල ඇතිවූයේ වුවද, භවය එතැනය. සිතුවිල්ලට නිමිතිවූ නාමරූප කෙරේ සිතුවිලි

දාමයක් පවත්වාගැනීම භව ගමනයි. අපමණ වූ සිතුවිලි පවත්වනුයේ සංසාරයක් හෙවත් අඛණ්ඩ ස්වභාවයක් පවත්වයි. එහි අග මුල නොපෙනෙනුයේ වල්මත් වෙයි. අතරමං වෙයි. දියසුළියකට හසුවූ පරඬලාපතක් මෙන් වෙයි. ගැලවීගත නොහැකිය. එහිම ගැවසෙන්නේ වෙයි.

රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාණ ලෙසින් වූයේ වුවද, ඵස්ස, වේදනා, සංඥා, චේතනා, මනසිකාර ලෙසින් වූයේ වුවද, නාමරූප ලෙසින් වූයේ වුවද, විඥාණය එතැන සිතුවිල්ලයි. පංචෝපාදානස්කන්ධයයි.

තෘෂ්ණාව යනු ඕනෑකමයි.

එයද සිතුවිල්ලයි.

සිතුවිල්ල පවත්වන්නට උපකාරවනුයේද සිතුවිල්ලක්මය. පහන්සිළුවත් දීප්තියත් මෙන් එකටම පවතින්නේය.

එහෙයින්, මෙහි සැබෑවූ ස්වරූපය යථාස්වභාවය අවබෝධකිරීම අපහසුය. අවබෝධකිරීමේ නොහැකියාව (අවිද්‍යාව) නිසාම සිතුවිලි ස්වභාවයන්හිම ඇලෙන්නේය. ගැලෙන්නේය. පවතින්නේය. කෙලවරක් අවසානයක් නොදකින්නේය.

සම්බුදුපියාණන් විසින් දක්වා වදාළේ මෙම ස්වභාවයන් හඳුනාගන්නා ආකාරයයි. හඳුනාගතහැකි ආකාරයයි. ඒවායින් ගැලවෙන ආකාරයයි. අවසාන කරන ආකාරයයි.

එහෙයින්ම උන්වහන්සේගේ දේශණය තුළ සිත මූලිකකොට දක්වා ඇත්තේය. සිතින් බැහැරලෝකයක්

හෝ භවයක් හෝ සංසාරයක් නොපවතින්නේය. අවබෝධ කළයුත්තේද, ප්‍රත්‍යක්ෂ කළයුත්තේද එම ස්වභාවයි. ධර්මතාවයයි.

කවරෙකු හෝ එම ස්වභාවයන් ප්‍රත්‍යක්ෂකරනු ලැබුයේද, හෙතෙම තවදුරටත් සිතුවිලි අතර අතරමං නොවෙයි. සිතුවිලි නොපවත්වයි. බැහැරවෙයි. සිතුවිලි හා නොගැටෙනවිට, සිතුවිලිවලට අනුව ක්‍රියා නොකරනවිට, සිතුවිලි අත්හරිනවිට ඉන් මිදුනේ වෙයි. ගැලවුනේ වෙයි. සිතුවිල්ලෙන් බැහැරවීමද සිතුවිල්ලකි. එය සිහියෙන් පවත්වනුයේ සම්මාසතියයි. නිවැරදි දැක්මෙන්යුතු සිතුවිල්ලයි. ඒ සිතුවිල්ල ස්වභාවය පිළිබඳ යථාවබෝධයයි.

සිතුවිල්ලම, ජීවත් කරවන්නාය.

සිතුවිල්ලම, සසර මවන්නාය.

සිතුවිල්ලම, භවය තනන්නාය.

සිතුවිල්ලම, උපද වන්නාය.

සිතුවිල්ලම, පවත්වන්නාය.

සිතුවිල්ලම, විඳවන්නාය.

සිතුවිල්ලම, වධකයාය.

සිතුවිල්ලම, මරන්නාය.

සිතුවිල්ලම, මාරයාය.

මාරයා පරාජය කරනුයේ, මාරයාගෙන් ගැලවෙනුයේ සිහියෙන් (සම්මාසතියෙන්) යුතුව සිතුවිල්ලෙන් බැහැරවිය යුත්තේය. එවිට ඉන් මිදුනේවෙයි.

ඉන් ගැලවුනේවෙයි.

නැවතුනේ වෙයි.

නැවතුනේ, නිරෝධයවේ.

## අඳුර හා ආලෝකය

පිස්සාය යනු චිත්තවිකාරයන්හි ගැලුන තැනැත්තාය.

ධනවත්වීමට සිතනුයේ, එම සිතුවිල්ලෙහිම ගැලෙන්නේය.

රජවෙන්නට සිතනුයේ, රජවීමේ සිතුවිල්ලෙහිම ගැලෙන්නේය.

උගතෙකුවීමට සිතනුයේ, ඉගෙනීමේ සිතුවිල්ලෙහිම ගැලෙනුයේ,

ව්‍යාපාරිකයෙකුවීමට සිතනුයේ ව්‍යාපාරික සිතුවිල්ලෙහිම ගැලෙන්නේය.

මෙවන් අනන්ත අප්‍රමාණ සිතුවිලි ඇතිකර ගනිමින් ඒවායේ ගැලීම සත්ත්වයාගේ ස්වභාවයයි. එවන් සිතුවිලි ඇතිකරන්නාසේම අත්හැරදැමීමද සත්ත්ව ස්වභාවයක් වෙයි.

තමන්තුළ ඇතිකරගත් චිත්තස්වභාවය තමන්හටම අගය ඇත්තේය. එබැවින් එහි රැඳෙන්නට, එයම

පවත්වන්නට හෙතෙම අනේක අප්‍රමාණවූ දුක් කම්කටොළුවලට මුහුණ දෙන්නේය. තමාගේ ඉලක්කය වූ අරමුණ (සිතුවිල්ල සාර්ථක කරගත් බවට සිතුවිල්ලක් පහළවනතාක් හෙතෙම ඇති වූ චිත්ත විකාරයන්හිම ගැලී සිටින්නේය.)

මේ කවරආකාරයේ සිතුවිලි (අරමුණු, චේතනා, විඥාණ) වුවද, වෙනස්නොවී නොපවතින්නේය. එහෙයින්ම සත්ත්වයෝ තම තමන්ගේ ඇවතුම්, පැවතුම්, ජීවන රටාවන් වරින්වර වෙනස්කරනු දැකිය හැකිවන්නේය.

සිතුවිල්ල සැබෑවූ ලෙසින් සිතන තැනැත්තේ, ඒ සැබෑව පවත්වාගන්නට, රැකගන්නට වෙරදරනුයේ එසේ නොකළහොත් තමන් ලද ජයග්‍රහණය, තමන් කෙරෙන් ගිලිහීයනු ඇතැ'යි සිතන බැවිනි. ගොඩනගාගත්සේ සිතන භෞතිකසම්පත් නැතිවී යනු ඇතැයි ඇතිවන බියෙනි, සැකයෙනි.

අයෙකු ජයග්‍රහණයක් ලෙස හඳුන්වනුලබන දෙය, ජයග්‍රහණයක් ලෙසින් සිත් ඇතිකරගන්නා අනෙකුත් උදවිය ජයග්‍රාහකයා ගෙන් ප්‍රයෝජන ගැනීමට සිතති. ජයග්‍රාහකයා වටා රොක්වෙති. ඔහුව අගය කරති. ඇතැමුන් තමන්ද ජයග්‍රහණයක් ලැබියයුතු ලෙසින් සිතති. ඒ අනුව ඔවුනගේ අභිමථයට රිසිපරිදි සිතුවිලි ඇතිකර ගනිති. ඒවායෙහි ගිලෙති.

තමන් ඇතිකරගත් සිතුවිලි ජාලයතුල වෙලෙන හෙතෙම තම අභිමතයට අනුකූලතාවය දක්වන්නන්,

සහය දක්වන්නන්, බුද්ධිමතුන්සේ දකිති. හිතවතුන් ලෙසින් ගනිති.

තම අභිමතයට එකඟනොවන්නේ මෝඩයින්සේ සලකති. ඔවුන් සතුරන්සේ සලකති. පිස්සන් යැ'යි කියාපාති.

අවාසනාවකට, තමන් වෙලීසිටින චිත්තවිකාරයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් ඔවුන්තුල පහලවන්නේ නැතිය. තමන් වෙලීසිටිනුයේ චිත්තවිකාර ජාලයක බැව් ඔවුනට නොපෙනෙන්නේය. තමන් දුවයමින් සිටිනුයේ මිරිඟුවක් පසුපසබැව් නොවැටහෙන්නේය. චිත්තවිකාරයන්ම තමන්ගේ ජයග්‍රහණයවන්නේය. චිත්තවිකාරයන්ම තමන්ගේ ලෝකයවන්නේය.

කොපමණ ජයග්‍රහණයන් ලැබුනේ වුවද, ඔවුන් සෑහීමකට පත්නොවන්නේය. කොපමණ අරමුණු ඉටුවූයේ වුවද තෘප්තිමත් නොවන්නේය. තව තවත් චිත්ත විකාරයන් ඇතිකරවමින් ඔවුන් ඒවා පසුපසින්ම හඹා යන්නේය. තම සිතුවිලි ජයගත්තේ හෝ වේවා, පරාජය වූයේ හෝ වේවා, කවර හෝ එක්තරා අවස්ථාවකදී ඔහු, ඔහුගේ චිත්තවිකාරයන්ද සමඟින් දුක උපදවමින් සම්මුතිමරණයකට පත්වන්නේය. මියයන්නේය. පුනර්භවය ඇතිවන්නේය. යළි උපදින්නේය. සිතුවිල්ල භව හේතුවකි. එය නිමාවනවිට තවත් සිතුවිල්ලක් ඇතිවෙයි. එය පුනර්භවයකි. සසර මෙසේ තැනෙන්නේය.

චිත්ත ස්වභාවයන් අවබෝධකළ සේඛ පුද්ගලයින්, තාදී තැනැත්තන්, චිත්තවිකාරයන්හි නොගිලෙති.

තමන්තුළ පහලවන චිත්තවිකාරයන් සිහියෙන් දකිති. හඳුනාගනිති. ඒවායින් බැහැරවෙති. ඒවා කෙරෙහි නොපිහිටති. නොපවත්වති. චිත්තවිකාරයන්හි නොගිලෙන බැවින් ඔව්හු නිරතුරුව සතුටින් වෙසෙති. පහසු ජීවිත ගතකරයි. සැනසෙති. තෘප්තිමත් වෙති. සැහැල්ලු දිවිපෙවතක් පවත්වති. කවදා හෝ දවසක දුකින් තොරව, බැඳීම්වලින් තොරව නිදහස්වූ සතුටු සිතින්ම සම්මුතිමරණයට පත්වෙති. මියයති. නොඇල්මෙන් භවය දුරුවූයේ විය. පුනර්භවයක් ඇතිනොවූයේ යලි නූපදින්නේය.

චිත්ත ස්වභාවයන් අවබෝධකර ගත් තැනැත්තේ ඒවායේ මුලා නොවන්නේ, අගය නොකරන්නේ ය. ඒවායෙහි නොගිලෙන්නේය.

චිත්ත ස්වභාවයන් අවබෝධ නොකළ තැනැත්තේ චිත්ත ස්වභාවයන්ම, විකාරයන්කර ගන්නේය. චිත්ත විකාරයන්හි ගැලෙන්නේය. ගිලෙන්නේය. චිත්ත විකාරයන්ම අගය කරන්නේය. තමන්ම බුද්ධිමත් ලෙස සිතන්නේය. පවසන්නේය. එළෙසින්ම හැසිරෙන්නේය. තම අභිමතයකට එකඟ නොවන්නන් පිස්සන් ලෙසින් දකින්නේය. පිස්සන් යැ'යි පවසන්නේය. තමන් විරාජමාන යැ'යි සිතමින්, හැසිරෙමින්, දුකින් දුකට පත්වන්නේය. ඒ බවක් ඔවුන්ට නොවැටහෙන්නේය. මුලාවෙහි ගැලෙන බැවින් භවයෙහි අතරමංවන්නේය. සංසාරවට්ටයට හසුවන්නේය. "සැපත" යයි සිතමින් දුක ම උපදවන්නේය. දුකම විඳින්නේය. පුනර්භවයම ඇතිකරන්නේය.

සත්‍ය අවබෝධකළ සේඛපුද්ගලයා, තාදීතැනැත්තේ මෙලොවද සතුටින් ජීවත්වෙති. මරණයෙහිද නොසැලෙති.

භවයෙහි ගැලීමක් නොවන්නේ සංසාරවට්ටයෙන් ගැලවෙති. සියල්ලෙන්ම නිරෝධවෙති. පරිනිර්වානයට පත්වෙති. නිවෙති.

## ප්‍රත්‍යාවේක්ෂය

විඥාණය යනු අතීත මතකයන්ද?

එය එසේ නොවේ.

විඥාණයයනු අතීත මතකයන් නොවන්නේ ද?

එය එසේ නොවේ.

විඥාණයයනු අතීත මතකයන් වන්නේත් අතීත මතකයන් නොවන්නේත් නොවේ ද?

එය එසේද වන්නේ නොවේ.

එසේ නම් විඥාණය කුමක්ද? අතීතය කුමක්ද? වර්තමානය කුමක්ද? අනාගතය යනු කුමක්ද?

මතකය වශයෙන් හැඳින්වුවද, විඥාණය වශයෙන් හැඳින්වූවද, එතැන ත්‍රිවිධ තෘෂ්ණාවන්ගේ ස්වභාවයයි. නාමරූපයෝ සංස්කාරයෝය. සංඛතයෝමය, මවාගත් -දේය. සිතාගත්දේමය. කාම, භව, විභව, තණ්හාවෝමය. මමය, මාගේය වශයෙන්, මමායනය, මමත්වය ආත්මදෘෂ්ඨි පහළවන ස්වභාවය විඥාණයි.

තත්කාලයේ, මේ මොහොතෙහිදී ඇතිවන ස්වභාවය ගැන විඥාණය උපාදානය වුවහොත් වර්තමානය නම්වූ ස්වභාවය බිහිවෙයි. විඥාණය, තෘෂ්ණාව හේතුවෙන් වර්තමානයක් පවත්වයි.

වර්තමාන ස්වභාවයෝ සහ තෘෂ්ණාවන් (විඥාණය) උපාදානයවන ආකාරයන්, අනුගතවන ආකාරයන් අනුව අනාගතය නම්වන සංස්කාර ස්වභාවයන් සැකසෙයි.

අතීතයනම්, ස්වභාවය සැකසී ඇත්තේද, පවතින්නේද තෘෂ්ණාව (පංචඋපාදානස්කන්ධ) හේතු ප්‍රත්‍යවීමෙනි.

වර්තමාන නම් ස්වභාවය පවතින්නේ ද, තෘෂ්ණාව (පංචඋපාදානස්කන්ධ) නම්වූ අතීත ස්වභාවයන් හා උපාදාන වෙමින් සැකසෙන හේතුවෙනි.

අනාගතය නම්වූ ස්වභාවයන් සැකසෙනුයේද තෘෂ්ණාව (පංචඋපාදානස්කන්ධ) ප්‍රත්‍යකරගනිමින් අතීතයේද, වර්තමානයේද සකස්වුනාවූ ස්වභාවයෝ හේතුවෙනි.

ඇසුනේය. එපමණි. ඇසුන ස්වභාවය නිරෝධයි.

ඇසුනේකුමක්දැ'යි විචිකිච්චාවක්, කුතුහලයක් උවමනා නැත. ඇසුනේකුමක්දැ'යි දැනගැනීමේ ස්වභාවය පහළවූයේනම් එතැන තෘෂ්ණාවයි. භවයයි. උපතයි. දුකයි.

දුටු ස්වභාවය, රස, නිරස ස්වභාවය, ගන්ධ ස්වභාවයද, දැනීම් ස්වභාවයද, යන මේ සියළු ස්වභාවයෝද ඇතිවූ ක්ෂණයකින්ම නිරෝධයවන්නේය. එපමණක්ම පමණි.

සක්කායදිට්ඨි, විචිකිච්ඡා, මෝහය, මුලාව, තෘෂ්ණාව, විඥාණය, නාමරූප, සංස්කාර එතැන නැත.

ඒවාට සැකසීමට අවස්ථාවන් එළැඹියේනම්, මහත් අනර්ථයකි. අභාග්‍යයකි. කෙළවරක් දැකිය නොහැකි භවයේ වැටීමකි.

එබැවින් කවරහෝ ආකාරයේ ගැටීමක්, ස්පර්ශ ස්වභාවයන් ඇතිවීමත්, එතැන්හිම සිදුවන නිරෝධයන් පමණක්ම මෙනෙහිවන අයුරින් සතිය, සිහිය පැවතිය යුතුය. මෙය හැඳින්වෙන තනි වචනය යෝනිසෝමනසිකාරය නම් වන්නේය.

## පෙර සිටි ආකාරයන් ප්‍රත්‍යාවේක්ෂය

මේ ජාතියෙහිදීම මම කළලයක්ව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

බිළිඳෙක්ව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

ළදරුවෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

දරුවෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

පාසැල් සිසුවෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

ක්‍රීඩකයෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත.මියගොස් ඇත.

ආදරවන්තයෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

රැකියා විරහිතයෙකුව සිටියෙමි. රැකියාවක් සොයන්නෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

පළතුරු වෙළෙන්දෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

දේශපාලනයේ නිරතවන්නෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

සමාජ සේවකයෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

ජවසම්පන්න තරුණයෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

අනුන් පෙළන්නෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

අන්අයව සුවපත් කරන්නෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

කෝපාවිෂ්ඨවී, මැරයෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

විධායක නිලධාරියෙකුව සිටියෙමි. ඒ වෙනස්වී ඇත. මියගොස් ඇත.

ධාර්මිකයෙකුව සිටින්නෙමි. ශීලයෙහි පිහිටා සිටින්නෙමි. ඒ වෙනස්වනු ඇත. මිය යනු ඇත.

මේ හැම වෙනස්වීමක් පාසාම කරජකය (දිරාපත්වන්නාවූ මේ ශරීරය) වෙනස්වී ඇත. සම්මුති

මරණයේදී, කරජකය අහෝසිවනු ඇත. දිරාපත්වනු ඇත. ක්ෂයවෙනු ඇත.

එහෙත් නාමරූප පරම්පරා ආශ්‍රිත ත්‍රිවිධ තෘෂ්ණාවෝ (විඥාණය) තව තවත් අනේක ඉපදීම් හා මරණ ඇතිකරනු ඇත. පවත්වනු ඇත.

මේ ජාතිය තුලදීම, මා විවිධ ස්වභාවයන්ට පත්වෙමින් ඉපදී ඇත. ඒවා අතහැර මියගොස් ඇත. සංසාර වට්ටය (දියසුළිය) භවය තුල මේ සියල්ල සිදුවෙමින්, ඇතිවෙමින්, නැතිවෙමින් ඉදිරියට ඇදී යයි. මේ කිසිවක් මට ඕනෑවූ දේ නොවේය. මා දත්දේ නොවේය. එහෙත් ඒවා සිදු වී ඇත.

ස්වභාවය ස්වභාවයලෙස හඳුනානොගැනීම නම්වූ අවිද්‍යාව හේතුකොට ගෙන උද්ගතවන්නාවූ සංස්කාරයන්, (වර්ගීකරණයන්) නාමරූප වශයෙන් උපාදානය කරමින්, තෘෂ්ණා හරිත භාවයෙන් නොමිඳුනේ නම්, අනන්තවූ අපරිමිතවූ කාලයක් සංසාරවට්ටයේ ගැලීසිටීමට සිදුවනු ඇත. භවයේ ඇදීයනු ඇත.

ධර්මතාවයම ස්වභාවයයි. ස්වභාවයේ ස්වභාවය වෙනස් වෙනස්වීම මයි.

## ආශ්වාස / ප්‍රශ්වාස

නිරන්තර සීඝ්‍ර ලෙසින් වෙනස්වන ස්වභාවයන්ය. එසේ වෙනස්වන ස්වභාවයන් අතර ස්වභාවයන් හේතුවෙන් පහළවන ස්වභාවයෝය.

චිත්ත ස්වභාවයෝය.

සංඥායැ'යිනම්වූ නාමරූප, සංඛාර නොවන්නට එම ස්වභාවයන් පිළිබඳ මෝහය, මුලාවන් ඇති නොවන්නේය.

ස්වභාවය තුලින් බිහිවූයේ වුවද, ස්වභාවය, සිත් එකිනෙක සමාන වේගයෙන් පහලවීම සිදුනොවන බැවින් පළමු සිත බිහිවී නිරෝධවනවිට ස්වභාවය තවත් බොහෝ ස්වභාවයන් ඇතිකොට, නැතිකොට අවසන්ය. එහෙයින් ප්‍රථම සිත නිරෝධවන්නේ දෙවන හෝ තෙවන හෝ එයටත් වඩා වැඩී ඇති ස්වභාවයක් ඇති තැනය.

ඒ වනවිට තවත්, තවත් ස්වභාවයන් හේතුවෙන් මතු වූ, නිරෝධයට පත්වන සිත් ජාලයක් පවතින බැවින් ඇතිවී නිරුද්ධවන සිත් ජාලයක් පවතින ලෙසක්, ස්වභාවයක් පවතී. සිතක් නිරුද්ධවන කාලයට පෙර ස්වභාවය තවත් ස්වභාවයක සිත් බිහිකොට ඇති බැවින් දෙවන සිත දකින්නේ එය බිහිවූ ස්ථානයේ නොව වෙනත් ස්වභාවයන් රාශියක් පවතින ස්වභාවය තුලය. එබැවින් එම සිත තුල දිස්වන්නේ සැබෑ ස්වරූපය නොව ඒ වනවිට බිහිවන ස්වභාවයයි. මංමුලාව එතැනය. දකින්නේ අතීතයයි. එහෙත් පෙනෙන්නේ එය වර්තමානය ලෙසයි. එය මුලාවක් නොවේ ද?

අතීතය, වර්තමානය, ඒවා ඇසිය, දැකිය, හැකි ඒවා නොවේය. නාමරූප සංස්කාරයන් හේතුවෙන් සම්මතයන් ලෙසත් පවත්වාගනු ලබනදේය. පැවතීමක් පෙනෙනුයේ, පවතිනුයේ පමාවූ සිත්වලය.

ස්වභාවය, නොපමාව දැකියහැක්කේද ස්වභාවයේද ස්වභාවයවන සිතෙහිද උත්පාද, නිරෝධයන් එක තැනදීම

දැකීමෙනි. ඒ සඳහා සිහිය, සතිය, මුලාවෙන් මිදුන සිත්, උපකාරී වේ. යෝනිසෝමනසිකාරයයි.

ආශ්වාසය, නාමරූපසංස්කාරයෝය. ආශ්වාසය අනිත්‍යය. ආශ්වාසය සමඟ ඇතිවන ආශ්වාසය දැකීමේ සිත ද අනිත්‍යය.

ප්‍රශ්වාසය අනිත්‍යය, ප්‍රශ්වාසය දකින සිතද අනිත්‍යය, ආශ්වාසය ඇතිකිරීමේ ඕනෑකමක් ආශ්වාසයට නැත. එහෙත් ආශ්වාසය ඇතිවන්නේය. නැති කිරීමේ ඕනෑකමක් ප්‍රශ්වාසයට නැත. එහෙත් ප්‍රශ්වාසය සිදුවන්නේය. එම ස්වභාවය සිහියෙන් අවබෝධකළ හැකිය.

ආශ්වාසය අනිත්‍යබව මෙනෙහි කරන්නේය.

ප්‍රශ්වාසය අනිත්‍යබව මෙනෙහි කරන්නේය.

ආශ්වාසය දැක්කේ සිතින්බව එවිට අවබෝධවන්නේ ආශ්වාසය අවබෝධකළ සිතින් අනිත්‍යබව මෙනෙහි වන්නේය.

ප්‍රශ්වාසය දැක්කේ, සිතින්බව එවිට අවබෝධවන්නේය.

ප්‍රශ්වාසය අවබෝධ කළ සිතත් අනිත්‍යබව මෙනෙහි වන්නේය.

ආශ්වාසය ඇතිවිට ප්‍රශ්වාසය නැතිබවත් අවබෝධ වන්නේය.

ප්‍රශ්වාසය ඇතිවිට ආශ්වාසය නැතිබවත් අවබෝධවන්නේය.

ආශ්වාසය දකින සිත ඇතිවන විට, ප්‍රශ්වාසය දකින සිත නැතිබවත් අවබෝධවන්නේය.

ප්‍රශ්වාසය දකිනවිට ආශ්වාසය දකින සිත නොමැති බවත් අවබෝධවන්නේය.

ආශ්වාස නම් නාමරූපය නොවන්නට, මෙනෙහි කිරීමක් සිදුනොවන බව අවබෝධවන්නේය.

ප්‍රශ්වාස නම් නාමරූප නොවන්නට, මෙනෙහි කිරීමක් සිදු නොවන බවත් අවබෝධවන්නේය.

ආශ්වාස අනිත්‍යය, යනුවෙන් සිහිකරන සිත, ආශ්වාසයත් එය සිහිකරන සිතත් පහළවීමත්, නිරෝධවීමත් අවබෝධ කරයි.

ප්‍රශ්වාසය අනිත්‍යය යනුවෙන් සිහිකරන සිත, ප්‍රශ්වාසයත් එය සිහිකරන (මෙනෙහි කරන) සිතත් පහළවීමත්, නිරෝධවීමත් අවබෝධ කරයි.

ආශ්වාසය අනිත්‍යය, ආශ්වාසය දකින සිතත් අනිත්‍ය වශයෙන් එකවර මෙනෙහි කරන්නට යන්නේනම්, ආශ්වාසයේ අනිත්‍යතාවය හා මෙනෙහි කරන සිතෙහි අනිත්‍යතාවය දැකිය හැක්කේ, ප්‍රශ්වාස ක්‍රියාවලිය තුල හෝ ඉන් ඔබ්බෙහිදීය.

එසේ සිදුවනුයේ ස්වභාවය, දෙස ස්වභාවයෙන් නොබලා ආශ්වාසය, සිත අනිත්‍යය, නිරෝධනම්වූ සංස්කාරක, නාමරූප උපාදානයකර ගැනීමේ හේතුවෙනි.

ආශ්වාසය අනිත්‍ය ලෙසත්, ක්ෂණයෙන් මෙනෙහි කළහැකිය. එය මෙනෙහිකළ සිතින් නිරෝධවනු දැකිය

හැකි ය. එය සිදුවිය යුත්තේ, ආශ්වාසය මතම පිහිටා මිස, ප්‍රශ්වාසයමතදී නොවේ. වරදින්නේ එතැනය. නාමරූප සංස්කාරයන් නොවන්නට මෙනෙහි කිරීමක් නොවනබවත් අවබෝධවන්නේය.

වෙනස්වන ස්වභාවයම අවබෝධවන්නේය.

වෙනස්වන ස්වභාවය යනු ද නාමරූපයෝය.

එම නාමරූප ස්වභාවයන් පිළිබඳවද අවබෝධවන්නේය.

මෙනෙහිකිරීම නාමරූපයෝය.

එම මෙනෙහිකිරීම නම්වූ නාමරූප පිළිබඳවද අවබෝධවන්නේය.

අවබෝධයද නාමරූපයකි.

අවබෝධය නම්වූ නාමරූපය පිළිබඳවද යථාස්වභාවය වැටහෙන්නේය.

සියල්ල පිළිබඳව යථා ස්වභාවය දැකීම නම් වූ ප්‍රඥාව එතැනය. එහි සමාධිය වැඩේ.

## ආනාපාන

ස්වභාවයකි.

(නාමරූපය) සංස්කාරය වෙයි.

ආශ්වාසයයි කියැවේ.

ස්වභාවයකි.

සංස්කාර (නාමරූප) වෙයි.

ප්‍රශ්වාස යයි කියැවෙයි.

සංස්කාර, නාමරූපය නොවන්නට ස්වභාවය පිළිබඳව කථිකාවක් නැත.

දීර්ඝ ආශ්වාසය, දීර්ඝ ප්‍රශ්වාස, කෙටි ආශ්වාසය කෙටි ප්‍රශ්වාසය, මෙකී නොකී විවිධාකාර සංස්කාර නාමරූපයන් මඟින් ස්වභාවය පිළිබඳව සැබෑ රූපයක්, මුහුණුවරක් පවත්වන්නටවීම හේතුවෙන්ම භවය ඇතිවෙයි.

ස්වභාවය දක්නට නැත. එය දැක්කේ ආශ්වාස හෝ ප්‍රශ්වාසය නම් වූ නාමරූප සංස්කාර ඔස්සේය.

නාමරූප සංස්කාරය හේතුවෙන්ම පහළවූ මනසිකාරය විසින්ම එවැනි තත්ත්වයක් දකිනුලබයි. දකින සිතද එතැනම නිරුද්ධවෙයි. එහෙත් ස්වභාවයේ වේගවත් ක්‍රියාකාරීත්වය හමුවේ පහලවන ප්‍රථම සිත නිරුද්ධවනවිට තවත් බොහෝ ස්වභාවයන් සමූහයක් සිදුවන්නේය. ඒ සමඟම පහලවන සිත් ද අපමණවත් ඇතිවී නිරුද්ධවන නමුදු, මුල්සිත පහලවී නිරුද්ධවන්නට පෙරදීම ස්වභාවයේ තවත් තවත් පහල වීම. නැතිවීම හේතුවෙන් මුල් සිත නිමාවන විට දෙවන තෙවන අවස්ථාවන්හි ගැටෙමින් ඒවායින් පහලවන සිත් ද අඛණ්ඩව ගලා ඒම හේතුවෙන් එක් සිතක නිරෝධයදැකීමට නොහැකිව සිත් පරම්පරාවක් දකියි. ඒ සිත් පරම්පරාව එකක් නොව, එකිනෙක සුන්බුන් බවත් නොවැටහේ.

මුල් සිත නිමාවන විට වෙනත් ස්වභාවයක්ද පහළවී ඇති බැවින් දෙවන, තෙවන, සිත් පහලවී නිරෝධවන විට, තවත් බොහෝ චිත්ත ස්වභාවයන් පහළවී අවසන් වන්නේය. මුලාව ඇතිවන්නේ එතැනය. භවය ඇතිවන්නේ එතැනය.

මුල් සිත පහළ වී නිරෝධවත්ම, ස්වභාවය බොහෝ දුරට ගමන්කර තිබේ. එහෙත් මුල් සිත බැහැරවත්ම දෙවන සිත දකින්නේ බොහෝ දුර ගොස් ඇති ස්වභාවය මතදීමය. එහෙයින් මනසිකාරය පවතින්නේ යථාස්ථානයේ නොව, පෙර අවධියකය.

එබැවින් යථාස්වභාවය තුළ මනසිකාරය දකින්නේ මේ ක්ෂණයේ පහලවන සිත මේ ක්ෂණයේ නොව, මොහොතකට පෙර පහලවූ නිරෝධවන සිතක් මය.

මේ මොහොතේ ඇතිකරන සිත් ස්වභාවයේ වේගවත් ක්‍රියාවලිය අනවබෝධය නිසා දකිනුයේ, පසුකලෙක හෙවත් අනාගතය නම්වූ සංස්කාරය තුලය. අවිද්‍යාව එයමය. මෝහයද එයමය.

ආශ්වාසය ඇතිවීම නිමාවෙයි. පහළවන සිතද ඒ සමඟම නිමාවෙයි.

ප්‍රශ්වාසය සමඟම ඇතිවන සිතද ප්‍රශ්වාසය නිමාවත් සමඟම නිමාවෙයි.

දැකියයුත්තේ එයයි. එවිට ස්වභාවයේ පැවැත්මත් නිරෝධයත් එතැනම වන්නේය.

ආශ්වාසය (ස්වභාවය) සමඟ ඇතිවන මනසිකාරය, නාමරූප සංස්කාරයන් වශයෙන් හැඳිනගැනීම්වලට

යොමුවූ කල, ස්වභාවය පිළිබඳ සැබෑතත්ත්වය යටපත් වී, අස්වාභාවික අයුරින් නාමරූප සංස්කාරයන් හමුවේ වල්මත් වෙයි. මුලාවට පත්වෙයි. එසේ මංමුලාවට පත්වන්නේ කවරදාක කෙසේනම් ඉන් මිදෙන්නට දැ'යි නොදන්නාහුය.

එබැවින් ස්වභාවය හා උත්පාද, නිරෝධයම පමණක් දැකීමට සමත්විය යුතුය.

ඒ සඳහා සිහිය පැවැත්විය යුතු ය.

එවිට එතැන සංස්කාර, භව, නාමරූප නොමැති බැවින් පහළවන්නේ සම්මාසතියයි. නිවැරදිසිහියයි, යෝනිසෝමනසිකාරයයි.

මේ යථාස්වභාවය දැකීමනම්වූ ප්‍රඥාවයි.

සංස්කාර, නාමරූපයනු ක්ලේශයයි.

සමාධිය හා ප්‍රඥාව පහලවූකල,

එතැන නිරෝධයයි.

ඇතිවීම, නැතිවන්නාක් මෙන්ම, ඒවායේ ශේෂයක්ද නොවන්නේය.

උපාදානයක් නොවන බැවින් නිරෝධයක්ද නොවන්නේය. දැන් දකිනවාය. දැන් දැනෙනවාය යනු මුලාවකි. ඒ මනසිකාරයකි. පහලවීමක්ම පමණි. අතීත සිද්ධිය (විඥාණය) වර්තමාන සිද්ධිය හා අනුගතවීම පමණකි.

දැන් දැකීමම මුලාවය. මෝහයමය. අවිද්‍යාවය. දැන් දකිනදෙය හඳුනාගත හැකිවූයේ පෙරදී දැකහඳුනා ගොඩනැඟු නාමරූපයන් හේතුවෙනි. පංචෝපාදානස්කන්ධය යනු එම ස්වරූපයයි.

කවරෙකුහට හෝ වේවා, වත්මන් භවයේදී අතීතභවයන් පිළිබඳව, තථාගතයන් වහන්සේ විසින් දේශනාකොට ඇත්තේද එබැවිනි.

මේ අතීතසිදුවීම් ජාලයෙන්මිදී, සැබෑ ස්වභාවය හඳුනාගත යුතුය. එයම විදර්ශණාකළ යුතුය. එළැඹී සිහියෙන් සිටිය යුතුය.

අතීත සංස්කාරයන් ගෙන් මිදීම නිසා තවදුරටත් ඒවා පවතින්නේද නැත. අතීතයතුළ රැඳීමම දුකට හේතුවය. දුකනම් මාරයාය. අතීත මනසිකාරයෙන්, අවබෝධයෙන් ඉන් බැහැරවීම, චිත්තවිකාරයන් පරාජය කිරීම මාරපරාජයකිරීම වන්නේය.

## විමුක්තිය පිළිබඳ කරුණු අට

01. ශරීරය පිළිබඳව සංඥා ඇත්තේ, රූප බලයි.

02. තමන් පිළිබඳව රූපසංඥා නැත්තේ, බාහිරරූප බලයි.

03. අසුභය යන හැඟීමෙහි නිරතවෙයි.

04. රූපසංඥා සම්පූර්ණයෙන් බැහැරකොට ආකාසය අනන්තයයි සලකමින් ආකාසානඤ්චායතනයට එළඹ වසයි.

05. කෙනෙක් ආකාසානඤ්ඤායතනය ඉක්මවමින් විඤ්ඤාණය අනන්තයයි සළකා විඤ්ඤාණඤ්චායතනයට එළඹ වසයි.

06. කෙනෙක් විඤ්ඤානඤ්චායතනය සම්පූර්ණයෙන් ඉක්මවා අකිඤ්චඤ්ඤායතනයට එළඹ වසයි.

07. කෙනෙක් ආකිඤ්චඤ්ඤායතනය සම්පූර්ණයෙන් ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට එළඹ වසයි.

8. කෙනෙක් නේවසඤ්ඤානාසඤ්ඤායතනය සම්පූර්ණයෙන් ඉක්මවා සංඥාවන්ගේ හා වේදනාවන්ගේ නිරෝධය වන සඤ්ඤාවේදයිත නිරෝධයට එළඹ වසයි.

## අවස්ථාව නොදිය යුතුය

මාරයා යනු මරණය නොවේ.

දුකය.

දුක දරාගැනීමට අසමත්වන ඇතැමුන් දුකින් (මාරයාගෙන්) බේරීම සඳහා,

මරණය සොයා යයි.

මරණය තවත් උපතකට හේතුවක් පමණි.

උපත  යනු තවත් දුක් කන්දරාවක් ඇති කරවන්නකි.

එබැවින් මාරයානම්වූ දුකින් මිදීමට කළයුත්තේ, දුකට හේතුවන්නාවූ ධර්මතාවයන් පිළිබඳව අවබෝධය ලබා ඉන් ගැලවීමයි.

අරමුණ පහළවූයේ කවර ක්ෂණයකද?

කුමන ආකාරයකින් හෝ අරමුණ හා බැඳුනේද?

එසැනින් උපන්නේවේ.

උපන්නේ දුකමවේ.

එවන් උපතම මාරයාහට අවස්ථාව උදාකරදීමකි.

අරමුණ (ආරම්මණය) පහලවූ ක්ෂණයෙහිදීම, එහි නොඇලී (සංස්කාර) අත්හැරෙන්නට ඉඩහැර, සිහිය පවත්වනුයේ, දුක ද පරාජය කරන්නේය. මරුවාහටද අවස්ථාව නොතබන්නේය.

## නැවතීම

භෞතිකදේමත ගැලෙමින් යථාර්ථය දැකිය නොහැකිය.

භෞතිකත්ත්වයමතින් ඉවත්වී යථාර්ථය දකිනකල පරමාර්ථ සත්‍යය හමුවෙයි.

යථා, යථා, ස්වභාවයන් තථා, තථා, පරිදි දකිනකල ප්‍රඥාව පහළවෙයි.

එවිට ස්වභාවයන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්මතාවයන් පිළිබඳව සැබෑස්වරූපයන් අවබෝධවී ඇති බැවින් ස්වභාවයන් හා උපාදානයන් නොවන්නේය. නිසළ වන්නේය. සමාධිය වැඩෙන්නේය. සමාධිය යනු අරමුණු ඇතිකර නොගැනීමය. අරමුණුවල නොගිලීමය.

යථා - යථා ස්වභාවයන් පිළිබඳව තථා - තථා පරිදි මෙනෙහිකළ යුතුය. අවබෝධකළ යුතුය. එය

සිදුකළහැක්කේ යෝනිසෝමනසිකාරයෙන් (සිහියෙන් /සතියෙන්) පමණි. යථා - යථා ස්වභාවයන් තථා - තථා අයුරින් මෙනෙහි කිරීමේදී, පහලවූයේ අවබෝධ ඥාණය හෙවත් ප්‍රඥාවය.

සැබෑ තතු (විද්‍යාව) දකින විට අවිද්‍යාව දුරුවන්නේය. අයෝනිසෝමනසිකාර (අසිහිය/අවිද්‍යාව) දුරුවන්නේය.

තෘෂ්ණාව පළායන්නේය. ත්‍රිවිධතෘෂ්ණාවෙන්ම, දුරුවන්නේය. තෘෂ්ණාව දුරුවනවිට අරමුණු නොවන්නේය. අරමුණු නොවුන තැන සමාධියයි.

## නෙක්කම්ම

නෙක්කම්මය යනු අත්හැරීම නොව, අත්හැරෙන්නට ඉඩහැරීමය. එය මේ ක්ෂණයෙහිම සිදුවිය යුත්තේය. නැවත නොඇලිය යුත්තේය.

අත් හරින්නටනම්, සත්‍ය වශයෙන් කිසිවක් තිබිය යුතුය. මෙහි එවැනි සත්‍යවශයෙන් ගතහැකි, ගතයුතු කිසිවක් නැත. ඇත්තේ සංඛතයෝය. සංස්කාරකයෝය. මවාගත්තාවූ දේය. මම, ගැහැණිය, පිරිමියා, ළමයා, අහස, පොළොව, ඉර, හඳ, තරු, ගහකොළ, ගේ දොර, ධන ධාන්‍ය.. මෙකී නොකී සියල්ලෝම නාමරූපයෝය. සංඥාවෝය, ක්ලේශයෝය. උපධීන්ය. මේවා අනේකාකාරවූ වෙනස්වීම් ක්‍රියාවෝය. ස්කන්ධයෝය. එකිනෙකට පරස්පර විවිධ ක්‍රියාවන්නිසා නිරන්තරයෙන් වෙනස් වන්නෝය.

එවන් ස්කන්ධයෝ, සත්ත්ව පුද්ගලාදී වශයෙන් නාමරූපයෙන් අල්ලාගැනීම අවිද්‍යාවමය. අනවබෝධයයි. නොදන්නාකමය.

මේ පිළිබඳව යථාවබෝධ පහළවීම, විද්‍යාව පහළ වීමය. සත්‍යදැකීමය. නාමරූපයෙන් බිහිවන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය් සිහියෙන් දැකීමඔස්සේ මෙනෙහිකිරීමඔස්සේ නාමරූපයන් කෙරෙහි පහළවන ත්‍රිවිධ තෘෂ්ණාවන් උපාදානයවීම බැහැරවන්නේය.

නාමරූප කෙරෙහි ඇතිකරගන්නාවූ තෘෂ්ණාවන් හෙවත් සිතුවිලි හේතුවෙන් භවය තැනෙන්නේය. සංසාරය පවතින්නේය.

නාමරූප කෙරෙහි තෘෂ්ණාවන්ගේ පහලවීම සිදුනොවන කල, නාමරූපයන්ගේ අනිත්‍ය ස්වභාවයන් පෙනෙන්නේය. නාමරූපයන් ගෙන් ඇතිවන දුක පෙනෙන්නේය. නාමරූප කෙරෙන් ගතහැකි හෝ නාමරූප කෙරෙන් පවතින කිසිවක් නොමැතිබව අවබෝධවන්නේය. එවිට නාමරූප කෙරෙහි උපාදානයන් සිදුවන්නේ නැත. අත්හැරන්නේය. නිරෝධවන්නේය. කිසිවෙකු විසින් අත්හරිනවා නොව, තණ්හාව විසින් උපාදානයකර ගෙනතිබූ ක්ලේශයන් තෘෂ්ණාවට සාපේක්ෂව ඇතිවන සිහිය ක්‍රියාත්මක වනකල නිරුද්ධවන්නේය. එසේ සිදුවන නිරෝධයේදී එහි ශේෂවන කිසිවක් නොවන්නේය. දුක කෙළවර වන්නේය. නෙක්කම්මය සිදුවන්නේ එසේය.

## විශ්වාසය හා මුලාව

එකම තැනෙකින් කපා පදම්කොට ගත් මැටි ගොඩකින්, විවිධ ආකාරයේ අනුරූප නිපදවියහැකිය. එසේ නිපදවන්නා වූ අනුරූප විවිධ නම්වලින් හැඳින්විය හැකිය.

එවන් රූපයන් කවර නාමයන්ගෙන් හැඳින්වූයේ වුවද එහි පවතිනුයේ සංඛතවූ නාමරූප නොව, මැටිටමය.

සංඛත වූ නාමහේතුවෙන්, රූපය එම නාමයට ප්‍රත්‍යය වූ බැවින්ම, පවතින දෙයක් ලෙසින් ග්‍රහණය කරගැනීම පෘතග්ජන ස්වභාවයයි.

විශ්වාසය ඇත්තාහට ගලින් කළේ වුවද, මැටියෙන් කළේ වුවද, එය දෙවිරුවකි. පිදිය යුත්තකි.

එවන් විශ්වාසයක් ඇතිකර නොගන්නේ, එය මැටි ගොඩක් හෝ කලුගලක් ලෙස විනා, වෙනත් අන්ධ භක්තීන්, ඇගැයීම්, ඇතිකර නොගන්නේය.

නාමරූපප්‍රත්‍යයට යටත්ව විශ්වාසයක් ගොඩනගාගත් තැනැත්තේ, එම විශ්වාසයටම යටත්වූ වහලෙකුවන්නේය. තමන් ඇතිකරගත් වහල්බවින් මිදිය හැක්කේ, යථා ස්වභාවයන් පිළිබඳව සැබෑ අවබෝධය ලැබීමෙන්, තමා විසින්ම ඇතිකරගත් මිථ්‍යාවිශ්වාසය බැහැරකිරීමෙන් පමණි. අයෙකුතුළ ඇතිවූ මිථ්‍යා විශ්වාසය අන් කවරෙකුහට හෝ වේවා බැහැරකළ නොහැක්කේමය. එයින් බැහැරවිය යුත්තේ එවන් මිථ්‍යා විශ්වාසයක් ඇතිකරගත් තැනැත්තේමය.

ස්පර්ශය දැනගන්නේ විඥාණයයි. ඒ ස්පර්ශය යම් කිසිවක් ලෙස හඳුනාගත්තේ එම මොහොතේ දීම නොවේ. ඒ පෙරදි දැනුන ස්වභාවයකි. එහෙත් එම මොහොතේ දී ඇති වූ ස්පර්ශය සමඟම පහලවන දැනීම (විඥාණය) අලුත් දෙයක්සේ ගෙන එයවටා සංස්කාර උපදවයි. අලුත් යමක් මවයි. එවන් මැවීම් පිළිබඳව පහලවන හැඟීම් අනුව ආස්වාදයද, ආස්වාදයේ ඵලයලෙස සක්කාය දිට්ඨිය ද (නාමරූප වශයෙන්) පවත්වයි. එවිට නාමරූප ස්පර්ශ ස්වභාවයේ අවසන් ඵලයලෙස දැකියහැකිය. සක්කාය දිට්ඨිය (නාමරූපය) ප්‍රත්‍යකොට ගෙන ආස්වාදය ලබනවිට හැඟීම්නොවන අරමුණු ලෙසින් සංඥාව පවතින්නේය. අරමුණු අනුව සංස්කාරයෝ මවන්නේය. මැවීම් අනුව දැනෙන්නේය. ආශාවන් උපදින්නේය. විඥාණය උපදානයවන්නේය. වැඩෙන්නේය.

එවිට නාමරූප පවතින බැවින්, ඒවා විදීම් ඇතිවන ලෙසින් වැටහෙන්නේය. මෙම වැටහීම වැරදි (අවිද්‍යාව)ය. නිවැරදි ස්වභාවය නම්,

රූප හේතුවෙන් ආස්වාදය ඇතිවූවා නොව විඥාණය (දැනීම්) හඳුනාගැනීම් ස්වභාවයමත සංස්කාර ලෙසින් මවාගැනීම් ඇතිවීමය. එවන් මවාගැනීම් කෙරෙහි හැඟීම් පහල වීමය. පහලවන හැඟීම් උපාදානය කරමින් ආස්වාදය පහලවීමය. ආස්වාදය කෙරෙහි බැඳෙමින් සියළුදැනීම් විදීම්, හැඟීම් ස්කන්ධයන් සත්‍යලෙස තිබෙන, නිත්‍යවූ සැබෑවූදේ ලෙසින් අරමුණු බිහිකර ගැනීමයි.

හැඟීම් අරමුණුබවට පත්විය. අරමුණ, භවය ඇති කරන්නට සමත්විය. ආස්වාදය සොයන්නටවිය. නොනවතින ගමන ඇතිවිය. සංසාරවට්ටය බිහිවිය.

දැනීම් හා ආස්වාදය (විඥාණය/වේදනා) හැඟීම් (සංඥා) සමඟ මුසුවූයේ, පැහැදිලි ජලයට වර්ණයන් එක් වූ සේ යථාස්වභාවයේ වෙනස් ආකාරයකට පත්වන්නේ, එතැන් සිට සැබෑස්වරූපය නොව මුලාවම (දැනීම වැටහීම වේ.) සක්කායදිට්ඨියම පවතින්නේය.

ස්පර්ශ, සංඥාවලින් පහලවන හැඟීම්, සමඟම පහලවන දැනීම්, (විඥාණය) කෙරෙහි සංස්කාර (මවාග ැනීම්) හැඟීම් (සංඥා) සමඟ උපාදානයවන්නට ඉඩනොතබා සිහිය පවත්වන්නේනම් සංඥාව, සංඥාව තුලම නිමවන්නේය. හැඟීම, හැඟීම ලෙසින්ම නොවැඩී නිමවන්නේය. එවිට ආස්වාදයක් නැත්තේය. ඉන් ඔබ්බට සක්කාය දිට්ඨිය (නාමරූප) නැත්තේය. එතැන යමක් නැති බැවින්, භවයක් (පවත්නා ගැනීමක්) නොවන්නේය. ගමනක් නොවන්නේය. නවතින ගමනක් නැත්තේය. ගමන නිමවන්නේය.

කඩදාසිකැබැල්ල නෝට්ටුවක් බවට පත්වන්නේය. කඩදාසිකැබැල්ල බව අමතකවන්නේය. කඩදාසි කැබැල්ල මත සටහන්වන සළකුණු (සංඥා) අනුව වටිනාකම තක්සේරු කරන්නේය.

කඩදාසියද සැබෑ ස්වරූපයක් නොවේ. එය වෙනත් හේතුන්ගෙන් සැදුම්ලද්දකි. එවන් ස්කන්ධයක් කඩදාසිය නමින් (නාම/රූප) හඳුන්වාගන්නට විය. එය මත සළකුණු (සංඥා ඇතිකරමින් ඒ කෙරෙහි බැඳීම් ඇති කරන්නේය. සළකුණු යෙදුනේද වෙනත් ස්කන්ධයන් ගෙනි. ඒවා වර්ණයන් ලෙසින් ගනිති. කඩදාසියමත යෙදෙන සලකුණු අනුව එය මුදල් නෝට්ටුව වශයෙන් (නාමරූප) විය.

එතැන වටිනාකමක් බිහිවිය. වටිනාකම කෙරෙහි බැඳුන සිත්ඇතියෝ ඒවා රැකගන්නට, උපයන්නට වෙරදරන්නට වන්නේය. එතැන ලෝභය බිහිවුනේය.

ලෝභය නිසා රැකගැනීමේ ඕනෑකම බිහිවිය. රැකගැනීමේ ඕනෑකම නිසා නැතිවේ යැ'යි යන හැඟීම් (සංඥාව) බිහිවිය. එනිසාම බිය උපන්නේය. බිය නිසාම ආරක්ෂාව පතා අවිආයුධ ද ඇතිකර ගන්නේය. සටන් ඇතිකර ගන්නේය. සටනේ වැදී අයසට පත්වූකල සටන් අත්හැර සාමය (නිස්සරණය) සොයන්නට වන්නේය.

කඩදාසි, සලකුණු, මුදල්නෝට්ටුව සම්මතයක් නොවේද? සම්මතය තුලින් බිහිවූයේ ලෝභය, ද්වේශය, මෝහය නොවේද?

මේ මුලාවක ගැලී ලැබුයේ මෝඩ ආස්වාදයක් නොවේද? මෝඩ ආස්වාදය නිසා ලැබුනේ දුක්ඛදායක ආදීනවයක් නොවේද? එම ආදීනවය දරාගැනීමට නොහැකිවීම නිසාම (සාමය) නිස්සරණය සොයන්නට සිදුවූයේ නොවේද?

සත්‍යය මෙසේ පැහැදිලිව, දැකිය හැකිව තිබියදී සම්මතයන් හා ගැලී, දුකට පත්වනුයේ නම් ඒ ඥාණවන්ත ක්‍රියාවක් වන්නේ ද?

ධර්මචක්ෂුයය (දහම් ඇස) පහලවන තෙක් සත්ත්වයා අන්ධයි. යනුවෙන් තථාගත සම්බුදු පියාණන් වහන්සේ විසින් වදාරා ඇත්තේ මේ තත්ත්වයම බව වටහා

ගන්නේ නම්... එවැන්නන් කොතරම් භාග්‍යවන්තයෝද, ප්‍රඥාවන්තයින්ද, අවාසනාවකතරම, සඳහම් ආලෝකය පෙනි පෙනී තිබියදීම තෘෂ්ණාභරිත සත්ත්වයෝ ලෝභ, දෝෂ, මෝහයන්ම ග්‍රහණය කරමින් දුකට පත්වෙති. දුකෙන් මිදීමට යැ'යි කියමින් දුකම වැළඳ ගනිති.

## නිරර්ථක ලාභ ප්‍රශංසා

මහණෙනි, ලාභ, සත්කාර, කීර්තිප්‍රශංසා දරුණුය. මහණෙනි, මෙහි මම ලාභසත්කාරයෙන් මඩනාලද, ගන්නාලද, සිත්ඇති, කාබුන්මරණින් මතු සැපයෙන් පහවූ නපුරුගතිඇති විවසව පතිතවන නිරයට පැමිණි ඇතැම් පුද්ගලයෙකු දකිමි.

මහණෙනි, මෙහි මම අසත්කාරයෙන් මඩනාලද ගන්නාලද සිත්ඇති කාබුන්මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගතිඇති විවසව පතිතවන නිරයට පැමිණි ඇතැම් පුද්ගලයෙකු දකිමි.

මහණෙනි, මෙහි මම සත්කාරයෙන් ද, අසත්කාරයෝද යන දෙකින්ම මඩනාලද, ගන්නාලද සිත් ඇති කාබුන්මරණින් මතු සැපයෙන් පහළූ, නපුරු ගතිඇති විවසව පතිතවන නිරයට පැමිණි ඇතැම් පුද්ගලයෙකු දකිමි.

මහණෙනි, ලාභ, සත්කාර, කීර්තිප්‍රශංසා මෙසේ දරුණුය. තියුණුය. රළුය. අනුත්තරවූ අරහත්වාවබෝධය පිණිස අන්තරායකරය, මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මියයුතු.

උපන් ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා බැහැරලන්නෙමු. උපන් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ සිතගෙණ නොමසිටින්නේය'යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුමය. සත්කාර කරණුලබන අප්‍රමාණ සමාධිවිහරණ ඇති, යමෙකුගේ සමාධිය අසත්කාරයන්ද, සත්කාරයෙන්ද යන දෙකින් නොසැලේද?

ධ්‍යාන කරණසුළු සත්තක්‍රියා ඇති, සූක්ෂම දෘෂ්ඨී හා විදර්ශනා ඇති, උපාදානක්ෂය සංඛත නිවනෙහි ඇලුණු ඔහුට සත්පුරුෂයයි කියති.

(ලාභ සත්කාර සංයුක්තය)

## නම්බුනාම මායා

ආචාර්‍යවරුන්ද මියයති. මහාචාර්‍යවරුන්ද මියයති. උගතුන්ද මියයති, පණ්ඩිතයින්ද මියයති. අග්ගමහාපණ්ඩිතත් මියයති. මෝඩයාත් මියයන්නේය. මරණයට පත්වූ තැන, අග්ගමහාපණ්ඩිත කියා හෝ මෝඩයා කියා හෝ කිසිදු වෙනසක් නැත්තේය. අග්ගමහාපණ්ඩිත හෝ මෝඩ යනු ජීවත්වන කාලයතුල ජීවත්වන්නන් විසින් සංඛිතකරගත්, මවාගත්, සංස්කරණයකරගත්, (සකස්කරගත්) තණ්හාව පවත්වාගන්නට අගයක්ඇති නැති බවත්, පවත්වා ගැනීමට උපයෝගීකරගත් නාම රූප මායාජාලයක් පමණි.

අනිත්‍යවූයේ නිත්‍යනොවන්නේය. යමක්වූයේ මායාවකි. සදාකාලික නොවන්නේය. වෙනස් වන්නේය.

අනිත්‍යමායාව නිත්‍යලෙස ගැනීමෙන් පංචෝපාදානස්කන්ධය උද්ගතවෙයි. සංඥාවන්

ඇතිවන්නේය. නාමරූප ඇතිවන්නේය. මනසිකාර ඇතිවන්නේය. මේ සියල්ල පවත්වාගැනීමේ තෘෂ්ණාව ඇතිවන්නේය. එතැන විඥාණ යළිත් උද්ගතවන්නේය.

මේ එක් තැනකින් පටන්ගෙන තව තැනකින් නිමාවන ස්වභාවයක් නොවේ. එකෙකින් අනෙකකට, එයින් තවකෙකට වශයෙන් වෙනස් වෙනස්වන්නාවූ ස්වභාවයන් උපාදානකරමින් එකතැන කරකැවෙන්නාවූ සුළියක්බඳු ක්‍රියාදායමකි. එහි ඇරඹුමක්, මුලක් දකිනවානම්, දකිනුයේ පංචෝපාදනස්කන්ධයන්මය. බලනවානම් බලන්නේ, විඳිනවානම් විඳින්නේ පංචෝපාදානස්කන්ධයන්මය.

රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාණ, පංචෝපාදානස්කන්ධයෝය.

ඇස, කන, නාසය, දිව, ශරීරය, අභ්‍යන්තර ආයතනයන්ය.

මේ කවරකින්වුවද උද්ගතවන්නාවූ ස්වභාවයෝ. අනිත්‍යය.

අනිත්‍යය, නිත්‍යවශයෙන් ගැනීම දුකය. දුක ඉපදීමේ හේතුවය. දැකිය නොහැකිය. පැවතුමක් නැත්තේවුවද පැවතුමක් ලෙසින් දැකිය හැකිය. එහි යථා ස්වභාවය අවබෝධකර ගැනීමකින් තොරව නැවැත්වියද නොහැකිය.

සැබෑතත්වයන් ප්‍රත්‍යක්ෂවූකළ ඇරඹුමක් අවසානයක් (උත්පාද, භංග) හැරුනුකොට අන්කිසිවක් නැතිය.

නැතිදෙයක පැවැත්මක්ද නැතිය. පැවතුමක් නැතිදෙයක නැවතුමක් පිළිබඳව ගැටලුවක් පැන නොනගී.

ස්වභාවයක් ඇතිවිය. එසැනින්ම එය නැතිවිය. හඳුනාගැනීමක් (සංඥාවක්) නොවීය. වර්ගකිරීමක් (සංස්කාරයක්) නොවීය. වර්ගකිරීමක් බෙදීමක් නොවන හෙයින් නාමරූප නොවීය. නාමරූප නොවූයේ,හඳුනාගත හැකි ස්වභාවයක්, ඕනෑකමක්, තෘෂ්ණාවක් (විඥාණය) නොපිහිටියේය. නූපන්නේය.

## නිසරු වාද විවාද

වාදවිවාද නිශ්ඵලයෝය.

දොරක් අඩවන් ලෙසින් තිබුණේ යැයි සිතමු.

දොර භාගයට වසාඇතැ'යි අයෙකු පවසනු ඇත.

දොර භාගයට විවෘතකරඇතැ'යි අනෙකෙකු පවසනු ඇත.

එවන් කරුණක් කෙරෙහි එළැඹ වාදවිවාදකර කවර නම් නිගමනයකට එළැඹිය හැකි ද?

වාදයකට එළඹුනේ ඔවුනොවුන් දරාගත් දෘෂ්ඨීන් (දැක්ම) අනුව මිස, සැබෑ ස්වභාවයමත නොවේ.

ඉහළ හොඳබව එහි සිටින්නා පැවසිය හැකිය.

පහළ හොඳබව එහි සිටින්නා පැවසිය හැකිය.

ඉහළ සිට එහි කළකිරුණ තැනැත්තේද පහළ හොඳබව කිවහැකිය.

මේවායේ කවර සත්‍යයක් ද?

එකිනෙකා ඇතිකරගන්නා දෘෂ්ඨීන් (දැක්මන්) මත එළැඹෙන සම්මුතීන් පමණි.

තනිකඩයා විවාහවීමට සිතයි.

විවාහයටපත්වූ තැනැත්තේ ඉන්මිදීමට ඇත්නම් යැ'යි සිතයි.

මෙවන් මුලාවන්ගේ කෙළවරක් දැකිය යුතුය.

අවශ්‍යවන්නේ වාද විවාද නොව පොදු එකඟත්වයයි. නිගමනයයි. එහෙත් වෙනස්වන ලෝකධර්මතාවය තුළ ස්වභාවය තුළ, නිත්‍ය හැඩයක් ස්වරූපයක් නැතිස්වභාවය තුළ සදාකාලිකවූ වෙනස් නොවෙන්නාවූ නිත්‍ය නිගමනයක් නිත්‍ය එකඟතාවයන් ඇතිකළ නොහැක්කේය.

තම තමන් තුළ ඇතිවී තිබෙන, ඇතිකරගෙන තිබෙන අනේකාකාර විවිධ දෘෂ්ඨීන්ගෙන් මිදී සැබෑස්වභාවය අවබෝධකළ අවස්ථාවේදී, යථාර්ථය දුටු අවස්ථාවේදී, ධර්මාවබෝධය ලැබෙනු ඇත. මුලාව දුරුවෙනු ඇත. සිදුවියයුත්ත එහි සිදුවෙනු ඇත. නිරෝධයවනු ඇත.

## නිසරු වාද

මහණෙනි, මම ලෝකයා සමඟ වාද නොකරමි. මහණෙනි, ලෝකයා වූකලී මා සමඟ විවාද කෙරෙයි. ධර්මවාදියෙකු ලොව කිසිවකු සමඟ විවාද නොකරයි. (ඒ විවාදකිරීමට තරම්වන කිසිවක් ධර්මතාවයන්හි නොමැති බැවිනි.)

(අඞගුත්තර නිකාය)

## සංක්ලේශයෙන් ත්‍රිවිධයහ

තණ්හා සංක්ලේශ

දිට්ඨි සංක්ලේශ

දුශ්චරිත සංක්ලේශ යනුවෙනි.

තණ්හාසංක්ලේශයෝ - සමථයෙන් විසුද්ධවෙයි. ඒ සමථය, සමාධිස්කන්ධයයි.

දිට්ඨිසංක්ලේශය - විදර්ශනයෙන් විසුද්ධවෙයි. ඒ විදර්ශනාව ප්‍රඥාස්කන්ධයි.

දුශ්චරිතසංක්ලේශ - සුචරිතයෙන් විසුද්ධවෙයි. එ සුචරිත ශීලස්කන්ධයි.

ශීලයෙහි පිහිටි ඔහුට භව ප්‍රාර්ථනාව උපදීනම්, මෙසේ ඒ පුද්ගලයාහට, මේ සමථ - විදර්ශනා (විපාක ඵල උපදවන හෙයින්) භාවනාමය පුණ්‍යක්‍රියා වස්තු වෙයි.

ඒ ඒ භවයෙහි උපත පිණිස පවතී.

මෙසේ හෙයින් සියළු ශීල, භාවනාවන් අවබෝධයෙන් යුතුව පැවත්විය යුත්තේ භව නිරෝධය උදෙසාම මිස භව තණ්හාව පෙරටුකොට ගෙන නොවේ. ශීලය වුවද වරදවාගත්කල "ශීලබ්බතපරාමාගයෙහි" වැටෙයි. යථා ස්වභාවයන් (ධර්මතාවයන්) අවබෝධකරගත හැකි වූවෙකු වීනම් තෘෂ්ණාවන්ගෙන් මිදී, මාරයාගේ ග්‍රහණයෙන් ගැලවී ගන්නේය.

කාමයෝත් පිරිහෙති. - කාමස්වරූපයෝත් පිරිහෙති.

කාමයෙහි වැදීසිටින පුද්ගලයාත් පිරිහෙති.

සිතුවිල්ලට ඉඩ නොහරින්න.

සිහිය පවත්වාගන්නා - මුලාවෙහි නොවැටෙයි.

සිහිය පවත්වාගත නොහැකිව - සිතුවිලි රජ කරන්නේ නම්, මුලාවටපත්වී අතරමංවන්නේය. "දුකම" පවතින්නේය.

සිදුවූදේ සිදුවී හමාරය. එහි කිසිවක් ශේෂවී නැත.

එහෙත් තණ්හාව හේතුකොට නැවත නැවත මෙනෙහිකිරීම මතකතබාගැනීම.

ආස්වාදය

ආදීනවය

නිස්සරණයට

යොමුවීම, තණ්හාවේ ස්වභාවයයි.

සිදුවියයුත්තේ ඊළඟ අරමුණෙහි නොඇලීමයි. ඉන් ගැලවීම පිණිස සිහියට එළඹීමයි.

අරමුණින් බැහැරවූයේ අරමුණ දුරුවූයේ, වෙනත් අරමුණක් නොමැතිවූයේ "සමාධිය" පවතී.

## මාරයා හා මරණය

මරණය යනු මාරයා නොවේ. එය වනාහි භවයෙහි එක් සන්ධිස්ථානයක් පමණි. මාරයා වනාහි දුකය. (පඤ්චොපාදානස්කන්ධයෝය.)

මරණය යනු මාරයානම්, දුකින් පීඩිතවූ, දුකින් ගැලවිගත නොහැකිවූ සත්ත්වයින්, මරණයේ පිළිසරණ පතන්නට නොයනු ඇත.

"දුක" නැමැති මාරයා, ඔහුගේ දඩයම ලෙසින් ගැනීම පිණිස ඔබව លුහුබඳින්නේය.

ඔබ මරයාහට බියපත්වී ඇත. මාරයාගෙන් ගැලවීම පිණිස ඔබ, දුවයමින් සිටින්නේය. කොතරම් වේගයෙන් දුවගියත්, කවරතැනක සැඟවුනත්, ඔබට මාරයගෙන් ගැලවීගත නොහැකිවනු ඇත.

ඔබ මාරයාගේ දඩයමක්වීමට නොකැමැත්තෙහිද?

එසේනම් නවතින්න.

ආපසු හැරෙන්න.

මාරයාහට මුහුණ දෙන්න. එවිට මාරයාගේ (දුකෙහි) යථාස්වභාවය ඔබට දැකගත හැකිවනුඇත. ඔහුව පරාජයකළ හැකිබව ඔබට අවබෝධවනු ඇත.

ඔබ දඩයක්කාරයාවන්න. දුක නැමැති මරුවාහට මුහුණදී ඔහුව විනාශකර දමන්න.

## මාරයා හැඳිනීම

දූරං ගමන් - දුර යාහැකි

ඒකචරං - තනිව හැසිරෙන

අශරීරං - ශරීරයක් නැති

ගුහාසයං - තණ්හා, මාන, දිට්ඨි නම් වූ ගුහාවන්හි සිරගතවන

යේ චිත්තං - සිත

සංයමෙස්සන්ති - තණ්හා මාන දිට්ඨි නම් වූ ගුහාවන්ට නොයා හික්මෙනුයේ

මොක්ඛන්ති - ගැලවෙන්නේය.

මාර බන්ධනා - මාරයාහට හසුවීමෙන්

සියළු ආකාරයේ ආශාවෝම තෘෂ්ණාවන් වන්නේය තෘෂ්ණාවන් ත්‍රිවිධාකාරයෙන් දක්වති. ඒ වනාහී,

කාම තණ්හාවෝය

භව තණ්හාවෝය

විභව තණ්හාවෝය

විඥාණය යනුද මේ ත්‍රිවිධ තෘෂ්ණාවන්මය.

විඥාණය, සත්ත්වයා සුඛිත මුදිතකරවන්නක් නොවේ. ඒ දුක්ඛකාරකමවේ. එය රඳවානොගත යුත්තක්මය. නොපමාව පළවාහැරිය යුත්තක්මය. විනාශකර දැමිය යුත්තක්මය.

විඥාණය දකින්නේනම් දැකිය හැක්කේ මාරයාවය. එහෙයින්,

විඥාණය - ඇසුරුනොකළ යුත්තේය.

- නොපැවැත්විය යුත්තේය.

- නොසෙවිය යුත්තේය.

- නොබැලිය යුත්තේය.

විඥාණය - ඇසුරුකරන්නේ නම්,

ඇසුරුකරනුයේ මාරයාවය.

- පවත්වන්නේ නම්,

පවත්වනු ලබනුයේ මාරයාවය.

- සොයන්නේ නම්,

සොයනුයේ මාරයාවය.

- බලන්නේ නම්,

බලනුයේ මාරයාවය.

- දකින්නේ නම්,

දකිනුයේ මාරයාවය.

මාරයාගේ වාසස්ථානය (ගුහාව) විඥාණයමය. ත්‍රිවිධ තෘෂ්ණාවෝ එහි දොරටුය. ආස්වාද, ආදීනව, නිස්සරණ මායාවෝය. එහි පිවිසෙන්නා ගැලවීගත නොහැකි අයුරින් අතරමං වන්නේය. එහිම සිරකරුවෙකු වන්නේය. මාරයාගේ බන්ධනයටම හසුවන්නේය.

යථා ස්වභාවයන් (ධර්මතාවයන්) අවබෝධකර ගතහැකි වූවකුවීනම් - තෘෂ්ණාවන්ගෙන් මිදී, මාරයාගේ ග්‍රහණයෙන් ගැලවී ගන්නේය.

"කාමය", තාගේ මුල දිටිමි. කාමය තෝ සිතුවිලි හේතුකොට ගෙන උපදින්නෙහිය. දැන් මම තා නොපතමි. "කාමය" යලිත් තෝ නූපදින්නේහිය.

(ථෙරගාථා)

## හැඟීමක්

අතීතය ආවර්ජනය කරන්නා පෙරේතයෙකි.

අනාගතය පිළිබඳව මෙනෙහි කරන්නා, සිහින දකින්නා කෑදරයෙකි.

වර්තමානය විඳින්නා මෝඩයෙකි. (ප්‍රඥාවන්තයා මේ සියල්ලෙන්ම නික්මුනෙකි. - බැහැර වූවෙකි.)

හෙතෙම මේ කිසිවෙකු නොඇලෙයි. එළැඹි සිහියෙන් යුතුව - සමාධිය වඩයි.

අතීතය - මෙනෙහි නොකරන්න.

අනාගතය - නොසිතන්න.

එළැඹ ඇති වර්තමානය - අරමුණ කෙරෙහි සිහියෙන් බලන්න. එහි නොඑළැඹෙන්න නොගැලෙන්න. එය නිරෝධවීමට ඉඩහරින්න.

අරමුණ නිරුද්ධවනු සමඟම, එතැන හිස් බවකි.

සිහියෙන් යුතුව සිටිමින් වෙනත් අරමුණු නොගන්නේ නම් හිස් බවම සමාධියයි.

සමාධියෙහි පඤ්චඋපාදානස්කන්ධයන් නැත්තේය. එහෙයින්ම නැවතුනේ වෙයි. නිවුනේ වෙයි.

## සතුට හා ප්‍රඥාව

ප්‍රඥාව ආලෝකයකි. ඒ වනාහි තත්ත්වාවබෝධය පිළිබඳ ඥානයයි. එය ලැබීමේ රිසියෙන්, සිහියෙන් යුතුව මම එතැන සිටියෙමි.

දිනක් මා ඉදිරියෙහි "සතුට" දිස්විය. මාගේ සිහිය මා කෙරෙන් මඳකට බැහැරවිය. මම සතුට විඳින්නට යොමුවුනෙමි. එය ආනන්දජනක විය. එහෙත් ඒ සුළු මොහොතකට පමණි. ක්ෂණයකින් එය නැතිවිය. නැවත නැවතත් එය ලබන්නට මට සිත්විය. මම සතුට පිටුපසින් හැල්මේ දුවන්නට වුයෙමි.

ප්‍රඥාව නැමැති ආලෝකය කෙරෙන් මා බැහැරවත් වත්ම "සතුට" නම්වූ සෙවනැල්ල මා කෙරෙන් තවතවත් ඈතට යනබවක් මට පෙණුනි. එහෙත් මම අත්නොහැරියෙමි. සතුට පිටුපසින් හඹාගියෙමි.

කෙසේවත් එය අල්ලා රඳවා තබාගැනීමට මම අපොහොසත් වූයෙමි. මට වේදනාවක් දැනුණි. මම වෙහෙසට පත්වුයෙමි.

මෙවන් වෙහෙසකාරී එක්තරා මොහොතකදී මගේ සිහිය යළිත් මා වෙත එළැඹුණි. "සතුට" මුලාවක්බව මට අවබෝධවිය. මම "සතුට" නම් වූ මුලාව හඹායෑම අත්හැරියෙමි.

මම ප්‍රඥාවේ ආලෝකය දෙසට හැරුණෙමි. එදෙසට යන්නට වීමි. එවිට "සතුට" නම් වූ මුලාවේ සෙවනැල්ල මා පසුපසින් හඹා එන බවක් මට දැනුණි. මම යළිත්

ප්‍රඥාවේ ආලෝකයතුළට පැමිණියෙමි. එළැඹි සිහියෙන් යුතුව, මම එතැන රැඳුනෙමි. ඒ මොහොතෙහි "සතුට" නම්වූ සෙවනැල්ල මා දෙපාමුල තිබෙනු දුටුවෙමි.

ප්‍රඥාව නම්වූ ආලෝකයතුල මා සිටිනතාක් "සතුට" මා දෙපාමුල රැඳීසිටිනු ඇත. එහෙත් එය මට අදාළ නොවේ.

## සැබෑ ලෝකය

උපදින සෑම ජීවියෙකුගේම ලෝකයන් ඇත. බ්‍රහ්මයන් සිටිනුයේ, බ්‍රහ්මලෝකවලය. දෙවිවරුන් සිටිනුයේ, දිව්‍යලෝකයන්හිය. මිනිසුන් සිටිනුයේ මිනිස්ලෝකයන්හිය. යක්ෂයින්, ප්‍රේතයින් වැනියවුන්ද සිටිනුයේ ඔවුනොවුන්ගේ ලෝකයන්හිය. සත්ත්වයින්ට සත්ත්ව ලෝකයන්ය. කුහුඹුආදී කෘමීන්ටද ඔවුන්ගේ ලෝකයන්ය. කුරුල්ලන්හට කුරුළුලෝකයන්ය. ඔවුනොවුන් සියල්ලෝම, ඔවුනොවුන්ගේ ලෝකතුළ ජීවත්වෙති.

ගහ කොල, ඉර හඳ තරු, පොළොව, අහස, මිනිසුන් සතුන්, පක්ෂීන්, ධන ධාන්‍ය හා මෙකී නොකී සියලුදැයින් සමන්විතවූයේ ලෝකයැ'යිද මිනිසුන් සිතති. ලෝකයසේම දකිති.

එසේ එවන්අයුරින් ලෝකය දකින මිනිසුන් අතුරෙන් ඇතැමුන්තුළ, ඔවුන් සිතන අයුරින් මගේ පුංචි ලෝකයද වෙති. මගේ ප්‍රේමලෝකයද වෙති. සුරංගනාලෝකද වෙති. මෙවන් අයුරින් බොහෝ දෙනාතුළ අනේකාකාරයේ ලෝකයන් පිළිබඳ සිතුවිලි නොවන්නේද නොවේ.

ධර්මාවබෝධයෙන් තොරවූ සත්ත්වයෝ සසරෙහිම ගැලෙති. අනිත්‍යවූ දුක්ඛ, අනාත්ම ස්වභාවයන් නිත්‍ය, සුඛ, ආත්මවශයෙන් ගනිමින් ඒවායෙහිම ගැලෙති. ස්වභාවය යන්නට යෙදෙන තවත් යෙදුමකි. ඒ ධර්මතාවය යනුයි.

මේ ධර්මතාවයන්, ස්වභාවයන් පිළිබඳව නිවැරදි දැක්මක් නොමැති පෘතග්ජනයෝ, ස්වභාවයේ, ස්වභාවයන් සංස්කරණය කෙරෙති. ඒවාට නාමකයන් යොදති. රූපයන්ලෙස ගනිති. සත්ත්වපුද්ගල වශයෙන් මෙනෙහි කරති. සැබෑලෙස පවතිනදෑ ලෙස දකිති. අයෝනිසෝමනසිකාරයන් පවත්වති. මඤ්ඤනා කරති. මෙනෙහි කරති. සිතුවිලි මවති. ලෝකයන් තනති. ලෝක තුල ජීවත්වෙති. ලෝකයන් පවත්වන්නට වෙරදරති. දුක්විඳිති. උපදිති, මියයයති, යලිත් උපදිති, දුක්විඳිති, මියයති. සංසාරවට්ටයෙහිම අතරමංවී භවයම වඩති. භව දුකෙහිම ගැලෙති. මේවා අවිද්‍යාවය. සැබෑ ස්වභාවයන්, ධර්මතාවයන් පිළිබඳව නොදන්නාකමය.

තථාගතයන් වහන්සේ විසින් අවබෝධකරනු ලැබුයේ මේ ස්වභාවයන් පිළිබඳව සැබෑ ස්වරූපයන්ය. ධර්මතාවයන්ය. සත්ත්වයා දුකට පත්වීමේ හේතූන්ය.

දුක ඇතිවීමය.

දුක ඇතිවීමේ හේතුවය.

දුක නැතිකළ හැකිබවය.

දුක නැතිකිරීමේ මාර්ගයය

වශයෙන් උන්වහන්සේ විසින් අවබෝධකළ ධර්මතාවයන් පිළිබඳ චතුරාර්‍ය්‍යසත්‍ය සියළු සත්ත්වයාගේ හිත සුව පිණිස, සසර දුකින් ගැලවීම පිණිස, භව නිරෝධය පිණිස දේශනාකර වදාරා ඇති සේක.

දුකට හේතුව, පැහැදිලිලෙසම දක්වා තිබියදීත්, දුකෙන්මිදීමේ මඟ පෙන්වාදී තිබියදීත්, පෘතග්ජන පුද්ගලයෝ, නැවත නැවතත් සැපය කියමින් දුකෙහිම ගැලෙති. සැපය සෙවීමට, ලැබීමට කියමින් දුකම සොයා යති. මුලාවෙන් දුකින් දුකටත් පත්වෙති.

සතුට ලැබීමටයයි සිතමින් පුහුදුන් තැනැත්තෝ, ධනය සොයති. තනතුරු සොයති. බලතල නිලතල සොයති. අභිමානය සොයති. මානීව උදම්වෙති. තම බලය වඩා ගැනීමට උපකාරකළ අයකෙරෙහි බියපත් වෙති. ඔවුන් ගෙන් තම බලයට හානි පැමිණෙතැ'යි සිතා ඔවුනට හානිපමුණුවති. තමබලය රැකගැනීමට අනෙකාව පීඩාවට පත්කරති. අන්සතු ධනය පැහැරගනිති. තම සුඛාස්වාදය පිණිස අන්අයව පෙළති. වංචා කරති. බොරු කියති. සතුරන්ව මරවති. පංචදුශ්චරිතයෙහිම යෙදෙති. අවිද්‍යාවෙහිම ගැලෙමින් අකුසල්ම වඩති. දුකින් දුකටම පත්වන මංපෙත් තනාගනිති.

සත්‍ය ස්වභාවය අවබෝධකර ගැනීමේ හැකියාවක්, අවස්ථාවක් නොමැතිකම, නොදන්නාකම හේතුකොට, මෙවන් දුක්විඳීමේ ප්‍රවනතාවයක් සිදුවන්නේ නම් එය එකෙකි.

එහෙත් දුකින්මිදීමේ මග හෙළිකළ බුද්ධෝත්පාද කාලයක, සැබෑස්වරූපය අවබෝධකළ හැකි. ධර්මාවබෝධය ලැබියහැකි යුගයක ජීවත්වන මිනිසා දුකම විඳින්නේනම් දුකම සොයන්නේනම් එහිම ගැලෙන්නේනම්, ඒ වනාහි ආයර්‍යසත්‍යයේ දෝෂයන් නිසා නොව, පුහුදුන් මිනිසාගේ අකුසල් ස්වභාවයන්ම පෙරදැරිවීමය. එවැනි ස්වභාවයන් බුදුරදුන් වහන්සේ නමකටවුවද වැලැක්විය නොහැකි බවට තථාගතයන් වහන්සේගේ දේශණයන්හිදී දක්වා තිබීම පිළිබඳව කාගේත් අවධානයට ලක්විය යුත්තේය.

අවිද්‍යා අන්ධකාරයෙහි ගැලුන පුද්ගලයෙකු ගෙයක් තනන්නට වන්නේය. එය කුඩාඑකක් නොව, විසල් මුදුරක්ම විය. එහි කටයුතු නිමාකිරීමට ධනය අවැසිවිය. ඔහු ධනය ඉපැයීමේ ක්‍රමවේදයන්හි නිරත විය. තම ආදායමින් ධනය ඉපැයීය. ඒවා ප්‍රමාණවත් නොවනවිට ණයවීමට නොකැමැති බැවින් අල්ලස්ගැනීම් වංචා කිරීම් වැනි ක්‍රියාවන්ගෙන් ධනය ඉපැයීය. තමන්ට ලැබී තිබූ නිලතල, බලතල අයුතුලෙසින් පාවිච්චි කළේය. නිවසේ ඉදිකිරීම් නිමකරගැනීම පිණිස කාලය ධනය ශ්‍රමය වැයකළේය. තමාගේ පෞද්ගලික ඕනෑ එපාකම් කෙරෙහිවුව දැඩිඅවධානයක් යොමුකිරීමේ අවස්ථාවන් විරළ විය. පිනක් දහමක්කර ගැනීමේ, කුසල්සිත් ඇතිකර ගැනීමේ අවස්ථාවන් ඔහුට නොමවිය.

ගෙය තනා නිමවිය. හේ විවාහවිය. දරුවන් ලැබුණි. හේ යාන වාහන මිළදීගත්තේය. දැසි දස්සන් ඇති කරගත්තේය. මේ සියල්ලන්ගෙන්ම පරිපූර්ණවූයේ නමුදු

භෞතිකසම්පත් හඹායෑමේ ඔහුගේ ඕනෑකමනම් තවමත් නිමවී නැත්තේය. තමන් නතුකරගත් භෞතික සම්පත් දෙස බලමින් හෙතෙම උද්දාමයට පත්විය. ඒවායේම බැඳෙන්නට විය. මේ හැමදෙයක්ම ඔහු ලෝකය යැ'යි සිතන්නට විය. ඔහු දන්නාහඳුනන අය සමඟ කථාබහ කළ අවස්ථාවන්හිදී කොහොමද මගේ ලෝකය'යි විමසන්නට හේ පසුබට නොවීය.

මෙවන් එක්තරා මොහොතක හෙතෙම රෝගීවිය. රෝගය උත්සන්න වන්නට විය. එහෙත් ඔහුගේ සිතුවිලි තවමත් භෞතික සම්පත් කෙරෙහිය. ඒවා රැකගැනීම කෙරෙහිය. තව කලක් ජීවත්වීම කෙරෙහිය.

රෝගය කරනකොට තමන් මියයා හැකි යැ'යි ඔහුට සිතිණ. ඔහුතුළ බියපහළ විය. දුක පහළ විය. සම්පත් අත්හරින්නටවේයැ'යි කම්පිත විය. තමන් සිදුකළ සියළුදෑ සිහිවන්නට විය. කුසල්නොවැඩූ බවක් සිහිවිය. අකුසල්හිම නිරතවූ බවත් සිහිපත්විය. බිය උත්සන්න විය. කුසල් කිරීමට ඕනෑය'යි සිත් විය. එහෙත් ඒ සඳහා තමන් පමා වී ඇති බවක් ද දැනින.

කිසිවක් පැහැදිලිකර ගතනොහැකි මානසික තත්ත්වයක් තුළ ඔහු සම්මුති මරණයට පත්විය. මිය ගියේය.

ඔහු මියයෑමත් සමඟ ඔහුගේ ලෝකය නිමවිය. එහෙත් ලෝකය ලෙස ඔහු දකිමින් සිටි භෞතිකදේ ඒවායේ ස්වභාවයන් අනුව පැවතියේය. මමය. මගේය. වශයෙන් ගනිමින් හෙතෙම ගොඩනැගූ භෞතික ලෝකය මායාවක්,

මුලාවක්බව අවබෝධ කරන්නට හේ අසමත්විය. අවසන් මොහොතේ හෝ සත්‍යඅවබෝධකර ගැනීමේ සිතුවිලි පහලවූයේ වුවද ඒ වනවිට ඔහු ප්‍රමාද ය. සත්‍යාවබෝධය කෙරෙහි යොමුවූයේ වුවද හෙතෙම සම්මුති මරණයට පත්විය. ඔහු තුල පැවති සංස්කාර ස්වභාවයන් විඥාණ ස්වභාවයන්, අනුව ඔහුගේ පුනර්භවය සිදුවන්නට ඇත.

## ලෝක

ලෝකය, ලෝකය.... යැ'යි කියමින් මිනිසුන් කථා කරයි. අතීතයේ සිටි මිනිසුන්ද ලෝකය පිළිබඳව කථා කරන්නට ඇත. අනාගතයේදී පහළවන මිනිසුන්ද ලෝකය ගැන කථාකරනු ඇත.

කවුරුන් ලෝකය පිළිබඳව කථාකළත්, ගෞතම සම්මාසම්බුදු පියාණන් හැරුණු කොට, ලෝකය පිළිබඳ යථා ස්වභාවය පැහැදිලිකළ අන් කවරෙකු හෝ නොවීය. උන්වහන්සේ විසින් ලෝකස්වභාවය පිළිබඳව අවබෝධකොට දේශණාකරන තෙක්ම මිනිසා සිට ඇත්තේ මුලාවෙහිමය.

ඔවුහු ඇත ආකාශය, ඉර, හඳ, තරු, ගහකොල, හරක බාන, ධන ධාන්‍ය, ඉඩ කඩම්, යාන වාහන, ගැහැණු පිරිමි, දරුදැරියෝ යනාදීන් හා මෙකී නොකී අපමණවත් භෞතිකසම්පතින් පිරුණු ස්වභාවයන් වෙනස් නොවන, සත්‍යය වූ දේ ලෙසින්ම ලෝකය ලෙසින්ම දැකඇත්තාහ.

එබැවින් ඔවුන් ලෝකය දියුණුකිරීමට සිතුවෝය. වර්තමානයෝද ලෝකය දියුණුකරන්නට සිතති. අද දවසේ ද ලෝකය තනන්නට සිතන්නෝය.

ඔවුහු මේ දක්වාත් ලෝකය කුමක් දැ’යි හරි හැටි හඳුනාගෙන නොතිබීම එයට හේතුවය. ලෝකය පිළිබඳව අවබෝධකොට නොතිබීම එයට හේතුවය.

ලෝකය පිළිබඳව සැබෑව හඳුන්වාදෙමින් බුදු පියාණන් වහන්සේ විසින් දේශිත අපමණවූත් ධර්ම කරණාවන් ඇත්තේය. ඒවා කෙරෙහි අවධානය යොමුකරනකල, මෙවැනි තොරතුරු හමුවෙයි.

## ලෝක... ලෝක...

භගවතුන් වහන්ස, ලෝකය ලෝකයැ’යි කියනු ලැබෙයි. වහන්ස කුමකින්, කොපමණකින් ලෝක හෝ ලෝක ප්‍රඥප්ති හෝ වන්නේ දැ’යි දැනගනු රිසියෙමි.

සමිද්ධිය, යම්තැනෙක චක්ෂුස තිබේද, රූපයෝ තිබේද, චක්ෂුර් විඥාණය තිබේද? චක්ෂූර් විඥාණයෙන් දතයුතු දහම් ඇතිද එහි ලෝක හෝ ලෝක ප්‍රඥප්ති හෝ ඇත.

ජිව්හාඇත්ද, රූපයෝ ඇත්තේද, මනස තිබේද, ධර්මයෝ තිබේද, මනෝවිඥාණයෝ තිබෙයිද? මනෝවිඥාණයෙන් දතයුතු දහම් තිබේද? එහි ලෝක හෝ ලෝක ප්‍රඥප්තිය ඇත.

තවද සමිද්ධිය. යම් තැනෙක චක්ෂුස නැත්තෙහිද, රූපයෝ නැත්තෙහිද, චක්ෂුර් විඥාණ නැත්තෙහිද, චක්ෂුර් විඥාණයෙන් දතයුතු දහම් නැත්තෙහිද? එහි ලෝක හෝ ලෝක ප්‍රඥප්ති හෝ නැත. ජිව්හා නැද්ද, රසයෝ නැද්ද, මනස නැද්ද, ධර්මයෝ නැත්තේ ද? මනෝවිඥාණයෝ

නැද්ද, මනෝවිඥාණයෝ දතයුතු දහම් නැද්ද, එහි ලෝක හෝ ලෝක ප්‍රඥප්ති හෝ නැත්තේමය.

(ලෝක පඤ්හ සූත්‍රයෙනි)

ලොව කුමකින් පමුණුවන ලැබේද? කුමකින් අදිනා ලැබේද? සියල්ලෝම කුමන ආකාරයේ එක් දහමෙකුගේ වසඟයට ගියාහුද?

සිතින් ලොව පමුණුවනු ලැබේ. සිතින් අදිනු ලැබේ. සියල්ලේම සිත් නමැති මේ එකම දහම්හුගේ වසඟයට ගියාහු වෙති.

(චිත්ත සූත්‍රයෙහි)

## ලෝකය යනු

ස්කන්ධ ලෝකය, ධාතු ලෝකය, ආයතන ලෝකය, විපත්ති භව (අපාය) ලෝකය, විපත්ති සම්භව අපායුපපග කම්ම ලෝකය, සම්පත්ති භව (සුගති) ලෝකය, සම්පත්ති සම්භව (සුගතු පගකම්ම) ලෝකයි.

එක් ලොවක සත්හු ආහාරයෙන් සිටුනාහ.

ලෝකයො දෙදෙනෙකි - නාමයන් රූපයත්ය

ලෝකයො තුන්දෙනෙකි - තුන් වේදනා

ලෝකයො සතර දෙනෙකි- සතර ආහාරයෝය

ලෝකයො පස් දෙනෙකි - පඤ්චෝපාදානස්කන්ධයෝය

ලෝකයො සය දෙනෙකි - අධ්‍යාත්මික ආයතනයෝය

ලෝකයො සත් දෙනෙකි - සප්ත විඥාණ ස්ථිතිහුය

ලෝකයො අට දෙනෙකි - අෂ්ඨලෝක ධර්මයෝය

ලෝකයො නව දෙනෙකි - නව සත්ත්වාවාසයෝය

ලෝකයො දස දෙනෙකි - දස ආයතනයෝය

ලෝකයො දොළොස් දෙනෙකි -දොළොස් අන්තයෝය

ලෝකයො දහඅට දෙනෙකි - අටලොස් ධාතුහුය

## ලෝකයේ අන්තය

එක් දවසක් දා බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩවසන අවස්ථාවේ රෝහිතස්ස නැමැති දේවපුත්‍රයෙකු රාත්‍රියේ ඇවිල්ල බුදුරජාණන් වහන්සේ ගෙන් මෙහෙම ප්‍රශ්ණයක් අහනවා.

ස්වාමිනි, යම් තැනෙක කෙනෙක් නූපදියිද? නොදිරයිද? නොමියෙයිද? චුත නොවෙයිද? නැවත නුපදනේද? ඒ ලෝකාන්තයට ගමන් කිරීමෙන්, ඒ ලෝකාන්තය දැනගත හැකි වෙයිද? ඊට පැමිණිය හැකි වෙයිද?

බුදුරජාණන් වහන්සේ ඊට දෙන පිළිතුර,

ඇවැත්නි, යම් තැනෙක නූපදිනේද, නොදිරයිද, නොමියේද, චුත නොවෙයිද, නැවත නූපදිනේද එබඳු ඒ ලෝකාන්තයට ගමන් කිරීමෙන් පැමිණිය හැකියැ'යි මම නොකියමි.

මේ බොහොම ආශ්චයයී, අද්භූතකාරණයක් ස්වාමීනි, ඔබවහන්සේ වදාළේ සත්‍යයක්මයි. මම එහෙම ප්‍රශංසාකරන්නේ මේ කාරණය ඇත්තබව ප්‍රත්‍යක්ෂයෙන්ම මම තේරුම්ගෙන ඇති නිසායි. මම හෝජ ඍෂිවරයාගේ පුතෙක්ව සිටියා. බොහෝම ඍද්ධි සහිතයි. හීයක වේගයෙන් අහසින්යෑමේ හැකියාව මා සතුවුනා. පියමාරුකිරීම්, පෙරදිගමුහුදත්, අපරදිගමුහුදත් අතර, එතරම් පුළුල් පියමාරුකිරීමක්. ඒ ඔක්කොම ඍද්ධි බලයෙන්, අන්න එබඳු බලයක් ඇති මාහට අදහසක් ඇතිවුනා. මම ගමන්කරලා ලෝකයේ කෙළවරට පැමිණෙනවා කියලා. එහෙම අදහසක් ඇතිකරගත් මම මේ විදියට ගමන්කරල, අවුරුදු සියයක්ම ගමන්කරලා ලෝකයේ කෙළවරට නොපැමිණීම කාලක්‍රියාකළා. අන්න ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ දේශනාකළ කාරණය සුභාෂිතවග මම පිළිගන්නවා.

මෙහිදී තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක.

ඇවැත්නි, මම ගමන්කිරීමෙන් ලෝකයේ කෙළවර දැකිය හැකියැ'යි නොකියමි. එසේම ලෝකයේ කෙළවරට නොපැමිණ දුකෙහි කෙළවරක් ඇතැ'යි ද මම ප්‍රකාශ නොකරමි. නැවතද ඇවැත්නි, සංඥාවත්, මනසත් සහිත බඹයක් පමණවන මේ ශරීර කූඩුවෙහිම, ලෝකයත් පෙන්වාලමි. ලෝකය හටගැනීමත් පෙන්වාලමි. ලෝක නිරෝධනම්වූ නිවනත් පෙන්වාලමි. ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාවත් පෙන්වාලමි.

(රෝහිතස්ස සූත්‍රයෙනි)

සත්ත්වයාය. පුද්ගලයා ලෝකය ය. යනාදී වශයෙන් පවත්වා ගෙනයනු ලබන මෝහාන්ධකාරය පිළිබඳව ගැඹුරු විවරණයක් මෙම රෝහතස්ස සූත්‍රය විමසුම් සහිතව හැදෑරීමේදී මැනවින් පැහැදිලි වන්නේය. පුහුදුන් මිනිසුන් විසින් ලෝකය, ලෝකය කියමින් අදහන, දකින, විශ්වාස කරනුලබන ලෝකය, මිථ්‍යාවක්බව පෙනීයයි. ඉර, හඳ, තරු, අහස, පොළොව, ගහකොළ, සත්තු, වනාන්තර, ගොඩනැගිලි, ඇල, දොළ, විල, ගංගා, කඳු, පතන, අව්ව, වැස්සවැනි තවත් මෙකී නොකී සෑමසියළු භෞතික ස්වභාවයන් කිසිවක් සැබෑ ලෝකයන් නොවනබවත් පැහැදිලිය. ලෝකය පවතිනුයේ බඹයක් පමණවන මේ කයතුළ බවත්, ලෝකයේ ඇතිවීම, පැවතීම හා ලෝක විනාශය එය තුලින් දැකියහැකි බවත් බුද්ධභාෂිතය යි.

රෝහිතස්ස ඍෂිවරයන් ලෝකයේ කෙළවර සොයන්නට ගොස්ඇත්තේ ලෝකයේ ඇතිවීමත්, පැවතීමත්, නැතිවීමත් අරගෙනමයි. මාරයාගේ ගැලවීම පිණිස, මාරයා නැති තැනක් සොයන්නට ගොස්ඇත්තේ ද මාරයාත් සමඟයි. මාරයාව කරතබාගෙනමයි. ලෝකයේ කෙළමවරක් සොයන්නට වසරසියයක් ගමනේ යෙදුන රොහිතස්ස ඍෂිවරයා, ලෝකය උපදවන ෂඩායතනයන් පිළිබඳව අවබෝධයකින් තොරව කාලක්‍රියාකොට ඇත.

රෝහිතස්ස ඍෂිවරයා ලෙසින් සිදුකළ සොයායෑමේ පූර්වමතකයන්, අත්දැකීම්, තිබුණු බැවින් බුදුන් වහන්සේගේ දේශණය අසා ඔහු අතිශයින්ම ප්‍රීතියටත් අමන්දානන්දයටත් පත්වූ බවනම් මෙහිදී පැහැදිලි වෙයි.

මේ පිළිබඳව වැඩිදුරටත් විමසා බැලීමේදී, ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් දක්වන ලද අර්ථ කථනයක මෙසේ සඳහන් වෙයි.

ඇවැත්නි, යමක් නිසා ලෝකයෙහි, ලෝකය යන දැනීම ඇත්තේ වේනම්, ශාසනයෙහි මේ ලෝකය'යි කියනු ලැබේ. ඇවැත්නි, කුමක් නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකයයන හැඟීම ඇත්තේවේද යත්,

ඇවැත්නි, ඇසනිසා ලෝකයෙහි, ලෝකය යන දැනීම ඇත්තේ, ලෝකය යන හැඟීම ඇත්තේවෙයි.

ඇවැත්නි, කනනිසා ලෝකයෙහි, ලෝකය යන දැනීම ඇත්තේ, ලෝකය යන හැඟීම ලෝකය වෙයි.

ඇවැත්නි, නාසයනිසා ලෝකයෙහි, ලෝකය යන දැනීම ඇත්තේ, ලෝකය යන හැඟීම ඇත්තේවෙයි.

ඇවැත්නි, දිව නිසා ලෝකයෙහි, ලෝකය යන දැනීම ඇත්තේ, ලෝකය යන හැඟීම ඇත්තේවෙයි.

ඇවැත්නි, කයනිසා ලෝකයෙහි, ලෝකය යන දැනීම ඇත්තේ, ලෝකය යන හැඟීම ඇත්තේවෙයි.

ඇවැත්නි, සිත නිසා ලෝකයෙහි, ලෝකය යන දැනීම ඇත්තේ, ලෝකය යන හැඟීම වෙයි.

ඇවැත්නි, යමක්නිසා ලෝකයෙහි, ලෝකය යන දැනීම ඇත්තේ, ලෝකය යන හැඟීම ඇත්තේ වේනම්, ශාසනයෙහි මේ ලෝකය'යි කියනු ලැබේ.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, ගමනින් ලොවකෙළවර දත හැකියැ'යි දැක්ක හැකියැ'යි පැමිණිය හැකිය'යි මම නොකියමි. මහණෙනි, ලොව කෙළවරට නොපැමිණ දුකෙහි කෙළවරකිරීමකුදු මම නොකියමි'යි යම් උද්දේසයක් ඔබලාහට කෙටියෙන් ප්‍රකාශකොට විස්තර වශයෙන් අර්ථය පැහැදිලි කිරීමෙන්තොරව උන්වහන්සේ නැගිට විහාරයට පිවිසිසේක්ද? ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කෙටියෙන් දේශිත දේශනාවන්හි අර්ථය විස්තර වශයෙන් මම මෙසේ දන්නෙමි'යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් විසින් ප්‍රකාශ කළහ.

(ලෝක කාමගුන සූත්‍රයෙනි)

"ලෝකය සදාකාලිකද කියල, කාලය අනුව කෙළවරක් සෙවීමත්, එහි අන්තයක් තියෙනවද කියල දේශ වශයෙන්, අවකාශ වශයෙන් එහි කෙළවරක් සෙවීමත් එහෙමපිටින්ම මිථ්‍යාදෘෂ්ඨියක් පමණි. මක්නිසාදයත් සළායතනයන් තිබෙනතාක් ලෝකයක් තිබෙනවා... අන්න ඒ නිසයි බුදුන්වහන්සේ මේ ලෝකය පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරුනොදී ඇත්තේ...."

(කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු)

## පටලැවිල්ල

ජීවීන් බිහිවෙති. ජීවත් වෙති. මියයති.

ඔවුන් අතුරින් ඇතැමෙකු බිහිවීමටපෙරම මිය ගොසිනි. ඇතැමෙකු බිහිවනවිටම මියයති. සමහරුන් බිහිවී පැයකින්, දෙකකින්, පැය කිහිපයකින්, දවසකින්,

දින කිහිපයකින්, සතියකින්, මාසයකින් වසරකින්, වසර කිහිපයකින් හෝ පසුව මියයන්නෝය.

එසේ බිහිවන මියයන ජීවීන්ගෙන් ඇතැමුන් නිරෝගි වෙති, ඇතැමෙකු රෝගීහු වෙති. සමහරුන් බිහිවූ දා සිටම රෝගීන්ය. තවත් සමහරෙක් බිහිවූ දා සිටම නිරෝගීය. රෝගීවබිහිව, පසුව නිරෝගීවන්නෝද නිරෝගීව බිහිව පසුව රෝගීවන්නනන්ද, දුක් විඳින්නනන්ද, සැප විඳින්නනන්ද, දුක සැප දෙකම විඳින්නනන්ද, ඔවුන් අතරවෙති.

කවරදෙයක හෝ ස්ථිර ස්වරූපයක් දැකගන්නට නිශ්චයකර ගන්නට නොහැකිය. මෙය මෙසේ වේ යැ'යි මෙසේම නොවෙනස්ව පවතින්නෙයැ'යි කිවනොහැකිය. සිතිය නොහැකිය. සියල්ලම එකසේම පැටලැවිලි ගොඩකි. අවුල් ජාලයකි. කොතැනින් පටන් ගෙන කොතැනින්ලිහා නිමකරන්න දැ'යි අවබෝධයක් නොමැති ජීවීහු, තව තවත් එවන් පටලැවිලි ජාලයන්හිම වෙළෙන්නෝය.

දෙවිබඹුන් වැන්නවුන්හට හෝ මෙම අවුල් ජාලයෙන් ගැලවීමේ හැකියාවක් තිබී නොමැතිබව, දෙවි දේවතාවුන් පිළිබඳ තොරතුරු ලියවීඇති පතපොත පරිහරණය කිරීමේදී දැකගන්නට ලැබෙයි.

මෙවන් අවුල් ජාලයකින් මිදීමපිණිස දෙවිබඹුන්, මිනිසුන් උත්සුකනොවූයේයැ'යිද කිවනොහැක්කේ විවිධන්‍යායන් ක්‍රමවේදයන්, දෘෂ්ඨිගැතියන් විසින් දක්වා තිබීම නිසාය. බොහෝවිට විවිධ දෘෂ්ඨිවාදීන් තම තමන්ගේ දෘෂ්ඨීන් අනුව මෙවන් අවුලින්මිදී විමුක්තිය ලබාගැනීම පිණිස තම අදහස් පතුරවමින් විවිධාකාරයේ

ශ්‍රමණ පිරිස් බිහිකොට සිටි බවද බෞද්ධ සාහිත්‍ය තුලින්ම දැකගන්නට හැකිය.

**අන්තෝ ජටා බහි ජටා - ජටාය ජටිතා පජා**
**තං තං ගොතම පුච්ඡාමි - කො ඉමං විජටයේ ජටං**

යනුවෙන් එක්තරා දෙවියෙක් බුදුරජාණන් වහන්සේගෙන් විමසූ බවක් සංයුක්ත නිකායෙහි "ජටා" සූත්‍රයෙන් දැක්වෙනවා.

මේ ලෝකය පිළිබඳව තියෙන්නෙ ඇතුලතත් අවුලක්, පිටතත් අවුලක්, මේප්‍රජාව එම අවුල්වල පැටලැවිලයි ඉන්නේ.

ගෞතමයින් වහන්ස, මා ඔබ වහන්සේගෙන් අහන්නේ මේ අවුල ලිහන්නේ කවුරුන්ද කියාය.

මේකට බුදුරජාණන් වහන්සේ ගාථා තුනකින් පිළිතුරු දෙනවා.

**සීලෙ පතිට්ඨාය නරොසපඤ්ඤො**
**චිත්තං පඤ්ඤං ච භාවයං**
**ආතාපි නිපකො භික්ඛු**
**සො ඉමං විජටයෙ ජටං**

කිසියම් භික්ෂුවක්, සීලයේ පිහිටල, සමාධිය, ප්‍රඥාවවඩමින්, කෙලෙස්තවන වීර්‍යයෙන් යුක්තව, ඥානාන්විතව උත්සාහ වඩනවානම්, එවැනි භික්ෂුවකට හැකිවේවි, මේ අවුල ලිහන්නට.

**යෙසං රාගො ච දොසො ච - අවිජ්ජා ච විරාජිතා**
**ඛිණාසවා අරහන්තො - තෙසං විජටිතා ජටා**

රාගය, ද්වේෂය සහ අවිද්‍යාව කියන මේ ධර්මතාවයන් ප්‍රහීණකළ, මකාදැමූ, රහතුන්වහන්සේලා විසින් මේ අවුල ලිහාගන්නා ලද්දේය.

**යත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති**
**පටිඝං රූපසඤ්ඤා ච - එත්ථ සා ඡිජ්ජතෙ ජටා**

යම් තැනෙක නාමයත් රූපයත් ප්‍රතිඝයක් රූපසංඥාවත් සම්පූර්ණයෙන්ම වැළැක්වෙන්නේද උපරෝධනයවන්නේද? එතැන'යි ඒ ජටාව, ඒ අවුල ලිහෙන්නේ,

"බුදුරජාණන් වහන්සේ ගේ පැහැදිලිකිරීම් අනුව ලෝකයාට ඇස් තිබුණට, ධර්ම චක්ෂුෂයවත් පෑදෙනකම් ලෝකයා අන්ධයි."

ඒ නිසාමයි. මේ හැපෙන, හැපෙන එක ඒ හැපීමෙන්මයි හඳුනාගත්තේ, රූප සංඥාව ගැටීමකුත්, ඒ ගැටීම හඳුනාගැනීම් වශයෙන් ඇති කරගන්න රූප සංඥාවත්, මේ ගැටුනේ සණදෙයක, තදදෙයක, බුරුල්දෙයක, උණුසුම්දෙයක ආදී වශයෙන් ඒ ඒ දේවල් පිළිබඳව සංඥාවල් ඇතිකරගන්නවා.

ඉතින් මෙය ඒ වගේම ගණනාවකගේ සම්මතයට නතු වුවහොත්, සම්මතයට පත්වුවහොත්, ඒක ලෝකසම්මතයක් ලෙසින් පවත්වනවා. එය සත්‍ය එකක්, සැබෑ එකක්සේ රඳවා ගන්නවා.

කිසියම් අයෙකු යම්කිසි දෙයක නම දන්නවා නම්, ඒ තැනැත්තා ඒ දේ දැනගත්තා කියන අවබෝධ ස්වභාවයක් ඇතිවෙනවා. ඔන්න ඔය ආකාරයේ පැටලැවිලි තිබෙන නිසා තමයි ලෝකය අවුලක්වෙලා තියෙන්නේ. ඇත්ත වශයෙන්ම මේක අවුල් ජාලයක්, පටලැවිලි සමූහයක්.

මේ නාමධර්මතාවයන්, නාමස්වභාවයන් තුළ තියෙනවා ලෝකයාම මුලාවට පත්කරන ස්වභාවයක්. අවිද්‍යාව සැඟවිලා තියෙන්නේ මේ නාමධර්මතාවයන් නාමස්වභාවයන් තුළයි.

ආර්‍ය්‍යඅෂ්ඨාංගික මාර්ගයම මේ අවුල්ජාලයෙන් ගැලවීයාමට ඇති මාර්ගයයි. අවුල්ලිහා ගැනීමට ඇති ක්‍රමවේදයයි.

භවයෙන් භවය එකට ගලපන ස්වභාවයක් මේ තණ්හාවේ තිබෙනවා.

පැවැත්ම කියන්නේ ඒකාන්ත සත්‍ය දෙයක් නොවෙයි. උපාදානය ඇතිතාක් භවය පවතිනවා. උපාදානය නැතිවුන හැටියේ භවය නිරුද්ධවෙනවා.

එම තණ්හාවගේම ඉතිරියක නොමැතිව ප්‍රහාණය කිරීම, විරාගය, නිරෝධය, අත්හැරීම ඔය ආදී වශයෙන් දක්වනවා. මේ තියෙන දුඃඛස්කන්ධය නැති කිරීමමයි නිවන, රාගාදී ක්ලේශ, මේ හැමදෙයක්ම ගින්නක් බුදුපියාණන් වහන්සේ වදාළේ "භව නිරෝධය නිවන බවයි." "නිවන" කියන්නේ භවනිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂයයි.

(නිවනේ නිවීම, කටුකරුන්දේ ඤාණනන්ද භික්ෂු)

## මහාභිනික්මන

අග්ගිවෙසනය, සම්‍යක් සම්බෝධිය ලබන්නට පෙර බෝධිසත්ත්වයෙකුව සිටි මාතුළ මෙවන් සිතුවිල්ලක් පහළවිය. ගෘහ වාසය බාධකයන්ගෙන් පිරුණුඑකක්. කෙලෙස් දූහුවිල්ලෙන් පිරුණුඑකකි. පැවිදිබවනම් ආකාශය වැනි පුලුල්ව පැතිරගිය නිදහස් තැනකි. ගිහිගෙයි වසමින් බ්‍රහ්මචර්‍යයාකරන්නට නොහැකියි. එහෙයින් මම කෙස්, රවුලු කපා, කසාවත් හැඳ ගිහිගෙයින් පිටව පැවිදිවීම උචිතබවය.

අග්ගිවෙසනය, තරුණවිය ආරම්භයේ, ප්‍රථම අවස්ථාවේ, එකද කෙස්ගසක් හෝ සුදුව නොතිබූ, ජවසම්පන්න තරුණයෙකුවූ මම, මාගේ බැහැරයෑමට නොකැමැතිව හඬමින්, හැඩූකඳුලින් මුහුණු තෙමා ගත් මගේ දෙමව්පියන්, බිරිඳ, නෑදෑයින්, හිතවතුන් කිසිවෙකුත් පිළිබඳව නොසිතා, හිසකෙස් හා රැවුල කපාදමා සහ සිවුරුහැඳ පොරවාගෙන ගිහිගෙයින් පිටව, පැවිද්දට වන්නෙමි.

(මහා සච්චන සූත්‍රයෙනි)

අග්ගිවෙසනය, කයට දුක්දීමෙන් සත්‍යාවබෝධය ලැබිය නොහැකිබව අවබෝධකළ මම ඉන්බැහැර වූයෙමි. මාගේ පියාගේ කුඹුරෙහි වප්මගුල් දිනයේ ජම්බුගසක් පාමුලෙහිදී මාවැඩූ ප්‍රථම ධ්‍යානය මට සිහිවිය. ඒ සමඟම බුද්ධත්වය ලබාගැනීමේ මාර්ගයද මෙය වියයුතු ලෙසත් මට අවබෝධවිය. කාමභෝගයන් කෙරෙහි ආශාවන් ඇතිකරවන කවර හෝ දෙයක් ඇත්නම් එය ප්‍රයෝජනයට

නොගෙන, දුකට හේතුනොවන කාමයෙන් බැහැරවීමෙන් ඇතිවන යහපත් සැපයට මා බිය නොවිය යුත්තේය. යන සිතිවිල්ල මාතුළ ඇතිවිය. මම කාමවිලාසිතාවන් ගෙන් බැහැරවීම පිළිබඳව බිය නොවීය යුතුය. ඉන්බැහැරව පවතිනදේ සෙවිය යුතුයි. මම සිතාගතිමි.

(මහා සච්චක සූත්‍රයෙනි)

# ආලෝකො උදපාදී

අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහ කාරකං ගවෙසන්තො- දුක්ඛා ජාති පුනප්පුනං
ගහ කාරකං දිට්ඨොසි - පුනගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා- ගහකූටං විසංඛිතං
විසංඛාරං ගතං චිත්තං - තණ්හා නං ඛය මජ්ක්ධගා

ඉපදීම දුකකි, නැවත නැවතත් ඉපදීම නම්වූ ගෙය තනන්නා සොයමින් සසරෙහි වැටී අනන්ත ජාතිවල සැරිසැරුවෙමි.

තෘෂ්ණාව නම්වූ ගෙය තනන්නාණෙනි, වඩුව, මවිසින් ඔබව දැකගනු ලැබීය. ඔබ තැනූ නිවසෙහි කැණිමඬල වනසාදැමීමි. තවත් කවරඅයුරකින් හෝ තෘෂ්ණාව නම්වූ ගෙය තැනිය නොහැකිවන අයුරින් ගත-සිත වෙන්කළෙමි. තණ්හා නමැති සියළු බන්ධනයන් ලෙහා දැමුවෙමි. ගලවා විනාශ කර දැමුවෙමි.

(ධම්මපදය)

සසරදුකින් මිදී සත්‍යාවබෝධය ලැබීම පිණිස සසුන්ගතව භාවනාවෙහි නිරතවෙමින්, විදර්ශනාවන්හි යෙදෙමින් සිටි, තෙරුන්වහන්සේලා හා තෙරණියන් වහන්සේලා තුල පහලවූ සිතිවිලි චිත්තවිකාරයන් පිළිබඳව පුළුල්අවබෝධයක් ථෙර - ථෙරී ගාථා කියැවීමෙන් ලැබිය හැකිය. මෙම ස්වභාවයන් එදාට පමණක් නොව, අද දවසේවුවද, ධර්මාවබෝධය පිණිස වෙරදරන්නන් තුළ දැකිය හැක්කේය.

විමුක්තිය ලැබීම - සත්‍යාවබෝධකිරීමට උන්වහන්සේලා තුළ පැවති ඕනෑකම, උත්සාහය, ධෛර්‍ය්‍ය, වීර්‍ය්‍ය, කොතරම් බලවත්දැයි අපහට වැටහෙනුයේ, තම සිත්හි මොහොතෙන් මොහොත පහළවූ විවිධවූ චිත්ත විකාරයන් හා ගැටෙමින්, ඒවාට අවනත නොවෙමින්, ඒවා මැඩගත් ආකාරයත් - පහළ වූ සිතිවිලි - චිත්තවිකාරයන් කවරේදැ'යි විසිතුරුව දක්වා ඇති බැවිනි.

එකම නිමිත්තක්, එකම කමටහනක්, යටතේ සියළුදෙනාම විමුක්තිය ලැබූබවක් හෝ සත්‍යාවබෝධකළ බවක් නොව - කවරෙකු හෝ වේවා තමන්හට හේතුප්‍රත්‍යය වූ කිසිවක් ඔස්සේ, ප්‍රත්‍යවේක්ෂාකොට ධර්මඥාණය - ලබාඇති බවත් ඒවා විවිධාකර බවත් පැහැදිලි වන්නේය.

එම්බා චිත්තය, තා වසන, තගේ ගිහිගෙයි වාසයෙන් පලක් නොමැතිබව කියමින් කොතරම් කලෙක සිට ඉන් බැහැරවීම ආයාචනය කළේ නොවේද? ඒ මා දැන් පැවිදි භාවයට පත්වඇති අවස්ථාවේ, කුමක් හෙයින් තා මට අනුකූලතාවය නොදක්වන්නෙහි ද?

එම්බා චිත්තය, තා විසින් කඳු හෙල්, විසිතුරු පියාපත් ඇති පක්ෂීහු, ජලදහරාවන්ගේ පතිතයෙන් හැඩවන ගල්තලාවන්හි ආස්වාදය ලබන තාගේ අනුකූලතාවය සහය මට දෙනලෙසත් මම ආයාචනය නොකළෙම්ද?

එම්බා චිත්තය, තගේ ආයාචනය අනුව මම හිත මිතුරන්ද, ප්‍රියයන්ද, නෑදෑයන්ද, මව්පියන්ද, ක්‍රීඩාශීලී කැමැත්තද, ලෝකයේ ඇති කාමගුණයන්ද, යන සියල්ල අත්හැරදමා, පැවිද්දට එළැඹියෙමි. මේ ආරණ්‍යයට පැමිණියෙමි. එසේ කළේ වුවද, තෝ මා නොපිනවන්නේය.

එම්බා චිත්තය, මේ සිත මාගේමය. තෝ අන්සතු නොවේමය. ක්ලේශ යුද්ධයට භාවනාවෙන් සන්නාහ සන්නද්ධ වනවිට තා වැළපෙන්නේ කිම? මේ ත්‍රයිභූමික ධර්මසියල්ල අනිත්‍යයැ’යි නුවණින් දකිමින් නිවන සොයන්නට ගිහිගෙයින් නික්ම ආවෙමි.

එම්බා චිත්තය, විරාගය විසින් වලකාලීමට ඉතා දුක්කර වූ චපල සිත නම්වූ නුඹ වඳුරෙකුම වැනියැ’යි සුභාෂිතවාදීවූ මිනිසුන් අතරෙහි උතුම්වූ ලෝකවිදුවූ බුදුන්වහන්සේ වදාළහ.

නුවණ මදවූ පෘතග්ජනයින් යම්තැනකට කැමති වූවාහු නම්, එහි රැඳුනාහුනම්, ඇළුනාහුනම්, ඒ කාමයෝ ඔවුනට විචිත්‍රය. මධූරය. මනෝරම්‍යය. මනස්කාන්ත වේමය. ඔවුහු පුනර්භවය සොයනුයේ සුඛයෙන් වළකන ලදුව නිරයෙහි පවතින්නාවූ දුකම ලබන්නෝ වෙති.

පක්ෂීන් විසින් කරනලද නාද ඇති වනයෙහි, වග වලසුන් ඇසුරෙහි වසන්නේ, සිරුරෙහි අපේක්ෂාව

හැරදමව. කාමයන්හි ගැලීම වරදක්ලෙස හුවාදක්වමින් මා පැවිද්දට පත්කළෙහිය.

එම්බා චිත්තය, බුදුසසුනෙහි ධ්‍යානවඩන, ඉන්ද්‍රිය බල බොධ්‍යාංග, සමාධි භාවනාවන් වඩව, ත්‍රිවිධ විද්‍යාවන් ලබව'යි පැවිද්දට පෙර, තා මට අණකළෙහිය.

එම්බා චිත්තය, පවතින්නාවූ සියළු දුක් ක්ෂයකොට, උතුම් වූ නිවන් අරමුණුකළ සියළු කෙලෙස්මළ දුරුකරන්නාවූ නිවන අවබෝධය කිරීම පිණිස ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය වඩන ලෙසින් තා මට අණකළෙහිය.

එම්බා චිත්තය, ස්කන්ධයන් දුකයි. නුවණින් බලව, යළි යමකින් දුක හටගැනේනම්, එය දුරුකරව. මේ අත්බවෙහිදීම දුක් කෙළවරකරව'යි තා මට අණකළෙහිය.

එම්බා චිත්තය, තා ස්කන්ධයන් අනිත්‍යයැ'යිද දුකැ'යිද ශූන්‍යයැ'යිද අනාත්මයැ'යිද වේදනාකාරීයැ'යිද හිංසකයැ'යිද, නුවණින් විදර්ශණකර, මනෝපචාරයන්, "සිත" නම්වූ තා කෙරෙන් වළක්වයි මට අණකළෙහිය.

එම්බා චිත්තය, තෝ හිස මුඩුකොට, විරූපව, භික්ෂු සමූහයා අතුරෙහි, කබලක් අතින්ගෙන සිඟාඇවිදුව, මහාර්ෂිවූ බුදුන්වහන්සේගේ උපදේශයෙහි පිහිටුවව'යි මට අණකළෙහිය.

එම්බා චිත්තය, අහස පැහැදිළි පුරපසුළොස්වකදා සඳමෙන්, ප්‍රමෝදයෙන් යුතුව, වීථිවල ගැවසෙමින් නොසිට, පංචකාමයන්හි නොඇලුන සිත ඇතියෙක් වෙව'යි මට අණකළෙහිය.

එම්බා චිත්තය, හැමකල්හි ධූතාංගයෙහි ඇළුන, ආරණ්‍යයක වසමින් පිණ්ඩපාතිකවන්නැ'යි පාංශකූලිකවන්නැ'යි නොනිදා සිටින්නැ'යි තා මට අණකළෙහි ය.

එම්බා චිත්තය, තෝ මා අනිතවූ සංසාරයෙහි නිමග්න කරවන්නේද? තෝ ඵල ලබන්නට කැමති අයෙකුලවා වෘක්ෂයන් වවා, එම රුක්මුල් කපාදමන්නට කැමති එකෙකු ලෙසින් මෙයාකාරයෙන් හැසිරෙන්නේහිද?

එම්බා රුවක්නැති තැනැත්තා, දුරගමන්ඇතිය. එකඇයුරක් නැති තැනැත්ත, මින්මතු මම තා විශ්වාස නොකරන්නෙමි. යම් හෙයකින් අතීත කාමයෝ දුක් වූවාහුද, අනාගතයෙහි කටුකඵල ඇත්තාහුද, මහත්සේ භය ඇත්තාහුදවේ. එහෙයින් මම "නිවන" සොයමින් හැසිරෙන්නෙමි.

එම්බා චිත්තය, මම අභාග්‍ය හෙයින් හෝ නිර්ලජ්ජිතාව නිසා හෝ චපල සිතට වහල්ව හෝ රාජද්‍රෝහි බැවින් හෝ ඒවායින් මිදී දිවිරැකගන්නා අරමුණින් ගිහිගෙයින් නික්මුනේ නොවෙමි. මම තගේ වසඟයෙහි නොසිටින බවට මට පොරොන්දු වූයෙමි.

එම්බා චිත්තය, තෝ එකල්හි "අල්පේච්ඡ" බවම සත්පුරුෂයන් විසින් වර්ණනා කරන්නේය. ගුණමකු බව ප්‍රහීණකිරීම දුඃඛයාගේ දුරුවීමය'යිද එහෙයින් එවන් ගුණයන්හි පිහිටිය යුතුයැ'යි මට අණ කළෙහිය. එහෙත් දැන් තෝ, තොගේ පෙරපුරුදු දෙයටම යන්නේද?

තෘෂ්ණාව ද, අවිද්‍යාව ද, ප්‍රියාප්‍රියයෝ ද, ශුභරූපයෝද, සුභවේදනාවද, මනවඩන කාමගුණයෝද, මවිසින් වමාරා දමනලද්දෙමි. වමාරාදැමූදේ යළි ගිළින්නට මම උත්සාහ නොකරමි.

එම්බා චිත්තය, සියළු භව, යොනි, ගති, විඥාණුස්සති යන තැන්හිම තා අනුව සිටියෙමි. නොයෙක් නොයෙක් ජාතීන්හිදී මා විසින් තෝ කෝපනොකරන ලද්දෙමි. ආධ්‍යාත්මයෙහි (සන්තාපනයෙහි) වැදසිටි හා කළගුණ නොදන්නා බැවින්, තා විසින් නිපදවනලද සසර දුකින් මා දිගුකලක් සැරිසැරුවෙමි.

එම්බා චිත්තය, තොපම අපට උපකාර වෙති. තොපම බ්‍රාහ්මණවන්නේය. තොපම රජවන්නේය. තොපම හේතුකොටගෙන ඇති ඇතැම් කලෙක වෛශ්‍යයන්, ශුද්‍රයන්වන්නේ, දිව්‍යභාවයද ලබන්නෙමි. තොප හේතුකොටගෙනම අසුරවන්නේද, තිරිසන් වන්නේ, ප්‍රේතභාවයන්ද ලබන්නට වන්නේය.

එම්බා චිත්තය, එක්වූ සෙලැවෙන චිත්‍ර (චරන චිත්‍ර) දක්වන්නෙකු ලෙසින් තෝ මට පුනපුනා දොඩවන්නේ නොවේද? උමතුවූවෙකු ලෙසින් මා හා කෙළිමින්, මා පොළඹවන්නේ නොවේද? එම්බා චිත්තය, තට මා කළ වරදකුමක්ද? පෙර මේ සිත කැමති අයුරින් - කැමති, කැමති තැනක සුවසේ සැරිසැරීය. අද මම ඒ සිත හෙණ්ඩුවක් ගත් අයෙකු, මහ ඇතෙකුව හික්මවන අයුරින්, යොනිසෝමනසිකාරයෙන් හික්මවන්නෙමි. මගේ යටතට පමුණුවන්නෙමි.

එම්බා චිත්තය, හොඳින් දැමුනාවූ, සමාහිත බැවින් සිටියා වූ තා කරණකොට අජානීය අශ්වයෙකු මෙහෙයවන අසරුවෙකුසේ මම සිත රැකගනිමින් නිරන්තරයෙන්, සොයනලද ක්ෂේම මාර්ගයට පැමිණෙන්නට සමත් වෙමි.

එම්බා චිත්තය, දැඩිරැහැනින් කණුවක බඳනාලද හස්තිරාජයෙකු ලෙසින්, භාවනා බලයෙන්, මම තා අරමුණෙහි බඳින්නෙමි. මා විසින් සිහියෙන් යුතුව මැනවින් රකිනලද භාවනාවෙන්, මැනවින් බඳිනලද්දාවූ තෝ කවර භවයක හෝ නොරැඳෙන්නේය.

නොමගයන්නාවූ ඉන්ද්‍රියයන් ප්‍රඥාවෙන්, යෝග භාවනාවෙන් දමනයකොට, විදර්ශනාවෙහි පිවිසවා, ආයතනයන්ගේ ඇතිවීම්, පැවතීම්, නැතිවීම්, මාර්ග ප්‍රඥාවෙන් දැක, සම්මා සම්බුදුන්ගේ පුත්‍රයෙකු වන්නෙමි.

එම්බා චිත්තය, තෝ වනාහි චතුර්විධ විපර්‍යාසයන්හි ගැලෙමින්සිටි මා නොදරුවෙකුසේ ඔබ මොබ අදින්නේය. එහෙත් සංයෝජන බන්ධනයෙන් සිඳුනා වූ කාරුණිකවූ සම්මා සම්බුදුන් ඒකාන්තයෙන් මැනවින් හමුවිය.

එම්බා චිත්තය. මම වෘක්ෂලතාදියෙන් විසිතුරුවු වනයෙහි නිදහස් මෘගයෙකු යම්සේ එහි කැමතිවන්නේ නම්, එසේම වර්ෂා කාලයෙහි, වැහිවළාපෙළ සිත්කළු පර්වතයක් හමුවේ නිරවුල්වූ ඒ පර්වතයෙහි සිත අලවන්නෙමි. තෝ නිසැකවම පරදින්නේය.

එම්බා චිත්තය, තොපගේ ඡන්දයෙන්ද, වසඟයෙන්ද සිටිනා යම් මිනිසෙකු හෝ ගැහැණියක, ගෙහනිශ්‍රිත සුඛයක් අනුභව කරන්නේ නම්, නුවණමඳවූද, මාරයාගේ වසඟයට පත්වනසුළුවූද, භවයම පතන්නාවූ සුළුවූද, භවයම පතන්නා වූ ඔව්හු තාගේ ශ්‍රාවකයෝයි. මම එබඳු නොවන්නෙමි.

(තලපුට සරවීර ගාථා) (ථෙරගාථා)

## විමුක්තිය

දොරකවුළු වැසූ කුටියෙක සිරවූ සමනළයා කුටියෙහි ඔබමොබ පියාඹායමින් කුටියෙන් පිටවීමට තැනක් සොයන්නට විය. යන්තමින් හෝ ආලෝක ස්වභාවයක් දුටුවිට වහ වහා එදෙසට පියෑඹීය. ඒ ස්වභාවය ඇති තැන වැසුවේ, කුටියෙන් පිටවියහැකි දොරකවුළුවක් හෝ සිදුරක් වෙතැ'යි ඌට සිතුණනිසා වියහැකිය. එහෙත් එතැන, එවන් පිටවීයෑමේ හැකියාවක් ඇති තැනක් නොවන බැව් හැඟුණ හෙයින් ඌ යළිත් නිදහස පතා පියඹන්නටවිය. රැඳෙන්නටවිය. රැවටෙන්නටවිය. රැඳුනේය. ඉගිලුණේය. නැවතුනේය. ගිමන්හළේය. වෙහෙස නිවුණකල යළිත් ඉගිලුණේය. පියෑඹුවේය. කාලය පිළිබඳව කිසියම් අවබෝධයක් ඌ තුළ තිබුණාද වියහැකිය. නොතිබුණද වියහැකිය. සමනළයාට ඌ සතු ලෝකයක් තිබුණබව නම් පැහැදිලිය. ඌ උත්සාහ කළේ, උගේ ලෝකය පවත්වාගැනීමටය.

රැයක් ගෙවීගොස් අරුණළු උදාවත්ම, කුටියෙහි සිටි අයෙකු, කුටියේ කවුළුවක් විවරකළේය. කවුළුව තුළින්

සිසිල්සුළඟක් කුටියතුළට ඇදීආවේය. ආලෝකයද පිවිසුණේය. සමනළයා පිළිබඳව කිසිදුහැඟීමක්, කුටියේ සිටි තැනැත්තාතුළ එතෙක් නොවීය.

කුටියතුළ සිරවීසිටි සමනලයා, ක්ෂණයකින් ආලෝකය සහ සුළඟ ඇතුළුවන කවුළු විවරය දුටුවේය. තවත් මොහොතකවු පමානොවූ හේ ක්ෂණයෙන්ම එම විවරයෙන් පිටවී, එතෙක් සිරවී සිටීමින් විඳී අපමණ දුක් කන්දරාවකින් මිදී, නිදහසේ පියාඹා ගියේය.

මෙතෙක් සමනළයා පිළිබඳව අදහසක් නොදැරූ, නොතිබූ තැනැත්තා කුටියෙන් පිටවීයන සමනළයාව දුටුවේය. කුටියේ සිරවී සිටිමින්, ඉන් බැහැරවන්නට උෟ වෙහෙසෙන්නට ඇතිබවක්ද සිතුණි. කුටියේ කවුළුව මුළුවනින්ම විවෘතවූවා නොවේ. යන්තම් විවරවූවා පමණි. සුලු ඉඩප්‍රමාණයක් හෝ ලැබුණ මොහොතේ, තමන්ගේ නිදහස පතා සමනළයා අනුගමනයකළ ක්ෂණික ක්‍රියාපිළිවෙත පිළිබඳව හෙතෙම මෙනෙහි කරන්නට විය.

භවයේ සිරවී, අපමණවත් දුක්විඳිමින්, එවන්දුකින් මිදීමට වෙරදරමින් සිටින මා වුවද මහාපරිමාණයෙන් නොව, ලැබෙන සුළුඅවස්ථාවකදී හෝ ඉඩක්ලද ක්ෂණයෙන් , සසර කුටියෙන් මිදී, නිදහස ලැබිය යුත්තේ යැ'යි අරමුණක් ඒ තැනැත්තාතුළ පහළ විය. හේ එයම, වඩ වඩා මෙනෙහි කරන්නට විය. ප්‍රත්‍යවේක්ෂා කරන්නට විය. එයම ඔහුට අනිත්‍යානුදර්ශණ නිමිත්තක් වූයේය.

# අරගලය

පුද්ගලයින් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා අතර කථාබහකි.

තෙවැනි පුද්ගලයෙකුහට මෙය ආස්වාදය වෙයි.
පළමු දෙදෙනා බහින්බස් වෙයි.

තෙවැන්නාහට, මෙයද ආස්වාදය වෙයි. විචිකිච්ඡාවද වෙයි.

පළමුදෙදෙනා දබරවෙයි.

තෙවැන්නාහට මෙයද විචිකිච්ඡාවකි. කුතුහලයකි. සැකයකි. නන්දිරාගයකි. පළමු දෙදෙනාගේ ක්‍රියාවන් ස්වභාවයන් අරමුණු කරමින් තෙවැන්නා තුල සිතුවිලි ලෙසින් අපමණවත් දේ නිර්මාණය වෙයි.

පළමුදෙදෙනා එකිනෙකාගෙන් වෙන්වී නොපෙනී යයි.

එහෙත් පළමුදෙදෙනාගේ හමුවීම ඔස්සේ තෙවැන්නා තුළ ඇතිවූ ස්වභාවයන්, තවමත් දුරුවීනොමැත. ඔහු තවමත් සිදුවීම්තුළ ගැලෙමින් - විමසමින් - මෙනෙහි කරමින් ඒවාතුළම අතරමංවී සිටී.

හේතුකාරකවූ පළමුපුද්ගලයින් දෙදෙනා මේවනවිට පෙනන - දකින - අසන - මානයක නැත්තේවුවද තෙවැන්නා තවමත් අවිද්‍යාව තුළය. මෙහිදී,

රූපයද - ඇසද , පුද්ගලයෝය.

විඥාණය, දකින්නා වේ.

ඇසත් - රූපයත් දුටුදේත් නිමාවී ඇත. අනවබෝධයෙන් ඇතිවූ, අයෝනිසෝමනසිකාරී ස්වභාවයන්, ඒවාට අනුගතව මතුවූ විඥාණය, අවිද්‍යාව පවත්නාතාක් තවත් තවත් දිගුවෙමින් නැවතීමේ ලකුණක් නැති වාක්‍යයක් මෙන් පවතින්නේය.

කණද - ශබ්දයද පුද්ගලයෝනම්

විඥාණය තෙවැන්නා වෙයි.

නාසයද - ගන්ධයද, පුද්ගලයෝනම් විඥාණය තෙවැන්නා වෙයි.

දිවද - රසයද, පුද්ගලයෝනම් විඥාණය තෙවැන්නා වෙයි.

කයද - පහසද, පුද්ගලයෝනම් තෙවැන්නා විඥාණය වෙයි.

මනස, මනෝරූප පුද්ගලයෝනම් තෙවැන්නා විඥාණය වෙයි.

අවිද්‍යාව කරණකොට ස්වභාවයන් පිළිබඳව සැබෑ තත්වය. නොදන්නාකම හේතුකොට ගෙන අසිහියෙන් - අයෝනිසෝමනසිකාරයෙන් සංසාර පුරුදු, ත්‍රිවිධ තෘෂ්ණා නම්වූ විඥාණයනට අනුගතවෙමින් නිමාවකින් තොරව අනන්තවත් අයුරින් භාවගාමි වන්නේය.

## අනන්තය

කෙළවරක් දැකියනොහැකි. කිවනොහැකි, නොදන්නා අනන්තය, කිසිවක අගක් - මුලක් කිවහැකිවන්නේ නම් එතැන කවර ආකාරයක හෝ සීමාවක් ඇතිවන්නේය.

සීමාව ඇතිවූයේ දන්නාබවක් හැඟවෙයි. කවරක හෝ එල්බගන්නේ වෙයි. ඇලුනේවෙයි. දැනගත්තේ වෙයි. සැබවින්ම එතැන ඇතිවූයේ දැනගැනීමක් නොව, මුලාවක්පමණි. එතැන අවිද්‍යාවය. එතැන සක්කායදිට්ඨියයි.

කිසිවෙකු නොකළ හෝ නොදන්නා දෙයක් පිළිබඳව විමසූකළ ඔහුගේ පිළිතුරවනුයේ මං දන්නේ නැහැ. දන්නේ නැතිදේ කොහොම කියන්නද යනුවෙන් වියහැක.

නොදන්නේ - නොදන්නාකමෙහි අගක් මුලක්, ප්‍රමාණයක්, තැනක්, නොතැනක් දැක්විය නොහැක්කේය. සීමාවක්නැති බැවින්ද, නොදන්නා බැවින් නොඇලුනේය. නොවෙලුනේය. නොපෙනුනේය. නොබැලුනේය. කවරේදැ'යි කිව නොහැක්කේය. අනන්තනම් වන්නේය. සත්ත්වයා දුක් විඳිනුයේ, නොදතයුතුදේ දැනගන්නා බැවිනි.

දැනගත යුතුදේ නොදන්නා බැවිනි. දැනගත යුත්තේ සම්මාදිට්ඨිය පිළිබඳවය. යෝනිසෝමනසිකාරය පිළිබඳවය. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ධර්තාවයන් පිළිබඳවය. එවිට සැබෑස්වභාවය, ධර්මතාවය අවබෝධවන්නේය. සත්‍ය ප්‍රත්‍යක්ෂවන්නේය. මුලාවෙන් ගැලවෙනුයේ දුකින් මිදෙන්නේය.

"දුක" උපදිනුයේ පංචඋපදානස්කන්ධය ඔස්සේ විඥාණය නම් වූ කාම, භව, විභය තණ්හා කෙරෙනි. ඵස්ස, වේදනා, සංඥා, චේතනා මනසිකාරයෙන් ලෙසින්ම දුක පවතින්නේය. ආස්වාද - ආදිනව - නිස්සරණ ලෙසින් පෙරමුණ ගන්නේය.

මේවායින් කවරහෝ හේතුප්‍රත්‍යයක් නිරුද්ධවනුයේ, දුක්ඛනිරෝධයද පෙනෙන්නේය. දුකෙහි හේතුප්‍රත්‍යයම දැනගත යුත්තේය.

දැනගනුයේ සංඥාවය.

සංඥාව හඳුනාගනුයේ, නාමරූප ඇතිවූයේ වෙයි.

සංස්කාර ඇතිවූයේ වෙයි.

සක්කායදිට්ඨිය පහළවූයේ වෙයි.

මුලාවම උපන්නේ වෙයි.

උපන්නේද සමගම.

මරණයද වන්නේය.

දුක වන්නේය.

සැප අපේක්ෂාවිය.

දුකින්මිදී, සැපය සොයනුයේ, භවයට පිවිසුනේ විය.

භවයෙහි ගැලෙනුයේ, සංසාරයේ අතරමං වූයේ විය.

සංසාරවට්ටයෙහි (දියසුළියෙහි) මැදිවූයේ විය.

ඉන් ගැලවීගත නොහැකිවූයේ, දුකෙහිම ගිලෙන්නේය.

දුකින් මිදෙන්නටනම්,

දුක නැතිකිරීමටනම්,

දුක ඇතිවූ හේතුව, හඳුනාගත යුත්තේය.

දුක ඇතිකළ හේතුව, නැතිකළ යුත්තේය.

දුක ඇතිවීමට පාදකවූ හේතුව නැතිනොකර, කිසිදාක දුක නැතිකරලිය නොහැක්කේමය.

සම්බුදු පියාණන් වහන්සේ විසින් අවබෝධකොට සත්ත්වයාගේ හිතසුව පිණිස දේශනාකොට වදාළ ශ්‍රී සද්ධර්මයෙහි දැක්වෙනුයේ ඒ චතුරාර්‍ය්‍යසත්‍යයයි.

දුකින් මිදීමේ මඟයි.

දුක නැති කිරීමේ මඟයි.

එම මඟ දකිනුයේ,

එම මඟෙහි ගමන්කරනුයේ - සංසාරවට්ටයෙන් වෙන්වන්නේය.

භවය නවතින්නේය. - "දුක" නැතිවන්නේය.

නවතිනුයේ, නොදන්නේය.

නොවනුයේ,

නාමරූප නැත්තේය.

දිට්ඨි - සුත - මුත - නැත්තේය.

එතැනක් - මෙතැනක් නැත්තේය.

දිග - පළල - උස - කොට - උඩ - යට කියා කිසිවක් නැත්තේය.

ද්වයතාවයක් නැත්තේමය.

අගක්, මුලක් - පිළිබඳව පැවසිය නොහැක්කේ,

දැකිය නොහැක්කේ, නිරවශේෂ අනන්තයමය.

මේ ලෝකයේ හටගත්තු, ඇත්ත දේ හැටියට පෙනෙන දේවල්, ඇත්ත වශයෙන්ම කරනලද, ගොඩනගනලද, සංස්කාරයෝම, සංඛතයෝම මිස, සත්‍ය ලෙස පවතින්නේ නොවේ. පවතිනුයේ, සිතනුයේ මුලාවය.

අතීතයේ පැවතුනානම් පැවතියේ සංස්කාර ගොඩකි. වර්තමානයේ තිබෙනවානම් තිබෙනුයේ සංස්කාර ගොඩකි. අනාගතයේදී ඇතිවනවානම් ඇතිවනුයේද, සංස්කාර ගොඩක්ම පමණි. මේවාසියල්ලම මවාගැනීම් ස්වභාවයක්බව වටහාගැනීමට, ප්‍රත්‍යක්ෂකර ගැනීමට හැකිවිය යුතුය.

අල්ලාගැනීම නිසා භවයක් ඇතිවෙයි. හටගත්තේ වෙයි. යම්තාක් හටගන්නා ස්වභාවය ඇත්තේද, ඒතාක් නැතිවන ස්වභාවයද ඇත්තේය.

මෙය ප්‍රත්‍යක්ෂකර ගතයුත්තේය. එසේ වූකල සසරින් ගැලවෙන්නේය. භවය අත්හැරෙන්නේය. "දුක" නිරුද්ධවන්නේය. යලි ඉපදීමේ හේතුන් නොවන්නේය. මහණෙනි, යම් ධර්මකාරණාවන් මෙනෙහිකෙරේනම්, මෙනෙහි නොකළයුතු ඒ ධර්මයෝ කවරේද? යත්, යම් ධර්මකාරණයක් මෙනෙහි කරන්නෙකුහට කාමාශ්‍රවඋපදීද, උපන් කාමාශ්‍රව වැඩෙන්නේද, නූපන් භවාශ්‍රවයෝ උපදින්නේද, උපන් භවාශ්‍රවයෝ වැඩෙන්නේද නූපන් අවිද්‍යාශ්‍රවයෝ උපදින්නේද, උපන් අවිද්‍යාභ්‍රවයෝ වැඩෙන්නේද, එවන් ආකාරයේ ධර්මකාරණාවන් මෙනෙහි නොකළයුතු ධර්මයෝයි.

මහණෙනි, යම් ධර්මකාරණාවන් මෙනෙහි නොකෙරේනම්, මෙනෙහි කළයුතු ඒ ධර්මයෝ කවරේදයත්, මහණෙනි ධර්මකාරණාවන් මෙනෙහි කරන්නෙකුහට නූපන් කාමාශ්‍රව නූපදින්නේද, උපන් භවාශ්‍රව ප්‍රහීණ වන්නේද, නූපන් අවිද්‍යාශ්‍රවයන් නූපදින්නේද? උපන් අවිද්‍යාශ්‍රවයන් ප්‍රහීණවන්නේද, මෙවන් ධර්මකාරණාවන් කවරෙකු හෝ මෙනෙහි නොකරන්නේ නම්, එවන් ධර්මකාරණාවන් මෙනෙහි කළයුතු ධර්මයෝය.

(සබ්බාසව සූත්‍රයෙනි)

## සසර පැවැත්මට හේතුවන ආහාර

පින්වත් මහණෙනි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත්, උපදින්නට සිටින සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත් පවතින්නා වූ ආහාර වර්ග සතරකි. ඒ කවර ආහාර වර්ගද යත්,

1. ගොරෝසු හෝ සියුම් හෝ කබලිංකාර ආහාරය.
2. දෙවැනි ආහාරය ස්පර්ශයයි.
3. තෙවැනි ආහාරය මනෝසංචේතනාවයි.
4. සිව්වැනි ආහාරය විඥාණයයි (සිහිපත් කිරීමයි, මෙනෙහි කිරීමයි)

පින්වත් මහණෙනි, ස්පර්ශයනම්වූ ආහාරය කෙරෙහි යම් රාගයක් ඇත්නම්, යම් ආස්වාදයක් ඇත්නම්, යම් තණ්හාවක් ඇත්නම්, එහි පිහිටන විඥාණය (මෙනෙහි කිරීම) වැඩෙන්නේ වෙයි.

යම්තැනක විඥාණය පිහිටන්නේවේද, වැඩෙන්නේවේද

එහි තිබෙන්නේ, වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාරවැනි භාව පදාර්ථයන් සහ සතරමහාභූතයින්ගෙන් හටගත් රූප යන නාමරූපයන්ගේ බැසගැනීමය.

නාමරූපයන් බැසගන්නේ යම් තැනෙකද, එහි තිබෙන්නේ (පුඤ්ඤාභිසංඛාර - අපුඤ්ඤාභිසංඛාර - අනෙඤ්ජාභිසංඛාර) සංස්කාරයන්ගේ වර්ධනයයි.

සංස්කාරයන්ගේ වර්ධනයක් යම් තැනෙකද තිබෙන්නේ, එහි පවතින්නේ මතුඉපදීම පිණිස හේතුවන භවයයි. මතුඉපදීමට හේතුවන භවය යම් තැනකද තිබෙන්නේ, එහි තිබෙන්නේ ඉපදීමත් ජරාවත් මරණයත්ය.

මතුඉපදීමත් ජරාමරණයත් යම් තැනක තිබෙන්නේ නම් - පින්වත් මහණෙනි, එතැන ශෝක සහිතවූ තැනක් යැයි කියමි. සුසුම්හෙළීම් සහිත තැනැක්යැ'යි කියමි.

පින්වත් මහණෙනි, ස්පර්ශාහාරය කෙරෙහි රාගය නැතිවිට, ආස්වාදයෙන් අරමුණු රසවිඳීම් නැතිවිට, තණ්හාව නැතිවිට "විඥාණය" එහි නොපිහිටයි. නොවැඩෙයි.

විඥාණය නොපිහිටන්නේ, නොවැඩෙන්නේ යම්තැනකද, එහි නාමරූපයන්ගේ බැසගැනීමක් නැත.

නාමරූපයන්ගේ බැසගැනීමක් නැත්තේ යම්තැනෙකද, එහි සංස්කාරයන්ගේ වර්ධනයක් නැත.

සංස්කාරයන්ගේ වර්ධනයක් නැත්තේ යම්තැනකද, එහි මතු ඉපදීමට හේතුවන ''භවයේ" හටගැනීමක්ද නැත.

මතු ඉපදීමට හේතුවන භවයේ හටගැනීමක් නැත්තේ යම්තැනකද, එහි මතුවට හටගන්නාවූ ඉපදීමක් හෝ ජරා මරණයක් නැත.

මතුවට හටගන්නාවූ ඉපදීමත්, ජරා මරණයත් නැත්තේ යම්තැනෙකද, පින්වත් මහණෙනි, අන්න එතැන ශෝක රහිත තැනයැ'යි කියමි. පීඩාරහිත (නැත) යැ'යි කියමි. සුසුම්හෙළීම් රහිත තැනයැ'යිකියමි. දුකින් මිදුණ - නිවී ගිය තැනයැයි කියමි.

(අත්පිරාග සූත්‍රයෙනි)

පින්වත් මහණෙනි, ආහාරයක් වශයෙන් පවතින ස්පර්ශය දැකියයුත්තේ කුමනආකාරයකින්ද?

පින්වත් මහණෙනි, හොඳින් ඇවිදයාහැකි ගවදෙනෙකගේ සමගලවා දැමුවේ යැ'යි සිතමු. එවිට ඒ ගවදෙන හේත්තුවන්නේ බිත්තියකටනම්, බිත්තියෙහි සිටින සතුන් ඇයව කන්නට පටන්ගන්නේය. ඒ ගවදෙන හේත්තුවන්නේ ගසකටනම්, ගසේ සිටින සතුන් ඇයව කන්නේය. ඒ ගවදෙන ජලයට බසින්නේනම්, දියේසිටින සතුන් ඇයව කාදමන්නේය. ඒ ගවදෙන සිටින්නේ එළිමහනේනම්, එළිමහනේ සිටින සතුන් ඇයව කන්නේය.

මෙසේම සම ඉවත්කරනලද ගවදෙන යම් යම් දෙයක් ස්පර්ශකොට සිටීනම්, ඒ ඒ ඇසුරු කරන තැන සිටින සතුන් විසින් ඇයව කා දමන්නාහුය.

පින්වත් මහණෙනි, ඔන්න ඔය ආකාරයෙන්, ස්පර්ශ ආහාරය දැනගත යුත්තේ යැ'යි පවසමි.

පින්වත් මහණෙනි, ස්පර්ශ ආහාරයේ තිබෙන මෙයථාර්ථය (අවිද්‍යාවන්, තණ්හාවන්, ප්‍රහීණවන ආකාරයෙන්) අවබෝධකර ගත්විට, ත්‍රිවිධ වේදනාවම පිරිසිඳ දැනගත්තේවේ. ත්‍රිවිධ වේදනාවම පිරිසිඳ දැනගත්විට ඒ ආර්යශ්‍රාවකයාහට නිර්වාණාවබෝධය පිණිස කළයුතු වෙනත් දෙයක් නැත්තේ යැ'යි කියමි.

(පුත්තමංස සුත්ත)

# එලවත්සුව

ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණ, වැඳ එකත්පස්ව සිටිමින්, ඔබ වහන්සේගේ සුවයක් මම දකිමි. ඔබ වහන්සේට සහනයක් ඇතිබවක් මම දකිමි. එහෙත් මගේ සිරුරෙහි දැඩිබවක් ඇත්තාසේ මට දැනෙයි. ඔබවහන්සේගේ ගිලන්බව හේතුකොට ගෙන කවර කවරදිශාවක් හෝ මට නොපෙනෙයි. සතිපට්ඨානධර්මයෝද මෙනෙහි නොවෙත්, ස්වාමීනි, එසේවුවත් භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා, උදෙසා කිසියම් අවසන් අවවාදයක් වදාරණසේක්ද? ඒතාක්ම ඔබ වහන්සේ පිරිනිවන්නොපානා බවට ආස්වාදයක් මාතුළ ඇතැ'යි සැළකළහ.

ආනන්දයෙනි, භික්ෂු සංඝයා මා කෙරෙන් කුමක් අපේක්ෂා කරන්නද? මා විසින් ධර්මවශයෙන් හෝ පුද්ගලවශයෙන් (අභ්‍යන්තර බාහිර) දෙකොටසක් නොකොට, දහම් දෙසනලදී. ආනන්දයෙනි, ධර්මවිෂයෙහි තථාගතයන්ගේ ආචාර්‍ය්‍ය මුෂ්ටියක් නැත. යමෙකුහට මම භික්ෂු සංඝයා පරිහරණය කරන්නෙමි කියා හෝ භික්ෂු

සංඝයා පරිහරණය කරන්නෙමි කියා හෝ භික්ෂු සංඝයා මා උදෙසා වාසය කළයුත්තේයැ'යි කියා හෝ සිතුනේ නම්, ආනන්දය, භික්ෂු සංඝයා උදෙසා කිසිවක් දේශනය කරනුඇත. ආනන්දයෙනි, මම භික්ෂු සංඝයා පරිහරණය කරන්නෙමි කියා හෝ භික්ෂු සංඝයා මා කෙරෙහි පිහිටා, මා වෙනුවෙන් පැවතිය යුතුයැ'යි කියා හෝ සිතක් තථාගතවූ මා තුළ නැත. එහෙයින්ම තථාගතයන් භික්ෂු සංඝයා උදෙසා කුමක් දෙසන්නද?

ආනන්දයෙනි, මම දැන් දිරාපත්වී ඇත්තෙමි. වෘද්ධයෙක්මි. මහළුවූවෙක්මි. දිගුකලක් ගතකොට ඇත්තෙක්මි. පැසුණුවයසට පත්ව සිටින්නෙක්මි. මා වයස දැන් අසූවක් වෙයි. දිරාපත්වූ කරත්තයක රෝද ආදිය අළුත්වැඩියා කරමින් පවත්වා ගන්නේද, එලෙස තථාගතයන්ගේ කය, රහත්ඵලසමවත් නැමැති පිළිසකරින් පවතින්නේය. ආනන්දයෙනි, තථාගතයෝ රූප නිමිති ආදී සියළු නිමිති මෙනෙහි නොකිරීමෙන්, වේදනාවන්ගේ නිරෝධයන්, නිමිතිරහිත චිත්ත විමුක්තියට පැමිණ වාසය කරනු ලබන හෙයින්, තථාගතයන්ගේ කයෙහි අතිශයින් පහසුගතියක් තිබේ. ආනන්දයෙනි. එහෙයින් ඔබ ඒ ඵල සමවත් පිණිස තමන්ම පිහිටකොට ගෙන, තමන්ම පිහිටකොට ඇතිව අන්‍යපිහිටක් නොමැත්තේම වාසයකළ යුතුය. ධර්මයම පිහිටකොට, ධර්මයම සරණකොට, අන්සරණක් අපේක්ෂාවෙන් තොරව වාසයකළ යුතුය. ආනන්දයෙනි, භික්ෂුව කෙසේ තමාව පිහිටකොට, තමාවම සරණකොට, අන්‍යසරණක් නොමැතිව, ධර්මයම පිහිට කොටගන්නේ, ධර්මයේ සරණකොට, කෙසේ වාසය කළ යුත්තේද යත්, ආනන්දයෙනි, තමන් පිහිටකොට,

ධර්මය පිහිටකොට සිටින භික්ෂුව කෙලෙස්තවන වියසීඇතිව, මනානුවණින් දන්නේ සිහිඇතිව, ලොව කෙරෙහි සියළුඅභිධ්‍යා, ව්‍යාපාදයන් දුරුකොට කයෙහි, කායානුපස්සීව වෙසෙයි. වේදනාවෙහි, වේදනානුපස්සීව වෙසෙයි. සිත්හි, චිත්තානුපස්සීව වෙසෙයි. කෙලෙස්තවන වියසීයෙන් යුතුව, නුවණින් දන්නේ සිහිඇත්තේ ලොවෙහි අවිද්‍යා, ව්‍යාපාදදුරලා, නීවරණධර්මයන්හි ධර්මානුපස්සීව වෙසෙයි.

ආනන්දයෙනි, මෙසේ භික්ෂු තෙම, තමන් පිහිටකොට, තමන් සරණකොට, අන්සරණක් නැතිව ධර්මය පිහිටකර ගනිමින් - අන්සරණ නොසොයා ධර්මයම සරණකොට ගනිමින් වාසය කරන්නේනම්, ආනන්දයෙනි, ශික්ෂාකාමිවූ සියළු භික්ෂූන්අතුරෙන් සතරසීවටන්වඩන ඒ මාගේ ශ්‍රාවක භික්ෂූහු සියළු දුක් නසා ශ්‍රේෂ්ඨවන්නාහ.

මහණෙනි, පමානොවව්, සිහිඇත්තෝවවු. සුසිල් වඩවු, මැනවින් පිහිටි සම්‍යක්සංකල්පනා ඇතිව තමන් සිත රැකගනිවු.

මේ සසුනෙන් යමෙකු අප්‍රමාදීව වාසය කරන්නේනම් හෙතෙම ජාති සංසාරය හැරදා දුක් කෙළවර කරන්නේය.

## නිරෝධය

එවේලෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රීති වාක්‍ය පහළකළ සේක.

"මම නොවූයෙමිනම්, මට අතීත කර්මාභිසංස්කාරයෙක් නොවිණිනම්, මතු ස්කන්ධ පහළකරන කර්මාභිසංස්කාරයෙක්

නොවන්නේය. එය නැති කල්හි, මට මතු ප්‍රතිසන්ධියක්නම් නොවන්නේය. මෙලෙසින් නිශ්චයට එළැඹෙන මහණ, ධර්මභාගිය (සක්කායදිට්ඨිය - කාමභව පිළිබඳ සියළුදැකීම්). සංයෝජන සිඳියි.

මෙසේ වදාළකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ විමසීය.

ස්වාමීනි, කෙසේනම් මම නොවූයෙම් නම්, මට අතීත කර්මාභිසංස්කාරයෙක් නොවිණිනම්, මතු ස්කන්ධ පහළකරන කර්මාභිසංස්කාරයෙක් නොවන්නේද? එය නැතිකල්හි මට මතු ප්‍රතිසන්ධියක්නම් නොවන්නේ ය'යි අදහන මහණගේ ඔරම්භාගිය සංයෝජනයන් සිඳුනේ කෙසේද?

මහණ, බුද්ධාදි ආර්‍ය්‍යයන්නොදන්නා, ආර්‍ය්‍ය ධර්‍මයෙහි අදක්ෂ, ආර්‍ය්‍යධර්‍මයෙහි නොපවතින, බුද්ධාදි සත්පුරුෂයන් නොදක්නා, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ, අවිනීත, අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ රූපය ආත්මය වශයෙන් දකියි. (ආත්මයයනු - සදාකාලිකව පවතින්නා වූ සැබෑ වූ දෙයක් වශයෙන් ගැනෙන මිථ්‍යා විශ්වාසයකි.) ආත්මය රූපවත්කොට හෝ ආත්මයෙහි රූපයඇතැ'යි හෝ රූපයෙහි ආත්මය ඇත්තාසේ හෝ දකියි. වේදනාව ආත්මකොට දකියි. ආත්මය වේදනාවක්කොට හෝ ආත්මයෙහි වේදනාවඇතැ'යි හෝ වේදනාවෙහි ආත්මය ඇත්තාසේ දකියි. සංඥාව ආත්මයකොට හෝ ආත්මයෙහි සංඥාවඇතැ'යි හෝ සංඥාවෙහි ආත්මය ඇත්තාසේ දකියි.

සංස්කාරය ආත්මයකොට දකියි. ආත්මයේ සංස්කාරයකොට දකියි. ආත්මයෙහි සංස්කාරය ඇතැ'යි හෝ සංස්කාරයෙහි ආත්මය ඇත්තාසේ දකියි. ආත්මයෙහි විඥාණ ඇත්තාසේ හෝ විඥාණයෙහි ආත්මය ඇත්තාසේ හෝ දකියි. හෝ අනිත්‍යවූ රූපය අනිත්‍යයැ'යි ඇති පරිදි නොදනී. අනිත්‍යවූ වේදනාව, වේදනාව අනිත්‍යයැ'යි ඇතිපරිදි නොදනී අනිත්‍ය වූ සංඥාව, සංඥාව අනිත්‍යයැ'යි ඇතිපරිදි නොදනී. අනිත්‍යවූ සංස්කාර, සංස්කාර අනිත්‍යයැ'යි ඇතිපරිදි නොදනී. අනිත්‍යවූ විඥාණය විඥාණය අනිත්‍යයැ'යි ඇතිපරිදි නොදනී.

දුක්වූ රූපය, "රූපය දුකැයි" තත්වූ පරිදි නොදනී.

දුක්වූ වේදනාව, "වේදනාව දුකැ'යි" තත්වූ පරිදි නොදනී.

දුක්වූ සංඥාව, "සංඥාව දුකැ'යි" තත්වූ පරිදි නොදනී.

දුක්වූ සංස්කාරය - සංස්කාරදුකැ'යි තත්වූ පරිදි නොදනී.

දුක්වූ විඥාණය, "විඥාණය දුකැ'යි" තත්වූ පරිදි නොදනි.

අනාත්මවූ රූපය "රූපය අනාත්ම" යි යථාභූතකොට නොදනී. අනාත්මවූ වේදනාව, "වේදනාව අනාත්ම'යි යථාභූතකොට නොදනී. අනාත්ම වූ "සංඥාව", සංඥාව අනාත්ම'යි යථාභූතකොට නොදනී. අනාත්මවූ සංස්කාරය, සංස්කාරය අනාත්ම'යි යථාභූතකොට නොදනී. අනාත්මවූ විඥානය. "විඥානය අනාත්ම'යි යථාභූතකොට නොදනියි.

සංඛත වූ (මවාගත්තා වූ) ප්‍රත්‍යයෝත්පන්න රූපය " රූපය" සංඛත යැ'යි තත්ත්වාකාරයෙන් නොදනියි. සංඛත වූ වේදනාව. "වේදනාව" සංඛතය'යි තත්ත්වාකාරයෙන් නොදනී.

සංඛතවූ සංඥාව, සංඥාව සංඛතය'යි තත්ත්වාකාරයෙන් නොදනී. සංඛතවූ සංස්කාරය, "සංස්කාරය" සංඛතය'යි තත්ත්වාකාරයෙන් නොදනී.

## අරමුණ හා සිහිය

ඔහු එකළාව සිටියේය. හැදකලාවූයේය. සිහිය පවත්වාගත හැකි තත්ත්වයකට පත්වසිටියේය. කෙලෙස් වලින් මිදි, සිත එකලස්වතබා ගෙන සමාධිගතවීමේ හැකියාව ලබාසිටියේය. දැහැන්ගතවීමේ හැකියාව ලද්දේය.

මෙසේ දැහැන්ගතවන ඔහු, එක් අවස්ථාවක දැහැනින් මිදී සිටියදී, කිසියම් හඬක්, සවනෙහි ගැටුණි. ඒ හා සමගම ශ්‍රෝතවිඥාණය පහළවිය. හඬ, ලේනෙකුගේ බව හඳුනාගත්තේය.

හඬ ඇසුණුදෙස බැලීමට සිත් පහලවිය. චක්ඛුවිඥාණය පහළවිය. ලේනෙකුව දැක්කේය. ගසක් උඩසිට කලබලයෙන් කෑගසන බව අවබෝධ විය.

ලේනා කලබලයෙන් හඬන්නේ ඇයිදැ'යි විමසීමේ සිත (විචිකිච්ඡාව) පහළවිය. බැලීමට පෙළඹුණි. බැලුවේය. දුටුවේය. ලේන්පැටියා ගස්බෙනයේතිබූ උගේ කූඩුවෙන් පිටත බිමවැටී සිටියේය.

ඔහුතුළ අනුකම්පාව පහළවිය. ලේන්පැටියාව උගේ කූඩුවෙන් තබන්නට සිතුණි.

අනුකම්පා සිතුවිල්ලට මුවාවී නැගිටින කාමතණ්හාව, (ආස්වාදය ලැබීමේ කැමැත්ත) සිහියෙන් සිටින ඔහු හට ප්‍රත්‍යක්ෂවිය.

ආස්වාදය (වේදනාව) විඳීමේ තණ්හාවට ඔහු නොඑළැඹුණි.

ලේන්පැටියාගේ කූඩුව අතපොව්වන මානයේ තිබූ බැවින් ඔහු ලේන්පැටියාව ගෙන කූඩුවෙහි තබා එතැනින් ඉවත්වූයේය.

ලේන්පැටියාව ගැනීම, කූඩුවේතැබීමට එළැඹීම සමඟම ඔහුත් ලේන්පැටියාත් අතර ක්‍රියාවලියක් (භවයක්) ආරම්භවිය. එය පවත්වාගැනීමේ අවැසිතාවයක් නොමැති බැවින් එය පවත්වාගෙන යාමට එළැඹීම නිශ්ඵලක්‍රියාවක් බැවින්, ලේන්පැටියාව කූඩුවෙහි තැබූ සැනෙකින් ඔහු එතැනින් බැහැරවිය.

ලේන්පැටියා සුරක්ෂිතද, උගේ අම්මා උා ළඟට පැමිණියේදැ'යි බැලියයුතුය වශයෙන් තෘෂ්ණාකාරී කෙලෙස් සිතුවිලි මතුවන්නට විය. හේ එළැඹිසිහියෙන් යුතුව සිටි බැවින් එවන් කෙලෙස් සිතුවිලිවල නොඇලුණි. ඒ පිළිබඳව විඳීමක් (කාමතණ්හා) ඔහුට අවැසිනොවීය.

ලේන්පැටියා ආයෙත් වැටෙන්න පුළුවන්. අද හරි හෙට හරි, වැටෙන්න පුළුවන්. ඒ ගැන විමසිලිමත්වන්න, ඕනෑ'යි ඔහු තුළ අනාගතයේ සිදුවියහැකි ලෙසත් (භව

තණ්හා) දැනෙන්නට විය. එළැඹිසිහියෙන් සිටි ඔහු හට එවන් නිරර්ථක සිතුවිලි පහසුවෙන් බැහැරකළ හැකිවිය.

තවත් ලේන්පැටියා දෙස නොබැලිය යුතුයි. එසේ බලන්නට යාමෙන් නැති කරදර, ප්‍රශ්න ඇතිවන්නට පුළුවනි'යි යනාදී වශයෙන් කෙලෙස් සිතුවිලි (විභව තණ්හා) ඔහු තුළින් මතුවන අයුරු එළැඹිසිහියෙන් සිටි ඔහුට ප්‍රත්‍යක්ෂ විය.

ඔහු එවන් සිතුවිලිවල නොඇලෙමින්, නොවෙලෙමින්, සිහිය නොසිඳී නොබිඳී පවත්වාගත්තේය.

විවිධ අරමුණු(නිමිති)ගත් විඥාණයෝ (චේතනා) පහළවිය. සිතුවිලි(මනසිකාරයන්)ඇතිවිය. ඒවා ඇතිවන්නාසේම නැතිවිය. ඒවායේ වැඩීමට, පැවතීමට අවස්ථාවක් නොඑළඹියේය. හේ සතිය (සිහිය) පවත්වා ගත්තේය. උදයව්‍ය ස්වභාවයන් දුටුවේය. අවබෝධ කළේය. ප්‍රත්‍යක්ෂ කළේය. උපේක්ෂාව ඇතිවිය. සමාධිය ඇතිවනවිට නාම සංඥාවෝ, රූප සංඥාවෝ දුබලයෝය. මායාවෝය. නිසරුවූයේය. කවරආකාරයකින් හෝ ගතහැකි කිසිවක්ම නොවූයේය.

උදයව්‍ය හා ඒවාට බද්ධකළ නාමස්වභාවයන් නොවන්නට, බැලීමට, ගැනීමට, විඳීමට, ආස්වාදය සඳහා පවතින කිසිඳුදෙයක්, සැබෑ ස්වරූපයක් නැත්තේය. සියල්ල නිරෝධවන්නේය. නිවීයන්නේය. ඔහු එසේ මෙනෙහි කිරීමේ නිරතවිය.

භාවනාව යනු අරමුණක් ගෙන ඒ කෙරෙහි සිතුවිලි පැවතීම නොව, මඤ්ඤනා කිරීම නොව අරමුණ කෙරෙහි සිහියෙන් (සතියෙන්) සිටීමය.

## පර්යේෂණ

මහණෙනි, ආයර්‍ය පර්යේෂණ, අනායර්‍ය පර්යේෂණය'යි මේ සෙවීම් දෙකකි.

මහණෙනි, අනායර්‍යය පර්යේෂණය කුමක්ද?

මහණෙනි, මේ ලෝකයෙහි යම් පුද්ගලයෙක් තෙමේ ජාතිය ස්වභාවකොට ඇත්තේ, ජාති ධර්මයක්, ජාතිය ස්වභාවකොට ඇත්තක්ම සොයයි. තෙමේ ජරාව ස්වභාවකොට ඇත්තේ ජරා ධර්මයක්ම සොයයි. තෙමේ ව්‍යාධිය ස්වභාවකොට ඇත්තේ, ව්‍යාධි ධර්මයක්ම සොයයි. තෙමේ මරණය ස්වභාවයකොට ඇත්තේ, මරණ ධර්මයක්ම සොයයි. තෙමේ ශෝක ස්වභාවකොට ඇත්තේ, ශෝක ධර්මයක්ම සොයයි. තෙමේ කෙලෙසෙන ස්වභාව කොට ඇත්තේ, කෙලෙසෙන ස්වභාව ඇත්තක්ම සොයයි.

මහණෙනි, කුමක් ජාතිධර්මයයි කියන්නේද? පුත්‍ර භාර්‍යාවෝ ජාති ධර්මයෝයි. දැසී දස්හු ජාතිධර්මයෝයි. එළු බැටළුවෝ ජාතිධර්මයෝයි. කුකුළන් හා ඌරන් ජාතිධර්මයෝයි. ඇත් ගව අස් වෙළඹහු ජාතිධර්මයෝයි. රන් රිදී ජාතිධර්මයෝයි. මහණෙනි මේ සියලු පංචකාමගුණ උපදිහු ජාතිධර්මයෝය. මෙහි තෘෂ්ණාවෙන් බැඳුනාවූ, මුසපත්වූ, බැසගත්තාවූ, මේ ලෝවැසි තෙමේ ජාතිය ස්වභාවකොට ඇත්තේ, ජාතිධර්මයක්ම සොයයි.

මහණෙනි, කුමක් ජරා ධර්මය ය'යි කියන්නේද?

පුත්‍රභාර්යාවෝ ජාතිධර්මයෝය. දැසිදස්හු ජරා ධර්මයෝයි. එළු බැටළුවෝ ජරාධර්මයෝයි. කුකුළන් හා ඌරන් ජරාධර්මයෝයි. ඇත් ගව අස් වෙළඹහු ජරාධර්මයෝයි. රන් රිදී ජරාධර්මයෝ යි. මහණෙනි මේ සියලු පංචකාමගුණ ජරාධර්මවෙති. මේ ලෝවැසි තෙමේ මෙහි ගැටගැසුනේ, මුසපත්වූයේ, බැසගත්තේ, තෙමේ ජරාව ස්වභාවකොට ඇත්තේ, ජරාධර්මයක්ම සොයයි.

මහණෙනි, කුමක් ව්‍යාධිධර්මයයි කියන්නේද?

පුත්‍ර භාර්යාවෝ ව්‍යාධිධර්මයෝය. දැසි දස්හු ව්‍යාධිධර්මයෝයි. එළු බැටළුවෝ ව්‍යාධිධර්මයෝ'යි. කුකුළන් හා ඌරන් ව්‍යාධිධර්මයෝ'යි. ඇත් ගව අස් වෙළඹහු ව්‍යාධිධර්මයෝ'යි. මහණෙනි, මේ පංචකාමගුණ උපදීහු ව්‍යාධිධර්මයෝ ය. මේ ලෝවැසි තෙමේ මෙහි ගැටගැසුනේ, මුසපත්වූයේ, බැසගත්තේ, තෙමේ ව්‍යාධිස්වභාවකොට ඇත්තේ, ව්‍යාධිධර්මයක්ම සොයයි.

මහණෙනි, කුමක් මරණ ධර්මයයි කියන්නේද?

පුත්‍ර භාර්යාවෝ මරණධර්මයෝය. දැසි දස්හු මරණධර්මයෝ'යි. එළු බැටළුවෝ මරණධර්මයෝ'යි. කුකුළන් හා ඌරන් මරණධර්මයෝ'යි. ඇත් ගව අස් වෙළඹහු මරණධර්මයෝ'යි. මහණෙනි, මේ උපදීහු මරණධර්මයෝ'යි. මේ ලෝවැසි තෙමේ මෙහි ගෙතුනේ, මුසපත්වූයේ බැසගත්තේ, තෙමේ මරණය ස්වභාවකොට ඇත්තේ මරණධර්මයක්ම සොයයි.

මහණෙනි, කුමක් ශෝක ධර්මයය'යි කියන්නේ ද?

පුත්‍ර භාර්යාවෝ ශෝකධර්මයෝය. දැසි දස්හු ශෝකධර්මයෝ'යි. එළු බැටළුවෝ ශෝකධර්මයෝ'යි. කුකුළන් හා ඌරන් ශෝකධර්මයෝ'යි. ඇත් ගව අස් වෙළඹහු ශෝකධර්මයෝ'යි. මහණෙනි මේ උපදීහුය. මේ ලෝවැසි තෙමේ මෙහි වෙළුනේ, මුසපත්වූයේ, බැසගත්තේ, තෙමේ ශෝකය ස්වභාවකොට ඇත්තේ, ශෝකධර්යක්ම සොයයි.

මහණෙනි, කුමක් සංක්ලේශ ධර්මය යයි කියන්නේද?

අඹුදරුවෝ සංක්ලේශධර්මයෝය. දැසි දස්හු සංක්ලේශධර්මයෝ'යි. එළු බැටළුවෝ සංක්ලේශධර්මයෝ'යි. කුකුළන් හා ඌරන් සංක්ලේශධර්මයෝ'යි. ඇත් ගව අස් වෙළඹහු සංක්ලේශධර්මයෝ'යි. රන් රිදී සංක්ලේශධර්මයෝ'යි. මහණෙනි මේ උපදිහු සංක්ලේශධර්ම වෙත්. මේ ලෝවැසි තෙමේ මෙහි ගෙතුනේ, මුසපත්වූයේ, බැසගත්තේ, තෙමේ සංක්ලේශධර්මයක්ම සොයයි. මේ අනාර්‍යයපර්යේෂණයයි.

මහණෙනි, ආයර්‍යය වූ සෙවීම් කුමක් ද?

මහණෙනි, මේ ලෝකයෙහි ඇතැමෙක් තෙමේ ජාතිධර්මයවූයේ, ජාතිධර්මයහි ආදීනවදැන, ජාතියක් නැති නිරුත්තරවූ යෝගකේෂමසංඛ්‍යාත නිර්වාණය සොයයි. තෙමේ ව්‍යාධිධර්මවූයේ මරණධර්මයෙහි ආදීනවදැන මරණයක් නැති, නිරුත්තර යෝගක්ෂේම වූ නිවන සොයයි. තෙමේ මරණධර්මවූයේ මරණධර්මයෙහි ආදීනව දැන මරණයක් නැති, නිරුත්තර යෝගක්ෂේම වූ නිවන සොයයි. තෙමේ ශෝකධර්මවූයේ, ශෝකධර්මයෙහි ආදීනවදැන, ශෝකයක් නැති නිරුත්තර යෝග

ක්ෂේමවූ නිවන සොයයි. තෙමේ සංක්ලේශධර්මවූයේ, සංක්ලේශධර්මයෙහි ආදීනවදැන, කෙලෙසීමක් නැති නිරුත්තර යෝගක්ෂේමවූ නිවන සොයයි. මහණෙනි, මේ ආයර්‍ය්‍ය පර්යේෂණයයි.

මහණෙනි, මම බුදුවීමටපෙර බෝසත් වූයෙමි. මා තෙමේ ජාතිධර්මවූයෙමි. ජාතිධර්මයක්ම සෙවීමි. තෙමේ ජරාධර්මවූයෙමි. ජරාධර්මයක්ම සෙවීමි. තෙමේ ව්‍යාධිධර්මවූයෙමි. ව්‍යාධිධර්මයක්ම සෙවීමි. තෙමේ මරණධර්මවූයෙමි. මරණධර්මයක්ම සෙවීමි. තෙමේ ශෝකධර්මවූයෙමි, ශෝකධර්මයක්ම සෙවීමි. තෙමේ සංක්ලේශධර්මවූයෙමි සංක්ලේශ ධර්මයක්ම සෙවීමි.

මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. කුමක් නිසා මම තෙමේ ජාති ධර්ම වූයෙම්, ජාති ධර්මයක්ම සොයම්ද? තෙමේ ජරාමූර්ධවීමෙන් ජරා ධර්මයක්ම සොයන්නෙම්ද? තෙමේ ජරාධර්ම වූයෙම්, ජරාධර්මයක්ම සොයම්ද? තෙමේ ව්‍යාධිධර්ම වූයෙම්. ව්‍යාධිධර්මයක්ම සොයන්නෙම්ද? තෙමේ මරණ ධර්ම වූයෙම්, මරණ ධර්මයක්ම සොයම්ද? තෙමේ ශෝක ධර්මයක් වූයෙම්, ශෝක ධර්මයක්ම සොයමුද? තෙමේ සංක්ලේශ ධර්‍ම වූයෙම් සංක්ලේශ ධර්මයක්ම සොයම්ද?

මම ජාතිධර්මවූයෙම්, ජාතිධර්මයෙහි ආදීනවදැන, ජාතියක් නැති අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවන සොයන්නෙම් නම් මැනව. ජරාධර්මවූයෙම් ජරාධර්මයෙහි ආදීනවදැන, ජරාවක් නැති අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවන සොයන්නෙම් නම් මැනව. තෙමේ මරණධර්මවූයෙම්, මරණධර්මයෙහි ආදීනවදැන

මරණයක් නැති අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවන සොයන්නෙම් නම් මැනව. තෙමේ ශෝකධර්මවූයෙම්, ශෝකධර්මයෙහි ආදීනවදැන, ශෝකයක්නැති අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවන සොයන්නෙම් නම් මැනව. තෙමේ සංක්ලේශධර්මවූයෙම්, සංක්ලේශධර්මයෙහි ආදීනවදැන, සංක්ලේශනොවූ අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවන සොයන්නෙම් නම් මැනව කියායි.

මහණෙනි, ඒ මම පසුකාලයෙහි ළදරුවූයෙම්ම, ඉතාකළු කෙස්ඇත්තෙම්, පළමුවන වයසවූ භද්‍රයෞවනයෙන් යුතුවූයෙම්, මව්පියන් නොකැමැත්තෙන් හඬද්දී, කඳුළුපිරුණු මුහුණින් යුතුව කෙස් රැවුළුබා, කහවත්හැඳ ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණියෙමි. ඒ මම මෙසේ පැවිදිවූයෙමි. "කුසලය" කුමක්දැයි සොයනසුළු වූයෙමි අනුත්තරවූ උතුම් ශාන්තිපදය සොයමින් ආලාරකාලාම කරා පැමිණියෙමි. එහිදී ප්‍රථමධ්‍යානය හා ද්විතීයධ්‍යානයට එළැඹිමි. මහණෙනි, ඒ මම ඒ ධර්මය ප්‍රමාණවත් නොවන්නක්කොට මෙයින් කම්නැතැ'යි සිතා ඒ ධර්මයන් කළකිරී බැහැරගියෙමි.

මහණෙනි, ඉක්බිති මම උද්දකරාමපුත්ත වෙත එළැඹියෙමි. ඔහු වෙත සිටිමි. තෘතීයධ්‍යානයත් චතුර්ථධ්‍යානයත් ලැබීමි. මහණෙනි, ඒ මම ඒ ධර්මය ප්‍රමාණවත් නොවන්නක්කොට මෙයින් කම්නැතැ'යි සිතා ඒ ධර්මයෙන් කළකිරී බැහැරවූයෙමි.

මහණෙනි, ඒ මම කුසලය කුමක්දැ'යි සොයනසුලු වූයෙමි. අනුකරණ උතුම් නිර්වාණ පදය සොයමින් මගධ දනව්වෙහි පිළිවෙලින් සැරිසරන්නෙම්, උරුවේලාවෙහි සේනානිග්‍රාමයකරා පැමිණියෙමි. එහි සිත්කළු භූමිභාගයද,

පහදවන වනලැහැබද, වැලිතලාද ඇති මනාතොටුඇති, සිත්කළු ගලාබස්නා නදියද, හාත්පස සොඳුරුගමද දිටිමි. මහණෙනි, ඒ මට මේ අදහස විය. භූමිභාගය රමණීයය. වනලැහැබද ප්‍රසාදජනකය. සුදුවැලිතලා ඇති, මනාතොටු ඇති, සිත්කළු නදියද ගලාබැස්සීය. හාත්පස සොඳුරුගමද වෙයි. ප්‍රධාන්කරුණ කැමති කුලපුත්‍රයෙකුට, ප්‍රධන් වීයයී සඳහා මෙය සුදුසුමය. මහණෙනි ඒ මම ප්‍රධන්වීයයී පිණිස මෙය සුදුසුමය'යි සිතා, එහිම හුන්නෙමි.

මහණෙනි, ඒ මම ජාතිධර්මවූයෙමි. ජාතිධර්මයෙහි ආදීනවදැන, ඉපදීමක් නැති, අනුත්තරවූ යෝගක්ෂමවූ නිවන සොයමින් අජාතවූ අනුසාරවූ යෝගක්ෂේමවූ නිර්වාණය අවබෝධ කළෙමි.

ජරා ධර්ම වූයෙමි, ජරා ධර්මයෙහි ආදීනව දැන, නිරුත්තර ඉපදීමක් නැති, අනුත්තර වූ, යෝගක්ෂේම වූ නිවන සොයමින් අජර වූ, අනුත්තර වූ යෝගක්ෂේම වූ, නිවණ අවබෝධ කළෙමි.

ව්‍යාධිධර්මවූයෙමි, ව්‍යාධිධර්මයෙහි ආදීනවදැන, ව්‍යාධියක් නැති අනුත්තරවූ යෝගක්ෂේමවූ නිර්වාණය සොයමින් අව්‍යාධිකවූ අනුත්තරවූ යෝගක්ෂේමවූ නිර්වාණය අවබෝධ කළෙමි.

මරණධර්මවූයෙමි, මරණධර්මයෙහි ආදීනවදැන, මරණයක් නැති අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවන සොයමින් මරණයක් නැති අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවනට පැමිණියෙමි.

ශෝකධර්මවූයෙමි, ශෝකධර්මයෙහි ආදීනවදැන, ශෝක රහිතවූ අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවන

සොයන්නෙම්, ශෝකරහිත අනුත්තරවූ යෝගක්ෂේමවූ නිවන අවබෝධ කළෙමි.

තෙමේ සංක්ලේශධර්මවූයෙම්, සංක්ලේශ ධර්මයෙහි ආදීනවදැන නොකිලිටිවූ අනුත්තරවූ යෝක්ෂේමවූ නිර්වාණය අවබෝධ කළෙමි.

මාගේ අරහත්ඵල විමුක්තිය අකොප්‍යය (ස්ථිර) විය. මේ මගේ අන්තිම උප්පත්තියයි. දැන් පුනර්භවයක් නැතැ'යි මට ඥානදර්ශනය පහළ විය.

(අරියපරියේෂණ සූත්‍රයෙනි)

ආනන්දය, උපාදානීය ධර්මයන්හි ආස්වාදය නැවත නැවත දකිමින් වෙසෙන්නහුගේ, තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානවේ. උපාදාන ප්‍රත්‍යයෙන් භවයවේ. මෙසේ හුදු දුක්රැසේ හටගැන්මවේ.

ආනන්ද, යම්සේ මහරුකක්වේද, එහි යටට බස්නා මුලුත්වේද, සරයට ගමන්ගත් මුලුත්වේද, ඒ සියල්ල ඕජස උඩට ගෙනයේ. ආනන්ද මෙසේ ඒ මහරුක ආහාර ඇත්තේ ඒ උපාදාන ඇත්තේ ඉතා දිගුකලක් සිටුනේය.

ආනන්ද, උපාදානීය ධර්මයන්හි ආදීනවය නැවත නැවත දකිමින් වෙසෙන්නාහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධය, උපාදාන නිරෝධයවේ. මෙසේ හුදු දුක්රැස් නිරෝධවේ.

ආනන්දය, යම්සේ මහරුකෙක්වේද, පුරුෂයෙක් උදැල්ලක් හා පැසක් ගෙන එහිඑන්නේය. හෙතෙම ඒ රුකමුල සිඳින්නේය. මුල්සිඳ හාත්පස කනින්නේය. හාත්පස කැන, යටත් පිරිසෙයින් සුවඳහොටමුල් පමණවූ

මුල්ද උදුරන්නේය. හෙතෙම ඒ රුක කඩ කඩකොට සිඳින්නේය. කඩ කඩකොට සිඳ තලන්නේය. පලා කැබලි කැබලි කරන්නේය. කැබලි කැබලිකොට අවු සුළඟෙහි වියලන්නේය. සුළඟෙහි වියළා, ගින්නෙන් දවන්නේය. ගින්නෙන් දවා හළු කරන්නේය. හළු කොට මහ සුළඟෙහි හෝ පොළාහරින්නේය. සැඩපහර ඇති ගඟෙහි පාකර හරින්නේය.

ආනන්ද මෙසේ ඒ මහරුක උසුන්මුල් ඇත්තේ හිස්සුන්හළක් මෙන් කරනලද්දේ නැවත හටනොගන්නා බවට පමුණුවනලද්දේ, මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේය.

(පටිච්ච සමුප්පාද සූත්‍රය)

## දැකිය යුතු...

අනිත්‍යයි ... දුකයිකීවාට මදිය. අනිත්‍යය - දුක්ඛ අනාත්ම, අවබෝධ කළයුත්තේ එම ස්වභාවයන්ය. අනිත්‍යයස්වභාවය නොදන්නා තැනැත්තේ ආස්වාදය ලබන්නේය. අනිත්‍යස්වභාවයේ ආදීනවය දුකය. ආස්වාදයේ ගැලුණ තැනැත්තේ, එහි අනිත්‍යස්වභාවයට පත්වනවිට එතැන දුකය. ආස්වාදයේ, ආදීනවය වශයෙන් දුකට පත්වන්නේය.

හේ දුකවිඳින්නට නොකැමැතිය. දුකට බියය. දුක, බිය, ආස්වාදය, ආදීනවය ආත්මවශයෙන් ගන්නා හෙතෙම අනාත්මයක් සොයයි. නිස්සරණයක් සොයයි. දුකින් ගැලවෙන්නට මඟක් සොයයි.

නිවැරදිමඟ නොදුටුයේනම් - නොඑළැඹියේනම් හේතුව තවත් වැටෙන්නේ දුකටමය.

තථාගතයන් වහන්සේ විසින් පෙන්වාදෙනු ලැබුයේ දුකින් මිදියහැකි නිවැරදි මාර්ගයයි. දුකින්මිදීමට කැමති ජනයා සිදුකළ යුත්තේ, ඒ නිවැරදි ධර්මමාර්ගය නිවැරදිව හදාරා ඒ මඟ ඔස්සේ ජීවනක්‍රමය පැවැත්වීමය. ඒ හැර දුකින් මිදීමේ අන්මඟක් නොමැතිය.

අනිත්‍යස්වභාවය අවබෝධවනවිට, දුරුවන්නේ නිත්‍ය - සුඛ - ආත්මවශයෙන් වැළඳගෙන සිටින අවිද්‍යාවයි. සක්කායදිට්ඨියයි.

අවිද්‍යාව පහවනවිට, නිවැරදි සංකල්පනාවන් ඇතිවන්නේය. නිවැරදිසිතුවිලි ඇතිවන්නේය. නෙක්කම්ම, අව්‍යාපාද, අහිංසාවැනි සංකල්පනාවන් පහලවන්නේය. සැබෑනොවන, නිත්‍යනොවන, නිරන්තරයෙන් වෙනස්වන කැඩී බිඳී දිරාපත්වීයන විනාශවන ස්වභාවයන් කෙරෙහි කැමැත්ත ඇතිකර ගනිමින් ආශාවන් පවත්වමින් තණ්හාවෙන් හරිත, ඇතිකරගැනීමේ, රඳවාගැනීමේ, පවත්වාගැනීමේ, විඳීමේ, ආස්වාදනය ලැබීමේ, උඩඟුවීමේ සිතුවිලි පවත්වන්නේ නැත. කල්පනාවන් ඇතිකරගන්නේ නැත. ඇලීම් බැඳීම් හා යෙදෙන්නේ නැත.

සක්කායදිට්ඨිය අවබෝධකොට, එවන් දෘෂ්ඨීන්හි නොගැලෙමින්, තෘෂ්ණාවන් නූපදවමින්, දුකට හේතුකාරකයින්වන තණ්හා මාන දිට්ඨි- ලෝභ, ද්වේශ, මෝහ සිතුවිලිහි නොගැලෙමින්, ඇතිකර නොග

නිමින්, සම්මා සතියෙන්, නිවැරදිසිහියෙන් සිටින්නා තුළ ඇතිවන්නේ සතුටය. එතැන දුක පවතින්නේ නැත. වත්මන් සමාජයේ වෙසෙන ශ්‍රමණ වේශධාරීන් හෝ ගිහියන් හෝ කවුරුන් හෝ වේවා, අවමවශයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවයන් පිළිබඳව හෝ නිවැරදිව අවබෝධකරගනු ලබන්නේ නම්, එතැන් සිට විවරවන්නේ සසර ගමන නිමාකිරීමට අදාල මාර්ගයේ දොරටුවය. ඉන් දැක්වෙනුයේ භවය නිමවන ඉසව්වය.

සත්‍ය අවබෝධයට නොඑළැඹ - විවිධ දෘෂ්ඨීන්හි ගැලෙමින්, ප්‍රාර්ථනාවන් පවත්වමින්, පුදපූජා පවත්වමින් එවන් යාදිනියන්, යාගකර්ම, යෝගකර්මයන් තුලින් විමුක්තිය ලබන්නට එළැඹීම, දුකින්, දුකට පත්වීමේ, අඳුරෙන්, අඳුරට ඇදීයාමේ ක්‍රමවේදයයි.

ඒ ඒ බුද්ධෝත්පාද කාලයෙහි පහළවූ බුදුවරුන්, උන්වහන්සේලාගේ ධර්මය දෙසන්නට ඇත. එවකට සිටි පිං ඇති ජනයා එම ධර්මශ්‍රවණය කිරීමෙන්, භාවිතා කිරීමෙන්, සසරදුක කෙටිකරගැනීමට හෝ සසර දුක නිමාකරගන්නට ඇත. ඒ එදාය. වර්තමානයද බුද්ධෝත්පාද කාලයෙකි. ගෞතම බුදුන් විසින් දේශිත ශ්‍රී සද්ධර්මය සුරැකිව පවතින යුගයකි. උන්වහන්සේ විසින් දේශනාකොට වදාළ ධර්මය පිවිතුරුය. පැහැදිලිය. ඒ සඳහා එළැඹෙන්නාහටද, ප්‍රඥාවන්තයාහටද, මැනවින් අවබෝධකළ හැකිවන්නේය. එම ධර්මමාර්ගයට එළැඹ, ඒ ඔස්සේ ගමන් කිරීමෙන්, සංසාර ගමන නිමාකළ හැක්කේය. භවයෙන් එතෙරවිය හැක්කේය.

නිර්මලවූ මේ ශ්‍රී සද්ධර්මයේ ගැඹුර දැකියයුත්තේ, සරළතත්ත්වය, තුලින් ගැඹුරු ජලාශයක පතුල දකින්නාවගේ විමසිලිමත් භාවයකින් හා ඉවසීමෙන් යුතුවය.

මේ පිළිබඳව වැඩිදුරටත් විමසන්නේනම් සංයුක්තනිකායේ මෙසේ සඳහන්වනු දැකිය හැකිය.

මහණෙනි, ඇස අනිත්‍යය, යමෙක් අනිත්‍යවේනම් එය දුක්වෙයි. යමෙක් දුක්වේනම්, එය අනාත්මවෙයි. යමෙක් අනාත්මවේනම්, එය මේ මාගේ නොවෙයි ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මයනොවේය'යි. මෙසේ එය ඇතිසැටියෙන් මනානුවණින් දැක්ක යුතුය.

කන අනිත්‍යය, යමෙක් අනිත්‍යවේනම්, එය දුක් වෙයි. යමෙක් දුක්වේනම්, එය අනාත්මය. යමෙක් අනාත්මවේනම්, ඒ මගේ නොවේ. ඒ මම නොවෙමි. ඒ මගේ ආත්මය නොවේයැ'යි මෙසේ එය ඇතිසැටියෙන් මනානුවණින් දැක්කයුතුය.

නැහැය අනිත්‍යය, යමෙක් අනිත්‍යවේනම්, එය දුක්වෙයි. යමෙක් දුක්වේනම්, එය අනාත්මය. යමෙක් අනාත්මවේනම්, ඒ මගේ නොවේ. ඒ මම නොවෙමි. ඒ මගේ ආත්මය නොවේයැ'යි මෙසේ ඒ ඇතිසැටියෙන් මනානුවණින් දැක්ක යුතුය.

දිව අනිත්‍යය, යමෙක් අනිත්‍යවේනම්, එය දුක් වෙයි. යමෙක් දුක්වේනම්, එය අනාත්මය. යමෙක් අනාත්මවේනම්, ඒ මගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මගේ ආත්මයනොවේයැ'යි මෙසේ ඒ ඇතිසැටියෙන් මනානුවණින් දැක්ක යුතුය.

කය අනිත්‍යය, යමෙක් අනිත්‍යවේනම්, එය දුක් වෙයි. යමෙක් දුක්වේනම්, එය අනාත්මය. යමෙක් අනාත්මවේනම්, ඒ මගේ නොවේ. මම නොවෙමි. ඒ මගේ ආත්මයනොවේයැ'යි මෙසේ ඒ ඇතිසැටියෙන් මනානුවණින් දැක්ක යුතුය.

මනස අනිත්‍යය, යමෙක් අනිත්‍යවේනම්, එය දුක්වෙයි. යමෙක් දුක්වේනම්, එය අනාත්මයි. යමෙක් අනාත්මවේනම්, ඒ මගේ නොවේ. ඒ මම නොවෙමි. ඒ මගේ ආත්මයනොවේයැ'යි මෙසේ ඒ ඇතිසැටියෙන් මනානුවණින් දැක්ක යුතුය.

මහණෙනි, මෙසේදක්නා බහුශ්‍රැත ආර්‍ය්‍ය ශ්‍රාවකයා, ඇසෙහිදු කළකිරෙයි. කනෙහිදු කළකිරෙයි. නැහැයෙහිදු කළකිරෙයි. දිවෙහිදු කළකිරෙයි. කයෙහිදු කළකිරෙයි. සිතෙහිදු කළකිරෙයි (හේ) කළකිරෙන්නේ විරක්ත වෙයි. විරාගහේතුවෙන් (සසරින්) විමුක්තවෙයි. විමුක්තවත්මැ " විමුක්ත" යැ යන ඥානය උදාවෙයි. උත්පත්තිය ක්ෂීණවිය. බඹසරවැස නිමවන ලද, (කරණී) කරනලද මේ රහත්බව පිණිස කළයුතු අනෙක් කටයුත්තක් ක්‍රියාවක් නැතියැ'යි නුවණින් දනියි.

(අඣාත්තනිච්ච සූත්‍රයෙනි)

මහණෙනි, ඉදින් ඇසෙහි ආස්වාදයක් නොවීනම්, මේ සත්ත්වයෝ ඇසෙහි නොඇලෙන්නාහ. මහණෙනි යම්හෙයකින් ඇසෙහි ආස්වාදයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ ඇසෙහි ඇලෙත්.

මහණෙනි ඉදින් ඇසෙහි ආදීනවයක් නොවීනම්, සත්ත්වයෝ ඇසෙහි නොකළකිරෙන්නාහ. මහණෙනි යම්හෙයකින් ඇසෙහි ආදීනවයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ ඇසෙහි කළකිරෙති. මහණෙනි, ඉදින් ඇසෙහි නිස්සරණයක් නොවීනම්, සත්ත්වයෝ ඇසින් නොමිදෙන්නාහ.

මහණෙනි, යම්හෙයකින් ඇසෙහි නිස්සරණයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ ඇසින් මිදෙති.

මහණෙනි, ඉදින් කනෙහි නොවිනිනම්... මහණෙනි ඉදින් නැහැයෙහි නොවිනිනම්... මහණෙනි ඉදින් දිවෙහි නොවීනම් සත්ත්වයෝ දිවෙහි නොඇලෙන්නාහ. මහණෙනි, යම්හෙයකින් දිවෙහි ආස්වාදයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ දිවෙහි ඇලෙත්.

මහණෙනි, ඉදින් දිවෙහි ආදීනවයක් නොවීනම්, සත්ත්වයෝ දිවෙහි නොකළකිරෙන්නාහ.

මහණෙනි, යම්හෙයකින් දිවෙහි ආදීනවයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ දිවෙහි කළකිරෙත්. මහණෙනි ඉදින් දිවෙහි නිස්සරණයක් නොවීනම්, සත්ත්වයෝ දිවෙන් නොමිදෙන්නාහ.

මහණෙනි, යම්හෙයකින් දිවෙහි නිස්සරණයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ දිවෙන් මිදෙති.

මහණෙනි, ඉදින් කයෙහි නොවීනම්... මහණෙනි, ඉදින් සිතේ ආස්වාදයක් නොවීනම්, සත්ත්වයෝ සිතෙහි නොඇලෙන්නාහ.

මහණෙනි, යම් හෙයකින් සිතෙහි ආස්වාදයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ සිතෙහි ඇලෙති. මහණෙනි, ඉදින්, සිතෙහි ආදීනවයක් නොවීනම්, සත්ත්වයෝ සිතෙහි නොකළකිරෙන්නාහ.

මහණෙනි, යම්හෙයකින් සිතෙහි ආදීනවයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ සිතෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් සිතෙහි නිස්සරණයක් නොවී නම්, සත්ත්වයෝ සිතින් නොමිදෙන්නාහ.

මහණෙනි, යම් හෙයකින් සිතෙහි නිස්සරණයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ සිතින් මිදෙති.

මහණෙනි, යම්තාක් සත්ත්වයෝ මේ අධ්‍යාත්මික ෂඩායතනයන්ගේ ආස්වාදය, ආස්වාද වශයෙනුත්, ආදීනවය, ආදීනව වශයෙනුත්, නිස්සරණය, නිස්සරණ වශයෙනුත්, තතුසේ නොදත්තාහුද.

මහණෙනි, ඒතාක් සත්ත්වයෝ, දෙවියන්සහිත මරුන්සහිත, බඹුන්සහිත ලෝකයෙන්, මහණ බමුණන්සහිත, දෙවිමිනිසුන් සහිත ප්‍රජාවෙන් නික්ම ගියාහු, වෙන්වූවාහු, මිදුනාහු, ක්ලේශයන් ඇසුරුකරමින්, කෙලෙසුන් මැඩපැවැත්වූවාවූ සිතින්යුක්තව වෙසෙති.

වැඩිදුරටත් කරුණු හැදෑරීමේදී, සංයුක්තනිකායෙහි, සළායතනසංයුත්තයේ, යමකවග්ගයේදී බුදුපියාණන් වහන්සේ විසින් දේශිත මෙවන් සූත්‍රයක් හමුවෙයි.

මහණෙනි, මම ඇසෙහි ආස්වාදය සෙවීම කෙළෙමි. ඇසේ යම් ආස්වාදයක්වේනම්, එය අවබෝධ කෙළෙමි.

ඇසේ ආස්වාදය යම්තාක්වේනම්, මා විසින් එය නුවණින් මැනවින් දක්නාලද්දේ ය.

මහණෙනි, මම ඇසේ ආදීනවය සෙවීම කෙළෙමි. ඇසේ යම් ආදීනවයක් වේ නම්, එය අවබෝධ කෙළෙමි. ඇසේ ආදීනවය යම්තාක් වේනම්, මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේය.

මහණෙනි, මම ඇසේ නිස්සරණය සෙවීම කෙළෙමි. ඇසේ යම්නිස්සරණයක් වේනම්, එය අවබෝධ කෙළෙමි. ඇසේ නිස්සරණය යම්තාක්වේනම් මා විසින් එය නුවණින් මැනවින් දක්නාලද්දේය.

මහණෙනි, මම කනෙහි ......... මහණෙනි, මම නැහැයෙහි .... මහණෙනි, මම දිවෙහි ආස්වාදය සොයාලීම කෙළෙමි. දිවෙහි යම් ආස්වාදයක් වේනම්, එය අවබෝධ කෙළෙමි. දිවෙහි ආස්වාදය යම්තාක් වේනම්, මා විසින් එය නුවණින් මැනවින් දක්නාලද්දේය.

මහණෙනි. මම දිවෙහි ආදීනව සොයාලීම කෙළෙමි. දිවෙහි යම් ආදීනවයක් වේනම්, එය අවබෝධ කෙළෙමි. දිවෙහි ආදීනවය යම්තාක්වේනම්, මා විසින් එය නුවණින් මැනවින් දක්නාලද්දේය.

මහණෙනි, මම දිවෙහි නිස්සරණය සොයාලීම කෙළෙමි. දිවෙහි යම් නිස්සරණයක් වේනම්, එය අවබෝධ කෙළෙමි. දිවෙහි නිස්සරණය යම්තාක් වේනම්, මා විසින් එය නුවණින් මැනවින් දක්නාලද්දේය.

මහණෙනි, කයෙහි... මහණෙනි මම සිතෙහි ආස්වාදය සොයාලීම කෙළෙමි. සිතෙහි යම් ආස්වාදයක් වේනම්,

එය අවබෝධ කෙළෙමි. සිතෙහි ආස්වාදය යම්තාක් වේනම්, මා විසින් එය නුවණින් මැනවින් දක්නාලද්දේය.

මහණෙනි, මම සිතෙහි ආදීනවය සොයාලීම කෙළෙමි. සිතෙහි යම් ආදීනවයක් වේනම්, එය අවබෝධ කෙළෙමි. සිතෙහි ආදීනවය යම්තාක්වේනම්, මා විසින් එය නුවණින් මැනවින් දක්නාලද්දේය.

මහණෙනි, මම සිතෙහි නිස්සරණය සොයාලීම කෙළෙමි. සිතෙහි යම් නිස්සරණයක් වේනම්, එය අවබෝධ කෙළෙමි. සිතෙහි නිස්සරණය යම්තාක්වේ නම්, මා විසින් එය නුවණින් මැනවින් දක්නාලද්දේය.

මහණෙනි, යම්තාක් මම මේ අධ්‍යාත්මික ෂඩායතනයන්ගේ ආස්වාදය, ආස්වාදයවශයෙනුත් ආදීනවය, ආදීනවවශයෙනුත් නිස්සරණය, නිස්සරණවශයෙනුත්, තතුසේ නොදත්තෙම්ද... දන්නෙම්ද.... මට ඥානදර්ශනය පහළවිය. මාගේ අර්හත්ඵල විමුක්තිය අකොප්‍යය. මේ පැසුළු (අවසන්) භවයයි. දැන් පුනර්භවයක් නැතිය.

(අස්සාද පරියේසන සූත්‍රයෙනි)

සංසාර දුක්ඛයෙන් මිදීමට - භවනිරෝධ උදෙසා සත්‍ය දැකියයුතුය. අවබෝධ කළයුතුය. ඉන් බැහැර අන්මඟක්, දුක්ඛ නිරෝධය පිණිස නොවනවග, මෙම සූත්‍රධර්මයන් අනුව පැහැදිලිවන්නේය.

සංසාර වට්ටයෙන් අත්මිදෙනු කැමැති - භවදුකින් ගැලවෙනු කැමති, බුද්ධිමත් තැනැත්තේ, නොපමාව ආයයී මඟට පිවිස, බුදුන් වහන්සේ අනුදැනවදාළ ආකාරයෙන් සසරගමන නිමකිරීමට මංපෙත - ක්‍රමවේදය සකසාගත

යුතුය. එසේ නොමැතිව, විවිධාකාරයේ දිට්ඨීන්හි ඇලෙමින්, ප්‍රාර්ථනාකරමින්, ලැබීඇති උතුම් අවස්ථාවන් අහිමිකරගැනීමට තරම්, දුර්වලයන් නොවියයුත්තේය.

## විභංග

ඉදින් හේ සුඛවේදනා විඳිනම් ඒ වේදනා අනිත්‍යයැ'යිදනී. බැසගෙනසිටුනට නොනිසිය'යිදනී. තෘෂ්ණා දෘෂ්ඨී වශයෙන් අභිනන්දනය කරනට නොනිසියැ'යි දනී. ඉදින් දුඃඛවේදනාවිඳිනම් ඒ වේදනා අනිත්‍යයැ'යි දනී. ගැලෙන්නට, සිටුනට නොනිසියැ'යි දනී. තෘෂ්ණාදෘෂ්ඨී වශයෙන් අභිනන්දනයට නොනිසි යැ'යි දනී. ඉදින් උපේක්ෂාවේදනා විඳියිනම්, ඒ වේදනා අනිත්‍යයැ'යි දනී. ගැලෙන්නට නොනිසියැ'යි දනී. අභිනන්දනාර්හ නොවෙති'යි දනී.

ඉදින් හේ සුඛවේදනා විඳීනම්, විසංයුක්තවද, (අසිහියෙන්- අයෝනිසෝමනසිකාරයෙන්) ඒ සුවනොවිඳි. ඉදින් හේ දුඃඛවේදනාවිඳීනම්, විසංයුක්තව ඒ දුක වේදනා නොවිඳී. ඉදින් හේ උපේක්‍ෂා වේදනා විඳීනම්, විසංයුක්තව ඒ උපේක්ෂා වේදනාවන් නොවිඳි. හේ කායපර්‍යන්තික වේදනා විඳුනේ, කායපර්‍යන්තික වේදනාවිඳිමි'යි දනී. ජීවිතපර්‍යන්තික වේදනාවිඳුනේ, ජීවිතපර්‍යන්තික වේදනාවිඳිමි'යි දනී. කාබුන්මරණින් මතු ජීවිතපර්‍යාදානයෙන් මතු මෙලොවමැ අභිනන්දිකවූ සියළු වේදනාවෝ මේආයතනයන්හිමැ සන්හිඳෙති'යි දනී.

මහණ, යම්පරිදි තෙල්නිසාද, වැටිනිසාද, තෙල් පහන් දිලිසේද, ඒ තෛලයාගේද, වැටියගේ ද, ක්ෂයවයෑමෙන්,

අනෙකක්හුගේ නොගැනීමෙන්, අනාහාරවද සිටියේද? මහණ, එපරිදිමැ කාර්යපන්තික වේදනාවිඳුනේ කාර්යපන්තික වේදනාවිඳිමි'යි දනී. ජීවිත පර්යන්තික වේදනාවිඳුනේ, ජීවිත පර්යන්තික වේදනාවිඳිමි'යි දනී. කාබුන්මරණින් මතු, ජීවිතක්ෂයෙන් මතු, මේ ආයතනන්හි මතු අනභිනන්දන සියළු වේදනාවෝ සන්හිඳෙති'යි දනී. එහෙයින් මෙසේ සමන්වාගත මහණ, පරමප්‍රඥාධිෂ්ඨානයෙන් සමන්වාගතවූයේ නම්වෙයි. මහණ මේ පරමආර්ය ප්‍රඥාවයි. කිමෙකයත්, සර්වදුඃඛක්ෂය ඥාණයයි.

ඔහුගේ ඒ අරහත්ඵල විමුක්තිය, පරමාර්ථ සත්‍යවූ නිවනෙහි සිටියා (කෙලෙසුන් විසින් කෝප නොකරති) අකෝප්‍ය වෙයි. මහණ යමක් නැසෙනපියවි ඇද්ද, එය විතථ වෙයි. නොනැසෙන පියවි ඇති යම් නිවනෙක් ඇද්ද, එය සත්‍යවෙයි. එහෙයින් මෙසේ, එයින් සමන්වාගත මහණ, මේ පරමාර්ථ සත්‍යාධිෂ්ඨානයෙන් සමන්විත වෙයි. මහණ, යම් නොනැසෙන ස්වභාවයවූ නිවනෙක්ඇද්ද, එය පරම වූ ආර්යසත්‍යයි.

(ධාතුවිභංග සූත්‍රය)

## නොඇලීම

මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත, බඹුන් සහිත ලෝකයා විසින්, ශ්‍රමණ, බ්‍රාහ්මණයන් සහිත අවශේෂ දේවමනුෂයන් සහිත ප්‍රජාව විසින්

යම් රූපායතනයක්,
යම් ශබ්දායතනයක්,

යම් ගන්ධායතනයක්,
යම් රසායතනයක්,
යම් ස්පර්ශායතනයක්,

ධර්මාලම්භනයක් ගන්නාලදද, සොයාගන්නාලදද, සිතින් ලුහුබඳිනලදද, ඒ හැම මම දනිමි.

මහණෙනි, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත ලෝකයා විසින්, ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත, අවශේෂ දේවමනුෂ්‍යයන් සහිත ප්‍රජාව විසින් යම් රූපායතනයක්, ශබ්දායතනයක්, ගන්ධ, රසායතනයක්, ස්පර්ශායතනයක්, ධර්මාලම්භනයක්, ඇතිකර ගන්නාලදද, සොයාගන්නාලදද, සිතින් ලුහුබඳිනලදද, ඒ හැම අතීතවශයෙන්ම මම දැනගතිමි. ඒහැම තථාගතයන් වහන්සේ පැහැදිලි ලෙසම අවබෝධකළහ. ඒහැම සදොර දොරටුකරා තෘෂ්ණාදෘෂ්ටී වශයෙන් තථාගතයන් නොඑළැඹෙන්නාහ.

මහණෙනි, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත ලෝකයා විසින් බ්‍රාහ්මණයන් සහිත, අවශේෂ දේව මනුෂ්‍යයන් සහිත ප්‍රජාව විසින්, යම් රූපායතනයක්, ශබ්ද/ගන්ධ/රස, ස්පර්ශායතනයක්, ධර්මාලම්බනයක් ගන්නාලදද, සොයාගන්නා ලදද, සිතින් ලුහුබඳිනලදද, ඒ හැම දනිමි'යි කියමි නම්, එය මාගේ මුසාවක් වෙයි.

මහණෙනි, ඒ හැම මම දනිමි'යි නොදනිමි'යි කියමි නම්, ඒ ද එබඳුම වෙයි. ඒහැම මම නොදනිමි'යිද නොදන්නෙම් නොවෙමි'යි ද කියමිනම්, එබස මාගේ දෝෂයක් වෙයි.

මහණෙනි, මෙසේ තථාගතයන් වහන්සේ පෙනෙන්නාහු වූ රූපායතන දැක, ඒ රූපායතන නිත්‍යවූ

දේ සැබෑවූ දේ හෝ රූප, සත්ත්ව ලෙසින් නොගන්නේය. ඒ කිසිවක් පිළිබඳව තෘෂ්ණාවන් පහළ නොකරන්නේය. මෙනෙහි නොකරන්නේය.

ඇසින් දකින්නාවූ, කනෙන් අසන්නාවූ, නාසයෙන් දැනෙන්නාවූ, දිවෙන් විඳින්නාවූ, කයෙහි දැනෙන්නාවූ, සිතෙහි පහළවන්නාවූ, කවර හෝ ස්වභාවයක්, ධර්මතාවයක්, රූප වශයෙන් හෝ සත්ත්වයන් ලෙසත් හෝ නොසිතන්නේය. තෘෂ්ණාමනාධියෙන් නොගන්නේය. මෙනෙහි නොකරන්නේය. එවන් කවරසංඥාවක් ඇතිවූ ක්ෂණයෙහිම බැහැරවන්නට හරින්නේය. ඒවායේ නොගැලන්නේය.

මහණෙනි, මෙසේ තථාගතයන් වහන්සේ දිට්ඨි, සුත, මුත, (දකින ඇසෙන විඳින) කිසිවක් කෙරෙහි නොබැඳෙන්නාහ. ඒ උන්වහන්සේ සියළු කෙළෙසුන් නසාලීමෙන් පහළ වූ රහත්භාවය පිළිබඳ තත්ත්වයයි. ඒ තථාගතභාවයට වැඩියෙන් උත්තරීතරවූ, රහත්භාවය හැරුණුකොට අන්සුවයක් නොමැතිබව වදාරමි.

අන්‍යයන්ගේ පැවසීම්කෙරෙන් කිසිවක් සැබෑයැ'යි හැඟීමෙන්යුතුව ඒවායේ බැඳෙනුයේ, කිසියම් රූපායතනයක් වේවා'යි ශබ්දායතනයක් වේව'යි ගන්ධායතනයක් වේව'යි දිට්ඨි, සුත, මුත විඥාණයන් වේව'යි ඒ කිසිවක්හි ගතයුත්තක් ඇත්තේය, හරවත් දෙයක් ඇත්තේය, යනාදී වශයෙන් කවර ආකාරයකින් හෝ නොගන්නා, සත්‍ය, මුසාවය සේ නොගනුයේ සියළු කෙලෙස් නසා රහත්ඵලයෙහිම වූයෙමි.

යම් දෘෂ්ඨියක බැඳුන ජනයෝ, ඇතිකරගන්නා වූ නිගමනයන්වෙත්ද, ඔවුන් ආයුධදැක, දැකගත් හෙයින් ආයුධයැ'යි කියත්ද? එය ආයුධයක් ලෙස දැකීමක්, හැඟීමක්, මෙනෙහි කිරීමක්, ආයුධයක් ලෙස දනිමි. දකිමියි, යනාදී පිළිගැනීමක්, තථාගතයන් තුල නැත්තේය.

(කාළකාරාම සූත්‍රයෙනි)

ලොව කුමකින් පමුණුවනු ලැබේද? කුමකින් අදිනා ලැබේද? සියල්ලෝම කුමනආකාරයේ එක්දහමෙකුගේ වසඟයට ගියාහුද?

සිතින් ලොව පමුණුවනු ලැබේ. සිතින් අදිනාලැබේ. සියල්ලෝම සිත නැමැති මේ එකම දහම්හුගේ වසඟයට ගියාහු වෙති.

(චිත්ත සූත්‍රයෙනි)

## සංයෝජනීය ධර්ම

සංයෝජනීය'යි සංයෝජනීය ධර්මයෝයි, හේ මේ දහම්හු වෙනස් වෙනස්අර්ථ ඇත්තාහු, වෙනස් වෙනස්ව්‍යඤ්ජන ඇත්තාහුද? නැතහොත් එම අක්ෂිඇත්තාහු ව්‍යඤ්ජන පමණක් වෙනස්වූවාහුද?

වහන්ස, සංයෝජනයය'යි හෝ සංයෝජන ධර්මයෝය'යි හෝ මේ දහම්හු වෙනස් වෙනස් අර්ථ ඇත්තාහුද, වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහුද වෙති. ඒ පිළිබඳ මෙසේ උපමාවක් දක්වමි. ඇතැම් නුවණැති මිනිසුන් උපමාවෙන්ද, දේශනාවේ අරුත දැනගනිත්"

යම්සේ කළුගොනෙකුත්, සුදුගොනෙකුත්, එක් දහමෙකින් හෝ එක්යොතකින් හෝ බඳිනලද්දේද, කළුගොන්, සුදුගොන් බැඳුමය. සුදුගොන් කළුගොන් බැඳුමය. වශයෙන් යමෙකු පවසන්නේ නම් - එය නිවැරදි ප්‍රකාශයක් වන්නේද?

එය නිවැරදි නොවන්නේමය.

කළුගොන්, සුදුගොනුන්ගේ බැඳුමනොවේ. සුදුගොනුන් කළුගොනුන්ගේ බැඳුමද නොවේ. යම් දහමෙකින් (ධර්මතාවයකින්) හෝ යොතකින් හෝ ඔහු බඳනාලද්දාහු නම් එය එහි සංයෝජනය යි.

එසෙයින්ම ඇස රූපයකට සංයෝජනය නොවේ. රූපයෝ ඇසට සංයෝජනය නොවෙති. එකී දෙකනිසා යම් ඡන්දරාගයක් උපදීනම්, එය එහි සංයෝජනයයි.

කණ - නාසය - දිව - ශරීරය - ශබ්ද - ගන්ධ - රස ස්පර්ශයේ ද මෙසේමය.

(චිත්ත සංයුක්තයෙනි)

## කායානුපස්සයට නුසුදුස්සෝ

කම්මාරාමතා : විවිධ ක්‍රියාකර්ම / කටයුතුවලට ඇති කැමැත්ත

භස්සරාමතා : කථාවේ යෙදීමට, කෙළිකවට බස්හි නිරතවීමට කැමති

නිද්දාරාමතා : නිදීමෙහි ප්‍රියකරණ

සඞ්ඝණිකාරාමතා : බොහෝ දෙනෙකු අතර, පිරිවර හා එක්ව සිටීමේ කැමැත්ත

පියු දොර ඉඳුරන් නැතිබවය :

නොසන්සුන්කම, බොහෝ සිතුවිලිවල නිරතවී, පංචඉන්ද්‍රියන්ගේ

සංඥාවනට රැවටෙනසුළු භාවය.

# කායානුපස්සනාව

පින්වත් මහණෙනි, සද්ධර්මය අවබෝධකරනු කැමති භික්ෂුව, යම් ආකාරයකින් දකින්නේවේද, මැරීගොස් එක දවසක් ගියා හෝ මැරීගොස් දෙදවසක් ගියා හෝ මැරීගොස් තුන්දවසක්ගියා හෝ සොහොනෙහි අතහැර දමාගොස්ඇති, ඉදිමීගියාවූ, නිල්වීගියාවූ, සැරවහටගත්තාවූ, පණුවන් උතුරන්නා වූ, මෘතදේහය දකිමින්,

ඒ භික්ෂුව තමාගේයැ'යි සම්මත මේ ශරීරයත් මෘතදේහය හා ගලපාබලමින් භාවනාව කරයි. මේ ශරීරය වනාහි මළකුණට අත්වූ ඉරණමට පත්වන - ඒ ස්වභාවයට පත්වන, ඒකාන්ත තත්ත්වයකි. මේ සිරුරද - මළසිරුර ඉක්මවූ ස්වභාවයම මිස, ඉන් වෙනස්වූ ස්වභාවයම නොවන්නේමය.

සතරමහාභූතධාතූන් මුල්කොට මේ කය, හටගන්නා ආකාරයද, ආහාරයෙන් ඒ පවත්නා ආකාරයද, කායානුපස්සනාවෙන් දකිමින් වාසය කරයි.

මේ ශරීරයම ආහාරනිරෝධයෙන් අභාවයටපත්වී නිල්වී, ඉදිමී, සැරව වැගිරී, නැසී, වැනසීයන ආකාරය ද අවබෝධවෙන්ම දකිමින් කායානුපස්සනාවෙන් වාසය කරයි.

හේතුඵල ධර්මයක් වශයෙන් සතරමහාධාතුන්ගෙන් සකස්වූ, සංඛතධර්මයක් වශයෙන් පවත්නා, අනිත්‍යවූ, දුක්වූ, අනාත්මවූ, කායික ස්වභාවයක් තිබේයැ'යි සද්ධර්මය අවබෝධකරනු කැමති, ඒ ශ්‍රාවකයාහට ඉදිමී නිල්වී සැරවහටගත් මෘතශරීරය අරමුණුකොට, මනාව යොමුකළ සිහිය බලවත්ව පිහිටියේ වෙයි.

එසේ කායානුපස්සනාවේ මනාව පිහිටි සිහිය, තවදුරටත් අවබෝධ ඥාණය දියුණුවීම පිණිසම පවතී.

බලවත්ව සිහිය දියුණුවීම පිණිසම පවතී.

එබඳු තැනැත්තා ඉදිමී, නිල්වී, සැරව වැගිරී, වැනසීයන මෘතශරීරය, තම කය හා ගලපා, මේ කයෙහි කිසිවක් මමය, මගේය, මාගේ ආත්මයය, වශයෙන් ග්‍රහණයකර නොගෙන, යථා, යථා ස්වභාවයන් තථා, තථා පරිදි මෙනෙහිකරමින් වාසය කරයි.

ලෝකයේ කිසිවක්, කිසිම පිළිවෙළකින්, ග්‍රහණයකර නොගනී. පින්වත් මහණෙනි, භික්ෂුව සතරමහාභූතධාතුන් ගෙන් හටගත්, මේ කයෙහි යථා ස්වභාවය අවබෝධයෙන්ම දකිමින් වාසය කරයි.

පින්වත් මහණෙනි, සද්ධර්මය අවබෝධකරනු කැමති භික්ෂුව, අමුසොහොනෙහි අතහැර දමාගිය ඇට කැබලි බවට පත්වූ, වෙන්වීගියාවූ, දිශා අනුදිශාවලට

විසිරගියාවූ, අත්ඇට වෙන පැත්තකය, පාඇට වෙන පැත්තකය, කෙණ්ඩාඇට වෙන පැත්තකය, දණඇට වෙන පැත්තකය, කළවා ඇට වෙන පැත්තකය, පිටකටුඇට වෙන පැත්තකය, උකුළුඇට වෙන පැත්තකය, ගෙලඇට වෙන පැත්තකය, දත්ඇට වෙන පැත්තකය. හිස්කබල වෙන පැත්තකය. වශයෙන් මෙයාකාරයෙන් දකින්නේ වේද,

ඒ භික්ෂුවද තමාගේයැ'යි සම්මත මේ ශරීරය ගැනත්, කරුණු ගළපාබලමින් භාවනා කරයි. මේ ශරීරය වනාහි, මළකුණකට අයිති ඉරණමවන මේ ස්වභාවයකට පත්වන ධර්මතාවයකි. මේ ස්වභාවයට පත්වන්නේමවේ.

මේ ආකාරයෙන් තමාගේයැ'යි සළකනුලබන කයෙහිද, කයපිළිබඳ යථාස්වභාවය අවබෝධයෙන්ම දකිමින් වාසයකරයි. අනුන්ගේයැ'යි සළකනුලබන කයෙහිද, කයපිළිබඳ යථාස්වභාවයද අවබෝධයෙන්ම දකිමින් වාසයකරයි. තමාගේයැ'යි කියනුලබන කයෙහිද, අනුන්ගේයැ'යි සළකනුලබන කයෙහිද, කය පිළිබඳ යථාස්වභාවයද අවබෝධයෙන්ම දකිමින් වාසයකරයි.

යම් ආකාරයකින්ද පින්වත් මහණෙනි, දෙපැත්තෙන්ම කටඇති මල්ලක්වේද, නොයෙක් වර්ගයේ ධාන්‍යවලින් පිරීඇති, කුමනවර්ගයේ ධාන්‍යවලින්ද යත්, හැල්වී වලිනි, වී වලිනි, මුංඇටවලිනි. මෑඇටවලිනි. තලවලිනි, සහල්වලිනි, ඒමල්ල හොඳින් ඇස්පෙනෙන පුරුෂයෙක් ලිහාදමා, ධාන්‍ය වෙන් වෙන්කොට බලන්නේ යම් ආකාරයකින්ද? මේවා හැල් වී, මේවා වී, මේවා මුංඇට, මේවා මෑඇට, මේවා තළ, මේවා සහල් වශයෙනි"

අන්න ඒ ආකාරයෙන්ම පින්වත් මහණෙනි, සද්ධර්මය අවබෝධකරනු කැමති භික්ෂුව, මේ කයෙහිම යටිපතුලෙන් උඩසිට, හිසමත පිහිටි කෙස්රොදින් පහළට, සම සීමාකොට තිබෙන, නොයෙක් ආකාරයන් පිරී අපිරිසිදුදේ පිළිබඳව අවබෝධඥාණය ඇතිවනපරිදි යලියළිත් නුවණින් විමසාබලයි. තමාගේයැ'යි සළකනු ලබන කයෙහිද, අනුන්ගේයැ'යි සළකනුලබන කයෙහි ද, කය පිළිබඳ ස්වභාවය අවබෝධයෙන්ම දකිමින් වාසය කරයි.

හේතුඵල දහමින් සකස්වූ, සංඛත ධර්මයක් වශයෙන් පවත්නා, අනිත්‍යවූ, දුක්වූ, අනාත්මවූ, කායික ස්වභාවයක් තිබේයැ'යි සද්ධර්මය අවබෝධ කරනු කැමැති ඒ ශ්‍රාවකයාහට, කය නම්වූ දෙතිස්කුණපය අරමුණුකොට මනාව යොමුකළ සිහිය බලවත්ව පිහිටියේ වෙයි.

එසේ කායානුපස්සනාවේ මනාව පිහිටි සිත තවදුරටත්, අවබෝධ ඥාණය දියුණුවීම පිණිසම පවතී. බලවත් වූ සිහිය දියුණු වීම පිණිසම පවතී.

එබඳු තැනැත්තා දෙතිසක්වූ කිසිදු කුණපයක් මමය, මගේය, මාගේ ආත්මයවශයෙන් ග්‍රහණයකර නොගෙන වාසය කරයි. ලෝකයේ කිසිවක්, කිසිම පිළිවෙලකින් ග්‍රහණයකර නොගනී.

මේ ආකාරයෙන්ද, පිංවත් මහණෙනි, භික්ෂුව සතරමහාභූතයින්ගෙන් හටගත් මේ කයෙහි, දෙතිස් කුණුයන් අරමුණුකොට, කය පිළිබඳ යථාස්වභාවය, අවබෝධයෙන්ම දකිමින් වාසය කරයි. යම් ආකාරයකින් පිංවත් මහණෙනි, දක්ෂවූ ගවඝාතකයෙක් හෝ ගව

සාතකයාගේ ගෝලයෙකු හෝ ගවදෙනක මරාදමා සතර මංසන්ධියක, කැලි කැලිවශයෙන් ගවමස් බෙදා තබා සිටින්නේවේද, අන්න ඒ ආකාරයෙන්ම, පිංවත් මහණෙනි, සද්ධර්මය අවබෝධකරගනු කැමති භික්ෂුව, මේ කයම යම් ආකාරයකින් පවතීද, යම් ආකාරයකින් පිහිටා තිබේද, මේ කය අරමුණුකොට මූලික ස්වභාවයන් වශයෙන්, වෙන් වෙන්කොට නුවණින් විමසා බලයි.

මේ කයෙහි ඇත්තේ, පොළවට පස්වී යන (පෘථිවි) ගොරෝසු ස්වභාවයන්ය.

දියවී යන වැගිරෙන (අපෝ) ස්වභාවයන්ය.

සිසිල - උණුසුම් (තේජෝ) ස්වභාවයන්ය.

හමායන (වායු) ස්වභාවයන්ය.

සතරමහාධාතුන් මුල්කොට මේ කය හටගන්නා ආකාරයද, අවබෝධයෙන් දකිමින් කායානුපස්සනාවෙන් වාසය කරයි.

මේ කය අභාවයටයන ආකාරයද, අවබෝධයෙන් දකිමින් කායානුපස්සනාවෙන් වාසය කරයි.

## දෙතිස් කුණප

සතරමහාභූතයින් ගෙන් හටගත් මේ කයෙහි ඇත්තේ, වෙනස්වන පැහැයෙන් යුතුව, පුළුටු ගඳින්වූ , දිරායනසුළුවූ "කෙස්"ය.

නිරතුරුවම දහදිය හා කුණු සමග තැවරී තිබෙන, දුගඳ හමන "ලොම්" ය.

දිරායන ස්වභාවයෙන්යුතු "නියපොතු"ය.

කුහර හටගැනීමෙන් කුණුවන්නාවූ, නිරතුරුව දුර්ගන්ධය හමන්නාවූ, මැලියම් තැවරීගිය "දත්"ය.

කලකදී පතුරුගැලවී යන්නාවූ, රැළිවැටෙන්නාවූ, හොරිදැමීම, බිබිළිදැමීම, අළුහම්, දද, කුෂ්ට, වණ ආදිය හටගන්නාවූ "සම"ය.

තුවාලවූවිට කුණුවී වහා සැරව පිරෙන්නාවූ, වහා පණුවන් හටගන්නාවූ "මස් වැදලිය'.

නොයෙක් ප්‍රමාණයෙන්යුතු, වැල්, පුරුක්ලෙසින් සිරුරෙහි මස්අතර වැදීසිටිනා "නහරවැල්ය"

හිස්කබල, ගෙල ඇට, උරහිස ඇට, අත් ඇට, ඇඟලි ඇට, පපු ඇට, ඉල ඇට, කොඳු ඇට, කලවා ඇට, දණහිස් ඇට, පා ඇට, පා ඇඟිලි ඇට ආදී වශයෙන් නහර වලින් හා මසින් වෙලාගත් "ඇටසැකිල්ල"ය.

ඇට ඇතුලේ පවතින, ජල්ලිවැනි වහා කුණුවීයන ඇට "ලොඳ"ය.

අඹගැට දෙකක හැඩයගන්නාවූ, ලේධාතුවට එක්වන ජලය පෙරා මුත්‍රාබවට පත්කරවන, නොයෙකුත් ආපදාවනට පත්වන, ලෙඩ රෝගයන්ගෙන් නරක්වන "වකුගඩු"ය.

ලේධාතුව සිරුරෙහි පැතිරවීමේ මූලිකස්ථානයවන පිළීගඳහමන ලෙය රැඳීඇති මස්ගොබයවන "හෘදය" මාංශයය.

පිළීගඳහමන ලොකු ලේ කුට්ටියක් වැනිවූ කුණුවී යන්නාවූ කුවුකුමසනම්වූ "අක්මාවය"

කහපාටින්යුතු පිත වගුරවන්නාවූ "පිත්තාශය"ය.

කුණුවීයන මස්වැදැල්ලක්වැනි "බඩදිව"ය.

දසත විහිදීගිය කුඩා නාලිකාවන්ගෙන් සැදුණු ලොකු වැටකොළු දෙකක්වැනිවූ, හුස්ම ඉහළටගන්නා විට පිම්බෙන්නාවූ, හුස්ම පහළටහෙලූවිට හැකිලෙන්නා වූ, ලෙයින් මසින් වැකුණු "පෙණහළු"ය.

හමගැසූ ගැරඬියෙකු, ලේ ඔරුවක දරණලා සිටින්නා වැනි, කුසතුළ දරණලා තිබෙන පණුවන්ගෙන්ද ගැවසුණු කුඩා "බඩවැල"ය.

වැළඳූආහාර, අසූචිබවට පත්වෙමින්, නලයක් දිගේ ඇදෙන්නාක්මෙන් එකතුවෙමින් ඇදීයන අසූචියෙන් පිරිණු "මහබඩවැල"ය.

සපා කෙළසමඟ මිශ්‍රවීගිය ආහාරය, බලු වමනයක් පිරවූ මල්ලක්සේ පවතින "ආමාශය"ය.

වැළඳූආහාර, දිරවායාමෙන් කුණුවූ මැටිපිඩක්සේ අධික දුර්ගන්ධය හමන්නාවූ "අසූචිය"

හිස්කබල ඇතුලේ දඟරගැසී පවතින, ලේතැවරුණ කුරුම්බාලොඳ වැනි "මොළය"ය.

දුගඳහමන්නාවූ කහපාටින්යුතු දියරය වන "පිත"ය.

සතුන්දැමූ වමනයක්සේ දුගඳහමන, පෙණගොඩින්යුතු සෙවළගතියෙන්යුතු "සෙම"ය.

ලේධාතුව කුණුවූ පසුව, වහා පණුවන් හටගන්නාවූ, නෙකවර්ණයෙන්යුතු "සැරව"ය.

පිලීගඳ හමන්නාවූ රක්තවර්ණයෙන් යුතු දියරයවන "ලේ"ය.

ලුණුවතුරක්වැනිවූ, දුර්ගන්ධයෙන් යුතුව, සිරුර පුරාම වැගිරෙන දියරයක්වූ "ඩහදිය"ය.

සමටත්, මසටත්, අතර පවතින තෙල්තට්ටුවවන "තෙල්මන්ද"ය.

ඇස්ගොබළුතුලින් වැගිරෙන්නාවූ කබබවට පරිවර්තනයවන්නාවූ, පිළිකුලදනවන්නාවූ "කඳුළු"ය.

ඩහදිය සමඟ මුසුවී, මේදයතුළින්, තෙල්ගතියෙන් මතුවන "වුරුණතෙලය"

මුඛයතුළින් වැගිරෙන්නාවූ, දුගඳහමන සෙවළ ගතියෙන්යුතු පෙණසහිතවූ "කෙල"ය.

නෙකපාටින්යුතු, ඇළෙනසුළුවූ දුගඳහමන්නාවූ, නාසයෙන් වැගිරෙන්නාවූ "සොටු"ය.

ඇටසන්ධි අතරතැවරී ඇත්තාවූ සෙවළ සහිත දියරයවන "සඳමිඳුළු"ය.

අපවිත්‍රදියරයක් වශයෙන්, සිරුරින් බැහැරවන නෙකවර්ණයෙන් හා දුර්ගන්ධයෙන් යුත් "මුත්‍ර"ය.

කුණපකොටස් තිස්දෙකකින් යුතු මේ කයෙහි ස්වභාවය දකිමින්, කායානුපස්සනාවෙන් වාසයකරයි.

මේ කය පවතින ආකාරයද, අභාවයටයන ආකාරයද, අවබෝධයෙන් දකිමින් වාසය කරයි.

තමාගේයැ'යි සලකනුලබන කයෙහිද මේ ආකාරයෙන්, කය පිළිබඳ යථාස්වභාවය දකිමින් වාසය කරයි.

අනුන්ගේ ය'යි සලකනුලබන කයෙහිද, කය පිළිබඳ යථා ස්වභාවය අවබෝධයෙන්ම දකිමින් වාසය කරයි.

තමාගේයැ'යි සලකනුලබන කයෙහිද, අනුන්ගේ යැ'යි සලකනුලබන කයෙහිද, කය පිළිබඳ යථා ස්වභාවය අවබෝධයෙන්ම දකිමින් වාසය කරයි.

කිසිවක් මමය, මාගේය. මාගේ ආත්මයය, වශයෙන් ග්‍රහණයකර නොගෙන වාසය කරයි. ලෝකයේ කිසිවක් කිසිම පිළිවෙලකින් ග්‍රහණයකර නොගනී.

**යථා අධො - තථා උද්ධං**

**තථා උද්ධං - යථා අධෝ**

යට යම්සේනම් උඩත් එසේමය.

උඩ යම්සේද - යටත් එසේමය.

පිංවත් මහණෙනි, පෘථිවිධාතුව අනිත්‍යය, විපරිනාමයට පත්වෙයි. වෙනස්වී යන ධර්මයකි. ආපෝ ධාතුවද, තේජෝධාතුවද, වායෝධාතුවද, අනිත්‍යය. විපරිනාමයට පත්වන්නේය. වෙනස්වන ධර්මයෝ ය.

පිංවත් මහණෙනි, යම් කෙනෙක් සතරමහාධාතුන් කෙරෙහි දක්නට ලැබෙන මේ ධර්මතාවය ඒ

ආකාරයෙන්ම, අවබෝධඥාණයෙන් දැනගනීද, දැකගනීද, ඔහු නිවන් අවබෝධකරගන්නෙකි.

(ධතු සුත්ත - සං.නි)

පිංවත් මහණෙනි, මේ පඨවිධාතුවේ, ආපෝධාතුවේ, තේජෝධාතුවේ, වායෝධාතුවේ යම් උපතක් වේද, යම් පැවැත්මක් වේද, යම් පහළවීමක් වේද, එවැනි ස්වභාවයක් වේද, ඒ වනාහි දුකෙහි උපතය. රෝගයන්ගේ පැවැත්මය. ජරා මරණ පහළ වීමය.

(උප්පර සුත්ත - සං.නි)

පිංවත් මහණෙනි, පඨවිධාතුව, අපෝධාතුව, තේජෝධාතුව, වායෝධාතුව යන මේ සතරමහාධාතුන් කෙරෙහි, ආශාවක්, ඇලීමක්, ඡන්දරාගයක් ඇත්ද, එය වනාහි සිතෙන් කෙළසීමකි.

(ධතු සුත්ත - සං. නි)

සතරමහාධාතුන්ගේ පැවැත්ම, ඉතාම සියුම් හෝ ඉතාම ගොරෝසු ආකාරයෙන් හෝ පවතී. එයින් මිදී ගිය, සතරමහාධාතු නොමැති "සසරක්" නොමැති අරහත්ත්වයටපත්වූ සිතෙහි පමණි. සතරමහාධාතුන් නොපිහිටන්නේ"

භාග්‍යවත් බුදුරජාණන්වහන්ස, මේ සසර සැඩපහරෙහි පැවැත්ම තිබෙන්නේ කොහිද? සංසාර චක්‍රය නැත්තේ කොහිද, නාමයන් / රූපයන් ශේෂනොවී නිරුද්ධවන්නේ කොතැනද?

පිංවත් දෙවිඳුනි, යම්තැනක ආපෝධාතුව, වායෝධාතුව, තේජෝධාතුව, පඨවිධාතුව, නොපිහිටයිද? අන්න එතැන "සසර" සැඩපහර නැත. එතැන සංසාර චක්‍රය නැත. එතැන නාමයන් / රූපයන් ශේෂනොවී නිරුද්ධ වෙයි.

(සර සුත්ත - සං. නි)

## ගිරිමානන්ද සූත්‍රය

බුදුන්වහන්සේ, අනාථපිණ්ඩික සිටුවරයා විසින් පූජාකරනලද, ජේතවනාරාමයේ වැඩවසන සමයෙහි, ගිරිමානන්දනම් භික්ෂු නමක් ආබාධිතව දැඩිසේ ගිලන් විය.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ. බුදුන්වහන්සේ වෙත එළඹ, වැඳ එකත්පස්වහිඳ - ගිරිමානන්ද භික්ෂුන්ගේ ආබාධය හා ගිලන්බවත් සැළකර සිටියේය.

ගිරිමානන්ද භික්ෂුව සිටින ස්ථානය වෙත අනුකම්පාවෙන් වැඩමකොට වදාරණමෙන්, බුදුන් වහන්සේ වෙතින් අයැද සිටියේය.

එවිට බුදුන් වහන්සේ මෙසේ වදාරණ සේක.

ආනන්දය, ඔබ ගිරිමානන්ද ස්ථවිරයන් සමීපයට ගොස් දසසංඥා, කියන්නෙහිනම් යහපති. එම දසසංඥාවන් අසන, ගිරිමානන්ද භික්ෂුවගේ ආබාධය වහා සංසිඳෙන්නට, එයම කාරණයක් වෙයි. එම දසසංඥා කවරේද යත්,

1. අනිත්‍ය සංඥා 7. නිරෝධ සංඥා

2. අනාත්ම සංඥා 8. අනභිරත සංඥා

3. අශුභ සංඥා (සියළු ලෝකයෙහි)

4. ආදීනව සංඥා 9. සියලු සංස්කාර කෙරෙහි

5. ප්‍රහාන සංඥා අනිත්‍ය සංඥා

6. විරාග සංඥා 10. ආනාපාන සතිය යනුයි.

ආනන්දය, අනිත්‍යසංඥා කුමක්ද?

ආනන්දය, යම් මහණ තෙම - ආරණ්‍යගතවූයේ හෝ රුක්මුලකට ගියේ හෝ ශුන්‍යාගාරයකට ගියේ හෝ මෙසේ නුවනින් සළකයි. මෙනෙහි කරයි"

| | |
|---|---|
| රූපස්කන්ධය | - අනිත්‍යය |
| වේදනාස්කන්ධය | - අනිත්‍යය |
| සංඥාස්කන්ධය | - අනිත්‍යය |
| සංස්කාරස්කන්ධය | - අනිත්‍යය |
| විඥාණස්කන්ධය | - අනිත්‍යය |

මෙසේ පංච උපාදානස්කන්ධයෙහි අනිත්‍ය ලක්ෂණය නැවත නැවත බලමින් වෙසෙයි. ආනන්දය මේ වනාහි **අනිත්‍ය සංඥාය'යි** කියනු ලැබේ.

ආනන්දයෙනි, අනාත්මසංඥා කවරේද?

ආනන්දය යම්මහණතෙම - ආරණ්‍යගතවූයේ හෝ රුක්මුලකට ගියේ හෝ ශුන්‍යාගාරයකට ගියේ හෝ මෙසේ නුවණින් සිතයි"

ඇස අනාත්මය - රූපය අනාත්මය
කන අනාත්මය - ශබ්දය අනාත්මය
නාසය අනාත්මය - ගන්ධය අනාත්මය
දිව අනාත්මය - රසයෝ අනාත්මය
කය අනාත්මය - ස්පර්ශයෝ අනාත්මය
මනස අනාත්මය - ධර්මයෝ අනාත්මය යනුයි.

මෙසේ අධ්‍යාත්මිකවූද, බාහිරවූද, මේ ෂඩායතනයන් කෙරෙහි අනාත්මලක්ෂණ අනුව බලමින් වාසය කෙරෙයි.

ආනන්දය, මෙ **අනාත්මසංඥාය'යි** කියනු ලැබේ.

ආනන්දය, අශුභ සංඥා කවරේද යත්,

මේ සසුනෙහි මහණ තෙම පත්ලෙන්උඩ කෙස්මතුයෙන් යම්, සමකෙළවරකොට ඇති, මේ ශරීරයම නානාප්‍රකාරවූ අසූචියෙන් (අපද්‍රව්‍යයෙන්) පිරුණේ ය'යි ප්‍රත්‍යවේක්ෂා (අවබෝධ) කෙරේද? මේ ශරීරයෙහි කේශයෝ, ලෝමයෝ, නියය. දත්ය, සමය, මස්ය, නහර , ඇටය, ඇටමිදුළුය, වකුගඩුය. හෘදයමාංශය, අක්මාවය, දලඹුවය, බඩදිවය, පපුවය, බඩවැල්ය, අතුණුබහන්ය. අමු අහරමය. මලය. පිතය. සෙමය. පූයාය, (සැරව) ලේය, දහඩියය, තෙලය, කඳුළුය, වුරුණු තෙලය, කෙලය, සොටුය, සඳමිදුළුය, මුත්‍රාය.

මේ ශරීරයේ ඇත්තාහුය'යි මෙසේ මේ ශරීරයෙහි අසුභය අනුව බලමින් වාසය කෙරෙයි.

ආනන්දය, මේ **අශුභසංඥාය'යි** කියනු ලැබේ.

ආනන්දය, ආදීනවසංඥා කවරේද යත්,

ආනන්දය, මේ සසුනෙහි මහණතෙම - ආරණ්‍යගත හෝ රුක්මුලකට ගොස් හෝ ශුන්‍යාගාරගතව මෙසේ නුවනින් සිතයි.

මේ ශරීරතෙම, බොහෝ දුක්ඇත්තේ වෙයි. බොහෝ ආදීනවඇත්තේ වෙයි. මේ ශරීරයේ බොහෝ ආබාධයෝ උපදිති. ඒ කවරහුද යත්,

ඇස්රෝගයෝද, කර්ණරෝගයෝද, නාසයෙහි රෝගයෝද, දිවෙහි ඇතිවන රෝගයෝද, කයෙහි ඇතිවන රෝගද, හිසෙහි ඇතිවන රෝගද, දන්ත රෝගද, කාසය (කැස්ස) ස්වාශ, (ඇදුම) පීනස, දැවිල්ල, උණ, උදරරෝග, මුර්ජාව, අතිසාරය, ඉදිමීම, වසූරිය, කුෂ්ට, ගඩු, අපස්මාරය, දද, කැසිලි, කච්චු නම්වූ කුෂ්ට රෝගය, නියෙන්කැසූ තැන්හි වණ රෝගය, විචර්චිකා නම්වූ කුෂ්ට රෝගය, රත්පිතය, දියවැඩියාවය, අංශරෝග, පිළිකාය, භගන්දරාය, පිතෙන් ඇතිවන රෝග, සෙමෙන් ඇතිවන රෝග, වාතයෙන් හටගන්නා රෝග, තුන්දොසින් වන්නාවූ සන්නිපාත රෝග, ඍතු පෙරළියෙන් හටගන්නා රෝග, විෂම (වැරදි) පරිහරණයෙන් (ක්‍රියාවෙන්) හටගන්නා රෝග, උපක්‍රමයෙන්වන රෝග, කර්ම විපාකයෙන්වන රෝග, සීතය, උෂ්ණය, කුසගින්න, පිපාසය, අහර, මළපහ කිරීමේ වේදනා, මුත්‍රය.

මෙසේ මේ කයෙහි (සිරුරෙහි) ආදීනව අනුව බලමින් වෙසෙයි.

ආනන්දය මේ **ආදීනවසංඥාය'යි** කියනු ලැබේ.

ආනන්දය ප්‍රහාණසංඥාව කවරේද යත්,

මේ සසුනෙහි මහණ තෙම උපන් කාමවිතර්ක නොඇලේද, අත්හරීද, දුරුකළේද? නැතිකළේද? අභාවයට පමුණුවාද, උපන් ව්‍යාපාද විතර්ක නොඇලේද, අත්හරීද, දුරුකළේද? නැතිකළේද? අභාවයට පමුණුවාද, උපන්නාවූ විහින්සා විතර්කයෙහි නොඇලේද, අත්හරීදී, දුරුකළේද? නැති කළේද? අභාවයට පමුණුවාද, උපන් ව්‍යාපාද, විතර්ක, නොඇලේද, අත්හරීද, දුරුකළේද? නැතිකළේද? අභාවයට පමුණුවාද, උපන්නා වූ විහින්සා විතර්කයෙහි නොඇලේද, අත්හරීද, දුරුකළේද? නැතිකළේද? අභාවයට පමුණුවාද, උපනුපන්, පවිටු අකුසල ධර්මයන්හි නොඇලේද, අත්හරීද, දුරුකළේද? නැතිකළේද? අභාවයට පමුණවාද,

ආනන්ද මේ **ප්‍රහාණසංඥාය'යි** කියනු ලැබේ.

ආනන්දය, විරාගසංඥා කවරේද යත්,

ආනන්දය, මේ සසුනෙහි මහණතෙම ආරණ්‍යගත වූයේ හෝ වෘක්ෂමූලයකට ගියේය හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ මෙසේ සිතයි.

මෙය ශාන්තය. මෙය ප්‍රණීතය. යම් මේ සියළු සංස්කාරයන්ගේ සංසිඳීමය, සියළු කෙලෙසුන්, භවභෝග සම්පත් දුරලීමය. තෘෂ්ණාව ක්ෂයකිරීමය. නොඇලීමය. නිර්වාණයයනුයි.

ආනන්දය, මේ **විරාගසංඥාවය'යි** කියනු ලැබේ.

ආනන්දය, නිරෝධසංඥාව කවරේද යත්,

ආනන්දය, මේ සසුනෙහි මහණ තෙම ආරණ්‍යගත

වූයේ හෝ වෘක්ෂමූලකයට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ මෙසේ සිතයි.

ආනන්දය, මේ සසුනෙහි මහණ තෙම ආරණ්‍යගතවූයේ හෝ වෘක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ මෙසේ සිතයි.

මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, යම් මේ සියළු සංස්කාරයන්ගේ සංසිඳීමය, සියළු කෙලෙසුන්, භවභෝග සම්පත් දුරලීමය. තණ්හාව ක්ෂයකිරීමය. නිරෝධය නිර්වාණය යනුයි.

ආනන්දය, මෙය **නිරෝධසංඥාවය'යි** කියනු ලැබේ.

ආනන්දය, මුළු ලොව නොඇලීමේසංඥාව කවරේද යත්,

ආනන්දය, මේ සසුනෙහි මහණ තෙම ආරණ්‍ය ගතවූයේ, රුක්මූල, ශූන්‍යාගාරගතවූයේ, ලෝකයෙහි තෘෂ්ණා දෘෂ්ටියයි. කියනලද යම් උපාදානයෝ වෙත්ද? කාමඋපාදානාදී, උපාදානයෝවෙත්ද, යම් උපාදාන කෙනෙක්වෙත්ද, සිත පිළිබඳ පිහිටියාවූ, සිතෙහි ඇතිකරගත් දැඩි රාගික අරමුණුවෙත්ද, අල්ලාගත් ශාස්වත, අශාස්වත, ඇත්තේය, නැත්තේය, වශයෙන් ඇතිකරගත්, කෙලෙස්වෙත්ද, දෘෂ්ඨීන්වෙත්ද ඔවුන් පහකරමින් නොග නිමින්, නොඇලේද,

ආනන්දය මුළුලොවෙහි මෙය **අනභිරථසංඥා'යි** කියනු ලැබේ.

ආනන්දය සියළු සංස්කාරධර්මයන්හි අනිත්‍ය සංඥාව කවරේද යත්,

ආනන්දය, මේ සසුනෙහි මහණ තෙම සියළු සංස්කාර ධර්මයන් කෙරෙන් පීඩාවට පත්වේද, ලැජ්ජාවේද, පිළිකුල් කෙරේද, හැගීම්කෙරෙන් බැහැරවෙයිද?

ආනන්දය, මේ සියළු සංස්කාර ධර්මයන් කෙරෙහි **අනිච්චසංඥවය'යි** කියනු ලැබේ.

ආනන්දය, ආනාපාන සතිය කවරේද?

ආනන්දය, මේ සසුනෙහි මහණ තෙම ආරණ්‍යගතවූයේ හෝ වෘක්ෂමූලගතවූයේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ පලක්බැඳ සෘජුව, උඩුකය ඇදනැතිව මනාව පිහිටුවාගෙන, අරමුණෙන් සිහියඑළවා හිදීද, ඒ මහණ තෙම සිහි ඇත්තේම, ආශ්වාසකෙරේද, සිහි ඇත්තේම ප්‍රශ්වාසකෙරේද, දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රශ්වාසකරමියි දනියි. කෙටිව ආශ්වාස කරන්නේ'යි දනියි. කෙටිව ප්‍රශ්වාස කරන්නේ හෝ ලුහුඩු කොට ප්‍රශ්වාස කරන්නේ ය'යි දනියි. සියලු ආශ්වාස කය දන්නේ ආශ්වාසකෙරෙමි'යි හික්මෙයි. සියලු ප්‍රාශ්වාස කය දන්නේ, ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.

කාය සංස්කාරය හෙවත් ආශ්වාසය සංසිඳුවන්නෙමි. ආශ්වාසකරමි'යි හික්මෙයි. කාය සංස්කාරය හෙවත් ප්‍රශ්වාසය සන්සිඳුවන්නෙමි. ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි. ප්‍රීතියවිඳිමින් ආශ්වාස කරමි'යි. හික්මෙයි. ප්‍රීතියවිඳිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි. සුවවිඳිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. සුවවිඳිමින් , ප්‍රශ්වාස කරෙමි'යි හික්මෙයි.

චිත්තසංස්කාර විඳිමින්, ආශ්වාස කරමි'යි හික්මෙයි. චිත්තසංස්කාර, සන්සිඳුවන්නෙමි, ආශ්වාස කරමි'යි හික්මෙ'යි. චිත්තසංස්කාරයන් සන්සිඳුවන්නෙමි ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි. සිත් පහළකරමින් ආශ්වාස කරමි'යි. හික්මෙ'යි. සිත් පහළකරමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙ'යි. සමථ විදර්ශනා දෙකින් සිත ඉතාසතුටුකරමින් ආශ්වාස කරන්නේයැ'යි හික්මෙයි. සමථ විදර්ශනා දෙකින් සිත ඉතාසතුටුකරමින් ප්‍රශ්වාස කරන්නේයැ'යි හික්මෙයි. ආශ්වාසයෙහි (අරමුණෙහි) සිත පිහිටුවන්නෙමි, ආශ්වාස කරමිය'යි හික්මෙයි. ප්‍රශ්වාසයෙහි (අරමුණෙහි) සිත පිහිටුවන්නෙමි ප්‍රශ්වාසකරමිය'යි හික්මෙයි.

නීවරණයන්ගෙන් සිත මුදන්නෙමි, ආශ්වාස කෙරෙමි'යි හික්මෙයි. නීවරණයන්ගෙන් සිත මුදන්නෙමි, ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි. අනිත්‍යලක්ෂණ නැවත නැවත දකින්නේ, ආශ්වාස කරමි'යි. හික්මෙයි. අනිත්‍යලක්ෂණ නැවත නැවත දකින්නේ, ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි. විරාගය නැවත නැවතදකින්නේ, ප්‍රශ්වාස කරමි'යි. හික්මෙයි. නිරෝධය නැවත නැවතදකින්නේ, ආශ්වාස කරමි'යි හික්මෙයි. විරාගය නැවත නැවතදකින්නේ, ආශ්වාස කරමි'යි හික්මෙයි. නිරෝධය නැවත නැවතදකින්නේ, ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි. කෙලෙසුන්ගෙන් මිදීම, නැවත නැවතදකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. කෙලෙසුන්ගෙන් මිදීම. නැවත නැවතදකිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.

ආනන්දය මෙය **ආනාපානසතියයැ'යි** කියනු ලැබේ.

ආනන්දය, ඉදින් වනාහි ඔබ ගිරිමානන්ද, භික්ෂුනම වෙත එළඹ, මේ දසසංඥාවන් කියන්නෙහිනම්, ගිරිමානන්ද භික්ෂු, මේ දසසංඥාවන් අසා, ඒ ආබාධ තෙම වහා සන්සිඳෙන්නේය.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ දසසංඥාවන් උගෙන, ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂු නමට, මේ දසසංඥාවන් වදාළේය.

ඉක්බිති, ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂුනමගේ, ඒ ආබාධය මේ දසසංඥාවන් අසා වහා සන්සිඳුනේය.

ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙමේද, ඒ ආබාධයෙන් නැගීසිටියේය. ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂුනමගේ ආබාධය එළෙසින් සුවවිය.

මෙහිදී වරදවා නොගතයුතු කාරණයකි. දසසංඥා මෙනෙහිකිරීමේදී ඒවායේ අනිත්‍ය, දුඃඛ, අනාත්ම, ස්වභාවයන් ප්‍රත්‍යක්ෂකර මඟඵල ලබාසිටි හෙයින්ම, ගිරිමානන්ද භික්ෂුන් වහන්සේට. එම දසසංඥාවන් මෙනෙහි කිරීමෙන්. තමන්තුළ පැවති, ආබාධයන් ගෙන් මිදී, නැගීසිටිය හැකිවූබවක් වටහාගත යුතුය.

එසේ නොමැතිව, සියළු පෘථග්ජනයින්හට, තමන් ප්‍රත්‍යක්ෂකොට නොමැති ධර්මයන්, ධර්මය සිහිකිරීමෙන් පමණක්ම - අවිදුඅඳුරෙහි ගැලෙමින් සිටියදී සියළු ආබාධයන් දුරුකළ හැකිබවක් මෙහිලා නොකියැවෙන්නේමය. ඒ බැව් අවබෝධනොකොට - වෙනත් මුලාවන් ඇතිකර නොගතයුතුය. වෙනත් මුලාවකට පත්නොවිය යුතුය. සිදුවියයුත්තේ, දස

සංඥාවන් පිළිබඳ ප්‍රත්‍යක්ෂඥානය වැඩීමය. ඒ ඔස්සේ ආබාධයන් දුරුකළහැකි තත්ත්වයකට පත්වීමය. ප්‍රඥාව වැඩීමය.

## කරජකප

මේ සිරුර මගේ යැ'යි කියාගන්නා කවරකුහට හෝ සිරුර තුළ පවතින එකද ලේ බිංදුවක් තමන්ගේ අභිමතය පරිදි සැකසිය හැකිද? නිර්මාණයකළ හැකිද? සංසරණය කරවිය හැකිද?

කරජකය, ශරීරය, වශයෙන් හඳුන්වනු ලබන ස්කන්ධයෙහි, ස්වභාවයන් අනුවම, ඒ හා ස්වභාවයන් පවත්නේය. සත්‍ය ස්වභාවයනම් වෙනස්වීමය.

අණ්ඩයක් හා ශුක්‍රාණුවක් එක්වීමෙන් පිණ්ඩයක් ඇතිවිය.

පිණ්ඩය, වෙනස්වෙමින්, කළලයක් විය.

කළලය, වෙනස්වීමෙන් බිළිදෙකු ඇතිවිය.

බිළිඳා, වෙනස්වීමෙන් දරුවෙකු ඇතිවිය.

දරුවා වෙනස්වීමෙන් යෞවනයකු ඇතිවිය.

යෞවනයා, වෙනස්වීමෙන්, පැසුණු පුද්ගලයකු ඇතිවිය.

පැසුණු පුද්ගලයා, වෙනස්වීමෙන්, මහල්ලෙකු ඇතිවිය.

මහල්ලා, වෙනස්වීමෙන්, වයෝවෘද්ධයෙකු ඇතිවිය.

එයද වෙනස්වීමෙන්, දිරාපත්වීමෙන්, මියයෑමනම් වූ සම්මුති මරණ ස්වභාවයට පත්වන්නේය.

කරජකය - ශරීරයනම්වූ ස්කන්ධය දිරාපත්වී විනාශවී යන්නේය. මෙහි නාමවශයෙන් දැක් වූ ස්වභාවයන් පමණක්නොව, ස්කන්ධයට හේතුභූතවූ සියළුම ස්වභාවයෝ, වෙනස්වීමේ ස්වභාවයටම යටත්වී එහි යථා ස්වභාවයන්ම දක්වන්නේය.

එහි අයිතියක්, ස්වභාවයේ ක්‍රියාවනටම මිස, අන් කවරෙකු හෝ සතුනොවන්නේමය. ස්වභාවයන්ගේ එවන් ස්වභාවයන් අවබෝධකර නොගැනීම අවිද්‍යාවයි. මුලාවයි.

මුලාවෙහි ගැලෙමින්, මමය, මගේය, වශයෙන් මමායනයෙහි ගැලීම, භවයේ පැවැත්මට හේතුකාරකවන්නේය. එහි නිමාවක් දැකියහැකි නොවන්නේය. සැබැවින් නොමැති, විවිධ ස්කන්ධයන් කෙරෙහි සංස්කාරයන් මවමින්, නාමරූප පවත්වමින්, නැත්තාවූ ස්වභාවයන් ඇත්තාසේ ගනිමින්, පෘථග්ජන සත්ත්වයා ගමන්කරනුයේ, අන්ධකාරයෙන් අන්ධකාරයටමය.

## වේදනානුපස්සනාව

පිංවත් මහණෙනි, සද්ධර්මය අවබෝධකරනු කැමති භික්ෂුව, වේදනාවන් කෙරෙහි, එම වේදනාවන් පිළිබඳ අවබෝධයෙන් දකිමින් වාසයකරන්නේ කෙසේද?

මේ කරුණෙහිලා, භික්ෂුව කායිකව හෝ මානසිකව සැපවේදනාවක් විඳිනා විටදී, සැපවේදනා ස්වභාවයක් පවතින බව මනාකොට දැනගනියි.

ඉදින් කායිකව හෝ මානසිකව දුක්වේදනාවක් විඳිනාවිටදී, දුක්වේදනා ස්වභාවයක් පවතින බව, මනාකොට දැනගනියි.

ඉදින් කායිකව හෝ මානසිකව දුක් නැති, සැප නැති, මධ්‍යස්ථවේදනාවක් විඳින විටදී, දුක් නැති, සැප, නැති, මධ්‍යස්ථවේදනා ස්වභාවයක් පවතින බව, මනාකොට දැනගනියි.

පිංවත් මහණෙනි, ජීවිතය යනු කුමක් දැ'යි සද්ධර්මයතුළින් අවබෝධනොකළ පෘථග්ජන ලෝකයා, දුක්වේදනා ස්වභාවයක් දැනුණුකල, ශෝකකරයි. ක්ලාන්ත වෙයි. වැළපෙයි. පපුවෙහි අත්ගසා ගනිමින් හඬයි. සිහිමුලාවෙයි. හෙතෙම වේදනා දෙකක් විඳියි. කායික වශයෙන් විඳිනවේදනාව මෙන්ම මානසික වශයෙන් විඳිනවේදනාවත්ය.

පිංවත් මහණෙනි, සත්ත්වයෙකුට හුලකින් විද්දා ය'යි සිතමු. ඔහුගේ හුල්පහර කෑ තැනටම දෙවැනි හුලකිනුත් විඳිනවානම්, ඔහු හුල්පහර දෙකින්ම වේදනාවිඳියි.

පිංවත් මහණෙනි, පෘථග්ජන මනුෂ්‍යයාගේ දුක් විඳීම, කායිකව හා මානසිකව දෙකින්මවේ. ඔහුතුළ, තමා දුක්විඳිනවිට, බලවත් තරහක් ඇතිවේ. එවිට චිත්තාභ්‍යන්තරයේ මුල්බැසගෙන තිබෙන, ද්වේශය මතුවන්නට පටන්ගනී. ඔහු දුක්විඳිමින්ම, දුකින්මිදීම පිණිස, දුක අමතකකිරීම පිණිස, කාමසැපය, පිළිගනී. එවිට ඔහුගේ චිත්තාභ්‍යන්තරයේ, මුල්බැසගෙන තිබෙන

ආශාවන්, මතුවන්නට පටන්ගනී. පෘථග්ජන මනුෂ්‍යයා හට එසේ සිදුවන්නේ ඇයි.?

පිංවත් මහණෙනි, ඔහු දුකින්මිදීමට උපක්‍රම සොයනවිට, කාමය වැළඳගැනීම හැර අන්කිසිවක් ඔහු නොදනී. ඔහු වේදනාවන්ගේ හටගැනීම හෝ අභාවයට පත්වීම හෝ එහි ආස්වාදය හෝ එහි ඇතිපීඩාකාරී බව හෝ ඒ කෙරෙහිඇති ඇල්මෙන්මිදීම හෝ හරියාකාර ලෙසින්, අවබෝධයකින් නොදනී.

ඒ නිසාම, ඔහු සැප, දුක්, විඳින විට, චිත්තාභ්‍යන්තරයේ මුල්බැසගත් රාගය මතුවේ. දුකක් විඳිනවිට, චිත්තාභ්‍යන්තරයේ මුල්බැසගත් ද්වේශය මතුවේ. මධ්‍යස්ථ තත්ත්වයක් විඳිනවිට, චිත්තාභ්‍යන්තරයේ මුල්බැසගත් මුලාව මතුවේ. එහෙයින් ඔහු මමය, මගේය, මට අයිතිය, වශයෙන් ග්‍රහණයකරගෙනම එම වේදනාවන් හා සිතෙන් එක්වීමෙන් සැප දුක විඳින්නේ.

එහෙයින්, පිංවත් මහණෙනි, ජීවිතය යනු කුමක්දැ'යි සද්ධර්මයතුළින් අවබෝධනොකර පෘථග්ජනයා ලෝකය, උපත හා එකතු වී, ජරා මරණ හා එකතු වී ශෝක කිරීම්, වැළපීම් කායික - මානසිකදුක් හා එකතු වී සිටින්නේයැ'යි කියනු ලැබේ. ඔහු සියළු දුක් හා එකතුවී සිටින්නෙකැ'යි කියමි.

එහෙත් පිංවත් මහණෙනි, ජීවිතය යනු කුමක්දැ'යි සද්ධර්මය තුළින් පූර්ණවශයෙන් අවබෝධකළ, තථාගත ශ්‍රාවකයාහට, දුක්වේදනා ලැබෙයි. එවිට ඔහු ශෝක නොකරයි. ක්ලාන්ත නොවේ. නොවැළපේ. පපුවෙහි

අත්ගසා නොගනී. සිහිවිකල් නොවේ. ඔහු විඳින්නේ එකම කායිකවේදනා ස්වභාවයක් පමණි. මානසික වේදනා ඔහුට නැත්තේය.

පිංවත් මහණෙනි, මනුෂ්‍යයෙකුහට හුලකින් විද්දා ය'යි සිතමු. ඔහුගේ හුල්පහර කැතැනටම දෙවැනි හුලකින් නොවිදිත්නම්, ඔහු විඳිනුයේ එකම එක වේදනා ස්වභාවයක් පමණි.

පිංවත් මහණෙනි, ජීවිතය පිළිබඳ අවබෝධය පරිපූර්ණවූ තථාගත ශ්‍රාවකයා අන්න එබඳු කෙනෙක් යැ'යි කියමි. එයට හේතුව කුමක්ද?

එම ශ්‍රාවකයා වේදනාවන්ගේ හටගැනීමත්, අභාවයට පත්වීමත්, ආස්වාදයත්, ආදීනවයත්, එම වේදනාවන් කෙරෙහි ඇති ඇල්ම දුරුවීමත්, හරියාකාරව අවබෝධයක් තුළින් දැනසිටි හෙයිනි.

(සල්ල සූත්‍රය - සංයුක්ත නිකාය)

පිංවත් මහණෙනි, සතර සතිපට්ඨානයේ මනාව සිහිය යොමුකරගත්, කෙලෙසුන් දුරුකිරීමේ නුවණින්යුතුවූ භික්ෂුව, මේ ජීවිතයේදීම (මේ ජාතියේදී) පිරිනිවන්පෑමේ අරමුණින් කාලය ගතකළ යුතුය යන කාරණය පෙරමුණු කරගත යුතුය. පිංවත් මහණෙනි, ඔබලා හට අපගෙන් ලැබෙන ධර්මානුශාසනයයි.

පිංවත් මහණෙනි, ඒ ආකාරයට සතර සතිපට්ඨානයට සිහිය මනාව යොමුකොට, කෙලෙසුන් දුරුකිරීමේ නුවණින් යුතුව, අප්‍රමාදීවෙමින් (බාහිර) වැඩවලින්, කථාබහෙන්,

අනවශ්‍ය කල්පනාවෙන්ද වැළකී) කෙලෙස්දුරුකිරීමේ වියෑීයෙන් යුතුව වාසය කරනවිට, (ඇස - හෝ කන හෝ නාසය හෝ දිව හෝ කය හෝ සිත හෝ මුල් කොට) සැප හෝ දුක වේදනාවක් උපදී. එවිට ඒ භික්ෂුව එම වේදනාවන් ගැන තේරුම් ගන්නේ මෙසේයි.

"මේ දැන් හටගන්නේ වේදනා ස්වභාවයකි. මේ වේදනාව හේතුසහිතව හටගත් දෙයකි. හේතුරහිතව නොවේ. මේ වේදනාව හටගත්තේ කුමන හේතුවක් ප්‍රත්‍යයක් නිසාද?

මේ ස්පර්ශයම නිසාය.

කුමක්ද, ස්පර්ශය නමින් හඳුන්වන්නේ?

ෂඩායතනයන්, ඇස, කන, නාසය, දිව, ශරීරය, සිත හෙවත් මනස යන ආයතනයනට අරමුණුවන, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, සිතුවිලි, යන හයත් විඥාණයත් සමඟ සම්බන්ධවීමය.

ඇසද, රූපයද, එය සිතෙන් දැනගැනීම හෙවත් චක්ඛු විඥාණයද, එකතුවීම ම ඇස පිළිබඳ රූප ස්පර්ශයයි.

කනද, ශබ්දයද විඥාණයද එකතුවීම, ශබ්ද හඳුනාගැනීම් සිත් හෙවත් ශබ්ද විඥාණයයි. ශබ්ද ස්පර්ශයයි.

නාසයද, ගන්ධයද, විඥාණයද එකතුවීම, ගන්ධ සුවඳ හඳුනාගැනීම් සිත් හෙවත් ගන්ධ විඥාණයයි. ගන්ධ ස්පර්ශයයි.

දිවත් - රසයත් විඥාණයත් එකතු වීමෙන් ඇතිවන රස විඥාණයයි. රස ස්පර්ශයයි.

කයත් කය හා ගැටෙන පහසත් විඥාණයත් එකතු වීමෙන් ඇතිවන, කාය විඥාණයයි. කාය ස්පර්ශයයි.

සිත - සිතුවිලි විඥාණයත් එකතුවීමෙන් ඇතිවන චෛතසික විඥාණයයි. මනෝවිඥාණයයි. සිතෙහි ස්පර්ශයයි.

එහෙයින් මේ ස්පර්ශයන් නිසාම, වේදනාවන් නම් නාමරූප ස්වභාවයන් හටගන්නේ වෙයි. මේ ස්පර්ශය වනාහි අනිත්‍ය දෙයකි. දුක පිණිස පවතින්නාවූ, හේතු ඵල දහමින් සකස්වුණ දෙයකි.

මේ වෙනස් වී යන, අනිත්‍යවූ සංඛත හේතුඵල දහමින් සකස්වූ හටගන්නාවූ, ස්පර්ශය නිසා හටගත් සැප හෝ දුක උපේක්ෂා වේදනාවන් කෙසේනම් වෙනස්නොවී පවතින්නේද?

ධර්මාවබෝධයෙන් යුත් භික්ෂුව හෝ විනිර්මුක්ත පුද්ගලයා, ස්පර්ශයෙහිද, සැපවේදනාවෙහිද, දුක්වේදනාවෙහිද, උපේක්ෂා වේදනාවෙහිද, යථා ස්වභාවයන් යථා, යථාකාරයෙන්ම තථා, තථා, පරිදි අවබෝධකරයි. (අනිච්ඡානු පස්සීව) වාසය කරයි.

ස්පර්ශයන් වැනසී යන ආකාරයන්ද, අවබෝධයෙන්ම දකිමින් (වයානුපස්සීව) වාසය කරයි.

ස්පර්ශය කෙරෙහි ඇතිවන ඇල්ම දුරුවීයන ආකාරයද, අවබෝධයෙන්ම (විරාගානුපස්සී) දකිමින් වාසය කරයි. පහළවුනා වූ ස්පර්ශයන්ද, ඒවා කෙරෙහි මතුවුණාවූ ඇල්මද, නිරෝධවීයන ආකාරයන් (නිරෝධානුපස්සී) අවබෝධයෙන්ම දකිමින් වාසය කරයි.

මේ ආකාරයෙන් වාසය කර විට, ස්පර්ශය කෙරෙහි මෙන්ම වේදනාවන් ලෙසින්, චිත්තාභ්‍යන්තරයෙහි මුල් බැසගත් ආශාවන් (රාගානුශය) ප්‍රහීනවෙයි. ස්පර්ශය කෙරෙහි මෙන්ම වේදනාවන් කෙරෙහි, චිත්තාභ්‍යන්තරයෙහි මුල් බැසගත් ද්වේශය (පටිගානුසය) ප්‍රහීනවේ. ස්පර්ශයෙන් මෙන්ම වේදනාවන් කෙරෙහි, චිත්තාභ්‍යන්තරයේ මුල් බැසගත් මුලාවන් (අවිජ්ජානුසය) ප්‍රහීනවෙයි"

ධර්මාවබෝධයෙන් යුතු භික්ෂුව හෝ විනිර්මුක්ත පුද්ගලයා දුක, සැප, උපේක්ෂා, වශයෙන් කවර හෝ වේදනාවක් ලබයි නම්, තමන්තුල ඇතිවූ අවබෝධ ඥාණය තුළින්, ඒ වේදනාව, වේදනාවක් ලෙස නොදකියි. ස්පර්ශයම දකියි. ඒ ස්පර්ශයත්, වෙනස්වන දහමට අයිති, අනිත්‍යදේ බැව් මනාකොට දැනගනියි. ඒ වේදනාවන ස්පර්ශයට, තමා තවදුරටත් වසඟ නොවනබව මනාකොට දැනගනියි. එම වේදනාවන්, ස්පර්ශයන්, කිසිවක් සංස්කාර වශයෙන් නාමරූපයන්හිලා පිළිනොගන්නා බවද, මනාකොට දැනගනියි. ධර්මාවබෝධයෙන් යුතු භික්ෂුව හෝ විනිර්මුක්ත පුද්ගලයාහට, සැප, දුක්, උපේක්ෂා, ස්පර්ශ, පහළවන නමුදු ඒවායින් සසළ වීමෙන් තොරව නිරාමිසව වාසය කරයි.

ධර්මාවබෝධයෙන් යුතු භික්ෂුව හෝ විනිර්මුක්ත පුද්ගලයා, සක්කායදිට්ඨි "කය" පවතිනතාක් පමණක්ම, වේදනාවන්, ස්පර්ශයන්, පවතිනබව මනාකොට, අවබෝධයෙන් දැනගනියි.

පිංවත් මහණෙනි, තෙලුත්නිසා, වැටියත්නිසා, දැල්වෙන පහනක්ගැන සිතමු. ඒ පහනෙහි තෙලුත්,

වැටියත්, අවසන් වූවිට, තවදුරටත් දැල්වීම පිණිස ආහාර නැති නිසා පහන නිවියයි.

අන්න ඒ ආකාරයෙන්ම පිංවත් මහණෙනි, වේදනාවන් කෙරෙහි ඇති අවිද්‍යාවත්, තණ්හාවත් දුරුකොට සසරින් මිදුන, භික්ෂුව විඳිනවේදනා විඳින්නේ, "කය" පවතින තෙක්ම පමණක්බව මනාකොට දැනග නියි. "කය" බිඳීයෑමෙන් (සක්කාය දුරුවීමෙන්) සිතින් පිළිනොගන්නා ලද, ඒ සියළු වේදනාවන් භව පැවැත්මට හේතු ආහාර නොමැති බැවින්) මෙහිදීම නිරෝධවී යන බැව් මනාකොට දැනගනියි."

(දුතිය ගේලඤ්ඤ සුත්ත)

පිංවත් මහණෙනි, වේදනාවයනු කුමක්දැ'යි හරියාකාරව අවබෝධයක් නැති තැනැත්තාහට, සැපක් විඳිනවිට ඒ කෙරෙහි රාගයම ඇතිවෙයි. එයින් නිදහස් වීමක්ගැන නොදනියි.

වේදනාවයනු කුමක් දැ'යි හරියාකාර අවබෝධයක් නැති තැනැත්තාට, දුකක් විඳිනවිට ඒ කෙරෙහි සිතෙහි ස්වේශයම ඇතිවෙයි. එයින් නිදහස්වීමක්ගැන නොදනියි.

මධ්‍යස්ථ වේදනාවක් පවා, යමෙක් පිළිගන්නේනම් ඔහු දුකින් නිදහස් නොවේ.

එහෙයින් යම් කලෙක, යමෙකු කෙලෙස් තවන වියෑයෙන්ද, කෙලෙස් ප්‍රහාණයට යොමුකළ නුවණින්ද යුතුවන්නේද? ඒ බුද්ධිමත් තැනැත්තා, සියළු වේදනාවන්ගේ, යථා තත්වයන්, ඒ ඒ ආකාරයෙන්ම, අවබෝධකර ගනියි.

මෙසේ ඒ තැනැත්තා වේදනාවන්ගේ යථා තත්ත්වය හරියාකාරලෙස අවබෝධ කරගැනීම නිසා, තමා ජීවත්ව සිටියදීම, නිකෙලෙස් භාවයට පත්වෙයි. සද්ධර්මයේ පිහිටි ඒ ප්‍රඥාවන්තයා කිසිදු ව්‍යවහාරයකට ඇතුළුනොවී, කයබිඳීයාමෙන් පිරිනිවීමට පත්වේ"

(පහාණසුත්ත සං.නි)

තථාගතයන් වහන්සේ වේදනාවන්ගේ හටගැනීම පිළිබඳව මෙසේ උපමාවන්ගෙන් පෙන්වා දෙති.

පිංවත් මහණෙනි, අහසෙහි නොයෙක් ක්‍රමයට සුළංහමනවා. පෙරදිගින් සුළංහමනවා. බටහිරින් සුළංහමනවා. උතුරින් සුළංහමනවා. දකුණින් සුළංහමනවා. දූවිලිසහිතව සුළංහමනවා. දූවිලිරහිතව සුළංහමනවා. සීත සුළංහමනවා. උෂ්ණසුමට සුළංහමනවා. මඳසුළං හමනවා. සැඩසුළං හමනවා.

පිංවත් මහණෙනි, මේ වේදනාවන්ද, අන්න ඒ වගෙයි. මේ කයෙහි නොයෙක් ආකාරයේ වේදනා උපදිනවා. සැපවේදනා ඇතිවෙනවා. දුකවේදනා ඇතිවෙනවා. මධ්‍යස්ථවේදනා ඇතිවෙනවා.

(අකාස සුත්ථ - සං.නි)

පිංවත් මහණෙනි, ඔය සැප, දුක, උපේක්ෂා යන වේදනාතුනම හටගන්නේ ස්පර්ශයෙනි. ස්පර්ශය මුල්කොට ගෙනය. ස්පර්ශය නිදානකොට ගෙනය. ස්පර්ශයම හේතුකොට ගෙනය.

ඉතින් පිංවත් මහණෙනි, සැපවේදනා ඇතිවන ස්පර්ශයේ ආකාරය නිසයි, සැපවේදනා හටගන්නේ.

සැපවේදනාව ඇතිකරවන ස්පර්ශය නැතිවූ විට, ඒ නිසා හටගත් සැප වේදනාවන් නැතිවී යයි.

ස්පර්ශයේ ආකාරය නිසයි දුකවේදනාවන් හටගන්නේ. දුකවේදනාවන් ඇතිකළ ස්පර්ශය නැතිවූ විට, ඒ නිසා හටගත් දුකවේදනාවන් නැතිවී යයි.

ස්පර්ශයේ ආකාරනිසයි මධ්‍යස්ථවේදනාවන් හටගන්නේ. මධ්‍යස්ථවේදනාවන් ඇතිකළ ස්පර්ශය නැතිවූ විට, ඒ නිසා හටගත් මධ්‍යස්ථවේදනාවන් නැතිවී යයි"

පිංවත් මහණෙනි, සැපවේදනාවේත්, මධ්‍යස්ථ වෙදනාවේත්, දුක්වේදනාවේත්, තිබෙන්නේ ස්පර්ශයම මූලිකකොට ගත් ඔය තත්ත්වයන්මය.

(ඵස්සමූලක සුත්ත - සං.නි)

සද්ධර්මය අවබෝධ කළ භික්ෂුව හෝ විනිර්මුක්ත පුද්ගලයා, ස්පර්ශය හටගැනීමෙන් වේදනාවන් හටගන්නා ආකාරයත්, අවබෝධයෙන්ම දකිමින්, වේදනාවන් පිළිබඳ සිහියෙන් (වේදනානුපස්සනාවෙන්) වාසය කරයි. ස්පර්ශයන් නිරුද්ධවීයාමෙන්, වේදනාවන්ද නිරුද්ධවීයන ආකාරයන් පිළිබඳව, වේදනානුපස්සනාවෙන් යුතුව වාසය කරයි.

ස්පර්ශයනිසා හටගන්නාවූ සංඛත ධර්මයන් වශයෙන් පවත්නා, අනිත්‍යවූ දුකවූ අනාත්මවූ වේදනා හෙවත් විඳීනස්වභාවයක් තිබේ යැ'යි. සද්ධර්මය අවබෝධකළ ඒ ශ්‍රාවකයාහට වේදනාවන් පිළිබඳ මනාවයොමුකළ සිහිය බලවත්ව පිහිටියේ වෙයි.

එසේ වේදනානුපස්සනාවේ මනාවපිහිටි සිත තවදුරටත්, අවබෝධඥාණය දියුණුවීම පිණිසම පවතී. බලවත් සිහිය දියුණුවීම පිණිසම පවතී. ස්පර්ශයෙන් හටගත් වේදනාවන් කෙරෙහි කවරලෙසකින් හෝ ග්‍රහණය නොවෙමින්, ලෝකයේ කිසිවක්, කිසිම පිළිවෙලකින් ග්‍රහණය කරනොගනී. මේ ආකාරයෙන් ධර්මාවබෝධයෙන් යුතු භික්ෂුව හෝ විනිර්මුක්ත පුද්ගලයා එම වේදනාවන්ගේ, යථා, යථා, ස්වභාවයන් තථා, තථා, පරිද්දෙන් දකිමින් ඒවායේ නොගැලෙමින්, නොගැටෙමින් අවබෝධයෙන් යුක්තව වාසය කරයි.

## චිත්තානුපස්සනා

සිතවනාහි හේතුඵලදහමින් හටගන්නා ධර්මතාවයකි. වෙනස්වීම උරුමකොට ගත් ධර්මතාවයකි. සිතක හටගැනීමට මුල්වූ කරුණ නැතිවීමෙන්, එම සිත නැතිවීයයි. එයයි සිතකඇති සාමාන්‍ය ස්වභාවය.

සිතක් ඉබේ හටනොගනී. සිත හටගන්නේ නාමරූපප්‍රත්‍යයෙන් බව අපි දනිමු. නාම යනු, ඵස්ස, වේදනා, සංඥා, චේතනා, මනසිකාර යන පසය.

රූප යනු සතර මහා ධාතුන්ගෙන් සකස්වුන දේය. රූප වේදනා, සංඥා, සංස්කාර විඥාණයෝය.

නාමරූප තේරුම්ගැනීම පිණිස, වෙන්වෙන්ව කතාකරන නමුදු මේ එකකුදු වෙන්වෙන්ව පවතිනුයේ නොවේ. ඒකරාශී ගතව පවතිනුයේවේ. එහෙයින්ම ස්කන්ධ වශයෙන් ගැනේ.

මේ නාමරූපයන් තුළිනි, සිතක් හටගන්නේ, මේ සිතවනාහි, කුසල් - අකුසල් සැමදෙයකටම මුල්වන බව සැබෑය. එහෙත් හේතූන්ගෙන් තොරව හටගන්නා - තනිව පවතින - චුතවන සුවිශේෂී සිතක් නොමැති බව තේරුම්ගෙන සිටීම නම් වැදගත්වේ.

නාමරූපයන්ගේ හටගැනීමෙන් සිතක හටගැනීම, සිදුවන්නේ, නාමරූප නිරුද්ධවීමෙන් සිතද නිරුද්ධවී යන්නේය."

(සමුදය සුත්ත - සං.නි)

බාහිර ලෝකයේ අනිත්‍යතාව විස්තරකරන සූත්‍ර දේශනා, අයෝනිසෝමනසිකාරයෙන්, ලෝකචින්තන බවට හරවාගන්නේ නැතිව, යෝනිසෝමනසිකාරයෙන් ඒවා අපගේ අධ්‍යාත්මය දෙසටම හරවාගෙන මේ ජීවිත නාට්‍යයේ ඇති නිස්සාරත්වය තේරුම්ගත යුතුව තිබෙනවා.

කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු (නිවනේ නිවීම)

මහණෙනි, මේ අකුසලවිතර්ක තුනක් ඇත. කාමවිතර්කය, ව්‍යාපාදවිතර්කය, විහිංසාවිතර්කය. මහණෙනි, මේ අකුසලවිතර්ක තුන කොතැනක හෝ නිරවශේෂ වශයෙන් නිරුද්ධවෙත්ද? සතර සතිපට්ඨානයෙහි මැනවින් පිහිටි සිත්ඇතිව වාසයකරන්නාහුට හෝ අනිමිත්ත සමාධිය වඩන්නාහුට හෝය. කෙතෙක්ද යත් මහණෙනි, මේ කාරණයම ඇති - ඔයඇති අනිමිත්ත සමාධියවඩන්න. අනිමිත්ත සමාධිය වඩනලද කල්හි, බහුල වශයෙන් කරනලදකල්හි, මහත්ඵල මහනිසංසවේ.

(කන්ද සංයුක්තය)

"යම් කෙනෙක් මේ පංචස්කන්ධය තමාවශයෙන් නොව, අනුන්වශයෙන් බලත්ද? ඔව්හු අශ්වලෝමයක් ඊතලයකින් විදින්නාක්මෙන් සියුම්වූ නිර්වාණධාතුව පිළිබඳදකිත්, ප්‍රතිවේදකරත්, විනිවිදදකිත්.

(මහ මොග්ගල්ලාන ථෙර ගාථා)

හේතුන්ගෙන් හටගත්, බිඳීයන ස්වභාවයඇති මේ සංස්කාරයන් අනුන් වශයෙන්දැක සියළුම ආශ්‍රවයන් ප්‍රහාණය කළෙමි. සිහිල්වූවා වෙමි. නිවුනෙමි.

(සකුලා ථෙර ගාථා)

## සසර තරණය

මහණෙනි, කර්කශවූ, දුෂ්කරවූ එක්තරා භූමියක වෙසෙන තැනැත්තෙකි. හේ නිරන්තරයෙන්ම එම භූමිය අසලින් ගලායන මහාගංගාව දෙස බලන ඔහු, ගංගාවෙන් එතෙර තිබෙන්නාවූ තවත් භූමියක් දක්නේය. එය සියළු සෞභාග්‍යයෙන් සපිරි භූමියක්බවද ඔහුට හැඟෙන්නේය.

මෙබිම දුෂ්කර සහිතය. අනතුරු වලින් ගහනය. සැක සහිතය. බිය සහිතය. එහෙයින් මෙම භූමියෙන් නික්ම එතෙරින් ඇති භූමියට යාහැකි නම් සුරක්ෂිතව විසියහැකි බවක්ද ඔහුට සිතුනේය. එහෙත් ගඟෙහි ජලකඳ ඉතාමත් රළුය. වේගයෙන් ගලාබසින්නේය. ඔහුට මෙතෙරින් එතෙරට යෑමටහැකි ඔරුවක්, පාරුවක්, අඟුලක් හෝ එවැනි කිසිවක් නොමැති බැවින් හෙතෙම තරමක පසුබෑමකටද ලක්විය.

දුෂ්කරවූ මේ භූමියෙන් කෙසේහෝ එතෙරවී එතෙරඇති භූමියට යායුතුයැ'යි ඔහු දැඩිසේ සිතා ගත්තේය. අරමුණුකරගත්තේය. එම අරමුණට අනුව ක්‍රියාත්මකවූ ඔහු, මෙගොඩ තිබෙන වියැළීගිය තණ, ලීදඬු අතු කොල කඩා එකතුකොට පහුරක් තනන්නටවන්නේය. දරන ලද මහත් උත්සාහයක ප්‍රතිඵලය ලෙසින් හෙතෙම කෙටි කලෙකින්ම පහුරක්තනා නිමකළේය. පහුරතනාගත් ඔහු තවත් සුළුමොහොතක් හෝ එතැන රැඳෙන්න අදහස් නොකළේ. වහ වහා පහුර දියෙහිදමා ඒමතනැගී හබලක් නොමැතිකමින්, අතින්, පයින්, දිය ගසමින් වුවද දැඩි වෙහෙසකින්තොරව ගඟතරණය කළේය. එතෙරින් මෙතෙරට ළඟාවූ හෙතෙම සුවසේ එහි ගොඩබටුයේ ය. ඔහුතුළ දැඩිසතුටක් විය. මේ භූමිය සශ්‍රීකය. එහි නවතින්නට සුදුසු ස්ථානයක් සොයාග ැනීම පහසුය. මම අද සුවපහසු භූමියකට පැමිණියෙමි. එසේ පැමිණීමට මාහට උපකාරවූයේ මෙම පහුරය. පහුර නොවන්නට කිසිදාක, මට මෙතෙරට ඒමට හැකියාවක් නොවන්නේමය. එනිසා පහුර මෙහි තනිකරදමා යෑම නුසුදුසු යැ'යි සිතමින් පහුර කරමතටගෙන ඉදිරියට පිය නගන්නට වන්නේනම්,

මහණෙනි, කුමක් සිතන්නේ ද? ඒ තැනැත්තා නිවැරදිව කළයුතුදෙය කරන්නෙහිද?

ස්වාමීනි, ඒ සුදුසු දෙයක් නොවේමය.

මහණෙනි, ඒ තැනැත්තේ නිවැරදිව කෙසේ සිතිය යුත්තේද?

"මම මේ පහුර ආධාරකරගෙන මෙතෙරට සුවසේ පැමිණියෙමි. දැන් මේ පහුර ගොඩඇදදමා හෝ දියෙහි පාකරයවා මගේ ගමන මේ භූමියෙහි ඉදිරියට පහසුවෙන්ම යායුතු වන්නේය."

මහණෙනි, මෙසේ සිතන ඒ තැනැත්තා. පහුරට කළයුතු දේ පිළිබඳව නිවැරදිව සිතනඅයෙකි. පහුර අතහැර හෝ දියෙහි පාකරයවන්නේ, අන්අයෙකුහට හෝ පහුරෙන් ප්‍රයෝජනයක්ම ලැබියහැකි වන්නේ ය. පහුරකරතබාගෙන යෑමෙන් ඒ තැනැත්තාහට අනවශ්‍ය වෙහෙසක්, කරදරයක්, ඇතිවනවා මිස, පහුරට සිදුවන යහපතක් හෝ අයහපතක් නොවන්නේමය.

මහණෙනි, මවිසින් ධර්මයම පහුරට උපමාකොට ධර්මයදේශනා කළෙමි. කර්කශභූමිය වනාහි දුකින් පිරුණු භවය යි. ඉදිරියෙන් ගලාගියේ සංසාරය නැමැති ගංගාවයි. එතෙරින් පැවති සශ්‍රීක භූමියවූයේ නිර්වාණයයි. පහුරවූයේ "ධර්මය" මයි. මේ ධර්මය සසරින් එතෙරවීමට මිස අල්වාතබාගැනීම පිණිස නොවේ.

මහණෙනි, පහුර උපමාකොට ඔබසැමට දේශනාකළ ධර්මයදක්නාවූ ඔබ සියලුදෙනා විසින් ප්‍රත්‍යාවේක්ෂයෙන් ප්‍රත්‍යක්ෂඥාණය ලැබීමත්, ධර්මාවබෝධයත් සමඟම සමථ විදර්ශනා ධර්මයෝද අත්හළයුත්තේය. අධර්මය සේම ධර්මයද හළයුත්තේය.

(අලගද්දූපම සූත්‍රයෙනි)

උස්වූ ගොඩනැගිල්ලක්වැනි කිසිවක් තනනු ලබන තැනැත්තේ එම කටයුත්ත සඳහා ඉහළ නැගීමට

පලංචිතනමින් ඒවායේ උපකාරයෙන් ඉහළ නගිමින් තම කටයුත්ත නිමකරයි. එකී කටයුත්ත නිමාවූ වහාම පලංචිගලවා ඉවත්කර දමන්නේ මිස, තවදුරටත් පලංචි තබා ගැනීම හෝ ඒ මතටවී සිටින්නේ නැත. සසර දුකින් එතෙරවීම පිණිස උපකාරවූ ධර්මය කෙරෙහි තෘෂ්ණා උපදවා ඒවායෙහි රැඳෙන්නේ නම් සිදුවන්නේ " උපාදානය" මය. උපාදානයත් ක්ෂයවීමට නම් ධර්මයෙහි සහයෙන් තත්ත්වබෝධය ප්‍රත්‍යක්ෂවීමත් සමඟ යළිත් කිසිවක උපාදානය නොවී, නිරෝධයට ඉඩහළ යුතුය. යනු තථාගත සම්බුදු පියාණන් වදාළ දේශනයේ අන්තර්ගතය වන්නේය.

## භව හේතු

වාඩිවීසිටි පුද්ගලයා සිටගැනීමට සිතයිනම්, භවහේතුකාරකයයි. සිටගනීනම්, ඒ භව හේතුකාරකයයි.

යන්නට සිතයිනම් ඒ භව හේතුකාරකයයි, යන්නේනම් භව හේතුකාරකයයි.

ඉන්නාතැන, මෙතැනය, යාමටසිදුවන්නේ අතැනටය. එවිට එතැනක් හා මෙතැනක් අතර සිදුවීම් රාශියකි. ඒ "දුක" ය.

මෙතැන, මෙතැනදී නිරෝධවූයේ එතැනක් පිළිබඳව සිතුවිලි පහළවීමක් නොවුයේනම් යෑමක් (භවයක්) ඇති නොවේ.

එතැනත්, මෙතැනත්, අතර (භවයක්) ඇතිවූයේ නම්, යෑමක් සිදුවන්නේනම් (දුක) ද එතැනමය. එය ස්වභාවයයි.

කවරහෝ මොහොතක එතැනත් අතහැර - මෙතැනත් අමතකකොට - වෙනත් අරමුණකවෙලී භවයන් උපදවාගනී. දුකපවත්වාගනී. දුක ඇතිවීමේ ස්වභාවය එයයි.

එහි වෙලීමෙන් විඥාණය "දුක" පවත්වාගනී. යථා යථා ස්වභාවයන් පිළිබඳ, තථා තථා කාරයෙන් යථාවබෝධය ලැබූ ධර්මාවබෝධය ලැබූ භික්ෂුව හෝ විනිර්මුක්ත පුද්ගලයා, භවහේතූන් හා නොවෙලෙන්නේය. නොපැටලෙන්නේය. අල්ලානොගන්නේය.

## භවය යනු

භවයයනු මරණයෙන් පසුව ඇතිවන්නක් නොවේ. ජීවත්වසිටියදීම ලබන්නාවූ විඳින්නාවූ ස්වභාවයෝය.

පිරිසක් හෝ දෙදෙනෙකු හෝ තනිව හෝ කිසියම් කටයුත්තක් අරඹන්නේය. ඒ භවයක උපතයි. ආරම්භයයි. එම කටයුත්ත පවත්වාගෙනයනු ලබන්නේද, ඒ භවකාරකයයි. භවය ක්‍රියාත්මකව පවත්නේය. ඒ පිළිබඳ තණ්හාව, ඕනෑකම, පවතිනතාක් එම භව ක්‍රියාවලිය පවතින්නේය. කවර හෝ අවස්ථාවක, අයෙකුහට මෙම ක්‍රියාවලිය එපාවිය. ඔහු එම ක්‍රියාවලිය. අත්හැරියේය. එතෙක් රැඳීසිටි භවයෙන් ඔහු ඉවත්වුණේය. මිදුණේය. තවදුරටත් එම ක්‍රියාවෙහි නිරතවීමේ ඕනෑකම "තෘෂ්ණාව" ඔහු කෙරෙන් බැහැරවී ඇති බැවින්, යළිත් එම ක්‍රියාවෙහි ඔහු නිරතනොවන ඔහු ගැළවුනේවෙයි. මිදුනේ වෙයි. නොඇලුනේ වෙයි. එතෙක් එම ක්‍රියාකාරකම් තුල ඔහු වෙලීසිටි සියළුබැඳීම් වලින් නිදහස්වූයේ භවයක් නිරුද්ධවූයේ වෙයි.

ජීවත්වන සත්ත්වයාතුළ පවතින (තෘෂ්ණාහරිත ඕනෑ, එපාකම් අනන්තය. එවන් ඕනෑ, එපාකම් අනුව විවිධ කරුණු කාරණාවන්හි ඇලෙමින්, ගැලෙමින්, අනන්තවත්වූ භවයන් ඇතිකරගන්නේය. අනන්තවූ භාවකාරකයෝම සංසාරයවන්නේය. අසීමිතවන හැලහැප්පීම්, ගැටීම්හමුවේ සංසාරයවට්ටයක් වන්නේය. සුළියක්වන්නේය. එහි මැදිවුණ සත්ත්වයා ඉන් ගැලවීගතහැකි මඟක් නොදන්නේ අප්‍රමාණවූ "දුක්" කන්දරාවක් විඳින්නේය.

"භවය" ඉබේ මැවෙන්නක් නොවේ. මැවිය හැක්කකි. එය සංඛතයකි. ඇතිකරගන්නා ලද්දකි. සකස්කරග න්නා ලද්දකි. ඕනෑකම - තෘෂ්ණාවෙන් ඇතිකරගත් එක් එක් භව ස්වභාවයක් පිළිබඳව වටහාගත හැක්කේනම්, එවන් තැනැත්තාහට භව දුකට හේතුවූ - තෘෂ්ණාවන් හඳුනාගෙන, ඒවායින් බැහැරවී දුකින් මිදීමට හැක්කේය. භව ක්‍රියාවන් හීනවනවිට සංසාර වට්ටයේ ද (සුළියේ) ක්‍රියාවලිය හීනවන්නේය. භව ක්‍රියාවලිය මුළුමනින්ම අත් හැරණේ කවරඅවස්ථාවකද සංසාරවට්ටයද එතැනම නිමාවනු ඇත්තේ ය.

## භවය

ස්වාමීනි, භවය භවය ය'යි කියනු ලැබේ. ස්වාමීනි කවරආකාරයකින් භවයවන්නේ ද?

ආනන්දය, කාමධාතුයෙහි ගැලෙන ක්‍රියාවන් (කර්මයක්) නොවීනම් කාමභවයකියා කිසිවක් ඇතිවිය හැකිද?

ස්වාමීනි, එසේ නොවන්නේමය.

ආනන්දය, මෙසේ කර්මය ක්ෂේත්‍රයවෙයි. අභිසංස්කාර විඥාණය බීජයවෙයි. තෘෂ්ණාව, ජලය වෙයි. අවිද්‍යාවෙන් ආවරණයවුණ තෘෂ්ණා බන්ධනයෙන් බැඳුණ සත්ත්වයන්ගේ කාමධාතුයෙහි කර්මචේතනාවන් ඇත්තේය. කර්මප්‍රාර්ථනාවන් ඇත්තේය. මෙසේ මතුයෙහි පුනර්භවය ඇතිවීමේ හේතු ප්‍රත්‍යය සිදුවෙයි.

(ආනන්ද වග්ග)

ඇවැත්නි, භවයෝ කොතෙක් වෙත්ද?

ඇවැත්නි, මේ භවයෝ තුන්දෙනෙකි. කාමභව, රූපභව, අරූප භවයි.

ඇවැත්නි, මතු අනාගතයෙහි පුනර්භවය ඉපදීම කෙසේ වන්නේද?

ඇවැත්නි, අවිද්‍යානීවරණ ඇති තෘෂ්ණාසංයෝජන ඇති, සත්ත්වයන්ගේ ඒ ඒ තන්හි, නාමරූපාදී ආස්වාදයන් ලබන්නේ, ආස්වාදයන් සොයනුයේ මෙසේ පුනර්භවය ඉපදීම (ඇතිවීම) වෙයි.

ඇවැත්නි, අනාගතයෙහි පුනර්භවයෙහි ඉපදීම කෙසේනම් නොවන්නේද?

ඇවැත්නි, අවිද්‍යාක්ෂය, විරාග හේතුයෙන්වන අරහත්මාර්ග විද්‍යාඋපදවා ගැනීමෙන්, තෘෂ්ණා නිරෝධයෙන්, මතු පුනර්භවය ඇතිවීමක් නොවන්නේය.

(මහවෙදැල්ල සූත්‍රය)

# ක්‍රියාව හා භවය

ඉපදීමටනම් භවයක් ඇතිවිය යුතුය. භවය ඇතිවීමට නම් විපාක දීමේ කර්මයක් - ක්‍රියාවක් පිළිබඳව නන්දිරාගය තිබියයුතුය. කැමැත්ත තිබියයුතුය. නන්දිරාගයෙන් බැහැරවූ භවයක් නැත. භවයෙන් තොරවූ ඉපදීමක්ද නැත්තේමය.

ඇත්තේය'යි හඟිණ පවතින්නේයැ'යි හඟිණ සෑම දේවලම, ඒකක ක්‍රියාවලියක්නොව, පවතිනුයේ අනන්ත වූ ක්‍රියාවලියන් සමූහයක්ම බව විදර්ශනාවේදී අවබෝධවන්නේය. එම අවබෝධය වනාහි ධර්මයදැකීමේ ප්‍රඥාවය.

ඉපදීම එක් අන්තයක් බවත්, මරණය තවත් අන්තයක් බවත්, කාගේත් පිළිගැනීමය. ඒ අතරතුර පවත්නේ ජීවිතය ලෙස ඔවුන් සිතයි. එතැනඇත්තේ මිථ්‍යාවය. බැහැර විය යුත්තේ එකී මිථ්‍යාදෘෂ්ටියෙන්මය. බුදුදහමෙහි - ක්ෂණික මරණයක් හා සම්මුතිමරණයක් යනුවෙන් ඉගැන්වීම්කරනු ලැබෙයි. පෘථග්ජනයින් දකින්නේ සම්මුතිමරණය පමණකි.

වරද එතැනය.

දැකියයුත්තේ, ක්ෂණික මරණයයි.

එවිට සංසාරගමන දැකියහැකි වන්නේය.

සංසාර ගමන පැවැත්වීමට හේතුකාරකවන්නාවූ නන්දිරාගය හඳුනාගත හැකිවන්නේය.

නන්දිරාගය නොවන්නට සංසාරගමනේ පැවැත්මක් නොමැති බව වැටහෙත්, වැටහෙත්ම, භවය නැති වන්නේය. භවය නොමැත්තේ ඉපදීමක් සිදුනොවන්නේය.

මේ පිළිබඳව උදාහරණයන් කිහිපයක් ගෙන බලමු.

සිතෙහි පහළවූ නන්දිරාගයක් (පවත්වා ගැනීමේ දැඩි කැමැත්තක්) හේතුවෙන් වර්තමානයේ පවත්වනු ලබන " සුපස්ටාර්" වැනි සංගීත තරඟයකට කිසිවෙක් ඉදිරිපත් වූයේයැ'යි සිතමු.

සංගීත තරඟයට ඉදිරිපත්වී ප්‍රථමස්ථානයට පත්වීමේ (දැඩිකැමැත්ත) නන්දිරාගය, භවයේ (ගමනක) ආරම්භයයි.

එහි අනෙක් අන්තයලෙස හෙතෙම දකිනුයේ, ප්‍රථම ස්ථානයලබා ඉන්ලබන ආස්වාදයයි"

දැන් ගමන අරඹාඇත. අන්තයන් දෙකකි. මැද හිඩැසකි.

එතැන පවතිනුයේ තරඟය'යි. "දුක" පවතිනුයේ එතැනය.

අවිද්‍යාවපවතිනුයේ එතැනය.

තරඟයේ ජයග්‍රහණය හඹායමින් හේ වෙහෙසෙන්නේය.

සංගීතය හදාරන්නේය. ගුරුවරුන් සොයන්නේය. උපකාරක සොයමින් වෙහෙසෙන්නේය.

අනන්තවූ අප්‍රමාණවූ ගැහැට විඳිමින්, හේ ජයග්‍රහණය මත නන්දිරාගය පිහිටුවාගෙන ගමනේ යෙදෙන්නේය.

තමාතුළ ඇතිවී තිබෙන නන්දිරාගය කොපමණ බලවත් වී ඇත්ද යත්, මේවන විටත් මේ අන්තයන් දෙක අතර ඔහු විඳින දුක් සමුදාය පිළිබඳව හේ නොදකින්නේය.

දැන් නන්දිරාගයක් (කැමැත්ත) පහළ වී ඇත. එතැන භවයයි. තරඟයට පිවිසීමෙන් ඔහු තරඟයතුළ ඉපදී ඇත.

තරඟයතුළ ගමන් මඟක් බිහිවී ඇත. හේ එම මඟෙහි ගමන ආරම්භකොට ඇත. එහි නිමාව කොතැනකදැ'යි ඔහු නොදන්නේය. තරඟයේ ප්‍රථම ස්ථානය ලබාගැනීමත් ඉන්ලැබියහැකි - ගෞරවයත් පිළිබඳව සිතනවා මිස, ඒ වනවිට විඳින දුක, ඔහු නොදකින්නේ සසර පිළිබඳව නොදන්නාකම නිසාය.

තරඟයේ මූලිකවට කිහිපයකින්ම ඔහු ජයලැබුවා විය හැකිය. ඒ අනුව ඔහුතුළ පවතින ජයග්‍රහණය පිළිබඳ නන්දිරාගය බොහෝ සෙයින් උත්සන්නවී තිබෙනු නිසැකය.

මේ වනවිට ඔහු අවසන් පූර්වතරඟයට ඉදිරිපත් වීමෙන් පසුව, එම තරඟ ප්‍රතිඵලය නිකුත්කරන අවස්ථාව යැයි සිතමු.

තරඟ තීරකයන්ගේ තීරණය ප්‍රකාශයට පත්කිරීම සඳහා ඉදිරිපත්වූ නිවේදකයා, එකවරම එම ප්‍රතිඵලය නිකුත් කරන්නේ නොමැතිව, එතැන සිටින තරඟකරුවන් එකිනෙකා වෙත යමින්, විවිධ ප්‍රශ්න අසමින්, කල්මරණ විට ශේෂවීසිටින තරඟකරුවන්තුළ පවතින කම්පනයන් කෙසේවිය හැකිද?.

ඔවුන් දැඩිසේ පීඩනයට ලක්වෙති. හෘදස්පන්ධන රිද්මයන් වැඩිවීඇත. හඬන්නටද - සිනහසෙන්නටදැ'යි ඔවුනට සිතාගත නොහැකිය.

එතැන ඇත්තේ මොනතරම් දුක් කන්දරාවක්ද, ඔවුන් ඒබැව් නොසිතන්නේය. නොවැටහෙන්නේ, ජයග්‍රහණය නම්වූ නන්දිරාගය මතම පවතින්නේය.

මේ තරඟකරුවන් සියළුදෙනම තම තමන්තුළ පහළවූ නන්දිරාගයන් හේතුවෙන්, බිහිවූ ගමන්මඟක භවයකඉපදී ගමනේ යෙදෙන්නවුන්ය.

තරඟයේ ප්‍රතිඵල නිකුත්වූ සැනින්, මොවුන් අතරින් කිහිප දෙනෙකුහට එම ගමන අතරමඟදී නිමාකරන්නට සිදුවෙනු ඇත. ජයග්‍රාහකයින් තවදුරටත් ගමනේ යෙදෙනු ලබන්නේය.

එසේ ඉදිරියට ගමනේ යෙදෙන්නවූන් තුළ නැවත නැවතත් කම්පනයන් සිදුවෙනු ඇත.

ගමනින්ඉවත්වූ තැනැත්තාහට යළිත් තරඟයේ ජයග්‍රහණය පිළිබඳව වේදනාවත්, කම්පනයත් ඇතිවීමත් නැත. එසේ වේදනාවක් පවත්වන්නේ නම් එයද ඔහුගේකැමැත්ත මත ඔහු විසින්ම ඔහුතුළ පවත්වාගනු ලබන්නක් මිස අනෙකක් නොවන්නේය. දැන් ඔහුතුළ ඇත්තේ පරාජය පිළිබඳව ඇතිකරගත්තාවූ විභව තණ්හාව පමණි.

ඔහුතුළ තවදුරටත් තරඟයට ඉදිරිපත්වීමේ නන්දිරාගය පහළ නොවන්නේ නම්, පෙරවිඳි වේදනාව ඔහුට තවදුරටත් නොවන්නේය. ඒ ඔහු ඒවා අත්හළ බැවිනි.

තව දුරටත් තරඟයනට සහභාගීවීමට ඔහුතුළ කැමැත්ත පහළවන්නේනම් යළි යලිත් පෙරවිඳි වේදනාවන් විඳීමටත් දුකට පත්වීමටත් ඔහුට සිදුවනු ඇත.

සිදුවියයුත්තේ කවරේදැ'යි යන්න තෝරාගැනීමේ අයිතිය ඇත්තේ ඔහු තුළය. ඔහුතුළ පවතින නන්දිරාගය මතය. කැමැත්ත මතය.

ඔහුතුළ එවන් කැමැත්තක් නැතිවූයේ. භවය නැතිවිය. එවැන්නක් පිළිබඳව කැමැත්තක් නොමැති වූයේ - ඔහු එවන් කාර්යයකට යොමුනොවන්නේය. එවන් කාර්යයකට යොමුනොවූ බැවින් එවැනි දෙයක පැවැත්මක් එතැන ඇතිනොවන්නේය.

එවැන්නක් නොමැති නම් එතැන හිස් ය. නිරෝධය'යි

* * *

ඇස සහ විඥාණය (මතකය) හේතුවෙන්, රූප ඉපදෙයි.

කන හා විඥාණය හේතුවෙන් ශබ්දය ඉපදෙයි.

මෙයාකාරයෙන් ශබ්දයන් හා විඥාණයන් හේතුවෙන් ඒ ඒවාට අනුරූපවූ සංඥා ඉපදීම් සිදුවෙයි. ඒ ක්ෂණයකින්ම ඒවා මියයයි.

එතැන සිදුවූයේ ක්ෂණික මරණයයි.

එහෙත් පංචේන්ද්‍රියයන් හේතුකොටගෙන ඉපදෙන්නාවූ කවරදෙයක් පිළිබඳව හා නන්දිරාග සහගත බවක් (කැමැත්තක්) පහළවූයේ වීනම් එතැනම සංසාර ගමන්මඟ විවරවන්නේය.

අතීතමතකයන් ලෙසින් හා අනාගතය පිළිබඳව (සංකල්පනාවන්) සමඟ වෙළෙමින් - ඉදිරියට පවත්වාගනු

ලබන්නේ, සසරගමනේ යෙදෙන්නේවන්නේය. කවරතැනකදී හෝ ඒ පිළිබඳ කැමැත්ත තමසිතින් බැහැරවන්නේද? ඒ දක්වාම එමගමන- සම්බන්ධය නන්දිරාගයමතම පවතින්නේ ය.

මේ තත්ත්වය (ධර්මතාවය) පිළිබඳව අවබෝධකර ගැනීමෙන් සසරගමන එතැනම අතහැරදැමීමේ හැකියාව ඇත්තේද, එම ගමනේ ආරම්භය ඇතිකරගන්නා තැනැත්තා තුලමය. එක්සංඥාවක් කෙරෙහි නන්දිරාගීවූ තැනැත්තේ එයනිමවූ ක්ෂණයෙන් වෙනත් සංඥාවක් කෙරෙහි නන්දිරාගය පැවැත්වීම අරඹන්නේය.

අළුත් සංඥාවක නන්දිරාගය පහළවත්ම, පෙරපැවති සංඥාව නිමාවන්නේය. හෙවත් මියයන්නේය. මරණයට පත්වන්නේය. එක් නන්දිරාගයක උපත පවත්වාගනු ලබන්නේ, සංසාරගමනේ යෙදෙන්නේය. එම සංඥාව නිමාවූ ක්ෂණයෙන් එමගමන මියයන්නේය. එහෙත් ඒ පිළිබඳව පවතින අනවබෝධය (අවිද්‍යාව) හේතුවෙන්.

එක් නන්දිරාගයක් අතහැරෙනවිට තවත් නන්දිරාගයක් හෝ ගණනාවක් පවත්වාගන්නේය. එබැවින් තවත් ගමනක් ඇතිවන්නේය.

එකමත එක ආසන්නයේදී, ක්ෂණයෙන් ක්ෂණය සිදුවන බැවින්, මේ සියළු ක්‍රියාදාමයන් එකක්ලෙසින් ධර්මාවබෝධය නොලත් තැනැත්තාහට පෙනෙන්නේය. නිරන්තරයෙන් ක්ෂණයෙන්, ක්ෂණය උපදිමින් මැරෙමින්

සසරගමනක් තනාගෙන ඇති සත්ත්වයා. සම්මුති මරණය එක්අන්තයක් සේ දකින්නේය. සම්මුති මරණය සැබෑමරණයක් නොව ඉපදීමත් සමගම මරණයත් අප අත්විඳිමින් සිටියි.

ඉපදීමට හේතුවූ මූලිකකරුණට නන්දිරාගසහගත වීම (කැමතිවීම නිසා) ක්ෂණයකින් නිමාවට පත්විය යුතුවතිබූ සංඥාව සත්ත්වයා විසින් ඉදිරියට පවත්වාගෙන යන්නටවීඇත.

එසේ එය ඉදිරියට පවත්වාගෙන යෑමටහේතුවූයේ අවිද්‍යාවයි - ධර්මතාවයන් පිළිබඳව නොදන්නාකමයි. නොපවතින දෙයක් පවතින දෙයක් ලෙස ඇතිකරගත් සක්කායදෘෂ්ඨියයි. ඒතුළ පහළවූ තණ්හාවයි. නැත්තාවූ දෙය ඇත්තාවූ දේ ලෙසින් විග්‍රහයට (සංස්කාර - සංස්කරණයට) ලක්කර ගැනීමයි.

එසේ විග්‍රහය ලක්කරගත් දේවලට නම්යෙදීමයි. රූපවශයෙන් පිළිගැනීමයි. මේ සියල්ලම නන්දිරාගය, කැමැත්තමතම බිහිවූවාමිස ඇතිකරදුන් මවාදුන් වෙනත් අයෙක් හෝ සර්වබලධාරි දෙවියෙක් හෝ නැත. මවාගැනීම සිදුකළේ ඔබය. එය නැතිකළ යුත්තේ ද ඔබ විසින්මය.

උපදින සංඥාව ක්ෂණයකින් මියයන්නේය. දැකිය යුත්තේ එයයි. ඒහැර, ඒවාමත පිහිටා නන්දිරාගසහගතවීම (කැමැත්ත) ඇතිකරගැනීම නොවේ. ක්ෂණයක් - ක්ෂණයක් පාසා ඉපදෙන, මියයන ස්වභාවය දැකගත් කළ, ශේෂයක් එහි නොමැතිබව වැටහෙන්නේය. එම වැටහීම ප්‍රඥාවයි.

ප්‍රඥාව පහළවත්ම දකිනුයේ ධර්මතාවයයි. එම ධර්මතාව අවබෝධවන තැන ශේෂයක් නැත්තේය. ශූන්‍යයයි.

බුදුන්වහන්සේ - අවබෝධකර දෙසා වදාළේ මෙම ධර්මතාවයයි. උන්වහන්සේ විසින් ලෝක සත්ත්වයන් විසින් ඇතිකරගෙන දුක්විඳින්නාවූ, මේ සසරින් ගලවා ගැනීම පිණිස, ධර්මතාවයන් අවබෝධකොට ගෙන සසරගමන නිමාකිරීමට දේශක බැවින් එය බුද්ධ ධර්මය නම් වී ඇත.

උන්වහන්සේ විසින්ද - උන්වහන්සේට පෙර වැඩසිටි බුදුවරුන්වහන්සේලා දේශනාකොට වදාරාඇත්තේ ධර්මතාවයන් පිළිබඳව අවබෝධකර ගැනීමේ මාර්ග යයි. එය අවබෝධකර ගැනීම පිණිස බුද්ධිය අභිබවා ගොස්, බුද්ධියෙහි පරතෙර පැමිණ, ප්‍රඥාව පහළකරගත් බැවින් උන්වහන්සේලා "බුද්ධ" නම්විය. උන්වහන්සේලා විසින් ධර්මතාවයන් පිළිබඳව පෙන්වාදුන් මාර්ගය බුද්ධ ධර්මයන් විය. **උන්වහන්සේලා විසින් ධර්මයදේශනාකොට ධර්මමාර්ගය, විවරකොටදී ඇත්තේ වත්මන් ජාතියෙහිදීම සසර අතහැර "නිවන" අවබෝධකර දුකින්මිදීමට මිස, ධර්මය ග්‍රහණයකරගෙන තවදුරටත් සසර සැරිසරන්නට නොවේ.**

## දුක හා දුක නිරෝධය

මහණෙනි, යමෙකුත් සිතයිද, කල්පනාකෙරේද, යමකුත්පවත්වාද, මෙය විඥාණයේ පැවැත්මට අරමුණුවේ. අරමුණු ඇතිකල්හි විඥාණයේ පිහිටීමවේ. ඒ විඥාණය

පිහිටිකල්හි වැඩුනකල්හි මතු පුනර්භවය හටගැනීමවේ. මතු පුනර්භවය හට ගැනීම ඇති කල්හි ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්සය උපායාසයෝ හටගනිත්, මෙසේ හුදුරුසේ හටගැනීමවේ.

මහණෙනි, අරමුණු ඇතිකල්හි විඥාණයේ පිහිටීමවේ. ඒ විඥාණය පිහිටි කල්හි, වැඩුනකල්හි, නාමරූපයේ බැසග ැනීමවේ. නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනවේ. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශවේ. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාවවේ. තෘෂ්ණාව උපාදාන, භව, ජාතිය, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසයෝ හටගනිති. මෙසේ හුදුදුක්රුසේ හටගැනීමවේ.

මහණෙනි, යමකුත් සිතා, යමකුත් කල්පනා කෙරේද? යමකුත් නැවත නැවත සිහිකරයිද, පවත්වාද, මෙය විඥාණයේ පැවැත්ම අරමුණුවේ. අරමුණඇති කල්හි විඥාණයේ පිහිටීමවේ. ඒ විඥාණය පිහිටිකල්හි, වැඩුනකල්හි තෘෂ්ණාවවේ. තෘෂ්ණාව ඇතිකල්හි කර්මාදි අරමුණෙහි, විඥාණයේ පැවැත්වීමවේ. විඥාණයේ පැවැත්ම ඇතිකල්හි චුතිය හා උත්පත්තියවේ. චුතිය උප්පත්ති ඇතිකල්හි මත්තෙහි ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසයෝ හට ගනිති. මෙසේ මේ හුදු දුක්රුසේ හටගැනීමවේ.

මහණෙනි, යම්කලෙක නොසිතාද, කල්පනා නොකෙරේද, සිහිනොකෙරේද, මෙය විඥාණයේ පැවැත්මට අරමුණුනොවේ. ඒ විඥාණය නොපිහිටි

කල්හි, තෘෂ්ණාව නොවේ. තෘෂ්ණාව නොවන කල්හි, නාමරූපයෝ බැසගැනීම නොවේ. තෘෂ්ණාව නොමැතිකල්හි කර්මාදි ආගතගති නොවේ. ආගතගති නොවූකල්හි, චුති, උප්පතිනොවේ. චුති, උප්පත්ති නැතිකල්හි, පුනර්භවය නොවේ. පුනර්භවය නැති කල්හි, මතු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසයෝ නිරුද්ධවෙත්. මෙසේ මේ හුදුදුක්රැසේ නිරෝධයවෙයි.

(චෙතනා සූත්‍රයෙනි)

## ආදිනවානු දර්ශන

මහණෙනි, ඉදින් කයෙහි ආස්වාදයක් නොවීනම්, මහණෙනි, සිතෙහි ආස්වාදයක් නොවීනම්, සත්ත්වයෝ සිතෙහි නොඇලෙන්නාහ. මහණෙනි, යම්හෙයකින් සිතෙහි ආශ්වාදයක් ඇත්ද, එහෙයින් සත්වයෝ සිතෙහි ඇලෙති. මහණෙනි, ඉදින් සිතෙහි ආදීනවයත් නොවී නම්, සත්ත්වයෝ සිතෙහි නොකළකිරෙන්නාහ. මහණෙනි, යම් හෙයකින් සිතෙහි ආදීනවයෙක් ඇද්ද එහෙයින් සත්ත්වයෝ සිතෙහි කළකිරෙත්.

මහණෙනි, ඉදින් සිතෙහි නිස්සරණයෙක් නොවී නම් සත්ත්වයෝ සිතින් නොමිදෙන්නාහ.

මහණෙනි, යම් හෙයකින් සිතෙහි නිස්සරණයක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ සිතින් මිදෙති.

මහණෙනි, යම්තාක් සත්ත්වයෝ මේ ආධ්‍යාත්මික ෂඩායතනයන්ගේ ආස්වාදය, ආස්වාදය වශයෙනුත්

ආදීනවය, ආදීනව වශයෙනුත්, නිස්සරණය, නිස්සරණය වශයෙනුත් තතු සේ නොදන්නාහුද?

මහණෙනි, ඒතාක් සත්ත්වයෝ දෙවියන් මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙන්, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙන් නික්මගියාහු වෙන්වූවාහු මිදුනාවූ ක්ලේශයන් හේතුවෙන් ඇතිකරගත් මුලාව ඉක්මවූ සිතින් යුක්තව නොමවිසූහ.

මහණෙනි, යම්කලෙක සත්ත්වයෝ මේ අධ්‍යාත්මික ෂඩායතනයන්ගේ ආස්වාදය - ආස්වාදය වශයෙනුත් ආදීනවය, ආදීනව වශයෙනුත්, නිස්සරණය - නිස්සරණය වශායනුත් තතුසේ දන්නාහුද?

මහණෙනි, එකල්හි සත්ත්වයෝ දෙවියන් මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙන් මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙන් නික්මගියාහු වෙන්වූවාහු මිදුනාවූ ක්ලේශවර්ත මාරයාද ඉක්මවූ සිතින් යුක්තව වෙසෙති.

(නො වෙ අස්සාද සූත්‍රයෙනි)

# අරි අටැඟි මඟ

## සම්මා දිට්ඨි

තථාගතයන් වහන්සේ හමුවෙහි එකත්පස්වහුන් ආයුෂ්මත් කච්චානගොත්ත ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේය.

වහන්ස, සම්මා දිට්ඨි, සම්මාදිට්ඨියයි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් සම්මාදිට්ඨි ඇතිවේද?

කච්චාන, මේ ලෝකය අස්තිරත්වයද, නාස්තිත්වයද යන දෙකොටස බෙහෙවින් ඇසුරුකළේ වේ. කච්චාන ලෝකසමුදයය (ඇතිවීම) තත්වූ පරිද්දෙන් මනානුවනින් දන්නාහට ලෝකයෙහි යම් නාස්තිත්වයක් ඇද්ද - එය නොවේ.

කච්චාන ලෝකනිරෝධය තත්වූ පරිද්දෙන් මනානුවණින් දක්නාහට ලෝකයෙහි යම් අස්තිත්වයෙන් ඇද්ද, එයනොවේ.

කච්චාන, මේ ලෝකය සත්ත්වයා තෘෂ්ණාදෘෂ්ඨි සංඛ්‍යාත උපාය, උපාදාන අභිනිවෙසයන් ගෙන් බැඳුනේ, සිත පිහිටන තැනවූ ඒ උපාය, උපාදාන සංඛ්‍යාත තෘෂණ දෘෂ්ටි අභිනවෙශානුශයට බෙහෙවින් නොපැමිණේ

"මාගේ" ආත්මය'යි නොගනී. නොඉටයි. උපදින්නේ දුකම උපදියි. නිරුද්ධවන්නේ "දුකම" නිරුද්ධවේ ය'යි සැකනොකෙරේ (අන්‍ය සත්ත්වයෙක් පුද්ගලයෙක් ඇතැයි නොසිතයි) විචිකිච්ඡා නූපදවයි. මෙහිලා ඔහුට පරපත්‍යරහිත භාවයෙන් ආත්මප්‍රත්‍යක්ෂ ඥානයවේ.

කච්චාන, මෙතෙකින්ම සම්‍යග්දෘෂ්ටිය ඇත්තේ වෙයි. කච්චාන සියල්ලඇතැයි යන අන්තයකි. සියල්ල නැතැ'යි යන අන්තයකි. කච්චාන, ඒ මේ අන්ත දෙකටම නොපැමිණ. මැදුම් පිළිවෙතින් තථාගත තෙමේ දහම් දෙසයි. අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාණය වෙයි. මෙසේ මේ හුදුදුක්රැසේ

හටගැන්ම වෙයි. අවිද්‍යාවගේම නිරවශේෂ, විරාගය, නිරෝධයෙන්, සංස්කාර නිරෝධයවේ. සංස්කාර නිරෝධයෙන්, විඥාණ නිරෝධයවේ. මෙසේ මේ දුක්රැසේ නිරෝධයවේය. කියායි.

(කච්චානගොත්ත සූත්‍රයෙනි)

කිසිවෙකු විසින්, කිසිවෙකු හඳුනාගනීද, කිසිවෙකු විසින් කිසිවක් හඳුනාගනීද, එහි ඇත්තේ නාමරූප ස්වභාවයයි. හඳුනාගන්නේ නාමයෙන්, හැඳුනුමවූයේ රූපයකි. හැඳුනුමවූයේ රූපස්කන්ධයකි. හඳුනාගන්නේ නාමයෙනි. පංචෝපාදානස්කන්ධයෙනි.

රූප ස්කන්ධය අපමණවූ ස්කන්ධයෝය. සණ ලෙසින්, ඒකකයන් ලෙසින් ඒවා හඳුනාගැනීම වැරදිදැක්මක්, වැරදිදැක්මක් ගෙන ඒවා නිවැරදිලෙසින් සළකයි. ඒවාකෙරෙහි පහළ කරනුලබන රූප හඳුනාග ැනීම් ස්වභාවයවූ නාමයද වැරදිය. ස්කන්ධවශයෙන් ඇතිවන ස්වභාවයන් කෙරෙහි නාමයද වියනොහැකිය. රූපයන්සේ ගතනොහැකිය. ස්කන්ධයෝ නිරන්තරයෙන්ම වෙනස්වන්නාවූ ස්වභාවයෝය. වෙනස්වන, වෙනස්වන ක්ෂණයක්පාසා ඒ ඒ ස්කන්ධයන් හඳුනාගනුයේ ඒවා කෙරෙහි ඇතිකරගන්නා රූපස්වභාවයන් හා ඒවාට යොදනුලබන නාම ස්වභාවයන් අනුවය. සැබෑ නොවූ ස්කන්ධස්වභාවයන් කේන්ද්‍රකරමින්, යොදාගන්නා නාමරූප ඔස්සේ ඇතිවන, තෘෂ්ණා ස්වභාවයෝ විඥාණයෝය. ඒ ඒ ස්වභාවයනට අනුවම නාමරූප ස්වභාවයන්ද විඥාණ ස්වභාවයන්ද බිහිවන්නේය. විඥාණයමවන්නේය. දන්නේය. දකින්නේය. විඳින්නේය. ආස්වාදය ලබන්නේය.

ආදීනවය දකින්නේය. නිස්සරණය පතන්නේය. මේ ස්වභාවයෝම, මමායනය වෙයි. මම වෙයි. මගේ වෙයි.

මමය, මගේය, වශයෙන් ස්වභාවයන් ඇතිවනුයේ (සක්කායදිට්ඨිය) නිරන්තරයෙන් වෙනස්, වෙනස්වන්නාවූ ස්කන්ධස්වභාවයන් කෙරෙහි, ආරෝපණය කරගත් නාමරූප සංඥාවන් කෙරෙහි, බිහිවන තෘෂ්ණාව (විඥාණය) තුළිනි. මම යනුද එකෙක් නොවේ. විඥාණයද එකෙක් නොවේ. නාමරූපද එකෙක් නොවේ. ඒ එකෙකුදු නිත්‍යයෝ නොවේ. නිරන්තර වෙනස් වෙනස්වන්නාවූ ස්වභාවයෝය. පංචඋපාදානස්කන්ධයෝමය. එසේ වෙනස්වන්නාවූ ස්වභාවයන් කෙරෙහි සංඛත වන්නා (මවාගන්නා) වූ "මම" නිත්‍යවශයෙන් පවතින්නක් වන්නේ කෙසේද? එවැන්නක් නැත.

ස්වභාවයන් කෙරෙන් වෙනස්වන්නාවූ ස්වභාවයන් පහළ කෙරෙති. ස්වභාවයන් කෙරෙන් වෙනස්වන්නාවූ ස්කන්ධස්වභාවයන් පහළ කෙරෙති. එසේ පහළවන්නාවූ ස්කන්ධස්වභාවයෝද නිරන්තරයෙන්ම වෙනස්වන්නේම වේ.

වෙනස්වීමේ ස්වභාවයෙන් බැහැරව, වෙනස්වීමේ ස්වභාවයමවන ස්කන්ධයක් කෙරෙහි ඒවා නිත්‍යවශයෙන් ගනිමින්, වෙනස් නොවන්නාවූදේ ලෙස ගනිමින්, ඒවා රූපයන්සේ ගනිමින්, ඒවාට නාමයන් අනුගත කරමින් ඇතිවෙන්නාවූ තෘෂ්ණා ස්වභාවයෝම භව කාරකයෝය. විඥාණ ස්වභාවයම "මම" වේ. මාගේ වේ. විඳින්නේවේ. දකින්නේවේ. පවත්වන්නේවේ. මේ වැරදි දැකීමය. සක්කාය දිට්ඨිය සැබෑවක් නොවෙති.

එකඅයුරකින් සිටි හෝ සිටින විඥාණයක් නැත. මමායනයක් නැත. දැක්මක් නැත. දකින්නක් නැත. පවත්නක් නැත. ස්වභාවයෝ වෙනස් වෙනස්වන්නේමය.

ස්වභාවයේ, ස්වභාවය හඳුනාගැනීමම නිවැරදි දැකුමය. එවිට මුලාවෙහි නොවැටෙති. නොපවතින ස්වභාවයන් නිත්‍යලෙස නොගනිති. නිත්‍යනොවන ස්කන්ධ ස්වභාවයෝ රූපයන්ලෙස නොගනිති. නිත්‍යනොවන රූපයන් කෙරෙහි නාමයන් නොයොදති. නිත්‍යවූ රූපයන් නොවූයේ, නිත්‍යවූ නාමයන් නොවූයේ, අගය කළයුතු කිසිවක් නොවන්නේය. අගය කළයුතු කිසිවක් නැත්තේ, තෘෂ්ණාව (විඥාණ) නොවන්නේය. විඥාණය (තෘෂ්ණාව) නොවනුයේ "මම"ය. මගේය යනුවෙන්ද නොවෙන්නේය.

නිවැරදිදැකීමයයි කෙටි හැඳින්වීමක් තිබේ. කුමක්ද නිවැරදිව දකින්නේ. පංචේන්ද්‍රියයන්ගේ අනිත්‍යභාවය දකින්නේය. පංචඋපාදානස්කන්ධයාගේ අනිත්‍යභාවය දකින්නේය.

කෙසේද මෙය දැකිය හැක්කේ.

විදර්ශණාවෙනි.

ආනාපානසතිය වැඩීමෙනි. නිවැරදිව අනාපානසතිය වඩනකල, කය පිලිබඳ ස්වභාවයන් වැටහෙන්නේය. (කායානුපස්සනා) ආස්වාදයන් පිළිබඳව වැටහෙන්නේය. (වේදනානුපස්සනා) හැඟීම් පිළිබඳව වැටහෙන්නේය. (ධම්මානුපස්සනා) සප්තබොජ්ජංගයන්ම අවබෝධවන්නේය. නාමරූප වශයෙන් වර්ග කළහැකි

කිසිවක්ම නැතිබව වැටහෙන්නේය. මෙපමණ කලක් මුලාවෙහි ගැලී සිටි බව වැටහෙන්නේය. ඒ වැටහීම් සමඟම සියළු ධර්මතාවයන් කෙරෙහි එතෙක් තබාගත් තෘෂ්ණාවන් අත්හැරී යන්නේය. සත්‍යාවබෝධවීම කරණකොටගෙන මතු කවරලෙසකින් හෝ තෘෂ්ණා ඇති නොකරන්නේය "දුක" ඇති නොවන්නේය.

ධර්මාවබෝධයන් යුතු භික්ෂුව හෝ විමුක්ත පුද්ගලයා, තත්කාලීනවූ මොහොත පමණක්ම දකින්නේය. එහි නිරෝධයද දකින්නේය.

එතැන විඳීමක් නැත. (කාම තණ්හා)

අනාගතයක් සඳහා පටන්ගැනීමක්, හෙට දවසක් පිළිබඳව නැත. (භව තණ්හා).

අත්හැරදැමීමක් හෝ ප්‍රතික්ෂේපකිරීමක් නැත. (විභව තණ්හා)

ස්වභාවයක් පහළවිය. ස්වභාවයක් නිරෝධවිය. ස්වභාවයම වෙනස් වෙනස් වෙයි.

වෙනස්වන ස්වභාවයන් පිළිබඳව නිත්‍යආකල්ප සංකල්පනාවක් ඇතිකරගැනීමම භව නිර්මානකාරක වෙයි.

බිම වැටීඇති කිසිවක් දුටු මිනිසා, එය අහුලාගනී නම්, එය ප්‍රවේශම්කර තැබීමට සිතයි නම්, හෙට දවසේ මෙය ප්‍රයෝජනයකට ගතහැකියැ'යි සිතයි නම්, ඒ සිතිවිල්ලතුලම භවය පවතියි / විඥාණය පහළවී තිබෙයි. කාම /භව/විභව, ත්‍රිවිධ තෘෂ්ණාවන්ම පහළ වී තිබෙයි.

එහෙත් ඒ බවක් එම පුද්ගලයාහට නොවැටහෙයි. ඒ අවිද්‍යාවනිසයි. සැබෑස්වභාවයන් පිළිබඳ ස්වභාවයන් නොදන්නාකම නිසාය.

කිසිවක් අහුලාගැනීම. එය තබාගැනීම, ආරක්ෂා කර ගැනීමට ප්‍රයත්නදැරීම, පෘථග්ජන ස්වභාවය'යි එය සාමාන්‍ය පුද්ගලයාගේ ක්‍රියාවයි.

එහෙත් ධර්මාවබෝධයෙන්යුතු භික්ෂුව / හෝ විමුක්ත පුද්ගලයා "කිසිවක්" දකිනමුත් එය හා නොබැඳෙන්නේය. හේ දුටුදෙයෙහි ස්කන්ධස්වභාවය දන්නේය. හේ අනිත්‍යස්වභාවය දන්නේය. අනාත්මවූ ස්වභාවය දන්නේය.

"කිසිවක්" පිළිබඳව උපාදාන සිත් ඇතිවූයේනම්,

"දුකට" හේතුවනබව දන්නේය.

එහෙයින්ම එහි නොබැඳෙන්නේය. නොවෙලෙන්නේය. අයිතියක් නොගන්නේය.

"දුටුදෙයට" කුමක්වුවත් ධර්මාවබෝධයෙන්යුතු භික්ෂූවට හෝ විමුක්ත පුද්ගලයාහට සිදුවන දෙයක් නැත. පහළවන සිතිවිල්ලක් නැත. දුටුදෙය එතැනය. තිබූතැනමය. එයට සිදුවූ දෙයක්ද නැත.

ධර්මාවබෝධයලත් භික්ෂුව හෝ විනිර්මුක්ත පුද්ගලයාතුළ "කිසිවක්" පිළිබඳව කිසිවක් ශේෂවූයේද නැත. ධර්මතාවය එයයි. දැකියයුත්තේද අවබෝධකළ යුත්තේද එම ස්වභාවයයි. ධර්මතාවයයි.

## සම්මා සංකප්ප

සංකල්පනාවන් යනු සිතුවිලිය. සම්මාසංකල්පනාවන් යනු නිවැරදි සිතුවිලිය. පුහුදුන් සත්ත්වයාතුල පවතිනුයේ සත්‍යනොවන සිතුවිලිය. ඒවා මිථ්‍යාවන් බව හඳුනාගෙන, ඒවායින් බැහැරවීම, දුක නැතිවීමට හේතුවන්නේය.

කවරෙකුහට වුවද, පවතින මොහොත පිළිබඳව සිතියහැකිය. ඉන් මොහොතකට පෙරපැවති තත්ත්වය පිළිබඳවද සිතිය හැකිය. පෙරදිනය පිළිබඳව සිතියහැකිය. සතියකට පෙර, මසකට පෙර, වසරකට පෙර, වසර දහයකට පෙර යනාදී වශයෙන් අපමණ අතීත සිද්ධීන් සිහිපත් කළහැකිය. මෙනෙහි කළහැකිය. එහෙත් ඒවා මෙනෙහි කිරීමෙන් භව තෘෂ්ණාවන් වැඩීම හැරුණුකොට අන්කවර යහපතක් සිදුවන්නේද? භවය වැඩෙන්නේද, වර්තමානයේ වෙසෙමින් අතීතයේ මෙනෙහිකරමින් අනාගතය පිළිබඳ සිහිනමවමින් මේ සිතුවිලි එකිනෙකා බැඳ තබා ගන්නට යැමනිසා නොවේද?

අතීත වේවා - වර්තමාන වේවා අනාගතය පිළිබඳව වේවා සිතුවිලි වලින් බැඳීයන සෑම සංකල්පනාවන් පවත්වාගැනීම දුක පිණිසම හේතුප්‍රත්‍යවන බැව් වටහාගත යුතුය. ප්‍රත්‍යක්ෂකළ යුතුය. එසේ ප්‍රත්‍යක්ෂ ඥාණයෙන්ම එවන් සංකල්පනාවන් අත්හළයුතුය. ඒවායින් බැහැරවිය යුතුය. "නෙක්කම්මය" ඇතිවන්නේ එවිටය.

යම් සේ පුරුෂයෙක් ගමින්, අන්ගමකට යන්නේද, ඒ ගමිනුත් අන්ගමකට යන්නේ ද, හේ ඒ ගමින් සියගමටම නැවත එන්නේද? එසේවූ ඔහුට මම මගේ ගමෙන්

බැහැරව අසවල්ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි. මෙසේ උන්නෙමි. මෙසේකීමි. මෙසේ නිහඬවීමි. ඒ ගමෙනුත් අසවල්ගමට ගියෙමි. එහිද මෙසේසිටියෙමි. මෙසේඋන්නෙමි. මෙසේකීමි. මෙසේ නිහඬවීමි. ඒ ගමෙන් සියගමටම පෙරලාආවෙමි වෙමි.

ඔහුට මෙබඳු සිතක් වන්නේද, කෙවඩ්ඪය. එපරිද්දෙන්ම මහණ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිඳු වූකල්හි, දීප්තකල්හි කෙලෙස් රහිතකල්හි උපක්ලෙශ පහවගියකල්හි මෘදුවූකල්හි සවීතකල්හි නිශ්චලබවට පැමිණිකල්හි පෙරවිසූ කඳපිළිවෙල සිහිකරන නුවණ පිණිස සිත මොනවට යොමුකරයි.

(කෙවඩ්ඪ සූත්‍රය)

මහණෙනි, බුදුවීමටකලින් බෝධිසත්වයකුව සිටියදී සියළුම විතර්ක, කොටස් දෙකකට බෙදියයුතුයැයි මට සිතිණ. ඒ අනුව කර්මවිතර්ක, ව්‍යාපාදවිතර්ක හා හිංසා විතර්ක යන මේවා එක් කොටසකටද, නෛශ්ක්‍රම්‍ය (හුදකලාව විසීම) අව්‍යාපාද (මෛත්‍රීය - බිය නොමැතිකම) අහිංසා (දුක්නොදීමේ බුද්ධිය) යනමේ විතර්කතුන අනෙක් කොටසටද වෙන්කළෙමි. ඉන්පසු ඉතා පරිස්සමින් හා පරික්ෂාවෙන්ද යුතුව වාසයකරනවිට මුලින්දැක්වූ විතර්ක තුනින් කිසියම් විතර්කයක් මාතුළ ඇතිවෙයි. එවිට මම වැරදිසිතුවිල්ලක් මා සිත්හි ඇතිවිණැයි සිතිමි. එය මාගේ දුක පිණිසද, අන්‍යයන්ගේ දුක පිණිසද හේතුවනුඇත. ප්‍රඥාව නිරුද්ධකරනුඇත. නිවනට බාධකයක්වනුඇත.

මෙසේ කල්පනාකරන මගේ සිතින් ඒ කාමවිතර්කය දුරුවෙයි.”

මහණෙනි, සරත් සෘතුවෙහි සිව්දිගින් ශෂ්‍ය පැසුණුවිට ගොපල්ලා ඉතා පරිස්සමින් තම ගවරැල රැකබලාගනියි. කෙවිටකින්ගසා හෝ ඔවුන් කෙතටයානොදී වළක්වයි. ඔහු එසේ කරන්නේ ගවරැළ කෙතටඇතුළු වුවහොත්, ඒනිසා තමාට ගෙවන්නට සිදුවන බව දන්නා හෙයිනි. එලෙසින් මමද, කාම, ව්‍යාපාද, හිංසා ආදී මනෝවෘත්තීන් භයානක බව දැනගතිමි.

එසමයෙහි මම ඉතා සන්සුන්ව උත්සාහයෙන් යුක්තව වාසය කළෙමි. එවිට මාගේ සිතෙහි නෛෂ්ක්‍රම්‍ය, අව්‍යපාද, අහිංසා යන විතර්ක තුනෙන් එකක් ඇතිවෙයි. ඉන්පසු මම මෙසේ සිතමි.

කුශල විතර්කයක් මා සිතෙහි ඇතිවිය. එය මගේ සහ අනෙක් අයගේ දුක සඳහා හේතුනොවේ. මෙය සත්ත්වයාගේ අභිවෘද්ධිය ඇතිකරන්නක් හා ඔවුන් නිවනටද පමුණුවන්නකි. මුළුරාත්‍රිය හා මුළුදවාලම ඒ ගැන කල්පනා කළත්, බියක් ඇතිනොවේ. එසේවුවද, බොහෝ වේලාවක් සිතීම හේතුවෙන් මාගේ සිරුර වෙහෙසට පත්වේ. එවිට “සිත” ද ස්ථිරව නොපිහිටයි. ඒ අස්ථිර සිතට සමාධියක් ලැබෙන්නේ කෙසේද? එහෙයින් මම ටිකවේලාවකට පසු මගේ සිත අභ්‍යන්තරයෙහිම ස්ථිර කළෙමි. ග්‍රීස්මසෘතුවෙහි අවසාන දිනවල මිනිසුන් තමතමන්ගේ ශෂ්‍ය තමතමන්ගේ ගෙවලට ගෙනගියකල්හි ගොපල්ලා තම ගවයන් නිදහසේ කෑමටහරියි. ඔහු

ගසක්යටටවී හෝ කෙළිබිමකටවී හෝ ඉඳහිට ගවයන්දෙස බලනුවිනා අන්කිසිවක් නොකරයි.

එලෙසින් මමද නෛෂ්ක්‍රම්‍යයාදී කුශල විතර්කයන් ඇතිවුන කල්හි මේ "කුශල ධර්මයෝය" යන්න ගැන පමණක් සිහිය පිහිටුවමි.

(ද්වෙධා විතක්ක සූත්‍රය)

ඒවා මෙනෙහි කිරීමෙන් දැකිය හැකිවනුයේ වෙනස්වීමේ ධර්මතාවයන්මය. වෙනස්වීමේ ධර්මතාවයන් ප්‍රත්‍යක්ෂනොකිරීම ප්‍රත්‍යවීමෙන් සසරගමන ඇතිවූහැටි පෙනෙන්නේය. භවකාරක හේතුප්‍රත්‍යයන් අවබෝධ කරන්නේය. මෙසේ අවබෝධය ලැබිය හැකිවූයේ සිත සමාහිතවූ බැවිනි. සිත තැන්පත්වූ බැවිනි. එසේ සිත තැන්පත් නොවූයේනම් එමසිතුවිලි භව කාරකයන්ම වන්නේය. ඒ අනුව ප්‍රඥාවඇත්තේ, ඇති තැනැත්තෝ, භවකාරක හේතුප්‍රත්‍යයන් ගෙන් ඉවත්වන්නේය. බැහැරවන්නේය. නික්මෙන්නේය"

එකත්පස්ව හුන් "රාධ" තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ.

ස්වාමිනි, සත්ත්ව (ප්‍රාණියා, ජීවියා, සත්ත්වයා) සත්ත්ව'යි කියනු ලැබෙයි. කවරකින් සත්ත්ව'යි කියනු ලැබෙයි ද,

රාධය, රූපයෙහි යම් කැමැත්තක් යම් ඇල්මක්, යම් සතුටක් යම් ආශ්වාදයක්වේද, එහිඇලුනේය. දැඩිව ඇලුනේය. එහෙයින් "සත්ව" යැයි කියනු ලැබේ.

වේදනායෙහි යම් කැමැත්තක් ඇල්මක් ... සංඥායෙහි යම් කැමැත්තක් ... ඇල්මක් ... සංස්කාරයෙහි යම් කැමැත්තක් ඇල්මක් ... විඥාණයෙහි යම් කැමැත්තක්, ඇල්මක්, යම් සතුටක්, යම් ආශාවක්වේද, එහිඇලුනේය, එහි දැඩිව ඇලුනේය, එහෙයින් සත්ත්වයැ'යි කියනු ලැබේ. රාධය. යම්සේ කුඩා දරුදැරියෝ වැලිවලින් ගෙවල්තනා ක්‍රීඩා කරද්ද, යම්තාක් ඒ වැලිගෙවල පහනොවූ ඇලුම් ඇත්තේ, පහනොවූ ආශා ඇත්තේවේද, ඒතාක් ඒ වැලි ගෙවලට ඇළුම්කරති. ලොල්වෙති. ධනයක් මෙන් හඟිති. මමත්වය ඇතිකරති. අයිතිය පෙන්වති.

රාධය, යම්කලෙක කුමර, කුමරියන් ලෙසින් වියපත් වූ දරුදැරියන්, ඒ වැලිගෙවල් කෙරෙහි පහවගිය කැමැත්ත ඇත්තේ, පහවගිය ඇලුම් ඇත්තේ, පහවගිය ප්‍රේමඇත්තේ, පහවගිය හැඟුම්ඇත්තේ, පහවගිය ආශාඇත්තේවේද, එකල්හි ඒ වැලිගෙවල් අතින්ද, පයින්ද, ගසා කඩාබිඳ දමති, වනසති. පෙර පැවති එවන් ක්‍රීඩාවන් ගෙන් බැහැර වෙති.

රාධය, එපරිද්දෙන් තොප විසින් රූපය විසුරුවව්. බිඳදමවු. වනසවු පහකළක්‍රීඩා ඇත්තවුන්වවු. තෘෂ්ණාව ක්ෂය කිරීම පිණිස පිළිපදිවු... වේදනා විසුරුවවු.... සංඥා විසුරුවවු .... සංස්කාරයන් විසුරුවවු.... විඥාණය විසුරුවවු ...... බිඳදමවු..... වනසවු... ක්‍රීඩාවෙන් බැහැරවවු. තෘෂ්ණාව ක්ෂයකිරීම පිළිපදිව් "රාධ, තෘෂ්ණා" ක්ෂය නිවනයි.

(සත්ත සූත්‍රය)

"රාධය", රූපය මාරය, වේදනාව මාරය, සංඥාව මාරය, සංස්කාරයන් මාරය, විඥාණය මාරය, "රාධ" මෙසේදක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා රූපයෙහිද කළකිරෙයි. වේදනායෙහිද කළකිරෙයි. සංඥායෙහිද කළකිරෙයි. සංස්කාරයෙහිද කළකිරෙයි. විඥාණයෙහිද කළකිරෙයි. කළකිරෙනුයේ නොඇලෙයි. නොඇලීම හේතුවෙන් පංචඋපාදානස්කන්ධයන් බිඳෙයි. සසරින් මිදුනබවට ප්‍රත්‍යක්ෂඥාණය පහළවෙයි. ජාතියගෙ වින. බ්‍රහ්මචර්‍ය්‍යයෙහිවැස නිමවිය. චතුරාර්‍ය්‍යසත්‍ය අවබෝධකොට ලද හෙයින් මේ රහත්බව පිණිස කළයුතු අන්කිසිවක් නැතැ'යි ප්‍රත්‍යක්ෂඥාණයෙනම දැනගනී.

සත්තසූත්‍රය අනුව සත්ත්වයා යනු කවරේදැයි වටහාගත හැකිය. රූප, වේදනා, සංඥා සංස්කාර විඥාණ නම් වූ පංචඋපාදානස්කන්ධයම සත්ත්ව ප්‍රඥප්තිය ලබන බව පැහැදිලිය.

රූප උපදිති - මියයති. වේදනා උපදිති. මියයති. සංඥා උපදිති - මියයති - සංස්කාර උපදිති - මියයති. විඥාණය උපදිති - මියයති.

ඇස හා ස්පර්ශවීමෙන් උපදින රූප මියයන්නේය. කණ හා ස්පර්ශවීමෙන් උපදින රූප මියයන්නේය. දිව .. නාසය ශරීරය හා ස්පර්ශවීමෙන් උපදින රූප මියයන්නේය. පංචස්කන්ධයම උපදින්නේය. මියයන්නේය. පංචඋපාදාන ස්කන්ධයන්ම උපදින්නේය. මියයන්නේය. පංචඋපාදාන ස්කන්ධයන්ම උපදින්නාසේම මියයන්නේය. සිතුවිලිම උපදින්නේය. සිතුවිලිම මියයන්නේය. සංකල්පනාවන්ම උපදින්නේය. සංකල්පනාවන්ම මියයන්නේය.

ශේෂවනකිසිවක් නොවන්නේය. චුතියත් එතැනය. උත්පාදයත් එතැනය. ඇතිවූතැනම නැතිවන්නේය. ඇතිවන රූපයක් නැත. නැතිවුන රූපයක් නැත. උපන්නේ සංකල්පනාවකි. මියගියේ සංකල්පනාවකි. සංකල්පනාවක් නූපන්නේ මියයන්නට සංකල්පනාවක් නොවන්නේය. පහලවනුයේ චුතුප්පාදඥාණයයි. සත්‍යාවබෝධවන්නේය. සංකල්පනාවන් නිවැරදිවනවිට (සම්මාසංකප්ප) මිථ්‍යාව දුරුවන්නේය. නාමරූප නිරෝධවන්නේය. "දුක" නොවන්නේය.

## සම්මාවාචා

නිවැරදිදේ කථාකළ යුතුය යන කෙටිතේරුමකි. නිවැරදිදේ කවරේද? වචනය දුශ්චරිතයට හේතුවන්නේය. සිතද දුශ්චරිතයට හේතුවන්නේය. කයද දුශ්චරිතයට හේතුවන්නේය. එහෙයින් සිත, කය, වචනයම මැනවින් හික්මවා ගතයුත්තේය. කථානොකළ යුත්තේ මොනවාද?

මහණෙනි, නන්වැදෑරුම් තිරිසන්කථා නොකියවු. එනම්, රජුන්පිළිබඳ කථා, සොරුන්පිළිබඳ කථා, මහාමාත්‍යයන්පිළිබඳ කථා, සේනාවපිළිබඳ කථා, බියපිළිබඳ කථා, වස්ත්‍රපිළිබඳ කථා සෙනසුන්පිළිබඳ කථා මල්දම්, ගඳ, සුවඳ පිළිබඳකථා, නෑයන් පිළිබඳකථා, වාහන පිළිබඳකථා, ගම් නියම්ගම්පිළිබඳ කථා, නගර දනවු පිළිබඳකථා, ස්ත්‍රීන් පිළිබඳකථා, පුරුෂයන් පිළිබඳකථා, සුරයන් පිළිබඳකථා, නානා ස්වභාවඇති කථා, ලෝක නිර්මාණය පිළිබඳකථා, සමුදුර හට ගැනීම පිළිබඳකථා, ශාශ්වත, උච්ඡේදආදී භවාභව පිළිබඳ කථා

හෝ නොකළයුත්තේය. බැනදොඩාගැනීම් නොකළ යුත්තේය. ඒ කවර හෙයින්ද යත්, මේ කථා වැඩසහිත නොවේ. මඟබඹසරට (කෙලෙසුන් ප්‍රහාණයට) හේතුනොවේ. ගැලවීමපිණිස නොවන්නේය. විරාග යපිණිස නොවන්නේය. නිරෝධයපිණිස නොවන්නේය. නිවීමපිණිස නොවන්නේය. නුවණ වැඩීමපිණිස නොවන්නේය. සම්බෝධියපිණිස නොවන්නේය. නිර්වාණයපිණිස නොවන්නේය.

මහණෙනි, පවසන්නේනම් "මේ දුක්ඛය"ම පවසන්න. "මේ දුක්ඛසමුදයම" පවසන්න. මේ දුක්ඛනිරෝධයම පවසන්න. මේ දුක්ඛනිරෝධගාමිණී පටිපදාව පිළිබඳවම පවසන්න. මේ චතුරායර්‍යසත්‍ය පිළිබඳවම කථාකරන්න. ඒ කුමක්නිසාද යත්, මහණෙනි මේ ධර්ම කතාවන් වැඩදායකය. මේ කෙලෙසුන් දුරුකරන බ්‍රහ්මචර්‍යාවට මූලිකවන්නේය. මෙය අත්හැරීමට. විරාගය, නිදහස්වීම, ගැලවීම, තත්ත්වාවබෝධඥාණය, සම්බෝධිය, නිර්වාණය ලැබීම පිණිසම පවතින්නේය.

මහණෙනි, එබැවින් මෙහිදී මේ "දුක"යැයි විය්‍යයෙන් අවබෝධකළ යුතුය. මේ දුක්ඛසමුදය'යි වියර්‍යයෙන් අවබෝධකළ යුතුය. මේ දුක්ඛනිරෝධය'යි වියර්‍යයෙන් අවබෝධකළ යුතුය. මේ දුක්ඛනිරෝධයගාමිණී ප්‍රතිපදාවය'යි වියර්‍යයෙන් අවබෝධකළ යුතුය.

(තිරච්ඡානකථා සූත්‍රයෙනි)

## සම්මා කම්මන්ත

මහණෙනි, මෙලොව ඇතැමෙක් සත්ත්වඝාතන

කරන්නේවෙයි. හරසුං නිශ්ඵලකථාවෙහි යෙදෙන්නේවෙයි. මහණෙනි, මේ කර්මාන්ත විපත්තිය'යි කියනුලැබේ.

(අංගුත්තර නිකාය ආපායික වග්ග)

හෙතෙම සංවරශීලයෙන්ද ආචරශීලී පැවැත්මෙන් යුක්තවූයේ ස්වල්පමාත්‍රවූද වරදෙහි බියවන්නේය. එහෙයින්ම මනාපැවතුම් සිල්වත්ක්‍රම ඇතිවූයේ ඉන්ද්‍රියයන් දමනය කරන්නේය. භෝජනයෙහි ප්‍රමාණය දන්නේය. සිහිනුවණින් යුක්තවූයේ සිව්පසයෙහි තුන්වැදෑරුම්වූ ශික්ෂාපදයන්හි සමාදන්වී හික්මීමෙන් යුතුවෙයි.

මේ සසුනෙහි ශ්‍රාවක තෙමේ ප්‍රාණඝාතයෙන් වැළකෙන්නේය. දඬුමුගුරු නොදරන්නේය. ආයුධ නොදරන්නේය. අකුසල්ක්‍රියා පිළිකුල් ලෙසින් බැහැරකරන්නේය. මෛත්‍රීයෙන් යුක්තව, සියළු සතුන්කෙරෙහි හිතානුකම්පාවෙන් යුක්තව වාසය කරන්නේය.

හේ අදත්තාදානය හැරදමා, නොදුන්දෑ ගැනීමෙන් වළකින්නේය. දුන්දෙයම පිළිගන්නාසුළුවූයේ, එයම ඉවසනසුළුවූයේ නොසොරවු පිරිසිදු සිතින්යුතුව වෙසෙයි.

හේ බඹසර රකින්නෙක්වෙයි. ග්‍රම්‍ය සිරිතක්වූ මෙවුන්දමින්බැහැරව හැසිරෙන්නේ එයින් වලකින්නේද වෙයි.

හේ බොරුකීමෙන් වළකින්නේවෙයි. සත්‍යයම ප්‍රකාශකරනසුළු වූයේ, සත්‍යයෙන් සත්‍යයමගලපා කථා කරන්නේය. කියන්නේය. ලොවනොරවටන්නේද වෙයි.

හේ කේලාම් නොකියන්නේය. එකිනෙකා නොබිඳවන්නේය. නොකිවයුතුදේ නොකියන්නේය. එකිනෙකා සමගි කරන්නේය. අසමගිය දුරුකරවා සාමය, සමගිය සමාදානය ඇතිකරවන්නේය. හේ පැළවෙනදෑ, පැළවුනදෑ නොසිඳින්නේය. නොකල්බොජුනින් වළකින්නේය. නටන, ගයන, වයන, විහිළුදසුන් යන මේවායින් වළකින්නේ ය. ඇඟසැරසීමට කරුණුවන මල් සුවඳවිලවුන් දැරීමෙන් වළකින්නේය. පමණඉක්මී උස්අසුන් නොකැපවූ මහඅසුන්ද යන දෙකින්ම වළකින්නේය. රන්, රිදී, මසු, කහවණු පිළිගැනීමෙන් වළකින්නේවෙයි. ස්ත්‍රීන්, කුමාරිකාවන් පිළිගැනීමෙන් වළකින්නේවෙයි, එළු, බැටළු, ගව, ආදී සතුන් පිළිගැනීමෙන් වළකින්නේවෙයි. කවර හෝ සිවුපාවුන් පිළිගැනීමෙන් වළකින්නේවෙයි. කෙත්වතු පිළිගැනීමෙන් වළකින්නේය. ගිහියනට දූත මෙහෙවර කිරීමෙහිද, ගෙන් ගෙට පණිවිඩ ගෙනයෑමෙහි යෙදීමෙන්ද වළකින්නේවෙයි. වෙළඳ ගනුදෙනුයෙන් වැළකුණේවෙයි. අල්ලස්ගෙන, හිමියන්, නොහිමි කිරීමෙන්, නානා උපායෙන් අනුන්රැවටීමෙන් අගනාදෑය නොඅගනාලෙසින් පෙන්වාකරන මායාවෙහිත් මෙකීනොකී හැම කෛරාටිකකම්වලින් වළකින්නේ වෙයි. අත්පාසිඳීමෙන්ද, මැරීමෙන්ද, රැහැන්ආදියෙන් බැඳීමෙන්ද, සැහැසිකම් කිරිමෙන්ද වළකින්නේ වෙයි.

හේ කුහක කම් කිරීමෙන් වළකින්නේය. චාටු බස් නොදොඩන්නේය. ලාභ සත්කාර ලත් අන් අයගේ සිත් පහදින ක්‍රියාන්හි නිරත නොවන්නේය. සිවුපස සඳහා කයින් බසින් ඇඟවීම් නොකරන්නේය. ලාභාකේක්ෂාවෙන්

අනුනට ගැරහීම් නොකරන්නේය. ලාභයෙන් ලාභය නොසොයන්නේ ය.

(කෙවඩ්ඪ සූත්‍රය)

## සම්මා ආජීව

ඇතැම් ශ්‍රමණනිකායන්හි මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන්වළදා නිමිත්තශාස්ත්‍රය, උත්පාතලක්ෂණ, ස්වප්නශාස්ත්‍රය, කායලක්ෂණ ශාස්ත්‍රය, විවිධ යාගහෝම කායර්‍යන් - අංගවිද්‍යාව, වාස්තුවිද්‍යාව භූත විද්‍යාව, භූරි විද්‍යාව, ශකුණ විද්‍යාව යන මෙකී හෝ මෙබඳු හෝ තිරශ්චීන විද්‍යායෙන්, මිථ්‍යාජීවයෙන් දිවිපවත්වත්ද, මේ සසුනෙහි මහණතෙමෙ, මෙකී මෙබඳුවූද, තිරශ්චින, මිථ්‍යාජීවයෙන් වැළකුනේවෙයි. මෙයද ඔහුගේ මහාශීලයක් වෙයි.

ඇතැම් ශ්‍රමණනිකායන්හි මහණබමුණෝ සැදැහැයෙන්දුන් බොජුන් වළඳා, අසෝදින චන්ද්‍රග්‍රහණය වන්නේය. අසෝදින සූයර්‍ග්‍රහණයවන්නේය. අසෝදින හිරු, සඳු, දෙදෙනා නොමගින් යෑම වන්නේය. අසෝදින නැකත්තරු නිසිමගින් යෑමවන්නේය. අසෝදින උල්කාපාතයවන්නේය. දිග්දාහය වන්නේය. භූමිකම්පනය වන්නේය. වැසි නැතිව අහස ගිගිරුම් වන්නේය. සඳ හිරුන්ගේද නැකැත්තරුන්ගේ උදාව, බැසීම, කෙලෙසීම, පිරිසිදුබව වන්නේය. චන්ද්‍රග්‍රහණය ලොවට මෙබඳුඵල ගෙනදෙන්නේය. සූයර්‍ග්‍රහණය මෙබඳුඵල ගෙනදෙන්නේය. නක්ෂත්‍ර,ග්‍රහණ මෙබඳුඵල ගෙනදෙන්නේය. සඳ, හිරු නිසිමගින්යෑම මෙබඳුඵල

දෙන්නේය. සඳ, හිරු දෙදෙනා නොමගින් යෑමෙන් මෙබඳුඵල දෙන්නේය යනාදී වශයෙන් කියනුවෝ මෙබඳු තිරස්චීනවිද්‍යායෙන් මෙබඳු මිථ්‍යාජීවයෙන් දිවිපවත්වද්ද, මේ සසුනෙහි මහණතෙමේ මේ හෝ මෙබඳුවූ තිරස්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවිකායෙන් වැළැක්කේවේ. මේද ඔහුගේ ශීලයක්වේ.

ඇතැම් ශ්‍රමණනියායයන්හි මහණබමුණෝ සැදැහැයෙන්දුන් බොජුන්වළඳා ශාන්තිකර්ම, ප්‍රණිධිකර්ම, භූරිකර්ම, පණ්ඩකයා පිරිමියෙකුකිරීම, පිරිමියා පණ්ඩකයෙකුකිරීම, මතුරුදපා මුවදෙවීම, මතුරුදපා අනුන්නෑවීම, සෙත්පතා ශාන්තිකර්ම පැවැත්වීම, දේවකන්නලව්, යාදිනිකිරීම, ගිහියන් උදෙසා විවිධාකාරයේ වෛද්‍ය ප්‍රතිකාර කිරීම, කායචිකිත්සක කටයුතුවල නිරතවීම, මේ ආදීවූ හෝ මෙබඳුවූ තිරස්චීනවිද්‍යායෙන් මිත්‍යාආජීවයෙන් දිවිපවත්වන්නේද, මේ සසුනෙහි මහණතෙම මේ හෝ මෙබඳු වූ තිරස්චීන විද්‍යායෙන්, මිථ්‍යාජීවයෙන් වැළකුණේ වෙයි. මෙයද ඔහුගේ ශීලයක්වේ.

කෙවඩ්ඪය, ඒ මහණතෙමේ ශීලසම්පන්න වූයේ, ශීලසංවර හේතුයෙන් එකද අසංවරතාවයකින් පහළවියහැකි බියක් නොදන්නේය.

කෙවඩ්ඪය, ක්ෂත්‍රියාභිශෝධයෙන්, අභිෂේකලත්, සතුරන් වනසාදමනලද, ක්ෂත්‍රියෙක් කවරඅයුරකින් හෝ එකදසතුරකු පිළිබඳ හෝ බියක් නොදන්නේද? එසේම මහණතෙමේ මෙපරිද්දෙන් ශීලසම්පන්න වූයේ, ශීලසංවර හේතුවෙන් කිසිම එකද අසංවරයකින් වියහැකි බියක් නොදකී. හේ මේ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් සමන්විතවූයේ

සිය සිත් සතන්හි නිදොස්වූ කායික, චෛතසික සුඛය විඳී. මෙසේ ඒ මහණතෙමේ මිථ්‍යාආජීවයෙන් මිදී ශීලසම්පන්නවේ.

(කෙවඩ්ඪ සූත්‍රය)

## සම්මා වායාම

කෙවඩ්ඪය, මෙසසුනෙහි මහණතෙමේ ඇසින් රූපයක්දැක ශුභාදීවශයෙන් එහි ලකුණු නොග න්නේ වෙයි. ශුභාදීවශයෙන්, අත්පාආදී අවයවයන්ගේ ආකාර සිතට නොගන්නේවේ. යම් කරුණකින් ඇස්වසානොගෙන වසන්නහුගේ චිත්තසන්තානය විෂම, ලෝභ, දොම්නස්ආදී ලාමක අකුසල ස්වභාවයෝ ලුහුබඳින්නාහුද, ඒත් ඇසෙහි සංවරය පිණිස හේ පිළිපදී. ඇසෙහි රකී. ඇසෙහි සංවරයට පැමිණේ. කනින් හඬ අසා... නාසයෙන් ගඳ ආග්‍රහණයකොට.. දිවෙන් රස ආස්වාදයකොට... කයින්, කයෙහි හැපෙනදෑ ස්පර්ශ කොට... සිතින් ධර්මාලම්භන දැන, ශුභාදී වශයෙන් ඒවායේ ලකුණු ගන්නේ නොවේ. ශුභාදී වශයෙන් අත්පා ආදී අවයවයන්ගේ ආකාර සිතට ගන්නේ නොවේ. යම් කරුණකින් කන ය... නාසය, දිව... කය... සිත, සංවරකොට නොගෙන වසන්නහුගේ චිත්තසන්තානය, විෂමලෝභ දොම්නස්ආදී ලාමක, අකුශල ස්වභාවයෝ ලුහුබඳින්නාහුද, ඒ කනෙහි, නාසයෙහි දිවෙහි, කයෙහි, සිතෙහි සංවරය පිණිස වෙරගනී, කන... නාසය... දිව... කය.... සිත... රකී. එහි සංවරයට පැමිණේ. හේ මේ ආර්‍යවූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විතවූයේ සිය සිත්සතන්හි

කෙලෙසුන් මිශ්‍රනොවීමෙන් වූ පිරිසිදු අධිචිත්ත සුඛය විඳී. කෙවඩ්ඪය, මෙසේ වනාහි මහණතෙමේ ඉන්ද්‍රියන්හි වැසූදොර ඇත්තේවේ.

(කෙවට්ඨ සූත්‍රය)

## සම්මා සති

කෙවඩ්ඪය, මහණතෙමේ කෙසේනම් සම්‍යක්ස්මෘති සම්ප්‍රජානයෙන් (සිහිනුවණින්) සමන්විතවේද යත්, මේ සස්නෙහි මහණතෙමේ ඉදිරියට යෑමෙහි, පෙරළා ඊමෙහි මනානුවණින් දැනම (එය) කරනුයේ වෙයි. ඉදිරිය බැලීමෙහි, අනු දික් (වටපිට) බැලීමෙහි මනානුවණින් දැනම (එය) කරනුයේ වෙයි. අත්පා ආදිය හැකිලීමෙහි, දිගුකිරීමෙහි, නුවණින්දැනම (එය) කරනුයේ වෙයි. සඟළසිවුරද, පාත්‍රයද, සෙසුසිවුරුද දැරීමෙහි නුවණින් දැනම කරන්නේ වෙයි. ආහාරගැනීමෙහි, පැන්බීමෙහි, ආදිය රසවිඳීමෙහි නුවණින්දැනම කරනුයේවෙයි. මළමූ පහකිරීමේදී නුවණින්දැනම කරනුයේවෙයි. ගමනෙහි, සිටීමෙහි, හිඳීමෙහි, නිදීමෙහි, කථාකිරීමෙහි, නොබිණීමෙහි, නුවණින්දැනම කරනුයේවෙයි. කෙවඩ්ඪය, මෙසේ මහණතෙම සිහිනුවණින් සමන්විත වෙයි.

කෙවඩ්ඪය, මේ සස්නෙහි මහණතෙමේ කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරින්ද, කුක්ෂි පරිහරණයට (කුසට) ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටුවෙයි. හේ යම් තැනකට නික්මයේද, අටපිරිකර පමණක් ගෙනම නික්මෙයි. අත්තටුඇති කුරුළුතෙමේ යම් යම් තැනක පියඹායේ නම්, පියාපත්බර සහිතවම, යම්සේ පියාඹාද,

එසේම ඒ මහණතෙම කායපරිහරණයට ප්‍රමාණ සිවුරින්ද, කුක්ෂිපරිහරණයට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටු වී පාසිවුරු (අටපිරිකර) පමණක් රැගෙනම යයි.

කෙටඩ්ඨය. ඒ මහණතෙමේ මේ ආයර්‍යශීල ස්කන්ධයෙන්ද, සමන්විතවූයේ, මේ ආයර්‍යඉන්ද්‍රිය සමන්විතවූයේ. මේ ආයර්‍යසන්තෘෂ්ටියෙන්ද සමන්විත වූයේ ආරණ්‍ය, වෘක්ෂමූල, පර්වත, කඳුරැළි, ගිරිගුහා ,සොහොන්, වනපෙත්, එළිමහන් සිදුරුලෙන් යන මෙකී ජනශූන්‍ය කිසි සෙනස් නක් භජනය කරයි. හේ පිඬු සෙවීමෙන් පෙරළාආයේ, දන්වැළදීමෙන් අනතුරුව පලක්බැඳ උඩුකය කෙළින් පිහිටුවා කමටහනට යොමු කොට සිහිඑළවා හිඳී.

හේ පංචඋපාදානස්කන්ධය (ලොව) කෙරෙහි ඇල්ම හැරදැමීමෙන්, යටපත් කිරීමෙන් පහවූ අවිද්‍යාවෙන් යුත්සිතින් වෙසෙයි. අවිද්‍යාවකෙරෙන් සිත පිරිසිදුකෙරේ. ක්‍රෝධය, භයහැර ව්‍යාපාදරහිත සිතැත්තේ සියළු පණඇති සතුන්කෙරෙහි හිතානුකම්පාඇතිව වෙසෙයි. පසුබෑම (ථිනමිද්ධය) හැරලුයේ, දිවා රෑ දෙකෙහිම දුටු එළිය හඳුනනු හැකි පිරිසිදු සංඥා ඇත්තේ, සිහියෙනුත්, නුවණිනුත් යුක්තව වෙසෙයි. ථිනමිද්ධය කෙරෙන් සිත පිරිසිදුවූයේ සිත නොසන්සුන්බවත් පසුතැවිල්ලත් සිතින්දුරලා, නොසන්සුන්බැවින් තොරව සන්සිඳුණු චිත්තසන්තානය ඇත්තේ පසුතැවිලි, කුතුහලය දෙක කෙරෙන් සිත පිරිසිදුකෙරෙයි. සැකයදුරලා, පහවූ සැකඇත්තේ කුසල්දහමෙහි සැකනොකරනුයේ සැකය කෙරෙන් හිත පිරිසිදුකරයි.

ඒ මහණතෙමේ විතර්ක, විචාරයන්ගේ සංසිඳීමෙන්, සියසන්තානයෙහි උපන්, සියසන්තානය පහදවන, ශ්‍රද්ධාව හා එක්වයෙදුණ සිත එකඟබව ඇති විතර්කනැති සමාධියට එළඹෙන්නේය.

(කෙවඩ්ඪ සූත්‍රය)

## සම්මා සමාධිය

මේ සසුනෙහි මහණතෙම් ආරණ්‍ය, වෘක්ෂමුල පර්වත කන්දර ගිරිගුහා, තැනිතලා වනප්‍රස්ථ හිස්භූමි ජනශූන්‍යවූ සෙනසුනක් ඇසුරුකෙරේ. කයෙනුද විවේකීව හිඳී. තනිවම ගමට පිඬුසිඟා යයි. තනිවම ආපසු එයි. හුදෙකලාවම කායවිවේකයද චිත්තවිවේකයද පවත්වයි.

පළමුවන ධ්‍යානයට සමවන්නහුගේ සිත, නීවරණයන් ගෙන් වෙන්වෙයි. දෙවැනි ධ්‍යානයට සමවන්හුගේ සිත, විතර්ක විචාරයන්ගෙන් වෙන්වෙයි. තුන්වැනි ධ්‍යානයට සමවන්හුගේ සිත, ප්‍රීතියෙන් වෙන්වෙයි. සතරවැනි ධ්‍යානයට සමවන්හුගේ සිත, සුවදුක්දෙකින් වෙන්වෙයි. ආකාසානඤ්චායතනයට සමවන්හුගේ සිත රූපසංඥා, පටිඝසංඥා, (කෝපසංඥා) නානත්තවසංඥාවෙන් වෙන්වෙයි. විඤ්ඤානඤ්චායතනයට සමවන්හුගේ සිත ආකාසානඤ්චායතන සංඥාවෙන් වෙන්වෙයි. අකිඤ්චඤ්ඤායතනයට සමවන්හුගේ සිත විඤ්ඤානඤ්චායතන සංඥාවෙන් වෙන්වෙයි. නෙවසඤ්ඤා නාසඤ්ඤාටතනයට සමවන්හුගේ සිත අකිඤ්චඤ්ඤායතන සංඥාවෙන් වෙන්වෙයි. සෝවාන්හුගේ සිත සක්කායදෘෂ්ටියෙන්, කුතුහලයෙන් ශීලය වරදවා

ගැනීමෙන් හා ඒ සමග යෙදෙන කෙලෙසුන්ගෙන්ද වෙන්වෙයි. සකෘදාගාමිහුගේ සිත නොහික්මුණු කාමරාග සංයෝජනයෙන් පටිඝ(කෝප/බිය)සංයෝජනයෙන් සත්ත්වයාතුළ නැවත නැවත උපදනා ක්ලේශයන් (කාම රාග - පටිඝ - මාන - දිට්ඨි විචිකිච්ඡා - භව රාග - අවිජ්ජා) ගෙන් වෙන්වෙයි.

අනාගාමිහුගේ සිත සියුම්වූ සියළු සංයෝජනයන් ගෙන් වෙන්වෙයි. සියළු ක්ලේශයන්ගෙන් වෙන්වූයේ වෙයි.

රහත්හුගේසිතරූපරාගයෙන්,අරූපරාගයෙන්මානයෙන්, නොසන්සුන්බවින් අවිද්‍යාවෙන් සියළුක්ලේශයන්ගෙන් හා සර්වසංස්කාර නිමිත්තයන්ගෙන්ද වෙන්වූයේ වෙයි.

(මහානිද්දේශපාලිය)

කෙවඩ්ඪය, එපරිද්දෙන්ම මහණතෙමේ මෙසේ සමාධිගත සිත පිරිසිදු කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් ප්‍රහීණවූකල්හි, උපක්ලේශයන් පහවූකල්හි විදර්ශනාඥාණය පිණිස සිත අභිමුඛකරයි. ඒ අතට නමාහරියි. හෙතෙම "මගේ" මේ කය වූකලී රූපීය, සතරමහාභූතයින්ගෙන් හැදුනේය. මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් නිපන්නේය. බත්කොමු ආදී අහරින් වැඩුණේය. අනිත්‍යබවද, දුගඳහරනට සුවඳවිලවුන් ඉලියයුතු බවද, ලෙඩ දුරලනුවට පිරිමැදීම් වැනිදෑ කළයුතුබවද, ඒ කළත් වේදනාබවද, විසිරෙනබවද, යන මේදෑ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ සිතද මෙහි ලැගගත්තේය. මෙහි බැඳුනේයැ'යි මෙසේ දැනගනියි. හේ

මෙසේ එකඟවූ සිත පිරිසිදුවූ කල්හි අන්සත්ත්වයන්ගේ සිත් පිරිසිඳ දක්නා නුවනපිණිස සිත යොමුකෙරෙයි. හේ අන් සත්ත්වයන්ගේ සිත සියසිතින් පිරිසිඳදනියි. රාගසහිත සිත, රාගසහිත සිතැ'යිද, දැනගනී, රාග රහිත සිත, රාගරහිත සිතැ'යි දනී. ද්වේශසහිත සිත, ස්වේශසහිත සිතැ'යි දනියි, ද්වේශරහිත සිත ද්වේශරහිත සිතැ'යි දනියි. මෝහසහිත සිත මෝහසහිත සිතැ'යි දනියි. මෝහරහිත සිත, මෝහරහිත සිතැ'යිද දැනගනී. හැකුළුණු (සංක්ෂිප්ත) සිත හැකුළුණුසිතැ'යි දනියි. විසිරුණු (වික්ෂිප්ත) සිත විසිරුණුසිතැ'යි දනියි. රූපාවචරසිත රූපාවචරසිතැ'යි ද, අරූපාවචරසිත අරූපාවචරසිතැ'යි දනියි. යළිඋපත සිදුකළහැකි සිත (සඋත්තරසිත) යළිඋපත සිදුකළහැකි සිතැ'යි දනී. යළිඋපත සිදුනොකරන සිත යළිඋපත සිදුනොකරන ශ්‍රේෂ්ඨ සිතැයි දනියි. තැන්පත් නොවුනසිත තැන්පත් නොවුන සිතැ'යි දනියි. තැන්පත්වූ සිත තැන්පත්වූ සිත යැයි'ද දනී. නොමිදුණු (අවිමුක්ත) සිත, නොමිදුණු සිතැ'යි දනියි. මිදුණු සිත (විමුක්ත සිත) විමුක්ත සිතැ'යි දනියි.

ආකාසාවඤ්ඤායතනයෙහිද ආස්වාද තිබේ.

අකිඤ්චඤ්ඤායතනයෙහිද ආස්වාද තිබේ.

විඤ්ඤාණචඤ්ඤායතනයෙහිද ආස්වාද තිබේ.

නෙවසංඥානාසංඥායතනයෙහිද ආස්වාද තිබේ.

ආස්වාද පවතිනුයේ කොතැනකද? එය භව කාරකවේ. යළිඋපත ඇතිකරවන්නකි. එහෙයින් මේ ධ්‍යානඵලවලට සමවැදීමෙන් හෝ "නිවන" ප්‍රත්‍යක්ෂකළ නොහැකිය.

"ඇවැත්නි, භව නිරෝධය නිර්වාණය, භව නිරෝධය නිර්වාණ'යි අන්සංඥාවක් උපදනේය. ආත්මසංඥාවක් නිරුද්ධවන්නේය. ඒ කෙසේද?

ඇවැත්නි ගිනිගත් රුක්පොතු, ගින්නෙහිම අන්ගිනිසිලෙක් උපදවන්නේය. අන් ගිනිසිලක්ම නිරුද්ධවන්නේය.

ඇවැත්නි එපරිදිම භවනිරෝධය, නිර්වාණය, භවනිරෝධයම නිර්වාණයය'යි ආත්මසංඥාවක් උපදවන්නේය. ආත්මසංඥාවක් නිරුද්ධවන්නේය.

ඇවැත්නි, එසමයෙහි මම භවනිරෝධය නිර්වාණය යයි යන සංඥාඇතියෙම් වූයෙමි."

(සාරිපුත්ත සූත්‍රයෙනි)

මහණෙනි, යමෙක්හි පෘථිවිධාතුව නැද්ද, අපෝධාතුව නැද්ද, තේජෝධාතුව නැද්ද, වායෝධාතුව නැද්ද, ආකාසාචඤ්ඤායතන සිතනැද්ද, නෙවසංඥා නාසංඥායතන සිතනැද්ද, මේ (ස්කන්ධ) ලෝකය නැද්ද, මෙයින් උපදනා අන්‍ය (ස්කන්ධ) ලෝකයකුත් නැද්ද, එහි අඳුරක් නැතිබැවින් අඳුර දුරලන්නට සඳ හිරු දෙදෙනෙකුත්නැද්ද, එසේවූ ඒ ආයතනය මාර්ගඵල සිතට අරමුණුවන නිවන ඇත.

මහණෙනි, එහි කිසිවකුගේ ඊමක් - යෑමක් සිටීමක් මරණයක් මැරීඉපැත්මක් නොකියමි. මෙය කිසිවක නොපිහිටි, ප්‍රයත්නයන්ගෙන් නොපවත්නා,

කිසිමඅරමුණක නොඑල්බෙන, දහමකි. මෙයම දුකෙහි කෙළවරය.

(පළමු වන නිර්වාන සූත්‍රය)

ඇවැත්නි, මෙහි මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සර්වප්‍රකාරයෙන්ම ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරෝධයට එළඹ වෙසෙමි. ඇවැත්නි ඒ මට හෝ මම සඤ්ඤාවෙදයිතනිරෝධයට එළැඹවෙසමි'යි හෝ මම සඤ්ඤාවෙදයිතනිරෝධයට සමවදිමියි හෝ මම සඤ්ඤාවෙදයිතනිරෝධයෙන් නැඟී සිටියෙමි,යි හෝ මෙබඳු සිතක් නොවේ.

(නිරෝධසමාපත්ති සූත්‍රයෙනි)

## සෝතාපත්ති මග

ඇවැත්නි, හේතුවෙන් උපදින යම්ධර්මතාවයක් ඇත්තේද? ඒවායේ හේතුව තථාගතතෙමේ වදාළේය. ඒවායේ යම් නිරෝධයක්වේද එයද වදාළේය. මහාශ්‍රමණතෙමේ මෙබඳුවාද ඇත්තේය. යනුවෙන් ආයාභික්ෂුව මේ ධර්මක්‍රමය මාහට පැවසීයයි ශාරිපුත්‍රපරිභ්‍රාජකතෙමේ මුගලන් පරිබ්‍රාජකයාහට පැවසීය.

ඉක්බිති මුගලන් පරිබ්‍රාජකයාහට මේ ධර්මක්‍රමය අසා, රාගාධි රජස්පහවූයේ, කෙලෙස්පහවූයේ, යමක් හටගැනීම ස්වභාවයකොට ඇත්තේද? ඒ සියල්ල නිරුද්ධවීම ස්වභාවයකොට ඇතැ'යි යන සෝතාපත්ති මග්ගඤාණය උපන්නේය.

මෙසේ, මෙපමණක්මවූවත් එයමධර්මයවේ. බෙහෝදෙනා විසින් අනන්තවූ අප්‍රමාණකලක් නොදුටු ශෝකය ඉක්මවාගිය ඒ නිර්වාණපදය මුගලන් පරිබ්‍රාජක තෙමේ අවබෝධකළ සේක.

(විනය පිටකය)

මහණෙනි, යම්කලක රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාණ, මනසයන මේ සයතැන් පිළිබඳව ආයර්‍යශ්‍රාවකයාගේ සැකය ප්‍රහීනවූයේවේ නම්, දුකෙහිත්, ඔහුගේ සැකය ප්‍රහීණවූයේ වෙයි. දුක හටගැනීමෙහිත්, ඔහුගේ සැකය ප්‍රහීනවූයේවෙයි. දුක නැවැත්වීමෙහිත් ඔහුගේ සැකය ප්‍රහීනවූයේවෙයි. දුක පමුණුවන පිළිවෙතෙහිත් ඔහුගේ සැකය ප්‍රහීනවූයේවේ.

මහණෙනි, අපායෙහි නොවැටෙනසුළු නියතවූ සම්බෝධිය පිහිටකොට ඇති මේ ආයර්‍යශ්‍රාවකයා සෝතාපන්නයැයි කියනු ලැබේ.

(සොතාපන්න වග්ග - සංයුක්ත නිකාය)

මහණෙනි,

ඇසඅනිත්‍යය, පෙරළෙනසුළුය. වෙනස්වනසුළුය.

කනඅනිත්‍යය. පෙරළෙනසුළුය. වෙනස්වනසුළුය.

නැහැයඅනිත්‍යය. පෙරළෙනසුළුය. වෙනස්වනසුළුය.

දිවඅනිත්‍යය, පෙරළෙනසුළුය. වෙනස්වනසුළුය.

කයඅනිත්‍යය, පෙරළෙනසුළුය. වෙනස්වනසුළුය.

මනසඅනිත්‍යය. පෙරළෙනසුළුය. වෙනස්වනසුළුය.

මහණෙනි, යමෙක් මේ ධර්මතාවයන් මෙසේ විශ්වාසකරයිද, පිළිගනියිද, ස්ථිරලෙසින් වටහාගනියිද, ඒ පුද්ගලතෙමේ ශ්‍රද්ධාව, ධනයකොට ඇත්තේයැ'යි කියනුලැබේ. හෙතෙම ආර්‍යමාර්ගයට පිවිසියේය. සත්පුරුෂභූමියට වැදගත්තේය. පෘථග්ජනභූමියට ඉක්ම ගියේය. බැහැරකළේය.

යම් කර්මයක්කොට නිරයටවේව'යි තිරිසන් යෝනියටවේව'යි. ප්‍රේත විෂයටවේව'යි. උප්පත්ති ලැබීමට හේතුවන්නේනම් එවන් කර්ම නොකළයුත්තේය. ඉන් බැහැරවියයුත්තේය. යම්තාක් සෝතාපත්තිඵලය සාක්ෂාත්නොකෙරේද? ඒතාක් කලුරියකරන්නට (මිය යන්නට) ද සුදුසු නොවේමය.

මහණෙනි, යමෙකු ධර්මවිදර්ශනා අවබෝධවූයේ දැනීමඇතිවූයේ, වැටහීමඇතිවූයේ, කාරණාවන් පිළිබඳ ඉවසීමඇතිවූයේ, ධර්මමාර්ගයට බැසගත්තේ ධම්මානුසාරී (ධර්මයහඳුනා ඒඅනුව ජීවත්වන්නා)යැ'යි කියනු ලැබේ.

හෙතෙම පිළිගත් ආර්‍යපිළිවෙත් අනුව ආර්‍යමාර්යට පිවිසසිටියේ වෙයි. සත්පුරුෂභූමියට බැසගත්තේය. පෘථග්ජනභූමිය ඉක්මවූයේය.

යම් කර්මයක්කොට නිරයට හෝ තිරිසන්යෝනියට හෝ ප්‍රේතවිෂයට හෝ එළැඹ, උප්පත්තිය සිදුවන්නේනම් එවන් කර්ම සිදුනොකළ යුත්තේමය. යම්තාක් සෝතාපත්තිඵලය ප්‍රත්‍යක්ෂ නොකෙරේද, සාක්ෂාත්

නොකෙරේද, ඒතාක් කලුරියකරන්න. (මිය යන්නට) නුසුදුසුය.

මහණෙනි, යමෙක් මේ ධර්මවිදර්ශනා නුවණින් දනීනම් මෙසේ දකීනම් ඒ තැනැත්තේ සෝතාපන්නයැ'යි කියනුලැබේ. හෙතෙම සතරඅපායෙහි නොවැටෙන්නේය. නියත ධර්මාවබෝධයෙන්යුතු හෙතෙම සම්බෝධිය පිහිටකොට ඇත්තේය.

(චක්ඛු සූත්‍රය)

උත්පාදය, සංස්කාරය හා අනුත්පාදය නිවන'යි. දතයුතු රූපස්කන්ධය, ආහාරය සමුදයකොට ඇත්තේය. වේදනා, සංඥා සංස්කාරයෝය. යන තුන් ස්කන්ධයෝ ස්පර්ශය සමුදයකොට ඇත්තේය. විඥාණ ස්කන්ධය නාමරූප සමුදයකොට ඇත්තේය.

(පටිසම්භිදා මාර්ගය)

පින්වත් ආනන්දය, මෙයම හේතුවය. මෙයට මූලික කාරණය මෙයමය. විඥාණයට උපකාරවන ධර්මය, එනම් නාමරූපයයි.

නාමරූප ප්‍රත්‍යකොටගෙන විඥාණය පැවැතීමය. විඥාණය රූප ප්‍රත්‍යකොටගෙන නාම පැවැතීමය.

(මහා නිදාන සූත්‍රය)

සාමාන්‍ය මිනිසාගේ ඉපදීම යනු, සංසාරික ජීවිතයේ බරපතල සකස්වීමකි. එහෙත් ඔහු ඉපදීමකට හේතුවූ අභ්‍යන්තරික පසුබිම කිසිසේත්නොදනී. හේතුඵල දහමක ක්‍රියාකාරීත්වය තුළින් ඉපදීම සිදුවනබව ඔහු නොදනී.

යථාස්වභාවය අවබෝධකර ගන්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවකයා කිසිවකට නොඇලී, සියල්ලෙන්ම නිදහස් වෙයි.

(ජාති ධම්ම සූත්‍රය)

**භවේකෝ අසති ජාති නහෝති**

**භව නිරෝධා - ජාති නිරෝධෝ**

භවය නිරුද්ධවීමෙන් ඉපදීමනිරුද්ධ නොවන්නේය. භවය නැතිකල්හි - ඉපදීම නිරුද්ධවන්නේය.

(ගෝතම සූත්‍රය)

ස්වාමීනි, භවය යනුවෙන් ධර්මකරුණක් කියනුලැබේ. භවය ඇතිවන්නේ කුමන කරුණු පදනම්කරගෙනද?

පින්වත් ආනන්දය, කාමධාතුවෙහි විපාක වින්දයුතු කර්මයක් සකස්වී නැතිනම්, කාමභවයක් කියාදෙයක් ගැන කථාවක් කළහැකිද?

ස්වාමීනි, එසේ කළනොහැකි වන්නේමය.

මෙසේ පින්වත් ආනන්දය, කර්මය කුඹුර වේ. (කම්ම කෙත්තං) විඥාණය පැලවනදෙය වේ. (විඥාණං බීජං) තණ්හාව පැළහටගන්වන වුවමනා ජලයවේ. (තෘෂ්ණා සීනේ හෝ) අවිද්‍යාවෙන් වැසීගිය තණ්හාවෙන් බැඳීගිය සත්ත්වයන්ගේ විඥාණය හීනධාතුවෙහි පිහිටියේය. චේතනාව හීනධාතුවෙහිම පිහිටියේය. ප්‍රාර්ථනය හීනධාතුවෙහිම පිහිටියේය.

මේ ආකාරයට, මත්තෙහි යළිත් භවයක් හේතුකොටගෙන ඉපදීම සිදුවන්නේය.

(අංගුත්තර නිකාය - තික නිපාතය)

එසේ නම් භවය යනු ඉපදීමනොව ඉදීමට හේතුවනදේය.

මහාකොට්ඨිත තෙරණුවෝ සැරියුත්හිමියන්ගෙන් මේ ප්‍රශ්නය ඇසූහ.

ප්‍රිය ආයුෂ්මතුනි, අනාගතයෙහි යළිත් භවයක් සකස්වීමෙන් ඉපදෙන්නේ කෙසේද? එයට සැරියුත් මා හිමියන් වදාළේ, ඉතාමත් පැහැදිලි පිළිතුරකි.

ප්‍රිය ආයුෂ්මතුනි, අවිද්‍යාවෙන් වැසීගිය, තණ්හාවෙන් බැඳීගිය සත්ත්වයන්, උපනූපන්තැන සතුටින් පිළිගැනීම හේතුවෙන් මෙසේ අනාගතයෙහි යළිත් භවයක් සකස්වීමෙන් ඉපදීම සිදුවෙයි.

ඉන්පසුව කොට්ඨිත තෙරුන් විමසුවේ...."

ප්‍රිය ආයුෂ්මතුනි, අනාගතයේ යළිත් භවයක් සකස් නොවීමෙන්, ඉපදීම ඇතිනොවන්නේ කෙසේද?

ප්‍රිය ආයුෂ්මතුනි, අවිද්‍යාවදුරුවීමෙන් (උතුම් අරහත්ඵලය නම්වූ) විද්‍යාව පහළවීමෙන් තණ්හාව නිරුද්ධවීමෙන් මෙසේ අනාගතයට යළිත් භවයක් සකස්නොවීමෙන් ඉපදීමක් ඇති නොවේ.

(මහාවේදැල්ල සූත්‍රය)

## දෙව්යෙක්

ස්වාමිනී...

සියළු ආස්‍රවයන් නැසූ, යලි පුනර්භවයක් නැති රහත්වූ මහණෙකු, මම කියමි කියාත් "මට" ය කියාත්, කියති, ඒ කෙසේනම් වේද?

භාග්‍යවතුන්වහන්ස, සිවුමඟින්කළ කිසඇති ආස්‍රවයන්නැසූ, අවසන් ශරීරයදරන , යම් රහත්මහණෙක් වේද? ඒ මහණතෙමේ මානයට පැමිණ හෝ "මම" කියමි'යි කියාත් කියන්නේද? හෙතම "මට කියති" කියාත් කියන්නේද?

## භගවත්හු

දේවතාවුනි, ප්‍රහීණවූ මානඇති ඔහුට, මානය ඇතිවීමක් නොවන්නේය. ඔහුවිසින් මානය ඇතිවන සියළුකෙලෙසුන් වෙසෙසින් නසනලද්දාහ. මනානුවණ ඇති හෙතෙමේ මඤ්ඤනාවන් ඉක්මවූයේය. හෙතෙම මම "කියමි" යි කියාත් කියන්නේය. හෙතෙම මටකියති'යි කියාත් කියන්නේය. දක්ෂවූ ඒ රහත්තෙමේ ලෝකයෙහි ව්‍යවහාරය දැන, ව්‍යවහාර මාත්‍රයන් පමණක්ම ව්‍යවහාර කරන්නේය.

(අරහත්ත සූත්‍රය - සංයුක්ත නිකාය)

රාගාධික්ලේශ මේ හැම එකක්ම ගින්නක්, බුදුපියාණන් වහන්සේ වදාළේ "භව නිරෝධය" "නිවන" බවයි. නිවන කියන්නේ භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂයයි.

වර්තමානයේ බොහෝ දෙනෙකු කරනුයේ රාග ද්වේෂ මෝහගිනි නිවාගැනීම නොව ඒවා නිවියහැකිලෙස අදහාගත් වැරදික්‍රම භාවිතා කරමින් තවාගැනීම පමණි. එය හරියට ගිනිඅඟුරු ඇති තැනකට සමීප වුණ කුෂ්ඨරෝගියෙකු එතැන ඉඳගෙන තමන්ගේ වේදනාවන් නැතිකරගන්න දරන උත්සාහයක් වගේ

(මාගන්ධි සූත්‍රයෙනි)

කුෂ්ඨරෝගියා එතැන ඉඳගෙන කරන්නේ කුමක්ද? නිවාගන්නඑක නොවෙයි. තවාගන්නඑකයි. ඔහුගේ වේදනාවල් එයින් පහවෙන්නේ නැහැ.

* * *

මේ සම්‍යක්දර්ශනය කුමක්සඳහාද?

මේ සම්‍යක්දර්ශනය සසරඅවබෝධය (නිබ්බිදාව)

සඳහායි.

නිබ්බිදාව කුමක්සඳහාද?

විරාගය (ඇල්මඅත්හැරීම) සඳහායි,

විරාගය කුමක්සඳහාද?

විමුක්තිය (නිවන) සඳහායි.

නිවන කුමක්සඳහාද?

රාධය, නුඹ මේ ප්‍රශ්නවල සීමාවක් ඉක්මවාගියා. ඒකයි ඔයවිදියේ ප්‍රශ්නයක් ඇහුවේ. මේ ශාසන බ්‍රහ්මචරියාව, නිවනෙහිම ගැලීතිබෙනවා. හරියට ගංගාව මුහුදටගලායන්නා වගේ, නිවන පරමනිෂ්ඨාවකරගෙන තිබෙනවා.

(රාධ සූත්‍රයෙන්)

මේ සත්‍ය අවබෝධකරන්න අමුතුඑකක් ඈතින් දකිනදෙයක් අවශ්‍යනැහැ. මේ ආර්‍යඅෂ්ටාංගික මාර්ගය යම් අවස්ථාවකදී සම්පූර්ණකළා නම් එතැනම නිවන.

විභාග ප්‍රශ්නපත්‍රයට පිළිතුරු ලිව්වානම්, ඒවා පරීක්ෂාකර බලා ප්‍රතිඵල නිකුත්කරන තෙක් ඉන්න ඕනේ. මේ ආයසී පරීක්ෂණයෙන්, විභාගයට පිළිතුරු සැපයූ ක්ෂණයෙහිම විභාගයෙන් සමත්, අමුතුසහතික අවශ්‍යනැහැ. රහතන්වහන්සේලා ප්‍රත්‍යක්ෂයලබා ඉවරයි. ඒ නිසා තමයි නිවන සාක්ෂාත්කළයුතු ධර්මයක් කියලා කියන්නේ. බ්‍රහ්මචාරියාවත් අවසානයි. ජාති, ජරා, මරණ ඒහැම එකක්ම නිදහස්, ඒ ප්‍රත්‍යක්ෂයලබා අවසානයි.

කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු
(නිවනේ නිවීම)

මොකටද නිවන්ලබන්නේ? කියා කෙනෙකු අහන්නට පුළුවනි. ඕකට උත්තර හොයන්න ගිහිල්ලා සමහරු අතරමංවෙනවා.

තණ්හාවෙන් ඉදිරිපත්වන හැමදෙයකම ඉදිරියටයෑමක් තියෙනවා. පරමාර්ථයක් අපේක්ෂාවක් බලාපොරොත්තුවක් තියෙනවා. නිවනෙහි එවන් පරමාර්ථයක් නැහැ. තණ්හාව ක්ෂයකිරීමම අරමුණ කරගත්තොත් - ඒ තණ්හාව ක්ෂයවන අවස්ථාවේදී තවත් කරන්නදෙයක් නැහැ. ඒකයි ස්වභාවය. ඒකයි ධර්මතාවය. ඒකයි සත්‍යය. ප්‍රත්‍යක්ෂකළ යුත්තේද එයයි. තෘෂ්ණා සිත්වලින් බැහැරවූ කෙලෙස්සිතුවිලි බැහැරකර, සිත නොසැලෙන තත්වයට පැමිණිකළ, ආස්‍රවයන්ගේ ක්ෂයවීම පිළිබඳ, විදර්ශනා සිතට එළැඹෙයි. හේ මෙය දුකක්බව ඇතිසැටියෙන් දැනගනියි. දුක ඇතිවීමේ ස්වභාවයද දැනගනියි. දුක නැතිකිරීමේ ස්වභාවයද දැනගනියි. හෙතෙම ආස්‍රවයන්ගේ ස්වභාවයන් දන්නාහෙයින් මේ

ආස්‍රවයෝය'යි දැනගනියි. ආස්‍රව නිරෝධයද දැනගනියි. මෙසේ අවබෝධය ලබන ඔවුනගේ සිත, කාමාස්‍රවයන්ගෙන් බැහැරවෙයි. (මිදෙයි) කාමාස්‍රවයන් බැහැරවූවිට, එසේ කාමාස්‍රවයන් බැහැරවීම පිළිබඳ ප්‍රත්‍යවේක්ෂා ඥානය පහළවෙයි. සත්‍යාවබෝධය පිණිස සොළොස්ආකාර කෘත්‍යභාවයහැර අනෙක් මාර්ගයක් නැතැ'යි දැනගනියි. දුක්ඛසමුදය, නිරෝධමාර්ග, සත්‍යසතර සෝවාන්සකෘදාගාමී, අනාගාමී, අරහත්, මාර්ගසතර ප්‍රහාණ පරිඥෙත්‍ර, සච්ඡකිරියා භාවනා කෘත්‍යසර වශයෙන් දනී. ජාතිය ක්ෂයවීයැයිද බ්‍රහ්මචාරියාවෙහි හැසිරීම් නිමවීයැයිද දැනගනී.

## සන්දක

සන්දක තොපට උපමාවක් පවසමි. මෙලොව ඇතැම් ප්‍රඥාවන්ත මිනිසුන් උපමාවක් තුළින්ද නිසිඅරුත දැනග නියි. කවරෙකුගේ හෝ අත් පා සිඳදමා ඇත්තේ යැ'යි ගනිමු. එවන් තැනැත්තෙකු ඇවිදීමට සිතන්නේවුවද, නැඟිටුවීමට සිතන්නේවුවද, නිදන්නට සිතන්නේවුවද, නිදිවරන්නට සිතන්නේවුවද, ඔහුගේ අත්පා සිඳදමා ඇත්තේමය. ඒ බැව්දකින ඔහු, තමාගේ අත්පා සිඳදමා ඇතිබව ප්‍රත්‍යක්ෂකරගනී. එලෙසින්ම සන්දකය, ආස්‍රවයන් ක්ෂයකළ බඹසරවසා නිමකළහැකි සියල්ලකර නිමාවූ, සසර බරින්නිදහස්වූ සැහැල්ලුවූ භව සංයෝජනයන් ක්ෂයකර රහත්බවඇති මහණෙක්වේද, හෙතෙම ඇවිදිනවිටද, නැගීසිටිනවිටද, නිදනවිටද, නිදිවරනවිටද, භවසංයෝජනයන්ගෙන් තොරව සිහියෙන්ම ඒවා පවත්වනුයේ, කවරහෝ ආකාරයක ආස්‍රවයෝ පහළ

නොවන්නාහ. ඒ බැව් ප්‍රත්‍යවේක්ෂා කරනුයේ මාගේ සියළු ආස්‍රවයන් ක්ෂයවී ඇත්තේ යැයි එලෙසින්ම දැනගනියි.

(සන්දක සූත්‍රයෙනි)

මහණෙනි, සෝපාදිශේෂ නිර්වාණ ධාතු කවරේද?

මහණෙනි, මේ සස්නෙහි මහණතෙමේ ආස්‍රවයන් පහකළ, බඹසරඉක්මවූ වඩනලද සතරසිවටන් ඇතිව කෙලෙස් ප්‍රහාණයකොට රහත්බවට පැමිණියේ වේ. භව බන්ධනයන්ගෙන් මිදුණු, මනාකොටලැබූ අවබෝධයෙන්, සියළු කෙලෙසුන්ගෙන් මිදුණු, ඒ රහත්හු නිරුද්ධනොකළ ඉන්ද්‍රියයන්හේතුවෙන් ඉටුඅනිටු අරමුණු ලබයිද, සැප දුක් විඳියිද, ඒ පංචඋපාදානස්කන්ධය වන්නාහු වෙත්, ඒ රහත්හුගේ, රාගක්ෂය, ද්වේෂාක්ෂය, මෝහක්ෂයවේද,

මහණෙනි, මේ (ක්ලේශ පරිනිර්වාණය) සෝපාදිශේෂ නිර්වාණ ධාතු යැයි කියනු ලැබේ.

මහණෙනි, අනුපාදිශේෂ නිර්වාණධාතු කවරේද?

මහණෙනි, මේ සස්නෙහි මහණතෙම, රහත්වූයේ පහකළ ආස්‍රවඇතිවූයේ, වැසනිමවූ බඹසරඇතියේ, කරනලද සිව්මගකිසඇතියේ බහාතබනලද කෙලෙස්බර ඇතියේ පිළිවෙලින් පැමිණි රහත්බව ඇතියේ පිරිහුණු භවබැඳුම්ඇතියේ මනාකොට නුවණින් දැන කෙලෙසුන්ගෙන් මිදුනේවේද, මහණෙනි ඒ රහත්හුගේ සියළු වේදනාවෝ මේ අත්භවයේදීම, තෘෂ්ණාවෙන් බැහැරකොට අතිශයින් සන්සුන්වන්නාහු, සිහිල්වන්නාහුය.

මහණෙනි, මේ (ස්කන්ධපරිනිර්වාණ) අනුපාධිශේෂ නිර්වාණධාතු යැයි කියනු ලැබේ.

ප්‍රඥාවේ ඇස්ඇත්තාවූ තෘෂ්ණා දෘෂ්ඨීන්ගෙන් බැහැරවුනාවූ, ඉටුඅනිටු අරමුණු විෂයෙහි නොසැලෙන ගුණයෙන් යුක්තවූ බුදුරදුන් විසින් මේ නිර්වාණ ධාතුහු දෙදෙනක් වදාරණ ලදහ. එකක් මේ අත්භවයට අයත් වූ (දිට්ඨ ධම්මික) උපාදානයෙහි ගැනියහැකි ස්කන්ධශේෂසහිතවය. භවයෙහිලා නැමීම ඇතිකරන ස්වභාවයන්වූ තෘෂ්ණාවන්ගෙන් බැහැරවූයේවේ. යම් මේ නිර්වාණ ධාතුයෙක්හි සර්වප්‍රකාරයෙන් භවයෝ නිරුද්ධවෙත්ද, ඒ අනුපාදිශේෂනිර්වාණ ධාතු තොමෝ සම්පරායික හෙවත් මරණින්මත්තෙහිවේ.

යම්කෙනෙක් මේ ගිනිය නොහැක්කාවූ ස්වභාවයන්වන නිර්වාණපදය දැන, තෘෂ්ණාව ක්ෂය කිරීමෙන්, මිදුණු සිත්ඇත්තාහුවෙත්ද, ඔහු "ධම්මසාර" නම් වූ, රහත්බව ලැබීමෙන් නිවනෙහි යෙදුණාහුවෙත් (නොහොත් ධම්මසාර නම් වූ නිර්වාණාධිභාවයන් පහළ කළහු වෙත්)

(නිර්වාණ ධාතු සූත්‍රය)

## ආනාපාන - දිට්ඨි අවබෝධ

ආශ්වාසය ඇරඹෙනතැනක් නැත. ආශ්වාසය නිමවනතැනක්ද නැත. ආශ්වාසය ඇරඹෙනතැනක් නැත්තේ මෙන්ම නිමවනතැනක්ද නැත්තේ ආශ්වාසය පවතිනතැනක්ද නැත්තේමය.

ප්‍රශ්වාසය ඇරඹෙනතැනක් නැත්තේ, ප්‍රශ්වාසය නිමවනතැනක්ද නැත්තේය. ප්‍රශ්වාසය ඇරඹෙනතැනක්

හෝ ප්‍රශ්වාසය නිමවනතැනක් නොමැතිකළ - ප්‍රශ්වාසය පවතිනතැනක්ද දැකියහැක්කේ නොවේ.

ආශ්වාසයද හේතුඵලයකි. ප්‍රශ්වාසයද හේතුඵලයකි.

ආශ්වාසය ප්‍රශ්වාසය ඇතිසේ දකින්නේ සක්කායදිට්ඨිය හෙවත් අවිද්‍යාවයි.

ආශ්වාසය, ප්‍රශ්වාසය නිරෝධය ප්‍රත්‍යක්ෂකරනුයේ සම්මාදිට්ඨියයි. විද්‍යාවයි.

## සප්ත බෝධ්‍යංග

මහණෙනනි, භාවනාවෙන් ප්‍රහීනකළයුතු ආස්‍රවයෝ කවරේද?

මහණෙනි, මේ ශාසනයේ මහණනතෙමේ නුවණින් සලකා, විවේකය ඇසුරුකළ, නිරෝධය ඇසුරුකළ, නිවනටනැඹුරු සතිසම්බොජ්ජය වඩයි. නුවණින් සලකා ධම්මවිචය සම්බොජ්ජය වඩයි. වීරිය සම්බොජ්ජය වඩයි. ප්‍රීති සම්බොජ්ජය වඩයි. පස්සදි සම්බොධ්‍යාංගය වඩයි. සමාධි සම්බෝධ්‍යාංගය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැඹුරු උපේක්ෂාසම්බෝධ්‍යාංගය වඩයි.

සති සම්බෝධ්‍යාංගය - යෝනිසෝමනසිකාරයෙන් යුක්තව සිත පිහිටුවීම.

ධම්මවිචයසම්බෝධ්‍යංගය - සතිපට්ඨානයට යොමුකළ සිහියෙන් යුතුව, ඒ ධර්ම

කාරණා, නුවණින් පරීක්ෂාකිරීම - විමසුමට භාජනය කිරීම.

වීරිය සම්බෝධ්‍යාංගය - නූපන් අකුසල් නොඉපදවීමට, උපන් අකුසල් දුරුකිරීමට, නූපන් කුසලඉපදවීම උපන් කුසල් දියුණුකිරීමට ගන්නා උත්සාහය.

ප්‍රීති සම්බෝධ්‍යංගය - චතුරාර්යසත්‍ය අවබෝධය පිණිස පවත්නා ප්‍රීතිය.

පස්සදී සම්බෝධ්‍යාංගය - වෙහෙසක් නොමැතිව, පීඩාවක් නොමැතිව, සුවසේ භාවනාවෙහි නිරතවෙමින් ස්පර්ශ සුන්‍යතාවය වටහා ගැනීම.

සමාධි සම්බෝධ්‍යාංගය - ඒකාග්‍රතාවය නැමැති චෛතසික ශක්තිය දියුණු කිරීම.

උපෙක්ඛා සම්බෝධ්‍යාංගය - චේතෝවිමුක්ති සිතෙහි හටගන්නා අරමුණු වලින් නිදහස් මධ්‍යස්ථබවට පත්වීම.

මහණෙනි, යම් කලෙක සිත සැඟවුනේවේ.

එවිට,

පස්සදි සම්බොධ්‍යාංගය.

සමාධි සම්බොධ්‍යාංගය.

උපේක්ෂා සම්බෝධ්‍යාංගය.

වැඩීමට නොයා යුතුය. සිත සැඟවුණ බැවින් මේ ධර්මයන් වැඩිය නොහැකි බැවිනි.

***

මහණෙනි, සිත සැඟවගියේ, සැඟවුනේ වූයේ,

ධම්මවිචය සම්බොධ්‍යාංගය.

වීරිය සම්බොධ්‍යාංගය,

ප්‍රීති සම්බොධ්‍යාංගය,

වැඩීමසුදුසුය. සැඟවුණ සිත මෙම ධර්මයන්තුළින් නගාසිටුවිය හැකිබැවිනි.

***

මහණෙනි, සිත නොසන්සුන් වේද, එවන් අවස්ථාවේදී

ධම්මවිජය සම්බොධ්‍යාංගය,

වීරිය සම්බෝධ්‍යාංගය,

ප්‍රීති සම්බෝධ්‍යාංගය,

වැඩීමට කාලයනොවේ. සිත නොසන්සුන්ය. මෙයින් එම සිතසන්සුන් කළනොහැකි බැවිනි.

මහණෙනි, යම් කලෙක සිත නොසන්සුන් වේ නම් එකල,

පස්සදී සම්බොධ්‍යාංගය,

සමාධි සම්බොධ්‍යාංගය,

උපේක්ෂා සම්බොධ්‍යාංගය.

වැඩියයුතුය. සිත නොසන්සුන්ය. එය මේ ධර්මයන්ගෙන් සන්සිඳුවිය හැක්කේවෙයි.

(අග්ගි සූත්‍රය - සං.නි)

මහණෙනි, යම්හෙයකින් බෝධ්‍යංග නොවඩන්නා හට වෙහෙස හා දැවිලිආස්‍රවයෝ උපදිත්ද, මහණෙනි, මෙසේ ඒ බෝධ්‍යංගවඩන්නාවූ ඔහුට ඒ වෙහෙස ඒ දැවිලි සහිත ආස්‍රවයෝ නොවෙති. මහණෙනි, මේ ආස්‍රවයෝ භාවනා මඟින් ප්‍රහීණකළ යුත්තෝය.

මහණෙනි, යම්කලෙක භික්ෂුහු යම්ආස්‍රවයෙක් සෝවාන්මඟින් ප්‍රහීණ කළයුත්තේද? ඒ ආස්‍රවයේ සෝවාන්මඟින් ප්‍රහීණවන්නෝය. යම්ආස්‍රවයක් සංවරයෙන් ප්‍රහීණ කළයුත්තේද ඒ, සංවරයෙන් ප්‍රහීණවේ. යම්ආස්‍රවයක් ප්‍රත්‍යවේක්ෂාවෙන් ප්‍රහීණකළයුත්තේද? ඒ ප්‍රත්‍යවේක්ෂාවෙන් ප්‍රහීණවෙත්, යම්ආශ්‍රවයක් සිතතබා නොගැනීමෙන් ප්‍රහීණකළයුත්තේද ඒ සිතතබා

නොගැනීමෙන් ප්‍රහීණවෙත් යම් ආස්‍රවයක් දුරුකිරීමෙන් ප්‍රහීණ කළයුත්තේද? ඒ ආස්‍රවයන් දුරුකිරීමෙන් ප්‍රහීනවෙත්, යම්ආස්‍රවයක් වීයර්යයෙන් ප්‍රහීණ කළයුත්තේද? ඒ ආස්‍රවයන් වීයර්යයෙන් ප්‍රහීණවෙත්, යම්ආස්‍රවයෙක් භාවනාවෙන් ප්‍රහීණ කළයුත්තේද? ඒ ආස්‍රවයෝ භාවනාවෙන් ප්‍රහීණවෙත්,

මහණෙනි, මේ මහණතෙමේ සියළු ආස්‍රවයන්ගෙ

න් මිදුනේ, තෘෂ්ණාව සිඳදැම්මේයැ'යිද සංයෝජන උපුටාහළේයයිද, මනාප්‍රහාණයෙන් දුක්කෙළවර කළේය'යිද කියනුලැබේ.

(සබ්බාසව සූත්‍රයෙන්)

# ආනාපානසති භාවනාව

මහණෙනි භික්ෂුසංඝයා අතරෙහි ආනාපාන(ස්මෘති) සති භාවනාවෙහි යෙදෙන භික්ෂූන්ද වෙති. මහණෙනි, බොහෝ සෙයින් භාවිතා කරනුලබන ආනාපානසති භාවනාව මහත්ඵල, මහානිශංසවෙයි. මහණෙනි, බොහෝකොට (නිරන්තරයෙන්) භාවිතය කරනුලබන ආනාපානසති භාවනාවෙන් , සතරසීවටන් (සතරසතිපට්ඨානයම) සපුරාලයි. වඩවඩාත් භාවිතකිරීමෙන් සප්තබොධ්‍යාංගයන් සපුරාලයි. (වැඩෙයි) වඩවඩාත් වැඩෙන සප්තබොධ්‍යාංගයන් හේතුවෙන් විද්‍යාවිමුක්ති සපුරාලයි.

මහණෙනි, ආනාපාන සතිභාවනාව කෙසේ වැඩිවැඩියෙන් බහුලවශයෙන් මහත්ඵල, මහානිශංසවන්නේද කියන්නේනම්,

මෙසස්නෙහි මහණ, ආරණ්‍යගතව හෝ රුක් මුලකයටවී හෝ ශුන්‍යාගාරයකටවී කයසෘජුව සිටින අයුරින් පළක්බැඳ වාඩිවී "සිහිය"ම කමටහන ලෙස තබාගනිමින් සිටී, හේ සිහිඇතිවමම ආශ්වාස කරයි. සිහි ඇතිවමම ප්‍රශ්වාස කරයි.

දීර්ඝකොට ආශ්වාසකරනුයේ, දීර්ඝකොට ආශ්වාස කරමියි නුවණින්දනී. දීර්ඝකොට ප්‍රශ්වාසකරනුයේ, දීර්ඝකොටප්‍රශ්වාස කරමි'යි නුවණින් දනී, කෙටියෙන් ආශ්වාසකරනුයේ, කෙටිආශ්වාසයක් කරනුයේ'යි නුවනින් දනී. කෙටියෙන් ප්‍රශ්වාස කරනුයේ. කෙටි ප්‍රශ්වාසයක් කරමි'යි නුවණින් දනී.

සර්‍වකාය ප්‍රතිසංවේදීව ආශ්වාස කිරීමේදී සර්‍වකාය දකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.

සර්‍වකාය ප්‍රතිසංවේදීව දකිමින් - ප්‍රශ්වාස කිරීමේදී, සර්‍වකාය ප්‍රතිසංවේදීව දකිමින් - ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.

කාය සංස්කාරයන් සංසුඳුවමින් ආශ්වාස කරමියි හික්මෙයි.

කාය සංස්කාරයන් සංසුඳුවමින් ප්‍රශ්වාස කරමියි හික්මෙයි.

ප්‍රීති සංවේදීව ආශ්වාසකරමි'යි හික්මෙයි.

ප්‍රීති සංවේදීව ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

සුඛ ප්‍රතිසංවේදිව ආශ්වාසකරමි'යි හික්මෙයි.

සුඛ ප්‍රතිසංවේදිව ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

චිත්තසංස්කාර ප්‍රතිසංවේදීව (දනිමින්) ආශ්වාසකරමි'යි හික්මෙයි.

චිත්තසංස්කාර ප්‍රතිසංවේදීව ප්‍රශ්වාසකරමි'යි

හික්මෙයි.

චිත්තසංස්කාරයන් සංසිඳුවමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.

චිත්තසංස්කාරයන් සංසිඳුවමින් ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

සිත ප්‍රමෝදයකරමින් ආශ්වාසකරමි'යි හික්මෙයි.

සිත ප්‍රමෝදයකරමින් ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

සිත සමාදාන කරමින් ආශ්වාසකරමි'යි හික්මෙයි.

සිත සමාදාන කරමින් ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

සිත පහදවමින් ආශ්වාසකරමි'යි හික්මෙයි.

සිත පහදවමින් ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

අනිත්‍ය නුවණින්දකිමින් ආශ්වාසකරමි'යි හික්මෙයි.

අනිත්‍ය නුවණින්දකිමින් ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

විරාගය නුවණින්දකිමින් ආශ්වාසකරමි'යි හික්මෙයි.

විරාගය නුවණින්දකිමින් ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි

නිරෝධය නුවණින්දකිමින් ආශ්වාසකරමි'යි හික්මෙයි.

නිරෝධය නුවණින්දකිමින් ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

කෙලෙසුන් අත්හැරදැමීම දකිමින් ආශ්වාසකරමි'යි හික්මෙයි.

කෙලෙසුන් අත්හැරදැමීම දකිමින් ප්‍රශ්වාසකරමි'යි හික්මෙයි.

තවද, මහණෙනි, දිගින් දිගටම පවත්වන්නාවූ ආනාපානසති භාවනාව ඔස්සේ සතරසතිපට්ඨානයන් (සතරසීවටන්) වැඩෙන්නේ කෙසේද යත්, පෙරදැක්වූ ආකාරයෙන් භාවනා කරනුලබන මහණතෙමේ කයෙහි කායානුදර්ශීව කෙලෙසුන්තවන වීයර්‍යඇතිව (නිවැරදි) සම්‍යක්ප්‍රඥාඇතිව, සිහියෙන්යුතුව, කාය සංඛ්‍යාත ලෝකයේ අවිද්‍යාදොම්නස් දුරුකොට වාසය කරයි. මහණෙනි යම් ආශ්වාස, ප්‍රශ්වාසයක් ඇතිද? එය පෘථිවියාදී චතුර්විධකායයන් කෙරෙහි කායන්‍යතරයක්කොට මම මෙසේ කියමි.

මහණෙනි, එහෙයින්, මෙහිදී එම මහණතෙමේ, කයෙහි කායපිළිබඳ දර්ශනයෙන් යුතුව, සම්‍යක්ප්‍රඥාඇතිව, සිහියෙන් කායලෝකයෙහි අවිද්‍යාදොම්නස්දුරුකොට වාසයකරයි. මහණෙනි, යම්කලෙක මේ සස්නෙහි මහණතෙමේ ප්‍රීතිප්‍රතිසංවේදීව, සුඛප්‍රතිසංවේදීව, චිත්තසංස්කාර ප්‍රතිසංවේදීව, චිත්තසංස්කාර සංසිඳුවමින් ආශ්වාස කරමි. ප්‍රශ්වාස කරමි. හික්මෙයි.

මහණෙනි, එසමයෙහි මහණතෙම වේදනායෙහි වේදනා, නුවණින් දකින්නේ කෙලෙස්තවන වීයර්‍යඇතිව, පිරුණු නුවණඇතිව, සිහියෙන්යුතුව, ස්කන්ධනම්වූ ලෝකයේ අවිද්‍යාදොම්නස් දුරුකොට වාසයකරයි. යම් ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳ සුන්දර මනසිකාරයක්වේද මහණෙනි, මම මෙසේ වේදනාවන් කෙරෙහි එය අන්‍යතරයෙකි'යි කියමි. මහණෙනි, මෙහිදී මහණතෙම වේදනායෙහි, වේදනා නුවණින්දකිනුයේ කෙලෙස්තවන

වියසිඇතිව සපිරුණු ඥාණයෙන්යුතුව සිහියෙන්යුතුව ස්කන්ධලෝකයෙහි අවිද්‍යාදොම්නස් දුරුකොට වාසයකරන්නේ වෙයි.

මහණෙනි, යම්කලෙක මහණතෙම චිත්ත ප්‍රතිසංවේදීව, චිත්තප්‍රමෝදයකරමින්, චිත්තසමාදානකරමින්, චිත්ත කෙලෙස්වලින් දුරුකරමින්, ආශ්වාස ප්‍රශ්වාස කරමි. හික්මෙයිද, මහණෙනි, එසමයෙහි මහණතෙම චිත්තයෙහි චිත්ත නුවණින්දකින්නේ කෙලෙස්තවන වෙරඇතිව සපිරුණ ප්‍රඥාවෙන් යුතුවය. සිහියඇතිව (සතිය,ස්මෘතිය) ස්කන්ධලෝකයෙහි අවිද්‍යාදෝමනස්සයන් පහකොට වාසය කරයි.

**මහණෙනි, මම අවුල්වූ සිහියඇති, අවබෝධකරගැනීමේ නුවණනැතියවුනට ආනාපානසති භාවනාව නොවදාරමි.** මහණෙනි, එහෙයින් එසමයෙහි මහණෙතෙමේ චිත්තයෙහි චිත්තය නුවණින්දකින්නේ අවබෝධයඇතිව පිරුණුඥාණය ඇතිව සිහියෙන් "චිත්ත" ලෝකයෙහි අවිද්‍යාදෝමනස්සයන් දුරුකොට වාසයකරන්නේවේ.

මහණෙනි, යම්කලෙක මහණතෙම අනිත්‍යානුදර්ශීවූයේ, විරාගය නුවණින්දක්නේවූයේ, නිරෝධය නුවණින්දක්නේවූයේ, කෙලෙසුන්ගෙන් බැහැරවීම නුවණින්දක්නේ දකිමින් ආශ්වාසකරමි. හික්මෙයිද ප්‍රශ්වාසකරමි. හික්මෙයිද?

මහණෙනි, එවිට ඒ මහණතෙම ධර්මයෙහි, ධර්මය නුවණින්දක්නේ, කෙලෙස්තවන වෙරඇතිව පිරුණු ප්‍රඥාවඇතිව, සිහියඇතිව, ස්කන්ධලෝකයෙහි අවිද්‍යාදෝමනස්සයන් පිළිබඳ යම්ප්‍රහාණයක්වේද?

ඒබැව් ප්‍රඥාවෙන්දැක, මනාකොට එහි නොඇලීමෙන් ප්‍රත්‍යවේක්ෂයකරන්නේ වෙයි.

මහණෙනි, එවිට මහණතෙමේ ධර්මය, ධර්මතාවයන් අනුව නුවණින්දකිනුයේ, කෙලෙස්තවන වීර්‍ය්‍යයඇතිව, සපිරුණුඥාණයෙන් යුතුව, මනාසිහියෙන් යුතුව, ස්කන්ධලෝකයෙහි අවිද්‍යාදොම්නස් ප්‍රහීනකොට වාසයකරන්නේ, මහණෙනි, නිරතුරුව ආනාපානසති භාවනාව වැඩීමෙන්, මෙසේ සතරසතිපට්ඨානයේ වැඩීම අවබෝධයවෙයි. මහණෙනි, සතරසතිපට්ඨානය නිරතුරු වැඩීමෙන් සප්තබොධ්‍යාංගයන් වැඩෙනුයේ කෙසේද? යත්,

මහණෙනි, යම්කලෙක මහණතෙම කයෙහි, කය නුවණින්දක්නේ අවබෝධයඇතිව වැඩුණඥානයඇතිව සිහියෙන්යුතුව ස්කන්ධලෝකයෙහි අවිද්‍යාදෝමනස්සයන් ප්‍රහීණකොට වාසයකෙරේද? එවිට ඔහුට සිහිය එළැඹසිටියේවෙයි. මුලාවට පත්නොවෙයි.

මහණෙනි, යම්කලෙක මහණ එළැඹිසිහියෙන් යුතුවූයේ මුලානොවූයේවේද, එකල්හි මහණහට ස්මෘතිසම්බෝධ්‍යාංගය අවබෝධවේ. එවිට ඒ මහණ තෙමේ ස්මෘතිසම්බෝධ්‍යාංගය වඩයි. එකල්හි ඒ මහණතෙම් ස්මෘතිසම්බෝධ්‍යාංගය භාවනාවෙන් පරිපූර්ණවෙයි. එසේ සිහියෙන්යුතුව වාසයකරනුයේ ඒ දහම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් මෙනෙහි කරයි. යළි යළිත් මෙනෙහිකරයි. අවබෝධයෙන්යුතුව නිගමනයට එළඹෙයි.

මහණෙනි, යම්කලෙක මහණතෙමේ එසේ

සිහියෙන්යුතුව වාසයකරනුයේ ඒ දහම ප්‍රඥාවෙන්යුතුව මෙනෙහිකරන්නේද, නිගමනයට එළඹෙන ඒ මහණහට නොසෙල්වෙන වීයර්යඇතිවේද, එකල්හි ඒ මහණතෙම විසින් වීයර්යසම්බෝධ්‍යාංගය පටන්ගන්නාලද්දේ වෙයි. එවිට ඒ මහණතෙමේ වීයර්යසම්බෝධ්‍යාංගය වඩයි. එයින් ඒ මහණ තෙමේ වීයර්ය සම්බෝධ්‍යාංග භාවනාවේ පරිපූර්ණභාවයට යයි.

නොසෙල්වෙන වීයර්යඇති ඒ මහණහට නිරාමිසප්‍රීතියඋපදී. මහණෙනි, යම්කලෙක නොසැලෙන වීයර්යඇති නිරාමිසප්‍රීතියඋපදීද, එසමයෙහි ඒ මහණ හට ප්‍රීතිසම්බෝධ්‍යාංගය පිහිටයි. එවිට ඒ මහණ තෙම ප්‍රීතිසම්බෝධ්‍යාංග භාවනාව වඩයි. එයින් ඒ මහණතෙමේ ප්‍රීතිසම්බෝධ්‍යාංග භාවනාවෙහි පරිපූර්ණභාවයට පත්වෙයි.

ප්‍රීති සිත්ඇති මහණහුගේ "නාමකයද"සංසිඳී සිතදසංසිඳේ. මහණෙනි, යම්අවස්ථාවක ප්‍රීතිසිත්ඇති මහණහුගේ නාමකයන් සංසිඳුනේද, සිත සංසිඳුනේද, එකල ඒ මහණහට ස්පර්ශසම්බෝධ්‍යාංග භාවනාව වැටහෙයි. එයින් ඒ මහණතෙමේ ස්පර්ශසම්බෝධ්‍යාංයෙන් පරිපූර්ණභාවයට පත්වේ.

සන්සුන් නාමකයඇති සුවපත්වූ මහණහුගේ සිත සමාධිගතවේ. කවර හෝ අවස්ථාවක කායස්පර්ශය ඇති සුවපත්වූ මහණහුගේ සිත සමාධිගත වෙයිද? එවිට ඒ මහණහට සමාධිසම්බෝධ්‍යාංගය වැටහේ. එකල ඒ මහණතෙමේ සමාධි සම්බෝධ්‍යාංග භාවනාව

වඩන්නේය. එයින් ඒ මහණතෙමේ සමාධිසම්බෝධ්‍යාංගය පරිපූර්ණභාවයට පත්වන්නේය.

හේ එසේ සමාධිගත සිත මනාකොට, නොඇලී මෙනෙහිකරන්නේය. මෙසේ නොඇල්මෙහිලා මෙනෙහිකරනුයේ ඒ මහණහට උපේක්ෂාසම්බෝධ්‍යාංගය වැටහෙයි. එවිට ඒ මහණතෙමේ උපේක්ෂාසම්බෝධ්‍යාංග භාවනාව වඩයි. එයින් ඔහුගේ උපේක්ෂාසම්බෝධ්‍යාංගය පරිපූර්ණබවට පත්වන්නේය.

මහණෙනි, මෙයාකාරයෙන් නිරතුරුවම වඩනලද සතරසතිපට්ඨානයන්ගෙන් සප්තසම්බෝධ්‍යාංගයන් පරිපූර්ණවන්නාහ.

සියළු ක්ලේශයන් පිළිබඳ සැබෑදැක්ම ඇතිවන්නාහ.

## ධ්‍යානසුවයද? නිවනද?

වහන්ස, ආනන්දයෙනි, සියල්ලදන්නාවූ අරහත්වූ සම්‍යක්සම්බුද්ධවූ භාග්‍යවතුන්වහන්සේ විසින් සිහියෙන්යුක්තව කෙලෙස්නසන වීයර්‍යඇතිව, නිවනකෙරෙහි යොමුකළ සිත්ඇතිව වාසයකරන භික්ෂුවකගේ යම්අරමුණක පිහිටි සිත ඉන්මිදේද, ක්ෂයනොවූ ආස්‍රවයෝ ක්ෂයවන්නේද, නොලැබූ හෝ අනුත්තර නිවන නුවණින්ලබාද, එබඳුවූ කිසියම් ධර්මයක් වදාරණලද්දේවේද?

ගෘහපතිය, සියල්ලදන්නාවූ, සියල්ලදක්නාවූ

අරහත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන්වහන්සේ විසින්, සිහියෙන්යුතුව, කෙළෙස්තවන වීර්‍ය්‍යඇතිව, නිවනටයොමුකළ සිත්ඇතිව වාසයකරන භික්ෂුවකගේ යම්අරමුණක්හි නොමිදුනාවූ සිත මුදවන්නේද, ක්ෂයනොවූ ආස්‍රවයෝ ක්ෂයකරවන්නාවූ නොලැබූ අනුත්තරවූ නිර්වානය නුවණින්ලබාද? එබඳු ධර්මයක් වදාරනලද්දේ වෙයි.

වහන්ස, ආනන්දයෙනි, සියල්ලදන්නාවූ සියල්ලදක්නාවූ අරහත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් සිහියෙන්යුතුව, කෙලෙස්තවන වීර්‍ය්‍යයඇතිව නිවනටයොමුවූ සිත්ඇතිව වාසයකරන භික්ෂූවගේ අරමුණක්හි නොමිදුනසිත මුදවන්නාවූ, ක්ෂයනොවූ ආස්‍රවයෝ ක්ෂයකරවන, නොලැබූ අනුත්තරනිවන නුවණින් ලබන්නේද? එබඳු වූ වදාරනලද ධර්මය කවරේද?

ගෘහපතිය, මේ සස්නෙහි භික්ෂුව කාමයෙන් වෙන්ව, අකුසලදහමින් වෙන්ව, විතර්කසහිත විචාරසහිත විවේකයෙන් උපන් ප්‍රීති, සුඛඇති පළමුවන දැහැනඋපයා වාසයකරයි. හේ මෙසේ සිතයි.

මේ ප්‍රථමධ්‍යානයද උපදවනලද්දකි. සිතින් නිපදවනලද්දකි. යම්කිසිවක් කරනලදනම්, සිතින් නිපදවනලදනම්, ඒ අනිත්‍යය, නිරුද්ධවනස්වභාවය ඇත්තේ’යි නුවණින් දනියි. හේ එහි සිටියේ ආස්‍රවක්ෂයට පැමිණෙයි. ඉදින් ආස්‍රවක්ෂයට නොපැමිණේ නම් ඒ සමථ විදර්ශනාමය ධර්ම යෙදීමෙන් පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්ෂයකිරීමෙන් ඕපපාතිකවෙයි. (මව්කුසක

පිළිසිඳගැනීමකින් තොරව උපන්) ඒ බඹලොවින් නැවතනොඑන ස්වභාවයෙන් එහිම පිරිනිවෙයි.

ගෘහපතිය, සියල්ල දන්නාවූ සියල්ලදක්නාවූ අරහත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් සිහියෙන්යුතුව කෙලෙස්තවන වීයර්‍යඇතිව නිවනටයොමුකළ සිත්ඇතිව වාසයකරන භික්ෂුවකගේ අවිමුක්තචිත්තය විමුක්තිවේද, ක්ෂයනොවූ ආස්‍රවයෝ ක්ෂයවන්නාවූද එබඳු මේ එක්ධර්මයක් වදාරණ ලද්දේ වෙයි.

තවද ගෘහපතිය, භික්ෂුව විතර්ක, විචාරයන්ගෙන් සංසිඳුන, සිය චිත්තසන්තානයෙහි සම්ප්‍රසාද ඇතිකරන දෙවනධ්‍යානය උපයා වාසයකරයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරයි. මේ දෙවනදැහැනද උපදවාගන්නා ලද්දකි. සිතින් සංස්කරණයකරනලද්දකි. යම්කිසිවක් සකස්කරනුයේනම් උපදවනුයේනම් ඒ අනිත්‍යවෙයි. නිරුද්ධවන ස්වභාවයඇත්තේයැ'යි නුවණින් දනියි. හේ එහිසිටියේ ආස්‍රවයන්ගේ ක්ෂයටපැමිණෙයි. එසේ ආස්‍රවක්ෂයට නොපැමිණියේ නම්, ශමථවිදර්ශනා ධර්මයන්ගෙන්ම පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්ෂයවීයෑමෙන් ඕපපාතිකවෙයි. ඒ බඹලොවින් නැවත නොඑන ස්වභාවඇතිව එහිම පිරිනිවන්පාන්නේය.

ගෘහපතිය, සියල්ලදන්නාවූ, සියල්ලදක්නාවූ, අරහත් සම්‍යක්සම්බුද්ධවූ භාග්‍යවතුන්වහන්සේ විසින් සිහියෙන්යුතුව කෙලෙස්නසන වීයර්‍යඇතිව, නිවනටමෙහෙයවූ සිත්ඇතිව, වාසයකරණ භික්ෂුවකගේ යම්අරමුණක්හි විමුක්තනොවූ සිත විමුක්තවේද?

ක්ෂයනොවූ ආස්‍රවයෝ ක්ෂයකරවන්නාවූද, නොපැමිණියාවූ අනුත්තරනිවන ප්‍රත්‍යක්ෂකළහැකි මෙබඳුවූ එක්ධර්මයක් වදාරනලද්දේ වෙයි.

තවද ගෘහපතිය, භික්ෂුව ප්‍රීතිවිරාගයෙන් යුතුව තුන්වනදැහැන උපයා වාසයකරයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරයි. මේ තුන්වනදැහැනද සිතින් සංස්කරණය කරනලද්දකි. සිතින් නිපදවනලද්දකි. සිතෙහි උපදවාගන්නාලද්දකි. යම්දෙයක් කරනලදවේනම්, සිතින්නිපදවනලදවේනම්, ඒ අනිත්‍යය වේ. නිරුද්ධවන ස්වභාවයඇතියේයැ'යි නුවණින්දනියි. හේ එහි සිටියේ... අනුත්තරවූ නිවනට එළැඹෙයි.

තවද, ගෘහපතිය, භික්ෂුව සුඛප්‍රහාණයෙන් (ස්පර්ශ ප්‍රහාණයෙන්) සිවුවනදැහැන උපයා වාසයකරයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරයි. මේ සිවුවනදැහැනද කරන ලද්දකි. සිතින් නිපදවනලද්දේවෙයි. කවර හෝ දෙයක් කරනලදවේනම්, සිතින් නිපදවනලදවේනම්, ඒ අනිත්‍යවේයැ'යි ද නිරුද්ධ වන ස්වභාවය ඇතිවේයැ'යි ද නුවණින් දනියි. හේ එහි සිටියේ ... අනුත්තරවූ නිවනට පැමිණෙයි.

තවද ගෘහපතිය, භික්ෂුව, මෛත්‍රීසහගත සිතින්යුතුව එක්දිශාවක්එළැඹ වාසයකරයි. එලෙසින්ම දෙවනදිශාවද එලෙසින්ම තුන්වනදිශාවද සතරවනදිශාවදැ'යිද මෙසේ උඩ, යට, සරස හැමතන්හි පැතිරපවත්නා සකලලෝකයේ පැතිරගිය අප්‍රමාණවූ අවෛරීවූ, නොසැලෙන, මෛත්‍රීසහගත සිතින්යුතුව වාසයකරයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරයි. මේ මෛත්‍රී සහගත සිත නිදහස්වීමද,

සිතින්මකරනලද්දකි. සිතින් නිපදවනලද්දකි. යම්දෙයක් කරනලදවේනම්, සිතින් නිපදවනලදවේනම්, ඒ අනිත්‍යවේ. නිරුද්ධවන ස්වභාවයඇතිවේයැ'යි නුවණින් දනියි. හේ එහි සිටියේ .... අනුත්තරවූ නිවනට පැමිණෙයි.

තවද ගෘහපතිය.. භික්ෂුව කරුණාසහගත සිතින් මුදිතාසහගත සිතින්.. උපේක්ඛාසහගත සිතින්.. එක්දිග ක් අරමුණුකොට වාසයකරයි. එසේම දෙවනදිගද, එලෙසින්ම තුන්වනදිගද, එලෙසින්ම සතරවනදිගදැ'යි මෙසේ උඩ, යට, සරස, සෑමතැන්හි පැතිරපවත්නා සකලලෝකය කෙරෙහි අප්‍රමාණවූ අවෛරය, නොසැලෙන උපේක්ෂාසහගත සිතින් අරමුණුකොට වාසයකරයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරයි. මේ උපේක්ෂාවේතොවිමුක්තියද සිතින් කරනලද්දේවෙයි. සිතින් නිපදවනලද්දේවෙයි. යම්ම දැයක්කරනලදවේනම්, සිතින් නිපදවනලදවේනම්, ඒ අනිත්‍යවේයැයි නිරුද්ධවන ස්වභාවයඇතිවේයැ'යි නුවණින් දනියි. හේ එහි සිටියේ... අනුත්තර නිවනට පැමිණෙයි.

තවද ගෘහපතිය. භික්ෂුව සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ ඉක්මවීමෙන්, ප්‍රතිඝසංඥා, (ගැටීම්) දුරුවීමෙන්, නානත්වසංඥාවන් මෙනෙහිනොකිරීමෙන්, අහස අනන්තයැ'යි ආකාසානඤ්චායතනය උපයා වාසයකරයි. හේමෙසේ ප්‍රත්‍යවේක්ෂාකරයි. මේ ආකාසානඤ්චායතනය සමාපත්තියද කරනලද්දේවෙයි. සිතින් නිපදවනලද්දේවෙයි. යම්මැදෙයක් කරනලදවේනම්, සිතින් නිපදවනලදවේනම්, ඒ අනිත්‍යවේයැ'යි නිරුද්ධවන ස්වභාවය ඇතිවේයැ'යි නුවණින්දනී. හේ එහි සිටියේ...

අනුත්තර නිවනට පැමිණෙයි.

තවද ගෘහපතිය, භික්ෂුව සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණඤ්චායතනය අනන්තයැ'යි විඤ්ඤාණඤ්චායතනය උපයා වාසයකරයි. හේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂාකරයි. මේ විඤ්ඤාණඤ්චායතනය සමාපත්තියද කරනලද්දේවෙයි. සිතින් නිපදවනලද්දේවෙයි. යම්මැදැයෙක් කරනලදවේනම්, සිතින් නිපදවනලදවේනම් අනිත්‍යවේයැ'යි නිරුද්ධවන ස්වභාවය ඇතිවේයැ'යි නුවණින්දනී. හේ එහි සිටියේ.... අනුත්තර නිවනට පැමිණෙයි.

තවද ගෘහපතිය, භික්ෂුව සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිත්නැතැ'යි අකිඤ්චඤ්ඤායතනය උපයා වෙසෙයි. හේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂාකරයි. මේ අකිඤ්චඤ්ඤායතන සමාපත්තියද හේතුයෙන් කරනලදවෙයි. සිතින් සිතනලදවෙයි. මෙසේ යම්මැදැයෙක් සංස්කරණය කරනලද්දේවෙයිද, සිතෙන් සිතනලද්දේවෙයිද, නිපදවනලද්දේවෙයිද, එය අනිත්‍යවේ. නිරුද්ධවන ස්වභාවය ඇත්තේයැ'යි නුවණින් දැනගනී. හේ ශමථ විදර්ශණා ධර්මයෙහිසිටියේ ආස්‍රවක්ෂයට පැමිණෙයි. ඉදින් ආස්‍රවයට නොපැමිණේනම් එම ශමථ විදර්ශණ ධර්මප්‍රත්‍යයෙන් ධර්මරාගයන්, පඤ්ච ඕරම්භාගිය

සංයෝජනයන්ගේ ක්ෂයවීමෙන් ඕපපාතිකවෙයි. ඒ බඹලොවින් නැවතනොඑන ස්වභාවය ඇතිවූයේ එහිම පිරිනිවෙයි.

ගෘහපතිය ඒ ඒ සත්ත්වයාගේ ආශයානුශයදන්නා

වූ, දතයුතු ධර්මයදක්නාවූ, අරහත්වූ, සම්‍යක්සම්බුද්ධයන් විසින් දේශිතපරිදි යම්අරමුණෙක සිහියෙන් යුතුව, කෙලෙස්තවන වීර්‍ය්‍යඇතිව, නිවනට මෙහෙයවූ සිත්ඇතිව වෙසෙන භික්ෂුහුගේ අවිමුක්ත (නොමිදෙන) චිත්තයන් මිදේද, ක්ෂයනොවූ ආස්‍රවයෝ ක්ෂයවන්නේද නොපැමිණියාවූ අනුත්තර නිවනට ළඟාකරවන්නේ ද? එබඳුවූ මේ ඒකධර්මය වදාරනලද්දේය.

මෙසේ වදාළකල්හි අට්ඨකනගරවාසී දශම ගෘහපති ආනන්දතෙරුණුවනට මෙසේ පැවසීය.

වහන්ස, ආනන්දයෙනි, එකනිධානයක් සොයන පුරුෂයෙක් එකමඅවස්ථාවකදී එකළොස් නිධානයක් යම්සේලබාද, එලෙසින්ම ස්වාමිනි, මම එක් අමාදොරක් සොයනුයේ එකම අවස්ථාවෙහිදී එකළොස් අමෘතද්වාරයක් පිළිබඳව අසන්නට ලැබුණි. ස්වාමිනී, යම්පරිදි මිනිසෙකු හට එකොළොස් දොරක්ඇති ගෙයක්වේද? ඒ ගෙය ඇවිළගත්කළ එක් එක්ම දොරකින් තමනට ගැලවීයන්නට හැකිවේද? එසෙයින්ම ස්වාමිනී, මම මේ එකොළොස් අමාදොර අතුරින් එක් එක්මැ අමාදොරකින් තම ගැලවීම කරගන්නෙමි.

(අට්ඨක නගර සූත්‍රයෙන්)

# ඝොටමුඛ සූත්‍රයෙන් ...

හේ ඇසින් රූපදැක නිමිතිගන්නේ නොවෙයි. අරමුණුගන්නේ නොවෙයි. අනුගතවන්නේ නොවෙයි. යම්කරුණකින් චක්ෂුරින්ද්‍රියය අසංවෘත්ව වාසයකරන

මොහු, අභිධ්‍යාදෝමනස්සසංඛ්‍යාත ලාමක අකුසලධර්මයෝ ලුහුබඳනාහුනම් ඒ චක්ෂුරින්ද්‍රිය සංවරයට පැමිණෙයි. කනෙන් හඬක්අසා... නැහැයෙන් ගඳක්ආඝ්‍රානයකොට... දිවෙන් රසක්විඳ... කයෙන් පහසක්ලැබ, මනසින් දහමක්දැන, නිමිතිගන්නේ නොවෙයි. අනුගතවන්නේ නොවෙයි. යම්කරුණකින් මනින්ද්‍රිය අසංවෘතව වාසයකරන මොහු අභිධ්‍යාදෝමනස්සයෙහිලා ගැනෙන ලාමක අකුසලධර්මයෝ ලුහුබඳනාහුනම් ඒ මනේන්ද්‍රියයාගේ සංවරයට පැමිණෙයි. මනේන්ද්‍රිය රකියි. මනේන්ද්‍රියයාගේ සංවරයට පැමිණෙයි. හේ මේ ආර්‍ය්‍ය ඉන්ද්‍රියසංවරයෙන් යුක්තව අධ්‍යාත්මයෙහි ක්ලේශාභිෂේක රහිත සුවවිඳී.

හේ ඉදිරියටයෑමෙහි පෙරලාඒමෙහි නුවණින්දැන කරනුයේවෙයි. ඉදිරියබැලීමෙහි අවටබැලීමෙහි නුවණින්දැන කරනුයේවෙයි. අත් පා හැකිළීමෙහි දිගු කිරීමෙහි නුවණින්දැන කරනුයේවෙයි. සඟළපාසිවුරු දැරීමෙහි නුවණින් දැන කරනුයේවෙයි. කථාකිරීමේදී කෑමෙහි, බීමෙහි, රසබැලීමෙහි නුවණින්දැන කරනුයේවෙයි. මලමූ පහකිරීමේදී නුවණින්දැන කරනුයේවෙයි. යෑමෙහි, සිටීමෙහි, හිඳීමෙහි, නිදිමෙහි, නිදිවැරීමෙහි සිනාසීමෙහි, තුෂ්ණීම්භාවයෙහි නුවණින්දැන කරනුයේවෙයි.

හේ මේ ආර්‍ය්‍යශීලස්කන්ධයෙනුදු සමන්විතව මේ ආර්‍ය්‍යඉන්ද්‍රියසංවරයෙනුදු සමන්විතව, ආර්‍ය්‍යසතියෙන් සිහියෙන්සමන්විතව ආරණ්‍යය වෘක්ෂමූලය, පර්වතය, කඳුය, ගිරියගුහාය, සෙහොනය, වනාන්තරගත සෙනසුනය,

හිස්පෙදෙසය, පිදුරුඅතුරාසැකසූ සෙනසුන්ය වැනිතැන් පරිහරණයකරයි. හේ භෝජනයඋදෙසා පිණ්ඩපාතයෙන් පසු ආපසු පැමිණියේ පලක්බැඳ වාඩිවී කය සෘජුකොටතබා කර්මස්ථානයන් මෙනෙහිකොට සිහියෙන් යුතුවසිටී. හේ (කායාදී) ලෝකයෙහි මුලාවහැර, පහවූ මෝහසිතින් යුතුව වාසයකරයි. ථීනමිද්ධයෙන් සිත පිරිසිදුකරයි. උද්ධච්චකුක්කුච්ච බැහැරකොට සංසුන්ව අධ්‍යාත්මයෙහි සංසුන් සිත්ඇතිව වාසයකරයි. විචිකිත්සා (කුතුහලය) අත්හැර, බැහැරකළ විචිකිත්සාවෙන් කුසල්දහම්හි සැකයෙන් තොරව වාසයකරයි. විචිකිස්සාවෙන් මුදවා සිත පිරිසිදුකරයි.

හේ සිතට උපක්ලේශවූ ප්‍රඥාව දුර්වලකරන මේ පංචනීවරණයන් බැහැරකොට අකුසල් දහමින්වෙන්ව විතර්ක, විචාරසහිතවූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛයඇති ප්‍රථමධ්‍යානය උපයා වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි ප්‍රසාදයඇති චිත්තයාගේ එකඟබවවූ විතර්කරහිත විචාරයරහිත, සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති, ද්විතීයධ්‍යානය උපයා වාසයකරයි. යළි සිහිඇතිව සම්‍යග්ඥානඇතිව කයින් සුවයද විඳියි. ආර්‍යයෝ යම් ධ්‍යානයක් සඳහා අපේක්ෂා ඇත්තේය. සිහි ඇත්තේය. සුඛවිහාර ඇත්තේයැ'යි කියත්ද, ඒ තෘතීයධ්‍යානය උපයා වාසය කරයි. සුඛයාගේද ප්‍රහාණයෙන්, දුඃඛයාගෙන්ද ප්‍රහාණයෙන්, සියළු සොම්නස් දොම්නසින් තොර, නොදුක්, නොසුව, උපේක්ෂායෙන් උපන් පිරිසිදු සිහියෙන්යුතු සිවුවැනිධ්‍යානය උපයා වාසයකරයි.

හේ මෙසේ සිත කෙලෙස්කෙරෙන් මුදවා ඉතාපිරිසිදු කොටගත්කල්හි මෘදුකල්හි පූර්ව නිවාසානුස්මෘතිඥානයට සිත යොමුකරයි.

හේ මෙසේ සිත තැන්පත්වූ කල්හි සිතෙහි සියළු කෙලෙසුන්දුරුව පිරිසිදුව නොසැලෙනබවට පැමිණිකල, සත්ත්වයන්ගේ චුති, ප්‍රාප්ති ඥාණයට සිතනමයි.

හේ විශුද්ධවූ මිනිස් ඇස ඉක්මවාගිය තියුණුවූ සිහියෙන් උපදින, චුතවන හීන, ප්‍රහීන ස්වර්ණ, දුර්වර්ණ සුගත, දුර්ගත සත්ත්වයන් දකී. මෙ භවත්සත්ත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තයහ. මිථ්‍යාදෘෂ්ඨයෙහි ගැලුනෝහ. ඔවුහු කයබුන්වූ මරණින්මතු සැපයෙන්පහවූ දුකට ගතිඇති නිරයෙහි පතිතවෙති. නිරයට පැමිණෙති. යළි මේ භවත්සත්ත්වයෝ කාය සුචරිතයෙන් යුක්තව සිට සම්‍යග්දෘෂ්ඨි ක්‍රියාවන්හි නිරතවී කයබුන්වන මරණින්මතු සුන්දර ගතිඇති සවර්ගලෝකයනට පැමිණියහ'යි මෙසේ විශුද්ධවූ මිනිස් ඇස ඉක්මගිය දිවැසක් බඳු දියුණුවූ සතියෙන්, උපදිනචුත වන සියළු සත්ත්වයන් දැකදනී.

හේ මෙසේ සිත සමාගිතකල්හි සියළුකෙලෙස් වලින් බැහැරව, නික්ලේසීවූකල්හි නොසැලෙන ආස්‍රවක්ෂයඥාණයට සිතනමයි.

හේ මේ (පඤ්චස්කන්ධය) දුක'යි ඇතිසැටියෙන් දැනගනියි. මේ (තෘෂ්ණාසමුදය) දුක් උපදනා කාරණයැ'යි ඇතිසැටියෙන් දැනගනියි. මේ දුක් නැතිකිරීමට යන පිළිවෙතැ'යි ඇතිසැටියෙන් දැනගනී. මේ ආස්‍රවයෝයැ'යි ඇතිසැටියෙන් දැනගනියි. මේ ආස්‍රවසමුදය'යි ඇතිසැටියෙන් දැනගනී. මේ ආස්‍රවනිරෝධය'යි

ඇතිසැටියෙන් දැනගනී. මේ ආස්‍රවනිරෝධගාමිනී ප්‍රතිපදායැ'යි ඇතිසැටියෙන් දැනගනී.

මෙසේදන්නා, මෙසේදක්නා ඔහුගේ සිත කායාස්‍රවයෙන්ද මිදෙයි. භවාස්‍රවයෙන්දමිදෙයි. අවිද්‍යාස්‍රවයෙන් මිදෙයි. මිදුණකල්හි මිදිණැ'යි ඥාණය වෙයි. ජාතිය ක්ෂිණවූ බඹසරවැස නිමවනලදී. තවත් කළයුතු අන්කිසිවක්නැතැ'යි දැනගනී.

බමුණ මේ පුද්ගලයා තමන් නොතවනුයේ, තමන් තවන යෝගයෙහි නොයෙදුණේ. මෙරමා නොතවනුයේ, මෙරමා තවනයෝගයෙහි නොයෙදුණේ ය'යි කියනු ලැබේ.

හේ තමා නොතවනුයේ අනුන් නොතවනුයේ මේ අත්භවයෙහිදීම තෘෂ්ණාරහිතවූයේ, නිවීයේ, සිහිල්වූයේ, සුවවිඳිනුයේ, ශ්‍රේෂ්ඨවූ ඉතාඋසස්වූ ජීවිතයක් ගතකෙරෙයි.

(සොටමුඛ සූත්‍රයෙනි)

## අභිනන්දන සූත්‍රයෙන්...

මහණෙනි, යමෙක් ඇස පිළිගනීනම්, හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනීනම් හෙතෙම දුකින් නොමිදුනේය'යි කියමි.

යමෙක් කන පිළිගනීනම්, හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනියිනම් හෙතෙම දුකින් නොමිදුනේය'යි කියමි.

යමෙක් නාසය පිළිගනීනම්, හෙතෙම දුක පිළිගනී. යමෙක් දුක පිළිගනීනම් හෙතෙම දුකින් නොමිදුනේ යැ'යි කියමි.

යමෙක් දිව පිළිගනීනම්, හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනීනම් හෙතෙම දුකින් නොමිදුනේයැ'යි කියමි.

යමෙක් කය පිළිගනීනම්, හෙතෙම දුක පිළිගනී. යමෙක් දුක පිළිගනීනම් දුකින් නොමිදුනේයැ'යි කියමි.

යමෙක් සිත පිළිගනීනම්, හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනීනම් හෙතෙම දුකින් නොමිදුනේයැ'යි කියමි.

මහණෙනි, යමෙක් ඇස නොපිළිගනීනම්, හෙතෙම දුක නොපිළිගනියි. දුක නොපිළිගනීනම්, හෙතෙම දුකින් මිදුනේ යැ'යි කියමි.

යමෙක් කන නොපිළිගනීනම් හෙතෙම දුක නොපිළිගනියි. යමෙක් දුක නොපිළිගනීනම්, හෙතෙම දුකින් මිදුනේයැ'යි කියමි.

යමෙක් නාසය නොපිළිගනීනම්, හෙතෙම දුක නොපිළිගනියි. යමෙක් දුක නොපිළිගනීනම් හෙතෙම දුකින් මිදුනේයැ'යි කියමි.

යමෙක් දිව නොපිළිගනීනම්, හෙතෙම දුක නොපිළිග නියි. යමෙක් දුක නොපිළිගනීනම්, හෙතෙම දුකින් මිදුනේ යැ'යි කියමි.

යමෙක් කය නොපිළිගනීනම්, හෙතෙම දුක නොපිළිගනියි. යමෙක් දුක නොපිළිගනීනම්, හෙතෙම දුකින් මිදුනේයැ'යි කියමි.

යමෙක් සිත නොපිළිගනීනම්, හෙතෙම දුක නොපිළිගනියි. යමෙක් දුක නොපිළිගනීනම්, හෙතෙම දුකින් මිදුනේයැ'යි කියමි.

මහණෙනි, යමෙක් රූපය අභිනන්දනය කෙරේනම් හෙතෙම දුක අභිනන්දනය කෙරේ. යමෙක් දුක අභිනන්දනය කෙරේනම්, දුකින් නොමිදුනේයැ'යි කියමි.

යමෙක් ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම අභිනන්දනය කෙරේනම්, හෙතෙම දුක අභිනන්දනය කෙරෙයි. යමෙක් දුක අභිනන්දනය කෙරේනම්, හෙතෙම දුකින් නොමිදුනේ යැයි කියමි.

මහණෙනි, යමෙක් රූප අභිනන්දනය නොකෙරේනම් හෙතෙම දුක අභිනන්දනය නොකරයි. යමෙක් දුක අභිනන්දනය නොකෙළේනම්, හෙතෙම දුකින් මිදුනේයැ'යි කියමි. ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම අභිනන්දනය නොකෙරේනම්, හෙතෙම දුක අභිනන්දනය නොකරයි. යමෙක් දුක අභිනන්දනය නොකරයිනම් හෙතෙම දුකින් මිදුනේයැයි කියමි.

## ආදිත්තපරියාය සූත්‍රයෙන්...

මහණෙනි, සියල්ල ඇවිලගන්නාලදී. මහණෙනි කවරසියල්ල ඇවිලගන්නාලදද යත්, මහණෙනි, ඇස ඇවිලගන්නාලදහ. රූපයෝ ඇවිලගන්නාලදහ. චක්ඛුවිඥාණය ඇවිලගන්නාලදැයැ. චක්ඛුසම්පස්සය ඇවිලගන්නාලදැයැ. චක්ඛුසම්පස්සය නිසා සුවවූ හෝ දුක්වූ හෝ නොදුක්සුව නොදුක් නොසුවවූ හෝ

යම්වේදනාවක් උපදීනම් ඒද ඇවිලගන්නාලදැයැ. සෝකයෙන්, දුක්ඛයෙන්, පරිදේවයෙන්, දෝමනස්සයන් ගෙන් උපායාශයෙන් ඇවිලගන්නාලදැයැ කියමි.

කන-ශබ්දයෙන්, නාසය-ගන්ධයෙන් දිව-රසයෙන්, කය-ස්පර්ශයන්, මනැස-මනෝවිඥාණය ඇවිලගන්නාලදයැ. රාගගින්නෙන් දෝසගින්නෙන් මෝහගින්නෙන් ඇවිල -ගන්නාලදයැ. ජාතියෙන් ජරාමරණයන් මෝහගින්නෙන් ඇවිලගන්නාලදයැ. ශෝකපරිදේවයෙන් දුක්ඛයෙන්, දෝමනස්සයෙන්, උපායාසයෙන් ඇවිලගන්නාලදයැ කියමි.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආයර්‍යශ්‍රාවකයා ඇසෙහිත්, කළකිරෙයි. රූපයන්හිත්, කළකිරෙයි. චක්ඛුවිඥාණයෙහිත් කළකිරෙයි. චක්ඛුසම්පස්සයනිසා සුවවූ හෝ දුක්වූ හෝ නොදුක් නොසුවවූ හෝ යම්වේදනාවෙක්වේනම්, එහිත් කළකිරෙයි. දිවෙහිත් කළකිරෙයි. රසයෙහිත්, කළකිරෙයි. සාණ විඥාණයෙහිත්, කළකිරෙයි. ස්පර්ශයෙහිත්, කළකිරෙයි. ස්පර්ශයනිසා සුවවූ හෝ දුක්වූ හෝ නොදුක් නොසුවවූ හෝ යම්වේදනාවක් උපදීනම් එහිත්, කළකිරෙයි. සිතෙහිත්, කළකිරෙයි. ධර්මයන්හිත්, කළකිරෙයි. මනෝවිඥාණයෙහිත්, කළකිරෙයි. මනෝ සම්පස්සයෙහිත්, කළකිරෙයි. මනෝසම්පස්සය නිසා සුවහෝ දුක්වූහෝ නොදුක් නොසුවවූ හෝ යම්වේදනාවක් උපදීනම්, එහිත් කළකිරේ. කළකිරෙන්නේ නොඇලේ. නොඇල්මෙන් මිදේ. මිදුනකල්හි මිදුනේයැ'යි දැනම වෙයි. ජාතිය ක්ෂයවූවාය. බඹසරවසා නිමවනලදී. කටයුතු කරනලදී. මේබැව් පිණිස අනෙකක් නැතිබැව් දැනගනී.

# ඛජ්ජනීය සූත්‍රයෙන් ...

මහණෙනි, අනේකප්‍රකාර පූර්වනිවාසයන් නුවණින් මෙනෙහිකරන කිසියම් ශ්‍රමණකෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්නම්, හෙතෙම මෙනෙහිකරනුයේ පඤ්චෝපාදානස්කන්ධයන්ම බව වටහාගත යුත්තේය. මහණෙනි, අතීතකාලයෙහි මෙබඳු රූපයකින් යුතුව සිටියෙමි. යනුවෙන් හෝ සිහිකරනුයේ රූපස්කන්ධයම සිහිකරයි.

මහණෙනි, අතීතකාලයෙහි මෙබඳු වේදනාඇතිව සිටියෙමියැ'යි යනුවෙන් සිහිකරනුයේනම්, වේදනාස්කන්ධයම සිහිකරනු ලබන්නේවෙයි. මහණෙනි, අතීතකාලයෙහි මෙබඳු සංස්කාරඇතිව සිටියෙමි'යි යනුවෙන් මෙනෙහිකරනු ලබනුයේනම්, හේ සිහිකරනුයේ සංස්කාර ස්කන්ධයමය.

මහණෙනි, අතීතකාලයෙහි මෙබඳු විඥාණ ඇතිව සිටියෙමි'යි යනුවෙන් සිහිකරනු ලබනුයේනම්, හෙතෙම සිහිකරනුයේ, විඥාණස්කන්ධය පිළිබඳවමය. මහණෙනි, කවරකරුණක් අරභයා "රූපය" කියන්නේදයත්, වෙනස්වන්නේය යන අරුතින් (විකාරයට පත්වන්නේය. යන අරුතින්) රූපයයැ'යි කියනුලැබේ. කුමකින් වෙනස්වේද විකාරයටපත්වේදයත්, ශීතයෙන්ද වෙනස්වෙයි. උෂ්ණයෙන්ද වෙනස්වෙයි. කුසගින්නෙන්ද වෙනස්වෙයි. පිපාසයෙන්ද වෙනස්වෙයි. ක්‍රියාවෙන්ද වෙනස්වෙයි. ධර්මතාවයන් හේතුකොටගෙනද වෙනස්වෙයි. අව්,වැසි,සුළංනිසාද වෙනස්වෙයි. සියලු හේතුප්‍රත්‍යයෙන්ම වෙනස්වෙයි. හේතුප්‍රත්‍යයෝම

වෙනස්වන්නේය. විකාරයට පත්වන්නේය. එහෙයින් වෙනස්වීමේ ස්වභාවයම "රූපය" යැ'යි කියනු ලැබේ.

මහණෙනි, කුමන කරුණක් අරභයා "වේදනා" යැ'යි කියනු ලබන්නේද යත්, විඳින්නේය. සෙලවෙන්නේය. කම්පාවන්නේය. යන අරුතින් වේදනායැ'යි කියති. කුමනකරුණක් අරභයා වේදනා ඇතිවන්නේදයත්, සුඛයවිඳී දුකදවිඳී, උපේක්ෂාවදවිඳී, මහණෙනි, මෙසේ විඳීමඅරභයා 'වේදනා" යැ'යි කියනු ලැබේ.

මහණෙනි, සංඥා යනු කවරේදයත්, "හඳුනාගැනීම" සංඥාවය'යි කියනුලැබේ. කවරකරුණකින් හඳුනාගන්නේද යත්, වර්ණහඳුනයි. ගන්ධහඳුනයි. රසහඳුනයි, ස්පර්ශහඳුනයි. මහණෙනි, මෙයාකාර හඳුනාගැනීම් "සංඥා' යැ'යි කියනුලැබේ.

මහණෙනි, කවරකරුණක් අරභයා "සංස්කාර"යැ'යි කියන්නේද යත්, උපකල්පනයකොට (සංඛත) සංස්කරණ සම්පාදනයකරන අරුතින් "සංස්කාර"යැ'යි කියති. කෙසේ සංස්කාරවන්නේද යත්, රූපය, රූපය පිණිස උපකල්පනයෙන් (සංඛත) සකස්වෙති. සම්පාදනය වෙති, වේදනා, වේදනා පිණිස (සංඛතව) උපකාලනයෙන් යළි සම්පාදනයවෙති, සකස්වෙති. නිර්මාණයවෙති. සම්පාදනයවෙති. සංස්කාර, සංස්කාරයන් පිණිස උපකල්පනයෙන් යළි සකස්වෙති. නිර්මාණය වෙති.

විඥාණය, විඥාණය පිණිස උපකල්පනයෙන් යළි සකස් වෙති, නිර්මාණය වෙති. සම්පාදනය වෙති.

මහණෙනි, උපකල්පනය (සංඛත) කරනකොට සංස්කාරයෝ යළි යළිත් සංස්කරණය වෙති. අභිසංස්කාර වෙයි. මෙසේ හෙයින් "සංස්කාර"යැ'යි කියනු ලැබේ.

මහණෙනි. කවර කරුණක් අරභයා "විඥාණ" යැ'යි කියන්නේද යත්, දැනෙන්නේය. දන්නේය. විඳින්නේය. යන අරුතින් විඥාණයැ'යි කියති. කවර කරුණු අරභයා දැනීම්වන්නේද යත්, රූපදන්නේය. ශබ්ද දන්නේය. ගඳ සුවඳ දන්නේය. සියළු රස දන්නේය. ස්පර්ශයන් දන්නේය. හොඳනරක දන්නේය. සියළු සංඛතයන් (සම්මතයන්) දන්නේය.

මහණෙනි, සිල්වත් ආයර්‍යශ්‍රාවකයා මෙසේ සිතා බලන්නේය.

මම වූ කලී දැන් රූපය ලෙසින් විඳිනු ලබන්නෙමි. දැන් පවත්නාවූ රූපය යම්සේ විඳිනුලබන්නේද? එලෙසින්ම අතීතයේද රූපය ලෙසින්විඳ ඇත්තෙමි. මම අනාගතරූපවිඳීම් ප්‍රාර්ථනා කරනුයේනම් - අනාගතයේද රූපයන් කෙරෙහි විඳිනුඇත.

මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරන හෙතෙම අතීතරූපයන් කෙරෙහි නොපිහිටයි. නොසිතයි. මෙනෙහිනොකරයි. අනාගතරූප නොපතයි. වර්තමාන රූපයෝද අත්හැරීම පිණිස බැහැරවීමපිණිස නොඇලීමපිණිස නිරෝධයපිණිස වන්නාවූ ශ්‍රද්ධාවියර්‍යය, සති, සමාධි, ප්‍රඥාවඩන්නාවූ හෙතෙම නිවන්මඟට පිවිසුනේවෙයි.

මමවර්තමානයේවේදනාවිඳිනුලබමි.මමවර්තමානයේ යම්ආකාරයකින් වේදනාවිඳිනුලබන්නෙම්ද? අතීතයේද

එලෙසින් වේදනාවන්විඳඇත්තෙමි. අනාගතයේහිද, වේදනාඇතිවීමේ හේතුප්‍රත්‍යයන් පවත්වාගනු ලබන්නේනම්, අනාගතයේදීද වේදනාවන්විඳීමට සිදුවනුඇත්තේය.

මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරන හෙතෙම අතීතවේදනාවන් මෙනෙහිනොකරයි. නොසිතයි. ඒවායේ නොඇලෙයි. අනාගතවේදනාවන් නොපතයි. වර්තමානයේවේදනාවන් බැහැරකිරීමට වෙරගනියි. අනාගතවේදනාවන් ඇතිකරලියහැකි හේතුප්‍රත්‍යයන්ගෙන් බැහැරවෙයි. වර්තමානවේදනාවන්හි නොඇලේ. ශ්‍රද්ධා, වීයර්‍ය, සති, සමාධි, ප්‍රඥාවඩන්නාවූ හෙතෙම නිවන්මඟට පිවිසුනේවෙයි.

මම දැන් සංඥාව විඳිනුලබන්නෙමි. වර්තමානයේ යම්ආකාරයකින් සංඥා විඳිනුලබන්නේද? එලෙසින් අතීතයේදීද සංඥාවිඳඇත්තෙමි. සංඥාවිඳීමේ තෘෂ්ණාවන්ඇත්තේ අනාගතයේද සංඥා විඳීමට සිදුවන්නේය.

මෙසේ ප්‍රත්‍යවේක්ෂාකරන හෙතෙම අතීතසංඥාවන් මෙනෙහිනොකරයි. නොසිතයි. අනාගත සංඥාවන් ඇතිකරලියහැකි හේතුප්‍රත්‍යයන්ගෙන් බැහැරවෙයි. අනාගතසංඥා නොපතයි. වර්තමානයේ විඳින සංඥාවන්හි නොපිහිටයි. නොඇලෙයි, බැහැරවෙයි. ශ්‍රද්ධා, වීයර්‍ය, සති, සමාධි, ප්‍රඥා වඩන හෙතෙම නිවන්මඟට පිවිසුනේවෙයි.

මම දැන් විඥාණය විඳිනුලබන්නෙමි. මම වර්තමානයේ යම්ආකාරයක විඥාණය විඳිනුලබන්නේවෙම්ද, අතීතයේද

විඥාණයේවිඳීම් ලබාඇත්තෙමි. අනාගතයේදීද විඥාණයේ විඳීම්ලැබීමේ හේතුප්‍රත්‍යයන් ඇතිකරනුයේනම්, අනාගතයෙහිදීද විඥාණයේ විඳීම්ලබන්නට සිදුවනුඇත.

හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂාකොට අතීතවිඥාණවිඳීම්හි නොඇලේ. නොගැටෙයි. සිහිපත්නොකරයි. අනාගතයේද විඥාණවිඳීම් නොපතනුයේ අනාගත විඥාණකාරක හේතුප්‍රත්‍යයන්ගෙන් බැහැරවෙයි. වර්තමානයේ විඳිනුලබන විඥානයෙහි නොපිහිටයි. නොඇලෙයි. නොගිලෙයි බැහැරවෙයි. ශ්‍රද්ධා, වියර්‍ය, සති, සමාධි, ප්‍රඥාවඩන හෙතෙම නිවන්මඟට පිවිසුනේ වෙයි.

මහණෙනි, කුමක් සිතන්නේද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය වේද,

ස්වාමිනි, අනිත්‍යය.

යමක් අනිත්‍යවේනම් හේ දුක්ඛ හෝ සුඛ වේද?

ස්වාමීනි, දුක්ය

යමක් අනිත්‍යවේනම් දුක්වේනම්, දුකට පෙරළෙන ස්වභාවයවේනම්, මේ මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මය වශයෙන් ඒ නිවැරදි ලෙසින් නුවණින් දැකිය යුත්තේය?

ස්වාමීනි, එසේ නොදැකියයුත්තේය.

මහණෙනි, ඒඅයුරින්ම අධ්‍යාත්මිකවේවා. බාහිරවේවා. අසංවරවේවා. සියුම්වේවා. දුර්වලවේවා. ප්‍රණීතවේවා, දුරින්වේවා, සමීපයෙහිවේවා, අතීතානාගතයේ හැඟෙන

යම්රූපයක් ඇත්නම්, ඒ හැම රූපය ඒ මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි. යනුවෙන් එම කරුණුපිළිබඳ නිවැරදිස්වභාවය නිවැරදිප්‍රඥාවෙන් දැනගතයුතුය. යම්ආකාරයක වේදනාඇත්තේද, යම්ආකාරයක සංඥාඇත්තේ ද, යම් ආකාරයක සංස්කාරඇත්තේද, අධ්‍යාත්මිකවේවා. බාහිරවේවා, අසංවරවේවා, සියුම්වේවා, දුර්වලවේවා, ප්‍රණීතවේවා, ඈතින්වේවා, සමීපයෙහිවේවා, අතීතානාගතයේ පැවති හෝ පවත්නාවූ යම් විඥාණයක් ඇත්තේවේවා, එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය යනාදී වශයෙන් නිවැරදිඅයුරින් ප්‍රඥාවෙන්ම දැකියයුතුය. මහණෙනි, මේ ආයඞීශ්‍රාවකයා සංසාරවට්ටය (සංසාරය දියසුළිය) ඉවත්කරයි. රැස්නොකරයි, දුරුකරයි, නොඇලෙයි, නොගනියි, විසුරුවයි, කැටිනොකරයි, නිවයි, නොදල්වන්නේය. යැ'යි කියනු ලැබේ.

**කුමක් වනසාද, රැස් නොකෙරේද යත්,**

රූප වනසයි, රැස්නොකරයි.

වේදනා වනසයි, රැස්නොකරයි.

සංඥා වනසයි, රැස්නොකරයි.

සංස්කාර වනසයි, රැස්නොකරයි.

විඥාණ වනසයි, රැස්නොකරයි.

**කුමක් අත්හරින්නේද? නොගනීද යත්**

රූප බැහැරලයි - නොගනියි.

වේදනා  බැහැරලයි - නොගනියි.

සංඥා බැහැරලයි - නොගනියි.

සංස්කාර බැහැරලයි - නොගනියි.

විඥාණ බැහැරලයි - නොගනියි.

**කුමක් විසුරුවාද, රැස් නොකරේද යත්,**

රූපය විසුරුවයි, - රැස්නොකරයි.

වේදනා විසුරුවයි, - රැස්නොකරයි.

සංඥා විසුරුවයි, - රැස්නොකරයි.

සංස්කාර විසුරුවයි, - රැස්නොකරයි.

විඥාණ විසුරුවයි, - රැස්නොකරයි.

**කුමක් නිවාද - නොදල්වාද යත්,**

රූප නිවයි, නොදල්වයි

වේදනා නිවයි, නොදල්වයි

සංඥා නිවයි, නොදල්වයි

සංස්කාර නිවයි, නොදල්වයි

විඥාණ නිවයි, නොදල්වයි

**මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා**

රූපකෙරෙහි සංවේගයට (කලකිරීමට) පත්වේ.

වේදනාකෙරෙහි සංවේගයට පත්වේ.

සංඥාකෙරෙහි සංවේගයට පත්වේ.

සංස්කාරකෙරෙහි සංවේගයට පත්වේ.

විඥාණකෙරෙහි සංවේගයට පත්වේ.

සංවේගයටපත්වනුයේ නොඇලෙයි. නොඇලීම හේතුවෙන්, නිදහස් වෙයි. නිදහස්වත්ම, නිදහස්වූයෙමි. ඥාණය ඇතිවෙයි. යළිඋපත නිමවිය. බ්‍රහ්මචර්‍ය්‍ය නිමවිය. කළයුතුසියල්ල කළෙමි. රහත්බව පිණිස කළහැකි, කලයුතු, අන්කිසිවක් නොමැතිබව ප්‍රත්‍යක්ෂ වෙයි.

මහණෙනි, මේ මහණ තෙම,

රැස් නොකරයි, නොවනසයි, වනසාසිටියේ වෙයි.

අත්නොහරි, නොගනී, අත්හැරසිටියේ වෙයි.

නොවිසුරුවයි, රැස්නොකරයි, විසුරුවාසිටියේ වෙයි.

නොනිවයි, නොදල්වයි, නිවාසිටියේයැ'යි කියනු ලැබේ.

**කුමක් රැස්නොකෙරේද? නොවනසාද, වනසා සිටියේවේද? යත්,**

රූප රැස්නොකරයි. නොවනසයි, වනසාසිටියේ වෙයි,

වේදනා රැස්නොකරයි. නොවනසයි, වනසාසිටියේ වෙයි.

සංඥා රැස්නොකරයි. නොවනසයි, වනසාසිටියේ වෙයි.

සංස්කාර රැස්නොකරයි. නොවනසයි, වනසාසිටියේ වෙයි.

විඥාණ රැස්නොකරයි. නොවනසයි, වනසාසිටියේ වෙයි.

**කුමක් නොහරින්නේද, නොගන්නේද හැරදමා සිටින්නේවේද යත්,**

රූප නොහරියි, නොගනියි, හැරදමාසිටියේ වෙයි.

වේදනා නොහරියි, නොගනියි, හැරදමාසිටියේ වෙයි.

සංඥා නොහරියි, නොගනියි, හැරදමාසිටියේ වෙයි.

සංස්කාර නොහරියි, නොගනියි, හැරදමාසිටියේ වෙයි.

විඥාණ නොහරියි, නොගනියි, හැරදමාසිටියේ වෙයි.

**කුමක් විසුරුවයිද? රැස් නොකරයිද, විසුරුවා සිටියේ වේද යත්,**

රූප නොමවිසුරුවයි, රැස්නොකරයි. විසුරුවාසිටියේ වෙයි.

වේදනා නොමවිසුරුවයි. රැස්නොකරයි. විසුරුවාසිටියේ වෙයි.

සංඥා නොමවිසුරුවයි, රැස්නොකරයි. විසුරුවාසිටියේ වෙයි.

සංස්කාර නොමවිසුරුවයි, රැස්නොකරයි. විසුරුවාසිටියේ වෙයි.

විඥාණ නොමවිසුරුවයි. රැස්නොකරයි. විසුරුවාසිටියේ වෙයි.

**කුමක් නිවා දමන්නේද, නොදල්වන්නේද, නොනිවාද, නොදල්වාද, සිටියේ වේද යත්,**

රූප නොනිවයි, නොදල්වයි, නිවාදැමුවේ වෙයි.

වේදනා නොනිවයි, නොදල්වයි, නිවාදැමුවේ වෙයි.

සංඥා නොනිවයි, නොදල්වයි, නිවාදැමුවේ වෙයි.

සංස්කාර නොනිවයි, නොදල්වයි නිවාදමුවේ වෙයි.

විඥාණ නොනිවයි, නොදල්වයි, නිවාදැමුවේ වෙයි.

මහණෙනි, මෙසේ නිදහස් (විමුක්ත) සිත්ඇති මහණුන්හට ඉන්ද්‍රයා සහිත, බ්‍රහ්මයා සහිත, ප්‍රජාපති (මරු) සහිත දෙවියෝ දුරින්සිට නමස්කාර කරති.

ඒ කෙසේද යත්,

යමක් ඇසුරුකොට ධ්‍යාන වඩන්නේද? තෘෂ්ණා දුරුකොට නිදහස් සිතින් නිර්වාණගාමී මඟටපිවිසුණ පුරුෂ ශ්‍රේෂ්ඨයාණනි, ඔබට නමස්කාර වේවා, පුරුෂෝත්තමයාණනි, ඔබට නමස්කාර වේවා..

# අලගද්දූපම සූත්‍රයෙන්...

මහණෙනි, මෙබඳු වාදඇති, මෙසේ කියනසුළු මම යම්සේ විනාශකයෙක් නොවෙම්ද, මම යම්පරිද්දකින් හෝ සත්ත්වයාගේ විනාශයක් නොපණවම්ද, එසේවූ මට ඇතැම් මහණබමුණන් "ශ්‍රමණ ගෞතම තෙමේ සත්ත්වවිනාශය කරන්නෙකි. ඇත්තාවූ සත්ත්වයාගේ සිඳීම, වැනසීම, හටනොගැන්ම පනවන්නේ"යැ'යි අසත්‍යයෙන්, හිස්දෙයින් බොරුවෙන්, අභූතයෙන් දෝෂාරෝපණය කෙරෙත්.

මහණෙනි, මම පෙර(බෝමැඩදී)ද, දැනුදුද දුකත්, දුක්ඛනිරෝධයත් පනවමි. මහණෙනි, මෙහිලා අන්‍යයෝ තථාගතයනට නින්දාකරත්ද, පරිභවකරත්ද, රොස්බස් කියත්ද, වෙහෙසත්ද, එකිනෙකා බිඳුවමින් කථාකෙරෙද්ද,

මහණෙනි, එහි තථාගතයන්ගේ වෛරයක් නැත. නොසතුටෙක් නැත. සිතේදොම්නසෙක් නැත. මහණෙනි, එහිලා අන්‍යයෝ තථාගතයනට සත්කාර කෙරෙත්ද, ගරු කෙරෙත්ද, බුහුමන් කෙරෙත්ද, පුදත්ද,

මහණෙනි, එහි තථාගතයන්ට සතුටෙක් නොවෙයි. සොම්නසෙක් නොවෙයි. සිතෙහිඉල්පෙන ප්‍රීතියක් නොවෙයි.

මහණෙනි, එහි අන්‍යයෝ තථාගතයන්ට සත්කාරකෙරෙත්ද, ගරුකෙරෙත්ද, බුහුමන්කෙරෙත්ද, පුදත්ද.

මහණෙනි, එහිලා තථාගතයන් "යම්මේ පඤ්චස්කන්ධයක් බෝමැඩදී පිරිසිඳ දැනගන්නාලද්දේද, ඒ

පඤ්චද්කන්ධයට මෙබඳුවූ සත්කාරයෝ කරනුලබන්නේ" යැ'යි මෙපමණක්ම අදහස් වෙයි.

මහණෙනි, එහෙයින් මෙහි අන්‍යයෝ තොපටද ආක්‍රෝශකරන්නාහුනම්, පරිභවකරන්නාහුනම්, රොස්උපදවන්නාහුනම්, වෙහෙසන්නාහුනම්, ගටන්නාහුනම්, ඒ කාරණයෙහි තොපවිසින් කෝප නොකළයුතුය. දොම්නස් නොකළයුතුය. සිතෙහි අසතුටක් ඇතිකර නොගතයුතුය.

මහණෙනි, එහෙයින් මෙහි තොපට අන්‍යයෝ සත්කාරකරන්නාහුනම්, ගරුකරන්නාහුනම්, බුහුමන්කරන්නාහුනම්, පුදන්නාහුනම්,

මහණෙනි, ඒ කරුණෙහි තොප විසිනුත්, සතුටක් නොකටයුතුයි. සොම්නසක් නොකටයුතුයි. සිතෙහිඋපුල්වන ප්‍රීතියක් නොකටයුතුයි.

මහණෙනි, එහෙයින් මෙහි තොපටද අන්‍යයෝ සත්කාරකෙරෙත්නම්, ගරුතෙරෙත්නම්, බුහුමන්තෙරෙත්නම්, පුදත්නම්,

මහණෙනි, ඒ කරුණෙහිලා, "යම් පඤ්චස්කන්ධයක් පෙර පිරිසිඳදන්නාලද්දේද, ඒ පඤ්චස්කන්ධයට මෙවැනි සත්කාර කරනුලැබෙත්යැ'යි තොපටද ප්‍රත්‍යක්ෂවන්නේය.

මහණෙනි, එහෙයින් මෙහි යමක් තොපගේ නොවේ නම්, එය බැහැරකරවූ. එය ප්‍රහීණ කරනලද්දේ, තොපට බොහෝ කාලයක් හිතපිණිස වන්නේය. සුවපිණිස වන්නේය.

මහණෙනි, කුමක් තොපගේ නොවේද?

මහණෙනි, රූපය තොපගේනොවෙයි. එහිඇල්ම දුරුකරවූ. එය දුරුකරනලද්දේ, තොපට දිගුකලක් හිතපිණිස සැපපිණිස වන්නේය.

මහණෙනි, වේදනාව තොපගේනොවෙයි. එහිඇල්ම දුරුකරවූ එය දුරුකරනලද්දේ, තොපට දිගුකලක් හිතපිණිස, සැපපිණිස වන්නේය.

මහණෙනි, සංඥාව තොපගේනොවෙයි. එහිඇල්ම දුරුකරවූ, එය දුරුකරනලද්දේ, තොපට දිගුකලක් හිතපිණිස, සැපපිණිස වන්නේය.

මහණෙනි, සංස්කාරයෝ තොපගේනොවෙත්. ඔවුන්කෙරෙහි ඇල්මදුරුකරවූ. ඔහු දුරුකරනලද්දේ තොපට දිගුකලක් හිතපිණිස, සැපපිණිස වන්නාහුය.

මහණෙනි, විඥාණය තොපගේනොවෙයි. එහිඇල්ම දුරුකරවූ. එහිඇල්ම දුරුකරණලද්දේ, තොපට දිගුකලක් හිතපිණිස, සැපපිණිස වන්නේය.

මහණෙනි, මවිසින් ධර්මය මැනවින් දෙසනලදී. ප්‍රකටකරනලදී. විවෘත කරනලදී. පවසනලදී.

මහණෙනි, මා විසින් මෙසේ මැනවින්දෙසූ, ප්‍රකටකළ විවෘතකළ, හෙළිකළ, සිඳහළකෙළෙස්(කසළ)ඇති, මේධර්මයෙහි රහත්වූ, ක්ෂීණවූ ආස්‍රවඇති, වැසනිමවූ බඹසරඇති සිවුමඟින්කළ කිසඇති, බහාතැබූ කෙලෙස්බරඇති, පැමිණි රහත්බව ඇති, සිව්ප්‍රකාරයෙන් ක්ෂීණකළ භව සංයෝජනඇති මැනවින් නුවණින්දැන

කෙලෙසුන්ගෙන් මිදුන, යම් මහණකෙනෙක්වෙත්ද, ඔවුනට ඇතැ'යි දක්වන්නට සසරවටෙක් (සසර සැරිසැරීමක්) නැත.

(අලගද්දූපම සූත්‍රයෙන්)

## ඕඝ තරණීය සූත්‍රය

**දේවතා : කථන්නු ත්වං මාරිස, ඔඝමතිරීති?**

නිදුකානන් වහන්ස, ඔබවහන්සේ කෙසේ ඕඝය තරණයකළ සේක්ද?

**භාග්‍යවත්හු : අප්පතිට්ඨං බවාහං ආවුසෝ අනායුහං ඔඝමතරින්ති.**

ඇවැත්නි, මම නොපිහිටමින්ද, වෑයම් නොකරමින්ද, ඕඝය තරණයකළෙමි.

**දේවතා : යථා කථං පන ත්වං මාරිස අප්පතිට්ඨං අනායුහං ඔඝමතරීති**

නිදුකානන් වහන්ස, ඔබවහන්සේ කෙසේ නම් නොපිහිටමින්ද, වෑයම්නොකරමින්ද, ඕඝය තරණය කළසේක්ද?

**භගවත්හු : යදා ස්වාහං ආවුසො සන්තිට්ඨාමි. තදාස්සු සංසීදාමි. යදා ස්වාහං ආවුසො ආයුහාමි තදාස්සු නිබ්බුයිහාමි එවං**

**බවානං ආවුසො අප්පතිට්ඨං අනායුහං ඔඝමතිරින්ති.**

ඇවැත්නි, මම යම්විටෙක පිහිටාසිටිම්ද එකල්හිගිලෙමි. ඇවැත්නි මම යම්විටෙක

වෑයම්කෙරෙම්ද එකල්හි ඉවතට

විසිවීයන්නේය. එහෙයින් මෙසේ මම නොපිහිටමින්, වෑයම්දනොකරමින් ඕඝය

තරණයකළෙමි.

**දේවතා** : **චිරස්සං වත පස්සාමි බ්‍රාහ්මණං පරිනිබබු තං අප්පතිට්ඨං අනායුහං තිණ්ණං ලොකෙ විසත්තිකං**

නොපිහිටමින්, වෑයම්නොකරමින්, ලෝකයෙහි තෘෂ්ණාව තරණයකළ, කෙලෙස්නැසූ, ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයෙකු කලෙකින් දකිමි.

(ඕඝතරණීය සූත්‍රයෙනි)

## ගමන නිමවිය

ස්වාමීනි, ඔබ දන්නවාද?

එසේ නොකියමි.

ස්වාමීනි, ඔබ නොදන්නවාද?

එසේ නොකියමි.

ස්වාමීනි, ඔබ දන්නේත් වේ, නොදන්නේත් වේද? එසේ නම් ඔබ පවසනුයේ කුමක්ද?

උපාසක, ඔබ විසින් වටහා ගත යුත්තේද එයයි. හේතුප්‍රත්‍යයයි. කවරෙක් පැවසුවේවුවද, ඔබ වැටහුනේයැ'යි කියයි නම්, ඔබ අනුගත වූයේ පංචඋපාදානස්කන්දයකටමය. ඒ පංචඋපාදානස්කන්දයෙන් වෙනස්වන්නෝමය. වෙනස් වන්නේ සුන්‍යවන්නේය. සුන්‍ය වූයේ පවතිනුයේ කවරක්ද, නොවන්නාවූ නොපවතින්නාවූ එවැන්නක් කෙසේ පවසන්නද?

ස්වාමීනි, ඔබ පවසන ආකාරයට අනුව "සුන්‍ය" නොපවතින්නේද?

සුන්‍ය යනුද , හුදු වචනයක්ම පමණී. වචනයෙන් ගොඩනැගුන (වචීසංස්කාරයක්) සකස්කිරිමක් පමණී. වචනයෙහි බැඳුනකළ නාමරූප සංඥාවෙන් ගැවසුන පංචඋපාදානස්කන්දයක මංමුලාවන්නේය. එසේ වනුයේ ඔබ ධර්ම සම්භාවයන් වටහා නොගත් නිසාය. අවිද්‍යාවෙහි ගැලී සිටින නිසාය. යථා සම්භාවයන් පිළිබඳව තත්වාවබෝධය නොලත් නිසාය.

මා තුල මහත් අවුලකි. මෙය නිරවුල් කර ගැනීමට තථාගතයන් වහන්සේ විසින් දේශනා කළ උපමා කිසිවක් දැක්විය හැකිද?

තථාගතයන් වහන්සේ විසින් දේශනාකොට වදාරා ඇති මජෙඣ සූත්‍රය හා කිංසුකෝපම සූත්‍ර කියවා වටහා ගන්න. එහි අවසන මෙලෙසින් දැක්වෙයි.

වහන්ස, එකල්හි මම ඒ මහණහුගේ පැන විසඳීමෙන් සතුටු නොවූයෙම් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියෙමි. වහන්ස, කෙතෙකින් මහණහුගේ දර්ශණය සුවිශුද්ධ වේ දැ? යි.

මහණ, යම්සේ පුරුෂයක් විසින් කෑලගස නුදුටුවිරූ වන්නේද, හෙතෙමේ කෑල ගසක් දුටු එක්තරා පුද්ගලයෙකු වෙත එළඹෙන්නේය. එළඹ ඒ පුරුෂයාට "පින්වත් පුරුෂය, කෑල ගස කෙබඳුදැ?" යි මෙසේ කියන්නේය. හෙතෙමේ එම්බල පුරුෂය, "කෑලගස දාගිය කණුවක් මෙන් කළුය" යි මෙසේ කියන්නේය. මහණ, ඒ පුරුෂයාගේ දැකීම යම්බඳු නම් එසමයෙහි කෑලගස එබඳුම වන්නේය.

මහණ, එකල්හි ඒ පුරුෂ තෙමේ ඒ පුරුෂයාගේ පැන විසඳීමෙන් සතුටු නොවූයේ කෑලගසක් දුටු එක්තරා පුරුෂයෙකු වෙත එළඹෙන්නේය. එළඹ ඒ පුරුෂයාට පින්වත් පුරුෂය, " කෑල ගස කෙබඳුදැ?" යි මෙසේ කියන්නේය. හෙතෙමේ එම්බල පුරුෂය, කෑලගස මස් වැදැල්ලක් මෙන් ලෙහෙවන්ය'යි මෙසේ කියන්නේය. මහණ, ඒ පුරුෂයාගේ දැකුම යම්බඳු නම් එසමයෙහි කෑලගස එබඳුම වන්නේය.

මහණ, එකල්හි ඒ පුරුෂ තෙමේ ඒ පුරුෂයාගේ පැන විසඳීමෙන් නොසතුටු වූයේ කැලගසක් දුටු එක්තරා පුරුෂයෙකු වෙත එළඹෙන්නේය. එළඹ ඒ පුරුෂයාට පින්වත් පුරුෂය, " කැල ගස කෙබඳුදැ?" යි මෙසේ කියන්නේය. හෙතෙමේ එම්බල පුරුෂය, කැලගස මහරි ගසක් මෙන් පැලුණු කරල් ඇත්තේ ගැලවුණු පොතු ඇත්තේ ය" යි මෙසේ කියන්නේය. මහණ, ඒ පුරුෂයාගේ දැකුම යම්බඳු නම් එසමයෙහි කැලගස එබඳුම වන්නේය.

මහණ, එකල්හි ඒ පුරුෂ තෙමේ ඒ පුරුෂයාගේ පැන විසඳීමෙන් නොසතුටු වූයේ කැලගසක් දුටු එක්තරා පුරුෂයෙකු වෙත එළඹෙන්නේය. එළඹ ඒ පුරුෂයාට පින්වත් පුරුෂය, " කැල ගස කෙබඳුදැ?" යි මෙසේ කියන්නේය. හෙතෙමේ එම්බල පුරුෂය, කැලගස නුග රැකක් මෙන් ගනසෙවණ ඇත්තේ ය" යි මෙසේ කියන්නේය. මහණ, ඒ පුරුෂයාගේ දැකුම යම්බඳු නම් එසමයෙහි කැලගස එබඳුම වන්නේය. මහණ, එසෙයින් ම යම් යම් පරිදි අවබෝධ කරන ලද ඒ සත්පුරුෂයන්ගේ දැක්ම සුපිරිසිදු වී නම් ඒ ඒ සත්පුරුෂයන් විසින් ඒ ඒ පරිද්දෙන් පවසන ලද්දේය.

සෙය්‍යථාපි භික්‌ඛු රඤ්ඤො පච්චන්තිමං නගරං දළ්හුද්දාපං දළ්හ පාකාරතොරණං ඡද්වාරං තත්‍රස්ස දොවාරිකො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවි අඤ්ඤාතානං නිවාරෙතා ඤාතානං පවෙසෙතා, පුරත්ථිමාය දිසාය ආගන්ත්වා සීඝං දූතයුගං තං දොවාරිකං එවං වදෙය්‍යඃ "කහංමෙහා පුරිස, ඉමස්ස නගරස්ස නගරසාමී"ති? සො එවං වදෙය්‍යඃ එසො භන්තෙ මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නොති.

අථ ඛො තං සීඝං දූතයුගං නගරසාමිස්ස යථාභූතං වචනං නීයාතෙත්වා යථාගතමග්ගං පටිපජ්ජෙය්‍ය. පච්ඡිමාය දිසාය ආගන්ත්වා සීඝං දූතයුගං -පෙ- උත්තරාය දිසාය ආගන්ත්වා සීඝං දූතයුගං -පෙ- දක්ඛිණාය දිසාය ආගන්ත්වා සීඝං දූතයුගං තං දොවාරිකං එවං වෙදෙය්‍යඃ "කත්ථමෙහා පුරිස ඉමස්ස නගරස්ස නගරසාමීති? සො එවං වදෙය්‍යඃ එසො හන්තෙ මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නොති. අථ ඛො තං සීඝං දූතයුගං නගරසාමිස්ස යථාභූතං වචනං නීයාතෙත්වා යථාගතමග්ගං පටිපජ්ජෙය්‍ය.

උපමාඛො මය්‍යායං භික්ඛු කතා අත්ථස්ස විඤ්ඤාපනාය, අයඤ්චෙවෙත්ථ අත්ථොඃ නගරන්ති ඛො භික්ඛු ඉමස්සෙතං චාතුම්මහාභූතිකස්ස කායස්ස අධිවචනං මාතාපෙත්තිකසම්භවස්ස ඔදනකුම්මාසූපචයස්ස අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසන ධම්මස්ස. ඡද්වාරන්ති ඛො භික්ඛු, ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං දොවාරිකොති ඛො භික්ඛු සතියා එතං අධිවචනං සීඝං දූතයුගන්ති ඛො භික්ඛු සමථවිපස්සනානේථං අධිවචනං නගරසාමීති ඛෝ භික්ඛු විඤ්ඤාණස්සේතං අධිවචනං මජ්ඣෙ සිඞඝාටකොති ඛො භික්ඛු චතුන්නෙන්තං මහාභූතානං අධිවචනං පඨවිධාතුයා ආපොධාතුයා තෙජොධාතුයා වායොධාතුයා යථාභූතවචනන්ති ඛො භික්ඛු නිබ්බානස්සෙතං අධිවචනං යථාගතමග්ගොති ඛො භාක්ඛු අරියස්සෙතං අට්ඨඞගිකස්ස මග්ගස්ස අධ්වදනං සෙය්‍යථීදංඃ සම්මාදිට්ඨියා -පෙ- සම්මාසමාධිස්සාති.

ඇවත්නි, යම්සේ රජෙකුහට අයත්, අලංකාර තොරන්, අගල්, පවුරු ආදියෙන් වටවූ මහානුවරක් වන්නේද? එහි බුද්ධිමත් වූ ප්‍රාඥායින්හට ඇතුළුවීමට අවසර දෙනුලබන, මෝඩයින්හට එහි ඇතුළුවීමට අවසර නොදෙන බුද්ධිමත් දොරටුපාලයෙක් වන්නේය.

ක්ෂණිකව පහළවූ පණිවිඩකරුවන් දෙදෙනෙකු නැගෙනහිර දෙසින් දොරටුපල්ලා වෙත පැමිණ,

දොරටු පාලකය, මේ නුවර හිමිකරු කොහිදැ'යි විමසන්නේය.

ස්වාමීණි, හෙතෙම නුවර තුල, සතරමං හංදියෙහි සිටින්නේයැ'යි දොරටුපල්ලා පවසන්නේය.

එවිට ක්ෂණිකව පහළ වූ පණිවිඩකරුවන් දෙදෙනා විසින්, නුවරහිමියා පිළිබඳ සැබෑ ස්වරූපය දොරටුපාලයාහට පහදා දෙන්නේය. යථාභූත ස්වභාවය හුදු වචන රැසක් පමණක්ම බව පවසමින් පැමිණි මගෙහිම බැහැර විය. වේගවත් පණිවිඩකරුවන් දෙදෙනා සතර දිශාවෙන්ම පැමිණ, දොරටුපල්ලා අමතා "එම්බා පුරුෂය, මෙනුවර නුවර හිමියා කොහිදැයි" ලෙසින් විමසන්නේය.

හෙතෙම ස්වාමිනි, මෙනුවර හිමිකරු මැද සිවුමංසළෙහි සිටී, කියා කියන්නේය. එකල්හි ඒ වේගවත් පණිවිඩකරුවන් දෙදෙනා යථාස්වරූපය දොරටුපාලයාහට පහදා දෙනුයේ සියල්ල හුදෙක් වචන රැසක්ම බව පවසමින් පැමිණි මගෙහිම ගියේය.

මහණ, අර්ථය වටහාදීම පිණිස මවිසින් උපමාවක් පවසනු ලදිමි. මේ එහි අරුතයි.

මහණ, ආරක්ෂිත නුවර යනු ඇස, කණ, නාසය, දිව, කය, මනස යන මේ අංගයන්ගෙන් සපිරි, බතින් අහරින් වැඩුනේය අනිත්‍ය වූයේ වේදනාකාරක, ඉල්ලීම්, පිරමැදීම්, කැඩිබිඳී, විනාශ වන්නේ ය යනුද ආයතනයන් යනුද, මේ පංචස්කන්ධය "කය" හැඳින්වීමට සංස්කරග න්නා හුදු වචන රැසක්ම පමණි. දොරටුපල්ලා යනු " සිහිය" උපමාකොට යෙදුන වචනයකි. හුදු වචනයක්ම පමණි.

ක්ෂණිකව පහළ වන වේගවත් පණිවිඩකරුවන් දෙදෙනා යනු සමථ, විදර්ශණ හැඳින්වීමට යොදා ගත් වචන පෙළකි. "උපමා" කළ යනුද, හුදෙක් වචන රැසක් හේතුකොට සකස්වුයේම පමණි.

නුවරහිමියාය යනු කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා කෙරෙන් සැකසුන පූර්ව මතකය හෙවත් විඤ්ඤාණ නාමධාරී හැඟීම උපදවන හුදු වචන රැසක්ම පමණි.

මහණ, මැද සිවුමංසල යනු, පඨවි, ආපෝ තේජෝ, වායෝ ධාතූන් හැඳින්වීම පිණිස යෙදෙන වචන රැ සකි. ධාතූන් යනුද හුදු වචනයක්ම පමණි. එහි ගතයුතු පවත්නා කිසිවක් නොවන, වචනයෙන් සකස් වූ, වචීසංස්කාරකයෝම පමණි.

මහණ, වූ පරිදි යනු නිවන හැඳින්වීමට යෙදෙන වචනයකි. එහෙයින් නිවන යනුදු හුදු වචනයක්ම පමණි. එය වටහා ගත යුත්තේ මිස සෙවිය යුත්තක් නොවන්නේය.

මහණ, ආ මග යනු ආයර්‍ය අෂ්ඨාංගිකමාර්ගය, එනම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධිය හැඳින්වීම සඳහා යෙදෙන හුදු වචන රැසක්ම පමණි. (අධිවචන)

කිංසුබොපමසූත්‍රය
සංයුක්තනිකාය
වේදනාසංයුක්තය

මෙම සූත්‍රය අනුව අවිද්‍යාවේ ප්‍රමුඛ ස්ථානයක් වචීසංස්කරණය සතුබව වටහා ගත හැකිය. එලෙසින් සම්මුතියේ පවතින නාමරූපයන්ගෙන් සපිරි මිථ්‍යා දෘෂ්ඨියෙන් ගැලවීගත හැකි නම් පහළ වනුයේ නිවැරදි දැකීමයි. සම්මා දිට්ඨියයි.

සියළු සංස්කාරයන් සිදුවනුයේ වචනයෙනි, වචීසංස්කාරයෙන්, වචීසංස්කාර නොවනුයේ කායසංස්කාර හෝ චිත්තසංස්කාර නොවන්නේය. එතැන සමාධියයි. මේ සියල්ල වචන සමූහයක්ම පමණක් බව වැටහෙන කළ නිරෝධය ද සුන්‍ය බවද ප්‍රත්‍යක්ෂ වනුයේ, නිවීයන්නේය.

උපාසක, තථාගතයන් වහන්සේ විසින් උපමා ලෙසින් දේශනාකොට අනතුරුව පැහැදිලිකර දී ඇති හේතුප්‍රත්‍ය ධර්ම කාරණාවන් ප්‍රඥාවන්තයින් හට සත්‍යාවබෝධය පිණිස මහෝපකාරී වන බවක් ඔබට වැටහෙනු ඇත.

මා පත්වී සිටින මුළාව පිළිබඳව මට වැටහෙයි. ස්වාමීනි මා තුළ පවතින අවබෝධය වඩාත් පැහැදිළිවීම පිණිස තවත් ධර්ම කාරණා කිසිවක් දැක්විය හැකිද?

උපාසක, කේවට්ට බමුණා හට තථාගතයන් වහන්සේ විසින් දේශනාකොට වදාරා ඇති මෙම ගාථා පාඨය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බ තෝ පභං
එත්ත ආපෝ ච පඨවි තෙජෝ වායො න ගාධති
එත්ථ දීඝඤ්ච රසසඤ්ච - අණුථූලං ශුභා ශුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරෝධෙන - එතේථං උපරුජ්ඣති

කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හාවෙන් සපිරි පූර්ව මතකයන්ගෙන් සැදුන විඤ්ඤාණය නොපෙනී යෑමෙන්, අහෝසිවීමෙන් යථාභූත ස්වභාවයන් පැහැදිළි වන්නේය. එවිට ජලය, පෘථිවිය, ගින්න, වාතය වැනි නාමරූප කිසිවක් නොවන්නේය.

දිගු බව, කෙටි බව, කෙසඟ බව, තර බව, ශුභ අශුභවාචී සංස්කාර වූ නාම සංඥා, රූප සංඥා ශේෂයකින් තොරව අහෝසි වන්නේය.

ත්‍රිවිධ තෘෂ්ණාවන්ගෙන් සපිරි පූර්ව මතක ප්‍රත්‍යයෙන් සැකසුන විඤ්ඤාණය අහෝසිවීමෙන් සියලු සංස්කාරයන්, සකස්කිරීම් නිරුද්ධවන්නේය. අහෝසිවන්නේය.

කෙවඩ්ඩ සූත්‍රය

දීඝ නිකාය - ශීලාස්කන්ධ වර්ගය

එපමණක් නොව තථාගතයන් වහන්සේ විසින් දේශනා කොට වදාරා ඇති මෙම සූත්‍රය පාඨය කෙරෙහිද ඔබ හැමගේ අවධානය යොමුකරන්න.

"යායං තණ්හා - පුනෝභවිකා තත්‍ර තත්‍රභනන්දනී

සෙය්‍යාන්දං කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා"

වැඩී ගිය තණ්හාවෙන් යුතුව යලි යලිත් ක්‍රියාවලියන් ඇරඹෙන (පුනර්භව) ඇසුරින් පූර්ව මතයන් හි ගැලෙමින් මෙනෙහි කරමින් නැවත නැවතත් මහත් රුචියෙන් යුතුව ආශ්වාදය ලබන්නට යෑමෙන් කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වැඩෙන්නේමය. විඥ්ඥානය සැකසෙන්නේය.

නිසි අවබෝධයක් නොමැතිකම හේතුවෙන් තෘෂ්ණාවන්ගේ හට ගැනීම පිළිබඳව මෙයින් වැටහෙන්නේය.

තථාගතයන් වහන්සේ විසින් බුදුබව ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙන් අනතුරුව, උදාන පාඨයක් වදාරන ලද බව, ධර්මග්‍රන්ථයන් පරිශීලනය කිරීමේදී අපට හමුවෙයි. එය මෙසේ වේ.

"අනෙක ජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං
ග්‍රහකාරකං ගවෙසන්ති
දුක්ඛාජාති පුනප්පුනං

ග්‍රහකාරකං දිට්ඨොසි
පුනගෙහ්‍යයංන කාහසී
සබ්බා තෙ පාසුකා භග්ගා
ග්‍රහකූටං විසංඛිතං

විසංකාරං ගතං චිත්තං
තණ්හානං ඛය මජ්ඣහා

නැවත නැවතත් "තණ්හා" නැමති "ගෙය" සාදනු ලබන වඩුවා සොයමින්, අනන්ත අප්‍රමාණ කාලයක් සසරෙහි සැරිසැරුවෙමි.

"ගෙය" සාදන්නා වූ වඩුවා දුටුවෙමි. ගෙය සෑදීමට උපයෝගීකරන්නා මූලිකාංගයන් විනාශ කළෙමි. ධර්ම ස්වභාවය වටහා ගතිමි. තණ්හාව නැමති ගෙය සකස්වීමට හේතුවන (ගතවූ) සියළු සංස්කාර (සකස්කිරීම්) ශේෂයකින් තොරව විනාශ අතීතය මෙනෙහි කිරීම් අත්හළෙමි.

ගෘහය තණ්හාවය, තණ්හාව ත්‍රිවිධාකාරයකි. ඒ කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනුවෙනි. ඵස්ස, වේදනා, සංඥා, චෙතනාද මනසිකාර වශයෙන් සැකසෙන පංචඋපාදානස්කන්ධයන් කෙරෙන් ත්‍රිවිධ තෘෂ්ණාවන්ම පූර්ව මතකයන් යුතුව විඥ්ඥානය නිමවෙයි.

ඵස්ස, වේදනා කෙරෙන් බිහිවන සංඥා සකස්වනුයේ වචන ලෙසිනි, වචීසංස්කාර ලෙසිනි. චේතනා හා සංස්කාර මුසුවීමෙන් මනසේ ආකාරය (මනසිකාරය) සකස් වෙයි. පංචඋපාදානස්කන්ධයෝ - අයෝනිසෝමනසිකාරයෙන් (හටගන්නා ආකාර නොදැනීම අවිද්‍යාව) සංසරවට්ටය ඇතිකරයි. එහිදී පංචඋපාදානස්කන්ධයක් යථාභූතපරිදි නොව, රූප - වේදනා, සංඥා සංස්කාර විඥ්ඥානවයෙන් පවතින්නේය.

පංචඋපාදානස්කන්ධයන් හි ක්‍රියාවලිය හටගන්නා ආකාරය පිළිබඳ වැටහීම (විද්‍යාව) ඇතිවූයේ - ඵස්ස (ගැටීම්) වේදනා (කම්පන) සංඥා (හඳුනාගැනීමට උපකාර) සකස්කිරීම, සංස්කාර වන්නේය. ඒ වචනයෙනි

වාචාසංස්කාරයෙනි. වාචාසංස්කාරයන් කෙරෙන් කාය ස්වභාවයන් බිහිවන්නේය. ඒ හා චිත්ත (චෙතනා) එක්වීමෙන් ත්‍රිවිධ තෘෂ්ණාවෙන් පිරි මනසිකාරයන් තැනෙනුයේ "දුක" ට හේතුකාරක වන්නේය.

වාචිසංස්කාර හේතු ප්‍රත්‍ය කරමින් චෙතනා පවතින්නේය. චෙතනා හේතු ප්‍රත්‍ය කරමින් වචීසංස්කාර පවතින්නේය. මේවා නාමරූපයෝය. එකෙකුගෙන් බැහැර අනෙකා නොවන්නේය.

වචී සංස්කාර (වචනවල) නිශ්චිත අරුත නොවන්නේය. කවර වචනයක් හෝ නිර්වචනකොට දැක්විය නොහැකිය. එහෙත් "වචනය" ඇසෙන ක්ෂණයෙහි පූර්ව දැනීමේ, මතකයනට අනුකූල රූපස්වභාවයන් - නාමරූපයන් යුතු හැඟීම් පහළ වනුයේ ඒවායෙහි උපාදානය වීමෙන් - අල්ලා ගැනීමෙන් නිත්‍ය ලෙසින් පවතින්නක් ලෙසින් මුලාවටම ග්‍රහණය කරමින් "දුක" ට පත්වෙයි.

පූර්ව මතකයන් හා ත්‍රිවිධ තෘෂ්ණාවෙන් සැකසුන විඤ්ඤාණය පිළිබඳ වැටහීම ඇතිවූයේ හැඟීමත් - වචනයත් (චෙතනා - වචීසංස්කාර) යන්හි යථාභූත ස්වභාවයන් වටහාගනුයේ කිසිදු ආකාරයකින් හෝ අධිවචනයෙහි නොරැවටෙන්නේය. අධිවචන (වචීසංස්කාර) චෙතනා (අයෝනිසෝමනසිකාර) නාම - රූප වැටහෙනුයේ වචීසංස්කාරයේ නොරැවටෙනුයේ නාම - රූප ඇසුරු නොකරන්නේය. නාම - රූප ඇසුරුනොවනුයේ බැඳීම් නොවන්නේය. බැඳීම් නොවනුයේ ගැලවුණේ විය. නිවුනේ විය.

ඕනෑකම - ඇතිවූවිට, නැතිකම දැනෙන්නේය. එවිට දුක උපදින්නේය. බලාපොරොත්තු ඇතිවන්නේය. බලාපොරොත්තු ඉටුකර ගැනීමේ ක්‍රියාවන් අරඹමින් " භවය" තනාගනුයේ - ඉපදුනේ වේ.

ඕනෑකම නැතිවූවිට, නැතිකම නොවන්නේය, එවිට දුක නූපදින්නේ - බලාපොරොත්තු නැත්තේය. බලාපොරොත්තු නොවනුයේ ක්‍රියාකාරකම් ලෙසින් " භවය" නොවන්නේය. භවය නොවූයේ ඉපදීමක් නැත. නූපන්නේය.

ඉපදීම සිදුවූයේ ඕනෑකම (තණ්හාව) නිසාය.

සසර දුකෙන් එතෙර වීම පිණිස තථාගතයන්වහන්සේ විසින් දේශනාකොට වදාල මාර්ගය ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයයි. එම මාර්ගය නිවැරදිව වටහා ගත යුතුය. එසේ නොමැතිව එම මග ගමන් කිරීමක් හෝ විමුක්ති ලැබීමක් නොවන්නේය.

සම්මා දිට්ඨි - වෙනස් වන්නා වූ ධර්ම ස්වභාවන් පිළිබඳ නිවැරදි වැටහීම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙසින් නිවැරදිව දැකීම. චතුරාර්‍ය සත්‍ය පිළිබඳ වැටහීම.

සම්මා සංකප්ප - නිවැරදි සංකල්පනාවන්, නිවැරදි දැකීමකින්, අවබෝධයකින් තොරව - නිවැරදි සංකල්පනාවන් පැවැත්විය නොහැකිය.

සම්මා වාචා - නිවැරදි කථාව - අනිත්‍ය පිළිබඳව දුක පිළිබඳව - අනාත්ම බව පිළිබඳව, සැබෑ නොවන දේ සැබෑ වන අයුරින් නිත්‍ය සුඛ, ආත්ම වශයෙන් කථා නොකිරීම. දෙතිස්කථාවන්ගෙන් බැහැර වීම.

සම්මා කම්මන්ත - නිවැරදි ක්‍රියාව, නික්මීම, හුදකලා වීම

සම්මා ආජීව - නිවැරදි ජීවන මග. සමථ විදර්ශනාවන්හි යෙදීම

සම්මා වායාම - නිවැරදි උත්සාහය. අනිත්‍ය වූ දුක ගෙන දෙන්නා වූ, කිසිදා සැබැවින් නොවන්නා වූ, නිරන්තරයෙන් වෙනස් වන ධර්ම ස්වභාවයන් කෙරෙහි නොබැඳී සිටීමට, අනුගත නොවීමට පුහුණුවන සිත සංස්කරණයන් කෙරෙහි යලි අනුගතවන්නට ඉඩනොදී රැකගැනීමේ උත්සාහය.

දියුණු කරගත් සිත සියළු සංස්කාරයන්ගෙන් බැහැරවීම ප්‍රත්‍යක්ෂකර ගැනීමට, නිරතුරුව දරන උත්සාහය.

සම්මා සති - නිවැරදි සිහිය. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, සංස්කාර උපධි, සකල ක්ලේශයන් කෙරෙහි අනුගත නොවන සිහිය.

සම්මා සමාධි - සංස්කාර ගත වූ සම්මුති, සම්මුති ගත වූ කාම/ භව/ විභව තණ්හාවන් ගෙන් සමන්විත වූ පෙර මතකයන් මුළුමනින්ම බැහැර වූ කවර හෝ ආකාරයක අල්ලා ගැනීමක්, උපාදානයක් කෙරෙහි නොඑලැඹෙන සියල්ල නිරුද්ධ වූ සිත නිරෝධිසමාප්තියයි.

උපාසකයිනි, මේ අනුව නිවැරදි වැටහීමෙන් යුතුව ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් සියළු ස්කන්ධයන්ගේ සකස්වීම (කායානුපස්සනා) වැටහන්නේය.

සියළු වින්දනයන් (විඳීම්)හි (වේදනානුපස්සනා) යථා ස්වභාවයන් තත්ත්වාවබෝධයෙන් යුතුව වැටහෙන්නේය.

විවිධාකාරයෙන් අරමුණු, හැඟීම්, චේතනා පහළවන ආකාරයන් (චිත්තානුපස්සනා) පිළිබඳව යථාවබෝධයෙන් වැටහෙන්නේය.

පරමාර්ථ සත්‍යයන්, ඉන් බැහැරව සම්මුති සත්‍යන් කෙරෙන් සකස්වන (ධම්මානුපස්සනා) ධර්‍ම ස්වභාවයන් පිළිබඳවත් යථාවබෝධයෙන් වැටහෙන්නේය.

මෙසේ සිවු ආකාරයකින් සිත් ඇති වන පවතින ස්වභාවයන් ප්‍රත්‍යාවෙක්ෂාකිරීමෙන් පරමාර්ථසත්‍ය " වෙනස් නොවන්නා වූ එකම ධර්මතාවය වෙනස්වීම" ප්‍රත්‍යක්ෂවීමත් සමගම සම්මුතිය අත්හැරෙන්නේය.

ඒතං සංතං - ඒතං පනිතං
යදිදං සබ්බ සංඛාර සමථො
සබ්බූපධිපටිනිස්සග්ගො - තණ්හක්ඛයෝ
විරාගො - නිරෝධො - නිබ්බානං

එය ශාන්තය. එය ප්‍රනීතය. සියළු සකස් කිරීම් සිදුකරනු ලබන වචීසංස්කාර (වචන පරිහරණ) යෙන් බැහැරවීමෙන්, වචනයෙන්ම සකස් වන උපධි - (අඹුදරු ගේ දොර වතුපිටි - ධනධාන්‍ය - සැප සම්පත් සත්ව - පක්ෂි අහස - පොළව - ඉර හඳ - තරු සියළු උපාදානයන්ම) කෙරෙහි ඇතිවන්නා වූ කැමැත්තෙහි (තෘෂ්ණාව) බැඳී නොයනුයේ - බැහැරවූයේ අත්හැරුණේ, නැතිවන්නේය නිවුනේය.

රැය පහන් විය. අරුණළු නැගෙන්ට විය. රැහැයියන්ග් හඬ දුරුවත්ම අතරින් පතර සියොතුන්ගේ හඬ ද නැගෙන්නට පටන් ගෙන ඇත. නායක හාමුදුරුවන් වහන්සේ හා පිරිස මේ වනවිටත් ධර්මශාලාවේය. සාකච්ඡාව නතර වී ඇති නමුදු ඔවුන් ප්‍රත්‍යාවේක්ෂාවෙහි යෙදී සිටිති.

තව මොහොතකින් අළුත් දවසක් උදාවෙනු ඇත. එහෙත් ඒ ධර්මය ස්වභාවයක් මිස, සම්මතයට යටත්ව තවත් අළුත් දවසක් ලෙසින් ඔවුන් කිසිවෙකු විසින් හෝ නොදකිනු ඇත.

ඔවුහු සම්මතයහි නොපිහිටනෝය.සම්මතයෙහි බැහරද නොවන්නේ, සම්මතයෙහි නෙඇලෙමින්, නොගැටෙමින් සසර ගමන නිම කරන්නෝය.

මිත්‍යාවේ සණ අඳුර පළවා හරිමින් ධර්මතාවයන් පිළිබඳ සත්‍යාවබෝධයේ ආලෝකය පහළ විය. ප්‍රභාෂ්වර වූ ආලෝක කදම්භය හමුවේ කෙළෙස් අඳුර මුළුමනින්ම දුරු වූයෙන් එතෙක් මෙතෙක් වශයෙන් පරවති "සසර ගමන" නිම විය.

# ගමන නිමවිය

# "ගමන නිමවිය" පසුවදන

දෙස් විසේ බොදුනුවන් බුදු දහම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන වත්මනෙහි ආරියරත්න හේවාපතිරණයන් විසින් සම්පාදනය කරන ලද "ගමන නිමවිය" කෘතිය ශ්‍රී ලාංකේය බොදු දනන්ගේ එකී දහම් පිපාසය සංසඳවීමට ප්‍රාමාණික කෘතියකි. මාතෘකා කීපයක් ඔස්සේ කෘතියෙහි කරුණු ගොනු කරන ලේඛකයා එමගින් බුදු දහමේ උගන්වන නිර්වාණග ාමී ප්‍රතිපදාව මොනවට විවරණය කර තිබේ. ත්‍රිපිටක පරිශීලනයෙන් හා ප්‍රායෝගිකව දහම් මගට යොමු වීමෙන් කතුවරයා ලැබූ ඥාන සම්භාරය පාඨක ලෝකයාට දායාද කිරීමට ප්‍රශස්ථ ප්‍රයත්නයක් ලෙස මෙම ධර්ම ග්‍රන්ථය හඳින්විය හැකිය.

නොයෙක් මාතෘකා ඔස්සේ බුදු දහමෙහි කරුණු විවරණය කරමින් පොතපත රචනා කරන බොහෝ ලේඛකයින් ඒවා පණ්ඩිතප්‍රිය භාෂා ශෛලියකින් රචනා කළ ද හේවාපතිරණයන් සිය කෘතිය රචනා කරනු ලබන්නේ නොවියත් හුදී ජනයාට ද කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි සරල සුගම භාෂා රටාවකිනි. එහෙයින් ම මෙම කෘතිය බොහෝ පාඨක පිරිසකට දහම් මඟ එළිපෙහෙළි කර ගැනීමට මහඟු අත්වැලක් වනු ඇති බව අපගේ හැඟීමයි.

නානාවිධ ආගමික මිත්‍යාචාරයන්ගෙන් ගහන නූතන සමාජ වපසරිය තුළ සිය දැක්ම නිවැරදි කර ගැනීමට හේවාපතිරණයන්ගේ මෙම "ගමන නිවිය" නම් කෘතිය පාඨක ලෝකයාට ආලෝකයක් ම වේවා.

පරිවේණාධිපති, ගෞරව ශාස්ත්‍රවේදී,

පූජ්‍ය මැකිලියතැන්නේ ධම්මවංශ හිමි

ගා/ශ්‍රී පුෂ්පාරාම මහා පරිවෙන, මීටියාගොඩ